බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 45

අභිධම්මපිටකයෙහි

01 වන ග්‍රන්ථය

# ධම්මසඞ්ගණීප්පකරණය

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්

වැද්දුව මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය,
කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්මමහාසංඝසභාවෙහි අනුනායක ධුරන්ධර
ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය

ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ ද

හිඟුල, මාකඩවර විහාරාධිපති පණ්ඩිත

කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ ද

විසින් කරන ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි

බු. ව. 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 45

The First Book in the

**Abhidhamma-Pitaka**

**1**

# DHAMMASANGANIPPAKARANA

With the Sinhala translation by

**The Venerable Pandita Labugama Lankānanda Thera**

Anunāyaka of Kōtte Srikalyanisamagri Dharma Mahā Sanghasabhā

Vice Principal of the Pravacanodaya Pirivena, Molligoda Wadduwa

&

**The Venerable Pandita Karahampitigoda Sumanasāra Thera**

Makadawara Vihara, Hingula

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ඛුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගිනි, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**


**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**

**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.


2557 / 2013

**බුද්ධ ජයන්ති ත්‍රිපිඨක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ**

**බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක**
**වි. ජ. මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි**
**තායිවානයේ ප්‍රධාන සංඝනායක**

# ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මගින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදී.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

❆ පූජ්‍ය අත්තුඩාවේ සද්ධාඥානනන්ද නාහිමි

❆ පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි

❆ ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි

❆ ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි

❆ දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි

❆ ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි

❆ ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි

❆ පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි

❆ පූජ්‍ය පානදුරේ පසන්න හිමි

❆ මිලිනා සුමතිපාල මැතිණිය

❆ ජගත් සුමතිපාල මැතිතුමා

❆ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා

❆ දොස්තර අරුණ රබෙල් මහත්මා

❆ සුජිත් මොහොට්ටි මහත්මා

❆ රංජිත් අමරසිංහ මහත්මා

❆ ගාමිණී කාරියවසම් මහත්මා

❆ අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා

❆ ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා

❆ මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා

❆ සිරිසේන හේරත් මැතිතුමා

❆ විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

අභිධම්මපිටකෙ

# ධම්මසඞ්ගණීප්පකරණං

අභිධර්මපිටකයෙහි

# ධර්මසඞ්ගණීප්‍රකරණය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය - තිකනිපාතය - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

# පටුන
## CONTENTS


| | පිටු |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... | IX |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... | XI |
| සංඥපනය ... ... ... | XIII – XXXV |
| සංකේතනිරූපණය - ABBREVIATIONS ... | XXXVI |
| පාලි හෝඩිය - PALI ALPHABET ... | XXXIX |
| විෂයසූචි ... ... ... | XLI – XLV |
| පෙළ හා පරිවර්තනය ... ... | 2 – 561 |
| නිද්දිට්ඨපදානුක්කමණිකා ... ... | 563 – 574 |
| විසෙසපදානුක්කමණිකා ... ... | 575 – 577 |
| ශුද්ධිපත්‍රය ... ... ... | 579 |

# සංස්කාරක නිවේදනය

අභිධර්මපිටකයෙහි පළමුවන ප්‍රකරණය වූ "ධම්මසඞ්ගණිපකරණය" බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලායෙහි එක්සාළිස්වන ග්‍රන්ථය වෙයි. බුද්ධජයන්ති උත්සවසංවිධානය සඳහා ලඞ්කාරජය මගින් පත්කරනලද ලඞ්කාබෞද්ධමණ්ඩලයේ සමාරාධනය පරිදි ධම්මසඞ්ගණිප්පකරණය සිංහලයෙන් ව්‍යාඛ්‍යාන කරනලද නමුදු එය බෞද්ධමණ්ඩලයෙන් සම්මත වූ සැලැස්ම අනුව නො ගිය හෙයින් ත්‍රිපිටකසංස්කාරක මණ්ඩලය විසින් ධම්මසඞ්ගණිප්පකරණයෙහි පාඨශෝධනය හා සිංහල අනුවාදය ද කළ මැනැවැයි අප වෙත පවරනලද්දේ විය.

ධම්මසඞ්ගණි පරිවර්තනය අත්‍යාසිකකාර්‍යයක් වූයෙන් ත්‍රිපිටක සංස්කාරකමණ්ඩලයෙහි උද්‍යෝගිමත් සාමාජිකයකු වූ පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ ද සහාය කොටගෙන යථොක්ත කාර්‍යය අප විසින් සපුරාලනලද්දේ ය.

ප්‍රවචනෝදය පිරිවෙන්හි උපාචාර්‍යධුරීණ වැ සිටි පණ්ඩිත සුමනසාර ස්ථවිරයන් වහන්සේ ඉතිහාස පුරාවිද්‍යායෙහි ද තර්කන්‍යායාදියෙහි ද විශේෂ කුශලතායෙන් යුක්තයහ. ඒ ස්ථවිරයන් ධම්මසඞ්ගණිප්පකරණය සඳහා ලියූ දීර්ඝ සංඥපනය නවීනයනට මතු නො වැ ප්‍රවීණයනට පවා වැඩදා වූයෙකි. එහි "අභිධම්ම" ශබ්දාර්ථය පෙළ අටුවාතය ගෙන විශද කොට ඇත. කාලාන්තරයෙහි සිට විතණ්ඩවාදීන් අභිධර්මපිටකය සඳහා ඉදිරිපත් කරන දූෂිත මැනැවින් නිරාකරණය කරනලද වෙයි. ලක්දිවැ අභිධර්මපිටකය සඳහා එන ඓතිහාසික සටහනුදු නගා දක්වති. ධම්මසඞ්ගණිප්පකරණයෙහි එන ධර්මවිභාගය සංග්‍රහ කොට දක්වනලදුයේ ද වෙයි.

ත්‍රිපිටකග්‍රන්ථ මුද්‍රණය ඉක්මනින් නිමවාලනුවස් ශෝධිත ධම්සඟුණිපෙළ හා සිංහල පරිවර්තනය ද 1960 දී පමණ එක්තරා මුද්‍රණාලයකට භාරදෙනලදුව බොහෝ දුරට මුද්‍රණය අවසාන වී තිබිය දී අප නො දත් යම් කිසි හේතුවක් නිසා මුද්‍රණකාර්‍යය නැවතීගියේ ය. මඳ කලකට පසු දතහැකි වූයේ මුද්‍රණයට සකස් කළ අත්පිටපත් මතු නො වැ මුද්‍රිත කොටස් පවා සොයාගත නො හැකි වූ බවෙකි. එහෙයින් දෙවැනිවරට ද ධම්මසඞ්ගණි පරිවර්තනය සපුරාලන්නට සිදුවිය.

ධම්මසඞ්ගණිප්පකරණයේ මුද්‍රණය වහා නිමහම් කිරීමට මහත් පරිශ්‍රමයක් දැරූ ත්‍රිපිටක සංස්කාරකමණ්ඩලයේ සම්පාදක වූ විද්‍යෝදයවිශ්වවිද්‍යාලයේ විනේතෘභූත දර්ශනවිශාරද පරවාහැර සිරිවජිරඤාණ නාහිමිපාණන් වහන්සේ පූර්වමුද්‍රිත කොටසෙහි අවසාන සංස්කරණය සිදු කළහ. මේ කාර්‍යයෙහි ලා වර්තමාන ත්‍රිපිටක සංස්කාරකමණ්ඩලයේ සභාපති අහංගම විද්‍යාවංශ පරිවෙණාධිපති පණ්ඩිත කෝදාගොඩ ඥානාලෝකාභිධාන දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේගේ ඥානාලෝකය ද මෙහි වැටී ඇත. ත්‍රිපිටකසම්පාදකමණ්ඩලයේ ලේඛකාධිකාරී පණ්ඩිත දෙරගමුවේ ධම්මපාල නායක ස්ථවිරයන් වහන්සේ ද මේ කාර්‍යයෙහි සහාය වූහ. මේ මුද්‍රණය අඩාල වැ හෙළිදක්වාලිය නො හැකි වැ තුබූ ධම්මසඞ්ගණිප්පකරණය සපුරාලීමට උපස්තම්භ වූ ස්වදේශීය මුද්‍රණශිල්පීහු ද, ලඞ්කාබෞද්ධමණ්ඩලයේ සුධීහු ද, මෙය පළකරවාලූ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අධිකාරීහු ද අභිධර්මප්‍රකාශනයෙන් ජනිත කුශලයෙන් සුඛභාගීහු වෙත්වා'යි ආශංසනය කරම්හ.

ලබුගම ලඞ්කානන්ද ස්ථවිර
ත්‍රිපිටකසම්පාදකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.

1972-12-30
ත්‍රිපිටක කාර්‍යාලය,
මහානායකචාරිකාරාමය,
115, විජේරාම මාවත,
කොළඹ. 7.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

---

**උපදේශක:**

එක්සත් අමරපුරමහානිකායේ සභාපති අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවේණාධිපති ත්‍රිපිටකවාගීශ්වර පණ්ඩිත කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය ත්‍රිපිටක-වාගීශ්වර පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද - කෝට්ටේ ශ්‍රී කල්‍යාණිසාමග්‍රී-ධම්මමහාසඞ්ඝසභාවේ අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

දෙමටගොඩ ධර්මදූතාශ්‍රම විද්‍යාලයාධිපති පණ්ඩිත පරවාහැර පඤ්ඤානන්ද (බී. ඒ. ලන්ඩන්) කොළඹ නවකෝරළයේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිගුලේ - මාකඩවර විහාරාධිවාසී පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

බෞද්ධාලෝක මාවතේ බෞද්ධාලෝක විහාරාධිපති පණ්ඩිත දෙරගමුවේ ධම්මපාල කොළඹ පළාතේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

# ස ං ඥා ප න ය

විජම්බණ: ශ්‍රීසුගත තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සම්බෝධියෙන් සවැනි වස රජගහනුවර බිම්සර මහරජහු විසින් කරවා දුන් වේළුවන අරම්හි වැඩවසන දවස් රජගහ සිටු 'තමන් රහත්හ' යි පිළිත කරන විවිධ දෘෂ්ටිවාදීන් පිරික්සනුවට සැටරියන් හුණදඬියෙකැ ලා රත්සඳුන් පාත්‍රයක් අහස්හි සෑලා 'රහත්හු ඇත් නම් ඉදුහයෙන් ගොස් ගනිත්ව' යි නුවර බෙර ලැවී. සදිනෙක් ඉක්මගියේ යැ, සඳුන්පය ගත්තෙක් නැති. එකරුණින් 'ලොවැ සෑදීමත් රහත්හු නැතැ' යි නුවරවැස්සෝ කිබිස්නට වන්හ. සත්වන දවස එනුවර පිඬුසිගා වඩනා මහමුගලන් තෙරණුවනටත් පිණ්ඩෝලභාරද්වාජ තෙරණුවනටත් එබස් ඇසිණ. එකල මහමුගලන් තෙරණුවන්ගේ බසින් පිණ්ඩෝලභාරද්වාජ තෙරණුවෝ ඉදුහයෙන් ගොස් පාත්‍රය ගෙන ලොව සෑදීමත් රහතුන් විසින් නොසිස් බව පල කළහ. බුදුහු එපවත් අසා "භික්ෂූන් සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නොපෑයුතු යැ" යි ශික්ෂා පැනවූහ. "ශ්‍රාවකයන් විසින් නො කළයුතු යැ" යි පනවන ලද්ද බුදුහුදු නො කෙරෙති" යි සිතූ තීර්ථකයෝ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පිණිස බුදුරදුනට වාදාරෝපණ කළහ. බිම්සර මහරජහු විසින් දන්වනලද බුදුහු උන්ගේ වාද පිළිගෙන ඉන් සාරමසෙකින් මොබ ඇසළ මැදිපොහෝ දවස්හි සැවැත් නුවර ගඬඹරුක්මුල්හි දී යමාමහපෙළහර දක්වා තීර්ථකයන්ගේ මාන මදින කොට සත්වැනි වස සඳහා තව්තිසා දෙව්ලොවට වැඩියහ. එහි පරසතුරුක්මුල්හි පඬුඇඹුල්සලස්නෙහි වැඩහිඳ මාතෘදිව්‍යරාජයා සාක්‍ෂී කොට දසදහසක් සක්වල දෙවියනට 'කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා' ආදින් තෙමසක් මුළුල්ලෙහි අභිධර්මදේශනා කළසේක. දවස දවස පිඬු පිණිස මිනිස්ලොවට වඩනා බුදුහු නුනත්දහතලායෙහි දී උවටන් පිණිස තමන්වහන්සේ වෙත එළැඹෙන දම්සෙනෙවි සැරියුත් තෙරණුවන් අමතා: 'ශාරිපුත්‍රයෙනි, අද මා විසින් මෙතෙක් දහම් දෙසන ලද්දැ' යි තෙරණුවනට එදහම් නය විසින් වදාරති. තෙරණුවෝ එ නය ගෙන එදා යමාමහපෙළහරෙහි පැහැදැ තමන් වහන්සේ වෙත පැවිදි වූ පන්සියක් අතැවැසියනට එදහම් සිය, දහස්, සුවහස් නයින් විභාග කොට හදාරවති. මෙසෙයින් සම්බුදුරදුන් තව්තිසායෙහි විජම්දෙසුන් නිමවත් මැ මිනිස්ලොවැ සැරියුත් තෙරණුවන්ගේ අතැවැසියොත් සප්තප්‍රකරණාත්ත විජම්බණ හදාරා නිමැවූහ. මෙසේ සම්බුදුරදුන් විසින් දෙවියනට දෙසූ අභිධර්මයෙහි වාචනාමාර්ගය මිනිස්ලොවැ දම්සෙනෙවි සැරියුත් මහරහත් තෙරණුවන් ප්‍රභව කොට පහළ වි. සම්බුදුරදුන් විසින් දෙසූ නය විභාග කොට දේශිත වන බැවින් එය බුද්ධවචනයෙහි මැ වැටෙයි. ප්‍රථම සඞ්ගීතියෙහි දී මහසුප් තෙරණුවන්ගේ පිළිවිසීමෙන් ධර්මභාණ්ඩාගාරික අනඳ තෙරණුවන් විසින් විසඳන ලදුව පන්සියක් මහරහතුන් විසින් සඞ්ගීත වූ අභිධර්මපිටකය දඹදිවැ ඇදුරොල්හි පිළිවෙළින් සැරියුත් තෙරණුවන් පටන් කොට භද්දජි, සොභිත, පියජාලි, පියපාල, පියදස්සි, කොසියපුත්ත, සිග්ගව, සන්දේහ, මොග්ගලිපුත්තතිස්ස, සුදත්ත, ධම්මිය, දාසක, සොණක, රෙවත යන මහ තෙරහු තුන්වැනි සඞ්ගීති කාලය තෙක් වාචනා කොටගෙන ආහ. දෙවනපෑතිස් මහරජුන් දවස දඹදිවැ දම්සෝ මහනිරිඳු පුත් අනුබුදු මිහිඳුමහරහතුන් විසින් ලක්දිවට ගෙන එන ලද

එදහම ලක්දිවැ ඇදුරොල්හි වාචනාමාර්ගයෙහි ආයේ වලගම්අබා මහරජුන් දවස මාතුලජනපදයෙහි අලුලෙන්හි දී ග්‍රන්ථාරූඪ කරන ලදු වැ මෙතෙක් නිර්මල වැ පවත්නේ යි. මේ සැකෙවින් දක්වන ලද්දේ අභිධර්මය පිළිබඳ අර්ථකථාගත ඉතිවෘත්ත යි.

**අභිධර්මාර්ථ:** අභිධර්මශබ්දයෙහි අර්ථවිවරණ නොයෙක් අයුරින් අටුවාහි දක්නට ඇත. "අභිධම්මෙති නාමරූප පරිච්ඡෙදෙ" යි අභිධර්ම යනු නාමරූපපරිච්ඡේද බව සමන්තපාසාදිකා[1] විනය අටුවාහි ද සාරත්ථදීපනී[2] විනයටීකාහි ද එයි. "අභිධම්මෙති අභිවිසිට්ඨෙ ධම්මෙ, ඉමෙසු සත්තතිංසබොධපක්ඛියධම්මෙසූති අත්ථො"[3] යි අභිධර්ම යනු විශිෂ්ට ධර්මයෙහි- සත්තිස් බොධිපාක්ෂිකධර්මයෙහි යන අර්ථ බව පපඤ්චසූදනී මජ්ඣිමනිකායට්ඨකථායෙහි දක්වෙයි. "අභිධම්මන්ති උත්තමධම්මකථං"[4] යි අභිධර්ම යනු උත්තමධර්මකථා යැ යි මනොරථපූරණී අඞ්ගුත්තරනිකායට්ඨකථායෙහි එයි. එහි මැ අන්තැනෙකැ අභිධර්මාර්ථය ඉතා පැහැදිලි ලෙස විවරණය කෙරෙමින්: "අභිධම්මෙ අභිවිනයෙති එත්ථ ධම්මො - අභිධම්මො - විනයො - අභිවිනයොති චතුක්කං වෙදිතබ්බං, තත්ථ ධම්මොති සුත්තන්තපිටකං, අභිධම්මොති සත්තප්පකරණානි, විනයොති උභතො විභඞ්ගං, අභිවිනයොති ඛන්ධකපරිවාරා"[5] යි කීහු.

"අභිධම්මෙ අභිවිනයෙ යන මෙහි ධර්ම-අභිධර්ම-විනය-අභිවිනය යන චතුෂ්කය දතයුතු යැ. එහි 'ධර්ම' යනු සූත්‍රපිටක යැ, 'අභිධර්ම' යනු සප්තප්‍රකරණයෝ යැ, 'විනය' යනු භික්ෂු - භික්ෂුණී උභය විභඞ්ග යැ, 'අභිවිනය' යනු චුල්ලවග්ග - මහාවග්ග - සඞ්ඛ්‍යාත ඛන්ධක හා පරිවාර හා මෙ දෙක යි" යනු එහි අර්ථ යි

ඇදුරොල්හි ආ සෙයින් අභිධර්ම ශබ්දයෙහි පූර්වෝක්ත අර්ථවිවරණය කරන අටුවා ඇදුරු බුදුගොස් තෙරණුවෝ 'අත්ථසාලිනී' නම් ධම්මසඞ්ගණී අර්ථකථායෙහි "තත්ථ අභිධම්මොති කෙනට්ඨෙන අභිධම්මො? ධම්මාතිරෙක ධම්මවිසෙසට්ඨෙන" යි ධර්මාතිරේකාර්ථයෙන් හා ධර්මවිශේෂාර්ථයෙන් අභිධර්ම නම් වන සේ නිරුක්ත්‍යර්ථ දු දක්වති.

'අභිධම්ම' පදයෙහි 'අභි' ශබ්දය "බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති" යන තන්හි සෙයින් අතිරේකාර්ථ ද "අභික්කන්තවණ්ණා" යන තන්හි සෙයින් විශේෂාර්ථ ද කියයි එයින් අතිරේකධර්ම විශේෂධර්ම 'අභිධම්ම' නම් වෙයි.

ඒ එසේ මැ යි: සූත්‍රාන්තයට පැමිණ පඤ්චස්කන්ධය එකදේශයෙකින් විභාග කරනලද යැ. අභිධර්මයෙහි දී සුත්තන්තභාජනීය, අභිධම්මභාජනීය, පඤ්හාපුච්ඡක යන ත්‍රිවිධ නය විසින් නිෂ්ප්‍රදේශ කොට (සර්වාකාරයෙන්) විභාග කරනලද වෙයි. මෙසෙයින් මැ දොළොස් ආයතන, අටළොස් ධාතු, සිවුසස්, සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, සතරඍද්ධිපාද, සප්ත බොධ්‍යඞ්ග, ආර්යඅෂ්ටාඞ්ගමාර්ග, සතර ධ්‍යාන, සතර අප්‍රමාණ්‍ය, සිවුපිළිසිඹියා, ඥාන, ක්ලේශ, භූම්‍යන්තරපරිච්ඡේද ද යන මොහු අභිධර්මයට පැමිණ නිෂ්ප්‍රදේශ කොට විභාග කරන ලදහ. හුදෙක් ඉන්ද්‍රියවිභඞ්ග, සික්ඛාපද විභඞ්ග යන මෙහි සුත්තන්තභාජනීය ද ප්‍රත්‍යයාකාරයෙහි පඤ්හාපුච්ඡකය ද නැත. මෙසේ සූත්‍රාන්තධර්මයෙන් අතිරේක කොට විශිෂ්ට කොට විභක්ත වන බැවින් ධර්මාතිරේක ධර්මවිශේෂාර්ථයෙන් අභිධර්ම නම් වෙයි.

---

1. සමන්තපාසාදිකා - හෙව්මු 789 පිටුව 2 සාරත්ථදීපනී - සිංහ. 40 පිටුව
3. පපඤ්චසූදනී, කීතගිරිසුත්තවණ්ණනා - හෙව්මු. 4-20 පිටුව
4. මනොරථපූරණී - හෙව්මු. 611 පිටුව 5. මනොරථපූරණී - හෙව්මු. 820 පිටුව.

**අභිධම්මපරියායෙ:** අභිධර්ම පිටක විසින් 'අභිධම්මපිටක' නමුදු දේශනා විසින් පරමාර්ථ බහුලකොට දේශිත වන බැවින් 'පරමත්ථ-දේශනා' නමුදු ශාසන විසින් ධර්මප්‍රඥප්තිමාත්‍රයෙහි 'මම' යැ 'මාගේ' යැ යන සංඥා ඇති සත්ත්වයන් මෙහි ලා ධර්මානුරූප කොට අනුසස්නා ලද වන බැවින් 'යථාධම්මසාසන' නමුදු රාගාදියට ප්‍රතිපක්ෂ වූ නාමරූපපරිච්ඡේදය කියන ලද වන බැවින් 'නාමරූපපරිච්ඡේදකථා' නමුදු වෙයි.

**ශාසන:** අභිධර්මපිටකයෙහි ලා අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ශික්ෂා අතුරෙහි 'අධිප්‍රඥාශික්ෂා' කියනලද වෙයි. ව්‍යතික්‍රම, පර්‍යුත්ථාන, අනුශය සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ක්ලේශප්‍රහාණයන් අතුරෙහි 'අනුශය-ප්‍රහාණය' කියනලද වෙයි තදඞ්ග, විෂ්කම්භන, සමුච්ඡේද ප්‍රහාණයන් අතුරෙහි 'සමුච්ඡේදප්‍රහාණය' කියනලද වෙයි. දුශ්චරිත, තෘෂ්ණා, දෘෂ්ටි සංක්ලේශයන් අතුරෙහි 'දෘෂ්ටිසංක්ලේශප්‍රහාණය' කියනලද වෙයි.

**සම්පත්:** සම්පත් අර්ථයෙන් ගනුත් විනයෙහි සුපිළිපන් මහණ ශීලසම්පත් නිසා ත්‍රිවිද්‍යාවට පැමිණෙයි. සූත්‍රාන්තයෙහි සුපිළිපන් මහණ සමාධිසම්පත් නිසා ෂඩභිඥාවට පැමිණෙයි. අභිධර්මයෙහි සුපිළිපන් මහණ ප්‍රඥාසම්පත් නිසා සිවුපිළිසිඹියාවට පැමිණේ.

**අඞ්ග:** තවද මේ අභිධර්මය දීඝ, මජ්ඣිම, සංයුත්ත, අඞ්ගුත්තර, ඛුද්දක යන පඤ්චවිධ නිකායයන් අතුරෙහි ඛුද්දකනිකායෙහි බැසගනී. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල යන නවවිධ ශාසනාඞ්ගයන් අතුරෙහි වෙය්‍යාකරණාඞ්ගයෙහි බැසගෙන සිටී. පිටක විසින් වෙන් කොට ගනුත් සූත්‍රාන්තපිටකයෙහි අන්තර්ගත ග්‍රන්ථයෝ දීඝනිකාය, මජ්ඣිමනිකාය ආදි විසින් 'නිකාය' නමින් හෝ 'ආගම' නමින් ද විනයපිටකයෙහි අන්තර්ගත ග්‍රන්ථයෝ පාරාජිකපාළි, පාචිත්තියපාළි ආදි විසින් 'පාළි' නමින් ද අභිධර්මපිටකයෙහි අන්තර්ගත ග්‍රන්ථයෝ ධම්මසඞ්ගණිප්පකරණ, විභඞ්ගප්පකරණ ආදි විසින් 'පකරණ' නමින් ද වෙසෙසා හඳුන්වනු ලැබෙත්.

**ප්‍රකරණ ශබ්දය:** පාළියෙහි 'පකරණ' ශබ්දය දෙශ, කාරණ, ප්‍රස්තාව, ග්‍රන්ථවිශේෂ යන අරුත්හි දක්නාලැබේ "කිස්මිඤ්චිදෙව පකරණෙ"[1] යනු තන්හි දෙශයෙහි වැටෙයි. "කිස්මිඤ්චිදෙව පකරණෙති කිස්මිඤ්චිදෙව දෙසෙ" යනු සුමඞ්ගලවිලාසිනී අම්බට්ඨසුත්තවණ්ණනා යි. "පකරණෙති රාගාදි වසෙන පදුට්ඨෙ පක්ඛලිතෙ කාරණෙ" යි එ මැ ටීකායෙහි[2] එයි. "එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ"[3] යන තන්හි කාරණයෙහි වැටෙයි "පකරණන්ති කායවිඤ්ඤත්ති සහිතාය වචීභෙදචෙත-නාය අධිප්පෙතත්ථසාධනං"[4] යනු සාරත්ථදීපනී විනයටීකාහි දක්වෙයි. පළමු කී සුමඞ්ගලවිලාසිනී අර්ථය ද මෙහි නො යෙදෙන්නේ නො වේ.

"සංයොගො විප්පයොගො ච සාහචරියා විරෝධතා
අත්ථා පකරණා ලිඞ්ගා සද්දන්තර සමීපතා"[5]

යන තන්හි ප්‍රස්තාවයෙහි වැටෙයි. "සත්තප්පකරණානි" යන තන්හි ග්‍රන්ථවිශේෂයෙහි වැටෙයි. ජාතකඅටුවාගැටපදයෙහි "නන් ප්‍රභේද-යෙන් බුත් අර්ථයෝ ප්‍රකාරයෙන් කියනුලැබෙත් නු යි යථෝක්ත ධම්මසඞ්ගණී ආදි 'ප්‍රකරණ' නම් වේ"[6] යනුවෙන් නොයෙක් ප්‍රභේදයෙන් භින්න වූ අර්ථයන් ප්‍රකාරයෙන් කියනුලබන හෙයින් ධම්මසඞ්ගණී ආදිය ප්‍රකරණ නම් වන සේ දක්වනලදී.

---

1. දීඝනිකාය - අම්බට්ඨසුත්ත 2. දීඝනිකාය සීලක්ඛන්ධවග්ගටීකා - ඡේසං. 305 පිටුව.
3. පාරාජිකපාළි - තතියපාරාජිකා. 4. සාරත්ථදීපනී - ඡේස., 256 පිටුව
5. පඤ්චිකාප්‍රදීප- ධස., 20 පිටුව. 6. ජාතකඅටුවාගැටපද-ඩී. බී. ජයතිලක 48 පිටුව.

භාෂාන්තරයෙහි: "ප්‍රමාණප්‍රකරණ, ප්‍රමේයප්‍රකරණ"[1] ආදි තන්හි ග්‍රන්ථ-සන්ධියෙහි වැටෙයි. මේ අරුත්හි 'පාද' ශබ්දය ද යෙදෙයි. මුග්ධබෝධයෙහි ග්‍රන්ථසන්ධි 'පාද' නමින් දක්වෙයි. පාද ලක්ෂණ දක්වන මුග්ධබෝධටීකාකාර දුර්ගාදාසයෝ: "එකාර්ථාවච්ඡින්න සූත්‍රසමූහඃ පාදඃ" යි 'එකාර්ථයෙහි කැටි කොටගත් සූත්‍රසමූහය පාද නමැ' යි කියති. පාදපර්යාය හෙයින් 'ප්‍රකරණ' ශබ්දයෙහිදු මේ අරුත් යෙදෙයි. එකාර්ථප්‍රතිපාදක ධර්ම සමූහ වන බැවින් ධම්මසඞ්ගණී ආදිය හා යෙදෙන ප්‍රකරණ ශබ්දයෙහි දු මේ අරුත් යෙදේ දැ යි විමසනු වටී.

සම්භාවනා: දිවමනු සම්බුදුරදුන් සමයෙහි මැ අභිධර්මය මහත් සම්භාවනා ලද්දේ යැ. එ දවස 'ධම්මකථික' යනු ආභිධර්මිකයනට නමෙකි. 'ධම්මකථික' නමින් වෙන මැ ආචාර්යගණයෙක් ද වී. කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි පන්සියක් අතැවැසියන්ගෙන් සමන්විත ධම්මකථික ගණයෙක් වී. මෙහි ධම්මකථික ගණයත් විනයධර ගණයත් අතර උපන් විනය පිළිබඳ මතභේදයක් නිසා බුදුරදුන් පාරිලෙය්‍යවනයට වැඩි සේ ධම්මපදට්ඨකථා කොසම්බකවත්ථුයෙහි දැක්වේ. මහාගොසිඞ්ග සූත්‍රයෙහි දී සම්බුදුරදුන් විසින් මැ ආභිධර්මිකයා 'ධම්මකථික'යයි නම් කරන ලද්දේ යැ.

කිනෙයින් මහණහු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ දැ? යි දම්සෙනෙවි සැරියුත් තෙරණුවන් විසින් පුළුවුත් මහමුගලන් තෙරණුවෝ:

"ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, මෙසස්නෙහි මහණහු දෙදෙනෙක් අභිධර්ම කථා කෙරෙත් ද, ඔහු ඔවුනොවුන් පැන පුළුවුසිත් ද ඔවුනොවුන් පැන පුළුවුස්නා ලදහු විසදත් ද නො පසුබසිත් ද උන්ගේ දැහැමිකථාත් පවත්නී වේ ද, ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, මෙවන් මහණහු විසින් ගොසිඞ්ගසාලවනය හොබනේ යැ"[2] යි අභිධර්මකථා කරන මහණහු විසින් ගොසිඞ්ගසාලවනය හොබවන සේ දැක්විණ. මහමුගලන් තෙරණුවන්ගේ විසැඳුම සැරියුත් තෙරණුවන් විසින් සම්බුදුරදුන් හමුයෙහි දක්වාලූ කල්හි භාග්‍යවත් බුදුහු: "සාධු සාධු ශාරිපුත්‍රය, එය මුගලන්හු පැවැසූ සේ මැනැවැ. ශාරිපුත්‍රය, මොග්ගල්ලාන ධර්මකථිකයෙකි"[3] යි වදාළහ. මෙහි සම්බුදුරදුන් විසින් අභිධර්ම කථා පසස්මින් 'ආභිධර්මිකයෝ මැ ධර්මකථිකයහ' යි ද වදාරනලද වෙයි.

ආභිධර්මික මැ ධර්මකථික වීමට හේතුදු අට්ඨකථායෙහි මෙසේ දැක්වෙයි: "සූක්ෂම වූ චිත්තාන්තර, ස්කන්ධාන්තර, ධාත්වන්තර, ආයතනාන්තර, ධ්‍යානාවක්‍රාන්ති, ආලම්බනාවක්‍රාන්ති, අඞ්ගව්‍යවස්ථා, ආලම්බනව්‍යවස්ථා, අඞ්ගසංක්‍රාන්ති, ආලම්බනසංක්‍රාන්ති, එකතොවඩ්ඪන, උභතොවඩ්ඪන යන මොවුන් ආභිධර්මිකයනට මැ ප්‍රකට වෙයි. ආභිධර්මික නො වූයේ ධර්මය කියතුදු මේ ස්වවාද යැ මේ පරවාද යැ යි නො දනී"[4] යයි.

අත්ථසාලිනියෙහිදු ආචාර්යයෝ: "ආභිධර්මික මහණහු මැ ධර්මකථික නම් වෙති. සෙස්සෝ ධර්මකථා කියන්නාහු නමුදු යථාර්ථයෙන් ධර්මකථික නො වෙති. කවර හෙයින යත්: ඔහු ධර්මකථා කියන්නාහු කර්මාන්තර විපාකාන්තර රූපාරූපපරිච්ඡේද ධර්මාන්තර ආලොළන කොට කියති. ආභිධර්මිකයෝ ධර්මාන්තර නො අලලති. එහෙයින් ආභිධර්මික මහණ ධර්මය කියන්නේ වේවයි නො කියන්නේ වේවයි පිළිවිසි කල්හි පැන විසඳනු යි මේ මැ ඒකාන්ත ධර්මකථික වේ"[5] යයි ආභිධර්මික මහණ මැ ධර්මකථික වන සේ තර කොට කියති.

---

1. ගෞතමන්‍යායදර්ශන, 2. මුග්ධබෝධටීකා - 15 පිටුව. ජවානන්ද විද්‍යාසාගර, 1902
3. මජ්ඣිමනිකාය - මහාගොසිඞ්ගසුත්ත. 4. පපඤ්චසූදනී - මහාගොසිඞ්ගසුත්ත-වණ්ණනා. 5. අත්ථසාලිනී - නිදානවණ්ණනා, හේවා. 24 පිටුව.

නිකායාන්තර බෞද්ධයන් අතුරෙහි සර්වාස්තිවාදීන් විසින් අභිධර්මය ආදෘත යැ. ඔවුනට ද අභිධර්මයෙහි සප්තප්‍රකරණයෙක් වෙයි: ඥානප්‍රස්ථාන යැ සඞ්ගීතිපර්‍යායය යැ ප්‍රකරණපාද යැ විඥානකාය යැ ධාතුකාය යැ ධර්මස්කන්ධ යැ ප්‍රඥප්තිශාස්ත්‍ර යැ යන මේ සප්තප්‍රකරණයෝ යි. කනිෂ්කරාජසමයෙහි දී ඥානප්‍රස්ථානයට 'විභාෂා' නමින් අර්ථකථාවක් ද යළි එයට ටීකා තුනක් ද ලියන ලදහ. එහි විශාලතම ටීකාව 'මහාවිභාෂා' නමින් හැඳින්වෙයි. පශ්චාත්කාලීන පඬිවරුන් විසින් ලියනලද පරිවාර ග්‍රන්ථ රාශියෙකිනුදු සර්වාස්තිවාදීන්ගේ අභිධර්මය පෝෂිත වෙයි.

ලක්දිව බෞද්ධයන් අභිධර්මය කෙරෙහි දක්වූයේ අතිමාත්‍ර භක්තියෙකි, සම්භාවනායෙකි. එහි ලා මෙරට රජවරුන් මැ පුරෝගාමී වූ සේ ඉතිහාසයෙහි දක්ක හැකි නැ. තෙවළා බුදුවදන්හි නිපුණ වූ සිංහල රජදරුවෝ බොහෝ දෙනෙක් මෙරට පාලනයෙහි නියුක්ත වූහ. බුදුදහම ව්‍යාප්ත කරලීම ද ඔවුන්ගේ රජදහම්හි අඞ්ගයෙක් වි. දහම් දෙසන්නටත් ධර්මව්‍යාඛ්‍යාන කරන්නටත් ධර්මාධ්‍යාපනය කරන්නටත් මෙරට රජවරු ඉදිරිපත් වූ අවස්ථා ඉතිහාසයෙහි සඳහන් වැ ඇත. කුමරුවන් නිවාපයෙන් උපලාලනය කොට දහම් හැදූර වූ රජවරු ද වූහ.

දුටුගැමුණුරජ (බු. ව. 382 – 406) අනුරාධපුර ලෝහප්‍රාසාදයෙහි යටිමහල්හි මහසඟන මැද දහම් දෙසන්නට ධර්මාසනාරූඪ වී.[1] සුළුමුගලන්රජ (බු. ව. 1089 – 1109) ධර්මභාණකයනට අතිරෙක පූජා කොට අර්ථකථා සහිත තුන්පිටකය වාචනා කරවී. කුමරුවන් නිවාපයෙන් උපලාලන කොට දහම් හැදූරවී. තෙමේ දහම් කවියට නගා රාත්‍රිධර්මාවසානයෙහි ඇතුන් පිට පුරුෂයන් හිඳුවා නගරයෙහි කියැවී.[2] දෙවුනිස් iii රජ (බු. ව. 1180 – 81) යුද්ධයෙන් පැරැදූ සිරියෙන් ගෙලසිඳ සියදිවි නසාගනුයේ ඇමැති අත මෙහෙසියට සන්දේශයක් යවමින් "පැවිදිවැ ආගම හදූරා අභිධර්මය කියා පින්පෙත් දෙව" යි කියායවී.[3] කසුප්මහරජ ii (බු ව. 1196 – 1205) මිරිසවැටි වෙහෙරෙහි පහයක් කරවා එහි නාගසාලනිවාසී 'මහාධම්මකථී' නම් මහ තෙරුන් වස්වා සිවුපසයෙන් උපස්ථාන කොට ඔබ ලවා අර්ථකථා සහිත අභිධර්මය කියැවී. නාගසාලයෙහි ද ආවාසයක් කරවා 'මහානිඨිල' ග්‍රාමය එයට ප්‍රත්‍යය පිණිස පිදී.[4]

දෙබිසෙවජා සලමෙවන් අභා මහරජ (v කසුප් බු. ව. 1445 - 1455) මිරිසවැටි වෙහෙරෙහි දී නුවරවැසියන් හා භික්ෂූන් පිරිවරා විචිත්‍ර මණ්ඩපයෙකැ හිඳ විජම්බණ දෙසී. විජම්පෙල රන්පත්හි ලියවා ධම්සඟුණු පෙළ සත්රුවනින් සද නුවර මැද උත්තමගෘහයක් (ධම්මචක්කගෙහ) කරවා එහි තබා පෙරහැර කරවී. තමා පුතුහට 'සක්කසෙනාපති' තැන් දී එයට පුද පෙරහැර කරවීමෙහි යෙදූවී. හවුරුදු පතා නුවර අලඞ්කාර කරවා සර්වාභරණයෙන් සැදී සෙන් පිරිවරා ඇතුපිට හිඳ ධම්සඟුණු වඩාගෙන ශ්‍රී සඤ්චාරය කොට තමන් කරවූ (මිරිසවැටි) විහාරයට මහපෙරහැරින් පමුණුවා එහි ධාතුඝරයෙහි විචිත්‍රමණ්ඩපයෙකැ තබා පුදපෙරහැර පැවැත්වී.[5] මහාවංශයෙහි එන මෙපුවත v කසුප් රජුගේ අභයගිරිශෛලලිපියෙහිදු

1. මහාවංශ – 32 පරි. 42, 43 ගාථා. 2. මහාවංශ - 40 පරි 58-60 ගාථා.
3. මහාවං – 42 පරි. 109 ගාථා 4. මහාවංශ – 43 පරි. 149-151 ගාථා..
5 මහාවංශ – 50 පරි. 45-56 ගාථා.

" ……… දෙබිසෙවජා සලමෙය්වන් අබහය් මහරජ්හුතාර් ……… දනැණෙන් බුද්රුවන් අරියය් ධම්රුවන් කවරිසෙයෙකින් පුජනෙමි හො යන අදහස් පුරය් අභිධම් දෙසුත් කසුත්පත් අරවය් මහපුජ කොට සපුත් පිහිටුවම් යන සිත් දෙල්නෙන් ඇජරපය හමුයෙහි එ මෙ ධම්දෙසුත් වියක්හත් කළ ……… " යනු දක්නට ඇත. මෙයින් එරජු අභිධර්ම-ව්‍යාඛ්‍යානයකුදු කළ බව හෙළි වෙයි.

මිහිඳු මහරජ iv (බු. ව. 1491 - 1507) සිතුළුගාම්වාසි 'දහමමිත්' තෙරුන් පුදා ඔබ ලවා අභිධර්මවණ්ණනාවක් කරවී. අරණ්‍යවාසි 'දාඨානාග' තෙරුන් ලවා අභිධර්මය කියැවී (උගැන්වී)[1] එයට වැටුප් තැබූ සැටිදු ඔබගේ මිහින්තලා පුවරු ලිපියෙහි එයි:

"……… විනාවලා කියන බික්සඟ හිමියනට කඩින් පිඩින් වසග් පසක් ඉසා සුතත්වලා කියන බික්සඟ හිමියනට කඩින් පිඩින් වසග් සතක් ඉසා බිදම්වලා කියන බික්සඟ හිමියනට කඩින් පිඩින් වසග් දොළසක් ඉසා ……… " යි.

මෙහි දැක්වෙන පරිදි විනයපිටකය කියන (උගන්වන) මහණක්හට වසග් පසක් ද සූත්‍රාන්තපිටකය කියන මහණක්හට වසග් සතක් ද අභිධර්මපිටකය කියන මහණක්හට වසග් දොළසක් ද දියයුතු වෙයි. විනයපිටකයත් සූත්‍රපිටකයත් දෙක මැ සඳහා කළ වැය එක් මැ අභිධර්ම-පිටකය සඳහා කළ වැය හා සම වෙයි. එයින් අභිධර්මය කෙරෙහි මහත් සම්භාවනා දැක්වූ සේ පැනෙයි.

මහාවිජයබාහු රජ (බු. ව 1594 - 1649) දවස්පතා උදෑසන විවෙකී වැ ධර්මාගාරයට වැද 'ධම්මසඞ්ගණීය' පරිවර්තන කෙළේ යැ.[2]

මෙසෙයින් බලත් මැ අභිධර්මපිටකය ලක්දිවිහි දී ලද සම්භාවනා ඉමහත්. ඉතිදු ධම්මසඞ්ගණීප්පකරණය විශිෂ්ට වෙයි. එය සඳහා 'ධම්ම-සඞ්ගණීගෙහ' නමින් වෙනමැ ගෘහයක් ද එහි ආරක්ෂාවට 'සක්කසෙනාපති' නමින් වෙන මැ සෙනෙවි ධුරයෙක් ද වී. මෙකල ඇසළ පෙරහැර සෙයින් පැවැත්වෙන වාර්ෂික පූජෝත්සවයෙක් ද වූයේ යි. එහි දී ධම්සඟුණු වඩා ගෙන ගියේ මහරජ තෙමේ යි.

## විරුද්ධවාද

ධර්මවිනයෙහි නිපුණ විශාරද පඬිවරුන්ගේ අත්‍යන්ත බහුමානයට පාත්‍ර වැ ඇත ද අභිධර්මපිටකය පමණ විවෙචකයන්ගේ මතභෙදයට ලක් වූ අන් පිටකයෙක් නැත. තුන්වැනි සඞ්ගීතියෙහුත් පළමු ඇරඹුණු විවෙචනය මෙතෙක් නැවැතී නැත. නිකායාන්තර බෞද්ධයන්ගේත් අන්‍යලබ්ධික යුරොපීය පඬුවන්ගේත් විවෙචනයට ලක්වීම ආශ්චර්ය නො වෙයි. ඔවුන් අනුකරණය කරන මෙරට ථෙරවාදී තෙරවරුන්ගේත් ගිහිපඬුවන්ගේත් ප්‍රහාරය ද දැන් එයට නො අඩු වැ වදනා සැටි පැනෙයි ! 'අභිධර්මය බුද්ධ-භාෂිත නො වෙයි' කියනුවන්ගේ මූඛ්‍යවාද ගැන හෙතුයුක්ති එළවා කළ ප්‍රාමාණික මතඛණ්ඩනයක් බුද්ධජයන්ති ත්‍රිපිටකමුද්‍රණාඞ්කාගත මහාවග්ග-පාළි ප්‍රස්තාවනායෙහි එයි. ධර්මවිනයෙහි මෙන් මැ දර්ශනයෙහි දු විශාරද වූ,

---

1. මහාවංස - 52 පරි. 35, 36 ගාථා. 2. මහාවංස - 53 පරි. 17 ගාථා.

ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි දර්ශනාංශයෙහි විශේෂතාභූත මහෝපාධ්‍යාය දර්ශනවිශාරද පරමාචාර්ය සිරිවජිරඤාණාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් කරනලද එ මැ වාද ඛණ්ඩනය ප්‍රමාණවතුදු ප්‍රාසඞ්ගික හෙයින් මෙහි දු කරුණු කිහිපයක් දක්වාලම්හ.

**මහාසාඞ්ඝිකයෝ:** අභිධර්මයට විරුද්ධ වැ පළමු නැඟී සිටියෝ මහාසාඞ්ඝික නිකායවාසීහු වෙති. දඹදිව කාලාශෝක මහරජු (බු. ව. 90 – 118) දවස අකප්පිය දශවස්තුවක් නගා ශාසනාර්බුදයක් ඉපැද වූ එහෙයින් මැ ද්විතීය සඞ්ගීතියෙහි දී ස්ථවිරවාදයෙන් නෙරනලද වජ්ජිපුත්තක භික්ෂූහු අධර්මවාදීන්ගේ පක්ෂබල ලබා දසදහසක් දෙනා එක් වැ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි දී 'මහාසාඞ්ඝික' නමින් වෙන මැ නිකායක් පිහිටුවා ගත්හ. ඔවුන් විසින් පරිවාර, අභිධර්මප්‍රකරණ සය, පටිසම්භිදා, නිද්දෙස, ජාතක එකදේශයක් යන මෙතෙක් දහම් හළ බව දීපවංසයෙහි[1] එයි.

**ශාසනය නවකෘත වි ද?:** දඹදිව දම්සෝ මහනිරිඳුන් දවස තෘතීය සඞ්ගීති සමයෙහි නිකායාන්තර බෞද්ධයන් අතුරෙහි සර්වාස්තිවාදීන් හැර සෙසු හැමදෙනා අභිධර්මය බුද්ධභාෂිත සේ නො ගත්හ. 'ශාසනය නවකෘත යැ (සාසනං නවං කතං) යි කියන්නෝ ද වූහ. මධුරසුත්ත[2] ඝොටමුඛසුත්ත[2] මුණ්ඩරාජසුත්ත[3] සත්තසතිකක්ඛන්ධක[4] වැනි ප්‍රථම සඞ්ගීතියෙන් පසු වැ කළ දේශනාවන් පෙළට එක් කිරීම ගැන ඔවුන් එසේ කියනු විය හැකි යැ. කථාවස්තුයෙහි උන්ගේ වාද සහෙතුක වැ ඛණ්ඩනය කොට ඇත.[5] 'ශාසනය නවකෘත යැ' යි කීම ඇතැම් උත්තරාපථකයන්ගේ මත වැන්නැයි අර්ථකථාචාර්යයෝ දක්වති.[6] මෙහි නිර්දිෂ්ට යන් අටුවා පාළියට නඟන අවධියෙහි විසූ උත්තරාපථකයනැ යි සිතම්හ. ඔහු සෞත්‍රාන්තික නිකායවාසී බෞද්ධයෝ වියයුත්තාහ. සෞත්‍රාන්තිකයෝ වනාහි කාශ්මීර ගන්ධාර දෙරටෙහි බලවත් වැ සිටි සර්වාස්තිවාදයෙන් බිඳීගියාහු වෙති. ඔහු සූත්‍රාන්ත මැ බුද්ධභාෂිත සේ ප්‍රමාණ කොට ගත් හෙයින් 'සෞත්‍රාන්තික' නම් වූහ. මෙයින් පැනෙනුයේ 'ශාසනය නවකෘත යැ' යන මතය කථාවස්තුයෙන් ඛණ්ඩනය කොට තිබියදීත් එහි තර වැ එල්බගත් පිරිසක් අටුවා පෙළබසට නඟන අවධියේත් භාරතයෙහි සිටි බවයි.

අභිධර්මයට විරුද්ධ වැ විතණ්ඩවාදීන් නඟන නොයෙක් චෝදනා ඇත. ඔවුනතර:

i අභිධර්මය බුද්ධභාෂිත නො වෙයි,

ii ප්‍රථම සඞ්ගීතියට පෙර අභිධර්මය නො වී,

iii අභිධර්මය ප්‍රථම සඞ්ගීතියෙහි සඞ්ගීත නො වී,

යන චෝදනාවෝ මුඛ්‍ය වෙති. මේ එකෙකුදු අලුත් නො වෙයි. අටුවා පෙළබසට නඟන්නටත් පෙර සිට මැ නිකායාන්තර බෞද්ධයන් විසිනුදු ස්ථවිරවාදයට විරුද්ධ වැ නඟනලදු වැ අර්ථකථායෙහි ඛණ්ඩන ද කොට ඇති චෝදනා මැ යි. අපිදු විමසම්හ.

---

1 දීපවංස - 4 පරි. 76 ගාථාව, 2. මජ්ඣිමනිකාය - මජ්ඣිමපණ්ණාසක.
5. අඞ්ගුත්තරනිකාය - පඤ්චකනිපාත, මුණ්ඩරාජවග්ග 4. චුල්ලවග්ගපාළි.
3. කථාවත්ථු - එකවීසතිවග්ග 6. පඤ්චප්පකරණට්ඨකථා - හේවා. 204 පිටුව.

## වාදනිරාස

**අභිධර්මය බුද්ධභාෂිත නො වේ ද?**: 'අභිධර්මය බුද්ධභාෂිත නො වේ' යයි ප්‍රතිඥා කරනුවෝ එහි නිදාන නැති බව හේතු විසින් දක්වති. සූත්‍රාන්තය එයට වෛධර්ම්‍යදෘෂ්ටාන්ත කොට එළවති. තර්කානුකූල වැ ගත් කල්හි මේ මෙසේ සිටුනේ යැ:

'අභිධර්මය බුද්ධභාෂිත නො වෙයි,
නිදාන නැති හෙයිනි,
(වෛධර්ම්‍යයෙහි) සූත්‍රාන්තය මෙනි' යි.

මෙයින් මේ කියනලද වෙයි: 'ඉදින් අභිධර්මය බුද්ධභාෂිත වී නම් සූත්‍රාන්තයට "එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ" ආදිය සෙයින් අභිධර්මයට ද නිදානයක් විය යුතු යැ. නිදාන නැති හෙයින් අභිධර්මය බුද්ධභාෂිත නො වේ' කියා යි. ඔවුන්ගේ හේතු මැ සදොස් වෙයි. ප්‍රතිඥාර්ථසිද්ධියට එළවන හේතු ඒකාන්ත වියයුතු යැ. බුද්ධභාෂිතයට නිදාන ඒකාන්ත හේතු නො වෙයි. 'යමෙක් බුද්ධභාෂිත වී නම් ඒ සනිදාන වියයුතු යැ' යි ව්‍යාප්තිනියමයෙක් නැති. දෘෂ්ටාන්ත කොටගත් සූත්‍රාන්තයෙහි දු නිදාන අව්‍යභිචාරී නො වෙයි. නිදාන නැති සූත්‍රාන්ත ද ඇති හෙයිනි. ජාතක, සුත්තනිපාත, ධම්මපද ආදියෙහි නිදාන නැත, බුද්ධභාෂිතයට සනිදානත්වය හේතු වී නම් එ හැම බුද්ධභාෂිත බැවින් බැහැර කළයුතු වෙයි.

මහාකාත්‍යායන තෙරණුවන්ගේ අතැවැසි සෝණ තෙරණුවෝ සුත්තනිපාතය උගෙන එහි එන අට්ඨකවග්ග ගාථා බුදුරදුන් වදාළ පරිදි මැ උන්වහන්සේ හමුයෙහි මධුරස්වරයෙන් සජ්ඣායනා කොට කල්‍යාණවාක්කරණ ඇති ශ්‍රාවක මහණුන් අතුරෙහි අගතැන් ලදහ. අඞ්ගුත්තරනිකායෙ එතදග්ගපාළියෙහි උන්වහන්සේගේ නම සඳහන් වැ ඇත. අට්ඨකථායෙහි පුවත විස්තර විසින් එයි. මෑත දී දඹදිවැ සාඤ්චිස්තූපයෙහි පුරාවස්තු අතර තිබී 'සත්පුරුෂ මහාකාත්‍යායනගේ අතැවැසි සෝණගේ' යන අරුත් ඇති "සපුරිසස මහකචනස අතෙවසිනො සොනස" යන ලිපිය සහිත ධාතුකරඬුවක් සොයා ගෙන ඇත. මහාකාත්‍යායන තෙරණුවෝ පැවිද්දට පෙර අවන්තිජනපදයෙහි චණ්ඩප්‍රද්‍යෝත රජුගේ පුරෝහිත බ්‍රාහ්මණ වූහ. සෝණ තෙරණුවෝ ප්‍රථම සෝවන් උවැසි වූ කුරරඝරයෙහි කාළී උවැසියගේ පුතණුවෝ යි. සාඤ්චිස්තූපයෙහි උන්වහන්සේගේ නම ගෞරවයෙන් අනුස්මරණය කිරීමට හේතුව ජන්මභූමියෙහි සම්බන්ධය වියයුතු යැ. එයින් පෙළ අටුවාහි ආ පවත් ඓතිහාසික සත්‍යභාවයෙන් තර වෙයි. මේ අනුව අන් කුමක් හැර පියතුදු සුත්තනිපාතයෙහි අට්ඨකවග්ගය හෝ බුද්ධභාෂිත සේ ගතයුතු වෙයි. එයට ද නිදානයෙක් නැත. මෙසෙයින් බුද්ධභාෂිතයෙහි නිදාන අනෛකාන්තික වෙයි. හේතු මැ සදොස් බැවින් වාදය බිඳ වැටෙයි.

**නිදාන නො දැක්වීමට හේතු**: අභිධර්මයට නිදාන එකක් නො වැ දෙකක් ඇති සේ අර්ථකථායෙහි දක්වන ලදී. එය එසේ නම් ඇති නිදාන නො දැක්වූයේ කිම්? නිරර්ථක හෙයිනි. නිදාන දක්වනුයේ අර්ථයක් සඳහා යි. ස්ථාන, පුද්ගල, වස්තු ආදීන් නානාත්වයක් ඇති තන්හි නිදාන දැක්වීම ග්‍රහණධාරණයෙහි පහසු පිණිස පවතී. එද අවශ්‍යයෙන් මැ දැක්වියයුතු යැ යි නියමයෙක් නැති. ප්‍රථමසඞ්ගීතියෙහි දී ධර්මසඞ්ග්‍රාහකතෙරුනට රිසි සේ නිදාන තබනලදී. අභිධර්මයෙහි සූත්‍රාන්තයෙහි සෙයින් ස්ථානපුද්ගලාදි නානාභාවයෙක් නැති. එයින් නිදාන අවශ්‍ය නො වෙයි.

තවද කරුණෙක් ඇති: සූත්‍රාන්ත ධර්මසඞ්ග්‍රහ කරන ලද්දේ බුදුන් පිරිනිවී තුන්මසකට පසු යැ. එයින් එය අනුශ්‍රව විසින් සනිදාන කොට කියයුතු වෙයි. ධර්මය ශාස්තෘන් වහන්සේ ප්‍රභව කොට පවත්නා හෙයින් හා උන්වහන්සේ නො හමුයෙහි සඞ්ග්‍රහ කළයුතු වූ ද බැවිනි. අභිධර්මපිටකය වාචනාමාර්ගයට නඟනලද්දේ සම්බුද්ධරජුන් හමුයෙහි යැ. ප්‍රථම සඞ්ගීතියෙහි සඞ්ගායනා කරනු මිස සඞ්ග්‍රහ කිරීමට කිසිවක් එහි නො වී. එයිනුදු නිදාන නිරර්ථක වෙයි.

මෙහි දී 'අභිධර්මයේ ප්‍රභවය' (THE ORIGIN OF THE ABHIDHAMMA) නමින් බෞද්ධවිශ්වකෝෂයෙහි (ENCYCLOPAEDIA OF BUDDHISM) එන ලිපිය ද විමසනු වටී. "බුදුරජහු අභිධර්මය නො දෙසූහ යනු මණ්ඩලාරාමවාසී තිස්සභූති තෙරුන්ගේ මතය විය. උන්වහන්සේ ස්වමතය සනාථ කිරීමට පදෙසවිහාර සූත්‍රය නිදසුන් කොට ගත්හ. සුමනදෙව නම් තෙර කෙනකුන් විසින් 'අභිධර්මයෙහි කර්තෘ බුදුරජාණන් වහන්සේ මැ යැ' යි පිළිගන්නා ලෙස ස්වකීය අනුගාමිකයෝ පොළොඹවන ලදහ"[1] යි ලියුම්කරු මහතා කියයි. දැන් අපි මෙයට සම්බන්ධ අටුවා පාඨ ගෙන බලම්හ.

"මණ්ඩලාරාමවාසී තිස්සභූතිත්ථෙරො පන මහාබොධිනිදානො එස අභිධම්මො නාමාති දස්සෙතුං "යෙන ස්වාහං භික්ඛවෙ විහාරෙන පඨමාභි-සම්බුද්ධො විහරාමි තස්ස පදෙසෙන විහාසින්ති ඉමං පදෙසවිහාර සුත්තන්තං කථෙසි ... එවං ථෙරො පදෙසවිහාරසුත්තන්තවසෙන අභිධම්මස්ස නිදානං කථෙසි. ගාමවාසී සුමනදෙවත්ථෙරො පන හෙට්ඨාලොහපාසාදෙ ධම්මං පරිවත්තෙන්තො අයං පරවාදී බාහා පග්ගය්හ අරඤ්ඤෙ කන්දන්තො විය අසක්ඛිකං අට්ටං කරොන්තො විය ච අභිධම්මෙ නිදානස්ස අභාවම්පි න ජානාතීති වත්වා නිදානං කථෙන්තො එවමාහ. "එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං, තත්‍ර ඛො භගවා දෙවානං තාවතිංසානං අභිධම්මකථං කථෙසි: කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා''ති.[2]

අත්ථසාලිනියෙහි එන මේ පාඨයෙන් බෞද්ධවිශ්වකෝෂ ලියුම්කරු නගාගත් පූර්වෝක්ත අර්ථය හාස්‍යජනක යැ. මෙහි එනුයේ: ''අභිධර්මයට නිදානයෙක් කිසෙක් නැතැ' යි කරුණු ගත්වනු නො හැකි, එහි නිදාන මැ සොයා වෙහෙසෙන විරුද්ධවාදීහට මණ්ඩලාරාමවාසී තිස්සභූති තෙරුන් විසින් පදෙසවිහාරසූත්‍රාන්තය එළවා මහාබෝධි නිදානය අභිධර්මයට නිදාන සේ දක්වූ බව යි. එසේ මැ ග්‍රාමවාසී සුමනදෙව තෙරණුවන් විසින් ලෝහප්‍රාසාදයෙහි යටිමහල්හි දී අභිධර්මයට තාවතිංසනිදානය එළවූ බව යි. මෙතරම් සරල පාළිපාඨ දු වරදවාගෙන අභිධර්මය වැනි ගැඹුරු විෂයෙක් විවේචන කෙරෙමින් ආධුනිකයන් විසංවාදයෙහි හෙළීම බලවත් අපරාධ යෙකි.

අභිධර්මය පිළිබඳ ථේරවාද මතයට විරුද්ධ වැ බෞද්ධවිශ්වකෝෂයෙහි අභිධර්ම ලිපියෙහි දක්වන තවත් අදහස් කිහිපයක් මෙසේ යැ:

iv "අභිධර්මය වැඩීගියේ සූත්‍රාන්තයෙහි දේශනා කොට ඇති ධර්මය පැහැදිලි කිරීමට ගන්නා ලද උත්සාහයෙහි ප්‍රතිඵලයක් වශයෙනි"[3]

---

1. බෞද්ධ විශ්වකෝෂ 41 පිටුව, 2. අත්ථසාලිනී - හෙවිමු 25 පිටුව.
3. බෞ. වි. කෝ. 63 පිටුව

v "නිද්දෙසයත් පටිසම්භිදාමග්ගයත් පාළි අභිධම්ම ග්‍රන්ථ සත පහළ වීමට පළමු යුගයකට අයත් වෙයි "[1]

vi "මේ ග්‍රන්ථ දෙකෙහි මැ දේශනාව සම්පූර්ණයෙන් ආකූල යැ "[1]

vii "නිද්දෙසය බුද්ධඝෝෂ ඉපැරණි කොටසට අයත් වන අට්ඨක පාරායණ වැනි ධර්ම කොට්ඨාශයනට අභිධර්ම අර්ථ විවරණ සපයන ග්‍රන්ථයෝ යි"[1] යනු යි.

අභිධර්මපිටකය පසුකලෙක දී සූත්‍රාන්තපිටකයට කරනලද අර්ථවිවරණයක් සේ ලියුම්කරු මහතා සලකන බව මෙයින් පෙනේ. ඒ අනුව නිද්දෙසයත් පටිසම්භිදාමග්ගයත් ඉපැරණි අභිධර්ම අර්ථවිවරණ දෙක යි. අභිධර්මපිටකයට ගුරු වූයේ ද එ දෙක මැ යි. 'නිද්දෙසයත් පටිසම්භිදාමග්ගයත් පාළි අභිධර්ම ග්‍රන්ථ සත පහළ වීමට පළමු යුගයකට අයත් වෙති' කියන්නේ එහෙයිනි. අභාග්‍යයකට මෙන් නිද්දෙසය මැ ඒ මහතාට හරස් වෙයි. ධම්මසඞ්ගණි-යෙන් උද්ධෘතපාඨ සවිස්සකට (26) නො අඩු ගණනක් ද විභඞ්ගයෙන් උද්ධෘතපාඨ සතළොස (17) කට නො අඩු ගණනක් ද නිද්දෙසයෙහි දක්නා ලැබේ. එ හැම බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණාගත නිද්දෙසයෙහි පෙන්වා ඇත. මේ පාඨයන් නිද්දෙසයට ඇතුළු වූ සේ නිර්ණය කිරීමේ දී පළමු නිගමනයන් වෙනස් කොට අර්ථකථායෙහි පිහිට නොගත්තාට සිදුවනු ඇත.

'අභිධර්මය සූත්‍රාන්තයට කළ අර්ථවිවරණයෙකි' යන විමතිය බොහෝ දෙනා තුළ පහළ වැ ඇත්තේ නිද්දෙසයත් පටිසම්භිදාමග්ගයත් අභිධර්ම ග්‍රන්ථ දෙකක් සේ වරදවා ගැනීමෙන් වියැයුතු යැ. නිද්දෙසයත් පටිසම්භිදා-මග්ගයත් තේරුම් ගැනීමට නො හැකි වීම නිසා ඔවුන් මහ අවුලෙකැ වැටී සිටිනා බව නම් පැහැදිලි යැ. 'මේ දෙකෙහි දේශනාව සම්පූර්ණයෙන් ආකූල යැ' යි කියන්නේ ද එහෙයිනි. දහම් නය දතුවෝ නම් එහි කිසි අවුලෙක් නුදුටුවිරු ය.

නිද්දෙසයෙහි හෝ පටිසම්භිදාමග්ගයෙහි හෝ අභිධර්මලක්ෂණයක් එ දෙක පහළ වූ තැන් පටන් මෙතෙක් එක ද ආභිධර්මිකයෙක් නො දුටුයේ යි. ධර්ම විසින් ගතුත් සූත්‍රාන්තයත් අභිධර්මයත් අතර කිසි වෙනසෙක් නැති. වෙනස ඇත්තේ විභාගනයෙහි පමණි. සූත්‍රාන්ත සප්‍රදේශ කොට ද අභිධර්ම නිෂ්ප්‍රදේශ කොට ද විභක්ත වෙයි. එයින් ඒ ධර්මාතිරේක ද ධර්ම විශේෂ ද විය සූත්‍රාන්තය ව්‍යවහාරදේශනා යැ. අභිධර්මය පරමාර්ථදේශනා යි. මේ වෙනස නො හැඳින හෝ නො තකා හෝ අභිධර්ම විවේචනයට බැසීම අදූරෙහි අත බවනු වැන්න නිද්දෙසයෙහිත් පටිසම්භිදාමග්ගයෙහිත් සප්‍රදේශ නය මිස නිෂ්ප්‍රදේශ නයෙක් නො වේ.

**ප්‍රථම සඞ්ගීතියට පෙර අභිධර්මය නො වී ද?**

මේ ද අර්ථකථායෙහි නිරාකෘත ප්‍රශ්නයෙකි. එහෙත් 'අභිධර්මය ප්‍රථම සඞ්ගීතියෙන් පෙර නො වී' යයි කියන්නෝ අදත් ඇත. ඔවුන් අභිධර්මයෙහි පශ්චාත්කාලීනත්වය කීමට බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ 'අභිධම්ම' ශබ්දයට දැක්වූ නිරුක්ත්‍යර්ථය ද වහල් කොට ගන්නා බව පෙනේ. අභිධම්ම ශබ්දයෙහි අරුත් දක්වන තෙරණුවෝ අත්ථසාලිනී නම් ධම්මසඞ්ගණී අටුවායෙහි: "තත්‍ථ අභිධම්මොති කෙනට්ඨෙන අභිධම්මො, ධම්මාතිරෙක ධම්මවිසෙසට්ඨෙන. අතිරෙක විසෙසත්‍ථදීපකො හි එත්‍ථ අභිසද්දො".[2] එහි-

---

1 බෞ. වි කෝෂ 66 පිටුව. 2. අත්ථසාලිනී - හෙව්මු 2 පිටුව

අභිධම්ම යනු කවර අරුතෙකින් අභිධම් වෙයි යත්: ධම්මාතිරේක ධම් විශේෂාර්ථයෙනි. මෙහි 'අභි' ශබ්දය අතිරේකවිශේෂාර්ථදීපක හෙයිනි'' යි කීහු ටීකාවෙහි 'අභිධම්ම' යනු 'සුත්තන්තාධිකා පාළි[1] සූත්‍රාන්තයට අධික වූ පාළි'' යයි කියන ලදී. 'අභිධර්මය සූත්‍රාන්තයට පසු වැ ඇති වී යයි කියන්නන් අතිරේක විශේෂ ශබ්දයනට අලුත්-පසු වැ ඇති වූ යන අරුත් ගන්නා බව පෙනේ. ඒ අනුව 'අභිධම්ම' යනු 'අලුත් දහම' 'පසු වැ ඇති වූ දහම' නම් වෙයි. එහෙත් අතිරේක විශේෂ ශබ්දයන්හි ඒ අරුත නො ලැබෙයි.

'අභිධම්ම' ශබ්දයට යථෝක්ත නිරුක්ත්‍යර්ථ හා වාච්‍යාර්ථ දැක්වූයෝ බුදුගොස් තෙරණුවෝ යි. එහි දී උන්වහන්සේ දැක්වූ අරුත් මැ ගනු මිස තමන් රිසියෙන අරුතක් ගැනීම නො මැනැවි. නිරුක්ත්‍යර්ථයට වඩා වාච්‍යාර්ථය බලවත්ය. අභිධර්මය ධම්මාතිරේක ධම්මවිශේෂ වන අයුරු ද පැහැදිලි ලෙස බුදුගොස් තෙරණුවෝ මැ දක්වාලූහ.[2] අපිදු එය මුලදී දැක්වූමහ.

'අභිධර්මපිටකය සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු ශතවර්ෂ කිහිපයක් තුළ අනුක්‍රමයෙන් වැඩීගියේ යැ' යි කියන්නෝ ද වෙති. ආචාර්ය කොගෙන් මිශුනෝ (KOGEN MIZUNO) 'ක්‍රි. පූ 3 වැනි සියවස්හි මධ්‍යභාගය පටන් ක්‍රිස්තුවර්ෂාරම්භය දක්වා අභිධර්මයෙහි මූලග්‍රන්ථ සම්පාදනය වූ කාලය' යේ කියයි.[3] මේ වනාහි සාධක රහිත නිගමනයෙකි. කථාවත්ථුප්‍රකරණය මිස ත්‍රිපිටකයෙහි ඇතුළු වැ ගිය අන් එක ද ග්‍රන්ථයෙකැ හෝ ඔවුන්ගේ විමතියට අදාළ කාලනිර්ණයකට සත්‍ය සාධක දැක්වීමෙහි ඔහු නො සමත් වෙති. කථාවත්ථුප්පකරණ පිළිබඳ පවත්නා අටුවාහි ද ඉදුරා දක්වා ඇත. සෙසු තෙවළා දහම් රැසැයුණු අයුරු ද අටුවාහි එයි 'කථාවත්ථුප්පකරණය බුදුරදුන් තැබූ මාතිකාව ගෙන මොග්ගලීපුත්තතිස්ස තෙරණුවන් විසින් දඹදිව දම්සෝ මහනිරිදුන් දවස දෙශිත යැ' යි දක්වා ඇත. ඉදින් විරුද්ධවාදීන් සිතන කියන පරිදි තෙවළායෙහි පාළි, නිකාය, පකරණ ග්‍රන්ථ ඒ ඒ යුගයන්හි වෙන් වෙන් කතුවරුන් විසින් නිපදවන ලද නම් ඔවුන්ගේ නම්ගොත් ජීවනසමය ආදි පවත් කථාවත්ථුප්පකරණයෙහි දැක් වූ සෙයින් අටුවා ඇදුරන් විසින් නො දක්වා වළහාලන්නට හෙතු කිම? එසේ වළහා ලූ බවට සත්‍යසාධක දැක්විය හැකි ද? පෙළ බසත් දහම් නයත් නො දන හෝ වරදවා ගෙන හෝ එළවන මනඃකල්පිත සාධක මගින් 'අර දහම් පැරැණි යැ, මේ දහම් කොටස් අළුත් යැ' යි කියනු මිස මෙතෙක් කිසි විවේචකයෙක් සත්‍ය සාධක එළවා එය තර කිරීමට සමත් වූයේ නො වේ.

“නිකාය ග්‍රන්ථ අතුරෙහි මජ්ඣිම අඞ්ගුත්තර දෙනිකාය පසු කලකට අයත් වේ යයි ද අභිධර්මය ගැන සඳහන් වන්නේ එ දෙක්හි පමණෙකැ”[4] යි ද ආචාර්ය කෝගෙන් මිශුනෝ මහතා බෞද්ධ විශ්වකෝෂයෙහි කියයි. කවර කලෙක කවුරුන් විසින් ද යනු නො කියයි. ද්විතීයසංගීතියෙහි දී පෙළට ඇතුළු කරන ලද ඝොටමුඛ, මධුර, මුණ්ඩරාජ සූත්‍ර නිසා ආචාර්ය මිශුනෝට ඒ විමතිය පහළ වූයේ වන ඒ එක ද සූත්‍රයක් හෝ බුද්ධභාෂිත සේ දැක්වීමට සංගීතිකාරක තෙරවරුන් හෝ අටුවා ඇදුරන් හෝ කිසි තැනක් දරා ඇද්ද? යථෝක්ත සූත්‍රයන්හි බුදුදහමින් බැහැරි කිසිවක් නැත.

1. අභිධම්මමූලටීකා - මජ්ඣ. 12 පිටුව, 2. අට්ඨසාලිනී නිදානකථා - හෙවිමු 2 පිටුව.
3. බෞ. වි. කෝෂය 65 පිටුව 4. බෞ. වි. කෝ 66 පිටුව

බුද්ධදහම් ශ්‍රාවකභාෂිත වුව ද එය පෙළට ඇතුළු කිරීම දිවමනු බුදුරදුන් හමුයෙහි මැ සිදු වූයේ යි. සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු වැ දේශිත වුව ද යථෝක්ත සූත්‍රයන් පෙළට ඇතුළු කිරීමට කිසි බාධායෙක් නැත. එහෙත් ශ්‍රාවකභාෂිතයක් බුද්ධභාෂිත සේ දැක් වූ තැනෙක් නැත. එ හැම අටුවා ඇදුරෝ ඉඳුරා සඳහන් කෙරෙති. උත්තර මාතුපෙතවත්ථුව මෙයට හොඳ නිදසුනෙකි. එහි එන මහකසයින් තෙරණුවෝ බුදුරදුන්ගේ සම්මුඛශ්‍රාවක කෙනෙකි. උදේනරජ සම්මුඛ උපාසකයෙකි. අට්ඨකථායෙහි නො කියන ලද නම් ඒ කථාව ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීත නො වී යැ යි කිසිලෙසකින් දත නො හෙයි. එහෙත් එහි එන පුවත සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු සිදු වූ බවත් ද්විතීය සඞ්ගීතියෙහි දී පෙළට ඇතුළු කරනලද බවත් අටුවා ඇදුරෝ හෙළි කෙරෙති.[1] විතණ්ඩවාදීන් සිතන කියන පරිදි පශ්චාත්කාලීන රචනා බුදුන් කෙරෙහි හෝ උන්වහන්සේගේ සම්මුඛශ්‍රාවකයන් කෙරෙහි හෝ ආරෝපණය කිරීමට වෑයමෙක් වී නම් නිතැතින් මැ ප්‍රථමසඞ්ගීතියට ඇතුළුවියහැකි වැ තුබුණු මාතුපෙතවත්ථුව ද්විතීයසඞ්ගීතියෙහි සඞ්ගීත වී යැ යි සඳහන් කරනු ඇද්ද?

මජ්ඣිම අඞ්ගුත්තර දෙනිකායෙහි අභිධර්මය ගැන සඳහන් වීම ප්‍රමාණ කොටගෙන අභිධර්මපිටකය පශ්චාත්කාලීන රචනාවක් බව දැක්වීමට බෞද්ධ විශ්වකෝෂයෙහි ආචාර්ය මිශුනෝ යත්න දරා ඇත.[2] එහෙත් අභිධර්මය ගැන සඳහන් සූත්‍ර දිවමනු බුදුරදුන්ගේ සමයට අයත් වීමෙන් ඒ මහතා අනාථ වෙයි. එමතු දු නො වෙයි, අභිධර්මපිටකයට ද ගුරු වූයේ යැ යි අදහන මහානිද්දෙසයෙහි අඞ්ගුත්තරනිකායාන්තර්ගත සූත්‍රයන් ගෙන් උද්ධෘතපාඨ එකොළොසක් (11) පමණ ද මජ්ඣිමනිකායාන්තර්ගත සූත්‍රයන්ගෙන් උද්ධෘත පාඨ තෙළෙසක් (13) පමණ ද දක්නට ඇත.[3] ප්‍රථමසඞ්ගීති අවසන්හි මජ්ඣිමනිකාය සැරියුත් තෙරණුවන්ගේ අතැවැසියනටත් අඞ්ගුත්තරනිකාය අනුරුද්ධ තෙරණුවනටත් පැවැරූ බව සුමඞ්ගලවිලාසිනී නම් දීඝනිකායට්ඨකථායෙහි සඳහන් වෙයි. මිශුනෝ මහතා සිතන පරිදි අභිධර්මපිටකයෙහි යටත්පිරිසෙයින් ධම්මසඞ්ගණීප්පකරණය හෝ මජ්ඣිමනිකායටත් අඞ්ගුත්තරනිකායටත් පැරණි වියයුතු යැ: නිද්දෙසය ඉතිදු පැරණි වෙයි (මිශුනෝ මතය පරිදි) එයට ගුරු වූ හෙයිනි. අභාග්‍යයකට මෙන් මජ්ඣිමනිකායාගත සූත්‍රපාඨ ද අඞ්ගුත්තරනිකායාගත සූත්‍රපාඨ ද ධම්මසඞ්ගණී විභඞ්ගපාඨ ද නිද්දෙසයෙහි නිර්දිෂ්ට වෙයි. මේ අවුලෙහි දී මිශුනෝ මහතාට සිදුවනුයේ විනයෙහි[4] අභිධර්ම සඳහන ගැන ඕල්ඩන්බර්ග් මහතා කී පරිදි 'පසුකලෙක ඇතුළු කරන ලදැ' යි කියා ලිස්සා යැමට යි. යථෝක්ත කරුණු අනුව මජ්ඣිමනිකායෙහිත් අඞ්ගුත්තරනිකායෙහිත් අභිධර්මය ගැන සඳහන ප්‍රමාණ කොට අභිධර්මයෙහි පශ්චාත්කාලීනත්වය සනාථ කරන්නට යන්නෝ අනාථ වැ ඇද වැටෙති.

**ත්‍රිපිටකයෙහි යුග බෙදීම්:** ත්‍රිපිටක බුද්ධවචනය යුග වශයෙන් බෙදන්නට යැමෙන් විවේචකයෝ මහ අවුලෙක පැටලී සිටිති. පාළි විසින් හෝ නිකාය විසින් හෝ පකරණ විසින් හෝ ගෙන අසුවල් පාළිය, නිකාය, පකරණය අනෙකට වඩා අළුත් යයි හෝ පැරණි යයි හෝ කිවහැකි කිසි ප්‍රමාණයෙක් නැත. ශික්ෂා විසින් හෝ සූත්‍ර විසින් හෝ විභාග කරත්හොත් ආයාසයෙන් පෙර පසු භෙද වෙන් කොට ගත හෙයි. තෙවලා බුදු වදන් පිටකයෙහි සඞ්ග්‍රහ කරන ලද්දේ දේශිත පරිපාටිය

1 පෙතවත්ථුඅට්ඨකථා - හෙවිමු. 105 පිටුව 2. බෞ. වි. කෝෂය 66 පිටුව.
3. නිද්දෙසප ශ්‍රී බුද්ධජයන්ති මුද්‍රණය. 4. පාචිත්තියපාළි - විලේඛනසික්ඛාපද

අනුව නො වැ ග්‍රහණධාරණයෙහි පහසු පිණිස ස්වරූපසාම්‍යය අනුව යි. දේශනා අනුපිළිවෙළ ගන්නා ලද නම් 'ධම්මචක්කප්පවත්තන' සූත්‍රය සඞ්ග්‍රහ කළයුතු වන්නේ සච්චසංයුත්තයෙහි නො වැ දීඝනිකායෙහි ප්‍රථම සූත්‍රස්ථානයෙහි යැ. මේ බව නො සිතන ත්‍රිපිටක විවේචකයන් ප්‍රථම සඞ්ගීතියෙන් පසු වැ දේශිත මූණ්ඩරාජ, ඝොටමුඛ, මධුර වැනි සූත්‍රයන්හි මූලා වැ අඞ්ගුත්තරනිකායත් මජ්ඣිමනිකායත් 'පශ්චාත්කාලීන රචනා' යයි සිතනු වියහැකි යි. එහෙත් යථොක්ත සූත්‍ර එකක් හෝ ප්‍රථමසඞ්ගීතියෙන් පෙර දේශිත වූ බව දක්වීමට කිසි වෑයමක් ස්ථවිරවාදීහු කර නැත. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු දේශිත කිසි දහමක් බුද්ධකාලය හා සම්බන්ධ කොට දක්වා ඇති බවක් සහෙතුක වැ කීමට මෙතෙක් කිසිදු විවේචකයෙක් සමත් නො වි.

ත්‍රිපිටකයෙහි යුග බෙදනුවන් පෙළ බසත් දහම්නයත් නො දැන මූලා වූ සේ නම් පැහැදිලි වැ පෙනේ. අපදානපාළියෙහි නව්‍යත්වය සනාථ කිරීමටත් එයින් මැ 'පශ්චාත්කාලීන රචනා බුදුරදුන් කෙරෙහි හෝ උන්වහන්සේගේ සම්පශ්‍රාවකයන් කෙරෙහි හෝ ආරෝපණය කිරීමට ස්ථවිරවාදීහු නැත් කොට ඇතැ' යි කීමටත් අභේද්‍ය සාධක යේ බොහෝ උගතුන් ප්‍රමාණ කොට ගන්නා අපදාන ගාථාවක් මෙහි ලා නිදසුන් කළ හැක්ක.

අපදානයෙහි:

"අභිධම්මනයඤ්ඤූහං කථාවත්ථුවිසුද්ධියා
සබ්බෙසං විඤ්ඤාපෙත්වාන විහරාමි අනාසවො"

යන්න නිසැකයෙන් මැ කථාවත්ථුප්පකරණය සඳහන් කරතියි ද කථාවත්ථුප්පකරණය සම්පාදිත වූයේ මොග්ගලිපුත්තතිස්ස තෙරුන් විසින් වන බැවින් අපදානය අන්තිම වරට සකස් වූයේ තෘතීයසඞ්ගීතියෙනුත් පසු කලෙකැ යි ද කියත්තෝ ඇත. පූර්වොක්ත ගාථායෙහි අරුත් විමසත් හොත් එයින් මොග්ගලිපුත්තතිස්ස තෙරණුවන් විසින් සම්පාදිත කථාවත්ථුප්පකරණය සඳහන් වන බවක් නිසැකයෙන් තබා සැකයෙනුදු ගත නො හෙයි. ඔවුන් ගාථායෙහි එන 'අභිධම්ම' ශබ්දයෙහිත් 'කථාවත්ථු' ශබ්දයෙහිත් මූලා වූ සේ යැ. අට්ඨකථායෙහි එන 'කථාවත්ථුප්පකරණෙ' යන්නෙහි වඩාලා මැ මූලා වන්නට ඇත. ගාථායෙහි අරුත් විමසන ලද නම් නගාගත් අභේද්‍යසාධකය ගැන සිනා නැගෙනු ඇත. 'කථාවත්ථු' යනු කථාවත්ථුප්පකරණ (මොග්ගලිපුත්තතිස්ස සම්පාදිත) යයි ගතුත් 'විසුද්ධියා' යන්නට කවර අරුතක් ගනී දැ යි නො දනුම්හ. එයින් 'කථාවත්ථුප්පකරණයෙහි ශෝධනයක් අදහස් කෙරේ' යයි නො කිව මැනැවි.

පූර්වොක්ත ගාථායෙන් මන්තානිපුත්‍ර පූර්ණ තෙරණුවෝ: 'අභිධර්මනය දන්නා මම (දශ) කථාවස්තු විශුද්ධියෙන් හැමදෙනාහට විඥාපන කොට අනාස්‍රව වැ වෙසෙමි'' යි කියති. උන්වහන්සේ දශකථාවස්තුයෙහි ලා සප්ත විශුද්ධීන් ද සප්ත විශුද්ධියෙහි ලා දශකථාවස්තූන් ද දේශනා කරන ධර්මකථික තෙරකෙනකුන් වශයෙන් හැමදෙනා කෙරෙහි ප්‍රකාශයට පත්වූහ. රථවිනීත සූත්‍රයෙහි[1] එය පැහැදිලි ලෙස දක්වෙයි. කථාවස්තුවිශුද්ධිය අට්ඨකථායෙහි[2] විස්තර කොට ඇත. බුදුරදුන් හමුයෙහි ධර්මකථික භික්ෂූන් අතුරෙහි අගතැන් ලද පූර්ණතෙරණුවන්ගේ අපදානයට බුදුන් පිරිනිවි හවුරුදු දෙසියසතිස (236) කට පසු සම්පාදිත ග්‍රන්ථයක් සම්බන්ධ කිරීම සිහි ඇතියකු විසින්

1. මජ්ඣිමනිකාය 2. පපඤ්චසූදනී, රථවිනීතසුත්තවණ්ණනා - හෙවිමු 2-131 පිටුව

කරනු ඇද්ද? මෙතරම් සුළු කරුණු පවා වරදවා ගනුවන්ගේ පුග බෙදීම් කථා ප්‍රතිඝා විරහිත ප්‍රලාප පමණි. තෙවලා බුද්ධදහමට ඉන් වන හානී නැත ද ආධුනිකයනට නම් මහත් හානි වෙයි. දහමහි නැක දනවන හෙයිනි.

ප්‍රථමසඞ්ගීතියෙන් පෙර අභිධර්මය නොවී' යයි කියන්නෝ සහෙතුක වැ එය තර කිරීමට නො සමත් වෙති. ඔහු මැ විනයපිටකයත් සූත්‍රාන්තපිට-යත් ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීත වූ බව පිළිගනිති. විනයෙහි ද සූත්‍රාන්ත-යෙහි ද නොයෙක් තැන අභිධර්මය ගැන සඳහන් වෙයි. පළමු ද එබඳු කිහිපතැනක් දක්වාලුම්හ. එ ද මෙහි ලා ගන්නේ යැ. තවද,

**පාචිත්තියපාළියෙහි**: "අනාපත්ති න විවණ්ණෙතුකාමො, ඉඞ්ඝ තාව ආවුසො සුත්තන්තං වා ගාථායො වා අභිධම්මං වා පරියාපුණස්සු, පච්ඡාපි විනයං පරියාපුණිස්සසීති භණති."[1] යන පාඨයෙහි අභිධර්මය සඳහන් වෙයි. ඕල්ඩන්බර්ග් මහතා සිතන පරිදි 'අභිධම්මං' යනු පසුකාලෙකැ ඇතුළු කරන ලදැයි පිළිගත නො හැකි යැ. ශික්ෂා පැනවීම හෝ වෙනස් කිරීම ශ්‍රාවකවිෂය නො වෙයි. බුද්ධානුබුද්ධකසික්ඛා සමූහනන-යට බුදුරදුන්ගෙන් ලද අවසරය ද ප්‍රථමසඞ්ගීතියෙහි දී ප්‍රතික්ෂෙප කරන ලදී. ශ්‍රාවකයන් ශික්ෂා පැනවූ හෝ වෙනස් කළ බවට වෙනත් සාධක ද නො ලැබෙයි

**මහාවග්ගපාළියෙහි**: "පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං න නිස්සයො දාතබ්බො න සාමණෙරො උපට්ඨාපෙතබ්බො, න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියකාය සික්ඛාය විනෙතුං, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං."[2] යන පාඨය එයි. මෙහි දැක්වෙන සේ උපසපත් කරන, නිස දෙන, හෙරණුන්ගෙන් උවටැන් ගන්නා ආචාර්‍ය උපාධ්‍යායයන් කෙරෙහි අවශ්‍යයෙන් තිබියයුතු අඞ්ග අතුරෙහි අන්තෙවාසි-කයා හෝ සද්ධිවිහාරිකයා හෝ අභිධර්මයෙහි විනයනය කරන්නට ප්‍රතිබල වීම ද එකෙකි. "අභිධම්මෙති නාමරූපපරිච්ඡෙදෙ" යි අභිධර් යනු නාමරූපපරිච්ඡේද බව එහි අට්ඨකථායෙහි එයි නාමරූපපරිච්ඡේද යනු අභිධර්මයෙහි පර්‍යායනාමයෙකි.

**මජ්ඣිමනිකායෙහි**: මහාගොසිඞ්ගසූත්‍රයෙහි "ඉධ භික්ඛූ අභිධම්මකථං කථෙන්ති" ආදීන් අභිධර්මය පිළිබඳ සඳහන පළමු දැක්වූම්හ එහි මැ ගුලිස්සානි සූත්‍රයෙහි "ආරඤ්ඤකෙනාවුසො භික්ඛුනා අභිධම්මෙ අභිවිනයෙ යොගො කරණීයො."[3] යන පාඨයෙහි අභිධර්මය දැක්වෙයි. "අභිධම්මෙ අභිවිනයෙති අභිධම්මපිටකෙ චෙව විනයපිටකෙ ච"[4] යි. 'අභිධම්ම' යනු අභිධර්මපිටකය බව අර්ථකථායෙහි පැහැදිලි වැ එයි.

අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරණුවන්ගේ බෑණණුවෝ - මන්තානිපුත්‍ර පුණ්ණ තෙරණුවෝ සම්බුදුරදුන් හමුයෙහි ධර්මකථික භික්ෂූන් අතුරෙහි අගතැන් ලදහ. අඞ්ගුත්තරනිකායෙහි එතදග්‍රපාළියෙහි උන්වහන්සේගේ නම සඳහන් වෙයි මෙහි 'ධම්මකථික' යනු ආභිධම්මික යන අර්ථයෙහි යොදනලද වෙයි.

---

1. පාචිත්තියපාළි – විලෙඛන සික්ඛාපද 2 මහාවග්ගපාළි - ජමූ 160 පිටුව
3. මජ්ඣිමනිකාය ගුලිස්සානිසුත්ත - ඤාස. 2-107 පිටුව
4. පපඤ්චසූදනී ගුලිස්සානිසුත්තවණ්ණනා.

පුණ්ණත්ථේරාපදානයෙහි: "අභිධම්මනයඤ්ඤූහං" යනුවෙන් තමන් අභිධම්මනයඥ ( අභිධර්මනය දන්නා ) බව තෙරණුවෝ මැ පවසති එසින් උත්වහන්සේ ධම්මකථික වූහ "ආභිධම්මිකො එව ධම්මකථිකො" යන අට්ඨකථා සමග ද එය සැසැඳෙයි. මජ්ඣිමනිකායෙහි 'රථවිනීත' සූත්‍රයෙන් එය තවද තහවුරු වෙයි.

මහානිද්දෙසයෙහි උද්ධෘතපාඨ දක්වා ඇති අයුරු ද මෙහි දී සලකනු වටී. සුත්තනිපාතයෙහි අට්ඨකවග්ගයට අර්ථ නිර්දේශ කරන පිණිස දහම් සෙනෙවි සැරියුත් තෙරණුවන් විසින් සම්බුදුරදුන් ධරමාන කල්හි මැ මහානිද්දෙසය දෙශිත යැ. එහි තුන්පිටකයෙහි නොයෙක් තැනින් උද්ධෘත නොයෙක් පාඨ දක්නට ඇත ඔවුනතුරෙහි ධම්මසඞ්ගණීපාඨ සවිස්ස (26) කට නො අඩු සඞ්ඛ්‍යාවක් ද විභඞ්ගපාඨ සතලොස (17) කට නො අඩු සඞ්ඛ්‍යාවක් ද වෙයි. එහැම මහානිද්දෙස බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණාඞ්ක-යෙහි දක්වා ඇත. එහි පාඨනිර්දේශයෙහි ද විශේෂයෙක් වෙයි. සූත්‍රාන්ත-යෙන් හා විනයෙන් උද්ධෘතපාඨ නිර්දේශ කිරීමෙහි දී "තෙනාහ භගවා" යනුවෙන් එය බුදුන් වදාළ සේ දක්වති. එහෙත් අභිධර්මපාඨ නිර්දේශයෙහි දී එය වදාළ කෙනකුන් සඳහන් නො කෙරෙති. අභිධර්මයෙහි වාචනාමාර්ගය සැරියුත් තෙරණුවන් සතු වීම මැ එසේ සඳහන් නො කිරීමට හෙතු වී. "අභිධම්මෙ වාචනාමග්ගො නාම සාරිපුත්තත්ථෙරප්පභවො" යි අත්ථසාලිනි-යෙහි කියන ලදී.[1] මෙසෙයින් බලත් මැ "ප්‍රථමසඞ්ගීතියෙන් පෙර අභිධර්මය නො වී" යනු ප්‍රතිඥා රහිත වැ බිඳ වැටෙන තැනෙකි.

## අභිධර්මය ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීත නො වී ද?

ප්‍රථමසඞ්ගීතියට පෙර අභිධර්මය පැවැති බවට කරුණු පළමු දක්වූමහ. එසින් එය සඞ්ගීතියෙහි ඇතුළු නො වන්නට කිසි කරුණෙක් නැත. පඤ්චසතිකක්ඛන්ධකයෙහි "හන්ද මයං ආවුසො, ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායාම"[2] යන තන්හි ධම්මවිනය මිස අභිධර්මය වෙන් කොට නො දැක්වීම ප්‍රථමසඞ්ගීතියෙහි අභිධර්මය සඞ්ගීත නො වී යයි කීමට එක් හේතුවක් ලෙස ගන්නා බව පෙනේ. පඤ්චසතිකක්ඛන්ධකය ප්‍රථමසඞ්ගීතිය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් පමණි. එහි අභිධර්මය පමණක් නො වැ අභිවිනය ගැන ද සඳහනෙක් නැත. 'ධම්මවිනය' යනු ත්‍රිපිටකයෙහි නොයෙක් විභාගක්‍රමයන් අතුරෙහි එක් ක්‍රමයෙකි. ධම්මවිනය ගත්කලැ තෙවළා බුදුවදන් එහි ඇතුළු වැ සිටී. සූත්‍රාන්තයෙන් වෙන් කොට දැක්වූවමනා තන්හි මිස අන් තන්හි 'අභිධම්ම' යයි වෙසෙසා කිවයුතු නො වෙයි. සුත්තන්ත අභිධම්ම දෙක්හි මැ සාමාන්‍ය සංඥාව 'ධම්ම' හෙයිනි.

'ධම්ම ශබ්දයෙහි අභිධම්මය සඞ්ග්‍රහ නො වෙතී'යි ගනුත් 'විනය, ශබ්දයෙහි අභිවිනය ද සඞ්ග්‍රහ නොවෙතී'යි ගත යුතු වෙයි. එවිට ඛන්ධක හා පරිවාර හා මෙ දෙක ද ප්‍රථම සඞ්ගීතියෙන් බැහැර කරන්නට සිදු වෙයි පරිවාරය තිබියේවා, ආභිසමාචාරික ශික්ෂා සඞ්ග්‍රහය වූ චුල්ලවග්ග මහ වග්ග සඞ්ඛ්‍යාත ඛන්ධකය ප්‍රථම සඞ්ගීතියෙහි සඞ්ගීත නො වී යයි කියමෝ ද? ඛන්ධකශික්ෂා විභඞ්ගශික්ෂාවනට පළමු පනවන ලද වෙයි එසින් එය අවශ්‍යයෙන් සඞ්ගීත විය යුතු බව පිළිගත යුතු යැ. වෙසෙසා නො දක්වූ අභිවිනය 'විනය' ශබ්දයෙහි මැ ඇතුළු වැ සිටියේ යි. 'විනය' ශබ්දයෙහි ැභිවිනය සඞ්ග්‍රහ වන්නා සේ 'ධම්ම' ශබ්දයෙහි 'අභිධම්ම' ද සඞ්ග්‍රහ වෙයි. එසින් පඤ්චසතිකක්ඛන්ධකයෙහි අභිධම්මය වෙසෙසා නො දක්වීම ප්‍රථම සඞ්ගීතියෙහි අභිධර්මය සඞ්ගීත නො වී යයි කීමට කරුණෙක් නො වේ.

---

අත්ථසාලිනී - නිදානකථා, 14 පිටුව    2. චුල්ලවග්ගපාළි - 369 පිටුව

ප්‍රථමසඞ්ගීතියෙහි දී අභිධම්මපිටකය පැවැරූ පුද්ගලයකු සඳහන් නොවීම ද එය එහි සඞ්ගීත නො වී යයි කීමට ගන්නා තවත් හේතුවක් බව පෙනේ. සඞ්ගීතිකාරක මහරහතුන් වහන්සේ විනයපිටකය උපාලි තෙරණු-වනටත් දීඝනිකාය අනඳතෙරණුවනටත් මජ්ඣිමනිකාය සැරියුත්තෙරණු-වන්ගේ අතැවැසියනටත් සංයුත්තනිකාය මහසුප් තෙරණුවනටත් අඞ්ගුත්තරනිකාය අනුරුද්ධ තෙරණුවනටත් පැවැරූ බව සුමඞ්ගලවිලාසිනී දීඝනිකායට්ඨකථායෙහි[1] දක්වෙයි. අභිධම්මපිටකය පැවැරූ වෙන මැ පුද්ගලයකු සඳහන් නො වෙයි. එහෙත් අභිධර්මය සඞ්ගීතියට නඟා පන්සියක් මහරහතුන් වහන්සේ සජ්ඣායනා කළ බව ''පඤ්චඅරහන්තසතානි සජ්ඣායමකංසු''[2] යි එහි මැ දක්වෙයි. අත්ථසාලිනී-ධම්මසඞ්ගණී අට්ඨකථා-යෙහි සැරියුත් මහරහතුන් වහන්සේ පටන් අභිධර්මපිටකය පවත්වා ගෙන ආ ඇදුරුපරපුර තෘතීයසඞ්ගීතිය හිමි කොට නම් වශයෙන් දක්වා ඇත.[3]

ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීත වූ අභිධර්මපිටකය පවත්වාගෙන ඊමේ භාරය කිසි පුද්ගලයකුට නො පැවරීමට ද හේතුවක් විය යුතු යැ. අභිධර්මපිටකය පමණක් නො වැ සූත්‍රාන්තයෙහි ඛුද්දකනිකාය භාරය පැවැරූ කෙනෙක් ද සඳහන් නො වෙති. නිකාය පස මැ සඞ්ගීතියට නැඟූ බව පඤ්චසතිකක්ඛන්ධකයෙහි දක්වෙයි[4] අභිධර්මපිටකයත් ඛුද්දකනිකායත් එහි දී කිසිවකුට භාර නො කිරීමට හේතු කිම?

ප්‍රථමසඞ්ගීතියෙහි දී පුද්ගලයනට නොපවරනලද බොහෝ දහම් කොටස් බුදුරදුන් හමුයෙහි මැ සඞ්ගෘහීත වැ වෙන වෙන මැ හදාරාගෙන ආ බවට නිදසුන් ත්‍රිපිටකයෙහි මැ ඇත. බුද්ධත්වයෙන් සත්වැනි වස දම්සෙනෙවි සැරියුත් මහරහතුන් වහන්සේ අභිධර්මය වාචනාමාර්ගයට නඟා උන්වහන්සේ ගේ පන්සියක් අතැවැසියනට හැදෑරවූහ.[3] ඛුද්දකනිකායෙහි ඇතුළු වැ සිටුනා නිද්දෙස හා පටිසම්භිදාමග්ග හා මෙදෙක ද සැරියුත් තෙරණුවන්ගේ මැ දේශනා යි. එ ද උන්වහන්සේ ගේ අතැවැසියන් කෙරෙහි පවත්නට ඇත. සොණකුටිකණ්ණ තෙරණුවන් මහකසයින් තෙරණුවන් වෙත සුත්තනිපාතය හදාළ බව සොණ තෙරුන්ගේ වතෙහි එයි. ධම්මපදය එකල වෙන මැ ධර්මසඞ්ග්‍රහයක් සේ හදාළ බව පෙනේ. V කසුප් රජ ද එබව ධම්පියාඅටුවාගැටපදයෙහි: ''බුදුන් සඳෑ මෙතියර දෙශනා ධම්මපද නම් යී වෙන් කොට හජාරන බැවින්''[5] යි සඳහන් කරයි. ථෙරගාථා ආදී අන් තන්හිදු ධම්මපද ගාථා දක්නා ලැබෙනුයේ එය වෙන මැ ධර්මසඞ්ග්‍රහ-යක් වශයෙන් පඨනපාඨනයෙහි පැවැති නිසා යයි සැලකිය යුතු යැ. ආරම්භයෙහි පටන් බුද්ධචරිතය හා සමග ජාතකදේශනා සම්බන්ධ වැ පවතී. ශාස්තෘශාසනාඞ්ග අතුරෙහි ජාතක ද එකෙකි. පසුකලෙකැ ජාතක භාණක නමින් වෙන මැ දේශකගණයෙක් ද හමුවෙයි. සාඤ්චිස්තූප ආදියෙහි දක්නා පැරණි සෙල් කැටයම් භාරතීය ජනයා ජාතක කථා කෙරෙහි දක්වූ සැලකිල්ලට දෙස් දෙයි. සම්බුද්ධපරිනිර්වාණයෙන් පළමු මැ ජාතකදේශනාත් වෙන මැ සඞ්ගෘහීත වැ පැවැති බව දතයුතු යැ

මෙසෙයින් බලත් මැ ප්‍රථමසඞ්ගීතියෙහි දී පුද්ගලයනට නො පැවැරූ ධර්මසඞ්ග්‍රහයන් අතුරෙහි වැඩි කොටසක් සම්බුද්ධපරිනිර්වාණයෙන් පළමු මැ සඞ්ගෘහීත වැ යම් යම් පුද්ගලයන් භාරයේ පැවැති බව පිළිගැනීමට කරුණු

1 සුමඞ්ගලවිලාසිනී - ස සං. 11 පිටුව    2. සුමඞ්ගලවිලාසිනී - ස සං. 11 පිටුව.
3. අත්ථසාලිනී - නිදානකථා.    4. චුල්ලවග්ගපාළි-පඤ්චසතිකක්ඛන්ධක, ඤූසං. 371 පිටුව.
5 ධම්පියා අටුවා ගැටපද - ඩී. බී. ජයතිලක, 19 පිටුව

ඇත. පුද්ගලයනට පවරන ලද දීඝනිකායාදි නිකාය සතර සඞ්ගීතියට පළමු සඞ්ගායිත වැ පැවැති බවක් හෝ පුද්ගලයනට පැවැරී තුබුණු බවක් හෝ නො පෙනේ. විනයෙහි උද්දෙසපරියාපන්න ශික්ෂා හැර සෙස්ස සඞ්ගායිත වැ තුබුණු බවට ද කරුණු නො පෙනේ. ප්‍රථම සඞ්ගීතියෙහි දී ශික්ෂා පිළිවෙළින් සූත්‍ර පිළිවෙළින් ගෙන සඞ්ග්‍රහ කරන ලද්දේත් සඞ්ගීති අවසන්හි පුද්ගලයනට පවරන ලද්දේත් එයට පෙර සඞ්ගායිත නො වූත් පුද්ගලයනට නො පවරන ලද්දවූත් ධර්මවිනය යයි සිතියයුතු යැ. සම්බුදුරදුන් හමුයෙහි නයග්‍රහණය කොට වාචනාමාර්ගයට නඟන ලදු වැ සැරියුත් තෙරණුවන්ගේ අතවැසියන් අත පැවැති අභිධර්මපිටකය අන් කිසිවකුට පැවැරිය යුතු නො වේ. එහෙත් ථේරානුමති සඳහා සඞ්ගීතියට නඟන ලද්දේ යැ. අට්ඨකථායෙහි සඞ්ගායනා කළ බව පමණක් දක්වා පැවැරූ පුද්ගලයන් සඳහන් නො කිරීමට හේතු වූයේ මේ කරුණ යැයි දතයුතු යි.

ද්විතීයසඞ්ගීතියෙහි දී සස්නෙන් බැහැර කරන ලද වජ්ජිභික්ෂූන් විසින් පිහිටුවා ගන්නා ලද මහාසඞ්ඝික නිකායවාසීන් අභිධර්මප්‍රකරණ සය නො පිළිගත් බව දීපවංසයෙහි දක්වෙයි. එයින් එද ස්ථවිරභික්ෂූන් කෙරෙහි අභිධර්මප්‍රකරණ සය තුබුණු බව කියැවෙයි, ද්විතීයසඞ්ගීතියට රැස් වූ තෙර-වරුන් අතුරෙහි අට නමක් බුදුරදුන්ගේ සම්මුඛශ්‍රාවකයෝ යි. සඞ්ඝස්ථවිර-සබ්බකාමී මහරහතුන් වහන්සේ උපසපන් එක්සියවිසිවස් ඇති වූහ. එවිට යටත් පිරිසෙයින් උන්වහන්සේ ජන්මයෙන් එක්සියසාළිස් (140) වස් පිරී සිටියයුතු යැ. බුදුන් පිරිනිවි සියක් වන හවුරුද්දෙහි සඞ්ගායනාව කරන ලද බැවින් සබ්බකාමීතෙරණුවනට බුදුන් ප්‍රත්‍යක්ෂයෙහි සතළිස් වසක් ගෙවී ඇත. උන්වහන්සේ ධර්මභාණ්ඩාගාරික අනඳ තෙරණුවන්ගේ සද්ධිවිහාරික වෙති. ප්‍රථමසඞ්ගීති පවත් මැනැවින් දැන සිටියහ. අභිධර්මපිටකය ප්‍රථම සඞ්ගීතියෙහි සඞ්ගීත නො වී නම් ද්විතීය සඞ්ගීතියට නො ගනු ඇත.

## ධම්මසඞ්ගණී සංඛෙප

සප්තප්‍රකරණයන් අතුරෙහි පළමු වැන්න ධම්මසඞ්ගණීප්පකරණ නම්. 'ධම්මසඞ්ගණී' යනු ධර්මසඞ්ග්‍රහ යන අර්ථ ඇත්තේ යි. සුමඞ්ගලවිලාසිනියෙහි එය 'ධම්මසඞ්ගහ' යි නම් කොට ඇත.[1] මෙහිලා වේදනා, සංඥා, සංස්කාර, විඥාන සඞ්ඛ්‍යාත චතුර්විධ නාමස්කන්ධපර්‍යාපන්න වැ චිත්තාඞ්ග විසින් පෙළෙහි ආ ඵස්සාදි සපනස් (56) ධර්මයෝ යැ පෙළෙහි නො එතුදු යෙවාපනක විසින් ගන්නාලද ඡන්දාදි නවධර්මයෝ යැයි පන්සැටක් (65) පමණ වූ නාමධර්මයෝ ද චතුර්විධභූතරූප යැ තෙවිසි උපාදායරූප යැයි සත්විසි වැදෑරුම් වූ භූතොපාදායරූපයෝ ද යන නාමරූපධර්මයෝ සඞ්ගායිත වෙති.

ධම්මසඞ්ගණීප්පකරණයෙහි චිත්තවිභත්ති යැ රූපවිභත්ති යැ නික්ෂෙප-රාශි යැ අත්ථොද්ධාර යැ යි විභත්ති (විභාග) සතරකි. සතර භූමියෙහි වූ එකුන් අනූ චිත්තයන්ගේ විභාගය චිත්තවිභත්ති නමු. චිත්තොප්පාදකාණ්ඩ යනුදු එයට නමි. එ ද මාතෘකා පදභාජනීය විසින් ද්විවිධ වෙයි.

**මාතෘකා**: අභිධර්මමාතෘකා යැ සූත්‍රාන්තමාතෘකා යැ යි මාතෘකා ද්විවිධ යි. එහි පරිච්ඡේද පනලොසෙකි. කුශලත්‍රිකාදි විසින් ආරබ්ධ දෙවිසි ත්‍රිකමාතෘකා එක් පරිච්ඡේදයෙකි. ද්විකමාතෘකා තුදුසෙකි. එහි 'හෙතු ධම්මා න හෙතු ධම්මා' ආදි ද්වික සයෙක් ග්‍රන්ථ විසින් ද අර්ථ විසින් ද අන්‍යෝන්‍ය

1. සුමඞ්ගලවිලාසිනී - සං. 12 පිටුව.

සම්බන්ධ බැවින් කලාප සෙයින් සිටියේ 'හෙතුගොච්ඡක' යයි කියනු ලැබෙයි. ඉක්බිති 'සප්පච්චයා ධම්මා, අප්පච්චයා ධම්මා' ආදි අඤ්ඤොඤ්ඤ සම්බන්ධ නො වූ ද්වික සතෙක් ද්වික සාමාන්‍යයෙන් ගෙන වෙන් වෙන් වැ ගොච්ඡක අතුරෙහි තබන ලද වන බැවින් ද මහන්තර ද්විකයට වඩා කුඩා වූ බැවින් ද 'චූලන්තර ද්වික' නම් වෙයි. අනතුරු වැ ආස්‍රව, සංයොජන, ග්‍රන්ථ, ඕඝ, යොග, නීවරණ, පරාමර්ශ යන එකෙකී ගොච්ඡකයෙහි ද්වික සය බැගින් කියන ලද වෙයි. ඉක්බිති 'සාරම්මණා ධම්මා' ආදීන් ආරබ්ධ තුදුස් ද්විකයෙක් 'මහන්තරද්වික' නම් වෙයි. තදනන්තර වැ 'උපාදානා ධම්මා' ආදි ද්වික සයෙක් 'උපාදානගොච්ඡක' නමුදු 'කිලෙසා ධම්මා' ආදි ද්වික අටෙක් 'කිලෙස-ගොච්ඡක' නමුදු වෙයි. ඉක්බිති 'දස්සනෙන පහාතබ්බා' ආදි අටළොස් ද්විකයෙක් අභිධර්මමාතෘකා අවසන්හි ස්ථාපිත වන බැවින් පිට්ඨිදුක නම් වෙයි. 'විජ්ජාභාගිනො ධම්මා' ආදි දෙසාළිස් ද්විකයන්ගේ සඞ්ග්‍රහය සූත්‍රාන්තමාතෘකා නමි. මෙසේ චිත්තවිභක්තිමාතෘකා පසළොස් පරිච්ඡෙද-යෙකින් සමන්වාගත වේ.

සප්‍රදෙශ නිෂ්ප්‍රදෙශ විසිතුදු මාතෘකා ද්විවිධ වෙයි. උද්දිෂ්ටධර්මයන් අතුරෙහි ත්‍රික නවයෙක් ද ද්වික එක්සැත්තෑවෙක් දූ යි අශීතිධර්ම කෙනෙක් සප්‍රදෙශ රූපාරූපධර්මයන් ගන්නා ලද බැවින් සප්‍රදෙශ වෙති. ත්‍රිකයන් අතුරෙහි: වෙදනා ත්‍රික යැ විතර්කත්‍රික යැ ප්‍රීතිත්‍රික යැ උත්පන්නත්‍රික යැ අතීතත්‍රික යැ ආලම්බනත්‍රික සතර යැ යන නවත්‍රිකයෝ සප්‍රදෙශයෝ යි. ද්විකධර්මයන් අතුරෙහි හෙතුගොච්ඡකය පටන් උපාදානගොච්ඡකය හිමි කොට ඇති නව ගොච්ඡකයෙහි අවසන් තුන් තුන් ද්වික විසින් සත්විසි ද්විකයෝ යැ කෙලශගොච්ඡකයෙහි අවසන් සතර ද්විකයෝ යැ "චිත්තවිප්ප-යුත්තා ධම්මා චිත්තසම්පයුත්තා ධම්මා, චිත්තසංසට්ඨා ධම්මා චිත්තවිසංසට්ඨා ධම්මා" යන මහන්තර ද්වික දෙක යැ, දෙසාළිස් සූත්‍රාන්ත ද්විකයන් අතුරෙහි අධිවචන, ප්‍රඥප්ති, නිරුක්ති, නාමරූප යන මේ සතර ද්විකයන් තබා අටතිස් ද්විකයෝ යැ යන මොහු සප්‍රදෙශ වෙති. අවශේෂධර්මයෝ නිෂ්ප්‍රදෙශ වෙත්.

**පදභාජනීය:** මාතෘකාවට අනතුරු වැ මාතෘකායෙහි සඞ්ගෘහීත ධර්මයන් ප්‍රභේද විසින් දක්වන්නට පදභාජනීය එයි. පදභාජනී නිර්දෙශයෙහි ධම්මවවත්ථානවාර යැ සඞ්ගහවාර යැ සුඤ්ඤතවාර යැ යි තුන් මහාවාරයෙක් වෙයි. ධම්මවවත්ථානවාරය උද්දෙස නිද්දෙස විසින් ද්විවිධ යැ. උද්දෙසයෙහි පුච්ඡා යැ සමයනිද්දෙස යැ ධම්මුද්දෙස යැ අප්පණා යැ යි පරිච්ඡෙද සතරෙකි. එහි "කතමෙ ධම්මා කුසලා" යනු පුච්ඡා යැ "යස්මිං සමයෙ කාමාවචරං -පෙ- තස්මිං සමයෙ" යනු සමයනිද්දෙස යැ, "ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති" යනු ධම්මුද්දෙස යැ. "යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා කුසලා" යනු අප්පණා යි.

උද්දෙශයට අනතුරු වැ නිර්දෙශය එයි. එ ද උද්දෙශ සෙයින් මැ පුච්ඡා යැ සමයනිද්දෙස යැ ධම්මනිද්දෙස යැ අප්පණා යැයි පරිච්ඡෙද සතරෙකින් යුක්ත වෙයි. මෙහි දී උද්දිෂ්ට පරොපණ්ණාස ධර්මයන් එකක් එකක් ගෙන විභාග කෙරෙති. එහි තුන් කරුණෙකින් විභාගය ද සතර කරුණෙකින් සාමාන්‍යය ද දෙතැනක අපර දීපනා ද වෙයි.

**විභංගය** වනාහි ව්‍යඤ්ජන යැ, උපසර්ග යැ, අර්ථ යැ යන තුන් කරුණින් වෙයි. "කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං" ආදි තන්හි ව්‍යඤ්ජන විසිනුදු "චාරො විචාරො අනුවිචාරො උපවිචාරො" ආදි තන්හි උපසර්ග විසිනුදු 'පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා" ආදි තන්හි අර්ථ විසිනුදු විභක්ත වෙයි.

**නානත්වය** නාම යැ, ලක්ෂණ යැ, කෘත්‍ය යැ, ප්‍රතික්ෂෙප යැ, යන සතර සැටියෙන් වෙයි එහි "කතමො තස්මිං සමයෙ බ්‍යාපාදො හොති යො තස්මිං සමයෙ දොසො දුස්සනා" යන මෙහි 'බ්‍යාපාද' යනුත් 'දොස' යනුත් ක්‍රොධ මැ යි. වෙනස නමින් පමණි. මෙසෙයින් "නාමනානත්වය" දතයුතු යැ. රාශ්‍යර්ථයෙන් ගතුත් රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන පඤ්ච-ස්කන්ධයෝ මැ එක් මැ ස්කන්ධ වෙයි. එතෙකුදු වත් රූප රූප්පන ලක්ෂණ ද වේදනා වේදයිත ලක්ෂණ ද සඤ්ඤා සඤ්ජානන ලක්ෂණ ද චේතනා චේතයිත ලක්ෂණ ද විඤ්ඤාණ විජානන ලක්ෂණ දැ යි ලක්ෂණ විසින් වෙනසි. මේ '**ලක්ෂණනානත්ව**' යි. "චත්තාරො සම්මප්පධානා: ඉධ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය -පෙ- චිත්තං පග්ගණ්හාති පදහති" යන මෙහි එක් මැ වීර්‍ය්‍ය කෘත්‍ය විසින් සතර තැනෙක ආයේ යි. මේ **කෘත්‍යනානත්ව** යි. චත්තාරො අසද්ධම්මා: කොධගරුතා න සද්ධම්ම-ගරුතා, මක්ඛගරුතා න සද්ධම්මගරුතා, ලාභගරුතා න සද්ධම්මගරුතා, සක්කාරගරුතා න සද්ධම්මගරුතා යන මෙහි **ප්‍රතික්ෂෙප** විසින් නානාත්වය වෙයි.

**අපරදීපනා** යනු පුනපුනා කීම යි එය පදසථව විසින් හෝ දෘඪීකරණ විසින් හෝ කරනු ලැබෙයි. "එසො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං" ආදි තන්හි සෙයින් ව්‍යඤ්ජන වශයෙන් හෝ උපසර්ග වශයෙන් හෝ අර්ථ වශයෙන් හෝ කරන පුනරුක්තිය **පදසථව** නම. "ආවුසො ආවුසො, භන්තෙ භන්තෙ" ආදි විසින් අරුත් දැඩි කරන පිණිස තබන පුනරුක්තිය **දෘඪීකරණ** නමි.

ධම්මවවත්ථානවාරයට අනතුරු වැ "තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති" ආදීන් **සඞ්ග්‍රහවාරය** එයි: එය උද්දෙස යැ නිද්දෙස යැ පටිනිද්දෙස යැ යි ත්‍රිවිධ වෙයි. "තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති" යනු උද්දෙස යි. "කතමෙ තස්මිං සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති" ආදිය නිද්දෙස යි. "කතමො තස්මිං සමයෙ වේදනාක්ඛන්ධො" ආදිය පටිනිද්දෙස යි. **කොට්ඨාසවාර** යනුදු මෙයට නමෙකි.

ඉක්බිති "තස්මිං ඛොපන සමයෙ ධම්මා හොන්ති" ආදීන් **ශූන්‍යතා-වාරය** එයි. එද උද්දෙස නිද්දෙස විසින් ද්විවිධ යැ. එහි "ධම්මා හොන්ති" ආදි සුවිසි උද්දෙසයෙක් ඇත. උද්දෙසයට අනතුරු වැ එකෙකි උද්දිෂ්ට-ධර්මයක් නිර්දෙශ කරනලද වෙයි. චිත්තාඞ්ග විසින් උපදනා පරොපණ්ණාස ධර්මයන් සත්ත්ව පුද්ගලාදි භාව ශූන්‍ය වැ ධර්මමාත්‍රාදි බැවින් කියන ලද හෙයින් මේ ශූන්‍යතවාර නම් වෙයි.

මෙතෙකින් දක්වන ලද්දේ ප්‍රථම මහාකුශල චිත්තයෙහි ධර්මසඞ්ග්‍රහ වන අයුරු යැ. සෙසු චිත්තයෙහි දු මෙ නයින් මැ යථායොග සෙයින් ධර්මසඞ්ග්‍රහ වන සේ දතයුතු.

භූමිභේදයෙන් චිත්තය චතුර්විධ වෙයි. කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෝකුත්තර විසිනි. එහි කාමාවචරය කුශල, අකුශල, විපාක, ක්‍රියා විසින් චතුර්විධ යැ. රූපාරූප චිත්තයෝ කුශල, විපාක, ක්‍රියා විසින් ත්‍රිවිධ වෙති. ලෝකුත්තර ක්‍රියා චිත්තයෙක් නැත. ප්‍රභේද විසින් කාමාවචරයෙහි කුශල අටෙක, අකුශල දොළොසෙක, කුශලවිපාක සොළොසෙක, අකුශලවිපාක සතෙක, ක්‍රියා එකොළොසෙකි. රූපාවචරයෙහි කුශල පසෙක, විපාක පසෙක, ක්‍රියා පසෙකි. අරූපාවචරයෙහි කුශල සතරෙක, විපාක සතරෙක, ක්‍රියා සතරෙකි. ලෝකුත්තරයෙහි කුශල (මාර්ග) සතරෙක, විපාක (ඵල) සතරෙකි. මෙහැම සිත් එකුන් අනූවෙකි.

අකුශල චිත්තය ලෝභමූල, දෝසමූල, මෝහමූල විසින් ත්‍රිවිධ යැ. එහි ලෝභමූලය දිට්ඨි, මාන, සංඛාර විසින් ප්‍රභේද වෙයි. කාමාවචර සහේතුක කුශල විපාක ක්‍රියාවෝ වේදනා, ඤාණ, සංඛාර විසින් ප්‍රභේද වෙයි. රූපාවචරකුශල විපාක ක්‍රියාවෝ ධ්‍යානාඞ්ග විසින් ප්‍රභේද වෙති. ලෝකුත්තරචිත්තය පඤ්ච ධ්‍යානාඞ්ග විසිනුදු සතර ප්‍රතිපදා විසිනුදු තුන් විමෝක්ෂ විසිනුදු විසි මහනය විසිනුදු විභාග කරන ලද වෙයි.

කුශල අකුශල අව්‍යාකෘත විසිනුදු චිත්තය ත්‍රිවිධ වෙයි. කුශලාකුශලයෝ ප්‍රසිද්ධයහ. මෙහි අව්‍යාකෘත යනු විපාක ක්‍රියාවනට නමෙකි. චිත්තුප්පාද කාණ්ඩය වාචනාමාර්ගයෙහි ආ පමණින් නාතිරෙක බණවර සයෙකි.

**රූපවිභක්ති:** චිත්තවිභක්තියට අනතුරු වැ රූපවිභක්තිය එයි. 'රූපකාණ්ඩ' යනුදු එයට නමෙකි. එද උද්දෙස නිද්දෙස විසින් ද්විවිධ යැ. උද්දෙසයෙහි එකවිධරූප පටන් එකාදශවිධරූප තෙක් රූපධර්මයන් සඞ්ග්‍රහ කොට එකක දුක ආදී විසින් මාතෘකා තබන ලදු. එකකසඞ්ග්‍රහයෙහි ලෑ තෙසාලිස් පද කෙනෙක් උද්දිෂ්ටයහ. ඔවුනතුරෙහි පශ්චිමපදත්‍රය මාතෘකාමුක්ත වෙයි. සෙසු සාලිස් පදයෝ මාතෘකාගතයෝ යි.

ද්විතීයසඞ්ග්‍රහයෙහි ද්වික රූප එක්සිය සතරෙකි. ඔවුනතුරෙහි අන්‍යෝන්‍ය අසම්බන්ධ ද්විකරූප තුදුසක් ගෙන 'ප්‍රකීර්ණකද්වික' නමින් ආදියෙහි තබන ලද යැ. ඉක්බිති වස්තු අවස්තු විමසනුවට පැවැති පස්විසි ද්විකයක් ගෙන 'වස්තුද්වික' නමින් ද ආලම්බන අනාලම්බන විමසනුවට පැවැති පස්විසි ද්විකයක් ගෙන 'ආලම්බනද්වික' නමින් ද ආයතන අනායතන විමසනුවට පැවැති දස ද්විකයක් ගෙන 'ආයතනද්වික' නමින් ද ධාතු අධාතු විමසනුවට පැවැති දස ද්විකයක් ගෙන 'ධාතුද්වික' නමින් ද ඉන්ද්‍රිය අනින්ද්‍රිය විමසනුවට පැවැති අට ද්විකයක් ගෙන 'ඉන්ද්‍රියද්වික' නමින් ද සූක්ෂමාසූක්ෂමරූප විමසනුවට පැවැති දෙළොස් ද්විකයක් ගෙන 'සූක්ෂමරූපද්වික' නමින් ද තබන ලද වෙති.

තෘතීයසඞ්ග්‍රහයෙහි එක්සිය තුනක් ත්‍රිකරූපයෝ වෙති. ඔහු ප්‍රකීර්ණකද්වික සඞ්ග්‍රහයෙහි කියන ලද ආධ්‍යාත්මිකද්විකය ගෙන සෙසු ද්විකරූපයන් හා සමග යෝගයෙන් සඞ්ග්‍රහ කරන ලද්දාහු ය. එහි අධ්‍යාත්මිකද්විකය සෙසු ප්‍රකීර්ණකද්වික තෙළෙස හා සමග යෙදීමෙන් තෙළෙස් ප්‍රකීර්ණකත්‍රිකයෝ කියන ලදහ. මෙසෙයින් මැ වස්තු, ආලම්බන, ආයතන, ධාතු, ඉන්ද්‍රිය, සූක්ෂමරූප යන ද්විකරූපයන් ද වෙන වෙන ගෙන ඔවුන් හා සමග ආධ්‍යාත්මිකද්විකය යෙදීමෙන් පස්විසි වස්තුත්‍රිකයෝ යැ පස්විසි ආලම්බනත්‍රිකයෝ යැ දස ආයතනත්‍රිකයෝ යැ දස ධාතුත්‍රිකයෝ යැ අෂ්ට ඉන්ද්‍රියත්‍රිකයෝ යැ, ද්වාදශ සූක්ෂමරූපත්‍රිකයෝ යැ යන එක්සිය තුනක් ප්‍රභේද වූ ත්‍රිකරූපසඞ්ග්‍රහය දක්වන ලද වෙයි.

චතුත්ථසඞ්ග්‍රහයෙහි දෙවිසි චතුෂ්කයෙක් එයි. එ ද ප්‍රකීර්ණකද්විකරූපයන්ගේ යෝගයෙන් මැ සඞ්ග්‍රහ කරන ලද්දේ යැ. ප්‍රකීර්ණකද්විකසඞ්ග්‍රහයෙහි ආදි තුන් ද්විකයෙහි එකෙකි ද්විකයක් ගෙන පස් පස් ද්විකයන් හා සමග යෝගයෙන් ආදියෙහි පසළොස් චතුෂ්කයෙක් තබන ලද යැ. ඉක්බිති පච්ඡද්විකය ගෙන ඉන්ද්‍රිය, මහාභූත ද්විකයන් හා යොගයෙන් චතුෂ්ක දෙකක් ද ඉන්ද්‍රියද්විකය ගෙන ඔළාරික, දූර ද්විකයන් හා යොගයෙන් චතුෂ්ක දෙකක් ද මහාභූතද්විකය ගෙන ඔළාරික දූර ද්විකයන් හා යෝගයෙන් චතුෂ්ක දෙකක් දැයි චතුෂ්ක සයෙක් සඞ්ග්‍රහ කරන ලද යැ. අවසන්හි දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත චතුෂ්කය හා සමග චතුෂ්ක දෙවිස්සෙක් වෙයි.

තදනන්තර වැ පඤ්චකයෙහි පටන් එකාදශක සඞ්ග්‍රහය තෙක් අමිශ්‍ර වැ එයි. උද්දෙසයට ඉක්බිති නිද්දෙසයෙහි ලා උද්දිෂ්ටරූප එකක් පාසා විභාග කොට දක්වනු ලැබේ. රූපවිභක්තිය වාචනාමාර්ගයෙහි ආ පමණින් සාතිරේක දෙබණවරෙක් වෙයි. මෙතෙකින් මාතෘකායෙහි ''කුසලා ධම්මා, අකුශලා ධම්මා අව්‍යාකතා ධම්මා'යි කියන ලද කුශලත්‍රිකය විභාග කරන ලද වෙයි. සෙසු ත්‍රිකද්වික ධර්මයන්ගේ විභාගය ද මෙනයිනි. විභාග කරත හොත් ඒ ඉතා මහත් වන බැවින් එය තබා නයානන්තරයෙකින් උන්ගේ විභාග කරනුවට රූපවිභක්තියට අනතුරු වැ නික්ෂෙපරාශි ආරබ්ධ යි.

**නික්ෂෙපරාශි:** නික්ෂෙපකාණ්ඩ යනුදු නික්ෂෙපරාශියට නමෙකි. ඒ වනාහි මාතෘකායෙහි ආ ත්‍රික ද්වික ධර්මයන් ගෙන නයානන්තරයෙකින් කෙරෙන විභාගයෙකි. මූල විසින් ස්කන්ධ විසින් ද්වාර විසින් භූමි විසින් අර්ථ විසින් ධර්ම විසින් නාම විසින් ලිඞ්ග විසින් නික්ෂෙප කොට (බහාලා) දෙසන ලද බැවින් මේ නික්ෂෙපරාශි නම් වෙයි. කුශලත්‍රිකය සෙයින් විභාග කරත් මැ ඉතා මහත් වන බැවින් විස්තර විභාගය නික්ෂිප්ත කොට (තබා) නයානන්තරයෙකින් විභාග කරන ලද වන බැවින් නික්ෂෙපරාශි නම් වෙතී ද යෙති. වාචනාමාර්ගයෙහි ආ පමණින් නික්ෂෙපකාණ්ඩය බණවර තුනෙකි.

**අර්ථකථාකාණ්ඩ:** නික්ෂෙපකාණ්ඩයට අනතුරු වැ ධර්මයෙහි අර්ථෝද්ධාර විසින් කළ දේශනාව අත්ථකථාකාණ්ඩ නම් වෙයි. 'අත්ථුද්ධාර' යනුදු මෙයට මැ නමෙකි. 'කුශලත්‍රිකය' පටන් 'සරණද්විකය' හිම් කොට මාතෘකායෙහි ආ සියලු ත්‍රික ද්වික ධර්මයන් ගේ අත්ථ උද්ධරණ කොට මෙහි තබන ලද යැ. අත්ථකථාකාණ්ඩය දම්සෙනෙවි සැරියුත් තෙරණුවන් විසින් දේශිත යැ. තෙරණුවෝ 'නික්ෂෙපකාණ්ඩයෙහි අර්ථෝද්ධාර සලකනු නො හැකි, තමන් වහන්සේගේ සද්ධිවිහාරිකයක්හට අත්ථකථාකාණ්ඩය වදාළහ'යි යෙති. මේ අදහස මහඅටුවාහි ප්‍රතික්ෂිප්ත යැ. 'අත්ථකථාකාණ්ඩය බුදුරදුන් විසින් මැ දේශිත යැ' යනු මහඅටුවාහි පිළිගත් මතය යි. අභිධර්මය ශ්‍රාවකවිෂය නොවැ බුද්ධවිෂය බවත් සැරියුත් තෙරණුවන් සවකීය සද්ධිවිහාරිකයා බුදුරදුන් වෙත පැමිණ වූ කල්හි උන්වහන්සේ විසින් මැ අත්ථකථාකාණ්ඩය දෙසන ලද බවත් මහ අටුවාහි ආ සේ බුදුඝොස් තෙරණුවෝ අත්ථසාලිනියෙහි දක්වති. වාචනාමාර්ගයෙහි ආ පමණින් අර්ථකථාකාණ්ඩය බණවර දෙකෙකි. මෙසෙයින් සියලු ධම්මසඞ්ගණිප්‍රකරණය තෙළෙස් බණවරෙකින් සමන්විත වේ.

**පරිවාරග්‍රන්ථ:** අභිධර්මපිටකයෙහි විභඞ්ගාදි ෂට්ප්‍රකරණය මැ ධම්මසඞ්ගණි නය අනු වැ විභාග කරනලද වෙයි. එයින් ධම්මසඞ්ගණිප්‍රකරණය එ හැමට මූලාශ්‍රය වූයේ අභිධර්මපිටකය පුරා පැතිර සිටී. ධම්මසඞ්ගණියට අත්ථකථාචාර්ය බුදුඝොස් තෙරණුවන් විසින් ලියනලද

‘අත්ථසාලිනී’ නම් අට්ඨකථාවක් ද එහි ලීනත්ථපද වණ්ණනා කෙරෙමින් ‘ආනන්ද’ නම් තෙර කෙනෙකුන් විසින් කරන ලද ‘අභිධම්මමූලටීකා’ නම් ලීනත්ථපදවණ්ණනාවක් ද එයට ‘ධම්මපාල’ නම් තෙර කෙනෙකුන්ගේ කෘතියකැයි සැලැකෙන කතෘ නො සඳහන් අනුටීකාවක් ද ඇත. පස්වැනි කසුප් (බු. ව. 1445-1455) රජු විසින් කරනලද අභිධම්මව්‍යාඛ්‍යානයක් ගැන එරජුගේ අභයගිරි සෙල්ලිපියෙහි සඳහන් වෙයි. සිව්වැනි මිහිඳු (බු. ව. 1491-1507) රජු විසින් සිත්ථගාමවාසී ‘ධම්මමිත්ත’ නම් තෙර කෙනකුන් ලවා අභිධම්මවණ්ණනාවක් කරවනලදැ යි මහාවංසයෙහි සඳහන් වෙයි.[1] මේ ව්‍යාඛ්‍යා දෙක දැන් නාමශේෂ ව පවතී.

‘අත්ථසාලිනී අටුවාව බුදුගොස් තෙරණුවන් විසින් ලඞ්කාගමනයට පළමු දඹදිව්හි දී මැ කරනලද බව මහාවංශයෙහි දක්වෙයි[2]. එහෙත් මෙකල විද්‍යමාන ‘අත්ථසාලිනිය’ ලක්දිව මහාවිහාරයෙහි දී ලියන ලද්දෙකි. “අයමෙත්ථ සඞ්ඛෙපො විත්ථාරො පන විසුද්ධිමග්ගෙ වුත්තනයෙනෙව වෙදිතබ්බො”[3] “අයමෙත්ථ සඞ්ඛෙපො, විත්ථාරො පන සමන්තපාසාදිකායං වුත්තො”[4]. ආදීන් එහි ‘විසුද්ධිමග්ගය’ ද ‘සමන්තපාසාදිකාව’ ද නිර්දිෂ්ට යැ. ලක්දිවට පැමිණ උන්වහන්සේ ලියූ පළමු වන ග්‍රන්ථය ‘විසුද්ධිමග්ග’ය බව ප්‍රකට යැ. ‘සමන්තපාසාදිකා’ විනයට්ඨකථාව සිරිනිවාස මහානාම (බු. ව. 950-972) රජුගේ එක්විසි වන වර්‍ෂයෙහි ලියා නිමවන ලද්දෙකි ‘අත්ථසාලිනි’ය ඉන් පසු ලියැ යුතු වෙයි. දඹදිව්හි දී ලියූ අත්ථසාලිනිය යළි මෙහි දී සකසා ලියූ සේ ද සිතියැ හෙයි. ආචාර්‍යවාද අතුරෙහි ‘රෙවත’ තෙරණුවන්ගේ මත ද එහි දක්නා හෙයිනි. ‘ඉදං අට්ඨකථාමුත්තකං ආචරියානං මතං න පණනකං සාරතො දට්ඨබ්බං.”[5] යන තන්හි “ආචරියානං මතං” යනු රෙවතාචාර්‍යයන්ගේ මතය බව ‘අභිධම්මමූලටීකා’’ යෙහි දක්වෙයි.[6] මෙහි රෙවතාචාර්‍යයෝ නම් දඹදිව බෝමැඩ වෙහෙර වැඩ විසූ බුදුගොස් තෙරණුවන්ගේ ඇදුරු තෙරණුවෝ යි.

‘අභිධම්මමූලටීකා’ ලියූ ‘ආනන්ද’ තෙරණුවෝ දඹදෙණියේ දෙවැනි පැරකුම්බා (බු. ව. 1779-1814) රජු දවස විසූ ‘ආනන්ද වනරතන’ තෙරණුවෝ යයි කෙනෙක් සිතති. ඒ නො මැනැවි. මූලටීකාකාර ‘ආනන්ද’ තෙරණුවෝ වූ කලී රූපසිද්ධි කතෘ ‘දීපඞ්කර බුද්ධප්පිය’ තෙරණුවනට ඇදුරු වූ ‘තම්බපණ්ණිද්ධජ’ යනුවෙන් පසස්නා ලද ‘ආනන්ද’ තෙරණුවෝ යි. ඔබ ‘ධම්මමිත්ත’ නම් තෙර කෙනකුන්ගේ අයැදුමින් ‘අත්ථසාලිනී ලීනත්ථපදවණ්ණනා’ ලියනලද බව ග්‍රන්ථයෙහි සඳහන් කෙරෙති. සිව්වැනි මිහිඳු (බු. ව. 1491-1507) රජුගේ ආරාධනයෙන් අභිධම්මවණ්ණනාවක් කළ ‘සිත්ථගාමවාසි ධම්මමිත්ත’ තෙරණුවෝ ද මුන් වහන්සේ මැ වියැ හෙති. ‘විසුද්ධිමග්ගටීකාව’ ලිවීමට ‘බදරතිත්ථ ධම්මපාල’ තෙරණුවනට ආරාධනා කළ ‘දාඨානාග’ තෙරණුවෝ ද ‘ධම්මමිත්ත’ තෙරණුවනට සමකාලීන වෙත්.

1. ම. ව. 52 පරි. 35 ගාථා
2. ම. ව. 37 පරි 225. ගාථා
3. අසා. 612 පිටුව
4. අසා. 108 පිටුව
5. අසා. 115 පිටුව.
6. මූ. ටී. 85 පිටුව

ධම්මසඞ්ගණී බුද්ධජයන්ති අනුවාදය: ලඞ්කාබෞද්ධමණ්ඩලය විසින් 2500 බුද්ධජයන්තිය නිමිත්තෙන් ආරම්භ කළ බුද්ධජයන්තීත්‍රිපිටක ග්‍රන්ථ-මාලායෙහි ධම්මසඞ්ගණී සිංහල අනුවාදයත් පාඨශෝධන සහිත පාළියත් ශ්‍රී ලංකා රජයේ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් මෙසේ පළවෙයි. පාඨශෝධනයේ දී සිංහල තල්පත් පිටපත් හා මුද්‍රිත පිටපත් මරම්ම (බුරුම) ඡට්ඨසඞ්ගීතියෙන් ශෝධිත පොත සියම් රට මුද්‍රිත පොත එංගලන්තයේ පාළිපොත් සමාගමෙහි (PTS) මුද්‍රණය අටුවා ටීකා හා සමග සසඳගෙන විසදෘශපාඨ අධෝලිපි වශයෙන් දක්වන ලදි. අනුවාදයෙහි දී අභිධර්ම පාරිභාෂික වචනයන්ට ප්‍රමුඛත්වය දෙන ලද්දේ යැ. පරමාර්ථධර්ම ව්‍යාඛ්‍යා හෙයින් පර්‍යාය වචනයෙන් අර්ථවෛපරීත්‍යයට අවකාශ නො තබනු සඳහා යි. දුර්ගමස්ථානයෙහි අර්ථ ප්‍රකට කරනු පිණිස පර්‍යායාර්ථ වරහන් තුළ යොදා ඇත. අර්ථව්‍යක්තිය පිණිස පාළියට අතිරේක වැ අර්ථ-කථායෙන් ගන්නාලද ව්‍යාඛ්‍යාන ද වරහන් තුළ දක්වන ලද්දේ යි. මේ උදාර කාර්‍යයෙහි සහාය වූ ත්‍රිපිටකසම්පාදක මණ්ඩලය ද ලඞ්කා බෞද්ධ මණ්ඩලය ද ශ්‍රී ලඞ්කා රජය හා එහි සංස්කෘතික දෙපාර්තමේන්තුවේ නිලධාරිමණ්ඩලය ද ස්වදේශීය මුද්‍රණාලයෙහි කාර්‍යමණ්ඩලය ද සුධීන්ගේ පැසසුමට ලක්විය යුත්තාහ.

සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා !

කරහම්පිටිගොඩ සුමනසාර

1972. 12. 30
ත්‍රිපිටක කාර්‍යාලය,
මහානායක වාරිකාරාමය,
විජේරාම මාවත,
කොළඹ 7.

# සඞ්කේතනිරූපණය

## ABBREVIATIONS

| | |
|---|---|
| සිමු. 1. — | බෙන්තර සද්ධාතිස්ස ස්ථවිර මුද්‍රණය, 1929. |
| සිමු. 2. — | ශ්‍රීපාද මුද්‍රණය |
| සිමු. 3. — | හේවාවිතාරණ මුද්‍රණය, 1953 |
| ස්‍යා. — | ස්‍යාමක්ඛරමුද්දිත පොත. |
| මඡසං — | මරම්මඡට්ඨසඞ්ගීති පොත |
| පවි. — | පරමානන්දවිහාර පුස්කොළ පොත. |
| අසා. — | අට්ඨසාලිනී, ධම්මසඞ්ගණී අට්ඨකථා. |
| PTS. — | Pali Text Society - Dhammasanganippakarana |
| හෙවිමු. — | හෙවාවිතාරණ මුද්‍රණය. |
| ධසං. — | ධම්මාරාම සංස්කරණය. |
| ඤසං. — | ඤාණවිමල සංස්කරණය. |
| බෞ. වි. කෝ. — | බෞද්ධවිශ්වකෝෂ - ENCYCLOPAEDIA OF BUDDHISM VOL. i |
| ම. ව. — | මහාවංශ. |
| මූ. ටී. — | අභිධම්මමූලටීකා. |

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS.

## VOWELS

අ a   ආ ā   ඉ i   ඊ ī   උ u   ඌ ū   එ e   ඔ o

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං aṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ vha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

ා ā   ි i   ී ī   ු ූ u   ු ූ ū   ෙ e   ො o

# ධම්මසඞ්ගණිප්පකරණං

## විෂයසූචි


| විෂයං | පිටුඞ්කං |
|---|---|
| **මාතිකා** | **1–24** |
| අභිධම්මමාතිකා | 1– 18 |
| තිකමාතිකා | 2– 6 |
| හෙතුගොච්ඡකං | 6 |
| චූළන්තරදුකං | 6– 8 |
| ආසවගොච්ඡකං | 8 |
| සංයොජනගොච්ඡකං | 8 |
| ගන්ථගොච්ඡකං | 10 |
| ඔඝගොච්ඡකං | 10 |
| යොගගොච්ඡකං | 10– 12 |
| නීවරණගොච්ඡකං | 12 |
| පරාමාසගොච්ඡකං | 12 |
| මහන්තරදුකං | 14 |
| උපාදානගොච්ඡකං | 14– 16 |
| කිලෙසගොච්ඡකං | 16 |
| පිට්ඨිදුකං | 16– 18 |
| සුත්තන්තමාතිකා | 20– 24 |
| මාතිකා නිට්ඨිතා. | |
| **චිත්තුප්පාදකණ්ඩං** | **26–254** |
| කාමාවචර අට්ඨමහාචිත්තානි | 26– 72 |
| පඨමං චිත්තං | 26– 64 |
| පදභාජනීයං | 26– 42 |
| කොට්ඨාසවාරො | 44– 60 |
| සුඤ්ඤතවාරො | 60– 64 |
| දුතියං චිත්තං | 64 |
| තතියං චිත්තං | 64– 66 |
| චතුත්ථං චිත්තං | 66 |
| පඤ්චමං චිත්තං | 66– 70 |
| ඡට්ඨං චිත්තං | 70 |
| සත්තමං චිත්තං | 70– 72 |
| අට්ඨමං චිත්තං | 72 |
| රූපාවචරකුසලචිත්තං | 74–118 |
| චතුක්කනයො | 74– 78 |
| පඤ්චකනයො | 78– 84 |
| චතස්සො පටිපදා | 84– 86 |

| විසයො | | පිට්ඨඞ්කො |
|---|---|---|
| චත්තාරි ආරම්මණානි | ... ... | 86– 88 |
| සොළසක්ඛත්තුකං | ... ... | 88– 94 |
| අට්ඨකසිණං සොළසක්ඛත්තුකං | ... | 94 |
| **අභිභායතනානි** | ... ... | **96–118** |
| අභිභායතන චතස්සො පටිපදා | ... | 96– 98 |
| ,, ද්වෙ ආරම්මණානි | ... | 98 |
| ,, අට්ඨක්ඛත්තුකං | ... ... | 100–102 |
| ඉදම්පි අට්ඨක්ඛත්තුකං | .. ... | 104 |
| චතස්සො පටිපදා | ... ... | 104–106 |
| ද්වෙ ආරම්මණානි | ... ... | 106–108 |
| අපරම්පි අට්ඨක්ඛත්තුකං | ... ... | 108–112 |
| ඉදම්පි අට්ඨක්ඛත්තුකං | ... ... | 112 |
| ඉමානිපි අභිභායතනානි සොළසක්ඛත්තුකානි | ... | 112–114 |
| ඉමානිපි තීණි විමොක්ඛානි සොළසක්ඛත්තුකානි | ... | 114 |
| චත්තාරි බ්‍රහ්මවිහාරජ්ඣානානි සොළසක්ඛත්තුකානි | ... | 114–118 |
| අසුභජ්ඣානං සොළසක්ඛත්තුකං | ... | 118 |
| **අරූපාවචර කුසලං** | ... ... | **120** |
| චත්තාරි අරූපජ්ඣානානි සොළසක්ඛත්තුකානි | ... | 120 |
| **තෙභූමක කුසලං** | ... ... | **120-126** |
| කාමාවචරකුසලං | ... ... | 1201–22 |
| රූපාවචරකුසලං | ... ... | 122 |
| අරූපාවචරකුසලං | ... ... | 124-126 |
| **ලොකුත්තරචිත්තං** | ... ... | **126-158** |
| සුද්ධිකපටිපදා | ... ... | 126–148 |
| සුඤ්ඤතං | ... ... | 148 |
| සුඤ්ඤතමූලක පටිපදා | ... ... | 148–150 |
| අප්පණිහිතං | ... ... | 150 |
| අප්පණිහිතමූලක පටිපදා | ... ... | 152 |
| වීසති මහානයා | ... ... | 154 |
| අධිපති පඨමො මග්ගො | ... ... | 154–156 |
| දුතියො මග්ගො | ... ... | 156 |
| තතියො මග්ගො | ... ... | 156 |
| චතුත්ථො මග්ගො | ... ... | 156–158 |
| **ද්වාදස අකුසලචිත්තානි** | ... ... | **158–182** |
| **අබ්‍යාකතවිපාකචිත්තානි** | ... ... | **182–244** |
| කුසලවිපාකානි පඤ්චවිඤ්ඤාණානි | ... | 182–190 |
| කුසලවිපාකා මනොධාතු | ... ... | 190–194 |
| කුසලවිපාකා මනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතා | | 194–198 |

| විසයං | පිට්ඨඞ්කං |
|---|---|
| කුසලවිපාකා මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතා | 198-202 |
| අට්ඨමහාවිපාකා ... ... | 204 |
| රූපාවචරවිපාකා ... ... | 204 |
| අරූපාවචරවිපාකා ... ... | 206-208 |
| **ලොකුත්තරවිපාකා ... ...** | **208-240** |
| සුද්ධිකපටිපදා ... ... | 208-210 |
| සුද්ධික සුඤ්ඤතං ... ... | 210-212 |
| සුඤ්ඤතපටිපදා ... ... | 212-216 |
| සුද්ධික අප්පණිහිතං ... ... | 216-218 |
| අප්පණිහිතපටිපදා ... ... | 218-220 |
| වීසතිමහානයා ... ... | 222 |
| ඡන්දාධිපතෙය්‍ය සුද්ධිකපටිපදා ... | 222-226 |
| ඡන්දාධිපතෙය්‍ය සුද්ධිකසුඤ්ඤතං ... | 226-228 |
| පඨමමග්ගවිපාකො ... ... | 228-238 |
| දුතිය, තතිය, චතුත්ථමග්ගවිපාකා ... | 238-240 |
| අකුසලවිපාකපඤ්චවිඤ්ඤාණානි ... | 240-242 |
| අකුසලවිපාකා මනොධාතු ... ... | 242-244 |
| අකුසලවිපාකා මනොවිඤ්ඤාණධාතු ... | 244 |
| කිරියා මනොධාතු ... ... | 246 |
| කිරියා මනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතා ... | 246-248 |
| කිරියා මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතා ... | 250 |
| කාමාවචරකිරියා ... ... | 250-252 |
| රූපාවචරකිරියා ... ... | 252 |
| අරූපාවචරකිරියා ... ... | 252-254 |


## රූපකණ්ඩං 256-380

### මාතිකා 256-276


| | |
|---|---|
| **එකකං ... ...** | **256** |
| **දුකානි ... ...** | **256-262** |
| පකිණ්ණකදුකං ... ... | 256-258 |
| වත්ථුදුකං ... ... | 258 |
| ආරම්මණදුකං ... ... | 258 |
| ආයතනදුකං ... ... | 260 |
| ධාතුදුකං ... ... | 260 |
| ඉන්ද්‍රියදුකං ... ... | 260 |
| සුඛුමරූපදුකං ... ... | 262 |
| **තිකානි ... ...** | **262-270** |
| පකිණ්ණකතිකං ... ... | 262-264 |
| වත්ථුතිකං ... ... | 264-266 |
| ආරම්මණතිකං ... ... | 266 |

| විසයා | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| ආයතනතිකං | ... | ... | 266-268 |
| ධාතුතිකං | ... | ... | 268 |
| ඉන්ද්‍රියතිකං | ... | ... | 268 |
| සුඛුමරූපතිකං | ... | ... | 268-270 |
| චතුක්කං | ... | ... | 272-274 |
| පඤ්චකං | ... | ... | 274 |
| ඡක්කං | ... | ... | 276 |
| සත්තකං | ... | ... | 276 |
| අට්ඨකං | ... | ... | 276 |
| නවකං | ... | ... | 276 |
| දසකං | ... | ... | 276 |
| එකාදසකං | ... | ... | 276 |
| රූපවිභත්ති | | | 278-380 |
| එකකනිද්දෙසො | ... | ... | 278 |
| දුකනිද්දෙසො | ... | ... | 278-326 |
| පකිණ්ණකදුකං | ... | ... | 278-312 |
| වත්ථුදුකං | ... | ... | 312 |
| ආරම්මණදුකං | ... | ... | 312-314 |
| ආයතනදුකං | ... | ... | 314-316 |
| ධාතුදුකං | ... | ... | 316-318 |
| ඉන්ද්‍රියදුකං | ... | ... | 318-320 |
| සුඛුමරූපදුකං | ... | ... | 320-326 |
| තිකනිද්දෙසො | ... | ... | 326-354 |
| පකිණ්ණකතිකා | ... | ... | 326-334 |
| වත්ථුතිකා | ... | ... | 334-336 |
| ආරම්මණතිකා | ... | ... | 336-338 |
| ආයතනතිකා | ... | ... | 338-340 |
| ධාතුතිකා | ... | ... | 342-344 |
| ඉන්ද්‍රියතිකා | ... | ... | 344-346 |
| සුඛුමරූපතිකා | ... | ... | 346-354 |
| චතුක්කං | ... | ... | 354-374 |
| පඤ්චකං | ... | ... | 374-376 |
| ඡක්කං | ... | ... | 376 |
| සත්තකං | ... | ... | 376 |
| අට්ඨකං | ... | ... | 376 |

| විසයො | | | පිට්ඨඞ්කො |
|---|---|---|---|
| නවකං | ... | ... | 378 |
| දසකං | ... | ... | 378 |
| එකාදසකං | ... | ... | 378-380 |
| **නික්ඛෙපකණ්ඩං** | | | **380-498** |
| තිකං | ... | ... | 380-400 |
| දුකං | .. | ... | 400-498 |
| හෙතුගොච්ඡකං | ... | .. | 400-410 |
| චූළන්තරදුකං | ... | ... | 410-416 |
| ආසවගොච්ඡකං | ... | ... | 416-420 |
| සංයොජනගොච්ඡකං | ... | ... | 420-430 |
| ගන්ථගොච්ඡකං | ... | .. | 430-436 |
| ඔඝගොච්ඡකං | ... | .. | 436 |
| යොගගොච්ඡකං | ... | .. | 436 |
| නීවරණගොච්ඡකං | .. | ... | 436-444 |
| පරාමාසගොච්ඡකං | .. | .. | 444 446 |
| මහන්තරදුකං | ... | ... | 446-452 |
| උපාදානගොච්ඡකං | ... | ... | 452-456 |
| කිලෙසගොච්ඡකං | ... | ... | 458-468 |
| පිට්ඨිදුකං | | ... | 468-478 |
| සුත්තන්තමාතිකං | ... | ... | 478-498 |
| **අට්ඨකථාකණ්ඩං** | | | **500-561** |
| තිකං | .. | ... | 500-516 |
| හෙතුගොච්ඡකං | .. | ... | 516-520 |
| චූළන්තරදුකං | ... | ... | 520 522 |
| ආසවගොච්ඡකං | ... | ... | 522-524 |
| සංයොජනගොච්ඡකං | ... | ... | 524-528 |
| ගන්ථගොච්ඡකං | ... | | 528-532 |
| ඔඝගොච්ඡකං | ... | .. | 532 |
| යොගගොච්ඡකං | ... | ... | 532 |
| නීවරණගොච්ඡකං | ... | ... | 532-534 |
| පරාමාසගොච්ඡකං | ... | . | 536-538 |
| මහන්තරදුකං | .. | .. | 538-542 |
| උපාදානගොච්ඡකං | | | 544-546 |
| කිලෙසගොච්ඡකං | ... | ... | 540-550 |
| පිට්ඨිදුකං | ... | ... | 550-560 |

අභිධම්මපිටකෙ

# ධම්මසඞ්ගණිප්පකරණං

# අභිධම්මපිටකෙ

# ධම්මසඞ්ගණීප්පකරණං

## අභිධම්මමාතිකා

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස**

1. කුසලා ධම්මා, 989, 1383*
   අකුසලා ධම්මා, 990, 1384
   අබ්‍යාකතා ධම්මා. 991, 1385

2. සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා, 992, 1386
   දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා, 993, 1387
   අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා. 994, 1388

3. විපාකා ධම්මා, 995, 1389
   විපාකධම්මධම්මා, 996, 1390
   නෙවවිපාකනවිපාකධම්මධම්මා. 997, 1391

4. උපාදින්නුපාදානියා[1] ධම්මා, 998, 1392
   අනුපාදින්නුපාදානියා[2] ධම්මා, 999, 1393
   අනුපාදින්නඅනුපාදානියා ධම්මා. 1000, 1394

5. සඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා ධම්මා, 1001, 1395
   අසඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා ධම්මා, 1002, 1396
   අසඞ්කිලිට්ඨ අසඞ්කිලෙසිකා ධම්මා. 1003, 1397

6. සවිතක්කසවිචාරා ධම්මා, 1004, 1398
   අවිතක්කවිචාරමත්තා ධම්මා, 1005, 1399
   අවිතක්ක අවිචාරා ධම්මා 1006, 1400

7. පීතිසහගතා ධම්මා, 1007, 1401
   සුඛසහගතා ධම්මා, 1008, 1402
   උපෙක්ඛාසහගතා[3] ධම්මා. 1009, 1403

---

* එතෙහි අඞ්කෙහි උපරි නික්ඛෙපඅත්ථුද්ධාරකණ්ඩෙසු මාතිකානං විභඞ්ගට්ඨානානි යථාක්කමං දස්සිතානි.

1. උපාදිණ්ණුපාදානියා, මජ්සං. 2. අනුපාදිණ්ණුපාදානියා, මජ්සං.
3. උපෙඛා - සාඵි.

### අභිධර්මපිටකයෙහි

# ධම්මසඞ්ගණීප්‍රකරණය

ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට
නමස්කාර වේවා.

## අභිධර්මමාතෘකා

1. කුශලධර්මයෝ යෑ,
අකුශලධර්මයෝ යෑ,
අව්‍යාකෘතධර්මයෝ යි.

2. සුඛවේදනාව හා සම්ප්‍රයුක්තධර්මයෝ යෑ,
දුඃඛවේදනාව හා සම්ප්‍රයුක්තධර්මයෝ යෑ,
අදුඃඛඅසුඛ වේදනාව හා සම්ප්‍රයුක්තධර්මයෝ යි.

3. විපාක ධර්මයෝ යෑ,
විපාක සවභාවධර්මයෝ යෑ,
නොමැවිපාක වූ විපාකසවභාව නො වූ ධර්මධර්මයෝ යි.

4. උපාදින්නඋපාදානියධර්මයෝ යෑ,
අනුපාදින්නඋපාදානියධර්මයෝ යෑ,
අනුපාදින්නඅනුපාදානියධර්මයෝ යි

5 සඞ්කිලිට්ඨසඞ්කිලෙසික ධර්මයෝ යෑ,
අසඞ්කිලිට්ඨසඞ්කිලෙසික ධර්මයෝ යෑ,
අසඞ්කිලිට්ඨඅසඞ්කිලෙසික ධර්මයෝ යි.

6. සවිතර්කසවිචාරධර්මයෝ යෑ,
අවිතර්කවිචාරමාත්‍රධර්මයෝ යෑ,
අවිතර්කඅවිචාරධර්මයෝ යි.

7. ප්‍රීතිසහගතධර්මයෝ යෑ,
සුඛසහගතධර්මයෝ යෑ,
උපේක්ෂාසහගත ධර්මයෝ යි.

8. දස්සනෙන පහාතබ්බා ධම්මා, 1010, 1404
භාවනාය පහාතබ්බා ධම්මා, 1014, 1405
නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා. 1015, 1406

9. දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා, 1016, 1407
භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා, 1017, 1408
නෙව දස්සනෙන න භාවනාය
පහාතබ්බහෙතුකා ධම්මා. 1018, 1409

10. ආචයගාමිනො ධම්මා, 1019, 1410
අපචයගාමිනො ධම්මා, 1020, 1411
නෙවාචයගාමිනො න අපචයගාමිනො ධම්මා 1021, 1412

11. සෙඛා[1] ධම්මා, 1022, 1413
අසෙඛා ධම්මා, 1023, 1414
නෙව සෙඛා නාසෙඛා ධම්මා. 1024, 1415

12. පරිත්තා ධම්මා, 1025, 1416
මහග්ගතා ධම්මා, 1026, 1417
අප්පමාණා ධම්මා. 1227, 1418

19 පරිත්තාරම්මණා ධම්මා, 1028, 1419
මහග්ගතාරම්මණා ධම්මා, 1029, 1420
අප්පමාණාරම්මණා ධම්මා. 1030, 1421

14. හීනා ධම්මා, 1031, 1422
මජ්ඣිමා ධම්මා, 1032, 1423
පණීතා ධම්මා. 1033, 1424

15 මිච්ඡත්තනියතා ධම්මා, 1034, 1425
සම්මත්තනියතා[2] ධම්මා, 1035, 1426
අනියතා ධම්මා. 1036, 1427

16. මග්ගාරම්මණා ධම්මා, 1037, 1428
මග්ගහෙතුකා ධම්මා, 1038, 1428
මග්ගාධිපතිනො ධම්මා. 1038, 1428

17. උප්පන්නා ධම්මා, 1040, 1429
අනුප්පන්නා ධම්මා, 1041, 1429
උප්පාදිනො[3] ධම්මා. 1042, 1429

18. අතීතා ධම්මා, 1043, 1430
අනාගතා ධම්මා, 1044, 1430
පච්චුප්පන්නා ධම්මා. 1045, 1˙30

---

1. සෙක්ඛා - සිමු 2, මජසං. සහ. 2 සම්මත්තනියතා - PTS.
3. උප්පාදිනො -

8. දර්ශනයෙන් (සෝවාන් මගින්) ප්‍රහාතව්‍යධර්මයෝ යෑ,
භාවනායෙන් (ශෙෂමාර්ගත්‍රයෙන්) ප්‍රහාතව්‍යධර්මයෝ යෑ,
නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ සි.

9. දර්ශනයෙන් ප්‍රහාතව්‍යහේතු ඇති ධර්මයෝ යෑ,
භාවනායෙන් ප්‍රහාතව්‍යහේතු ඇති ධර්මයෝ යෑ,
නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ සි.

10. ආචයගාමී (ප්‍රතිසන්ධි ච්‍යුති ගති ප්‍රවෘත්තීන්ට පමුණුවන) ධර්මයෝ යෑ,
අපචයගාමී (නිවනට පමුණුවන) ධර්මයෝ යෑ,
නො මැ ආචයගාමී නො ද අපචයගාමී ධර්මයෝ සි.

11. ශෛක්‍ෂධර්මයෝ යෑ,
අශෛක්‍ෂධර්මයෝ යෑ,
නො මැ ශෛක්‍ෂ වූ නො ද අශෛක්‍ෂ වූ ධර්මයෝ සි.

12. පරීත්ත (කාමාවචර) ධර්මයෝ යෑ,
මහද්ගත (රූපාරූප) ධර්මයෝ යෑ,
අප්‍රමාණ (ලොකොත්තර) ධර්මයෝ සි.

13. පරීත්තාලම්බනධර්මයෝ යෑ,
මහද්ගතාලම්බනධර්මයෝ යෑ,
අප්‍රමාණාලම්බනධර්මයෝ සි.

14. හීන (ලාමකඅකුශල) ධර්මයෝ යෑ,
මධ්‍යම (අවශෙෂත්‍රෛභූමක) ධර්මයෝ යෑ,
ප්‍රණීත (ලෝකෝත්තර) ධර්මයෝ සි.

15. මිථ්‍යාත්වනියත (මිථ්‍යාස්වභාව) ධර්මයෝ යෑ,
සම්‍යක්ත්වනියතධර්මයෝ යෑ,
අනියතධර්මයෝ සි.

16. මාර්ගාලම්බනධර්මයෝ යෑ,
මාර්ගහේතුකධර්මයෝ යෑ,
මාර්ගාධිපතිධර්මයෝ සි.

17. උත්පන්නධර්මයෝ යෑ,
අනුත්පන්නධර්මයෝ යෑ,
උත්පාදී (අවශ්‍යයෙන් උපදනා) ධර්මයෝ සි.

18. අතීතධර්මයෝ යෑ,
අනාගතධර්මයෝ යෑ,
ප්‍රත්‍යුත්පන්නධර්මයෝ සි.

19. අතීතාරම්මණා ධම්මා, 1046, 1431
අනාගතාරම්මණා ධම්මා, 1047, 1432
පච්චුප්පන්නාරම්මණා ධම්මා. 1048, 1433

20 අජ්ඣත්තා ධම්මා, 1049, 1434
බහිද්ධා ධම්මා, 1050, 1434
අජ්ඣත්තබහිද්ධා ධම්මා. 1051, 1434

21. අජ්ඣත්තාරම්මණා ධම්මා, 1052, 1435
බහිද්ධාරම්මණා ධම්මා, 1053, 1436
අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා. 1054, 1436

22. සනිදස්සනසප්පටිඝා ධම්මා, 1055, 1437
අනිදස්සනසප්පටිඝා ධම්මා, 1056, 1438
අනිදස්සනඅප්පටිඝා ධම්මා. 1057, 1439

## තිකමාතිකා.

1. හෙතුධම්මා,[1] 1058, 1440
නහෙතුධම්මා, 1077, 1441

2. සහෙතුකා ධම්මා, 1078, 1442
අහෙතුකා ධම්මා, 1079, 1443

3. හෙතුසම්පයුත්තා ධම්මා, 1080, 1444
හෙතුවිප්පයුත්තා ධම්මා, 1081, 1445

4. හෙතූ චෙව ධම්මා සහෙතුකා ච, 1082, 1446
සහෙතුකා චෙව ධම්මා න ච හෙතූ, 1083, 1447

5. හෙතූ චෙව ධම්මා හෙතුසම්පයුත්තා ච, 1084, 1448
හෙතුසම්පයුත්තා චෙව ධම්මා න ච හෙතූ, 1085, 1449

6. නහෙතූ[2] ඛො පන ධම්මා සහෙතුකාපි, 1086, 1450
අහෙතුකාපි 1087, 1451

## හෙතුගොච්ඡකං.

1. සප්පච්චයා ධම්මා, 1088, 1452
අප්පච්චයා ධම්මා. 1089, 1453

2. සඞ්ඛතා ධම්මා, 1090, 1454
අසඞ්ඛතා ධම්මා, 1091, 1455

3. සනිදස්සනා ධම්මා, 1092, 1456
අනිදස්සනා ධම්මා, 1093, 1457

---

1. හෙතු ධම්මා - මජසං. 2 නො හෙතු - PTS.

19. අතීතාලම්බනධර්මයෝ යැ,
අනාගතාලම්බනධර්මයෝ යැ,
ප්‍රත්‍යුත්පන්නාලම්බනධර්මයෝ යි.

20. අධ්‍යාත්මධර්මයෝ යැ,
බාහ්‍යධර්මයෝ යැ,
අධ්‍යාත්මබාහ්‍යධර්මයෝ යි.

21. අධ්‍යාත්මාලම්බනධර්මයෝ යැ,
බාහ්‍යාලම්බනධර්මයෝ යැ,
අධ්‍යාත්මබාහ්‍යාලම්බනධර්මයෝ යි.

22. සනිදර්ශනසප්‍රතිඝධර්මයෝ යැ,
අනිදර්ශනසප්‍රතිඝධර්මයෝ යැ,
අනිදර්ශනඅප්‍රතිඝධර්මයෝ යි.

### ත්‍රිකමාතෘකා යි.

1. හේතු නම් වූ ධර්මයෝ යැ,
හේතු නො වූ ධර්මයෝ යැ,

2. (සම්ප්‍රයුක්ත) හේතු සහිත වූ ධර්මයෝ යැ,
හේතු නැති ධර්මයෝ යැ,

3. (එකොත්පාදාදිවශයෙන්) හේතු සම්ප්‍රයුක්ත වූ ධර්මයෝ යැ,
හේතු විප්‍රයුක්ත වූ ධර්මයෝ යැ,

4. හේතු ද වූ සම්ප්‍රයුක්තහේතු සහිත ද වූ ධර්මයෝ යැ,
සහෙතුක වූ ද හෙතු නො වූ ද ධර්මයෝ යැ,

5. හේතු වූ ද හේතු සම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ යැ,
හේතු සම්ප්‍රයුක්ත වූ ද හේතු නො වූ ද ධර්මයෝ යැ,

6. යළි හේතු නො වූ සහේතුක ද වූ ධර්මයෝ යැ,
(හෙතු නො වූ) අහේතුක ද වූ ධර්මයෝ යි.

### හෙතුගොච්ඡකය යි.

1. සප්‍රත්‍යය වූ ධර්මයෝ යැ,
අප්‍රත්‍යය වූ ධර්මයෝ යැ,

2. සඞ්ඛත (ප්‍රත්‍යයන් විසින් සකස් කළ) ධර්මයෝ යැ,
අසඞ්ඛත (ප්‍රත්‍යයන් විසින් සකස් නො කළ) ධර්මයෝ යැ,

3 නිදර්ශන (දක්න යුතු බව) සහිත වූ ධර්මයෝ යැ,
අනිදර්ශන වූ ධර්මයෝ යැ,

4. සප්පටිඝා ධම්මා, 1094, 1458
අප්පටිඝා ධම්මා, 1095, 1459

5. රූපිනො ධම්මා, 1096, 1460
අරූපිනො ධම්මා, 1097, 1461

6. ලොකියා ධම්මා, 1098, 1462
ලොකුත්තරා ධම්මා, 1099, 1463

7 කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා, 1100, 1463
කෙනචි නවිඤ්ඤෙය්‍යා ධම්මා. 1100, 1463

## චූලන්තරදුකං.[1]

1. ආසවා ධම්මා, 1101, 1464
නොආසවා ධම්මා, 1106, 1465

2. සාසවා ධම්මා, 1107, 1466
අනාසවා ධම්මා, 1108, 1467

3. ආසවසම්පයුත්තා ධම්මා, 1109, 1468
ආසවවිප්පයුත්තා ධම්මා, 1110, 1469

4. ආසවා චෙව ධම්මා සාසවා ච, 1111, 1470
සාසවා චෙව ධම්මා නො ච ආසවා, 1112, 1471

5. ආසවා චෙව ධම්මා ආසවසම්පයුත්තා ච, 1113, 1472
ආසවසම්පයුත්තා චෙව ධම්මා නො ච ආසවා, 1114, 1473

6. ආසවවිප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි, 1115, 1474
අනාසවාපි. 1116, 1475

## ආසවගොච්ඡකං.

1. සඤ්ඤොජනා ධම්මා, 1117, 1476
නොසඤ්ඤොජනා ධම්මා, 1128, 1477

2. සඤ්ඤොජනියා ධම්මා, 1129, 1478
අසඤ්ඤොජනියා ධම්මා, 1130, 1479

3. සඤ්ඤොජනසම්පයුත්තා ධම්මා, 1131, 1480
සඤ්ඤොජනවිප්පයුත්තා ධම්මා, 1132, 1481

4 සඤ්ඤොජනා චෙව ධම්මා සඤ්ඤොජනියා ච, 1133, 1482
සඤ්ඤොජනියා චෙව ධම්මා නො ච සඤ්ඤොජනා, 1134, 1483

5. සඤ්ඤොජනා චෙව ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා ච, 1135, 1484
සඤ්ඤොජනසම්පයුත්තා චෙව ධම්මා
නො ච සඤ්ඤොජනා, 1136, 1485

6. සඤ්ඤොජනවිප්පයුත්තා ඛො පන ධම්මා
සඤ්ඤොජනියාපි, 1137, 1486
අසඤ්ඤොජනියාපි. 1138, 1487

## සඤ්ඤොජනගොච්ඡකං.

1. චූළන්තරදුකං - මජසං.

4. සප්‍රතිඝ (ගැටීම් සහිත) වූ ධර්‍මයෝ යෑ,
අප්‍රතිඝ වූ ධර්‍මයෝ යෑ,

5. රූපී වූ ධර්‍මයෝ යෑ,
අරූපී වූ ධර්‍මයෝ යෑ,

6. ලෞකික (ලොකයෙහි ඇතුලත්) වූ ධර්‍මයෝ යෑ,
ලෝකෝත්තර වූ ධර්‍මයෝ යෑ,

7. කිසි විඥානයකින් දතයුතු වූ ධර්‍මයෝ යෑ,
කිසි විඥානයකින් නො දතයුතු වූ ධර්‍මයෝ යි

චූලන්තරදුකය යි.

1. ආස්‍රව වූ ධර්‍මයෝ යෑ,
ආස්‍රව නො වූ ධර්‍මයෝ යෑ,

2. ආස්‍රව සහිත වූ ධර්‍මයෝ යෑ,
ආස්‍රව රහිත වූ ධර්‍මයෝ යෑ,

3. ආස්‍රව සම්ප්‍රයුක්ත වූ ධර්‍මයෝ යෑ,
ආස්‍රව විප්‍රයුක්ත වූ ධර්‍මයෝ යෑ,

4. ආස්‍රව වූ ද ආ ව සහිත වූ ද ධර්‍මයෝ යෑ,
ආස්‍රව සහිත වූ ද නො ද ආස්‍රව වූ ද ධර්‍මයෝ යෑ,

5. ආස්‍රව වූ ද ආස්‍රවසම්ප්‍රයුක්ත වූ ද ධර්‍මයෝ යෑ,
ආස්‍රව සම්ප්‍රයුක්ත වූ ද නො ද ආස්‍රව වූ ද ධර්‍මයෝ යෑ,

6. යළි ආස්‍රව විප්‍රයුක්ත වූ සාස්‍රව ද වූ ධර්‍මයෝ යෑ,
(ආස්‍රව විප්‍රයුක්ත වූ) අනාස්‍රව ද වූ ධර්‍මයෝ යි.

ආස්‍රවගොච්ඡකය යි.

1. සංයෝජන (පුහුල්හු සසර බඳනා) වූ ධර්‍මයෝ යෑ,
සංයෝජන නො වූ ධර්‍මයෝ යෑ,

2. සංයෝජනිය (සංයොජනයන්ට හිත) වූ ධර්‍මයෝ යෑ,
සංයෝජනිය නො වූ ධර්‍මයෝ යෑ,

3. සංයෝජනසම්ප්‍රයුක්ත වූ ධර්‍මයෝ යෑ,
සංයෝජනවිප්‍රයුක්ත වූ ධර්‍මයෝ යෑ,

4. සංයෝජන වූ ද සංයෝජනිය වූ ද ධර්‍මයෝ යෑ,
සංයෝජනිය වූ ද නො ද සංයෝජන වූ ද ධර්‍මයෝ යෑ,

5. සංයෝජන වූ ද සංයොජනසම්ප්‍රයුක්ත වූ ද ධර්‍මයෝ යෑ,
සංයෝජනසම්ප්‍රයුක්ත වූ ද නො ද සංයොජන වූ ද ධර්‍මයෝ යෑ,

6. යළි සංයොජනවිප්‍රයුක්ත වූ සංයොජනිය ද වූ ධර්‍මයෝ යෑ,
(සංයොජනවිප්‍රයුක්ත වූ) අසංයොජනිය ද වූ ධර්‍මයෝ යි.

සංයොජනගොච්ඡකය යි.

1. ගන්ථා ධම්මා, 1139, 1488
නොගන්ථා ධම්මා, 1144, 1489

2. ගන්ථනීයා ධම්මා, 1145, 1490
අගන්ථනීයා ධම්මා, 1146, 1491

3. ගන්ථසම්පයුත්තා ධම්මා, 1147, 1492
ගන්ථවිප්පයුත්තා ධම්මා, 1148, 1493

4. ගන්ථා චෙව ධම්මා ගන්ථනීයා ච, 1149, 1494
ගන්ථනීයා චෙව ධම්මා නො ච ගන්ථා, 1150, 1495

5. ගන්ථා චෙව ධම්මා ගන්ථසම්පයුත්තා ච, 1151, 1496
ගන්ථසම්පයුත්තා චෙව ධම්මා නො ච ගන්ථා, 1152, 1497

6. ගන්ථවිප්පයුත්තා ඛො පන ධම්මා ගන්ථනීයාපි, 1153, 1498
අගන්ථනීයාපි. 1154, 1499

### ගන්ථගොච්ඡකං.

1. ඔඝා ධම්මා, 1155, 1500
නොඔඝා ධම්මා,

2. ඔඝනීයා ධම්මා,
අනොඝනීයා ධම්මා,

3 ඔඝසම්පයුත්තා ධම්මා,
ඔඝවිප්පයුත්තා ධම්මා,

4 ඔඝා චෙව ධම්මා ඔඝනීයා ච,
ඔඝනීයා චෙව ධම්මා නො ච ඔඝා,

5. ඔඝා චෙව ධම්මා ඔඝසම්පයුත්තා ච,
ඔඝසම්පයුත්තා චෙව ධම්මා නො ච ඔඝා,

6. ඔඝවිප්පයුත්තා ඛො පන ධම්මා ඔඝනීයාපි,
අනොඝනීයාපි

### ඔඝගොච්ඡකං.

1 යොගා ධම්මා, 1156, 1501
නොයොගා ධම්මා,

2. යොගනීයා ධම්මා,
අයොගනීයා ධම්මා,

3. යොගසම්පයුත්තා ධම්මා,
යොගවිප්පයුත්තා ධම්මා,

1. ග්‍රන්ථ (ච්‍යුතිප්‍රතිසන්ධි විසින් සසර ගැටලන) ධම්මයෝ යැ,
ග්‍රන්ථ නො වූ ධම්මයෝ යැ,

2. ග්‍රන්ථනීය (අරමුණු කිරීම් වශයෙන් ග්‍රන්ථයන් විසින් ගෙනීය යුතු වූ ධම්මයෝ යැ,
ග්‍රන්ථනීය නො වූ ධම්මයෝ යැ,

3. ග්‍රන්ථසම්ප්‍රයුක්ත වූ ධම්මයෝ යැ,
ග්‍රන්ථවිප්‍රයුක්ත වූ ධම්මයෝ යැ,

4. ග්‍රන්ථ වූ ද ග්‍රන්ථනීය වූ ද ධම්මයෝ යැ,
ග්‍රන්ථනීය වූ ද නො ද ග්‍රන්ථ වූ ධම්මයෝ යැ,

5. ග්‍රන්ථ වූ ද ග්‍රන්ථසම්ප්‍රයුක්තත වූ ද ධම්මයෝ යැ,
ග්‍රන්ථ සම්ප්‍රයුක්ත වූ ද නො ද ග්‍රන්ථ වූ ධම්මයෝ යැ,

6. යළි ග්‍රන්ථවිප්‍රයුක්ත වූ ග්‍රන්ථනීය ද වූ ධම්මයෝ යැ,
(ග්‍රන්ථවිප්‍රයුක්ත වූ) ග්‍රන්ථනීය ද නො වූ ධම්මයෝ යි.

ග්‍රන්ථගොච්ඡකය යි.

1. ඕඝ (පුහුල්හු සසරැ ගලනා) වූ ධම්මයෝ යැ,
ඕඝ නො වූ ධම්මයෝ යැ,

2. ඕඝනීය (ඕඝයෙන් ඉක්මියයුතු) වූ ධම්මයෝ යැ,
ඕඝනීය නො වූ ධම්මයෝ යැ,

3. ඕඝසම්ප්‍රයුක්ත වූ ධම්මයෝ යැ,
ඕඝවිප්‍රයුක්ත වූ ධම්මයෝ යැ,

4. ඕඝ වූ ද ඕඝනීය වූ ද ධම්මයෝ යැ,
ඕඝනීය වූ ද ඕඝ නො වූ ද ධම්මයෝ යැ,

5. ඕඝ වූ ද, ඕඝසම්ප්‍රයුක්ත වූ ද ධම්මයෝ යැ,
ඕඝසම්ප්‍රයුක්ත වූ ද නො ඕඝ වූ ධම්මයෝ යැ,

6. යළි ඕඝවිප්‍රයුක්ත වූ ඕඝනීය ද වූ ධම්මයෝ යැ,
(ඕඝවිප්‍රයුක්ත වූ,) ඕඝනීය ද නො වූ ධම්මයෝ යි.

ඕඝගොච්ඡකය යි.

1. යොග ( ගුල්හු සසරැ යොදන) ධම්මයෝ යැ,
යොග නො වූ ධම්මයෝ යැ,

2. යොගනීය ධම්මයෝ යැ,
අයොගනීය ධම්මයෝ යැ,

3. යොගසම්ප්‍රයුක්ත වූ ධම්මයෝ යැ,
යොගවිප්‍රයුක්ත වූ ධම්මයෝ යැ,

4. යොගා චෙව ධම්මා යොගනීයා ච,
යොගනීයා චෙව ධම්මා නො ච යොගා,

5. යොගා චෙව ධම්මා යොගසම්පයුත්තා ච,
යොගසම්පයුත්තා චෙව ධම්මා නො ච යොගා,

6. යොගවිප්පයුත්තා ඛො පන ධම්මා යොගනීයාපි,
අයොගනීයාපි.

**යොගගොච්ඡකං.**

1. නීවරණා ධම්මා, 1157, 1502
නොනීවරණා ධම්මා, 1168, 1503

2 නීවරණියා ධම්මා, 1169, 1504
අනීවරණියා ධම්මා, 1170, 1505

3. නීවරණසම්පයුත්තා ධම්මා, 1171, 1506
නීවරණවිප්පයුත්තා ධම්මා, 1172, 1507

4. නීවරණා චෙව ධම්මා නීවරණියා ච, 1173, 1508
නීවරණියා චෙව ධම්මා නො ච නීවරණා, 1174, 1509

5. නීවරණා චෙව ධම්මා නීවරණසම්පයුත්තා ච, 1175, 1510
නීවරණසම්පයුත්තා චෙව ධම්මා නො ච නීවරණා, 1176, 1511

6. නීවරණවිප්පයුත්තා ඛො පන ධම්මා නීවරණියාපි, 1177, 1512
අනීවරණියාපි. 1178, 1513

**නීවරණගොච්ඡකං.**

1. පරාමාසා ධම්මා, 1179, 1514
නොපරාමාසා ධම්මා, 1181, 1515

2. පරාමට්ඨා ධම්මා, 1182, 1516
අපරාමට්ඨා ධම්මා, 1183, 1517

3. පරාමාසසම්පයුත්තා ධම්මා, 1184, 1518
පරාමාසවිප්පයුත්තා ධම්මා, 1185, 1519

4. පරාමාසා චෙව ධම්මා පරාමට්ඨා ච, 1186, 1520
පරාමට්ඨා චෙව ධම්මා නො ච පරාමාසා, 1187, 1521

5. පරාමාසවිප්පයුත්තා ඛො පන ධම්මා පරාමට්ඨාපි, 1188, 1522
අපරාමට්ඨාපි. 1189, 1523

**පරාමාසගොච්ඡකං.**

4. යෝග වූ ද යෝගනීය ද ධර්මයෝ යැ,
යෝගනීය වූ ද යෝග නො වූ ද ධර්මයෝ ය,

5. යෝග වූ ද යෝගසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ යැ,
යෝගසම්ප්‍රයුක්ත වූ ද නො ද යෝග වූ ධර්මයෝ යැ,

6. යළි යොගවිප්‍රයුක්ත වූ යොගනීය ද වූ ධර්මයෝ යැ,
(යොගවිප්‍රයුක්ත වූ) අයොගනීය ද වූ ධර්මයෝ යි.

යොගගොච්ඡකය යි.

1. නීවරණ (සිත හාත්පසින් බැඳගන්නා) වූ ධර්මයෝ යැ,
නීවරණ නො වූ ධර්මයෝ යැ,

2. නීවරණීය (නීවරණයන්ට හිත) වූ ධර්මයෝ යැ,
අනීවරණීය වූ ධර්මයෝ යැ,

3. නීවරණසම්ප්‍රයුක්ත වූ ධර්මයෝ යැ,
නීවරණවිප්‍රයුක්ත වූ ධර්මයෝ යැ,

4. නීවරණ වූ ද නීවරණීය වූ ද ධර්මයෝ යැ,
නීවරණීය වූ ද නො ද නීවරණ වූ ධර්මයෝ යැ,

5. නීවරණ වූ ද නීරවණසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ යැ,
නීවරණසම්ප්‍රයුක්ත වූ ද නො ද නීවරණ වූ ධර්මයෝ යැ,

6. යළි නීවරණවිප්‍රයුක්ත වූ නීවරණීය ද වූ ධර්මයෝ යැ,
(නීවරණවිප්‍රයුක්ත වූ) අනීවරණීය ද වූ ධර්මයෝ යි.

නීවරණගොච්ඡකය යි.

1. පරාමර්ශ (නිත්‍යාදි වශයෙන් වරදවා ගන්නා) ධර්මයෝ යැ,
පරාමර්ශ නො වූ ධර්මයෝ යැ,

2. පරාමෘෂ්ට (පරාමාසයන් විසින් අරමුණු කළ) ධර්මයෝ යැ,
අපරාමෘෂ්ට (පරාමාසයන් විසින් අරමුණු නො කළ) ධර්මයෝ යැ,

3. පරාමාසසම්ප්‍රයුක්ත වූ ධර්මයෝ යැ,
පරාමාසවිප්‍රයුක්ත වූ ධර්මයෝ යැ,

4. පරාමර්ශ වූ ද පරාමෘෂ්ට වූ ද ධර්මයෝ යැ,
පරාමෘෂ්ට වූ ද නො ද පරාමර්ශ වූ ධර්මයෝ යැ,

5. යළි පරාමර්ශ විප්‍රයුක්ත වූ පරාමෘෂ්ට ද වූ ධර්මයෝ යැ,
(පරාමර්ශ විප්‍රයුක්ත වූ) අපරාමෘෂ්ට ද වූ ධර්මයෝ යි.

පරාමාසගොච්ඡකය යි.

1. සාරම්මණා ධම්මා, 1190, 1524
අනාරම්මණා ධම්මා, 1191, 1525

2. චිත්තා ධම්මා, 1192, 1526
නොචිත්තා ධම්මා, 1193, 1527

3. චෙතසිකා ධම්මා, 1194, 1528
අචෙතසිකා ධම්මා, 1195, 1529

4. චිත්තසම්පයුත්තා ධම්මා, 1196, 1530
චිත්තවිප්පයුත්තා ධම්මා, 1197, 1531

5. චිත්තසංසට්ඨා ධම්මා, 1198, 1532
චිත්තවිසංසට්ඨා ධම්මා, 1199, 1533

6. චිත්තසමුට්ඨානා ධම්මා, 1200, 1534
නොචිත්තසමුට්ඨානා ධම්මා, 1201, 1535

7. චිත්තසහභුනො ධම්මා, 1202, 1536
නොචිත්තසහභුනො ධම්මා, 1203, 1537

8. චිත්තානුපරිවත්තිනො ධම්මා, 1204, 1538
නොචිත්තානුපරිවත්තිනො ධම්මා, 1205, 1539

9. චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා, 1206, 1540
නොචිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා, 1207, 1541

10. චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො ධම්මා, 1208, 1242
නොචිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො ධම්මා, 1209, 1543

11. චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා, 1210, 1544
නොචිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා, 1211, 1545

12. අජ්ඣත්තිකා ධම්මා, 1212, 1546
බාහිරා ධම්මා, 1213, 1547

13. උපාදා ධම්මා, 1214, 1448
නොඋපාදා ධම්මා, 1215, 1549

14. උපාදින්නා ධම්මා, 1216, 1550
අනුපාදින්නා[1] ධම්මා 1517, 1551

මහන්තරදුකං.

1. උපාදානා ධම්මා, 1218, 1552
නොඋපාදානා ධම්මා, 1223, 1553

2. උපාදානියා ධම්මා, 1224, 1554
අනුපාදානියා ධම්මා, 1225, 1555

1. නො උපාදින්නා - සිමු. 1

1. සාරම්මණ (ආලම්බන සහිත) වූ ධර්මයෝ ය,
අනාරම්මණ (ආලම්බන රහිත) වූ ධර්මයෝ ය,

2. චිත්තධර්මයෝ ය,
චිත්ත නො වූ ධර්මයෝ ය,

3. චෛතසික (සිත්හි යෙදුණු) ධර්මයෝ ය,
චෛතසික නො වූ ධර්මයෝ ය,

4. චිත්තසම්ප්‍රයුක්ත වූ ධර්මයෝ ය,
චිත්තවිප්‍රයුක්ත වූ ධර්මයෝ ය,

5. චිත්තසංසෘෂ්ට (සිත හා මිශ්‍ර) වූ ධර්මයෝ ය,
චිත්තවිසංසෘෂ්ට (සිත හා මිශ්‍ර නො වූ) ධර්මයෝ ය,

6. චිත්තසමුට්ඨාන (සිතින් හටගන්නා) ධර්මයෝ ය,
චිත්තසමුට්ඨාන නො වූ ධර්මයෝ ය,

7. චිත්තසහභූ (සිත හා එක් ව උපදනා) ධර්මයෝ ය,
චිත්තසහභූ නො වූ ධර්මයෝ ය.

8. චිත්තානුපරිවර්ති (සිත අනුව පෙරළෙන සුළු) ධර්මයෝ ය,
චිත්තානුපරිවර්ති නො වූ ධර්මයෝ ය,

9. චිත්තසංසෘෂ්ටසමුත්ථාන වූ ධර්මයෝ ය,
චිත්තසංසෘෂ්ටසමුත්ථාන නො වූ ධර්මයෝ ය,

10. චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ ධර්මයෝ ය,
චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ නො වූ ධර්මයෝ ය,

11. චිත්තසංසෘෂ්ට - සමුත්ථාන - අනුපරිවර්ති වූ ධර්මයෝ ය,
චිත්තසංසෘෂ්ට - සමුත්ථාන - අනුපරිවර්ති නො වූ ධර්මයෝ ය,

12. ආධ්‍යාත්මික වූ ධර්මයෝ ය,
බාහ්‍ය වූ ධර්මයෝ ය,

13. උපාදා (භූතයන් නිසා පවත්නා) ධර්මයෝ ය,
උපාදා නො වූ ධර්මයෝ ය,

14. උපාදින්න (කර්මය විසින් ඵලභාවයෙන් ගන්නා ලද) වූ ධර්මයෝ ය,
අනුපාදින්න වූ ධර්මයෝ යි.

මහන්තරදුකය යි.

1. උපාදාන (දැඩි ව ගන්නා) වූ ධර්මයෝ ය,
උපාදාන නො වූ ධර්මයෝ ය,

2. උපාදානීය (උපාදානයන්ට හිත) වූ ධර්මයෝ ය,
අනුපාදානීය ධර්මයෝ ය,

3. උපාදානසම්පයුත්තා ධම්මා, 1226, 1556
උපාදානවිප්පයුත්තා ධම්මා, 1227, 1557

4. උපාදානා චෙව ධම්මා උපාදානියා ච, 1228, 1558
උපාදානියා චෙව ධම්මා නො ච උපාදානා, 1229, 1559

5. උපාදානා චෙව ධම්මා උපාදානසම්පයුත්තා ච, 1230, 1560
උපාදානසම්පයුත්තා චෙව ධම්මා නො ච උපාදානා, 1231, 1561

6. උපාදානවිප්පයුත්තා ඛො පන ධම්මා උපාදානියාපි, 1232, 1562
අනුපාදානියාපි. 1233, 1563

### උපාදානගොච්ඡකං.

1. කිලෙසා ධම්මා, 1234, 1564
නොකිලෙසා ධම්මා, 1245, 1565

2. සඞ්කිලෙසිකා ධම්මා, 1246, 1566
අසඞ්කිලෙසිකා ධම්මා, 1247, 1567

3. සඞ්කිලිට්ඨා ධම්මා, 1248, 1568
අසඞ්කිලිට්ඨා ධම්මා, 1249, 1569

4. කිලෙසසම්පයුත්තා ධම්මා, 1250, 1570
කිලෙසවිප්පයුත්තා ධම්මා, 1251, 1571

5. කිලෙසා චෙව ධම්මා සඞ්කිලෙසිකා ච, 1252, 1572
සඞ්කිලෙසිකා චෙව ධම්මා නො ච කිලෙසා. 1253, 1573

6. කිලෙසා චෙව ධම්මා සඞ්කිලිට්ඨා ච, 1254, 1574
සඞ්කිලිට්ඨා චෙව ධම්මා නො ච කිලෙසා, 1255, 1575

7. කිලෙසා චෙව ධම්මා කිලෙසසම්පයුත්තා ච, 1256, 1576
කිලෙසසම්පයුත්තා චෙව ධම්මා නො ච කිලෙසා, 1257, 1577

8. කිලෙසවිප්පයුත්තා ඛො පන ධම්මා සඞ්කිලෙසිකාපි, 1258, 1578
අසඞ්කිලෙසිකා පි. 1259, 1579

### කිලෙසගොච්ඡකං.

1. දස්සනෙන පහාතබ්බා ධම්මා, 1260, 1580
න දස්සනෙන පහාතබ්බා ධම්මා, 1264, 1581

2. භාවනාය පහාතබ්බා ධම්මා, 1265, 1582
න භාවනාය පහාතබ්බා ධම්මා, 1265, 1583

3. දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා, 1267, 1584
න දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා, 1271, 1585

3. උපාදානසම්ප්‍රයුක්ත වූ ධර්මයෝ ය,
උපාදානවිප්‍රයුක්ත වූ ධර්මයෝ ය,

4. උපාදාන වූ ද උපාදානීය වූ ද ධර්මයෝ ය,
උපාදානීය වූ නො ද උපාදාන වූ ධර්මයෝ ය,

5. උපාදාන වූ ද උපාදානසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ ය,
උපාදානසම්ප්‍රයුක්ත වූ ද නො ද උපාදාන වූ ධර්මයෝ ය.

6. යළි උපාදානවිප්‍රයුක්ත වූ උපාදානීය ද වූ ධර්මයෝ ය,
(උපාදානවිප්‍රයුක්ත වූ) අනුපාදානීය ද වූ ධර්මයෝ යි.

### උපාදානගොච්ඡකය යි.

1. ක්ලෙශ ධර්මයෝ ය,
ක්ලෙශ නො වූ ධර්මයෝ ය,

2. සාංක්ලෙශික ධර්මයෝ ය,
අසාංක්ලෙශික ධර්මයෝ ය,

3. සංක්ලිෂ්ට ධර්මයෝ ය,
අසංක්ලිෂ්ට ධර්මයෝ ය,

4. ක්ලේශසම්ප්‍රයුක්ත ධර්මයෝ ය,
ක්ලේශවිප්‍රයුක්ත ධර්මයෝ ය,

5. ක්ලේශ වූ ද සාංක්ලෙශික වූ ද ධර්මයෝ ය,
සාංක්ලේශික වූ ද නො ද ක්ලෙශ වූ ධර්මයෝ ය,

6. ක්ලේශ වූ ද සංක්ලිෂ්ට වූ ද ධර්මයෝ ය,
සංක්ලිෂ්ට වූ ද නො ද ක්ලෙශ වූ ධර්මයෝ ය,

7. ක්ලේශ වූ ද ක්ලෙශසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ ය,
ක්ලෙශසම්ප්‍රයුක්ත වූ ද නො ද ක්ලෙශ වූ ධර්මයෝ ය,

8. යළි ක්ලේශවිප්‍රයුක්ත වූ සාංක්ලෙශික ද වූ ධර්මයෝ ය,
(ක්ලෙශවිප්‍රයුක්ත වූ) අසාංක්ලෙශික ද වූ ධර්මයෝ යි.

### ක්ලේශගොච්ඡකය යි.

1. දර්ශනයෙන් (සෝවන් මගින්) ප්‍රහාතව්‍ය වූ ධර්මයෝ ය,
දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ ය.

2. භාවනායෙන් (සෙසු තුන් මගින්) ප්‍රහාතව්‍ය වූ ධර්මයෝ ය,
භාවනායෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ ය,

3. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ හේතු ඇති ධර්මයෝ ය,
දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ හේතු නැති ධර්මයෝ ය,

4. භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා, 1272, 1586
න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා, 1273, 1587

5. සවිතක්කා ධම්මා, 1274, 1588
අවිතක්කා ධම්මා, 1275, 1589

6. සවිචාරා ධම්මා, 1276, 1590
අවිචාරා ධම්මා, 1277, 1591

7. සප්පීතිකා ධම්මා, 1278, 1592
අප්පීතිකා ධම්මා, 1279, 1593

8. පීතිසහගතා ධම්මා, 1280, 1594
න පීතිසහගතා ධම්මා, 1281, 1595

9 සුඛසහගතා ධම්මා, 1282, 1596
න සුඛසහගතා ධම්මා, 1283, 1597

10. උපෙක්ඛාසහගතා ධම්මා, 1284, 1598
න උපෙක්ඛාසහගතා ධම්මා, 1285, 1599

11. කාමාවචරා ධම්මා, 1286, 1600
න කාමාවචරා ධම්මා, 1287, 1601

12. රූපාවචරා ධම්මා, 1288, 1602
න රූපාවචරා ධම්මා, 1289, 1603

13. අරූපාවචරා ධම්මා, 1290, 1604
න අරූපාවචරා ධම්මා, 1291, 1605

14. පරියාපන්නා ධම්මා, 1292, 1606
අපරියාපන්නා ධම්මා, 1203, 1607

15. නිය්‍යානිකා ධම්මා, 1294, 1608
අනිය්‍යානිකා ධම්මා. 1295, 1609

16. නියතා ධම්මා, 1296, 1610
අනියතා ධම්මා, 1297, 1611

17. සඋත්තරා ධම්මා, 1298, 1612
අනුත්තරා ධම්මා, 1299, 1613

18. සරණා ධම්මා, 1300, 1614
අරණා[1] ධම්මා. 1301, 1615

**පිට්ඨිදුකං.**

**අභිධම්මමාතිකා.**

---

1. අසරණා - PTS.

4. භාවනායෙන් ප්‍රහාතව්‍ය වූ හේතු ඇති ධර්මයෝ ය,
භාවනායෙන් ප්‍රහාතව්‍ය වූ හේතු නැති ධර්මයෝ ය,

5. විතර්ක සහිත වූ ධර්මයෝ ය,
විතර්ක රහිත වූ ධර්මයෝ ය,

6. විචාර සහිත වූ ධර්මයෝ ය,
විචාර රහිත වූ ධර්මයෝ ය,

7. ප්‍රීති සහිත වූ ධර්මයෝ ය,
ප්‍රීති රහිත වූ ධර්මයෝ ය,

8. ප්‍රීති සහගත වූ ධර්මයෝ ය,
ප්‍රීති සහගත නො වූ ධර්මයෝ ය,

9. සුඛ සහගත වූ ධර්මයෝ ය,
සුඛ සහගත නො වූ ධර්මයෝ ය,

10. උපේක්‍ෂා සහගත වූ ධර්මයෝ ය,
උපේක්‍ෂා සහගත නො වූ ධර්මයෝ ය,

11. කාමාවචර වූ ධර්මයෝ ය,
කාමාවචර නො වූ ධර්මයෝ ය,

12. රූපාවචර වූ ධර්මයෝ ය,
රූපාවචර නො වූ ධර්මයෝ ය,

13. අරූපාවචර වූ ධර්මයෝ ය,
අරූපාවචර නො වූ ධර්මයෝ ය,

14. පර්‍යාපන්න (තුන්වටෙහි ඇතුළත්) වූ ධර්මයෝ ය,
අපර්‍යාපන්න ධර්මයෝ ය,

15. නෛර්‍යාණික වූ (නිවන අරමුණු කොට සසරින් නික්ම යන) ධර්මයෝ ය,
අනෛර්‍යාණික වූ ධර්මයෝ ය,

16. නියත (ච්‍යුතියට අනතුරුව ඵල දීමෙහි නියත) වූ ධර්මයෝ ය,
අනියත වූ ධර්මයෝ ය,

17. සඋත්තර (උතුරුඅහම් සහිත) වූ ධර්මයෝ ය,
අනුත්තර වූ ධර්මයෝ ය,

18. සරණ (රාගාදි රණයන් සහිත) වූ ධර්මයෝ ය,
අරණ වූ ධර්මයෝ යි.

පිට්ඨිදුකය යි.

අභිධම්මමාතිකා නිමි.

1. විජ්ජාභාගිනො ධම්මා, 1302
අවිජ්ජාභාගිනො ධම්මා, 1303

2. විජ්ජූපමා ධම්මා, 1304
වජිරූපමා ධම්මා, 1305

3. බාලා ධම්මා, 1306
පණ්ඩිතා ධම්මා, 1307

4. කණ්හා ධම්මා, 1308
සුක්කා ධම්මා, 1309

5. තපනීයා ධම්මා, 1310
අතපනීයා ධම්මා, 1311

6. අධිවචනා ධම්මා, 1312
අධිවචනපථා ධම්මා, 1312

7. නිරුත්ති ධම්මා, 1313
නිරුත්තිපථා ධම්මා, 1313

8 පඤ්ඤත්ති ධම්මා, 1314
පඤ්ඤත්තිපථා ධම්මා, 1314

9. නාමඤ්ච, 1315
රූපඤ්ච, 1316

10 අවිජ්ජා ච, 1317
භවතණ්හා ච, 1318

11. භවදිට්ඨි ච, 1319
විභවදිට්ඨි ච, 1320

12. සස්සතදිට්ඨි ච, 1321
උච්ඡෙදදිට්ඨි ච, 1322

13. අන්තවා දිට්ඨි ච, 1323
අනන්තවා දිට්ඨි ච, 1324

14 පුබ්බන්තානුදිට්ඨි ච, 1325
අපරන්තානුදිට්ඨි ච, 1326

15. අහිරිකඤ්ච, 1327
අනොත්තප්පඤ්ච, 1328

16. හිරි ච, 1329
ඔත්තප්පඤ්ච, 1330

17 දොවචස්සතා ච, 1331
පාපමිත්තතා ච, 1332

1. විජ්ජාභාගී (විද්‍යාව භජනය කරන) ධර්මයෝ ය,
අවිජ්ජාභාගී (අවිද්‍යාව භජනය කරන) ධර්මයෝ ය,

2. විදුලිය උපමා කොට ඇති ධර්මයෝ ය,
වජ්‍රය උපමා කොට ඇති ධර්මයෝ ය,

3. බාල (බාලයන් කෙරෙහි සිටි) ධර්මයෝ ය,
පණ්ඩිත (පණ්ඩිතයන් කෙරෙහි සිටි) ධර්මයෝ ය,

4. කෘෂ්ණ (සිත අප්‍රභාස්වර කරන) ධර්මයෝ ය,
ශුක්ල (සිත ප්‍රභාස්වර කරන) ධර්මයෝ ය,

5. තපනීය (මෙලොව පරලොව තවන) ධර්මයෝ ය,
අතපනීය ධර්මයෝ ය,

6. අධිවචන (වචනමාත්‍රය මැ ප්‍රධාන කොට පවත්නා) ධර්මයෝ ය,
අධිවචනපථ ධර්මයෝ ය,

7. නිරුක්ති ධර්මයෝ ය,
නිරුක්තිපථධර්මයෝ ය,

8. ප්‍රඥප්ති ධර්මයෝ ය,
ප්‍රඥප්තිපථ ධර්මයෝ ය

9. (නමන ලක්‍ෂණ වූ) නාමය ද,
(රූපන ලක්‍ෂණ වූ) රූපය ද,

10. (දුඃඛාදීන්හි නොදැනීම වූ) අවිද්‍යාව ද,
(භවය ප්‍රාර්ථනා කරන) භවතෘෂ්ණාව ද,

11. භව (ශාශ්වත වශයෙන් උපදනා) දෘෂ්ටිය ද,
විභව (උච්ඡේද වශයෙන් උපදනා) දෘෂ්ටිය ද,

12. ශාශ්වත දෘෂ්ටිය ද,
උච්ඡේද දෘෂ්ටිය ද,

13. අන්තවත් දෘෂ්ටිය ද,
අනන්තවත් දෘෂ්ටිය ද,

14. පූර්වාන්තය අනුව ගිය දෘෂ්ටිය ද,
අපරාන්තය අනුව ගිය දෘෂ්ටිය ද,

15. අහ්‍රීකය (ලජ්ජා නැති බව) ද,
අනපත්‍රපාව (බිය නො වන බව) ද,

16. හ්‍රිය (ලජ්ජාව) ද,
අපත්‍රපාව (බිය වීම) ද,

17. දුර්වච බව ද,
සුවච බව ද,

18. සොවචස්සතා ච, 1333
කල්‍යාණමිත්තතා ච, 1334

19. ආපත්තිකුසලතා ච, 1335
ආපත්තිවුට්ඨානකුසලතා ච, 1336

20. සමාපත්තිකුසලතා ච, 1337
සමාපත්තිවුට්ඨානකුසලතා ච, 1338

21. ධාතුකුසලතා ච, 1339
මනසිකාරකුසලතා ච, 1340

22. ආයතනකුසලතා ච, 1341
පටිච්චසමුප්පාදකුසලතා ච, 1342

23. ඨානකුසලතා ච, 1343
අට්ඨානකුසලතා ච, 1344

24. අජ්ජවො ච, 1345
මද්දවො ච, 1346

25. ඛන්ති ච, 1347
සොරච්චඤ්ච, 1348

26. සාඛල්‍යඤ්ච, 1349
පටිසන්ථාරො ච, 1350

27. ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච, 1351
භොජනෙ අමත්තඤ්ඤුතා ච, 1352

28. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා ච, 1353
භොජනෙ මත්තඤ්ඤුතා ච, 1354

29. මුට්ඨස්සච්චඤ්ච, 1355
අසම්පජඤ්ඤඤ්ච, 1356

30. සති ච, 1357
සම්පජඤ්ඤඤ්ච. 1358

31. පටිසඞ්ඛානබලඤ්ච, 1359
භාවනාබලඤ්ච, 1360

32. සමථො ච, 1361
විපස්සනා ච, 1362

33. සමථනිමිත්තඤ්ච, 1363
පග්ගාහනිමිත්තඤ්ච, 1364

34. පග්ගාහො ච, 1365
අවික්ඛෙපො ච, 1366

35. සීලවිපත්ති ච, 1367
දිට්ඨිවිපත්ති ච, 1368

18. පාපමිත්‍රයන් ඇති බව ද,
කල්‍යාණමිත්‍රයන් ඇති බව ද,

19. ආපත්තියෙහි කුශල බව ද,
ආපත්තියෙන් නැගී සිටීමෙහි කුශල බව ද,

20. සමාපත්තියෙහි කුශල බව ද,
සමාපත්තියෙන් නැගී සිටීමෙහි කුශල බව ද,

21. (අටළොස්) ධාතුයෙහි කුශල බව ද,
(ධාතු) මනසිකාරයෙහි කුශල බව ද,

22. (චක්ෂුරාදි) ආයතනයෙහි කුශල බව ද,
ප්‍රතීත්‍යසමුත්පාදයෙහි කුශල බව ද,

23 ඨාන (කාරණයෙහි) කුශල බව ද,
අට්ඨාන (අකාරණයෙහි) කුශල බව ද,

24. ඍජු බව ද,
මෘදු බව ද,

25. ක්ෂාන්තිය (ඉවසීම) ද,
සුරත බව ද,

26. සඛිල (මෘදු) බව ද,
(ධර්මාමිෂයෙන්) පටිසන්ථාරය ද,

27. ඉන්ද්‍රියයන්හි නො පියූ දොර ඇති බව ද,
තෝජනයෙහි පමණ නො දන්නා බව ද,

28. ඉන්ද්‍රියයන්හි පියූ දොර ඇති බව ද,
භෝජනයෙහි පමණදන්නා බව ද,

29. මුසසමෘති (මුළා සිහි ඇති) බව ද,
සම්‍යක්ප්‍රඥ නැති බව ද,

30. සමෘතිය ද,
සම්‍යක්ප්‍රඥ ඇති බව ද,

31. පටිසංඛාන (ප්‍රත්‍යවෙක්ෂා) බලය ද,
භාවනා බලය ද,

32. ශමථය ද,
විදර්ශනාව ද,

33. ශමථ නිමිත්ත ද,
ප්‍රග්‍රාහ නිමිත්ත ද,

34. ප්‍රග්‍රාහය ද,
අවික්ෂෙපය ද,

35. ශීලවිපත්තිය ද,
දෘෂ්ටිවිපත්තිය ද,

36. සීලසම්පදා ච, 1369
දිට්ඨිසම්පදා ච, 1370

37 සීලවිසුද්ධි ච, 1371
දිට්ඨිවිසුද්ධි ච, 1372

38. දිට්ඨිවිසුද්ධි ඛො පන, 1373
යථාදිට්ඨිස්ස ච පධානං, 1374

39. සංවෙගො ච සංවෙජනීයෙසු ඨානෙසු, 1375
සංවිග්ගස්ස ච යොනිසො පධානං, 1376

40. අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු, 1377
අප්පටිවානිතා ච පධානස්මිං, 1378

41. විජ්ජා ච, 1379
විමුත්ති ච, 1380

42. ඛයෙ ඤාණං, 1381
අනුප්පාදෙ ඤාණන්ති. 1382

**සුත්තන්තමාතිකා**

**මාතිකා නිට්ඨිතා.**

36. ශීලසම්පත්තිය ද,
දෘෂ්ටිසම්පත්තිය ද,

37. ශීලවිශුද්ධිය ද,
දෘෂ්ටිවිශුද්ධිය ද,

38. (කර්මස්වකතාඥාන සඞ්ඛ්‍යාත වූ) දෘෂ්ටිවිශුද්ධිය ද,
අනුරූපදෘෂ්ටි ඇත්තහුගේ වීර්යය ද,

39. සංවේජනීය කාරණයෙහි සංවේගය ද,
සංවිග්න වූවහුගේ සම්‍යක්ප්‍රධන් වීර්යය ද,

40. කුශලධර්මපූරණයෙහි අසන්තුෂ්ටි බව ද,
ප්‍රධන්වීර්යයෙහි නො නවත්නා බව ද,

41. ත්‍රිවිද්‍යාව ද,
විමුක්තිය ද,

42. (ක්ලේශක්ෂය සඞ්ඛ්‍යාත) ආර්යමාර්ගයෙහි ඥානය,
අනුත්පාදයෙහි (ආර්යඵලයෙහි) ඥානය යි.

සූත්‍රාන්තමාතෘකා යි.

මාතෘකා නිමි.

1. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ. තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති, සම්මාසංකප්පො හොති, සම්මාවායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සද්ධාබලං හොති, විරියබලං හොති, සතිබලං හොති, සමාධිබලං හොති, පඤ්ඤාබලං හොති, හිරිබලං හොති, ඔත්තප්පබලං හොති, අලොභො හොති, අදොසො හොති, අමොහො හොති, අනභිජ්ඣා හොති, අව්‍යාපාදො හොති, සම්මාදිට්ඨි හොති, හිරි හොති, ඔත්තප්පං හොති කායපස්සද්ධි හොති, චිත්තපස්සද්ධි හොති, කායලහුතා හොති, චිත්තලහුතා හොති, කායමුදුතා හොති, චිත්තමුදුතා හොති, කායකම්මඤ්ඤතා හොති, චිත්තකම්මඤ්ඤතා හොති, කායපාගුඤ්ඤතා හොති, චිත්තපාගුඤ්ඤතා හොති, කායුජ්ජුකතා හොති, චිත්තුජ්ජුකතා හොති, සති හොති, සම්පජඤ්ඤං හොති, සමථො හොති, විපස්සනා හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා-ඉමෙ ධම්මා කුසලා.

2. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං - අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

3. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා-අයං තස්මිං සමයෙ වෙදනා හොති.

4. කතමා තස්මිං සමයෙ සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං-අයං තස්මිං සමයෙ සඤ්ඤා හොති.

5. කතමා තස්මිං සමයෙ චෙතනා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා චෙතනා සංචෙතනා චෙතයිතත්තං[1] - අයං තස්මිං සමයෙ චෙතනා හොති.

1. සංචෙතයිතත්තං - PTS.

1. කවර දහම්හු කුසල්හ යත්:

යම් කාලෙක්හි රූපාලම්බන වේවයි ශබ්දාලම්බන වේවයි ගන්ධාලම්බන වේවයි රසාලම්බන වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ධර්මාලම්බන වේවයි යම් යම් අරමුණෙකැ හෝ එල්බැ සොම්නස් සහගිය ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුශල චිත්තය උපදනේ (ක්ෂණත්‍රයගත) වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, ප්‍රීතිය වෙයි, සුඛය වෙයි, චිත්තයාගේ ඒකාග්‍රතාව වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, වීර්යෙන්ද්‍රිය වෙයි, ස්මෘතීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රිය වෙයි; මනින්ද්‍රිය වෙයි, සෞමනස්සින්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි, සම්‍යග්දෘෂ්ටිය වෙයි, සම්‍යක්-සංකල්පය වෙයි, සම්‍යග් ව්‍යායාමය වෙයි, සම්‍යක්ස්මෘතිය වෙයි, සම්‍යක් සමාධිය වෙයි, ශ්‍රද්ධාබලය වෙයි, වීර්යබලය වෙයි, ස්මෘතිබලය වෙයි, සමාධිබලය වෙයි, ප්‍රඥාබලය වෙයි, හිරිබලය වෙයි; ඔත්තප්පබලය වෙයි, අලෝභය වෙයි, අද්වේෂය වෙයි, අමෝහය වෙයි, අනභිධ්‍යාව වෙයි, අව්‍යාපාදය වෙයි, සම්‍යග්දෘෂ්ටිය වෙයි, හිරිය වෙයි, ඔත්තප්පය වෙයි, කායප්‍රශ්‍රබ්ධිය වෙයි, චිත්තප්‍රශ්‍රබ්ධිය වෙයි, කායලඝුත්වය වෙයි, චිත්තලඝුත්වය වෙයි, කායමෘදුත්වය වෙයි, චිත්තමෘදුත්වය වෙයි, කායකර්මණ්‍යතාව වෙයි, චිත්තකර්මණ්‍යතාව වෙයි, කායප්‍රාගුණ්‍යතාව වෙයි, චිත්තප්‍රාගුණ්‍යතාව වෙයි, කාය-ඍජුත්වය වෙයි, චිත්ත-ඍජුත්වය වෙයි, ස්මෘතිය වෙයි, සම්‍යග්ඥානය වෙයි, ශමථය වෙයි, විදර්ශනාව වෙයි, ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂෙපය වේ. එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපී ධර්ම කෙනෙක් හෝ වෙත් නම් මේ ධර්මයෝ කුශලයෝ යි.

2. කවරෙක් එසමයෙහි (කාමාවචර මහාකුශලචිත්තය උපදනා ඇසිල්ලෙහි) ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශ කරන අයුරෙක් මොනොවට ස්පර්ශ කරන අයුරෙක් මොනොවට ස්පර්ශ කළ බවෙක් වේ ද මේ එසමයෙහි ස්පර්ශය වේ.

3. කවරක් එසමයෙහි වේදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප මනෝවිඥානධාතුහුගේ සංස්පර්ශයෙන් උපන් චෛතසික වූ යම් මිහිරෙක් චෛතසික සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් මධුර වූ වේදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් මධුර වූ සුඛ වේදනාවෙක් වේ ද මේ - එසමයෙහි වේදනාව වේ.

4. කවරක් එසමයෙහි සංඥා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනොවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් සංඥාවෙක් සඤ්ජානනාකාරයෙක් හැඳිනගත් බවෙක් වේ ද - මේ එසමයෙහි සංඥාව වේ.

5. කවරක් එසමයෙහි චෙතනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනෝවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් චේතනාවෙක් සඤ්චේතනාවෙක් සිතන ලද බවෙක් වේ ද - මේ එසමයෙහි චේතනාව වේ.

6. කතමං තස්මිං සමයෙ චිත්තං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු-ඉදං තස්මිං සමයෙ චිත්තං හොති.

7 කතමො තස්මිං සමයෙ විතක්කො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා[1]. ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මා සඞ්කප්පො-අයං තස්මිං සමයෙ විතක්කො හොති.

8. කතමො තස්මිං සමයෙ විචාරො හොති?

යො තස්මිං සමයෙ චාරො විචාරො අනුවිචාරො උපවිචාරො චිත්තස්ස අනුසන්ධානතා අනුපෙක්ඛණතා-අයං තස්මිං සමයෙ විචාරො හොති.

9. කතමා තස්මිං සමයෙ පීති හොති?

යා තස්මිං සමයෙ පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස - අයං තස්මිං සමයෙ පීති හොති.

10. කතමං තස්මිං සමයෙ සුඛං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛවෙදනා-ඉදං තස්මිං සමයෙ සුඛං හොති.

11. කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි-අයං තස්මිං සමයෙ චිත්තස්සෙ'කග්ගතා හොති.

12. කතමං තස්මිං සමයෙ සද්ධින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං-ඉදං තස්මිං සමයෙ සද්ධින්ද්‍රියං හොති.

---

1. අප්පණා-අඝ

6. කවරෙක් එසමයෙහි චිත්ත වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් (පණ්ඩර වූ) භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥනයෙක් විඥනස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥනධාතුයෙක් වේ ද – මේ එසමයෙහි චිත්තය වේ.

7. කවරෙක් එසමයෙහි විතර්ක වෙයි යත්:

එසමයෙහි යම් තර්කයෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණයෙක් බලවත් අර්පණයෙක් (අරමුණෙහි) සිත පිහිටුවීමෙක් සම්‍යක්සංකල්පයෙක් වේ ද – මේ එසමයෙහි විතර්කය වේ.

8. කවරෙක් එසමයෙහි විචාර වෙයි යත්:

එසමයෙහි යම් (අරමුණෙහි හැසිරෙන) චාරයෙක් විචාරයෙක් අනුවිචාරයෙක් උපවිචාරයෙක් (අරමුණෙහි) සිත ගළපන බවෙක් අනුප්‍රෙක්‍ෂණතායෙක් වේ ද – මේ එසමයෙහි විචාරය වේ.

9. කවරක් එසමයෙහි ප්‍රීති වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රීතියෙක් ප්‍රාමොද්‍ය (තරුණප්‍රීති)යෙක් ආමොදනා-කාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් ප්‍රීතිධනයෙක් ඔදවැඩි බවෙක් චිත්තයා ගේ සතුටු බවෙක් වේ ද – මේ එසමයෙහි ප්‍රීතිය වේ.

10. කවරෙක් එසමයෙහි සුඛ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික මිහිරෙක් චෛතසික සුඛයෙක් චිත්ත සංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදනායෙක් වේ ද – මේ එසමයෙහි සුඛවේදනාව වේ

11. කවරක් එසමයෙහි චිත්තෙකාග්‍රතා වෙයි යත්:

එසමයෙහි චිත්තයා ගේ යම් (නිසල බැවින් අරමුණෙහි) සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්‍ෂෙපයෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක් සමාධියෙක් වේ ද – මේ එසමයෙහි චිත්තෙකාග්‍රතා වේ.

12. කවරෙක් එසමයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් ශ්‍රද්ධාවෙක් හැදහීම් අයුරෙක් (ගුණයෙහි) බැසැ ගැනීමෙක් අභිප්‍රසාදයෙක් සැදැහැයෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයෙක් ශ්‍රද්ධාබලයෙක් වේ ද – මේ එසමයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය වේ.

13. කතමං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො[1] පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො - ඉදං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති.

14. කතමං තස්මිං සමයෙ සතින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති - ඉදං තස්මිං සමයෙ සතින්ද්‍රියං හොති.

15. කතමං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි - ඉදං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති.

16. කතමං තස්මිං සමයෙ පඤ්ඤින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි - ඉදං තස්මිං සමයෙ පඤ්ඤින්ද්‍රියං හොති.

17. කතමං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු - ඉදං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති.

1. නික්ඛමො - අභා.

13. කවරෙක් එසමයෙහි වීර්‍ය්‍යෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ වීර්‍ය්‍යාරම්භයෙක් නිෂ්ක්‍රම (කුසීත බැවින් නික්මෙන) වීර්‍ය්‍යයෙක් පරාක්‍රම (වීර්‍ය්‍ය)යෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් දෘඪපරාක්‍රම (ථාම)යෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිර පරාක්‍රමතායෙක් නො තැබූ ඡන්දය ඇති බවෙක් නො තැබූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් වීර්‍ය්‍ය දැඩි වැ ගැනීමෙක් වේ ද, වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද - මේ එසමයෙහි වීර්‍ය්‍යෙන්ද්‍රිය වේ.

14. කවරෙක් එසමයෙහි ස්මෘතීන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් ස්මෘතියෙක් (සිහි කිරීමෙක්) පුනපුනා සිහි කිරීමෙක් අභිමුඛ කොට සිහි කිරීමෙක්, ස්මෘති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් අරමුණෙහි පිවිසෙන බවෙක් සිහිය නො නස්නා බවෙක් ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියෙක් වේ ද - මේ එසමයෙහි ස්මෘතීන්ද්‍රිය වේ.

15. කවරෙක් එසමයෙහි සමාධීන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැස-ගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක් සමාධියෙක් වේ ද - මේ එසමයෙහි සමාධීන්ද්‍රිය වේ.

16. කවරෙක් එසමයෙහි ප්‍රඥෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥයෙක් දන්නා අයුරෙක් (අනිත්‍යාදිය) විමසීමෙක් ප්‍රවිචයයෙක් ධර්මවිචයයෙක් (අනිත්‍යාදිය) සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිත බවෙක් කුශල බවෙක් නිපුණ බවෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරිප්‍රඥයෙක් (කෙලෙසුන් නසන හෙයින්) මේධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග් ඥානයෙක් (සිත විදර්ශනාවීථියට නගන) ප්‍රතොදයෙක් ප්‍රඥයෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥබලයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥප්‍රාසාදයෙක් ප්‍රඥ-ආලෝකයෙක් ප්‍රඥවභාසයෙක් ප්‍රඥප්‍රද්‍යොතයෙක් ප්‍රඥරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ එසමයෙහි ප්‍රඥෙන්ද්‍රිය වේ.

17. කවරෙක් එසමයෙහි මනින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් චිත්තයෙක් භවාඞ්ගචිත්තයෙක් මනයෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද, මේ එසමයෙහි මනින්ද්‍රිය වේ.

18. කතමං තස්මිං සමයෙ සොමනස්සින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා-ඉදං තස්මිං සමයෙ සොමනස්සින්ද්‍රියං හොති.

19. කතමං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති?

යො තෙසං අරූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං-ඉදං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති.

20. කතමා තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි - අයං තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති.

21. කතමො තස්මිං සමයෙ සම්මාසඞ්කප්පො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මාසඞ්කප්පො - අයං තස්මිං සමයෙ සම්මාසඞ්කප්පො හොති.

22. කතමො තස්මිං සමයෙ සම්මාවායාමො හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හි ථාමො ඨිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තච්ඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො - අයං තස්මිං සමයෙ සම්මාවායාමො හොති.

23. කතමා තස්මිං සමයෙ සම්මාසති හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති - අයං තස්මිං සමයෙ සම්මාසති හොති.

18. කවරේක් එසමයෙහි සොමනස්සින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික මිහිරෙක් චෛතසික සුඛයෙක් චෙතොසම්ඵස්සජ - සාත - සුඛ - වෙදනායෙක් වේ ද - මේ එසමයෙහි සොමනස්සින්ද්‍රිය වේ.

19. කවරේක් එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වෙයි යත්:

ඒ අරූපිධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යපනයෙක් යැපීමෙක් ඉරියැවී පැවැත්මෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද - මේ එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වේ.

20 කවරේක් එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් විචයයෙක් ප්‍රවිචයයෙක් ධර්මවිචයයෙක් සංලක්‍ෂණයෙක් උපලක්‍ෂණයෙක් ප්‍රත්‍යුපලක්‍ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්‍ෂාවෙක් භූරි (-පතල) ප්‍රඥයෙක් මේධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥයෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥබලයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥප්‍රාසාදයෙක් ප්‍රඥලෝකයෙක් ප්‍රඥවභාසයෙක් ප්‍රඥප්‍රද්‍යොතයෙක් ප්‍රඥරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද - මේ එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වේ

21. කවරේක් එසමයෙහි සම්‍යක්සංකල්ප වෙයි යත්:

එසමයෙහි යම් තර්කයෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණයෙක් බලවත් අර්පණයෙක් චිත්තයාගේ අභිනිරොපණයෙක් සම්‍යක්සංකල්පයෙක් වේ ද - මේ එසමයෙහි සම්‍යක්සංකල්ප වේ.

22. කවරේක් එසමයෙහි සම්‍යක්ව්‍යායාම වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ වීර්‍යාරම්භයෙක් (කුසීත බැවින්) නික්මීමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් දැඩි පරාක්‍රමයෙක් ධෛර්‍යයෙක් ස්ථිරපරාක්‍රමයෙක් නො තැබූ ඡන්දය ඇති බවෙක් නො තැබූ ධුර ඇති බවෙක් වීර්‍යය දැඩි වැ ගැනීමෙක් වීර්‍යයෙක් වීර්‍යෙන්ද්‍රියයෙක් වීර්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද - මේ එසමයෙහි සම්‍යග්ව්‍යායාම වේ.

23. කවරක් එසමයෙහි සම්‍යක්සමාධි වෙයි යත්:

එසමයෙහි යම් සමාධියෙක් අනුසමාධියෙක් ප්‍රතිසමාධියෙක් සති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් අරමුණෙහි පිවිසෙන බවෙක් සිහිය නො නස්නා බවෙක් සමාධියෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද - මේ එසමයෙහි සම්‍යක්සමාධි වේ.

24. කතමො තස්මිං සමයෙ සම්මාසමාධි හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි - අයං තස්මිං සමයෙ සම්මාසමාධි හොති.

25. කතමං තස්මිං සමයෙ සද්ධාබලං හොති?

යා තස්මිං සමයෙ සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං - ඉදං තස්මිං සමයෙ සද්ධාබලං හොති.

26. කතමං තස්මිං සමයෙ විරියබලං[1] හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො - ඉදං තස්මිං සමයෙ විරියබලං හොති.

27. කතමං තස්මිං සමයෙ සතිබලං හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අපම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති - ඉදං තස්මිං සමයෙ සතිබලං හොති.

28. කතමං තස්මිං සමයෙ සමාධිබලං හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි - ඉදං තස්මිං සමයෙ සමාධිබලං හොති

29. කතමං තස්මිං සමයෙ පඤ්ඤාබලං හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි - ඉදං තස්මිං සමයෙ පඤ්ඤාබලං හොති.

30. කතමං තස්මිං සමයෙ හිරිබලං[2] හොති?

යං තස්මිං සමයෙ හිරීයති හිරියිතබ්බෙන, හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා - ඉදං තස්මිං සමයෙ හිරිබලං හොති.

---

1. වීරියබලං, මජසං. හිරීබලං, මජසං

24. කවරෙක් එසමයෙහි සම්‍යක්සමාධි වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැ ගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක් සමාධියෙක් වේ ද - මේ එසමයෙහිසම්‍යක්සමාධි වේ.

25. කවරෙක් එසමයෙහි ශ්‍රද්ධාබල වෙයි යත්:

එසමයෙහි යම් ශ්‍රද්ධායෙක් හදහන අයුරෙක් (ගුණයෙහි) බැසැ ගැනීමෙක් අභිප්‍රසාදයෙක්, ශ්‍රද්ධාවෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයෙක් ශ්‍රද්ධාබලයෙක් වේ ද - මේ එසමයෙහි ශ්‍රද්ධාබල වේ.

26. කවරෙක් එසමයෙහි වීර්‍ය්‍යබල වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ වීර්‍ය්‍යාරම්භයෙක් නික්මීමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් දැඩිඋත්සාහයෙක් දැඩිපරාක්‍රමයෙක් ධෘතියෙක් ස්ථිරපරාක්‍රමයෙක් අනික්ෂිප්තඡන්දතායෙක් අනික්ෂිප්තධුරතායෙක් ධුරසම්ප්‍රග්‍රාහයෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්-ව්‍යායාමයෙක් වේ ද - මේ එසමයෙහි වීර්‍ය්‍යබල වේ.

27. කවරෙක් එසමයෙහි ස්මෘතිබල වෙයි යත්:

එසමයෙහි යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් ප්‍රතිස්මෘතියෙක් සති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් අරමුණෙහි පිවිසෙන බවෙක් සිහිය නො නස්නා බවෙක් ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘති බලයෙක් සම්‍යක්ස්මෘතියෙක් වේ ද - මේ එසමයෙහි ස්මෘතිබල වේ.

28. කවරෙක් එසමයෙහි සමාධිබල වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයාගේ සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැ-ගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂේපයෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක් සමාධියෙක් වේ ද - මේ එසමයෙහි සමාධිබල වේ.

29. කවරෙක් එසමයෙහි ප්‍රඥාබල වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥායෙක් පජානනයෙක් විචයයෙක් ප්‍රවිචයයෙක් ධම්විචයයෙක් සංලක්ෂණයෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩි-ත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරි (පතල) ප්‍රඥයෙක් මෙධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් පතොදයෙක් ප්‍රඥයෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාලෝකයෙක් ප්‍රඥාව-භාසයෙක් ප්‍රඥාප්‍රද්‍යෝතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධම්විචයයෙක් සම්‍යක්දෘෂ්ටියෙක් වේ ද - මේ එසමයෙහි ප්‍රඥාබල වේ.

30 කවරෙක් එසමයෙහි හිරිබල වෙයි යත්:

එසමයෙහි යමෙකින් ලජ්ජාවියයුතු කායදුශ්චරිතාදිය ජුගුප්සා කෙරේ ද, ලාමක අකුශලධම්යන්ට පැමිණීම ජුගුප්සා කෙරේ ද - මේ එසමයෙහි හිරිබල වේ.

31. කතමං තස්මිං සමයෙ ඔත්තප්පබලං හොති?

යං තස්මිං සමයෙ ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන, ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා – ඉදං තස්මිං සමයෙ **ඔත්තප්පබලං හොති.**

32 කතමො තස්මිං සමයෙ අලොභො හොති?

යො තස්මිං සමයෙ අලොභො අලුබ්භනා අලුබ්භිතත්තං අසාරාගො අසාරජ්ජනා අසාරජ්ජිතත්තං අනභිජ්ඣා අලොභො කුසලමූලං – අයං තස්මිං සමයෙ **අලොභො හොති.**

33. කතමො තස්මිං සමයෙ අදොසො හොති?

යො තස්මිං සමයෙ අදොසො අදුස්සනා අදුස්සිතත්තං[1] අව්‍යාපාදො අව්‍යාපජ්ජො අදොසො කුසලමූලං – අයං තස්මිං සමයෙ **අදොසො හොති**

34. කතමො තස්මිං සමයෙ අමොහො හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී[2] මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි අමොහො කුසලමූලං – අයං තස්මිං සමයෙ **අමොහො හොති.**

35. කතමා තස්මිං සමයෙ අනභිජ්ඣා හොති?

යො තස්මිං සමයෙ අලොභො අලුබ්භනා අලුබ්භිතත්තං අසාරාගො අසාරජ්ජනා අසාරජ්ජිතත්තං අනභිජ්ඣා අලොභො කුසලමූලං – අයං තස්මිං සමයෙ **අනභිජ්ඣා** හොති.

36. කතමො තස්මිං සමයෙ අව්‍යාපාදො හොති?

යො තස්මිං සමයෙ අදොසො අදුස්සනා අදුස්සිතත්තං[1] අව්‍යාපාදො අව්‍යාපජ්ජො අදොසො කුසලමූලං – අයං තස්මිං සමයෙ **අව්‍යාපාදො** හොති.

---

1. අදුස්සනා, අදුස්සිතත්තං, සයා. 2. භූරි, සීමු 1, 2, 3, අභා

31. කවරේක් එසමයෙහි ඔත්තප්පබල වෙයි යත්:

එසමයෙහි යමෙකින් බියට කරුණු වූ කායදුශ්චරිතාදිය හේතු කොට ගෙන බිය ගනී ද, ලාමක වූ අකුශලධර්මයන්ට පැමිණීමෙන් තැතිගනී ද - මේ එසමයෙහි ඔත්තප්පබල වේ.

32. කවරේක් එසමයෙහි අලොභ වෙයි යත්:

එසමයෙහි යම් අලොභයෙක් අලොභාකාරයෙක් අලුබ්ධ බවෙක් නො ඇලීමෙක් නො ඇලෙන අයුරෙක් නො ඇලුණු බවෙක් අනභිධ්‍යායෙක් අලොභ සඞ්ඛ්‍යාත වූ කුශලමූලයෙක් වේ ද - මේ එසමයෙහි අලොභ වේ.

33. කවරේක් එසමයෙහි අද්වේෂ වෙයි යත්:

එසමයෙහි යම් අද්වෙෂයෙක් අද්වෙෂාකාරයෙක් අද්විෂ්ට බවෙක් අව්‍යාපාදයෙක් නිදුක් බවෙක් අද්වෙෂ සඞ්ඛ්‍යාත කුශලමූලයෙක් වේ ද - මේ එසමයෙහි අද්වෙෂ වේ.

34. කවරේක් එසමයෙහි අමොහ වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥයෙක් වෙසෙසින් දැනීමෙක් විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් සිවුසස් දහම් විමසීමෙක් (අනිත්‍යාදි වශයෙන්) සැලකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිත බවෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනායෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරි (-පතල) ප්‍රඥයෙක් මෙධා සඞ්ඛ්‍යාත ප්‍රඥයෙක් (යථාවලක්ෂණ ප්‍රතිවෙධයට පමුණුවන) පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් (ප්‍රඥ සඞ්ඛ්‍යාත) ප්‍රතොදයෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥා-ආලොකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් අමොහ සඞ්ඛ්‍යාත කුශලමූලයෙක් වේ ද - මේ එසමයෙහි අමොහ වේ.

35. කවරක් එසමයෙහි අනභිධ්‍යා වෙයි යත්:

එසමයෙහි යම් අලොභයෙක් අලොභාකාරයෙක් අලුබ්ධ බවෙක් නො ඇලීමෙක් නො ඇලෙන අයුරෙක් නො ඇලුණු බවෙක් අනභිධ්‍යායෙක් අලොභ සඞ්ඛ්‍යාත කුශලමූලයෙක් වේ ද - මේ එසමයෙහි අනභිධ්‍යා වේ.

36. කවරේක් එසමයෙහි අව්‍යාපාද වෙයි යත්:

එසමයෙහි යම් අද්වෙෂයෙක් අද්වෙෂාකාරයෙක් අද්විෂ්ට බවෙක් අව්‍යාපාදයෙක් නිදුක් බවෙක් අද්වෙෂ සඞ්ඛ්‍යාත කුශලමූලයෙක් වේ ද - මේ එසමයෙහි අව්‍යාපාද වේ.

37 කතමා තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි – අයං තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති.

38. කතමා තස්මිං සමයෙ හිරි හොති?

යං තස්මිං සමයෙ හිරීයති හිරීයිතබ්බෙන, හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා – අයං තස්මිං සමයෙ හිරී හොති.

39. කතමං තස්මිං සමයෙ ඔත්තප්පං හොති?

යං තස්මිං සමයෙ ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන, ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා – ඉදං තස්මිං සමයෙ ඔත්තප්පං හොති.

40. කතමා තස්මිං සමයෙ කායපස්සද්ධි හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස පස්සද්ධි පටිප්පස්සද්ධි පස්සම්භනා පටිප්පස්සම්භනා පටිප්පස්සම්භිතත්තං අයං තස්මිං සමයෙ කායපස්සද්ධි හොති.

41. කතමා තස්මිං සමයෙ චිත්තපස්සද්ධි හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස පස්සද්ධි පටිප්පස්සද්ධි පස්සම්භනා පටිප්පස්සම්භනා පටිප්පස්සම්භිතත්තං – අයං තස්මිං සමයෙ චිත්තපස්සද්ධි හොති.

42. කතමා තස්මිං සමයෙ කායලහුතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස ලහුතා ලහුපරිණාමතා අදන්ධනතා අවිත්ථනතා – අයං තස්මිං සමයෙ කායලහුතා හොති.

43. කතමා තස්මිං සමයෙ චිත්තලහුතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස ලහුතා ලහුපරිණාමතා අදන්ධනතා අවිත්ථනතා – අයං තස්මිං සමයෙ චිත්තලහුතා හොති.

44. කතමා තස්මිං සමයෙ කායමුදුතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස මුදුතා මද්දවතා අකක්ඛළතා අකථිනතා – අයං තස්මිං සමයෙ කායමුදුතා හොති.

37. කවරක් එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥාවෙක් වෙසෙසින් දැනීමෙක් විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් ධර්මවිචයයෙක් සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තාවෙක් උපපරීක්ෂායෙක් භූරී සඞ්ඛ්‍යාත ප්‍රඥයෙක් මේධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥා-ආලොකයෙක් ප්‍රඥා-අවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද - මේ එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වේ.

38. කවරක් එසමයෙහි හිරි වෙයි යත්:

එසමයෙහි යමෙකින් ලජ්ජා විය යුතු කායදුශ්චරිතාදිය ජුගුප්සා කෙරේ ද - මේ එසමයෙහි හිරි වේ

39. කවරෙක් එසමයෙහි අපත්‍රපා වෙයි යත්:

එසමයෙහි යමෙකින් බියට කරුණු වූ කායදුශ්චරිතාදිය හේතු කොටගෙන ත්‍රස්ත වේ ද, ලාමක වූ අකුශල ධර්මයන්ට පැමිණීමෙන් ත්‍රස්ත වේ ද - මේ එසමයෙහි අපත්‍රපා වේ.

40. කවරක් එසමයෙහි කායප්‍රශ්‍රබ්ධි වෙයි යත්:

එසමයෙහි වෙදනාස්කන්ධයා ගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් සන්හිඳීමෙක් වෙසෙසින් සන්හිඳීමෙක් සන්හිඳුණු අයුරෙක් වෙසෙසින් සන්හිඳුණු අයුරෙක් සන්හිඳුණු බවෙක් වේ ද - මේ එසමයෙහි කායප්‍රශ්‍රබ්ධි වේ.

41. කවරක් එසමයෙහි චිත්තප්‍රශ්‍රබ්ධි වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයා ගේ යම් සංහිඳීමෙක් වෙසෙසින් සන්හිඳීමෙක් සන්හිඳුණු අයුරෙක් වෙසෙසින් සන්හිඳුණු අයුරෙක් සන්හිඳුණු බවෙක් වේ ද - මේ එසමයෙහි චිත්තප්‍රශ්‍රබ්ධි වේ.

42. කවරක් එසමයෙහි කායලඝුතා වෙයි යත්:

එසමයෙහි වෙදනාස්කන්ධයාගේ සංඥස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් ලඝුත්වයෙක් යුහුව පෙරළෙන බවෙක් නො බර බවෙක් නො තද බවෙක් වේ ද - මේ එසමයෙහි කායලඝුතා වේ.

43. කවරක් එසමයෙහි චිත්තලඝුතා වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයා ගේ යම් ලඝුත්වයෙක් යුහුව පෙරළෙන බවෙක් නො බර බවෙක් නො තද බවෙක් වේ ද - මේ එසමයෙහි චිත්තලඝුතා වේ.

44. කවරක් එසමයෙහි කායමෘදුතා වෙයි යත්:

එසමයෙහි වෙදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් මෘදු බවෙක් මාර්දවයෙක් නො කැකුළු බවෙක් නො තද බවෙක් වේ ද - මේ එසමයෙහි කායමෘදුතා වේ.

45. කතමා තස්මිං සමයෙ චිත්තමුදුතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස මුදුතා මද්දවතා අකක්ඛළතා අකථිනතා - අයං තස්මිං සමයෙ චිත්තමුදුතා හොති.

46. කතමා තස්මිං සමයෙ කායකම්මඤ්ඤතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවො - අයං තස්මිං සමයෙ කායකම්මඤ්ඤතා හොති.

47. කතමා තස්මිං සමයෙ චිත්තකම්මඤ්ඤතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවො - අයං තස්මිං සමයෙ චිත්තකම්මඤ්ඤතා හොති.

48. කතමා තස්මිං සමයෙ කායපාගුඤ්ඤතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස පගුණතා පගුණත්තං පගුණභාවො - අයං තස්මිං සමයෙ කායපාගුඤ්ඤතා හොති.

49. කතමා තස්මිං සමයෙ චිත්තපාගුඤ්ඤතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස පගුණතා පගුණත්තං පගුණභාවො - අයං තස්මිං සමයෙ චිත්තපාගුඤ්ඤතා හොති.

50. කතමා තස්මිං සමයෙ කායුජ්ජුකතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස උජුතා උජ්ජුකතා[1] අජිම්හතා අවඞ්කතා අකුටිලතා - අයං තස්මිං සමයෙ කායුජ්ජුකතා හොති.

51. කතමා තස්මිං සමයෙ චිත්තුජ්ජුකතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස උජුතා උජ්ජුකතා[1] අජිම්හතා අවඞ්කතා අකුටිලතා - අයං තස්මිං සමයෙ චිත්තුජ්ජුකතා හොති.

52. කතමා තස්මිං සමයෙ සති හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අපම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති - අයං තස්මිං සමයෙ සති හොති.

1. උජුකතා - මජසං., සයා.

45. කවරක් එසමයෙහි චිත්තමෘදුතා වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් මෘදුත්වයෙක් මාද්දවයෙක් නො කැකුළු බවෙක් නො තද බවෙක් වේ ද - මේ එසමයෙහි **චිත්තමෘදුතා** වේ.

46. කවරක් එසමයෙහි කායකර්මණ්‍යතා වෙයි යත්:

එසමයෙහි වේදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් කර්මණ්‍යතායෙක් කර්මණ්‍යත්වයෙක් කර්මණ්‍ය බවෙක් වේ ද - මේ එසමයෙහි **කායකර්මණ්‍යතා** වේ.

47 කවරක් එසමයෙහි චිත්තකර්මණ්‍යතා වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් කර්මණ්‍යතායෙක් කර්මණ්‍යත්වයෙක් කර්මණ්‍ය බවෙක් වේ ද - මේ එසමයෙහි **චිත්තකර්මණ්‍යතා** වේ.

48. කවරක් එසමයෙහි කායප්‍රාගුණ්‍ය වෙයි යත්:

එසමයෙහි වේදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් ප්‍රගුණතායෙක් ප්‍රගුණත්වයෙක් ප්‍රගුණ බවෙක් වේ ද - මේ එසමයෙහි **කායප්‍රාගුණ්‍ය** වේ.

49. කවරක් එසමයෙහි චිත්තප්‍රාගුණ්‍ය වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් ප්‍රාගුණ්‍යයෙක් ප්‍රගුණත්වයෙක් ප්‍රගුණ බවෙක් වේ ද - මේ එසමයෙහි **චිත්තප්‍රාගුණ්‍ය** වේ.

50. කවරක් එසමයෙහි කායර්ජුකතා වෙයි යත්:

එසමයෙහි වේදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් ඍජුතායෙක් ඍජුත්වයෙක් අජිම්හතායෙක් අවඞ්කතායෙක් අකුටිලතායෙක් වේ ද - මේ එසමයෙහි **කායර්ජුකතා** වේ.

51. කවරක් එසමයෙහි චිත්තර්ජුකතා වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් ඍජුතායෙක් ඍජුත්වයෙක් අජිහ්මතායෙක් අවඞ්කතායෙක් අකුටිලතායෙක් වේ ද - මේ එසමයෙහි **චිත්තර්ජුකතා** වේ.

52. කවරක් එසමයෙහි ස්මෘති වෙයි යත්:

එසමයෙහි යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් ප්‍රතිස්මෘතියෙක් සති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් (අරමුණෙහි) පිවිසෙන බවෙක් සිහිය නො නස්නා බවෙක් ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘති බලයෙක් සම්‍යක්ස්මෘතියෙක් වේ ද - මේ එසමයෙහි **ස්මෘති** වේ.

53. කතමං තස්මිං සමයෙ සම්පජඤ්ඤං හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි – ඉදං තස්මිං සමයෙ **සම්පජඤ්ඤං** හොති.

54. කතමො තස්මිං සමයෙ සමථො හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි – අයං තස්මිං සමයෙ **සමථො** හොති.

55. කතමා තස්මිං සමයෙ විපස්සනා හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි – අයං තස්මිං සමයෙ **විපස්සනා** හොති.

56. කතමො තස්මිං සමයෙ පග්ගාහො හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො – අයං තස්මිං සමයෙ **පග්ගාහො** හොති.

57. කතමො තස්මිං සමයෙ අවික්ඛෙපො හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි – අයං තස්මිං සමයෙ **අවික්ඛෙපො** හොති.

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා – ඉමෙ ධම්මා කුසලා.

**පදභාජනීයං නිට්ඨිතං.**

**පඨමභාණවාරං.**

53 කවරෙක් එසමයෙහි සම්‍යග්ඥාන වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥාවෙක් වෙසෙසින් දැනීමෙක් විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් ධර්මවිචයයෙක් සැලැකීමෙක් උපලක්‍ෂණයෙක් ප්‍රත්‍යුපලක්‍ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්‍ෂායෙක් භූරි සඞ්ඛ්‍යාත (පැතුරුණු) ප්‍රඥායෙක් මේධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් (ප්‍රඥාසඞ්ඛ්‍යාත) ප්‍රතෝදයෙක් ප්‍රඥායෙක් ප්‍රඥේන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාආලෝකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යෝතයෙක් ප්‍රඥාරත්නයෙක් අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද – මේ එසමයෙහි සම්‍යග්ඥාන වේ.

54. කවරෙක් එසමයෙහි ශමථ වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්‍ෂේපයෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද – මේ එසමයෙහි ශමථ වේ.

55. කවරක් එසමයෙහි විදර්ශනා වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥාවෙක් වෙසෙසින් දැනීමෙක් විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් ධර්මවිචයයෙක් සැලැකීමෙක් උපලක්‍ෂණයෙක් ප්‍රත්‍යුපලක්‍ෂණයෙක් පණ්ඩිත බවෙක් කුශල බවෙක් නිපුණ බවෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්‍ෂායෙක් භූරි ප්‍රඥායෙක් මේධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් (තෘෂ්ණා මඟ යන සිත විපිණට තඟන) ප්‍රතෝදය වැනි ප්‍රඥායෙක් ප්‍රඥායෙක් ප්‍රඥේන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාආලෝකයෙක් ප්‍රඥා-අවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යෝතයෙක් ප්‍රඥාරත්නයෙක් අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද – මේ එසමයෙහි විදර්ශනා වෙයි.

56. කවරෙක් එසමයෙහි ප්‍රග්‍රාහ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් (කෞසීද්‍යයෙන්) නික්මීමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් දෘඪෝත්සාහයෙක් දෘඪපරාක්‍රමයෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිරපරාක්‍රමයෙක් නො නැඹු ඡන්ද ඇති බවෙක් නො නැඹු ධුර ඇති බවෙක් වීර්‍ය්‍යධුරය දැඩි ව ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යේන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද – මේ එසමයෙහි ප්‍රග්‍රාහ වේ.

57. කවරෙක් එසමයෙහි අවික්‍ෂේප වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්‍ෂේපයෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද – මේ එසමයෙහි අවික්‍ෂේප වේ.

එසමයෙහි අන්‍ය වූ ද, ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපී ධර්ම කෙනෙක් හෝ වෙත් නම් – මේ ධර්මයෝ කුශලයෝ යි.

පද බෙදුම නිමි.

පළමුවන බණවර යි.

58. තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, අට්ඨින්ද්‍රියානි හොන්ති, පඤ්චඞ්ගිකං ඣානං හොති, පඤ්චඞ්ගිකො මග්ගො හොති, සත්තබලානි හොන්ති, තයො හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, එකා වෙදනා හොති, එකා සඤ්ඤා හොති, එකා චෙතනා හොති, එකං චිත්තං හොති, එකො වෙදනාක්ඛන්ධො හොති, එකො සඤ්ඤාක්ඛන්ධො හොති, එකො සඞ්ඛාරක්ඛන්ධො හොති, එකො විඤ්ඤාණක්ඛන්ධො හොති, එකං මනායතනං හොති, එකං මනින්ද්‍රියං හොති, එකා මනොවිඤ්ඤාණධාතු හොති, එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා.

59. කතමෙ තස්මිං සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති?

වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො.

60. කතමො තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධො හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා - අයං තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධො හොති.

61. කතමො තස්මිං සමයෙ සඤ්ඤාක්ඛන්ධො හොති?

යා තස්මිං සමයෙ සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං - අයං තස්මිං සමයෙ සඤ්ඤාක්ඛන්ධො හොති.

62. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං අලොභො අදොසො අමොහො අනභිජ්ඣා අව්‍යාපාදො සම්මාදිට්ඨි හිරි ඔත්තප්පං කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා සති සම්පජඤ්ඤං සමථො විපස්සනා පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං, ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං, ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති.

58 තවද, එසමයෙහි (ප්‍රථම මහාකුශල චිත්තය උපදනා කෙණෙහි) ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති. පඤ්චාඞ්ගිකධ්‍යානය වෙයි, පඤ්චාඞ්ගික මාර්ග වෙයි, බලයෝ සත්දෙනෙක් වෙති, හෙතූහු තිදෙනෙක් වෙති, එක ස්පර්ශයෙක් වෙයි, එක වෙදනායෙක් වෙයි, එක සංඥයෙක් වෙයි, එක චෙතනායෙක් වෙයි, එක චිත්තයෙක් වෙයි, එක වෙදනාස්කන්ධයෙක් වෙයි, එක සංඥස්කන්ධයෙක් වෙයි, එක සංස්කාරස්කන්ධයෙක් වෙයි, එක විඥනස්කන්ධයෙක් වෙයි, එක් මනායතනයෙක් වෙයි, එක් මනින්ද්‍රියයෙක් වෙයි, එක් මනොවිඥනධාතුයෙක් වෙයි, එක් ධර්මායතනයෙක් වෙයි, එක් ධර්මධාතුයෙක් වෙයි. එසමයෙහි අන්‍ය වූ ද, ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපී ධර්ම කෙනෙක් හෝ වෙත් නම් - මේ ධර්මයෝ කුශලයෝ යි.

59. එසමයෙහි කවර ස්කන්ධයෝ සතරදෙනෙක් වෙති යත්:

වෙදනාස්කන්ධය, සංඥස්කන්ධය, සංස්කාරස්කන්ධය විඥනස්කන්ධය යන මොහු යි.

60. කවරෙක් එසමයෙහි වෙදනාස්කන්ධ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මිහිරි බවෙක් චෛතසික වූ සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් මිහිරි වූ සැප වූ වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාත වූ මධුර වූ සුඛවෙදනාවක් වේ ද - මේ එසමයෙහි **වෙදනාස්කන්ධ** වේ.

61. කවරෙක් එසමයෙහි සංඥස්කන්ධ වෙයි යත්:

එසමයෙහි යම් සංඥයෙක් හැඳිනගන්නා අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද - මේ එසමයෙහි **සංඥස්කන්ධ** වේ.

62. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චෙතනා ය විතර්ක ය විචාර ය ප්‍රීති ය චිත්තෛකාග්‍රතා ය ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය සම්‍යග්දෘෂ්ටිය ය සම්‍යක්සඞ්කල්ප ය සම්‍යග්ව්‍යායාම ය සම්‍යක්ස්මෘති ය සම්‍යක් සමාධි ය ශ්‍රද්ධාබල ය වීර්යබල ය ස්මෘතිබල ය සමාධිබල ය ප්‍රඥබල ය හිරිබල ය ඔත්තප්පබල ය අලොභ ය අද්වෙෂ ය අමොහ ය අනභිධ්‍යා ය අව්‍යාපාද ය සම්‍යග්දෘෂ්ටි ය හිරි ය ඔත්තප්ප යැ, කායප්‍රශ්‍රබ්ධි යැ චිත්තප්‍රශ්‍රබ්ධියැ කායලඝුතා යැ චිත්තලඝුතා ය කායමෘදුත්ව ය චිත්තමෘදුත්ව ය කායකර්මණ්‍යතා ය චිත්තකර්මණ්‍යතා ය කායප්‍රාගුණ්‍ය ය චිත්තප්‍රාගුණ්‍ය ය කාය-ඍජුත්ව ය චිත්ත-ඍජුත්ව ය ස්මෘති ය සම්‍යග්ඥන ය ශමථ ය විදර්ශනා ය ප්‍රග්‍රාහ ය අවික්ෂෙප යැ, තවද එසමයෙහි වෙදනාස්කන්ධය තබා, විඥනස්කන්ධය තබා, අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපී ධර්ම කෙනෙක් ඇද්ද - මේ එසමයෙහි **සංස්කාරස්කන්ධ** වේ.

63. කතමො තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධො හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු – අයං තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධො හොති.

ඉමෙ තස්මිං සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති.

64. කතමානි තස්මිං සමයෙ ද්වායතනානි හොන්ති?

මනායතනං, ධම්මායතනං.

65 කතමං තස්මිං සමයෙ මනායතනං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු – ඉදං තස්මිං සමයෙ මනායතනං හොති

66. කතමං තස්මිං සමයෙ ධම්මායතනං හොති?

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො – ඉදං තස්මිං සමයෙ ධම්මායතනං හොති.

ඉමානි තස්මිං සමයෙ ද්වායතනානි හොන්ති.

67. කතමා තස්මිං සමයෙ ද්වෙ ධාතුයො හොන්ති?

මනොවිඤ්ඤාණධාතු, ධම්මධාතු.

68. කතමා තස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු – අයං තස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු හොති.

69. කතමා තස්මිං සමයෙ ධම්මධාතු හොති?

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො – අයං තස්මිං සමයෙ ධම්මධාතු හොති.

ඉමා තස්මිං සමයෙ ද්වෙ ධාතුයො හොන්ති.

70. කතමෙ තස්මිං සමයෙ තයො ආහාරා හොන්ති?

ඵස්සාහාරො, මනොසඤ්චෙතනාහාරො, විඤ්ඤාණාහාරො.

71. කතමො තස්මිං සමයෙ ඵස්සාහාරො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං – අයං තස්මිං සමයෙ ඵස්සාහාරො හොති.

72. කතමො තස්මිං සමයෙ මනොසඤ්චෙතනාහාරො හොති?

යා තස්මිං සමයෙ චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං – අයං තස්මිං සමයෙ මනොසඤ්චෙතනාහාරො හොති.

63. එසමයෙහි කවරෙක් විඥානස්කන්ධ වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි **විඥානස්කන්ධ** වේ. මොහු එසමයෙහි සතර ස්කන්ධයෝ වෙත්.

64. එසමයෙහි කවර ආයතනයෝ දෙදෙනෙක් වෙති යත්:

මනායතන යැ ධර්මායතන යි,

65. කවරෙක් එසමයෙහි මනායතන වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි **මනායතනය** වේ.

66 කවරෙක් එසමයෙහි ධර්මායතනය වෙයි යත්:

වෙදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ ය යි - මේ එසමයෙහි **ධර්මායතන** වේ. මොහු එසමයෙහි ආයතනයෝ වෙත්.

67. එසමයෙහි කවර ධාතුහු දෙදෙනෙක් වෙති යත්:

මනොවිඥානධාතු යැ, ධර්මධාතු යි.

68. කවරෙක් එසමයෙහි මනොවිඥානධාතු වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි **මනොවිඥානධාතු** වේ.

69. කවරෙක් එසමයෙහි ධර්මධාතු වෙයි යත්:

වෙදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යි. මේ එසමයෙහි **ධර්මධාතු** වේ. මොහු එසමයෙහි ධාතුහු දෙදෙනා වෙත්.

70. එසමයෙහි කවර තුන් ආහාරයෝ වෙති යත්:

ස්පර්ශාහාර යැ, මනස්සංචෙතනාහාර යැ, විඥානාහාර යි.

71. කවරෙක් එසමයෙහි ස්පර්ශාහාර වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශකාරයෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් ස්පර්ශ කළ බවෙක් වේ ද - මෙ එසමයෙහි **ස්පර්ශාහාර** වේ.

72. කවරෙක් එසමයෙහි මනස්සංචෙතනාහාර වෙයි යත්:

එසමයෙහි යම් චෙතනායෙක් සංචෙතනායෙක් සිතන ලද බවෙක් වේ ද - මේ එසමයෙහි **මනස්සංචෙතනාහාර** වේ.

73. කතමො තස්මිං තමයෙ විඤ්ඤාණාහාරො හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු - අයං තස්මිං සමයෙ විඤ්ඤාණාහාරො හොති.

ඉමෙ තස්මිං සමයෙ තයො ආහාරා හොන්ති.

74. කතමානි තස්මිං සමයෙ අට්ඨින්ද්‍රියානි හොන්ති?

සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං, මනින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං.

75. කතමං තස්මිං සමයෙ සද්ධින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං - ඉදං තස්මිං සමයෙ සද්ධින්ද්‍රියං හොති

76. කතමං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො - ඉදං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති

77. කතමං තස්මිං සමයෙ සතින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති -පෙ- සම්මාසති - ඉදං තස්මිං සමයෙ සතින්ද්‍රියං හොති.

78. කතමං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති-පෙ-සම්මා සමාධි - ඉදං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති.

79. කතමං තස්මිං සමයෙ පඤ්ඤින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි - ඉදං තස්මිං සමයෙ පඤ්ඤින්ද්‍රියං හොති.

73 කවරේක් එසමයෙහි විඥානාහාර වේයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද – මේ එසමයෙහි විඥානාහාර වේ

මොහු එසමයෙහි තුන් ආහාරයෝ වෙත්.

74. එසමයෙහි කවර ඉන්ද්‍රියයෝ අටදෙන වෙති යත්:

ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය, සමෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය ය, මනින්ද්‍රිය ය, සෞමනස්සින්ද්‍රිය ය, ජීවිතෙන්ද්‍රිය යි.

75. කවරේක් එසමයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය වේයි යත්:

එසමයෙහි යම් ශ්‍රද්ධායෙක් හැදහීම් අයුරෙක් (ගුණයෙහි) බැසැගැනීමෙක් ඉතා පැහැදීමෙක් ශ්‍රද්ධායෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයෙක් ශ්‍රද්ධාබලයෙක් වේ ද – මේ එසමයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය වේ.

76. කවරේක් එසමයෙහි වීර්‍ය්‍යෙන්ද්‍රිය වේයි යත්:

එසමයෙහි යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් (කුසීත බැවින්) නික්මීමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් දෘඪ උත්සාහයෙක් දෘඪපරාක්‍රමයෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිරපරාක්‍රමයෙක් නො නැවූ ඡන්දය ඇති බවෙක් නො නැවූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් වීර්‍ය්‍ය දෘඪ වැ ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද – මේ එසමයෙහි වීර්‍ය්‍යෙන්ද්‍රිය වේ.

77. කවරේක් එසමයෙහි සමෘතීන්ද්‍රිය වේයි යත්:

එසමයෙහි යම් සමෘතියෙක් අනුසමෘතියෙක්...සම්‍යක්සමෘතියෙක් වේ ද මේ එසමයෙහි සමෘතීන්ද්‍රිය වේ

78. කවරේක් එසමයෙහි සමාධීන්ද්‍රිය වේයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් ස්ථිතියෙක් ... සම්‍යක් සමාධියෙක් වේ ද– මේ එසමයෙහි සමාධීන්ද්‍රිය වේ.

79. කවරේක් එසමයෙහි ප්‍රඥෙන්ද්‍රිය වේයි යත්:

එසමයෙහි යම් ප්‍රඥයෙක් දැනීම් අයුරෙක් විචයයෙක් ප්‍රවිචයයෙක් ධර්මවිචයයෙක් සංලක්ෂණයෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂණයෙක් පතල ප්‍රඥයෙක් ධාරණප්‍රඥයෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් පතොදයෙක් ප්‍රඥයෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥප්‍රාසාදයෙක් ප්‍රඥාලෝකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥප්‍රද්‍යෝතයෙක් ප්‍රඥාරත්නයෙක් අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද – මේ එසමයෙහි ප්‍රඥෙන්ද්‍රිය වේ.

80. කතමං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු - ඉදං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති

81. කතමං තස්මිං සමයෙ සොමනස්සින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා - ඉදං තස්මිං සමයෙ සොමනස්සින්ද්‍රියං හොති.

82. කතමං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති?

යො තෙසං අරූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං - ඉදං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති.

ඉමානි තස්මිං සමයෙ අට්ඨින්ද්‍රියානි හොන්ති.

83. කතමං තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති?

විතක්කො, විචාරො, පීති, සුඛං, චිත්තස්සෙ'කග්ගතා.

84. කතමො තස්මිං සමයෙ විතක්කො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මාසඞ්කප්පො අයං තස්මිං සමයෙ විතක්කො හොති

85. කතමො තස්මිං සමයෙ විචාරො හොති?

යො තස්මිං සමයෙ චාරො විචාරො අනුවිචාරො උපවිචාරො චිත්තස්ස අනුසන්ධානතා[1] අනුපෙක්ඛනතා - අයං තස්මිං සමයෙ විචාරො හොති.

86. කතමා තස්මිං සමයෙ පීති හොති?

යා තස්මිං සමයෙ පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස - අයං තස්මිං සමයෙ පීති හොති.

87. කතමං තස්මිං සමයෙ සුඛං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා - ඉදං තස්මිං සමයෙ සුඛං හොති

---

1. අනුසන්ධනතා, සීමු.1, 3, මජසං.

80 කවරෙක් එසමයෙහි මනින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් හදය - සිතෙක් භවාඞ්ග සිතෙක් මනයෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි මනින්ද්‍රිය වේ

81. කවරෙක් එසමයෙහි සොමනස්සින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මිහිරි බවෙක් චෛතසික සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් මධුර වූ සුඛ වූ වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදනායෙක් වේ ද - මේ එසමයෙහි සොමනස්සින්ද්‍රිය වේ.

82. කවරෙක් එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වෙයි යත්:

ඒ අරූපිධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යැපීමෙක් පැවැත්මෙක් ඉරියව් පැවැත්මෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද - මේ එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වේ.

මොහු එසමයෙහි අෂ්ටෙන්ද්‍රියයෝ වෙත්.

83. කවරෙක් එසමයෙහි පඤ්චාඞ්ගික ධ්‍යාන වෙයි යත්:

විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෙකාග්‍රතා යි.

84. කවරෙක් එසමයෙහි විතර්ක වෙයි යත්:

එසමයෙහි යම් තර්කයෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණායෙක් බලවත් අර්පණායෙක් (අරමුණෙහි) සිත පිහිටුවීමෙක් සංකල්පනයෙක් වේ ද - මේ එසමයෙහි විතර්ක වේ.

85. කවරෙක් එසමයෙහි විචාර වෙයි යත්:

එසමයෙහි යම් (අරමුණෙහි හැසිරෙන) චාරයෙක් විචාරයෙක් අනුවිචාරයෙක් උපවිචාරයෙක් (අරමුණෙහි) සිත ගළපන බවෙක් අනුප්‍රෙක්ෂණතායෙක් වේ ද - මේ එසමයෙහි විචාර වේ.

86. කවරක් එසමයෙහි ප්‍රීති වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රීතියෙක් ප්‍රාමොද්‍යයෙක් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් ප්‍රීතිධනයෙක් ඔදවැඩි බවෙක් චිත්තයාගේ සතුටු බවෙක් වේ ද - මේ එසමයෙහි ප්‍රීති වේ

87. කවරෙක් එසමයෙහි සුඛ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මිහිරි බවෙක් චෛතසික සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදනායෙක් වේ ද - මේ එසමයෙහි සුඛ වේ.

88. කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි - අයං තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති.

ඉදං තස්මිං සමයෙ පඤ්චඞ්ගිකං ඣානං හොති.

89. කතමො තස්මිං සමයෙ පඤ්චඞ්ගිකො මග්ගො හොති?

සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි.

90. කතමා තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි - අයං තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති.

91. කතමො තස්මිං සමයෙ සම්මාසඞ්කප්පො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මාසඞ්කප්පො - අයං තස්මිං සමයෙ සම්මාසඞ්කප්පො හොති.

92. කතමො තස්මිං සමයෙ සම්මාවායාමො හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ඨිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො - අයං තස්මිං සමයෙ සම්මාවායාමො හොති.

93. කතමා තස්මිං සමයෙ සම්මාසති හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අපම්මුස්සනතා[1] සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති - අයං තස්මිං සමයෙ සම්මාසති හොති

94. කතමො තස්මිං සමයෙ සම්මාසමාධි හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධි බලං සම්මාසමාධි - අයං තස්මිං සමයෙ සම්මාසමාධි හොති

අයං තස්මිං සමයෙ පඤ්චඞ්ගිකො මග්ගො හොති.

1. අසම්මුස්සනතා - මජසං.

88. කවරක් එසමයෙහි චිත්තෛකාග්‍රතා වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් (නිසල බැවින් අරමුණෙහි) සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැ ගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුළ සිත ඇති බවෙක් සමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද - මේ එසමයෙහි **චිත්තෛකාග්‍රතා** වේ.

**මේ එසමයෙහි පඤ්චාඞ්ගික ධ්‍යාන වේ.**

89. **කවරෙක් එසමයෙහි පඤ්චාඞ්ගික මාර්ග වෙයි යත්:**

**සම්‍යග්දෘෂ්ටි ය, සම්‍යක් සංකල්ප ය, සම්‍යග්ව්‍යායාම ය, සම්‍යක්සමෘති ය, සම්‍යක්සමාධි යි.**

90. කවරක් එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥාවක් පජානනයෙක් විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් ධර්මවිචයයෙක් සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරි සඞ්ඛ්‍යාත ප්‍රඥායෙක් මෙධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාආලොකයෙක් ප්‍රඥා-අවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද - මේ එසමයෙහි **සම්‍යග්දෘෂ්ටි** වේ.

91. කවරෙක් එසමයෙහි සම්‍යක්සංකල්ප වෙයි යත්:

එසමයෙහි යම් තර්කයෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණයෙක් බලවත් අර්පණයෙක් චිත්තයාගේ අභිනිරොපණයෙක් සම්‍යක් සංකල්පයෙක් වේ ද - මේ එසමයෙහි **සම්‍යක්සංකල්ප** වේ.

92. කවරෙක් එසමයෙහි සම්‍යග්ව්‍යායාම වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ වීර්‍ය්‍යාරම්භයෙක් කෞසීද්‍යයෙන් නික්මැ යැමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් දෘඪොත්සාහයෙක් දෘඪපරාක්‍රමයෙක් ධෘතියෙක් ස්ථිරපරාක්‍රමයෙක් පරාක්‍රමතායෙක් නො පියූ ඡන්දය ඇති බවෙක් වීර්‍ය්‍ය දැඩි වැ ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍ය බලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද - මේ එසමයෙහි **සම්‍යග්ව්‍යායාම** වේ.

93. කවරක් එසමයෙහි සම්‍යක්සමෘති වෙයි යත්:

එසමයෙහි යම් සමෘතියෙක් අනුසමෘතියෙක් ප්‍රතිසමෘතියෙක් සති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් අරමුණෙහි පිවිසෙන බවෙක් නො මුළා වන බවෙක් සමෘතියෙක් සමෘතීන්ද්‍රියයෙක් සමෘතිබලයෙක් සම්‍යක්සමෘතියෙක් වේ ද - මේ එසමයෙහි **සම්‍යක්සමෘති** වේ.

94. කවරෙක් එසමයෙහි සම්‍යක්සමාධි වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයාගේ සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුළ සිත ඇති බවෙක් සමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද - මේ එසමයෙහි **සම්‍යක්සමාධි** වේ

**මේ එසමයෙහි පඤ්චාඞ්ගිකමාර්ග වේ.**

95. කතමානි තස්මිං සමයෙ සත්තබලානි හොන්ති?

සද්ධාබලං, විරියබලං,[1] සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං, හිරිබලං ඔත්තප්පබලං.

96. කතමං තස්මිං සමයෙ සද්ධාබලං හොති?

යා තස්මිං සමයෙ සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං – ඉදං තස්මිං සමයෙ සද්ධාබලං හොති.

97. කතමං තස්මිං සමයෙ විරියබලං[1] හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො – ඉදං තස්මිං සමයෙ විරියබලං[1] හොති.

98. කතමං තස්මිං සමයෙ සතිබලං හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති – ඉදං තස්මිං සමයෙ සතිබලං හොති.

99. කතමං තස්මිං සමයෙ සමාධිබලං හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති -පෙ- සම්මාසමාධි – ඉදං තස්මිං සමයෙ සමාධිබලං හොති.

100. කතමං තස්මිං සමයෙ පඤ්ඤාබලං හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි – ඉදං තස්මිං සමයෙ පඤ්ඤාබලං හොති.

101. කතමං තස්මිං සමයෙ හිරිබලං හොති?

යං තස්මිං සමයෙ හිරීයති හිරියිතබ්බෙන හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා – ඉදං තස්මිං සමයෙ හිරිබලං හොති.

102. කතමං තස්මිං සමයෙ ඔත්තප්පබලං හොති?

යං තස්මිං සමයෙ ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන, ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා – ඉදං තස්මිං සමයෙ ඔත්තප්පබලං හොති.

ඉමානි තස්මිං සමයෙ සත්තබලානි හොන්ති.

103. කතමෙ තස්මිං සමයෙ තයො හෙතූ හොන්ති?

අලොභො අදොසො අමොහො.

1 වීරියබලං, මජසං

95. එසමයෙහි කවර සප්තබලයෝ වෙති යත්:

ශ්‍රද්ධාබල ය, වීය්‍ර්‍යබල ය, සමෘතිබල ය, සමාධිබල ය, ප්‍රඥාබල ය හිරිබල ය, ඔත්තප්පබල යි.

96. කවරෙක් එසමයෙහි ශ්‍රද්ධාබල වෙයි යත්:

එසමයෙහි යම් ශ්‍රද්ධායෙක් හැදහීම් අයුරෙක් බැසැගැනීමෙක් අභිප්‍රසාදයෙක් ශ්‍රද්ධායෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයෙක් ශ්‍රද්ධාබලයෙක් වේ ද - මේ එසමයෙහි ශ්‍රද්ධාබල වේ.

97. කවරෙක් එසමයෙහි වීය්‍ර්‍යබල වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වීය්‍ර්‍යාරම්භයෙක් ... සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද - මේ එසමයෙහි වීය්‍ර්‍යබල වේ.

98. කවරෙක් එසමයෙහි සමෘතිබල වෙයි යත්:

එසමයෙහි යම් සමෘතියෙක් අනුසමෘතියෙක් ප්‍රතිසමෘතියෙක් සමෘති සඞ්ඛ්‍යාත සිහි කරන බවෙක් ධරන බවෙක් බැසැගත්තා බවෙක් නො මුළා වන බවෙක් සමෘතියෙක් සමෘතීන්ද්‍රියයෙක් සමෘතිබලයෙක් සම්‍යක් සමෘතියෙක් වේ ද - මේ එසමයෙහි සමෘතිබල වේ.

99. කවරෙක් එසමයෙහි සමාධිබල වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් ස්ථිතියෙක් ... සම්‍යක්සමාධියෙක් වේ ද- මේ එසමයෙහි සමාධිබල වේ.

100. කවරෙක් එසමයෙහි ප්‍රඥාබල වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥායෙක් ප්‍රජානනාකාරයෙක් ... අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද - මේ එසමයෙහි ප්‍රඥාබල වේ.

101. කවරෙක් එසමයෙහි හිරිබල වෙයි යත්:

එසමයෙහි යමකින් ලජ්ජා විය යුතු කායදුශ්චරිතාදිය ජුගුප්සා කෙරේ ද, ලාමක අකුශලධර්මයන්ට පැමිණීම ජුගුප්සා කෙරේ ද - මේ එසමයෙහි හිරිබලය වේ.

102. කවරෙක් එසමයෙහි ඔත්තප්පබල වෙයි යත්:

එසමයෙහි යමකින් තැවීමට කරුණු වූ කායදුශ්චරිතාදිය හේතු කොටගෙන ත්‍රාසන වේ ද - මේ එසමයෙහි ඔත්තප්පබල වේ.

මොහු එසමයෙහි සප්තබලයෝ වෙත්.

103. එසමයෙහි කවර හේතු තිදෙන වෙති යත්:

අලොභ ය අද්වෙෂ ය අමොහය යි.

104. කතමො තස්මිං සමයෙ අලොභො හොති?

යො තස්මිං සමයෙ අලොභො අලුබ්භනා අලුබ්භිතත්තං අසාරාගො අසාරජ්ජනා අසාරජ්ජිතත්තං අනභිජ්ඣා අලොභො කුසලමූලං – අයං තස්මිං සමයෙ අලොභො හොති.

105. කතමො තස්මිං සමයෙ අදොසො හොති?

යො තස්මිං සමයෙ අදොසො අදුස්සනා අදුස්සිතත්තං අබ්‍යාපාදො අබ්‍යාපජ්ජො[1] අදොසො කුසලමූලං – අයං තස්මිං සමයෙ අදොසො හොති.

106. කතමො තස්මිං සමයෙ අමොහො හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි – අයං තස්මිං සමයෙ අමොහො හොති.

ඉමෙ තස්මිං සමයෙ තයො හෙතූ හොන්ති.

107. කතමො තස්මිං සමයෙ එකො ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං – අයං තස්මිං සමයෙ එකො ඵස්සො හොති.

108. කතමා තස්මිං සමයෙ එකා වෙදනා හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා – අයං තස්මිං සමයෙ එකා වෙදනා හොති.

109. කතමා තස්මිං සමයෙ එකා සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං – අයං තස්මිං සමයෙ එකා සඤ්ඤා හොති.

110. කතමා තස්මිං සමයෙ එකා චෙතනා හොති?

යා තස්මිං සමයෙ චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං – අයං තස්මිං සමයෙ එකා චෙතනා හොති.

111. කතමං තස්මිං සමයෙ එකං චිත්තං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු – ඉදං තස්මිං සමයෙ එකං චිත්තං හොති.

112. කතමො තස්මිං සමයෙ එකො වෙදනාක්ඛන්ධො හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා – අයං තස්මිං සමයෙ එකො වෙදනාක්ඛන්ධො හොති.

---

1. අබ්‍යාපජ්ජං - සීමු 1, 3, මජසං.

104. කවරෙක් එසමයෙහි අලොභ වෙයි යත්:

එසමයෙහි යම් අලොභයෙක් අලොභාකාරයෙක් අලුබ්ධ බවෙක් නො ඇලීමෙක් නො ඇලෙන අයුරෙක් නො ඇලුණු බවෙක් අනභිධ්‍යායෙක් අලොභකුශලමූලයෙක් වේ ද - මේ එසමයෙහි අලොභ වේ.

105. කවරෙක් එසමයෙහි අදොස වෙයි යත්:

එසමයෙහි යම් අද්වෙෂයෙක් අද්වෙෂනාකාරයෙක් අද්විෂ්ට බවෙක් අව්‍යාපාදයෙක් නිදුක් බවෙක් අදොසකුසලමූලයෙක් වේ ද - මේ එසමයෙහි අදොස වේ

106. කවරෙක් එසමයෙහි අමොහ වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රඥාවෙක් පජානනාකාරයෙක් ... අමොහයෙක් ධම්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද - මේ එසමයෙහි අමොහ වේ.

මොහු එසමයෙහි තුන්හෙතුහු වෙත්.

107. කවරෙක් එසමයෙහි එක් මැ ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශකාරයෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් මොනවට ස්පර්ශ කල බවෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ ස්පර්ශ වේ.

108. කවරක් එසමයෙහි එක් මැ වේදනා වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මධුර බවෙක් චෛතසික වූ සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛ වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදනායෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ වෙදනා වේ

109. කවරක් එසමයෙහි එක් මැ සංඥාවෙයි යත්:

එසමයෙහි යම් සංඥායෙක් සංජානනාකාරයෙක් හැඳිනගත් බවෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ සංඥා වේ.

110 කවරක් එසමයෙහි එක් මැ චෙතනා වෙයි යත්:

එසමයෙහි යම් චේතනාවෙක් සංචේතනායෙක් සිතන ලද බවෙක් වේ ද - මේ එසයෙහි එක් මැ චෙතනා වේ.

111. කවරෙක් එසමයෙහි එක් මැ සිත වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ සිත වේ.

112. කවරෙක් එසමයෙහි එක් මැ වෙදනාස්කන්ධ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මිහිරි බවෙක් චෛතසික සුඛයෙක් චිත්ත-සංස්පර්ශජ වූ සාතසුඛවෙදයිතයෙක් චිත්තසංස්පර්ශජ වූ සාතසුඛවෙදනායෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ වේදනාස්කන්ධ වේ.

113. කතමො තස්මිං සමයෙ එකො සඤ්ඤාක්ඛන්ධො හොති?

යා තස්මිං සමයෙ සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං - අයං තස්මිං සමයෙ එකො සඤ්ඤාක්ඛන්ධො හොති.

114. කතමො තස්මිං සමයෙ එකො සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො පීති චිත්තස්සෙ'කග්ගතා සද්ධින්ද්‍රියං වීරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සද්ධාබලං වීරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං අලොභො අදොසො අමොහො අනභිජ්ඣා අව්‍යාපාදො සම්මාදිට්ඨි හිරි ඔත්තප්පං කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා සතිසම්පජඤ්ඤං සමථො විපස්සනා පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඨපෙත්වා වෙදනාක්ඛන්ධං, ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං, ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ එකො සඞ්ඛාරක්ඛන්ධො හොති.

115. කතමො තස්මිං සමයෙ එකො විඤ්ඤාණක්ඛන්ධො හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු - අයං තස්මිං සමයෙ එකො විඤ්ඤාණක්ඛන්ධො හොති.

116. මං තස්මිං සමයෙ එකං මනායතනං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු - ඉදං තස්මිං සමයෙ එකං මනායතනං හොති.

117. කතමං තස්මිං සමයෙ එකං මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු - ඉදං තස්මිං සමයෙ එකං මනින්ද්‍රියං හොති.

118. කතමා තස්මිං සමයෙ එකා මනොවිඤ්ඤාණධාතු හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු - අයං තස්මිං සමයෙ එකා මනොවිඤ්ඤාණධාතු හොති.

119. කතමං තස්මිං සමයෙ එකං ධම්මායතනං හොති?

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො - ඉදං තස්මිං සමයෙ එකං ධම්මායතනං හොති.

113. කවරෙක් එසමයෙහි එක් මැ සංඥාස්කන්ධ වෙයි යත්:

එසමයෙහි යම් සංඥාවක් සංජානනාකාරයෙක් සඤ්ජානිත බවෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ සංඥාස්කන්ධ වේ.

114. කවරෙක් එසමයෙහි එක් මැ සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශය, චේතනා ය, විතර්ක ය, විචාර ය, ප්‍රීති ය. චිත්තෛකාග්‍රතා ය, ශ්‍රද්ධේන්ද්‍රිය ය, වීර්යේන්ද්‍රිය ය, ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥේන්ද්‍රිය ය, ජීවිතේන්ද්‍රිය ය, සම්‍යක්දෘෂ්ටිය ය, සම්‍යක්සංකල්ප ය, සම්‍යග්ව්‍යායාම ය, සම්‍යක්ස්මෘතිය ය, සම්‍යක්සමාධි ය, ශ්‍රද්ධාබල ය, වීර්යබල ය, ස්මෘතිබල ය, සමාධිබල ය, ප්‍රඥාබල ය, හිරිබල ය, ඔත්තප්පබල ය, අලෝභ ය, අද්වේෂ ය, අමෝහ ය, අනභිධ්‍යා ය, අව්‍යාපාද ය, සම්‍යග්දෘෂ්ටි ය, හිරි ය, ඔත්තප්ප ය, කායප්‍රශ්‍රබ්ධිය, චිත්තප්‍රශ්‍රබ්ධි ය, කායලඝුත්ව ය, චිත්තලඝුත්ව ය, කායමෘදුත්ව ය, චිත්තමෘදුත්ව ය, කායකර්මණ්‍යතා ය, චිත්තකර්මණ්‍යතා ය, කායප්‍රාගුණ්‍ය ය, චිත්තප්‍රාගුණ්‍ය ය, කාය ඍජුත්ව ය චිත්ත ඍජුත්ව ය, ස්මෘති ය, සම්‍යග්ඥාන ය, ශමථය, විදර්ශනා ය, ප්‍රග්‍රාහ ය, අවික්ෂේප ය, තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද යම් ප්‍රතීත්‍ය සමුත්පන්න වූ අරූපීධර්ම කෙනෙක් ඇද්ද - මේ එසමයෙහි එක් මැ සංස්කාරස්කන්ධ වේ

115. කවරෙක් එසමයෙහි එක් මැ විඥානස්කන්ධ වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ විඥානස්කන්ධ වේ.

116 කවරෙක් එසමයෙහි එක් මැ මනායතන වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ මනායතන වේ.

117. කවරෙක් එසමයෙහි එක් මැ මනින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් සිතෙක් මනසෙක් මානසයෙක් ... තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ මනින්ද්‍රිය වේ.

118. කවරක් එසමයෙහි එක් මැ මනෝවිඥානධාතු වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් ... තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද - මේ එසමයෙහි එක් මැ මනෝවිඥානධාතු වේ.

119. කවරෙක් එසමයෙහි එක් මැ ධර්මායතන වෙයි යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, මේ එසමයෙහි එක් මැ ධර්මායතන වේ.

120. කතමා තස්මිං සමයෙ එකා ධම්මධාතු හොති?

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො - අයං තස්මිං සමයෙ එකා ධම්මධාතු හොති.

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා.

### කොට්ඨාසවාරං.

121. තස්මිං ඛො පන සමයෙ ධම්මා හොන්ති, ඛන්ධා හොන්ති ආයතනානි හොන්ති, ධාතුයො හොන්ති, ආහාරා හොන්ති, ඉන්ද්‍රියානි හොන්ති, ඣානං හොති, මග්ගො හොති, බලානි හොන්ති, හෙතූ හොන්ති, ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, වෙදනාක්ඛන්ධො හොති, සඤ්ඤාක්ඛන්ධො හොති, සඞ්ඛාරක්ඛන්ධො හොති, විඤ්ඤාණක්ඛන්ධො හොති, මනායතනං හොති, මනින්ද්‍රියං හොති, මනොවිඤ්ඤාණධාතු හොති, ධම්මායතනං හොති, ධම්මධාතු හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා- ඉමෙ ධම්මා කුසලා.

122. කතමෙ තස්මිං සමයෙ ධම්මා හොන්ති?

වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො- ඉමෙ තස්මිං සමයෙ ධම්මා හොන්ති.

123. කතමෙ තස්මිං සමයෙ ඛන්ධා හොන්ති?

වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො- ඉමෙ තස්මිං සමයෙ ඛන්ධා හොන්ති.

124. කතමානි තස්මිං සමයෙ ආයතනානි හොන්ති?

මනායතනං, ධම්මායතනං - ඉමානි තස්මිං සමයෙ ආයතනානි හොන්ති.

125. කතමා තස්මිං සමයෙ ධාතුයො හොන්ති?

මනොවිඤ්ඤාණධාතු, ධම්මධාතු - ඉමා තස්මිං සමයෙ ධාතුයො හොන්ති

126. කතමෙ තස්මිං සමයෙ ආහාරා හොන්ති?

ඵස්සාහාරො, මනොසඤ්චෙතනාහාරො, විඤ්ඤාණාහාරො - ඉමෙ තස්මිං සමයෙ ආහාරා හොන්ති.

127. කතමානි තස්මිං සමයෙ ඉන්ද්‍රියානි හොන්ති?

සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං, මනින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං - ඉමානි තස්මිං සමයෙ ඉන්ද්‍රියානි හොන්ති.

120. කවරක් එසමයෙහි එක් මැ ධම්ධාතු වෙයි යත්:

වේදනාසකන්ධ ය, සංඥසකන්ධ ය, සංසකාරසකන්ධ සි - මේ එසමයෙහි එක් මැ ධම්ධාතු වේ.

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න අරූපිධම්යෝ වෙත් ද - මෙ ධම්යෝ කුශලයෝ සි.

කොට්ඨාසවාරය සි.

121. තවද එසමයෙහි ධම්යෝ වෙති, සකන්ධයෝ වෙති, ආයතනයෝ වෙති, ධාතුහු වෙයි, ආහාරයෝ වෙති, ඉන්ද්‍රියයෝ වෙති, ධ්‍යානය වෙයි, මාගීය වෙයි, බලයෝ වෙති, හෙතුහු වෙති, ස්පශීය වෙයි, වෙදනාව වෙයි, සංඥව වෙයි, වෙතනාව වෙයි, චිත්තය වෙයි, වෙදනාසකන්ධය වෙයි, සංඥසකන්ධය වෙයි, සංසකාරසකන්ධය වෙයි, විඥනසකන්ධය වෙයි, මනා-යතනය වෙයි, මනින්ද්‍රිය වෙයි, මනොවිඥනධාතුව වෙයි, ධම්ායතනය වෙයි, ධම්ධාතුව වෙයි. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධම් කෙනෙක් වෙත් නම් - මෙ ධම්යෝ කුශලයෝ සි.

122. කවරහු එසමයෙහි ධම්යෝ වෙති යත්:

වේදනාසකන්ධ ය, සංඥසකන්ධ ය, සංසකාරසකන්ධ ය, විඥනසකන්ධ සි එසමයෙහි මේ ධම්යෝ වෙත්.

123. කවරහු එසමයෙහි සකන්ධයෝ වෙති යත්:

වෙදනාසකන්ධ ය, සංඥාසකන්ධ ය, සංසකාරසකන්ධ යැ විඥනසකන්ධ සි. එසමයෙහි මේ සකන්ධයෝ වෙත්.

124. කවරහු එසමයෙහි ආයතනයෝ වෙති යත්:

මනායතන ය, ධම්ායතන සි. එසමයෙහි මේ ආයතනයෝ වෙත්.

125. කවරහු එසමයෙහි ධාතුහු වෙති යත්:

මනෝවිඥනධාතු ය, ධම්ධාතු සි. එසමයෙහි මේ ධාතුහු වෙත්.

126. කවරහු එ සමයෙහි ආහාරයෝ වෙති යත්:

ස්පශීාහාර ය, මනසසංචෙතනාහාර ය, විඥනාහාර සි. එසමයෙහි මේ ආහාරයෝ වෙත්.

127. කවරහු එසමයෙහි ඉන්ද්‍රියයෝ වෙති යත්:

ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීය්‍යීන්ද්‍රිය ය, සමෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය ය, මනින්ද්‍රිය ය, සොමනසසින්ද්‍රිය ය, ජීවිතෙන්ද්‍රිය සි. එසමයෙහි මේ ඉන්ද්‍රියයෝ වෙත්.

128. කතමං තස්මිං සමයෙ ඣානං හොති?

විතක්කො විචාරො පීති සුඛං චිත්තස්සෙකග්ගතා – ඉදං තස්මිං සමයෙ ඣානං හොති.

129. කතමො තස්මිං සමයෙ මග්ගො හොති?

සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි – අයං තස්මිං සමයෙ මග්ගො හොති.

130. කතමානි තස්මිං සමයෙ බලානි හොන්ති?

සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං – ඉමානි තස්මිං සමයෙ බලානි හොන්ති.

131. කතමෙ තස්මිං සමයෙ හෙතූ හොන්ති?

අලොභො අදොසො අමොහො – ඉමෙ තස්මිං සමයෙ හෙතූ හොන්ති.

132. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො -පෙ- අයං තස්මිං සමයෙ ඵස්සො හොති

133. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං සාතං -පෙ- අයං තස්මිං සමයෙ වෙදනා හොති.

134 කතමා තස්මිං සමයෙ සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා -පෙ- අයං තස්මිං සමයෙ සඤ්ඤා හොති.

135. කතමා තස්මිං සමයෙ චෙතනා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා චෙතනා -පෙ- අයං තස්මිං සමයෙ චෙතනා හොති.

136. කතමං තස්මිං සමයෙ චිත්තං හොති?

යං තස්මිං සමයෙ චිත්තං -පෙ- ඉදං තස්මිං සමයෙ චිත්තං හොති.

137. කතමො තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධො හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං -පෙ- අයං තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධො හොති.

138. කතමො තස්මිං සමයෙ සඤ්ඤාක්ඛන්ධො හොති?

යා තස්මිං සමයෙ සඤ්ඤා -පෙ- අයං තස්මිං සමයෙ සඤ්ඤාක්ඛන්ධො හොති

139. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා -පෙ- පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා; ඨපෙත්වා වෙදනාක්ඛන්ධං, ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං, ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං – අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති.

140. කතමො තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධො හොති?

යං තස්මිං සමයෙ චිත්තං -පෙ- අයං තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධො හොති

128. කවරේක් එසමයෙහි ධ්‍යාන වෙයි යත්:

විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, සුඛ ය, චිත්තෙකාග්‍රතා යි. එසමයෙහි මේ ධ්‍යානය වේ.

129. කවරේක් එසමයෙහි මාර්ග වෙයි යත්:

සම්‍යග්දෘෂ්ටි ය, සම්‍යක්සංකල්ප ය, සම්‍යග්ව්‍යායාම ය, සම්‍යක් ස්මෘති ය, සම්‍යක් සමාධි යි. එසමයෙහි මේ මාර්ගය වේ.

130. කවරහු එසමයෙහි බලයෝ වෙති යත්:

ශ්‍රද්ධාබල ය, වීර්‍ය්‍යබල ය, ස්මෘතිබල ය, සමාධිබල ය, ප්‍රඥාබල ය, හිරිබල ය, ඔත්තප්පබල යි. එසමයෙහි මේ බලයෝ වෙත්

131. කවරහු එසමයෙහි හෙතූහු වෙති යත්:

අලොභ ය, අද්වෙෂ ය, අමොහ යි. එසමයෙහි මේ හෙතූහු වෙත්.

132. කවරේක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් . එසමයෙහි මේ ස්පර්ශය වේ.

133. කවරක් එසමයෙහි වෙදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූපමනොවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් චෛතසික සාතයෙක් ... එසමයෙහි මේ වෙදනාව වේ.

134 කවරක් එසමයෙහි සංඥා වෙයි යත්:

එසමයෙහි තදනුරූප මනොවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් සංඥායෙක් ... එසමයෙහි මේ සංඥාව වේ.

135. කවරක් එසමයෙහි චෙතනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප මනොවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් චෙතනායෙක් ... එසමයෙහි මේ චෙතනා වේ

136. කවරේක් එසමයෙහි චිත්ත වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් ... එසමයෙහි මේ චිත්තය වේ.

137 කවරේක් එසමයෙහි වෙදනාස්කන්ධ වෙයි යත්:
එසමයෙහි යම් චෛතසිකසාතයෙක් ... එසමයෙහි මේ වෙදනාස්කන්ධ වේ.

138. කවරේක් එසමයෙහි සංඥාස්කන්ධ වෙයි යත්:

එසමයෙහි යම් සංඥායෙක් ... එසමයෙහි මේ සංඥාස්කන්ධ වේ.

139. කවරේක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය, චෙතනා ය ... ප්‍රග්‍රාහ ය, අවික්ෂෙප ය, තවද එසමයෙහි වෙදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ අරූපීධර්ම කෙනෙක් ඇද්ද මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ.

140. කවරේක් එසමයෙහි විඥානස්කන්ධ වෙයි යත්:
එසමයෙහි යම් චිත්තයෙක් ... එසමයෙහි මේ විඥානස්කන්ධ වේ.

141. කතමං තස්මිං සමයෙ මනායතනං හොති?

යං තස්මිං සමයෙ චිත්තං -පෙ- ඉදං තස්මිං සමයෙ මනායතනං හොති.

142. කතමං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං -පෙ- ඉදං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති.

143. කතමා තස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු හොති?

යං තස්මිං සමයෙ චිත්තං -පෙ- අයං තස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු හොති.

144. කතමං තස්මිං සමයෙ ධම්මායතනං හොති?

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො - ඉදං තස්මිං සමයෙ ධම්මායතනං හොති

145. කතමා තස්මිං සමයෙ ධම්මධාතු හොති?

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො - අයං තස්මිං සමයෙ ධම්මධාතු හොති.

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා.

සුඤ්ඤතවාරො.

පඨමං චිත්තං.

146. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

දුතියං චිත්තං.

147. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති, සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාසඞ්කප්පො හොති, සම්මාවායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සද්ධාබලං හොති, විරියබලං හොති, සතිබලං හොති, සමාධිබලං හොති, හිරිබලං හොති, ඔත්තප්පබලං හොති, අලොභො හොති, අදොසො හොති, අනභිජ්ඣා හොති, අව්‍යාපාදො හොති, හිරි හොති, ඔත්තප්පං හොති, කායපස්සද්ධි හොති, චිත්තපස්සද්ධි හොති, කාය ලහුතා හොති, චිත්ත ලහුතා හොති, කායමුදුතා හොති, චිත්තමුදුතා හොති, කායකම්මඤ්ඤතා හොති, චිත්තකම්මඤ්ඤතා හොති, කායපාගුඤ්ඤතා හොති, චිත්තපාගුඤ්ඤතා හොති, කායුජ්ජුකතා හොති, චිත්තුජ්ජුකතා හොති, සති හොති, සමථො හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා.

141. කවරෙක් එසමයෙහි මනායතන වෙසි යත්:

එසමයෙහි යම් සිතෙක් ... එසමයෙහි මේ මනායතන වේ.

142. කවරෙක් එසමයෙහි මනින්ද්‍රිය වෙසි යත්:

එසමයෙහි යම් සිතෙක් ... එසමයෙහි මේ මනින්ද්‍රිය වේ.

143. කවරක් එසමයෙහි මනොවිඥානධාතු වෙසි යත්:

එසමයෙහි යම් සිතෙක් ... එසමයෙහි මේ මනොවිඥානධාතු වේ.

144. කවරෙක් එසමයෙහි ධර්මායතන වෙසි යත්: වෙදනාස්කන්ධ ය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධ යි - එසමයෙහි මේ ධර්මායතන වේ.

145. කවරක් එසමයෙහි ධර්මධාතු වෙසි යත්: වෙදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ යි. එසමයෙහි මේ ධර්මධාතු වේ.

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද - මේ ධර්මයෝ කුශලයෝ යි.

ශුන්‍යතවාරය යි.

ප්‍රථමචිත්තය යි.

146. කවර දහම්හු කුසල්හ යත්:

යම් කලෙක්හි රූපාලම්බන වේවයි, ... ධර්මාලම්බන වේවයි, යම් යම් අරමුණෙකැ හෝ එල්බැ සොම්නස්සහගියා වූ ඥානසම්ප්‍රයුක්ත වූ කාමාවචර කුශලචිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙසි ... අවික්ෂෙපය වේ... මේ ධර්මයෝ කුශලයෝ යි.

ද්විතීයචිත්තය යි.

147 කවර දහම්හු කුසල්හ යත්:

යම් සමයෙක්හි රූපාලම්බන වේවයි, ශබ්දාලම්බන වේවයි, ගන්ධාලම්බන වේවයි, රසාලම්බන වේවයි, ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි. ධර්මාලම්බන වේවයි, යම් යම් අරමුණෙකැ හෝ එල්බැ සොම්නස් සහගියා වූ ඥානවිප්‍රයුක්ත වූ කාමාවචර කුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙසි, වෙදනාව වෙසි, සංඥාව වෙසි, චෙතනාව වෙසි, චිත්තය වෙසි, විතර්කය වෙසි, විචාරය වෙසි, ප්‍රීතිය වෙසි, සුඛය වෙසි, චිත්තයාගේ එකාග්‍රතාව වෙසි, ශ්‍රද්ධෙන්ද්‍රිය වෙසි, වීර්යෙන්ද්‍රිය වෙසි, සමෘතීන්ද්‍රිය වෙසි, සමාධීන්ද්‍රිය වෙසි, මනින්ද්‍රිය වෙසි, සොමනස්සින්ද්‍රිය වෙසි, ජීවිතෙන්ද්‍රිය වෙසි, සම්‍යක්සංකල්පය වෙසි, සම්‍යග්ව්‍යායාමය වෙසි, සම්‍යක්සමෘතිය වෙසි. සම්‍යක්සමාධිය වෙසි, ශ්‍රද්ධාබලය වෙසි, වීර්‍ය්‍යබලය වෙසි, සමෘතිබලය වෙසි, සමාධිබලය වෙසි, හිරිබලය වෙසි, ඔත්තප්පබලය වෙසි, අලොභය වෙසි, අද්වෙෂය වෙසි, අනභිධ්‍යාව වෙසි, අව්‍යාපාදය වෙසි, හිරිය වෙසි, ඔත්තප්පය වෙසි, කායප්‍රශ්‍රබ්ධිය වෙසි, චිත්තප්‍රශ්‍රබ්ධිය වෙසි, කායලඝුත්වය වෙසි, චිත්තලඝුත්වය වෙසි, කායමෘදුත්වය වෙසි, චිත්තමෘදුත්වය වෙසි, කායකර්මණ්‍යත්වය වෙසි, චිත්තකර්මණ්‍යත්වය වෙසි, කායප්‍රාගුණ්‍යය වෙසි, චිත්තප්‍රාගුණ්‍යය වෙසි, කාය ඍජුත්වය වෙසි, චිත්ත ඍජුත්වය වෙසි. සමෘතිය වෙසි, ශමථය වෙසි, ප්‍රග්‍රාහය වෙසි, අවික්ෂෙපය වේ. එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් හෝ වෙත් ද - මේ ධර්මයෝ කුශලයෝ යි.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, සත්තින්ද්‍රියානි හොන්ති, පඤ්චඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, ඡ බලානි හොන්ති, ද්වෙ හෙතූ හොන්ති, එකො ඵස්සො හොති -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා.

148. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං හිරිබලං ඔත්තප්පබලං අලොභො අදොසො අනභිජ්ඣා අබ්‍යාපාදො හිරි ඔත්තප්පං කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා සති සමථො පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති. -පෙ- ඉමෙ ධම්මා කුසලා.

තතියං චිත්තං.

149. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං සසඞ්ඛාරෙන, රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ - තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

චතුත්ථං චිත්තං.

150. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ - තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති,

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතුහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ සත්දෙනෙක් වෙති, පඤ්චාඞ්ගික ධ්‍යානය වෙයි, චතුරඞ්ගිකමාර්ගය වෙයි, බලයෝ සදෙනෙක් වෙති, හේතුහු දෙදෙනෙක් වෙති, එක් ස්පර්ශයෙක් වෙයි, එක් ධර්මායතනයෙක් වෙයි, එක් ධර්මධාතුයෙක් වේ. එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් හෝ වෙත් නම් - මේ ධර්මයෝ කුශලයෝ යි.

148. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය, චේතනා ය, විතර්ක ය, විචාර ය, ප්‍රීති ය, චිත්තෛකාග්‍රතා ය, ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්යෙන්ද්‍රිය ය, ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ජීවිතෙන්ද්‍රිය ය, සම්‍යක්සංකල්ප ය, සම්‍යග්ව්‍යායාම ය, සම්‍යක්ස්මෘති ය, සම්‍යක්සමාධි ය, ශ්‍රද්ධාබල ය, වීර්යබල ය, ස්මෘතිබල ය, සමාධිබල ය, හිරිබල ය, ඔත්තප්පබල ය, අලොභ ය, අද්වෙෂ ය, අනභිධ්‍යා ය, අව්‍යාපාද ය, හිරි ය, ඔත්තප්ප ය, කායප්‍රශ්‍රබ්ධි ය, චිත්තප්‍රශ්‍රබ්ධි ය, කායලඝුතා ය, චිත්තලඝුතා ය, කායමෘදුතා ය, චිත්තමෘදුතා ය, කායකර්මණ්‍යතා ය, චිත්තකර්මණ්‍යතා ය, කායප්‍රාගුණ්‍ය ය, චිත්තප්‍රාගුණ්‍ය ය, කායඍජුතා ය, චිත්තඍජුතා ය, ස්මෘති ය, ශමථ ය, ප්‍රග්‍රාහ ය, අවික්ෂෙප ය, තවද එසමයෙහි වෙදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් වෙත් ද - මේ එසමයෙහි සංස්කාරස්කන්ධය වේ... මේ ධර්මයෝ කුශලයෝ යි.

තෘතීයචිත්තය යි.

149. කවර දහම්හු කුසල්හ යත්:

යම් සමයෙක්හි රූපාලම්බන වේවයි, ... ධර්මාලම්බන වේවයි, යම් යම් අරමුණෙකැ හෝ එල්බැ සොම්නස්සහගත වූ ඥානවිප්‍රයුක්ත වූ සංස්කාර සහිත වැ කාමාවචර කුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වෙයි... මේ ධර්මයෝ කුශලයෝ යි.

චතුර්ථචිත්තය යි.

150. කවර ධර්මයෝ කුශල්හ යත්:

යම් කලෙක්හි රූපාලම්බන වේවයි, ශබ්දාලම්බන වේවයි, ගන්ධාලම්බන වේවයි, රසාලම්බන වේවයි, ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි, ධර්මාලම්බන වේවයි, යම් යම් අරමුණෙකැ හෝ එල්බැ උපෙක්ෂාසහගත වූ ඥානසම්ප්‍රයුක්ත වූ කාමාවචර කුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වෙදනාව වෙයි, සංඥාව වෙයි, චෙතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, වීර්යෙන්ද්‍රිය වෙයි, ස්මෘතීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපේක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි, සම්‍යග්දෘෂ්ටිය වෙයි,

සම්මාසඞ්කප්පො හොති, සම්මාවායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සද්ධාබලං හොති, විරියබලං හොති, සතිබලං හොති, සමාධිබලං හොති, පඤ්ඤාබලං හොති, හිරිබලං හොති, ඔත්තප්පබලං හොති, අලොභො හොති, අදොසො හොති, අමොහො හොති, අනභිජ්ඣා හොති, අව්‍යාපාදො හොති, සම්මාදිට්ඨි හොති, හිරි හොති, ඔත්තප්පං හොති, කායපස්සද්ධි හොති, චිත්තපස්සද්ධි හොති, කායලහුතා හොති, චිත්තලහුතා හොති, කායමුදුතා හොති, චිත්තමුදුතා හොති, කායකම්මඤ්ඤතා හොති, චිත්තකම්මඤ්ඤතා හොති, කායපාගුඤ්ඤතා හොති, චිත්තපාගුඤ්ඤතා හොති, කායුජ්ජුකතා හොති, චිත්තුජ්ජුකතා හොති, සති හොති, සම්පජඤ්ඤං හොති, සමථො හොති, විපස්සනා හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා.

151. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං - අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

152. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජා මනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං නෙවසාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා - අයං තස්මිං සමයෙ වෙදනා හොති. -පෙ-

153. කතමා තස්මිං සමයෙ උපෙක්ඛා හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං නෙවසාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා - අයං තස්මිං සමයෙ උපෙක්ඛා හොති -පෙ-

154. කතමං තස්මිං සමයෙ උපෙක්ඛින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං නෙවසාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා - ඉදං තස්මිං සමයෙ උපෙක්ඛින්ද්‍රියං හොති. -පෙ-

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, අට්ඨින්ද්‍රියානි හොන්ති, චතුරඞ්ගිකං ඣානං හොති, පඤ්චඞ්ගිකො මග්ගො හොති, සත්ත බලානි හොන්ති, තයො හෙතු හොන්ති, එකො ඵස්සො හොති -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

සම්‍යක් සංකල්පය වෙයි, සම්‍යග්ව්‍යායාමය වෙයි, සම්‍යක්සමාධිය වෙයි, ශ්‍රද්ධාබලය වෙයි, වීය්‍ය්‍යබලය වෙයි, සමෘතිබලය වෙයි, සමාධිබලය වෙයි, ප්‍රඥාබලය වෙයි, හිරිබලය වෙයි, ඔත්තප්පබලය වෙයි, අලොභය වෙයි, අද්වෙෂය වෙයි, අමොහය වෙයි, අනභිධ්‍යාව වෙයි, අව්‍යාපාදය වෙයි, සම්‍යග්දෘෂ්ටිය වෙයි, හිරිය වෙයි, ඔත්තප්පය වේ, කායප්‍රශ්‍රබ්ධිය වෙයි, චිත්තප්‍රශ්‍රබ්ධිය වෙයි, කායලඝුත්වය වෙයි, චිත්තලඝුත්වය වෙයි, කායමෘදුත්වය වෙයි, චිත්තමෘදුත්වය වෙයි, කායකර්මණ්‍යතා වෙයි, චිත්තකර්මණ්‍යතා වෙයි, කායප්‍රගුණත්වය වෙයි, චිත්තප්‍රගුණත්වය වෙයි, කාය ඍජුත්වය වෙයි, චිත්ත ඍජුත්වය වෙයි, සමෘතිය වෙයි, සම්‍යක්ඥානය වෙයි, ශමථය වෙයි, විදර්ශනාව වෙයි, අවික්ෂෙපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍ය-සමුත්පන්න වූ, යම් අරූපිධර්ම කෙනෙක් හෝ වෙත් ද - මේ ධර්මයෝ කුශලයෝ යි.

151. කවරෙක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශ කරන අයුරෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් ස්පර්ශ කළ බවෙක් වේ ද - මේ එසමයෙහි ස්පර්ශය වේ.

152. කවරක් එසමයෙහි වේදනා වෙයි යත්:

එසමයෙහි යම් තදනුරූප වූ මනොවිඥානධාතුසංස්පර්ශයෙන් උපන් චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් උපෙක්ෂාවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් උපෙක්ෂාවෙදනායෙක් වේ ද - මේ එසමයෙහි වේදනාව වේ. ...

153. කවරක් එසමයෙහි උපේක්ෂා වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් උපේක්ෂාවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් උපේක්ෂාවෙදනායෙක් වේ ද - මේ එසමයෙහි උපෙක්ෂාව වේ. ...

154. කවරෙක් එසමයෙහි උපෙක්ෂේන්ද්‍රිය වෙයි, යත්:

එසමයෙහි යම් චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් උපේක්ෂාවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් උපේක්ෂාවෙදනායෙක් වේ ද, මේ එසමයෙහි උපෙක්ෂේන්ද්‍රිය වේ ...

තවද එසමයෙහි ප්‍රතීත්‍යසමුත්පන්න වූ අන්‍ය වූ ද යම් අරූපිධර්ම කෙනෙක් හෝ වෙත් නම් - මේ ධර්මයෝ කුශලයෝ යි ...

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතුහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති, චතුරඞ්ගධ්‍යානය වෙයි, පඤ්චාඞ්ග මාර්ගය වෙයි, සප්තබලයෝ වෙති, හෙතුහු තිදෙනෙක් වෙති, එක් ස්පර්ශයෙක් වෙයි, ... එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි ප්‍රතීත්‍යසමුත්පන්න වූ අන්‍ය වූ ද යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇද්ද - මේ ධර්මයෝ කුශලයෝ යි. ...

155. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙ'කග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං අලොභො අදොසො අමොහො අනභිජ්ඣා අබ්‍යාපාදො සම්මාදිට්ඨි හිරි ඔත්තප්පං කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කාය-කම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා සති සම්පජඤ්ඤං සමථො විපස්සනා පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

පඤ්චමං චිත්තං.

156. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං සසඞ්ඛාරෙන, රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ - තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

ඡට්ඨං චිත්තං.

157. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ - තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙ'කග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාසඞ්කප්පො හොති, සම්මාවායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සද්ධාබලං හොති, විරියබලං හොති සතිබලං හොති, සමාධිබලං හොති, හිරිබලං හොති, ඔත්තප්පබලං හොති, අලොභො හොති, අදොසො හොති, අනභිජ්ඣා හොති, අබ්‍යාපාදො හොති, හිරි හොති, ඔත්තප්පං හොති, කායපස්සද්ධි හොති, චිත්තපස්සද්ධි හොති, කායලහුතා හොති, චිත්තලහුතා හොති, කායමුදුතා හොති, චිත්තමුදුතා හොති, කායකම්මඤ්ඤතා හොති, චිත්තකම්මඤ්ඤතා හොති, කාය-පාගුඤ්ඤතා හොති, චිත්තපාගුඤ්ඤතා හොති, කායුජ්ජුකතා හොති, චිත්තුජ්ජුකතා හොති, සති හොති, සමථො හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

155. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි, යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය චිත්තෛකාග්‍රතා ය ශ්‍රද්ධේන්ද්‍රිය ය වීර්යේන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥේන්ද්‍රිය ය ජීවිතේන්ද්‍රිය ය සම්‍යග්දෘෂ්ටි ය සම්‍යක්සංකල්ප ය සම්‍යග්ව්‍යායාම ය සම්‍යක්ස්මෘති ය සම්‍යක්සමාධි ය ශ්‍රද්ධාබල ය වීර්යබල ය ස්මෘතිබල යෑ සමාධිබල ය ප්‍රඥාබල ය හිරිබල ය ඔත්තප්පබල ය අලෝභ ය අද්වේෂ ය අමෝහ ය අනභිධ්‍යා ය අව්‍යාපාද ය සම්‍යග්දෘෂ්ටි ය හිරි ය ඔත්තප්ප ය කායප්‍රශ්‍රබ්ධි ය චිත්තප්‍රශ්‍රබ්ධි ය කායලඝුත්ව ය චිත්තලඝුත්ව ය කායමෘදුත්ව ය චිත්තමෘදුත්ව ය කායකර්මණ්‍යතා ය චිත්තකර්මණ්‍යතා ය කායප්‍රාගුණ්‍ය ය චිත්තප්‍රාගුණ්‍ය ය කායෘජුත්ව ය චිත්තෘජුත්ව ය ස්මෘති ය සම්‍යග්ඥාන ය ශමථ ය විදර්ශනා ය ප්‍රග්‍රාහ ය අවික්ෂේප ය, තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා ප්‍රතීත්‍යසමුත්පන්න වූ අන්‍ය වූ ද යම් අරූපීධර්ම කෙනෙක් හෝ වෙත් නම් මේ එසමයෙහි සංස්කාරස්කන්ධය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

පඤ්චමචිත්තය යි.

156. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක්හි රූපාලම්බන වේවයි ... යමක් යමක් හෝ අරමුණු කොට උපෙක්ෂාසහගත වූ ඥානසම්ප්‍රයුක්ත වූ කාමාවචර කුශලචිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වෙයි ... මේ ධර්මයෝ කුශලයෝ යි.

ෂෂ්ඨචිත්තය යි.

157. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක්හි රූපාලම්බන වේවයි ශබ්දාලම්බන වේවයි රසාලම්බන වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට උපේක්ෂා සහගත වූ ඥානසම්ප්‍රයුක්ත වූ කාමාවචර කුශල චිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි. විචාරය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, ශ්‍රද්ධේන්ද්‍රිය වෙයි, වීර්යේන්ද්‍රිය වෙයි, ස්මෘතීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපේක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතේන්ද්‍රිය වෙයි, සම්‍යක්සංකල්පය වෙයි, සම්‍යග්-ව්‍යායාමය වෙයි, සම්‍යක්ස්මෘතිය වෙයි, සම්‍යක්සමාධිය වෙයි, ශ්‍රද්ධාබලය වෙයි, වීර්යබලය වෙයි, ස්මෘතිබලය වෙයි, සමාධිබලය වෙයි, හිරිබලය වෙයි, ඔත්තප්පබලය වෙයි, අලෝභය වෙයි, අද්වේෂය වෙයි, අනභිධ්‍යාව වෙයි, අව්‍යාපාදය වෙයි, හිරිය වෙයි, ඔත්තප්පය වෙයි, කායප්‍රශ්‍රබ්ධිය වෙයි, චිත්තප්‍රශ්‍රබ්ධිය වෙයි, කායලඝුත්වය වෙයි, චිත්තලඝුත්වය වෙයි, කායමෘදුත්වය වෙයි, චිත්තමෘදුත්වය වෙයි, කායකර්මණ්‍යත්වය වෙයි, චිත්තකර්මණ්‍යත්වය වෙයි, කායප්‍රාගුණ්‍යය වෙයි, චිත්තප්‍රාගුණ්‍යය වෙයි, කායෘජුත්වය වෙයි, චිත්තෘජුත්වය වෙයි, ස්මෘතිය වෙයි, ශමථය වෙයි, ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂේපය වේ. තවද එසමයෙහි ප්‍රතීත්‍යසමුත්පන්න වූ අන්‍ය වූ ද යම් අරූපීධර්ම කෙනෙක් හෝ වෙත් ද - මේ ධර්මයෝ කුශලයෝ යි ...

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, සත්තින්ද්‍රියානි හොන්ති, චතුරඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, ඡ බලානි හොන්ති, ද්වෙ හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා – ඉමෙ ධම්මා කුසලා -පෙ-

158. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙ'කග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාසඞ්කප්පො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං හිරිබලං ඔත්තප්පබලං අලොභො අදොසො අනභිජ්ඣා අබ්‍යාපාදො හිරි ඔත්තප්පං කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා සති සමථො පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං– අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති. -පෙ- ඉමෙ ධම්මා කුසලා

සත්තමං චිත්තං.

159 කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං සසඞ්ඛාරෙන, රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ – තස්මිං සමයෙ ඵස්සො හොති, -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

අට්ඨමං චිත්තං.

කාමාවචර අට්ඨමහාචිත්තානි.

දුතියං භාණවාරං

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ සත්දෙනෙක් වෙති, චතුරඞ්ගධ්‍යානය වෙයි, චතුරඞ්ග මාර්ගය වෙයි, බලයෝ සදෙනෙක් වෙති, හේතූහු දෙදෙනෙක් වෙති, එක් ස්පර්ශයෙක් වෙයි ... එක් මැ ධර්මායතනයෙක් වෙයි, එක් මැ ධර්මධාතුයෙක් වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇත් ද, – මේ ධර්මයෝ කුශලයෝ යි ...

158. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ යැ චේතනා යැ විතර්ක යැ විචාර යැ චිත්තෛකාග්‍රතා ය ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය සම්‍යක් සඞ්කල්ප ය සම්‍යග් ව්‍යායාම ය සම්‍යක් සමාධි ය ශ්‍රද්ධාබල ය වීර්යබල ය ස්මෘතිබල ය සමාධිබල ය හිරිබල ය ඔත්තප්පබල ය අලෝභ ය අද්වේෂ ය අනභිධ්‍යා ය අව්‍යාපාද ය හිරි ය ඔත්තප්ප ය කායප්‍රශ්‍රබ්ධි ය චිත්තප්‍රශ්‍රබ්ධි ය කායලඝුත්ව ය චිත්තලඝුත්ව ය කායමෘදුත්ව ය චිත්ත-මෘදුත්ව ය කායකර්මණ්‍යතා ය චිත්තකර්මණ්‍යතා ය කායප්‍රාගුණ්‍ය ය චිත්තප්‍රාගුණ්‍ය ය කාය – ඍජුත්ව ය චිත්ත – ඍජුත්ව ය ස්මෘති ය ශමථ ය ප්‍රග්‍රාහ ය අවික්ෂේප ය, – තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද් ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

සත්තම චිත්තය යි.

159 කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක්හි රූපාලම්බන වේවයි ... ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට උපේක්ෂා සහගත වූ ඥානවිප්‍රයුක්ත වූ කාමා-වචර කුශල චිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

අෂ්ටම චිත්තය යි.

කාමාවචර අෂ්ට මහාචිත්තයෝ යි.

දෙවන බණවර යි.

# රූපාවචර කුසලචිත්තං

## [චතුක්කනයො]

160. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති: විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි, සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[1] උපසම්පජ්ජ විහරති පඨවීකසිණං[2] - තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

161. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති: විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති පඨවීකසිණං. තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙ'කග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං[3] හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති, සම්මාවායාමො හොති, -පෙ- පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්ච සමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, අට්ඨින්ද්‍රියානි හොන්ති, තිවඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, සත්ත බලානි හොන්ති, තයො හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මාධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

162. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා පීති චිත්තස්සෙ'කග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං[3] සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාවායාමො -පෙ- පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

---

1. පඨමජ්ඣානං - සීමු 1, 2, 3. 2 පඨවීකසිණා - මජසං.
3. විරියින්ද්‍රියං - මජසං.

# රූපාවචරකුසලචිත්තය

## [චතුක්කනය]

160. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක්හි රූපභවයෙහි උත්පත්තිය පිණිස මාර්ගය වඩා ද - කාමයන්ගෙන් වෙන් වැ මැ අකුශලධර්මයන්ගෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති පඨවිකසිණ සඞ්ඛ්‍යාත වූ ප්‍රථමධ්‍යානය උපදවා වෙසේ ද, ඒ ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙන ඇසිල්ලෙහි (මහද්ගත භාවයට පැමිණි) ස්පර්ශය වෙයි... අවික්ෂෙපය වෙයි ... මේ ධර්මයෝ කුශලයෝ යි.

161. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙකැ රූපභවයෙහි උත්පත්තිය පිණිස මාර්ගය වඩා ද - විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ උතුම් එකඟබව වඩන අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය ඇති පඨවිකසිණ සඞ්ඛ්‍යාත ද්විතීයධ්‍යානය උපදවා වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, ප්‍රීතිය වෙයි, සුඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, වීර්යෙන්ද්‍රිය වෙයි, ස්මෘතීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, සෞමනස්සින්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි, සම්‍යග්දෘෂ්ටිය වෙයි, සම්‍යග්-ව්‍යායාමය වෙයි ... ප්‍රග්‍රාහය වෙයි ... අවික්ෂෙපය වේ. තවද එසමයෙහි ප්‍රතීත්‍යසමුත්පන්න වූ අන්‍ය වූ ද යම් අරූපීධර්ම කෙනෙක් හෝ වෙත් නම් - මේ ධර්මයෝ කුශලයෝ යි.

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති, තිවඞ්ගික ධ්‍යානය වෙයි, චතුරඞ්ගික මාර්ගය වෙයි, සප්තබලයෝ වෙති, හේතූහු තිදෙනෙක් වෙති, එක් ස්පර්ශයෙක් වෙයි ... එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් හෝ වෙත් නම් - මේ ධර්මයෝ කුශලයෝ යි ...

162. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි, යත්:

ස්පර්ශ ය චේතනා ය ප්‍රීති ය චිත්තෛකාග්‍රතා ය ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්යෙන්ද්‍රියය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය සම්‍යග්දෘෂ්ටි ය සම්‍යග්ව්‍යායාම ය ... ප්‍රග්‍රාහ ය අවික්ෂේප ය, තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද යම් ප්‍රතීත්‍යසමුත්පන්න වූ අරූපීධර්ම කෙනෙක් හෝ වෙත් නම් - මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

163. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති: පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං[1] උපසම්පජ්ජ විහරති පඨවීකසිණං[2] - තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, සුඛං හොති, චිත්තස්සෙ'කග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං[3] හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති ජීවිතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති, සම්මාවායාමො හොති -පෙ- පග්ගාහො හොති, අවික්ඛෙපො හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්ම කුසලා -පෙ-

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, අට්ඨින්ද්‍රියානි හොන්ති, දුවඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, සත්ත බලානි හොන්ති, තයො හෙතූ හොන්ති, එකො ඵස්සො හොති -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්ම - ඉමෙ ධම්මා කුසලා -පෙ-

164. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා චිත්තස්සෙ'කග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං[3] සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාවායාමො -පෙ- පග්ගාහො අවික්ඛෙපො - යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්ච සමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

165. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති: සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං[4] උපසම්පජ්ජ විහරති, පඨවීකසිණං - තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති, සම්මාවායාමො හොති, -පෙ- පග්ගාහො හොති, අවික්ඛෙපො හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

1. තතියජ්ඣානං - සීමු 1, 2, 3.
2 පඨවිකසිණං මජසං.
3. විරියින්ද්‍රියං - මජසං.
4. චතුත්ථජ්ඣානං සීමු 1, 2, 3. .

163. කවර ධර්මයෝ කුශලභ යත්:

යම් කාලෙක රූපභවයෙහි උත්පත්තිය පිණිස මාර්ගය වඩා ද - ප්‍රීතිය ගේ ද විරාගයෙන් උපේක්ෂා ඇතියේත් සිහි ඇතියේත් සම්‍යග්ඥාන ඇතියේත් වෙසේ ද, නාමකායයෙන් සුඛයත් විඳී ද, ආර්‍යයෝ යම්ක් හේතුකොටගෙන ඔහු 'උපෙක්ෂක සමෘතිමත් ය, සුඛවිහරණ ඇත්තෙය'යි පවසත් ද, ඒ පඨවිකසිණ සඞ්ඛ්‍යාත තෘතීයධ්‍යානය උපදවා වෙසේ ද - එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි සුඛය වෙයි, චිත්තෛකාග්‍රතා වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි වීර්‍යෙන්ද්‍රිය වෙයි, සමෘතීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, සොම්නසින්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි, සම්‍යග්දෘෂ්ටිය වෙයි, සම්‍යග්ව්‍යායාමය වෙයි, ... ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂේපය වෙයි. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ වෙත් නම් - මේ ධර්මයෝ කුශලයෝ යි ...

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති, ද්වඞ්ගික ධ්‍යානය වෙයි, චතුරඞ්ගික මාර්ගය වෙයි, සප්තබලයෝ වෙති, හේතූහු තිදෙනෙක් වෙති, එක් ස්පර්ශයෙක් වෙයි,... එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වෙයි. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් වෙත් නම් - මේ ධර්මයෝ කුශලයෝ යි ...

164. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ යැ චේතනා යැ චිත්තෛකාග්‍රතා යැ ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍යෙන්ද්‍රිය යැ සමෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යැ ජීවිතෙන්ද්‍රිය යැ සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යග්ව්‍යායාම යැ ... ප්‍රග්‍රාහ යැ අවික්ෂෙප යැ, තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍ය සමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් වෙත් ද - මේ එසමයෙහි සංස්කාර ස්කන්ධය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

165. කවර ධර්මයෝ කුශලභ යත්:

යම් කාලෙක රූපභවයෙහි උත්පත්තිය පිණිස මාර්ගය වඩා ද - සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයා ගේ ද ප්‍රහාණයෙන් පෙර (උපචාරක්ෂණයෙහි) මැ සොම්නස් දොම්නසුන්ගේ අස්තඞ්ගමයෙන් නිදුක් වූ නො සුව වූ උපේක්ෂා වෙත් උපන් සමෘතිපාරිශුද්ධිය ඇති පඨවිකසිණ සඞ්ඛ්‍යාත චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද - එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, වීර්‍යෙන්ද්‍රිය වෙයි, සමෘතීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපේක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතේන්ද්‍රිය වෙයි, සම්‍යග්දෘෂ්ටිය වෙයි, සම්‍යග්ව්‍යායාමය වෙයි ... ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂෙපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද යම් ප්‍රතීත්‍යසමුත්පන්න වූ අරූපිධර්ම කෙනෙක් හෝ වෙත් ද - මේ ධර්මයෝ කුශලයෝ යි..

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, අට්ඨින්ද්‍රියානි හොන්ති, දුවඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, සත්තබලානි හොන්ති, තයො හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති - යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

166. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා චිත්තස්සෙ'කග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං[1] සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාවායාමො -පෙ- පග්ගාහො අවික්ඛෙපො - යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

චතුක්කනයො.

167. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති: විවිච්චෙ'ව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං - තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

168. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති: අවිතක්කං විචාරමත්තං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං[2] - තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විචාරො හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති, සම්මාවායාමො හොති, -පෙ- පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

1. වීරියින්ද්‍රියං - මජසං, 2. පඨවීකසිණං මජසං.

එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති, දුවඞ්ගික ධ්‍යානය වෙයි, චතුරඞ්ගික මාර්ගය වෙයි, සප්තබලයෝ වෙති, හේතූහු තිදෙනෙක් වෙති, එක් ස්පර්ශයෙක් වෙයි, ... එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇද්ද - මේ ධර්මයෝ කුශලයෝ යි ...

166. කවරේක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය චිත්තෛකාග්‍රතා ය ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්‍ය්‍යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය සම්‍යග්දෘෂ්ටි ය සම්‍යග්ව්‍යායාම ය... ප්‍රග්‍රාහ ය අවික්ෂේප ය, තවද එසමයෙහි වෙදනාස්කන්ධය තබා සංඥස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇත් නම් - එසමයෙහි මේ සංස්කාරස්කන්ධය වේ. .... මේ ධර්මයෝ කුශලයෝ යි.

**චතුෂ්කනය යි.**

167. කවර ධර්මයෝ කුශලහ? යත්:

යම් කලෙක්හි රූපභවයෙහි උත්පත්තිය පිණිස කාමයන්ගෙන් වෙන් වැ මැ ... පෘථිවීකසිණ සඞ්ඛ්‍යාත ප්‍රථමධ්‍යානය උපදවා වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, .... අවික්ෂේපය වෙයි, ... මේ ධර්මයෝ කුශලයෝ යි.

168. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක්හි රූපභවයෙහි උත්පත්තිය පිණිස මාර්ගය වඩා ද - විතර්ක රහිත වූ විචාරමාත්‍ර වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති පෘථිවීකසිණ සඞ්ඛ්‍යාත ද්විතීයධ්‍යානය උපදවා වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වෙදනාව වෙයි, සංඥව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විචාරය වෙයි, ප්‍රීතිය වෙයි, සුඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, වීර්‍ය්‍යෙන්ද්‍රිය වෙයි, ස්මෘතීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, සෞමනස්සින්ද්‍රිය වෙයි, ජීවිතින්ද්‍රිය වෙයි, සම්‍යග්දෘෂ්ටිය වෙයි, සම්‍යග්-ව්‍යායාමය වෙයි, ... ප්‍රග්‍රාහය වෙයි අවික්ෂේපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇත් නම් - මේ ධර්මයෝ කුශලයෝ යි ...

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, අට්ඨින්ද්‍රියානි හොන්ති, චතුරඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, සත්ත බලානි හොන්ති, තයො හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

169. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විචාරො පීති චිත්තස්සෙ'කග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාවායාමො -පෙ- පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

170. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විතක්කවිචාරානං වූපසමා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති පථවීකසිණං - තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙ'කග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති, සම්මාවායාමො හොති, -පෙ- පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්ච සමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, අට්ඨින්ද්‍රියානි හොන්ති, තිවඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, සත්ත බලානි හොන්ති, තයො හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති, චතුරඞ්ගික ධ්‍යානය වෙයි, චතුරඞ්ගික මාර්ගය වෙයි, සප්තබලයෝ වෙති, හේතූහු තිදෙනෙක් වෙති, එක් ම ස්පර්ශයෙක් වෙයි, ... එක් ම ධර්මායතනය වෙයි, එක් ම ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍ය සමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇද්ද – මේ ධර්මයෝ කුශලයෝ යි. ...

169. කවරේක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය විචාර ය ප්‍රීති ය චිත්තෛකාග්‍රතා ය සද්ධින්ද්‍රිය ය විරියින්ද්‍රිය ය සතින්ද්‍රිය ය සමාධින්ද්‍රිය ය පඤ්ඤින්ද්‍රිය ය ජීවිතින්ද්‍රිය ය සම්මාදිට්ඨි ය සම්මාවායාම ය ... ප්‍රග්‍රාහ ය අවික්ෂේප ය, තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇද්ද – එසමයෙහි මේ සංස්කාරස්කන්ධය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

170. කවර ධර්මයෝ කුශලය යත්:

යම් කලෙක්හි රූපභවයෙහි උත්පත්තිය පිණිස මාර්ගය වඩා ද – විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් ... පඨවීකසිණ සඞ්ඛ්‍යාත තෘතීයධ්‍යානය උපදවා වෙසේ ද - එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, චිත්තය වෙයි, ප්‍රීතිය වෙයි, සුඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, සද්ධින්ද්‍රිය වෙයි, විරියින්ද්‍රිය වෙයි, සතින්ද්‍රිය වෙයි, සමාධින්ද්‍රිය වෙයි, පඤ්ඤින්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, සෞමනස්සින්ද්‍රිය වෙයි, ජීවිතින්ද්‍රිය වෙයි, සම්මාදිට්ඨිය වෙයි, සම්මාවායාමය වෙයි, ... ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂේපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇද්ද – මේ ධර්මයෝ කුශලයෝ යි...

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති, ත්‍රිවඞ්ගික ධ්‍යානය වෙයි, චතුරඞ්ගික මාර්ගය වෙයි, සප්තබලයෝ වෙති, හේතූහු තිදෙනෙක් වෙති, එක් ම ස්පර්ශයෙක් වෙයි, ... එක් ම ධර්මායතනය වෙයි, එක් ම ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් හෝ ඇද්ද – මේ ධර්මයෝ කුශලයෝ යි. ...

171. කතමෝ තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධෝ හෝති?

ඵස්සෝ චේතනා පීති[1] චිත්තස්සේ'කග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාවායාමෝ -පෙ- පග්ගාහෝ අවික්ඛෙපෝ - යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤේ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනෝ ධම්මා, ඨපෙත්වා වේදනාක්ඛන්ධං, ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං, ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධෝ හෝති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

172. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති: පීතියා ච විරාගා -පෙ- චතුත්ථං ඣානං[2] උපසම්පජ්ජ විහරති පථවීකසිණං - තස්මිං සමයෙ ඵස්සෝ හෝති, වේදනා හෝති, සඤ්ඤා හෝති, චේතනා හෝති, චිත්තං හෝති, සුඛං හෝති, චිත්තස්සේ'කග්ගතා හෝති, සද්ධින්ද්‍රියං හෝති, විරියින්ද්‍රියං හෝති, සතින්ද්‍රියං හෝති, සමාධින්ද්‍රියං හෝති, පඤ්ඤින්ද්‍රියං හෝති, මනින්ද්‍රියං හෝති, සෝමනස්සින්ද්‍රියං හෝති, ජීවිතින්ද්‍රියං හෝති, සම්මාදිට්ඨි හෝති, සම්මාවායාමෝ හෝති, -පෙ- පග්ගාහෝ හෝති. අවික්ඛෙපෝ හෝති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤේ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනෝ ධම්මා ඉමෙ ධම්මා කුසලා -පෙ-

තස්මිං ඛෝ පන සමයෙ චත්තාරෝ ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයෝ හොන්ති, තයෝ ආහාරා හොන්ති, අට්ඨින්ද්‍රියානි හොන්ති, දුවඞ්ගිකං ඣානං හෝති, චතුරඞ්ගිකෝ මග්ගෝ හෝති, සත්ත බලානි හොන්ති, තයෝ හේතූ හොන්ති, ඒකෝ ඵස්සෝ හෝති, -පෙ- ඒකං ධම්මායතනං හෝති, ඒකා ධම්මධාතු හෝති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤේ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනෝ ධම්මා - ඉමෙ ධම්මා කුසලා -පෙ-

173. කතමෝ තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධෝ හෝති?

ඵස්සෝ චේතනා චිත්තස්සේ'කග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාවායාමෝ -පෙ- පග්ගාහෝ අවික්ඛෙපෝ - යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤේ'පි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනෝ ධම්මා, ඨපෙත්වා වේදනාක්ඛන්ධං, ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං, ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං. - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධෝ හෝති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

---

1. පීති [සුඛං] - PTS.
2. චතුත්ථජ්ඣානං සීමු, 1 2 3.

171. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය ප්‍රීති ය චිත්තෛකාග්‍රතා ය ශ්‍රද්ධේන්ද්‍රිය ය වීර්යෙන්ද්‍රිය ය සතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය සම්මාදිට්ඨි ය සම්මාවායාම ය ... ප්‍රග්‍රාහ ය අවික්ෂේප ය – තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද – එසමයෙහි මේ සංස්කාරස්කන්ධය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

172. කවර ධර්මයෝ කුශල ද යත්:

යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් ... පෘථවීකසිණ සඞ්ඛ්‍යාත වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, සුඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, ශ්‍රද්ධේන්ද්‍රිය වෙයි, වීර්යෙන්ද්‍රිය වෙයි, සතීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, සෞමනස්සින්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි, සම්මාදිට්ඨිය වෙයි, සම්මා-වායාමය වෙයි, ... ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂේපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද – මේ ධර්මයෝ කුශලයෝ යි ...

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙයි, ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති, දුවඞ්ගික ධ්‍යානය වෙයි, චතුරඞ්ගික මාර්ගය වෙයි, සප්තබලයෝ වෙති, හේතූහු තිදෙනෙක් වෙයි, එක් ම ස්පර්ශයෙක් වෙයි, ... එක් ම ධර්මායතනය වෙයි, එක් ම ධර්මධාතු වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද – මේ ධර්මයෝ කුශලයෝ යි ...

173. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය චිත්තෛකාග්‍රතා ය ශ්‍රද්ධේන්ද්‍රිය ය වීර්යෙන්ද්‍රිය ය සතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය සම්මාදිට්ඨි ය සම්මාවායාම ය ... ප්‍රග්‍රාහ ය අවික්ෂේප ය – තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද – එසමයෙහි මේ සංස්කාරස්කන්ධය වේ... මේ ධර්මයෝ කුශලයෝ යි.

174. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

---

1. පඨමං ඣානං, ඉති ඌනං සිමු.

243. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම-රූපයෙහි පරිකර්මසංඥ රහිත වූයේ අප්‍රමාණ වූ බාහ්‍ය වූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දන්මි දක්මි විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ පඤ්චමධ්‍යා-නයට පැමිණ වෙසේ ද, ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ ... දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණා-ලම්බන වූ ...දුඃඛප්‍රති පත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණාලම්බන වූ ... සුඛප්‍රති-පත් ඇති දන්ධාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ ... සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ ... සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ පරිත්ත වූ අප්‍රමාණාලම්බන වූ ... සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රමාණ වූ අප්‍රමාණාලම්බන වූ පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

අනෙකුදු අභිභායතනයෙකි.

244. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කාලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම-රූපයෙහි පරිකර්මසංඥ රහිත වූයේ අප්‍රමාණ වූ සුවර්ණදුර්වර්ණ වූ බාහ්‍ය වූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දන්මි දක්මි කාමයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

245. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම-රූපයෙහි පරිකර්මසංඥ රහිත වූයේ අප්‍රමාණ වූ සුවර්ණදුර්වර්ණ වූ බාහ්‍ය වූ රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දන්මි දක්මි විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

මෙද අභිභායතනයෙකි.

246 කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්මරූප-යෙහි පරිකර්මසංඥ රහිත වූයේ නිල් වූ නිල් වන් වූ නුදුනිල් වූ නිල්පැහැ වූ බැහැරි රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දන්මි දක්මි කාමයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි

247. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි -පෙ- ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි -පෙ- ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

ඉමානිපි අභිභායතනානි සොළසක්ඛත්තුකානි.

[තීණි විමොක්ඛානි සොළසක්ඛත්තුකානි]

248. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, රූපී රූපානි පස්සති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

249. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

250. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, සුභන්ති අධිමුත්තො[1] හොති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

ඉමානි තීණි විමොක්ඛානි සොළසක්ඛත්තුකානි.

[චත්තාරි බ්‍රහ්මවිහාරජ්ඣානානි සොළසක්ඛත්තුකානි]

251. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

1. සුභන්තිවිවිච්චෙව. PTS.

247. කවර ධර්මයෝ කුශලද යත්:

යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම රූපයෙහි පරිකර්මසංඥා රහිත වූයේ පීත වූ පීතවර්ණ වූ පීතනිදර්ශන වූ පීතප්‍රභ වූ බාහ්‍යරූපයන් දකී ද ... ලෝහිතක වූ ලෝහිතකවර්ණ වූ ලෝහිතක නිදර්ශන වූ ලෝහිතකප්‍රභ වූ ... අවදාත වූ අවදාතවර්ණ වූ අවදාතනිදර්ශන වූ අවදාතප්‍රභ වූ (බාහ්‍ය) රූපයන් දකී ද, ඒ රූපයන් මැඩගෙන දනිමි දක්මි කාමයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල්හි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

**මේ අභිභායතනයෝත් සොළසකඛතතුකයෝ යි.**

[විමොක්ෂ සොළසකඛතතුකය]

248. කවර ධර්මයෝ කුශලද යත්:

යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්ම-රූපධ්‍යාන ඇතියේ (බාහ්‍ය වූ ද) රූපයන් දකී ද, කාමයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි. ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

249. කවර ධර්මයෝ කුශලද යත්:

යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අධ්‍යාත්මයෙහි රූපසංඥා රහිත වූයේ බාහ්‍ය රූපයන් දකී ද, කාමයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

250. කවර ධර්මයෝ කුශලද යත්:

යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සුභ ය යි කසිණ අරමුණෙහි නිසල වූයේ වේ ද, කාමයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

**මේ තුන් විමොක්ෂයෝත් සොළසකඛතතුකයෝ යි.**

[බ්‍රහ්මවිහාරධ්‍යාන සොළසකඛතතුකය]

251. කවර ධර්මයෝ කුශලද යත්:

යම් කලෙක රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... මෛත්‍රීසහගත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

252. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

253 කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

254. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

255. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, අවිතක්කං විචාරමත්තං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

256. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විතක්කවිචාරානං වූපසමා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

257. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, පීතියා ච විරාගා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

258. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

252. කවර ධම්යෝ කුශලහු යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාර-යන්ගේ සන්හිඳීමෙන් ... මෛත්‍රීසහගත ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධම්යෝ කුශලයෝ යි.

253. කවර ධම්යෝ කුශලහු යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් ... මෛත්‍රීසහගත තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධම්යෝ කුශලයෝ යි.

254. කවර ධම්යෝ කුශලහු යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ ... මෛත්‍රීසහගත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධම්යෝ කුශලයෝ යි.

255. කවර ධම්යෝ කුශලහු යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, අවිතර්ක වූ විචාරමාත්‍ර වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති මෛත්‍රීසහගත ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධම්යෝ කුශලයෝ යි.

256. කවර ධම්යෝ කුශලහු යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාර-යන්ගේ සන්හිඳීමෙන් ... මෛත්‍රීසහගත වූ තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධම්යෝ කුශලයෝ යි.

257. කවර ධම්යෝ කුශලහු යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, ප්‍රීතියගේ ද විරාගයෙන් ... මෛත්‍රීසහගත චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධම්යෝ කුශලයෝ යි.

258. කවර ධම්යෝ කුශලහු යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ ... කරුණාසහගත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධම්යෝ කුශලයෝ යි.

259. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- පඨමං ඣානං[1] -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති කරුණාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

260. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති මුදිතාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

261 කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති මුදිතාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ ඉමෙ ධම්මා කුසලා.*

262 කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති උපෙක්ඛාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති පෙ- ඉමෙ ධම්මා කුසලා.

චත්තාරි බ්‍රහ්මවිහාරජ්ඣානානි සොළසක්ඛත්තුකානි.

[අසුභජ්ඣානං සොළසක්ඛත්තුකං]

263. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති උද්ධුමාතකසඤ්ඤාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

264. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති විනීලකසඤ්ඤාසහගතං -පෙ- විපුබ්බකසඤ්ඤාසහගතං -පෙ- විච්ඡිද්දකසඤ්ඤාසහගතං -පෙ- වික්ඛායිතකසඤ්ඤාසහගතං -පෙ- වික්ඛිත්තකසඤ්ඤාසහගතං -පෙ- හතවික්ඛිත්තකසඤ්ඤාසහගතං -පෙ- ලොහිතකසඤ්ඤාසහගතං -පෙ- පුළවකසඤ්ඤාසහගතං -පෙ- අට්ඨිකසඤ්ඤාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

අසුභජ්ඣානං සොළසක්ඛත්තුකං.

රූපාවචරකුසලං.

---

* අයං වාරො සිමු 3 පොත්ථකෙ න දිස්සතෙ  1. පඨමං ඣානං - ඌනං, සිමු3.

259. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාර-යන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ප්‍රථමධ්‍යාන-යට... කරුණාසහගත චතුර්ථධ්‍යානයට ... පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ...මේ ධර්මයෝ කුශලයෝ යි.

260. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්-ගෙන් වෙන් ව ම ... මුදිතා සහගත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

261. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාර-යන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... ප්‍රථම-ධ්‍යානයට ... මුදිතාසහගත චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුසලයෝ යි.

262. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ...උපේක්‍ෂාසහගත චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසම-යෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

සතර බ්‍රහ්මවිහාරධ්‍යානික සොළසකඛත්තුකය යි.

[අශුභධ්‍යාන සොළසකඛත්තුකය]

263. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්-ගෙන් වෙන් වැ මැ ... උද්ධුමාතකසංඥාසහගත වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

264. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙකැ රූපභවොත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්-ගෙන් වෙන් ව ම ... විනීලකසංඥාසහගත වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද ... විපුබ්බකසංඥාසහගත වූ ... විච්ඡිද්දකසංඥාසහගත වූ ... වික්ඛායි-තකසංඥා සහගත වූ ... වික්ඛිත්තකසංඥාසහගත වූ ... හතවික්ඛිත්තකසංඥා සහගත වූ ... ලොහිතකසංඥාසහගත වූ ... පුලවකසංඥාසහගත වූ ... අට්ඨික-සංඥා සහගත වූ (ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ. මේ ධර්මයෝ කුශලයෝ යි.

අශුභධ්‍යාන සොළසකඛත්තුකය යි.

රූපාවචර කුශල යි.

[අරූපාවචරකුසලං]

265. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා[1] නානත්තසඤ්ඤානං අමනසිකාරා ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති උපෙක්ඛාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

266 කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති උපෙක්ඛාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

267. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති උපෙක්ඛාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

268. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති උපෙක්ඛාසහගතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

චත්තාරි අරූපජ්ඣානානි සොළසක්ඛත්තුකානි.

අරූපාවචරකුසලං.

269. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං -පෙ- ඡන්දාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- විරියාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- චිත්තාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- වීමංසාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

---

1. අත්ථගමා - සිමු 3.

### [අරූපාවචරකුශල]

265. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාර-යෙන් රූපසංඥාවන්ගේ ඉක්මයෑමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ ප්‍රහාණයෙන් නානාත්වසංඥාවන්ගේ නො මෙනෙහි කිරීමෙන් ආකාසානඤ්චායතන සංඥා-සහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... උපේක්ෂාසහගත වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

266. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාර-යෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණඤ්චායතනසංඥා සහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... උපේක්ෂාසහගත වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

267 කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාර-යෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ආකිඤ්චඤ්ඤායතන සංඥාසහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... උපේක්ෂාසහගත වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

268. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාර-යෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා සහ-ගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ...උපේක්ෂාසහගත වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

අරූපධ්‍යාන සොළසක්ඛත්තුකය යි.

අරූපාවචර කුශල යි.

269. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක සෞමනස්‍යසහගත වූ ඥානසම්ප්‍රයුක්ත වූ හීන වූ කාමාවචර කුශලචිත්තය උපදනේ වේ ද ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... ඡන්දය අධිපති කොට ඇති ... වීර්‍ය්‍ය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති ... ඡන්දය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ප්‍රණීත වූ ... චිත්තය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ... විමංසාව අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ප්‍රණීත වූ - (කාමාවචර කුශලචිත්තය උපදනේ වේ ද) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

270. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං -පෙ- සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං -පෙ- උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං -පෙ- උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං සසඞ්ඛාරෙන හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං පෙ චිත්තාධිපතෙය්‍යං -පෙ- ඡන්දාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- විරියාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- චිත්තාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

කාමාවචරකුසලං.

271. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවීකසිණං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං -පෙ- ඡන්දාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- විරියාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- චිත්තාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- වීමංසාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා

272. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විතක්කවිචාරානං -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පඨවීකසිණං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං -පෙ- ඡන්දාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- විරියාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- චිත්තාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- වීමංසාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

රූපාවචරකුසලං.

270. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක්හි සෞමනස්‍යසහගත වූ ඥානසම්ප්‍රයුක්ත වූ කාමාවචර කුශලචිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද ... සෞමනස්‍යසහගත වූ ඥානවිප්‍රයුක්ත වූ ... සෞමනස්‍ය සහගත වූ ඥානවිප්‍රයුක්ත වූ, සංස්කාර සහිත වැ ... උපෙක්ෂාසහගත වූ ඥානසම්ප්‍රයුක්ත වූ ... උපෙක්ෂාසහගත වූ ඥාන-සම්ප්‍රයුක්ත වූ, සංස්කාර සහිත වැ ... උපෙක්ෂාසහගත ඥානවිප්‍රයුක්ත ... උපෙක්ෂාසහගත ඥානවිප්‍රයුක්ත, සංස්කාර සහිත වැ හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... ඡන්දය අධිපති කොට ඇති ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... ඡන්දය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... චිත්තය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ (කාමාවචර කුශලචිත්තය) උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

**කාමාවචරකුශල යි.**

271. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක්හි රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, කාමයන්ගෙන් වෙන් වැ මැ ... හීන වූ පෘථිවීකසිණ - ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... ඡන්දය අධිපති කොට ඇති ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති ... ඡන්දය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... චිත්තය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ...) විමංසාව අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ (ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

272. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කලෙක්හි රූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, විතර්කවිචාර-යන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යා-නයට ... ප්‍රථමධ්‍යානයට ... හීන වූ පෘථිවීකසිණ - පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... ඡන්දය අධිපති කොට ඇති ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති ... ඡන්දය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... චිත්තය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... විමංසාව අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ (පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද,) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

**රූපාවචරකුශල යි.**

273. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා[1] නානත්තසඤ්ඤානං අමනසිකාරා ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං -පෙ- ඡන්දාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- විරියාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- චිත්තාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- වීමංසාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

274. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං -පෙ- ඡන්දාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- විරියාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- චිත්තාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- වීමංසාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

275. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං -පෙ- ඡන්දාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- විරියාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- චිත්තාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- වීමංසාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

---

1 අත්ථගමා - සිමු 2.

273. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කාලෙකැ අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ ඉක්මයෑමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ ප්‍රහාණයෙන් නානාත්වසංඥාවන්ගේ නො මෙනෙහි කිරීමෙන් ආකාසානඤ්චායතනසංඥා සහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... හීන වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... ඡන්දය අධිපති කොට ඇති... වීර්යය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති ... ඡන්දය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීර්යය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... චිත්තය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... විමංසාව අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ (චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

274. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කාලෙකැ අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණඤ්චායතන සංඥා සහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... හීන වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... ඡන්දය අධිපති කොට ඇති ... වීර්යය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති... ඡන්දය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීර්යය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... චිත්තය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... විමංසාව අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ (චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

275. කවර ධර්මයෝ කුශලහු යත්:

යම් කාලෙකැ අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ආකිඤ්චඤ්ඤායතනසංඥාසහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... හීන වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... ඡන්දය අධිපති කොට ඇති ... වීර්යය අධිපති කොට ඇති .. චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති ... ඡන්දය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීර්යය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... චිත්තය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... විමංසාව අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

276. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං -පෙ- ඡන්දාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- විරියාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං -පෙ- වීමංසාධිපතෙය්‍යං හීනං -පෙ- මජ්ඣිමං -පෙ- පණීතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

### අරූපාවචරකුසලං.

### තෙභූමකකුසලං නිට්ඨිතං.

## [ලොකුත්තරං චිත්තං]

277. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, සද්ධින්ද්‍රියං හොති, විරියින්ද්‍රියං හොති, සතින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, පඤ්ඤින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං හොති, සම්මාදිට්ඨි හොති, සම්මාසඞ්කප්පො හොති, සම්මාවාචා හොති, සම්මාකම්මන්තො හොති, සම්මාආජීවො හොති, සම්මාවායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සද්ධාබලං හොති, විරියබලං හොති, සතිබලං හොති, සමාධිබලං හොති, පඤ්ඤාබලං හොති, හිරිබලං හොති, ඔත්තප්පබලං හොති, අලොභො හොති, අදොසො හොති, අමොහො හොති, අනභිජ්ඣා හොති, අබ්‍යාපාදො හොති, සම්මාදිට්ඨි හොති, හිරි හොති, ඔත්තප්පං හොති, කායපස්සද්ධි හොති, චිත්තපස්සද්ධි හොති, කායලහුතා හොති, චිත්තලහුතා හොති, කායමුදුතා හොති, චිත්තමුදුතා හොති, කායකම්මඤ්ඤතා හොති, චිත්තකම්මඤ්ඤතා හොති, කායපාගුඤ්ඤතා හොති, චිත්තපාගුඤ්ඤතා හොති, කායුජ්ජුකතා හොති, චිත්තුජ්ජුකතා හොති, සති හොති, සම්පජඤ්ඤං හොති, සමථො හොති, විපස්සනා හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා කුසලා.

276. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක අරූපභවෝත්පත්තිය පිණිස මාර්ගය වඩා ද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා සහගත වූ සුඛයාගේ ද ප්‍රහාණයෙන් .... හීන වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... ඡන්දය අධිපති කොට ඇති ... වීර්යය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... වීමංසාව අධිපති කොට ඇති ... ඡන්දය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීර්යය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... චිත්තය අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ ... වීමංසාව අධිපති කොට ඇති හීන වූ ... මධ්‍යම වූ ... ප්‍රණීත වූ (චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

අරූපාවචරකුශල යි.

ත්‍රෛභූමකකුශලය නිමි.

[ලෝකෝත්තර සිත]

277. කවර ධර්මයෝ කුශලහ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස (ස්‍රොතාපත්තිඵල සඞ්ඛ්‍යාත) ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ (ච්‍යුතිප්‍රතිසන්ධි නසමින් යන) ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, ප්‍රීතිය වෙයි, සුඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, සද්ධින්ද්‍රිය වෙයි, විරියින්ද්‍රිය වෙයි, සතින්ද්‍රිය වෙයි, සමාධින්ද්‍රිය වෙයි, පඤ්ඤින්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, සොමනස්සින්ද්‍රිය වෙයි, ජීවිතින්ද්‍රිය වෙයි, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය වෙයි, සම්මාදිට්ඨි වෙයි, සම්මාවාචා වෙයි, සම්මාකම්මන්ත වෙයි, සම්මාආජීව වෙයි, සම්මාවායාම වෙයි, සම්මාසති වෙයි, සම්මාසමාධි වෙයි, සද්ධාබල වෙයි, විරියබල වෙයි, සතිබල වෙයි, සමාධිබල වෙයි, පඤ්ඤාබල වෙයි, හිරිබල වෙයි, ඔත්තප්පබල වෙයි, අලෝභය වෙයි, අද්වේෂය වෙයි, අමෝහය වෙයි, අනභිජ්ඣා වෙයි, අව්‍යාපාද වෙයි, සම්මාදිට්ඨි වෙයි, හිරි වෙයි, ඔත්තප්ප වෙයි, කායපස්සද්ධි වෙයි, චිත්තපස්සද්ධි වෙයි, කායලහුතා වෙයි, චිත්තලහුතා වෙයි, කායමුදුතා වෙයි, චිත්තමුදුතා වෙයි, කායකම්මඤ්ඤතා වෙයි, චිත්තකම්මඤ්ඤතා වෙයි, කායපාගුඤ්ඤතා වෙයි, චිත්තපාගුඤ්ඤතා වෙයි, කායුජ්ජුකතා වෙයි, චිත්තුජ්ජුකතා වෙයි, සති වෙයි, සම්පජඤ්ඤ වෙයි, සමථය වෙයි, විපස්සනා වෙයි, පග්ගාහය වෙයි, අවික්ඛේපය වේ. තවද එසමයෙහි ප්‍රතීත්‍යසමුත්පන්න වූ අන්‍ය වූ ද යම් අරූපීධර්ම කෙනෙක් හෝ ඇද්ද, මේ ධර්මයෝ කුශලයෝ යි.

278. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

279. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, අයං තස්මිං සමයෙ වෙදනා හොති.

280. කතමා තස්මිං සමයෙ සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං තස්මිං සමයෙ සඤ්ඤා හොති.

281. කතමා තස්මිං සමයෙ චෙතනා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං, අයං තස්මිං සමයෙ චෙතනා හොති.

282. කතමං තස්මිං සමයෙ චිත්තං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං තස්මිං සමයෙ චිත්තං හොති.

283. කතමො තස්මිං සමයෙ විතක්කො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මාසඞ්කප්පො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ විතක්කො හොති.

284. කතමො තස්මිං සමයෙ විචාරො හොති?

යො තස්මිං සමයෙ චාරො විචාරො අනුවිචාරො චිත්තස්ස අනුසන්ධානතා[1] අනුපෙක්ඛනතා, අයං තස්මිං සමයෙ විචාරො හොති.

285. කතමා තස්මිං සමයෙ පීති හොති?

යා තස්මිං සමයෙ පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස පීතිසම්බොජ්ඣඞ්ගො, අයං තස්මිං සමයෙ පීති හොති.

---

1. අනුසන්ධනතා, සීමු. මජසං. සයා. PTS.

278. කවරෙක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශ කරන අයුරෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් මොනවට ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශ වේ.

279. කවරක් එසමයෙහි වේදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනොවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් චෛතසික වූ යම් මිහිරි බවෙක් චෛතසික සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් මධුර වූ වේදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් මධුර වූ සුඛ වූ වේදනායෙක් වේ ද, මේ එසමයෙහි වේදනාව වේ.

280. කවරක් එසමයෙහි සංඥා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනොවිඥානධාතුසංස්පර්ශයෙන් උපන් යම් සංඥායෙක් සඤ්ජානනාකාරයෙක් හැඳිනගත් බවෙක් වේ ද, මේ එසමයෙහි සංඥා වේ.

281. කවරක් එසමයෙහි චෙතනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනොවිඥානධාතුසංස්පර්ශයෙන් උපන් යම් චෙතනායෙක් සඤ්චෙතනායෙක් සිතන ලද බවෙක් වේ ද, මේ එසමයෙහි චෙතනා වේ.

282. කවරෙක් එසමයෙහි චිත්ත වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් හිතෙක් භවාඞ්ග සිතෙක්, මනයෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුයෙක් වේ ද, මේ එසමයෙහි චිත්තය වේ.

283. කවරෙක් එසමයෙහි විතර්ක වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ යම් තර්කයෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණායෙක් බලවත් අර්පණායෙක් (අරමුණෙහි) සිත පිහිටුවීමෙක් සම්‍යක් සංකල්පයෙක් වේ ද, මේ එසමයෙහි විතර්ක වේ.

284. කවරෙක් එසමයෙහි විචාර වෙයි යත්:

එසමයෙහි යම් (අරමුණෙහි හැසිරෙන) චාරයෙක් විචාරයෙක අනුවිචාරයෙක් උපවිචාරයෙක් (අරමුණෙහි) සිත ගලපන බවෙක් අනුප්‍රෙක්ෂණතායෙක් වේ ද, මේ එසමයෙහි විචාරය වේ.

285. කවරක් එසමයෙහි ප්‍රීති වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රීතියෙක් ප්‍රාමොද්‍යයෙක් ආමොදනාකාරයෙක ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් ප්‍රීතිධනයෙක් ඔදවැඩි බවෙක චිත්තයාගේ සතුටු බවෙක් වේ ද, මේ එසමයෙහි ප්‍රීති වේ.

286. කතමං තස්මිං සමයෙ සුඛං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ සුඛං හොති.

287. කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති.

288. කතමං තස්මිං සමයෙ සද්ධින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං, ඉදං තස්මිං සමයෙ සද්ධින්ද්‍රියං හොති.

289. කතමං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො විරියසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති.

290. කතමං තස්මිං සමයෙ සතින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අපම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ සතින්ද්‍රියං හොති.

291. කතමං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති

292. කතමං තස්මිං සමයෙ පඤ්ඤින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ පඤ්ඤින්ද්‍රියං හොති.

286. කවරේක් එසමයෙහි සුඛ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මිහිරි බවෙක් චෛතසික සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදනාවෙක් වේ ද, මේ එසමයෙහි සුඛවෙදනා වේ.

287. කවරක් එසමයෙහි චිත්තෙකාග්‍රතා වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, චිත්තයාගේ යම් (නිසල බැවින් අරමුණෙහි) සිටීමෙක් බැසැ සිටීමෙක් නොවිසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුළු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් සමාධි සම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි චිත්තෙකාග්‍රතා වේ.

288. කවරේක් එසමයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් ශ්‍රද්ධාවෙක් හැදහීම් අයුරෙක් (ගුණයෙහි) බැසැ ගැනීමෙක් අභිප්‍රසාදයෙක් ශ්‍රද්ධාවෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයෙක් ශ්‍රද්ධාබලයෙක් වේ ද, මේ එසමයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය වේ.

289. කවරේක් එසමයෙහි වීර්‍යෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, යම් චෛතසික වූ වීර්‍යාරම්භයෙක් නිෂ්ක්‍රම (කුසීත බැවින් නික්මෙන වීර්‍ය) යෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍රඋත්සාහයෙක් ථාමයෙක් ධෛර්‍යයෙක් සථිරපරාක්‍රමයෙක් නො තැබූ ඡන්දය ඇති බවෙක් නො තැබූ වීර්‍යධුර ඇති බවෙක් වීර්‍යය දැඩි වැ ගැනීමෙක්, වීර්‍යයෙක් වීර්‍යෙන්ද්‍රියයෙක් වීර්‍යබලයෙක් සම්‍යග්වීර්‍යයෙක් වීර්‍යසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි වීර්‍යෙන්ද්‍රිය වේ.

290. කවරේක් එසමයෙහි ස්මෘතීන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් සිහි කිරීමෙක් පුනපුනා සිහි කිරීමෙක් අභිමුඛ කොට සිහි කිරීමෙක් ස්මෘති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් අරමුණෙහි පිවිසෙන බවෙක් නො මුළා වන බවෙක් ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියෙක් ස්මෘති සම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි ස්මෘතීන්ද්‍රිය වේ.

291. කවරේක් එසමයෙහි සමාධීන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ චිත්තයාගේ යම් සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුළු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් සමාධි සම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සමාධීන්ද්‍රිය වේ.

292. කවරේක් එසමයෙහි ප්‍රඥෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, යම් (අනිත්‍යාදි ප්‍රකාරයෙන් දහම්) දැනීමෙක් දන්නා අයුරෙක් (අනිත්‍යාදිය) විමසීමෙක් සිවුසස්දහම් විමසීමෙක් (අනිත්‍යාදිය) සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිත බවෙක් කුශල බවෙක් නිපුණ බවෙක් විභාවනයෙක් චින්තාවෙක් උපපරීක්ෂාවෙක් භූරිප්‍රඥයෙක් ධාරණප්‍රඥයෙක් පරිණායිකාවෙක් විදර්ශනාවෙක් සම්‍යග්ඥානයෙක් (සිත විදර්ශනාවීථියට නඟන) පතොදයෙක් ප්‍රාඥයෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥබලයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥ ප්‍රාසාදයෙක් ප්‍රඥ ආලොකයෙක් ප්‍රඥවභාසයෙක් ප්‍රඥප්‍රද්‍යොතයෙක් ප්‍රඥ රත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි ප්‍රඥෙන්ද්‍රිය වේ.

293. කතමං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති.

294. කතමං තස්මිං සමයෙ සොමනස්සින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ සොමනස්සින්ද්‍රියං හොති.

295. කතමං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති?

යො තෙසං[1] අරූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති.

296. කතමං තස්මිං සමයෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං හොති?

යා තෙසං ධම්මානං අනඤ්ඤාතානං අදිට්ඨානං අප්පත්තානං අවිදිතානං අසච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං හොති.

297. කතමා තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති.

298. කතමො තස්මිං සමයෙ සම්මාසඞ්කප්පො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මාසඞ්කප්පො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාසඞ්කප්පො හොති.

1. යං තෙසං - සීමු.

293. කවරේක් එසමයෙහි මනින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් හෘදය (චිත්ත)යෙක් භවාඞ්ගචිත්තයෙක් මනසඞ්ඛ්‍යාත මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥාන-යෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද, මේ එසමයෙහි මනින්ද්‍රිය වේ.

294. කවරේක් එසමයෙහි සොමනස්සින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මිහිරි බවෙක් චෛතසික සුඛයෙක් චේතොසම්ඵස්සයෙන් උපන් සාතසුඛවේදයිතයෙක් චේතොසම්ඵස්සජ සාතසුඛවේදනායෙක් වේ ද, මේ එසමයෙහි සොමනස්සින්ද්‍රිය වේ.

295. කවරේක් එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වෙයි යත්:

ඒ අරූපීධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යපනයෙක් යැපීමෙක් ඉරියව් පැවැත්මෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රිය-යෙක් වේ ද, මේ එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වේ.

296. කවරේක් එසමයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය වෙයි යත්:

නො දත් විරූ නුදුටු විරූ නො පත් විරූ නුවණින් නො පාල කළ නො පසක් කළ ඒ සිවුසස් දහමුන්ගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ යම් ප්‍රඥයෙක් පජානනාකාරයෙක් විමසීමෙක් ප්‍රවිචයයෙක් (අනිත්‍යාදිය) සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණ-යෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරිප්‍රඥයෙක් ධාරණප්‍රඥයෙක් පරිණායිකා-වක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥයෙක් ප්‍රඥෙන්ද්‍රිය-යෙක් ප්‍රඥබලයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥප්‍රාසාදයෙක් ප්‍රඥආලොකයෙක් ප්‍රඥඅවභාසයෙක් ප්‍රඥප්‍රද්‍යොතයෙක් ප්‍රඥරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය වේ.

297. කවරක් එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, යම් ප්‍රඥයෙක් පජානනා-කාරයෙක් විමසීමෙක් ප්‍රවිචයයෙක් (අනිත්‍යාදිය) සැලැකීමෙක් උපලක්ෂණ-යෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරිප්‍රඥයෙක් ධාරණප්‍රඥයෙක් පරිණායිකාවක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥයෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥබලයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥප්‍රාසාදයෙක් ප්‍රඥ-ආලොකයෙක් ප්‍රඥ අවභාසයෙක් ප්‍රඥප්‍රද්‍යොතයෙක් ප්‍රඥරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වේ.

298. කවරේක් එසමයෙහි සම්‍යක්සංකල්ප වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ යම් තර්කයෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණායෙක් බලවත් අර්පණායෙක් චිත්තයාගේ අභිනිරො-පණයෙක් සම්‍යක් සංකල්පයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යක් සංකල්ප වේ.

299. කතමා තස්මිං සමයෙ සම්මාවාචා හොති?

යා තස්මිං සමයෙ චතූහි වචීදුච්චරිතෙහි ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො සම්මාවාචා මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාවාචා හොති.

300. කතමො තස්මිං සමයෙ සම්මාකම්මන්තො හොති?

යා තස්මිං සමයෙ තීහි කායදුච්චරිතෙහි ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො සම්මාකම්මන්තො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාකම්මන්තො හොති.

301. කතමො තස්මිං සමයෙ සම්මාආජීවො හොති?

යා තස්මිං සමයෙ මිච්ඡාආජීවා ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො සම්මාආජීවො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාආජීවො හොති.

302. කතමො තස්මිං සමයෙ සම්මාවායාමො හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තච්ඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො විරියසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාවායාමො හොති.

303. කතමා තස්මිං සමයෙ සම්මාසති හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාසති හොති.

304. කතමො තස්මිං සමයෙ සම්මාසමාධි හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාසමාධි හොති.

305. කතමං තස්මිං සමයෙ සද්ධාබලං හොති?

යා තස්මිං සමයෙ සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං, ඉදං තස්මිං සමයෙ සද්ධාබලං හොති.

299. කවරක් එසමයෙහි සම්මාවාචා වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, සතර වාග්දුශ්චරිතයෙන් යම් දුරුවීමෙක් විරතියෙක් පටිවිරතියෙක් විරමණයෙක් අක්‍රියායෙක් අකරණයෙක් නො පැමිණීමෙක් ආචාරසීමා නො ඉක්මැවීමෙක් ප්‍රත්‍යය සිඳීමෙක් සම්‍යග්වචනයෙක් වේ ද, මේ එසමයෙහි සම්මාවාචා වේ.

300. කවරෙක් එසමයෙහි සම්‍යක්කර්මාන්ත වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, ත්‍රිවිධ කායදුශ්චරිතයෙන් යම් දුරුවීමෙක් විරතියෙක් පටිවිරතියෙක් විරමණයෙක් අක්‍රියායෙක් අකරණයෙක් නො පැමිණීමෙක් සීමා නො ඉක්මැවීමෙක් ප්‍රත්‍යය සිඳීමෙක් සම්‍යක්කර්මාන්තයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යක්කර්මාන්ත වේ.

301. කවරෙක් එසමයෙහි සම්‍යගාජීව වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, මිථ්‍යා ආජීවයෙන් යම් දුරුවීමෙක් විරතියෙක් පටිවිරතියෙක් විරමණයෙක් අක්‍රියායෙක් අකරණයෙක් නො පැමිණීමෙක් සීමා නො ඉක්මැවීමෙක් ප්‍රත්‍යය සිඳීමෙක් සම්‍යක් ආජීවයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යගාජීව වේ.

302. කවරෙක් එසමයෙහි සම්‍යග්ව්‍යායාම වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, යම් චෛතසික වූ වීර්‍ය්‍යාරම්භයෙක් (කුසීත බැවින්) නික්මීමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් දෘඪ උත්සාහයෙක් දෘඪපරාක්‍රමයෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිරපරාක්‍රමයෙක් නො තැබූ ඡන්දය ඇති බවෙක් නො තැබූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් වීර්‍ය්‍යය දෘඪ වැ ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍ය බලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යග්ව්‍යායාම වේ.

303. කවරක් එසමයෙහි සම්‍යක්ස්මෘති වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් ප්‍රතිස්මෘතියෙක් සති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් අරමුණෙහි පිවිසෙන බවෙක් නො මුළා වන බවෙක් ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යක්ස්මෘති වේ.

304. කවරෙක් එසමයෙහි සම්‍යක්සමාධි වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, යම් චිත්තයාගේ සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුළ සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යක්සමාධි වේ.

305. කවරෙක් එසමයෙහි ශ්‍රද්ධාබල වෙයි යත්:

එසමයෙහි යම් ශ්‍රද්ධායෙක් හදහන අයුරෙක් (ගුණයෙහි) බැසැගැනීමෙක් අභිප්‍රසාදයෙක් ශ්‍රද්ධායෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයෙක් ශ්‍රද්ධාබලයෙක් වේ ද, මේ එසමයෙහි ශ්‍රද්ධාබල වේ.

306. කතමං තස්මිං සමයෙ විරියබලං හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො විරියසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ විරියබලං හොති.

307. කතමං තස්මිං සමයෙ සතිබලං හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සති-සම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ සතිබලං හොති.

308. කතමං තස්මිං සමයෙ සමාධිබලං හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ සමාධිබලං හොති.

309. කතමං තස්මිං සමයෙ පඤ්ඤාබලං හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියා-පන්නං, ඉදං තස්මිං සමයෙ පඤ්ඤාබලං හොති.

310. කතමං තස්මිං සමයෙ හිරිබලං හොති?

යං තස්මිං සමයෙ හිරීයති හිරියිතබ්බෙන හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං තස්මිං සමයෙ හිරිබලං හොති.

311. කතමං තස්මිං සමයෙ ඔත්තප්පබලං හොති?

යං තස්මිං සමයෙ ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං තස්මිං සමයෙ ඔත්තප්පබලං හොති.

306. කවරේක් එසමයෙහි වීර්‍ය්‍යබල වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ, යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් නිෂ්ක්‍රමයෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් දෘඪොත්සාහයෙක් දෘඪපරාක්‍රමයෙක් ධෘතියෙක් ස්ථිරපරාක්‍රමයෙක් අනික්ෂිප්තඡන්දතායෙක් අනික්ෂිප්තධුරතායෙක් ධුරසම්ප්‍රග්‍රාහයෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි වීර්‍ය්‍යබල වේ.

307. කවරේක් එසමයෙහි ස්මෘතිබල වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ, යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් ප්‍රතිස්මෘතියෙක් සති සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් අරමුණෙහි පිවිසෙන බවෙක් නො මුළා වන බවෙක් ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි ස්මෘතිබල වේ

308. කවරේක් එසමයෙහි සමාධිබල වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ, යම් චිත්තයාගේ සිටීමෙක් මොනවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂේපයෙක් නො විසුළ සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සමාධි බල වේ.

309. කවරේක් එසමයෙහි ප්‍රඥාබල වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍ය්‍යාපන්න වූ, යම් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් විචයෙක් ප්‍රවිචයෙක් ධර්මවිචයෙක් සංලක්ෂණයෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් පතල ප්‍රඥායෙක් ධාරණ-ප්‍රඥායෙක් පරිණායිකාවෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥා ආලොකයෙක් ප්‍රඥා අවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි ප්‍රඥාබල වේ.

310. කවරේක් එසමයෙහි හිරිබල වෙයි යත්:

එසමයෙහි යමෙකින් ලජ්ජාවියයුතු කායදුශ්චරිතාදිය ජුගුප්සා කෙරේ ද, ලාමක අකුශලධර්මයන්ගේ පැමිණීම ජුගුප්සා කෙරේ ද, මේ එසමයෙහි හිරිබල වේ.

311. කවරේක් එසමයෙහි ඔත්තප්පබල වෙයි යත්:

එසමයෙහි යමෙකින් තැවීමට කරුණු වූ කායදුශ්චරිතාදිය හේතුකොට බිය වේ ද, ලාමක වූ අකුශලධර්මයන්ගේ පැමිණීමෙන් බිය වේ ද, මේ එසමයෙහි ඔත්තප්පබල වේ.

312. කතමො තස්මිං සමයෙ අලොභො හොති?

යො තස්මිං සමයෙ අලොභො අලුබ්භනා අලුබ්භිතත්තං අසාරාගො අසාරජ්ජනා අසාරජ්ජිතත්තං අනභිජ්ඣා අලොභො කුසලමූලං, අයං තස්මිං සමයෙ අලොභො හොති.

313. කතමො තස්මිං සමයෙ අදොසො හොති?

යො තස්මිං සමයෙ අදොසො අදුස්සනා අදුස්සිතත්තං අව්‍යාපාදො අව්‍යාපජ්ජො අදොසො කුසලමූලං, අයං තස්මිං සමයෙ අදොසො හොති.

314. කතමො තස්මිං සමයෙ අමොහො හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ අමොහො හොති.

315. කතමා තස්මිං සමයෙ අනභිජ්ඣා හොති?

යො තස්මිං සමයෙ අලොභො අලුබ්භනා අලුබ්භිතත්තං අසාරාගො අසාරජ්ජනා අසාරජ්ජිතත්තං අනභිජ්ඣා අලොභො කුසලමූලං, අයං තස්මිං සමයෙ අනභිජ්ඣා හොති.

316 කතමො තස්මිං සමයෙ අව්‍යාපාදො හොති?

යො තස්මිං සමයෙ අදොසො අදුස්සනා අදුස්සිතත්තං අව්‍යාපාදො අව්‍යාපජ්ජො අදොසො කුසලමූලං, අයං තස්මිං සමයෙ අව්‍යාපාදො හොති.

317. කතමා තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති.

318. කතමා තස්මිං සමයෙ හිරි හොති?

යා තස්මිං සමයෙ හිරීයති හිරියිතබ්බෙන හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, අයං තස්මිං සමයෙ හිරි හොති.

312. කවරෙක් එසමයෙහි අලොභ වෙයි යත්:

එසමයෙහි යම් අලොභයෙක් අලොභාකාරයෙක් අලුබ්ධ බවෙක් නො ඇලීමෙක් නො ඇලෙන අයුරෙක් නො ඇලුණු බවෙක් අනභිධ්‍යායෙක් අලොභ සඞ්ඛ්‍යාත වූ කුශලමූලයෙක් වේ ද, මේ එසමයෙහි අලොභ වේ.

313. කවරෙක් එසමයෙහි අද්වෙෂ වෙයි යත්:

එසමයෙහි යම් අද්වෙෂයෙක් අද්වෙෂාකාරයෙක් අදුෂ්ට බවෙක් අව්‍යාපාදයෙක් නිදුක්බවෙක් අද්වෙෂසඞ්ඛ්‍යාත කුශලමූලයෙක් වේ ද, මේ එසමයෙහි අද්වෙෂ වේ.

314. කවරෙක් එසමයෙහි අමොහ වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, යම් ප්‍රඥාවෙක් ප්‍රකාරයෙන් දන්නා අයුරෙක් විමසීමෙක් ප්‍රකාරයෙන් විමසීමෙක් සිවුසස්දහම් විමසීමෙක් සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිත බවෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් භූරිප්‍රඥායෙක් ධාරණප්‍රඥායෙක් පරිණායිකාවක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් පතොද-යෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රද්‍යොත-යෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි අමොහ වේ.

315. කවරක් එසමයෙහි අනභිධ්‍යා වෙයි යත්:

එසමයෙහි යම් අලොභයෙක් අලොභාකාරයෙක් අලුබ්ධ බවෙක් නො ඇලීමෙක් නො ඇලෙන අයුරෙක් නො ඇලුණුබවෙක් අනභිධ්‍යායෙක් අලොභ සඞ්ඛ්‍යාත කුශලමූලයෙක් වේ ද, මේ එසමයෙහි අනභිධ්‍යා වේ.

316. කවරෙක් එසමයෙහි අව්‍යාපාද වෙයි යත්:

එසමයෙහි යම් අද්වෙෂයෙක් අද්වෙෂාකාරයෙක් අදුෂ්ට බවෙක් අව්‍යාපාදයෙක් නිදුක්බවෙක් අද්වෙෂසඞ්ඛ්‍යාත කුශලමූලයෙක් වේ ද, මේ එසමයෙහි අව්‍යාපාද වේ

317. කවරක් එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ, යම් ප්‍රඥාවෙක් ප්‍රජානනාකාරයෙක් විමසීමෙක් ප්‍රකාරයෙන් විමසීමෙක් සිවුසස් දහම් විමසීමෙක් අනිත්‍යාදි විසින් සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් වෛභව්‍යයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරිප්‍රඥායෙක් මේධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාආලොකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥා-ප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යග්දෘෂ්ටි වේ.

318. කවරක් එසමයෙහි හිරි වෙයි යත්:

එසමයෙහි යමෙකින් ලජ්ජාවියයුතු කායදුශ්චරිතාදිය ජුගුප්සා කෙරේ ද, ලාමක අකුශලධර්මයන්ගේ පැමිණීම ජුගුප්සා කෙරේ ද, මේ එසමයෙහි හිරි වේ.

319. කතමං තස්මිං සමයෙ ඔත්තප්පං හොති?

යං තස්මිං සමයෙ ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං තස්මිං සමයෙ ඔත්තප්පං හොති.

320. කතමා තස්මිං සමයෙ කායපස්සද්ධි හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස පස්සද්ධි පටිප්පස්සද්ධි පස්සම්භනා පටිප්පස්සම්භනා පටිප්පස්සම්භිතත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අයං තස්මිං සමයෙ කායපස්සද්ධි හොති.

321. කතමා තස්මිං සමයෙ චිත්තපස්සද්ධි හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස පස්සද්ධි පටිප්පස්සද්ධි පස්සම්භනා පටිප්පස්සම්භනා පටිප්පස්සම්භිතත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අයං තස්මිං සමයෙ චිත්තපස්සද්ධි හොති.

322. කතමා තස්මිං සමයෙ කායලහුතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස ලහුතා ලහුපරිණාමතා අදන්ධනතා අවිත්ථනතා, අයං තස්මිං සමයෙ කායලහුතා හොති.

323. කතමා තස්මිං සමයෙ චිත්තලහුතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස ලහුතා ලහුපරිණාමතා අදන්ධනතා අවිත්ථනතා, අයං තස්මිං සමයෙ චිත්තලහුතා හොති.

324. කතමා තස්මිං සමයෙ කායමුදුතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස මුදුතා මද්දවතා අකක්ඛලතා අකථිනතා, අයං තස්මිං සමයෙ කායමුදුතා හොති.

325. කතමා තස්මිං සමයෙ චිත්තමුදුතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස මුදුතා මද්දවතා අකක්ඛලතා අකථිනතා, අයං තස්මිං සමයෙ චිත්තමුදුතා හොති.

326. කතමා තස්මිං සමයෙ කායකම්මඤ්ඤතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවො, අයං තස්මිං සමයෙ කාය-කම්මඤ්ඤතා හොති.

327. කතමා තස්මිං සමයෙ චිත්තකම්මඤ්ඤතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවො, අයං තස්මිං සමයෙ චිත්තකම්මඤ්ඤතා හොති.

319. කවරෙක් එසමයෙහි ඔත්තප්ප වෙයි යත්:

එසමයෙහි යමෙකින් තැවීමට කරුණු වූ කායදුශ්චරිතාදිය හේතු කොට ගෙන ත්‍රාසත වේ ද, ලාමක වූ අකුශලධර්මයන්ගේ පැමිණීමෙන් ත්‍රාසත වේ ද, මේ එසමයෙහි ඔත්තප්ප (උත්ත්‍රාසත) වේ.

320. කවරක් එසමයෙහි කායප්‍රශ්‍රබ්ධි වෙයි යත්:

එසමයෙහි වෙදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් සන්හිඳීමෙක් වෙසෙසින් සන්හිඳීමෙක් සන්හිඳුණු අයුරෙක් වෙසෙසින් සන්හිඳුණු අයුරෙක් සන්හිඳුණු බවෙක් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍ය- ඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි කායප්‍රශ්‍රබ්ධි වේ.

321. කවරක් එසමයෙහි චිත්තප්‍රශ්‍රබ්ධි වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් සන්හිඳීමෙක් වෙසෙසින් සන්හිඳීමෙක් සන්හුන් අයුරෙක් වෙසෙසින් සන්හුන් අයුරෙක් සන්හුන් බවෙක් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි චිත්තප්‍රශ්‍රබ්ධි වේ.

322. කවරක් එසමයෙහි කායලඝුතා වෙයි යත්:

එසමයෙහි වෙදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් ලඝුතාවෙක් සුහු වැ පෙරළෙන බවෙක් නො බර බවෙක් නො තද බවෙක් වේ ද, මේ එසමයෙහි කායලඝුතා වේ.

323 කවරක් එසමයෙහි චිත්තලඝුතා වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් ලඝුතාවෙක් සුහු වැ පිරිවැටෙන බවෙක් නො බර බවෙක් නො තද බවෙක් වේ ද, මේ එසමයෙහි චිත්ත ලඝුතා වේ.

324. කවරක් එසමයෙහි කායමෘදුතා වෙයි යත්:

එසමයෙහි වෙදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් මෘදු බවෙක් මාර්දවයෙක් නො කැකුළු බවෙක් නො තද බවෙක් වේ ද, මේ එසමයෙහි කායමෘදුතා වේ.

325. කවරක් එසමයෙහි චිත්තමෘදුතා වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් මෘදු බවෙක් මාර්දවයෙක් නො කැකුළු බවෙක් නො තද බවෙක් වේ ද, මේ එසමයෙහි චිත්තමෘදුතා වේ.

326. කවරක් එසමයෙහි කායකර්මණ්‍යතා වෙයි යත්:

එසමයෙහි වෙදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් කර්මණ්‍යතාවෙක් කර්මණ්‍යත්වයෙක් කර්මණ්‍ය බවෙක් වේ ද, මේ එසමයෙහි කායකර්මණ්‍යතා වේ.

327. කවරක් එසමයෙහි චිත්තකර්මණ්‍යතා වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් කර්මණ්‍යතාවෙක් කර්මණ්‍යත්වයෙක් කර්මණ්‍ය බවෙක් වේ ද, මේ එසමයෙහි චිත්තකර්මණ්‍යතා වේ.

328. කතමා තස්මිං සමයෙ කායපාගුඤ්ඤතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස පගුණතා පගුණත්තං පගුණභාවො, අයං තස්මිං සමයෙ කායපාගුඤ්ඤතා හොති.

329. කතමා තස්මිං සමයෙ චිත්තපාගුඤ්ඤතා හොති?

යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස පගුණතා පගුණත්තං පගුණභාවො, අයං තස්මිං සමයෙ චිත්තපාගුඤ්ඤතා හොති.

330. කතමා තස්මිං සමයෙ කායුජ්ජුකතා හොති?

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස උජුතා උජ්ජුකතා අජිම්හතා අවඞ්කතා අකුටිලතා, අයං තස්මිං සමයෙ කායුජ්ජුකතා හොති.

331. කතමා තස්මිං සමයෙ චිත්තුජ්ජුකතා හොති?
යා තස්මිං සමයෙ විඤ්ඤාණක්ඛන්ධස්ස උජුතා උජ්ජුකතා අජිම්හතා අවඞ්කතා අකුටිලතා, අයං තස්මිං සමයෙ චිත්තුජ්ජුකතා හොති.

332. කතමා තස්මිං සමයෙ සති හොති?

යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අපම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සති හොති.

332. කතමං තස්මිං සමයෙ සම්පජඤ්ඤං හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං තස්මිං සමයෙ සම්පජඤ්ඤං හොති.

334. කතමො තස්මිං සමයෙ සමථො හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ සමථො හොති.

328. කවරක් එසමයෙහි කායප්‍රාගුණ්‍ය වෙයි යත්:

එසමයෙහි වේදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් ප්‍රගුණතායෙක් ප්‍රගුණත්වයෙක් ප්‍රගුණ (නො ගිලන්) බවෙක් වේ ද, මේ එසමයෙහි කායප්‍රාගුණ්‍ය වේ

329. කවරෙක් එසමයෙහි චිත්තප්‍රාගුණ්‍ය වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් ප්‍රගුණතායෙක් ප්‍රගුණත්වයෙක් ප්‍රගුණ බවෙක් වේ ද, මේ එසමයෙහි චිත්තප්‍රාගුණ්‍ය වේ.

330. කවරක් එසමයෙහි කායසෘජුතා වෙයි යත්:

එසමයෙහි වේදනාස්කන්ධයාගේ සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් සෘජුතායෙක් සෘජුත්වයෙක් අජිහ්මතායෙක් අවඞ්කතායෙක් අකුටිලතායෙක් වේ ද, මේ එසමයෙහි කායසෘජුතා වේ.

331. කවරක් එසමයෙහි චිත්තසෘජුතා වෙයි යත්:

එසමයෙහි විඥානස්කන්ධයාගේ යම් සෘජුතායෙක් සෘජුත්වයෙක් අජිහ්මතායෙක් අවඞ්කතායෙක් අකුටිලතායෙක් වේ ද, මේ එසමයෙහි චිත්තසෘජුතා වේ.

332. කවරක් එසමයෙහි සමාධි වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, යම් සමාධියෙක් අනුසමාධියෙක් ප්‍රතිසමාධියෙක් සමාධි සඞ්ඛ්‍යාත සිහි කරන අයුරෙක් දරන බවෙක් (අරමුණෙහි) පිවිසෙන බවෙක් නො මූලා වන බවෙක් සමාධියෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සමාධි වේ.

333. කවරෙක් එසමයෙහි සම්‍යග්ඥාන වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, යම් ප්‍රඥායෙක් ප්‍රජානනාකාරයෙක් විමසීමෙක් ප්‍රකාරයෙන් විමසීමෙක් සිවුසස් දහම් විමසීමෙක් සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් වෛභව්‍යයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරිප්‍රඥායෙක් මේධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතෝදයෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාලෝකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යෝතයෙක් ප්‍රඥාරත්නයෙක් අමෝහයෙක් ධර්‍මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධර්‍මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි සම්‍යග්ඥාන වේ.

334. කවරෙක් එසමයෙහි ශමථ වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂේපයෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි ශමථ වේ.

335. කතමා තස්මිං සමයෙ විපස්සනා හොති?

යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ විපස්සනා හොති.

336. කතමො තස්මිං සමයෙ පග්ගාහො හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තච්ඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො විරියසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ පග්ගාහො හොති.

337. කතමො තස්මිං සමයෙ අවික්ඛෙපො හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං තස්මිං සමයෙ අවික්ඛෙපො හොති.

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා කුසලා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, නවින්ද්‍රියානි හොන්ති, පඤ්චඞ්ගිකං ඣානං හොති, අට්ඨඞ්ගිකො මග්ගො හොති, සත්ත බලානි හොන්ති, තයො හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, එකා වෙදනා හොති, එකා සඤ්ඤා හොති, එකා චෙතනා හොති, එකං චිත්තං හොති, එකො වෙදනාක්ඛන්ධො හොති, එකො සඤ්ඤාක්ඛන්ධො හොති, එකො සඞ්ඛාරක්ඛන්ධො හොති, එකො විඤ්ඤාණක්ඛන්ධො හොති, එකං මනායතනං හොති, එකං මනින්ද්‍රියං හොති, එකා මනොවිඤ්ඤාණධාතු හොති, එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා කුසලා.

335. කවරක් එසමයෙහි විදර්ශනා වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, යම් ප්‍රඥාවෙක් ප්‍රජානනාකාරයෙක් විමසීමෙක් ප්‍රකාරයෙන් විමසීමෙක් සියුසස් දහම් විමසීමෙක් සැලැකීමෙක් උපලක්‍ෂණයෙක් ප්‍රත්‍යුපලක්‍ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් වෛභව්‍යයෙක් චින්තායෙක් උපපරීක්‍ෂායෙක් භූරිප්‍රඥාවයෙක් මෙධායෙක් පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාආලොකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධම්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධම්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි විදර්ශනා වේ.

336. කවරෙක් එසමයෙහි ප්‍රග්‍රාහ වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, යම් චෛතසික වීර්‍යාරම්භයෙක් (කුසීත බැවින්) නික්මීමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් දෘඪොත්සාහයෙක් දෘඪපරාක්‍රමයෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිර පරාක්‍රමයෙක් නො නැමූ ඡන්දය ඇති බවෙක් නො නැමූ වීර්‍යධුර ඇති බවෙක් වීර්‍යධුරය දැඩි ව ගැන්මෙක් වීර්‍යයෙක් වීර්‍යෙන්ද්‍රියයෙක් වීර්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වීර්‍යසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි ප්‍රග්‍රාහ වේ.

337. කවරෙක් එසමයෙහි අවික්ෂේප වෙයි යත්:

එසමයෙහි මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ, චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක් සමාධියෙක් සමාධිසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එසමයෙහි අවික්ෂෙප වේ.

එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් වෙත් නම්, මේ ධර්මයෝ කුශලයෝ යි.

තවද එසමයෙහි සතර ස්කන්ධ කෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ නව දෙනෙක් වෙති, පඤ්චාඞ්ගික ධ්‍යානය වෙයි, අෂ්ටාඞ්ගිකමාර්ගය වෙයි, සප්තබල කෙනෙක් වෙති, හෙතූහු තිදෙනෙක් වෙති, එක් ස්පර්ශයෙක් වෙයි, එක් වෙදනායෙක් වෙයි, එක් සංඥායෙක් වෙයි, එක් චේතනායෙක් වෙයි, එක් චිත්තයෙක් වෙයි, එක් වේදනාස්කන්ධයෙක් වෙයි, එක් සංඥාස්කන්ධයෙක් වෙයි, එක් සංස්කාරස්කන්ධයෙක් වෙයි, එක් විඥානස්කන්ධයෙක් වෙයි, එක් මැ මනායතනය වෙයි, එක් මනින්ද්‍රියයෙක් වෙයි, එක් මනෝවිඥානධාතුයෙක් වෙයි, එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් වෙත් නම්, මේ ධර්මයෝ කුශලයෝ යි.

338. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං[1] සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ජීවිතින්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං අලොභො අදොසො අමොහො අනභිජ්ඣා අබ්‍යාපාදො සම්මාදිට්ඨි හිරි[2] ඔත්තප්පං කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා සති සම්පජඤ්ඤං සමථො විපස්සනා පග්ගාහො අවික්ඛෙපො, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං - අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති. -පෙ- ඉමෙ ධම්මා කුසලා.

339. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං[3] අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා*.

340. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං[4] ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

341. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛාපටිපදං[5] දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

342. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං[3] අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛාපටිපදා[5] ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා

---

1 විරියින්ද්‍රිය - මජසං

2 හිරී - මජසං.

3. නියානිකං - සීමු 1, 3.

4. දුක්ඛපටිපදං මජසං

5. සුඛපටිපදං - මජසං.

* අයං වාරො මජසං පොත්ථකෙ න දිස්සතෙ.

338. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය ප්‍රීති ය චිත්තෛකාග්‍රතා ය ශ්‍රද්ධෙන්ද්‍රිය ය වීර්යෙන්ද්‍රිය ය ස්මෘතීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ප්‍රඥෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය අනඤ්ඤාතඤ්ඤස්සාමීතීන්ද්‍රිය ය සම්‍යග්දෘෂ්ටි ය සම්‍යක්-සංකල්ප ය සම්‍යග්වාචා ය සම්‍යක්කර්මාන්ත ය සම්‍යක්-ආජීව ය සම්‍යග්-ව්‍යායාම ය සම්‍යක්ස්මෘති ය සම්‍යක්සමාධි ය ශ්‍රද්ධාබල ය වීර්යබල ය ස්මෘතිබල ය සමාධිබල ය ප්‍රඥාබල ය හිරිබල ය ඔත්තප්පබල ය අලෝභ ය අද්වේෂ ය අමෝහ ය අනභිධ්‍යා ය අව්‍යාපාද ය සම්‍යග්දෘෂ්ටි ය හිරි ය ඔත්තප්ප ය කායප්‍රශ්‍රබ්ධි ය චිත්තප්‍රශ්‍රබ්ධි ය කායලඝුතා ය චිත්තලඝුතා ය කායමෘදුතා ය චිත්තමෘදුතා ය කායකර්මණ්‍යතා ය චිත්තකර්මණ්‍යතා ය කායප්‍රාගුණ්‍යතා ය චිත්තප්‍රාගුණ්‍යතා ය කායර්ජුතා ය චිත්තර්ජුතා ය ස්මෘති ය සම්‍යග්ඥාන ය ශමථ ය විදර්ශනා ය ප්‍රග්‍රාහ ය අවික්ෂේප යි, නවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූද ප්‍රතීත්‍ය සමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් වෙද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ... මේ ධර්මයෝ කුශලයෝ යි.

339. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ස්‍රෝතාපත්තිඵල සඞ්ඛ්‍යාත ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ (ච්‍යුතිප්‍රතිසන්ධි නසමින් යන) ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

340. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ස්‍රෝතාපත්තිඵල සඞ්ඛ්‍යාත ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ. ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

341. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ස්‍රෝතාපත්තිඵල සඞ්ඛ්‍යාත ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... සුඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

342. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ස්‍රෝතාපත්තිඵල සඞ්ඛ්‍යාත වූ ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... සුඛප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

343. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං[1] දන්ධාභිඤ්ඤං -පෙ- දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං -පෙ- සුඛාපටිපදං[2] දන්ධාභිඤ්ඤං -පෙ- සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

සුද්ධිකපටිපදා.

[සුඤ්ඤතං]

344. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඤ්ඤතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

345. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං[3] -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති සුඤ්ඤතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

සුඤ්ඤතං.

[සුඤ්ඤත මූලක පටිපදා]

346. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

347. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඤ්ඤතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

1. දුක්ඛාපටිපදා - මජසං. 2. සුඛාපටිපදා - මජසං 3. පඨමං ඣානං - සීමු. 3. ඌනං.

343. කවර ධර්මයෝ කුසල්හු යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ස්‍රොතාපත්තිඵල සඞ්ඛ්‍යාත ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... දුඃඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද ... දුඃඛ ප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ ... සුඛප්‍රතිපද ඇති දන්ධාභිඥ වූ ... සුඛප්‍රතිපද ඇති ක්ෂිප්‍රාභිඥ වූ (පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද,) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

සුද්ධිකපටිපදා යි.

[ශූන්‍යතය]

344. කවරධර්මයෝ කුසල්හු යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... ශූන්‍යත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

345. කවර ධර්මයෝ කුසල්හු යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තර ධ්‍යානය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්සිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... ශූන්‍යතපඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

ශූන්‍යත යි.

[ශූන්‍යත මූලකප්‍රතිපද]

346. කවර ධර්මයෝ කුසල්හු යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

347. කවර ධර්මයෝ කුසල්හු යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ ශූන්‍යත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

348. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

349. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඤ්ඤතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො -පෙ- ඉමෙ ධම්මා කුසලා.

350. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං[1] -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං -පෙ- දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඤ්ඤතං -පෙ- සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං -පෙ- සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඤ්ඤතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

සුඤ්ඤත මූලක පටිපදා.

[අප්පණිහිතං]

351. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති අප්පණිහිතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

352. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති අප්පණිහිතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

අප්පණිහිතං.

1. පඨමං ඣානං - ඌනං. සීමු 3.

348. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙකැ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමි වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් වම ... සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ශූන්‍යතප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ .... මේ ධර්මයෝ කුශලයෝ යි.

349. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙකැ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමි වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ ශූන්‍යතප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි .... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

350 කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙකැ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමි වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... දුඃඛප්‍රතිපත් ඇති, දන්ධාභිඥ වූ ශූන්‍යත පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ ශූන්‍යත වූ ... සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ශූන්‍යත වූ ... සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ ශූන්‍යත වූ පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

ශූන්‍යතමූලක ප්‍රතිපදා යි.

[අප්‍රණිහිතය]

351. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙකැ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථම භූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමි වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... අප්‍රණිහිත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

352. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙකැ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමි වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... අප්‍රණිහිත පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

අප්‍රණිහිතය යි.

## [අප්පණිහිත මූලකපටිපදා]

353. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

354. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පණිහිතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

355. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා

356. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පණිහිතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

357. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං -පෙ- දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පණිහිතං -පෙ- සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං -පෙ- සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පණිහිතං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

අප්පණිහිත මූලක පටිපදා.

[අප්‍රණිහිත මූලක ප්‍රතිපදා]

353 කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ අප්‍රණිහිත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

354. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රණිහිත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

355. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ අප්‍රණිහිත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ...අවික්ෂේපය වේ... මේ ධර්මයෝ කුශලයෝ යි.

356. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමායන්ගෙන් වෙන් ව ම ... සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රණිහිත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

357. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට .... ප්‍රථමධ්‍යානයට ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ අප්‍රණිහිත පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රණිහිත වූ ... සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ අප්‍රණිහිත වූ ... සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥ වූ අප්‍රණිහිත වූ (පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද,) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ. ... මේ ධර්මයෝ කුශලයෝ යි.

අප්‍රණිහිතමූලක ප්‍රතිපදා යි.

[විසතිමහානයා]

358. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං මග්ගං භාවෙති -පෙ- ලොකුත්තරං සති-පට්ඨානං භාවෙති -පෙ- ලොකුත්තරං සම්මප්පධානං භාවෙති -පෙ- ලොකුත්තරං ඉද්ධිපාදං භාවෙති -පෙ- ලොකුත්තරං ඉන්ද්‍රියං භාවෙති -පෙ- ලොකුත්තරං බලං භාවෙති -පෙ- ලොකුත්තරං බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- ලොකුත්තරං සච්චං භාවෙති -පෙ- ලොකුත්තරං සමථං භාවෙති -පෙ- ලොකුත්තරං ධම්මං භාවෙති -පෙ- ලොකුත්තරං ඛන්ධං භාවෙති -පෙ- ලොකුත්තරං ආයතනං භාවෙති -පෙ- ලොකුත්තරං ධාතුං භාවෙති -පෙ- ලොකුත්තරං ආහාරං භාවෙති -පෙ- ලොකුත්තරං ඵස්සං භාවෙති -පෙ- ලොකුත්තරං වෙදනං භාවෙති -පෙ- ලොකුත්තරං සඤ්ඤං භාවෙති -පෙ- ලොකුත්තරං චෙතනං භාවෙති -පෙ- ලොකුත්තරං චිත්තං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

විසතිමහානයා.

[අධිපති පඨමො මග්ගො]

359. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

360. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

[විශුද්ධමහානය]

358 කවර ධර්මයෝ කුසල්හු යත්:

යම් කලෙකැ ලොකොත්තර වූ මාර්ගය වඩා ද ... ලොකොත්තර වූ සතිපට්ඨානය වඩා ද ලොකොත්තර වූ සම්‍යක්ප්‍රධානය වඩා ද... ලොකොත්තර වූ ඍද්ධිපාදය වඩා ද ... ලොකොත්තර වූ ඉන්ද්‍රිය වඩා ද ... ලොකොත්තර වූ බලය වඩා ද ... ලොකොත්තර වූ බොධ්‍යඞ්ගය වඩා ද ... ලොකොත්තර වූ සත්‍යය වඩා ද ... ලොකොත්තර වූ ශමථය වඩා ද ... ලොකොත්තර වූ ධර්මය වඩා ද ... ලොකොත්තර වූ ස්කන්ධය වඩා ද ... ලොකොත්තර වූ ආයතනය වඩා ද... ලොකොත්තර වූ ධාතු වඩා ද... ලොකොත්තර වූ ආහාරය වඩා ද... ලොකොත්තර වූ ස්පර්ශය වඩා ද ... ලොකොත්තර වූ වේදනාව වඩා ද ... ලොකොත්තර වූ සංඥාව වඩා ද ... ලොකොත්තර වූ චෙතනාව වඩා ද ... දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තර චිත්තය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

විශුද්ධ මහානය යි.

[අධිපති ප්‍රථමමාර්ගය]

359. කවර ධර්මයෝ කුසල්හු යත්:

යම් කලෙකැ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ඡන්දය අධිපති කොට ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති (ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද) එසමයෙහි ස්පර්ශය වෙයි. ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

360. කවර ධර්මයෝ කුසල්හු යත්:

යම් කලෙකැ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්‍යාණික වූ අපචයගාමී වූ ලොකොත්තරධ්‍යානය වඩා ද, විතර්කවිචාරයන්ගේ සංසිඳීමෙන් ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ඡන්දය අධිපති කොට ඇති පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති (පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද,) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

361. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං මග්ගං භාවෙති -පෙ- ලොකුත්තරං සතිපට්ඨානං භාවෙති -පෙ- ලොකුත්තරං සම්මප්පධානං භාවෙති -පෙ- ලොකුත්තරං ඉද්ධිපාදං භාවෙති -පෙ- ලොකුත්තරං ඉන්ද්‍රියං භාවෙති -පෙ- ලොකුත්තරං බලං භාවෙති -පෙ- ලොකුත්තරං බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- ලොකුත්තරං සච්චං භාවෙති -පෙ- ලොකුත්තරං සමථං භාවෙති -පෙ- ලොකුත්තරං ධම්මං භාවෙති -පෙ- ලොකුත්තරං ඛන්ධං භාවෙති -පෙ- ලොකුත්තරං ආයතනං භාවෙති -පෙ- ලොකුත්තරං ධාතුං භාවෙති -පෙ- ලොකුත්තරං ආහාරං භාවෙති -පෙ- ලොකුත්තරං ඵස්සං භාවෙති -පෙ- ලොකුත්තරං වෙදනං භාවෙති -පෙ- ලොකුත්තරං සඤ්ඤං භාවෙති -පෙ- ලොකුත්තරං චෙතනං භාවෙති -පෙ- ලොකුත්තරං චිත්තං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං ඡන්දාධිපතෙය්‍යං -පෙ- විරියාධිපතෙය්‍යං -පෙ- චිත්තාධිපතෙය්‍යං -පෙ- වීමංසාධිපතෙය්‍යං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

අධිපති පඨමො මග්ගො.

362. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං කාමරාගබ්‍යාපාදානං තනුභාවාය දුතියාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අඤ්ඤින්ද්‍රියං හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

දුතියො මග්ගො.

363. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං කාමරාගබ්‍යාපාදානං අනවසෙසප්පහානාය තතියාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අඤ්ඤින්ද්‍රියං හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

තතියො මග්ගො.

364. කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං රූපරාගඅරූපරාගමානඋද්ධච්චඅවිජ්ජාය අනවසෙසප්පහානාය චතුත්ථාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අඤ්ඤින්ද්‍රියං හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා කුසලා.

361, කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක ලෝකෝත්තර වූ මාර්ගය වඩා ද ... ලොකොත්තර වූ සතිපට්ඨානය වඩා ද ... ලෝකෝත්තර වූ සම්‍යක්ප්‍රධානය වඩා ද... ලෝකෝත්තර වූ ඍද්ධිපාදය වඩා ද ... ලෝකෝත්තර වූ ඉන්ද්‍රිය වඩා ද ... ලෝකෝත්තර වූ බලය වඩා ද ... ලෝකෝත්තර වූ බොධ්‍යඞ්ගය වඩා ද ... ලෝකෝත්තර වූ සත්‍යය වඩා ද ... ලෝකෝත්තර වූ ශමථය වඩා ද ... ලෝකෝත්තර වූ ධර්මය වඩා ද ... ලෝකෝත්තර වූ සකන්ධය වඩා ද ... ලෝකෝත්තර වූ ආයතනය වඩා ද ... ලෝකෝත්තර වූ ධාතු වඩා ද... ලෝකෝත්තර වූ ආහාරය වඩා ද ... ලෝකෝත්තර වූ ස්පර්ශය වඩා ද ... ලෝකෝත්තර වූ වේදනාව වඩා ද ... ලෝකෝත්තර වූ සංඥාව වඩා ද ... ලෝකෝත්තර වූ චේතනාව වඩා ද ... දෘෂ්ටීනයන්ගේ ප්‍රහාණය පිණිස ප්‍රථමභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ ලොකොත්තර චිත්තය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ඡන්දය අධිපති කොට ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද ... වීර්‍ය්‍ය අධිපති කොට ඇති ... චිත්තය අධිපති කොට ඇති ... විමංසාව අධිපති කොට ඇති (ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද) එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

අධිපති ප්‍රථමමාර්ගය යි.

362. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙකැ කාමරාගව්‍යාපාදයන්ගේ තුනීබව පිණිස ද්විතීයභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් වූ දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකලැ ස්පර්ශය වෙයි ... අඤ්ඤින්ද්‍රිය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

ද්විතීයමාර්ගය යි.

363. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙක කාමරාගව්‍යාපාදයන්ගේ අනවශේෂප්‍රහාණය පිණිස තෘතීයභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ ලොකොත්තර ධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකල්හි ස්පර්ශය වෙයි ... අඤ්ඤින්ද්‍රිය වෙයි ... අවික්ෂෙපය වේ. ... මේ ධර්මයෝ කුශලයෝ යි.

තෘතීය මාර්ගය යි.

364. කවර ධර්මයෝ කුසල්හ යත්:

යම් කලෙකැ රූපරාග - අරූපරාග - මාන - ඖද්ධත්‍ය - අවිද්‍යාවගේ අනවශේෂප්‍රහාණය පිණිස චතුර්ථභූමියට පැමිණීම පිණිස නෛර්යාණික වූ අපචයගාමී වූ ලෝකෝත්තරධ්‍යානය වඩා ද, කාමයන්ගෙන් වෙන් ව ම ... දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥ වූ ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එකලැ ස්පර්ශය වෙයි ... අඤ්ඤින්ද්‍රිය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ කුශලයෝ යි.

365. කතමං තස්මිං සමයෙ අඤ්ඤින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ තෙසං ධම්මානං අඤ්ඤාතානං දිට්ඨානං පත්තානං විදිතානං සච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤා-පාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ග-පරියාපන්නං, ඉදං තස්මිං සමයෙ අඤ්ඤින්ද්‍රියං හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා කුසලා.

චතුත්ථො මග්ගො

ලොකුත්තරං චිත්තං.

[ද්වාදස අකුසලචිත්තානි.]

366 කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, මිච්ඡාදිට්ඨි හොති, මිච්ඡාසඞ්කප්පො හොති, මිච්ඡාවායාමො හොති, මිච්ඡාසමාධි හොති, විරියබලං හොති, සමාධිබලං හොති, අහිරිබලං[1] හොති, අනොත්තප්පබලං හොති, ලොභො හොති, මොහො හොති, අභිජ්ඣා හොති, මිච්ඡාදිට්ඨි හොති, අහිරිකං හොති, අනොත්තප්පං හොති, සමථො හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

367 කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

368. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතො-සම්ඵස්සජා සාතා සුඛා වෙදනා, අයං තස්මිං සමයෙ වෙදනා හොති.

1. අහිරිකබලං - සීමු.

365. කවරෙක් එසමයෙහි අඤ්ඤින්ද්‍රිය වෙයි යත්:

(පලමු මගින්) දන්නා ලද දක්නා ලද අධිගම කරන ලද ප්‍රකට කරන ලද ප්‍රත්‍යක්ෂ කරන ලද ඒ ධර්මයන්ගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස මාර්ගාඞ්ග වූ මාර්ගපර්යාපන්න වූ යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් විචයයෙක් ප්‍රවිචයයෙක් ධර්මවිචයයෙක් සංලක්ෂණයෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් වෛභව්‍යයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරිප්‍රඥයෙක් මේධායෙක් පරිණායිකාවක් විදර්ශනායෙක් සම්‍යග් ඥානයෙක් ප්‍රතොදයෙක් ප්‍රඥයෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥබලයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥප්‍රාසාදයෙක් ප්‍රඥආලෝකයෙක් ප්‍රඥඅවභාසයෙක් ප්‍රඥප්‍රද්‍යෝතයෙක් ප්‍රඥරත්නයෙක් අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යක්දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ එකල්හි අඤ්ඤින්ද්‍රිය වෙයි. ... අවික්ෂෙපය වේ ... තවද එකලැ අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇත් ද, මේ ධර්මයෝ කුශලයෝ යි.

චතුර්ථමාර්ගය යි.

ලෝකෝත්තරචිත්තය යි.

[දෙලොස් අකුසල්සිත්]

366. කවර ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි ශබ්දාලම්බන වේවයි ගන්ධාලම්බන වේවයි රසාලම්බන වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ධර්මාලම්බන වේවයි යම් යම් අරමුණෙකැ හෝ එල්බැ සොමනස් සහගත වූ දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වූ අකුශලචිත්තය උපන්නේ වේ ද, එකලැ ස්පර්ශය වෙයි. වෙදනාව වෙයි. සංඥව වෙයි චෙතනාව වෙයි. චිත්තය වෙයි. විතර්කය වෙයි විචාරය වෙයි. ප්‍රීතිය වෙයි. සුඛය වෙයි. චිත්තෛකාග්‍රතාව වෙයි. වීර්යෙන්ද්‍රිය වෙයි. සමාධීන්ද්‍රිය වෙයි. මනින්ද්‍රිය වෙයි. සෞමනස්සින්ද්‍රිය වෙයි. ජීවිතෙන්ද්‍රිය වෙයි. මිථ්‍යාදෘෂ්ටිය වෙයි. මිථ්‍යාසඞ්කල්පය වෙයි. මිථ්‍යාව්‍යායාමය වෙයි. මිථ්‍යාසමාධිය වෙයි. වීර්යබලය වෙයි. සමාධිබලය වෙයි. අහිරිකබලය වෙයි. අනොත්තප්පබලය වෙයි. ලෝභය වෙයි. මෝහය වෙයි. අභිධ්‍යාව වෙයි. මිථ්‍යාදෘෂ්ටිය වෙයි. අහිරිකය වෙයි. අනොත්තප්පය වෙයි. ශමථය වෙයි. ප්‍රග්‍රාහය වෙයි. අවික්ෂෙපය වෙයි. තවද එකලැ අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් වෙත් නම්, මේ ධර්මයෝ කුශලයෝ යි.

367. කවරෙක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එ සමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශනාකාරයෙක් සංස්පර්ශනාකාරයෙක් සංස්පර්ශිතත්වයෙක් වේ ද, එකලැ මේ ස්පර්ශය වේ.

368. කවරක් එසමයෙහි වෙදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප මනොවිඥනධාතුසංස්පර්ශයෙන් උපන් චෛතසික වූ යම් මිහිරි බවෙක් චෛතසික සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාත සුඛ වේදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාත සුඛ වෙදනායෙක් වේ ද, මේ එසමයෙහි වේදනා වේ.

369. කතමා තස්මිං සමයෙ සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං තස්මිං සමයෙ සඤ්ඤා හොති.

370. කතමා තස්මිං සමයෙ චෙතනා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං[1], අයං තස්මිං සමයෙ චෙතනා හොති

371. කතමං තස්මිං සමයෙ චිත්තං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං තස්මිං සමයෙ චිත්තං හොති.

372. කතමො තස්මිං සමයෙ විතක්කො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා මිච්ඡාසඞ්කප්පො, අයං තස්මිං සමයෙ විතක්කො හොති.

373. කතමො තස්මිං සමයෙ විචාරො හොති?

යො තස්මිං සමයෙ චාරො විචාරො අනුවිචාරො උපවිචාරො චිත්තස්ස අනුසන්ධානතා අනුපෙක්ඛනතා, අයං තස්මිං සමයෙ විචාරො හොති.

374. කතමා තස්මිං සමයෙ පීති හොති?

යා තස්මිං සමයෙ පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස, අයං තස්මිං සමයෙ පීති හොති.

375. කතමං තස්මිං සමයෙ සුඛං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ සුඛං හොති.

376. කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං මිච්ඡාසමාධි, අයං තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති.

---

1. සංචෙතයිතත්තං - සයා

369. කවරක් එසමයෙහි සංඥා වෙයි යත්:

එසමයෙහි තදනුරූප මනොවිඥානධාතුසංස්පර්ශයෙන් උපන් යම් සංඥාවක් සංජානනාකාරයෙක් සඤ්ජානිතබවෙක් වේ ද, මේ එසමයෙහි සංඥා වේ.

370. කවරක් එසමයෙහි චෙතනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප මනොවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් චේතනාවක් සංචේතනාවක් සිතනලදබවෙක් වේ ද, මේ එසමයෙහි චේතනා වේ.

371. කවරෙක් එසමයෙහි චිත්ත වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් හෘදයෙක් භාවාංග චිත්තයෙක්, මනසක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥාන-ස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුවයක් වේ ද, මේ එසමයෙහි චිත්ත වේ.

372. කවරෙක් එසමයෙහි විතර්ක වෙයි යත්:

එසමයෙහි යම් තර්කයෙක් විතර්කයෙක් සඞ්කල්පයෙක් අර්පණායෙක් ව්‍යර්පණායෙක් සිතට නහාලීමෙක් මිථ්‍යාසඞ්කල්පයෙක් වේ ද, මේ එසම-යෙහි විතර්ක වේ.

373 කවරෙක් එසමයෙහි විචාර වෙයි යත්:

එසමයෙහි යම් (අරමුණෙහි) හැසිරීමෙක් විචාරයෙක් අනුවිචාරයෙක් උපවිචාරයෙක් චිත්තයාගේ (අරමුණෙහි සිත) ගලපනබවෙක් අනුප්‍රෙක්ෂණ-තායෙක් වේ ද, මේ එසමයෙහි විචාර වේ.

374. කවරක් එසමයෙහි ප්‍රීති වෙයි යත්:

එසමයෙහි යම් ප්‍රීතියෙක් ප්‍රාමොද්‍යයෙක් ආමොදනාකාරයෙක් ප්‍රමො-දනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් ප්‍රීතිධනයෙක් ඔදවැඩිබවෙක් චිත්ත-යාගේ සතුටුබවෙක් වේ ද, මේ එසමයෙහි ප්‍රීති වේ.

375. කවරෙක් එසමයෙහි සුඛ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මිහිරිබවෙක් චෛතසික සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාත සුඛ වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාත සුඛ වේදනායෙක් වේ ද, මේ එසමයෙහි සුඛ වේ.

376. කවරක් එසමයෙහි චිත්තෛකාග්‍රතා වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැස-ගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසිරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් මිථ්‍යාසමාධියෙක් වේ ද, මේ එසමයෙහි චිත්තෛකාග්‍රතා වේ.

377. කතමං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තච්ඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං මිච්ඡාවායාමො, ඉදං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති.

378. කතමං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං මිච්ඡාසමාධි, ඉදං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති.

379. කතමං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං, මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු, ඉදං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති.

380. කතමං තස්මිං සමයෙ සොමනස්සින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ සොමනස්සින්ද්‍රියං හොති.

381. කතමං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති?

යං තෙසං අරූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති.

382. කතමා තස්මිං සමයෙ මිච්ඡාදිට්ඨි හොති?

යා තස්මිං සමයෙ දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං[1] දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො[2] අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො,[3] අයං තස්මිං සමයෙ මිච්ඡාදිට්ඨි හොති.

383. කතමො තස්මිං සමයෙ මිච්ඡාසඞ්කප්පො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා මිච්ඡාසඞ්කප්පො, අයං තස්මිං සමයෙ මිච්ඡාසඞ්කප්පො හොති.

1. දිට්ඨිවිසූකායිතං - සීමු 1, 2, 2. පටිග්ගාහො - සීමු 3, - මජසං, PTS.
3. විපරියාසග්ගාහො - මජසං. විපරියෙසග්ගාහො සහා.

377. කවරේක් එසමයෙහි විරියින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ වීර්‍ය්‍යාරම්භයෙක් නිෂ්ක්‍රමයෙක් පරක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් දෘඪපරාක්‍රමයෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිර පරාක්‍රමිතායෙක් නො තැබූ ඡන්දය ඇති බවක් නො තැබූ ධුර ඇති බවක් වැර දැඩි වැ ගැන්මක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් මිථ්‍යාව්‍යායාමයෙක් වේ ද, මේ එසමයෙහි විරියින්ද්‍රිය වේ.

378. කවරේක් එසමයෙහි සමාධීන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසිරුණු සිත ඇති බවක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් මිථ්‍යාසමාධියෙක් වේ ද, මේ එසමයෙහි සමාධීන්ද්‍රිය වේ.

379. කවරේක් එසමයෙහි මනින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් හෘදයෙක් භවාඞ්ගචිත්තයෙක්, මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද, මේ එසමයෙහි මනින්ද්‍රිය වේ.

380. කවරේක් එසමයෙහි සොමනස්සින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ මිහිරිබවෙක් චෛතසික සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාත සුඛ වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාත සුඛ වේදනායෙක් වේ ද, මේ එසමයෙහි සොමනස්සින්ද්‍රිය වේ.

381. කවරේක් එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වෙයි යත්:

ඒ අරූපිධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යපනයෙක් යාපනයෙක් ඉරියව් පැවැත්මෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වේ.

382. කවරක් එසමයෙහි මිථ්‍යාදෘෂ්ටි වෙයි යත්:

එසමයෙහි යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලොමදෘෂ්ටියෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයොජනයෙක් ග්‍රාහයෙක් පිහිටා සිටීමෙක් (නිත්‍යාදිවශයෙන්) අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ එසමයෙහි මිථ්‍යාදෘෂ්ටි වේ.

383. කවරේක් එසමයෙහි මිථ්‍යාසඞ්කල්ප වෙයි යත්:

එසමයෙහි යම් තර්කයෙක් විතර්කයෙක් සඞ්කල්පයෙක් අර්පණයෙක් බලවත් අර්පණයෙක් චිත්තයාගේ අභිනිරොපණයෙක් මිථ්‍යාසංකල්පයෙක් වේ ද, මේ එසමයෙහි මිථ්‍යාසඞ්කල්ප වේ.

384. කතමො තස්මිං සමයෙ මිච්ඡාවායාමො හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තච්ඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං මිච්ඡාවායාමො, අයං තස්මිං සමයෙ මිච්ඡාවායාමො හොති.

385. කතමො තස්මිං සමයෙ මිච්ඡාසමාධි හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං මිච්ඡාසමාධි, අයං තස්මිං සමයෙ මිච්ඡාසමාධි හොති.

386. කතමං තස්මිං සමයෙ විරියබලං හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තච්ඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං මිච්ඡාවායාමො, ඉදං තස්මිං සමයෙ විරියබලං හොති.

387. කතමං තස්මිං සමයෙ සමාධිබලං හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං මිච්ඡාසමාධි, ඉදං තස්මිං සමයෙ සමාධිබලං හොති.

388. කතමං තස්මිං සමයෙ අහිරිකබලං හොති?

යං තස්මිං සමයෙ න හිරීයති හිරීයිතබ්බෙන, න හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං තස්මිං සමයෙ අහිරිකබලං හොති.

389. කතමං තස්මිං සමයෙ අනොත්තප්පබලං හොති?

යං තස්මිං සමයෙ න ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන, න ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං තස්මිං සමයෙ අනොත්තප්පබලං හොති.

390. කතමො තස්මිං සමයෙ ලොභො හොති?

යො තස්මිං සමයෙ ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං සාරාගො සාරජ්ජනා සාරජ්ජිතත්තං අභිජ්ඣා ලොභො අකුසලමූලං, අයං තස්මිං සමයෙ ලොභො හොති.

384. කවරෙක් එසමයෙහි මිථ්‍යාව්‍යායාම වෙයි යත්:

එසමයෙහි යම් චෛතසිකවීර්‍ය්‍යාරම්භයෙක් නිෂ්ක්‍රමයෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් ස්ථිරභාවයෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිරපරාක්‍රමතායෙක් නො තැබූ ඡන්දය ඇතිබවෙක් නො තැබූ වීර්‍ය්‍යධුර ඇතිබවෙක් වීර්‍ය්‍ය දැඩි වැ ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් මිථ්‍යාව්‍යායාමයෙක් වේ ද, මේ එසමයෙහි මිථ්‍යාව්‍යායාම වේ.

385. කවරෙක් එසමයෙහි මිථ්‍යාසමාධි වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් අවික්ෂෙපයෙක් නො විසුරුණු සිත් ඇතිබවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් මිථ්‍යාසමාධියෙක් වේ ද, මේ එසමයෙහි මිථ්‍යාසමාධි වේ.

386. කවරෙක් එසමයෙහි වීර්‍ය්‍යබල වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ වීර්‍ය්‍යාරම්භයෙක් නිෂ්ක්‍රමයෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍රපරාක්‍රමයෙක් ස්ථිර පරාක්‍රමයෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිරපරාක්‍රමතායෙක් නො තැබූ ඡන්දයඇතිබවෙක් නො තැබූ වීර්‍ය්‍යධුර ඇතිබවෙක් වීර්‍ය්‍ය දැඩි වැ ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් මිථ්‍යාව්‍යායාමයෙක් වේ ද, මේ එසමයෙහි වීර්‍ය්‍යබල වේ.

387. කවරෙක් එසමයෙහි සමාධිබල වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුරුණු සිත් ඇතිබවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් මිථ්‍යාසමාධියෙක් වේ ද, මේ එසමයෙහි සමාධිබල වේ.

389. කවරෙක් එසමයෙහි අහිරිකබල වෙයි යත්:

එසමයෙහි යමෙකින් ලජ්ජා කටයුතු කායදුශ්චරිතාදිය පිළිකුල් නො කෙරේද, ලාමක අකුශල ධර්මයන්ගේ පැමිණීම පිළිකුල් නො කෙරේ ද, මේ එසමයෙහි අහිරිකබල වේ.

389. කවරෙක් එසමයෙහි අනොත්තප්පබල වෙයි යත්:

එසමයෙහි යමෙකින් බියපත් විමට කරුණු වූ කායදුශ්චරිතාදිය හේතු කොට ගෙන බිය නො වේ ද, ලාමක වූ අකුශල ධර්මයන්ගේ පැමිණීමෙන් බිය නො වේ ද, මේ එසමයෙහි අනොත්තප්පබල වේ.

390. කවරෙක් එසමයෙහි ලොභ වෙයි යත්:

එසමයෙහි යම් ලොභයෙක් ලොභාකාරයෙක් ලුබ්ධබවෙක් ඇල්මෙක් ඇලෙන් අයුරෙක් ඇලුණුබවෙක් අභිධ්‍යායෙක් ලොභසංඛ්‍යාත අකුශල මූලයෙක් වේ ද, මේ එසමයෙහි ලොභ වේ.

391. කතමො තස්මිං සමයෙ මොහො හොති?

යං තස්මිං සමයෙ අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසංගාහනා අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං[1] දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං තස්මිං සමයෙ මොහො හොති.

392. කතමා තස්මිං සමයෙ අභිජ්ඣා හොති?

යො තස්මිං සමයෙ ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං සාරාගො සාරජ්ජනා සාරජ්ජිතත්තං අභිජ්ඣා ලොභො අකුසලමූලං, අයං තස්මිං සමයෙ අභිජ්ඣා හොති.

393 කතමා තස්මිං සමයෙ මිච්ඡාදිට්ඨි හොති?

යා තස්මිං සමයෙ දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං[2] දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො[3] අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො,[4] අයං තස්මිං සමයෙ මිච්ඡාදිට්ඨි හොති.

394. කතමං තස්මිං සමයෙ අහිරිකං හොති?

යං තස්මිං සමයෙ න හිරීයති හිරීයිතබ්බෙන, න හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං තස්මිං සමයෙ අහිරිකං හොති.

395. කතමං තස්මිං සමයෙ අනොත්තප්පං හොති?

යං තස්මිං සමයෙ න ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන, න ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං තස්මිං සමයෙ අනොත්තප්පං හොති.

396. කතමො තස්මිං සමයෙ සමථො හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං මිච්ඡාසමාධි, අයං තස්මිං සමයෙ සමථො හොති.

397. කතමො තස්මිං සමයෙ පග්ගාහො හොති?

යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං අනික්ඛිත්තඡන්දතා විරියබලං මිච්ඡාවායාමො, අයං තස්මිං සමයෙ පග්ගාහො හොති.

---

1. අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං - ස්‍යා.
2. දිට්ඨිවිසූකායිතං - සීමු 1, 2,
3. පටිග්ගාහො - සීමු 3, මජසං. PTS.
4. විපරියාසග්ගාහො - මජසං. විපරියෙසග්ගාහො ස්‍යා.

391. කවරෙක් එසමයෙහි මෝහ වෙයි යත්:

එසමයෙහි යම් නො දැනීමෙක් නො දැක්මෙක් අනවබොධයෙක් අසම්බොධයෙක් අප්‍රතිවෙධයෙක් අසංග්‍රාහණයෙක් අපර්‍යවගාහණයෙක් (-හාත්පසින් නො බැසගැන්මෙක්) සම වැ නො බැලීමෙක් ප්‍රත්‍යවෙක්ෂා නො කිරීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් අපවිත්‍රබවෙක් බාලබවෙක් අසම්‍යග්-ඥානයෙක් මොහයෙක් ප්‍රමොහයෙක් සම්මොහයෙක් අවිද්‍යාවෙක් අවිද්‍යෞඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යාපර්‍ය්‍යුත්ථානයෙක් අවිද්‍යාපරිඝයෙක් මෝහසංඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ එසමයෙහි මොහ වේ.

392. කවරක් එසමයෙහි අභිධ්‍යා වෙයි යත්:

එසමයෙහි යම් ලෝභයෙක් ලෝභාකාරයෙක් ලුබ්ධබවෙක් ඇල්මෙක් ඇලෙන අයුරෙක් ඇලුණුබවෙක් අභිධ්‍යායෙක් ලොභ සංඛ්‍යාත අකුශල මූලයෙක් වේ ද, මේ එසමයෙහි අභිධ්‍යා වේ.

393. කවරක් එසමයෙහි මිථ්‍යාදෘෂ්ටි වෙයි යත්:

එසමයෙහි යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලොමදෘෂ්ටියෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයොජනයෙක් ග්‍රාහයෙක් පිහිටා සිටීමෙක් අභිනිවෙශයෙක් පරාමර්ශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්‍ථායතනයෙක් විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ එසමයෙහි මිථ්‍යාදෘෂ්ටි වේ.

394. කවරෙක් එසමයෙහි අහිරික වෙයි යත්:

එසමයෙහි යමෙකින් ලජ්ජා වියයුතු කායදුශ්චරිතාදිය පිළිකුල් නො කෙරේ ද, ලාමක වූ අකුශල ධර්‍මයන්ගේ පැමිණීමෙන් පිළිකුල් නො කෙරේද, මේ එසමයෙහි අහිරික වේ.

395. කවරෙක් එසමයෙහි අනොත්තප්ප වෙයි යත්:

එසමයෙහි තැවීමට කරුණු වූ කායදුශ්චරිතාදිය හේතු කොටගෙන බිය නො වේ ද, ලාමක වූ අකුශල ධර්‍මයන්ගේ පැමිණීමෙන් බිය නො වේ ද, මේ එසමයෙහි අනොත්තප්ප වේ.

396. කවරෙක් එසමයෙහි ශමථ වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැස ගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුරුණු සිත් ඇතිබවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් මිථ්‍යාසමාධියෙක් වේ ද, මේ එසමයෙහි ශමථ වේ.

397. කවරෙක් එසමයෙහි ප්‍රග්‍රාහ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වීර්‍යාරම්භයෙක් නිෂ්ක්‍රමයෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් උත්සාහයෙක් අධිමාත්‍රෝත්සාහයෙක් ස්ථිරපරාක්‍රමයෙක් ධෛර්‍ය්‍යයෙක් ස්ථිරපරාක්‍රමතායෙක් බහා නො තැබූ ඡන්ද ඇතිබවෙක් බහා නො තැබූ වීර්‍ය්‍යධුර ඇතිබවෙක් වීර්‍ය්‍ය දැඩි වැ ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් මිථ්‍යාව්‍යායාමයෙක් වේ ද, මේ එසමයෙහි ප්‍රග්‍රාහ වේ.

398. කතමො තස්මිං සමයෙ අවික්ඛෙපො හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං මිච්ඡාසමාධි, අයං තස්මිං සමයෙ අවික්ඛෙපො හොති.

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, පඤ්චින්ද්‍රියානි හොන්ති, පඤ්චඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, චත්තාරි බලානි හොන්ති, ද්වෙ හෙතූ[1] හොන්ති, එකො ඵස්සො හොති -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා. -පෙ-

399. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං සමාධිබලං අහිරිකබලං අනොත්තප්පබලං ලොභො මොහො අභිජ්ඣා මිච්ඡාදිට්ඨි අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

400. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

401 කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං දිට්ඨිගතවිප්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, මිච්ඡාසඞ්කප්පො හොති, මිච්ඡාවායාමො හොති, මිච්ඡාසමාධි හොති, විරියබලං හොති, සමාධිබලං හොති, අහිරිකබලං[2] හොති, අනොත්තප්පබලං හොති, ලොභො හොති, මොහො හොති, අභිජ්ඣා හොති, අහිරිකං[3] හොති, අනොත්තප්පං හොති, සමථො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

1. හෙතුයො - සිමු 1, 2 2. අහිරීකබලං - මජසං. 3. අහිරීකං - මජසං.

398. කවරෙක් එසමයෙහි අවික්ෂෙප වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැසැ ගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුරුණු සිත් ඇතිබවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් මිථ්‍යාසමාධියෙක් වේ ද, මේ එසමයෙහි අවික්ෂෙප වේ.

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති. ආයතනයෝ දෙදෙනෙක් වෙති. ධාතුහු දෙදෙනෙක් වෙති. ආහාරයෝ තිදෙනෙක් වෙති. ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති. පඤ්චාඞ්ගික ධ්‍යානය වෙයි. චතුරඞ්ගික මාර්ගය වෙයි. බලයෝ සතරදෙනෙක් වෙති. හේතූහු දෙදෙනෙක් වෙති. එක් මැ ස්පර්ශයෙක් වෙයි. ... එක් මැ ධර්මායතනය වෙයි. එක් මැ ධර්මධාතුව වෙයි. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපී ධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි. ...

399. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය ප්‍රීති ය චිත්තෛකාග්‍රතා ය වීර්යෙන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය මිථ්‍යාදෘෂ්ටි ය මිථ්‍යාසංකල්පය මිථ්‍යාව්‍යායාම ය මිථ්‍යාසමාධි ය වීර්යබල ය සමාධි බල ය අහිරිකබල ය අනොත්තප්පබල ය ලෝභ ය මෝහ ය අභිධ්‍යා ය මිථ්‍යාදෘෂ්ටි ය අහිරික ය අනොත්තප්පය ශමථ ය ප්‍රග්‍රහ ය අවික්ෂෙප යි. තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ අකුසලයෝ යි.

400. කවර ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙක රූපාලම්බන වේවයි ... ධර්මාලම්බන වේවයි යම් යම් අරමුණක් හෝ ඇරබැ සොමනස්සහගත වූ දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වූ අකුශලචිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි. ... අවික්ෂෙපය වේ. ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

401. කවර ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙක රූපාලම්බන වේවයි ශබ්දාලම්බන වේවයි ගන්ධාලම්බන වේවයි රසාලම්බන වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට සොමනස්සහගත වූ දෘෂ්ටිගතවිප්‍රයුක්ත වූ අකුශලචිත්තය උපදනේවේ ද, එකල්හි- ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, ප්‍රීතිය වෙයි, සුඛය වෙයි චිත්තෛකාග්‍රතාව වෙයි, වීර්යේන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, සෞමනස්සින්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි, මිථ්‍යාසංකල්පය වෙයි, මිථ්‍යාව්‍යායාමය වෙයි, මිථ්‍යාසමාධිය වෙයි, වීර්යබලය වෙයි, සමාධිබලය වෙයි, අහිරිකබලය වෙයි, අනොත්තප්පබලය වෙයි, ලෝභය වෙයි, මෝහය වෙයි, අභිධ්‍යාව වෙයි, අහිරිකය වෙයි, අනොත්තප්පය වෙයි, ශමථය වෙයි, ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂෙපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, පඤ්චින්ද්‍රියානි හොන්ති, පඤ්චඞ්ගිකං ඣානං හොති, තිවඞ්ගිකො මග්ගො හොති, චත්තාරි බලානි හොන්ති, ද්වෙ හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.-පෙ-

402. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං සමාධිබලං අහිරිකබලං අනොත්තප්පබලං ලොභො මොහො අභිජ්ඣා අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

403. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං දිට්ඨිගතවිප්පයුත්තං සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

404. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා, යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, මිච්ඡාදිට්ඨි හොති, මිච්ඡාසඞ්කප්පො හොති, මිච්ඡාවායාමො හොති, මිච්ඡාසමාධි හොති, විරියබලං හොති, සමාධිබලං හොති, අහිරිකබලං හොති, අනොත්තප්පබලං හොති, ලොභො හොති, මොහො හොති, අභිජ්ඣා හොති, මිච්ඡාදිට්ඨි හොති, අහිරිකං හොති, අනොත්තප්පං හොති, සමථො හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

405. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

තවද, එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතුහු දෙදෙනෙක් වෙයි, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති, පඤ්චාඞ්ගිකධ්‍යානය වේයි, තිවඞ්ගික මාර්ගය වෙයි, බලයෝ සතර දෙනෙක් වෙති, හේතුහු දෙදෙනෙක් වෙති, එක් මැ ස්පර්ශයෙක් වෙයි, ... එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්ම ධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපී ධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි. ...

402. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය ප්‍රීති ය චිත්තෛකාග්‍රතා ය වීර්යේන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතේන්ද්‍රිය ය මිථ්‍යාසංකල්ප ය මිථ්‍යාසමාධි ය වීර්යබල ය සමාධිබල ය අහිරිකබල ය අනොත්තප්පබල ය ලෝභ ය අභිධ්‍යා ය අහිරික ය අනොත්තප්ප ය ශමථ ය ප්‍රග්‍රාහ ය අවික්ෂෙප යි. තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ. ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

403. කවර ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි ... ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට සෞමනස්‍ය සහගත වූ දෘෂ්ටිගතවිප්‍රයුක්ත වූ අකුශලචිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

404. කවර, ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි ශබ්දාලම්බන වේවයි ගන්ධාලම්බන වේවයි රසාලම්බන වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට උපේක්ෂාසහගත වූ දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත වූ අකුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, වීර්යේන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපේක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතේන්ද්‍රිය වෙයි, මිථ්‍යාදෘෂ්ටිය වෙයි, මිථ්‍යාසංකල්පය වෙයි, මිථ්‍යාව්‍යායාමය වෙයි, මිථ්‍යා සමාධිය වෙයි, වීර්යබලය වෙයි, සමාධිබලය වෙයි, අහිරිකබලය වෙයි, අනොත්තප්පබලය වෙයි, ලෝභය වෙයි, මෝහය වෙයි, අභිධ්‍යාව වෙයි, මිථ්‍යාදෘෂ්ටිය වෙයි, අහිරිකය වෙයි, අනොත්තප්පය වෙයි, ශමථය වෙයි, ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂෙපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍ය සමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

405. කවරෙක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශාකාරයෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශ වේ.

406. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, අයං තස්මිං සමයෙ වෙදනා හොති.

407. කතමා තස්මිං සමයෙ උපෙක්ඛා හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, අයං තස්මිං සමයෙ උපෙක්ඛා හොති.

408. කතමං තස්මිං සමයෙ උපෙක්ඛින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං නෙවසාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ උපෙක්ඛින්ද්‍රියං හොති. -පෙ-

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, පඤ්චින්ද්‍රියානි හොන්ති, චතුරඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, චත්තාරි බලානි හොන්ති, ද්වෙ හෙතූ හොන්ති, එකො ඵස්සො හොති, එකා වෙදනා හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා. -පෙ-

409. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං සමාධිබලං අහිරිකබලං අනොත්තප්පබලං ලොභො මොහො අභිජ්ඣා මිච්ඡාදිට්ඨි අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

410. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

406. කවරක් එසමයෙහි වෙදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප මනොවිඤ්ඤාණධාතුහුගේ සංස්පර්ශයෙන් උපන් චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් අදුඃඛ වූ අසුඛ වූ යම් වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් අදුඃඛ වූ අසුඛ වූ යම් වෙදනාවෙක් වේ ද, මේ එසමයෙහි වෙදනා වේ.

407. කවරක් එසමයෙහි උපේක්ෂා වෙයි යත්:

එසමයෙහි චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්ත-සංස්පර්ශයෙන් උපන් අදුඃඛ වූ අසුඛ වූ යම් වෙදයිතයෙක්, චිත්තසංස්පර්ශ-යෙන් උපන් අදුඃඛ වූ අසුඛ වූ යම් වෙදනාවෙක් වේ ද, මේ එසමයෙහි උපේක්ෂා වේ.

408. කවරෙක් එසමයෙහි උපෙක්ඛින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්ත-සංස්පර්ශයෙන් උපන් අදුඃඛ වූ අසුඛ වූ යම් වෙදයිතයෙක්, චිත්තසංස්පර්ශ-යෙන් උපන් අදුඃඛ වූ අසුඛ වූ යම් වෙදනාවෙක් වේ ද, මේ එසමයෙහි උපෙක්ඛින්ද්‍රිය වේ ...

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපී ධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතුහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ පස් දෙනෙක් වෙති, චතුරඞ්ගිකධ්‍යානය වෙයි, චතුරඞ්ගික-මාර්ගය වෙයි, බලයෝ සතර දෙනෙක් වෙති, හේතුහු දෙදෙනෙක් වෙති, එක් මැ ස්පර්ශයෙක් වෙයි, එක් මැ වෙදනාවෙක් වෙයි, ... එක් මැ ධර්මා-යතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි ...

409. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චෙතනා ය විතර්ක ය විචාර ය චිත්තෛකාග්‍රතා ය වීර්යෙන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය මිථ්‍යාදෘෂ්ටි ය මිථ්‍යාසංකල්ප ය මිථ්‍යාව්‍යායාම ය මිථ්‍යාසමාධි ය වීර්යබල ය සමාධිබල ය අහිරිකබල ය අනොත්තප්පබල ය ලෝභ ය මෝහ ය අභිධ්‍යා ය මිථ්‍යාදෘෂ්ටි ය අහිරික ය අනොත්තප්ප ය ශමථ ය ප්‍රග්‍රාහ ය අවික්ෂෙප යි. තවද එසමයෙහි වෙදනාස්කන්ධය තබා සංඥා-ස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍ය සමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ. ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

410. කවර ධර්මයෝ අකුසල් වෙති යත්:

යම් කලෙක රූපාලම්බන වේවයි ... ධර්මාලම්බන වේවයි, යමක් යමක් හෝ අරමුණු කොට උපේක්ෂා සහගත වූ දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වූ අකුශල චිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

411. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනා-රබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, මිච්ඡාසඞ්කප්පො හොති, මිච්ඡාවායාමො හොති, මිච්ඡාසමාධි හොති, විරියබලං හොති, සමාධිබලං හොති, අහිරිකබලං හොති, අනොත්තප්පබලං හොති, ලොභො හොති, මොහො හොති, අභිජ්ඣා හොති, අහිරිකං හොති, අනොත්තප්පං හොති, සමථො හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, පඤ්චින්ද්‍රියානි හොන්ති, චතුරඞ්ගිකං ඣානං හොති, තිවඞ්ගිකො මග්ගො හොති, චත්තාරි බලානි හොන්ති, ද්වෙ හෙතු හොන්ති, එකො ඵස්සො හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

412. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං සමාධිබලං අහිරිකබලං අනොත්තප්පබලං ලොභො මොහො අභිජ්ඣා අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

413. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

411. කවර ධර්මයෝ අකුසල්හු යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි ශබ්දාලම්බන වේවයි ගන්ධාලම්බන වේවයි රසාලම්බන වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට උපේක්ෂාසහගත වූ දෘෂ්ටිගතවිප්‍රයුක්ත වූ අකුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, වීර්යෙන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපේක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි, මිථ්‍යාසංකල්පය වෙයි, මිථ්‍යාව්‍යායාමය වෙයි, මිථ්‍යාසමාධිය වෙයි, වීර්‍ය-බලය වෙයි, සමාධිබලය වෙයි, අහිරිකබලය වෙයි, අනොත්තප්පබලය වෙයි, ලෝභය වෙයි, මෝහය වෙයි, අභිධ්‍යාව වෙයි, අහිරිකය වෙයි, අනොත්තප්පය වෙයි, ශමථය වෙයි, ප්‍රග්‍රාහය වෙයි, අවික්ෂෙපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතුහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති, චතුරඞ්ගිකධ්‍යානය වෙයි, තිවඞ්ගික මාර්ගය වෙයි, බලයෝ සතරදෙනෙක් වෙති, හේතුහු දෙදෙනෙක් වෙති, එක් මැ ස්පර්ශයෙක් වෙයි ... එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි ...

412. කවරේක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය චිත්තෛකාග්‍රතා ය වීර්යෙන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය මිථ්‍යාසංකල්ප ය මිථ්‍යාව්‍යායාම ය මිථ්‍යාසමාධි ය වීර්යබල ය සමාධිබල ය අහිරිකබල ය අනොත්තප්පබල ය ලෝභ ය මෝහ ය අභිධ්‍යා ය අහිරික ය අනොත්තප්ප ය ශමථ ය ප්‍රග්‍රාහ ය අවික්ෂේප යි. තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධය වේ. ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

413. කවර ධර්මයෝ අකුසල්හු යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි ... ධර්මාලම්බන වේවයි, යමක් යමක් හෝ අරමුණු කොට උපේක්ෂාසහගත වූ දෘෂ්ටිගතවිප්‍රයුක්ත වූ අකුශලචිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

414. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති දොමනස්සසහගතං පටිඝසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, දුක්ඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, දොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, මිච්ඡාසඞ්කප්පො හොති, මිච්ඡාවායාමො හොති, මිච්ඡාසමාධි හොති, විරියබලං හොති, සමාධිබලං හොති, අහිරිකබලං හොති, අනොත්තප්පබලං හොති, දොසො හොති, මොහො හොති, ව්‍යාපාදො හොති, අහිරිකං හොති, අනොත්තප්පං හොති, සමථො හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

415. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

416. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, අයං තස්මිං සමයෙ වෙදනා හොති. -පෙ-

417. කතමං තස්මිං සමයෙ දුක්ඛං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතො-සම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ දුක්ඛං හොති. -පෙ-

418. කතමං තස්මිං සමයෙ දොමනස්සින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතො-සම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ දොමනස්සින්ද්‍රියං හොති. -පෙ-

419. කතමො තස්මිං සමයෙ දොසො හොති?

යො තස්මිං සමයෙ දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං තස්මිං සමයෙ දොසො හොති. -පෙ-

414. කවර ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි ශබ්දාලම්බන වේවයි ගන්ධාලම්බන වේවයි රසාලම්බන වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට දොම්නස් සහගත වූ ප්‍රතිඝසම්ප්‍රයුක්ත වූ අකුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, දුඃඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, වීර්යෙන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, දෞර්මනස්සින්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි, මිථ්‍යාසංකල්පය වෙයි, මිථ්‍යාව්‍යායාමය වෙයි, මිථ්‍යාසමාධිය වෙයි, වීර්යබලය වෙයි, අහිරිකබලය වෙයි, අනොත්තප්පබලය වෙයි, ද්වේෂය වෙයි, මෝහය වෙයි, ව්‍යාපාදය වෙයි, අහිරිකය වෙයි, අනොත්තප්පය වෙයි, ශමථය වෙයි, ප්‍රග්‍රහය වෙයි, අවික්ෂෙපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

415. කවරෙක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශකාරයෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් මොනවට ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශය වේ.

416. කවරක් එසමයෙහි වේදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනෝවිඥානධාතුහුගේ සංස්පර්ශයෙන් උපන් චෛතසික වූ අමිහිරි බවෙක් චෛතසික වූ දුඃඛයෙක් චිත්ත සංස්පර්ශයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදයිතයෙක්, චිත්ත සංස්පර්ශයෙන් උපන් අමිහිරි වූ දුඃඛවේදනායෙක් වේ ද, මේ එසමයෙහි වේදනා වේ. ...

417. කවරෙක් එසමයෙහි දුඃඛ වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ අමිහිරි බවෙක් චෛතසික වූ දුඃඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදනායෙක් වේ ද, මේ එසමයෙහි දුඃඛය වේ. ...

418. කවරෙක් එසමයෙහි දෞර්මනස්සින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ අමිහිරි බවෙක් චෛතසික වූ දුඃඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් අමිහිරි වූ දුක් වූ වෙදනායෙක් වේ ද, මේ එසමයෙහි දෞර්මනස්සින්ද්‍රිය වේ ...

419. කවරෙක් එසමයෙහි ද්වේෂ වෙයි යත්:

එසමයෙහි යම් ද්වේෂයෙක් දූෂණාකාරයෙක් දූෂිත බවෙක් ව්‍යාපත්තියෙක් ව්‍යාපජ්ජනයෙක් ව්‍යාපන්න බවෙක් විරෝධයෙක් ප්‍රතිවිරෝධයෙක් තද බවෙක් නො පිරිපුන් වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ එසමයෙහි ද්වේෂය වේ ...

420. කතමො තස්මිං සමයෙ ව්‍යාපාදො හොති?

යො තස්මිං සමයෙ දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං තස්මිං සමයෙ ව්‍යාපාදො හොති -පෙ-

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, පඤ්චින්ද්‍රියානි හොන්ති, චතුරඞ්ගිකං ඣානං හොති, තිවඞ්ගිකො මග්ගො හොති, චත්තාරි බලානි හොන්ති, ද්වෙ හෙතූ හොන්ති, එකො ඵස්සො හොති -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා. -පෙ-

421. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං සමාධිබලං අහිරිකබලං අනොත්තප්පබලං දොසො මොහො ව්‍යාපාදො අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

422. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති දොමනස්සසහගතං පටිඝසම්පයුත්තං සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා, යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

423. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං විචිකිච්ඡාසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා, යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, මිච්ඡාසඞ්කප්පො හොති, මිච්ඡාවායාමො හොති, විරියබලං හොති, අහිරිකබලං හොති, අනොත්තප්පබලං හොති, විචිකිච්ඡා හොති, මොහො හොති, අහිරිකං හොති, අනොත්තප්පං හොති, පග්ගාහො හොති. අවික්ඛෙපො හොති, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්ච සමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

420. කවරෙක් එසමයෙහි ව්‍යාපාද වෙයි යත්:

එසමයෙහි යම් ද්වේෂයෙක් දූෂණාකාරයෙක් දූෂිත බවෙක් ව්‍යාපත්ති-යෙක් ව්‍යාපජ්ජනයෙක් ව්‍යාපන්න බවෙක් විරෝධයෙක් ප්‍රතිවිරෝධයෙක් තද බවෙක් නො පිරිපුන් වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ එසමයෙහි ව්‍යාපාද වේ. ...

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධම් කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

තවද එසමයෙහි ස්කන්ධයෝ සතරදෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙ-නෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති, චතුරඞ්ගිකධ්‍යානය වෙයි, තිවඞ්ගිකමාර්ගය වෙයි, සතර බලයෝ වෙති, හේතූහු දෙදෙනෙක් වෙති, එක් මැ ස්පර්ශ-යෙක් වෙයි, එක් මැ ධර්මායතනය වෙයි ... එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධම් කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි ...

421. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය චිත්තෙකාග්‍රතා ය වීර්යේන්-ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතේන්ද්‍රිය ය මිථ්‍යාසංකල්ප ය මිථ්‍යාව්‍යායාම ය මිථ්‍යාසමාධි ය වීර්යබල ය සමාධිබල ය අහිරිකබල ය අනොත්තප්පබල ය ද්වේෂ ය මෝහ ය ව්‍යාපාද ය අහිරික ය අනොත්තප්ප ය ශමථ ය ප්‍රග්‍රාහ ය අවික්ෂේප යි. තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥ-ස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධම් කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

422. කවර ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙක රූපාලම්බන වේවයි ... ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට දෞර්මනස්‍ය සහගත වූ ප්‍රතිඝ සම්ප්‍රයුක්ත වූ අකුශල චිත්තය සංස්කාර සහිත වැ උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂේපය වේ ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

423. කවර ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙක රූපාලම්බන වේවයි, ශබ්දාලම්බන වේවයි, ගන්ධාලම්බන වේවයි, රසාලම්බන වේවයි, ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි, ධර්මාලම්බන වේවයි, යමක් යමක් හෝ අරමුණු කොට උපෙක්ෂාසහගත වූ විචිකිච්ඡා සම්ප්‍රයුක්ත වූ අකුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපෙක්ෂාව වෙයි, චිත්තෙකාග්‍රතාව වෙයි, වීර්යේන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපෙක්ෂේන්ද්‍රිය වෙයි, ජීවිතේන්ද්‍රිය වෙයි, මිථ්‍යාසංකල්පය වෙයි, මිථ්‍යාව්‍යායාමය වෙයි, වීර්යබලය වෙයි, අහිරිකබලය වෙයි, අනොත්තප්පබලය වෙයි, විචිකිච්ඡාව වෙයි, මෝහය වෙයි, අහිරිකය වෙයි, අනොත්තප්පය වෙයි. ප්‍රග්‍රාහය වෙයි. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධම් කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

424. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති. -පෙ-

425. කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති -පෙ- අයං තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති. -පෙ-

426 කතමා තස්මිං සමයෙ විචිකිච්ඡා හොති?

යා තස්මිං සමයෙ කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො [1] ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ථම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො, අයං තස්මිං සමයෙ විචිකිච්ඡා හොති -පෙ-

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, චත්තාරි ඉන්ද්‍රියානි හොන්ති, චතුරඞ්ගිකං ඣානං හොති, දුවඞ්ගිකො මග්ගො හොති, තීණි බලානි හොන්ති, එකො හෙතු හොති, එකො ඵස්සො හොති -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා. -පෙ-

427. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො විරියබලං අහිරිකබලං අනොත්තප්පබලං විචිකිච්ඡා මොහො අහිරිකං අනොත්තප්පං පග්ගාහො. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

428. කතමෙ ධම්මා අකුසලා?

යස්මිං සමයෙ අකුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං උද්ධච්චසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති, මිච්ඡාසඞ්කප්පො හොති, මිච්ඡාවායාමො හොති, මිච්ඡාසමාධි හොති, විරියබලං හොති, සමාධිබලං හොති, අහිරිකබලං හොති, අනොත්තප්පබලං හොති, උද්ධච්චං හොති, මොහො හොති, අහිරිකං හොති, අනොත්තප්පං හොති, සමථො හොති, පග්ගාහො හොති, අවික්ඛෙපො හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා.

1. අනෙකංසග්ගාහො - මජසං.

424. කවරේක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශනාකාරයෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් මොනවට ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශ වේ ...

425. කවරක් එසමයෙහි චිත්තෛකාග්‍රතා වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් ... මේ එසමයෙහි චිත්තෛකාග්‍රතා වේ ...

426. කවරක් එසමයෙහි විචිකිච්ඡා වෙයි යත්:

එසමයෙහි යම් සැකයෙක් සැක කරන අයුරෙක් සැක කළ බවෙක් විමතියෙක් විචිකිත්සායෙක් ද්වෛධභාවයෙක් ද්විධාපථයෙක් සංශයෙක් අනෛකාංශග්‍රාහයෙක් පසුබැස්මෙක් හාත්පසින් පසුබැස්මෙක් නො බැසගැන්මෙක් තදබවෙක් සිත පිළිබඳ මනොවිලෙඛයෙක් වේ ද, මේ එසමයෙහි විචිකිච්ඡා වේ ...

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි...

තවද එසමයෙහි ස්කන්ධයෝ සතරදෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ සතරදෙනෙක් වෙති, චතුරඞ්ගිකධ්‍යානය වෙයි, ද්විඅඞ්ගික මාර්ගය වෙයි, බලයෝ තිදෙනෙක් වෙති, එක් මැ හේතුයෙක් වෙයි, එක් ම ස්පර්ශයෙක් වෙයි ... එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි ...

427. කවරේක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය චිත්තෛකාග්‍රතා ය වීර්යෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය මිථ්‍යාසංකල්ප ය මිථ්‍යාව්‍යායාම ය වීර්ය බල ය අහිරිකබල ය අනොත්තප්පබල ය විචිකිත්සා ය මෝහ ය අහිරික ය අනොත්තප්ප ය ප්‍රශ්‍රංශ යි. තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

428. කවර ධර්මයෝ අකුසල්හ යත්:

යම් කලෙක රූපාලම්බන වේවයි ශබ්දාලම්බන වේවයි ගන්ධාලම්බන වේවයි රසාලම්බන වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ධර්මාලම්බන වේවයි යමක් යමක් හෝ අරමුණු කොට උපේක්ෂාසහගත වූ ඖද්ධත්‍යසම්ප්‍රයුක්ත වූ අකුශලචිත්තය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, වීර්යෙන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපේක්ෂේන්ද්‍රිය වෙයි, ජීවිතේන්ද්‍රිය වෙයි, මිථ්‍යාසංකල්පය වෙයි, මිථ්‍යාව්‍යායාමය වෙයි, මිථ්‍යාසමාධිය වෙයි, වීර්යබලය වෙයි, සමාධිබලය වෙයි, අහිරිකබලය වෙයි, අනොත්තප්පබලය වෙයි, ඖද්ධත්‍යය වෙයි, මෝහය වෙයි, අහිරිකය වෙයි, අනොත්තප්පය වෙයි, ශමථය වෙයි, ප්‍රග්‍රහය වෙයි, අවික්ෂේපය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

429. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති. -පෙ-

430. කතමං තස්මිං සමයෙ උද්ධච්චං හොති?

යං තස්මිං සමයෙ චිත්තස්ස උද්ධච්චං අවූපසමො[1] චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං තස්මිං සමයෙ උද්ධච්චං හොති -පෙ-

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, පඤ්චින්ද්‍රියානි හොන්ති, චතුරඞ්ගිකං ඣානං හොති, තිවඞ්ගිකො මග්ගො හොති, චත්තාරි බලානි හොන්ති, එකො හෙතු හොති, එකො ඵස්සො හොති, -පෙ- එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අකුසලා. -පෙ-

431. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං සමාධිබලං අහිරිකබලං අනොත්තප්පබලං උද්ධච්චං මොහො අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අකුසලා.

### ද්වාදස අකුසල චිත්තානි.

### [අව්‍යාකත විපාකචිත්තානි]

432. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං රූපාරම්මණං, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා.

333. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

---

1. අවූපසමො - මජසං.

429. කවරේක් එසමයෙහි ස්පර්ශ වේයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශකාරයෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් මොනවට ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශ වේ ...

430. කවරේක් එසමයෙහි ඖද්ධත්‍ය වේයි යත්:

එසමයෙහි චිත්තයාගේ ඖද්ධත්‍යයෙක් චිත්තයාගේ අව්‍යුපශමයෙක් වික්ෂේපයෙක් චිත්තයාගේ භ්‍රාන්ත බවෙක් වේ ද, මේ එසමයෙහි ඖද්ධත්‍ය වේ ...

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අකුශලයෝ යි.

තවද එසමයෙහි ස්කන්ධයෝ සතරදෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතුහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති, චතුරඞ්ගිකධ්‍යානය වෙයි, ත්‍රිවඞ්ගික මාර්ගය වෙයි, බලයෝ සතරදෙනෙක් වෙති, එක් මැ හේතුයෙක් වෙයි, එක් මැ ස්පර්ශයෙක් වෙයි ... එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද මේ ධර්මයෝ අකුශලයෝ යි ...

431. කවරේක් එසමයෙහි සංස්කාරස්කන්ධ වේයි යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය චිත්තෛකාග්‍රතා ය වීර්‍ය්‍යේන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය මිථ්‍යාසංකල්ප ය මිථ්‍යාව්‍යායාම ය මිථ්‍යාසමාධි ය වීර්‍ය්‍යබල යැ සමාධිබල ය අහිරිකබල ය අනොත්තප්පබල ය ඖද්ධත්‍ය ය මෝහ ය අහිරික ය අනොත්තප්ප ය ශමථ ය ප්‍රග්‍රාහ ය අවික්ෂෙප යි තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ අකුශලයෝ යි.

දොළොස් අකුසල් සිත් නිමි.

[අව්‍යාකෘත විපාක විඥාන]

432. කවර ධර්මයෝ අව්‍යාකෘතහ යත්:

යම් කලෙකැ කාමාවචර කුශලකර්මය කළ හෙයින්, රැස් කළ හෙයින් රූපාලම්බන වූ උපේක්ෂා සහගත විපාක වූ චක්ෂුර්විඥානය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, උපේක්ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, උපෙක්ෂේන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි. එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

433. කවරේක් එසමයෙහි ස්පර්ශ වේයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශකාරයෙක් මොනවට ස්පර්ශ කරන අයුරෙක් මොනවට ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශ වේ.

434 කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාචක්ඛුවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, අයං තස්මිං සමයෙ වෙදනා හොති.

435. කතමා තස්මිං සමයෙ සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාචක්ඛුවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං තස්මිං සමයෙ සඤ්ඤා හොති.

436 කතමා තස්මිං සමයෙ චෙතනා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාචක්ඛුවිඤ්ඤාණධාතුසම්ඵස්සජා චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං, අයං තස්මිං සමයෙ චෙතනා හොති.

437. කතමං තස්මිං සමයෙ චිත්තං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං, මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාචක්ඛුවිඤ්ඤාණධාතු, ඉදං තස්මිං සමයෙ චිත්තං හොති.

438. කතමා තස්මිං සමයෙ උපෙක්ඛා හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, අයං තස්මිං සමයෙ උපෙක්ඛා හොති.

439 කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති -පෙ- අයං තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති.

440. කතමං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං, මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාචක්ඛුවිඤ්ඤාණධාතු, ඉදං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති.

441. කතමං තස්මිං සමයෙ උපෙක්ඛින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ උපෙක්ඛින්ද්‍රියං හොති.

434. කවරක් එසමයෙහි වෙදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ චක්ඛුර්විඥානධාතු සංස්පර්ශයෙන් උපන් චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ යම් වෙදයිතයෙක්, චිත්ත සංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ යම් වේදනායෙක් වේ ද, මේ එසමයෙහි වේදනා වේ.

435. කවරක් එසමයෙහි සංඥා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ චක්ඛුර්විඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් හැඳිනීමෙක් හඳුනන අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද, මේ එසමයෙහි සංඥා වේ.

436. කවරක් එසමයෙහි චෙතනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ චක්ඛුර්විඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් චේතනායෙක් සඤ්චෙතනායෙක් සිතන ලද බවෙක් වේ ද, මේ එසමයෙහි චෙතනා වේ.

437. කවරෙක් එසමයෙහි චිත්ත වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක්, මනයෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ චක්ඛුර්විඥානධාතුයෙක් වේ ද, මේ එසමයෙහි චිත්ත වේ.

438. කවරක් එසමයෙහි උපේක්ෂා වෙයි යත්:

එසමයෙහි චෛතසික වූ නො මැ සාත වූ අසාත නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ යම් වෙදයිතයෙක්, චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ යම් වේදනායෙක් වේ ද, මේ එසමයෙහි උපේක්ෂා වේ.

339. කවරක් එසමයෙහි චිත්තෛකාග්‍රතා වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් ... මේ එසමයෙහි චිත්තෛකාග්‍රතා වේ.

440. කවරෙක් එසමයෙහි මනින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක්, මනයෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ චක්ඛුර්විඥානධාතුයෙක් වේ ද, මේ එසමයෙහි මනින්ද්‍රිය වේ.

441. කවරෙක් එසමයෙහි උපේක්ෂෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි චෛතසික වූ නො මැ සාත වූ අසාත නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් අදුඃඛ වූ අසුඛ වූ යම් වෙදයිතයෙක්, චිත්තසංස්පර්ශයෙන් උපන් අදුඃඛ වූ අසුඛ වූ යම් වේදනායෙක් වේ ද, මේ එසමයෙහි උපෙක්ෂෙන්ද්‍රිය වේ.

442. කතමං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති?

යං තෙසං අරූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති.

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ඡ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, තීණි ඉන්ද්‍රියානි හොන්ති, එකො ඵස්සො හොති -පෙ- එකා චක්ඛුවිඤ්ඤාණධාතු හොති, එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා. -පෙ-

443 කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා චිත්තස්සෙකග්ගතා ජීවිතින්ද්‍රියං. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං, ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං, ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

444. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං සොතවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං සද්දාරම්මණං -පෙ- විපාකං ඝානවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං ගන්ධාරම්මණං -පෙ- විපාකං ජිව්හාවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං රසාරම්මණං -පෙ- විපාකං කායවිඤ්ඤාණං උප්පන්නං හොති සුඛසහගතං ඵොට්ඨබ්බාරම්මණං, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, සුඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා.

445. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

446. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාකායවිඤ්ඤාණධාතුසම්ඵස්සජං කායිකං සාතං කායිකං සුඛං කායසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං කායසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, අයං තස්මිං සමයෙ වෙදනා හොති.

442. කවරෙක් එසමයෙහි ජීවිතේන්ද්‍රිය වෙයි යත්:

ඒ අරූපිධර්මයන් ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යැපීමෙක් යාපනයෙක් ඉරියව් පැවැත්මෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වේ.

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

තවද එසමයෙහි ස්කන්ධයෝ සතරදෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ තිදෙනෙක් වෙති, එක් මැ ස්පර්ශයෙක් වෙයි ... එක් මැ චක්ෂුර්විඥනධාතුයෙක් වෙයි, එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍ය සමුත්පන්න වූ යම් අරූපි ධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි ...

443. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය චිත්තෛකාග්‍රතා ය ජීවිතේන්ද්‍රිය ය, තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥස්කන්ධය තබා විඥනස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

444. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙකැ කාමාවචර කුශලකර්මය කළ හෙයින් රැස් කළ හෙයින් ශබ්දාලම්බන වූ උපේක්ෂාසහගත විපාක වූ ශ්‍රොත්‍රවිඥනය උපදනේ වේ ද ... ගන්ධාලම්බන වූ උපේක්ෂාසහගත විපාක වූ ඝ්‍රාණවිඥනය උපදනේ වේ ද ... රසාලම්බන වූ උපේක්ෂාසහගත විපාක වූ ජිහ්වාවිඥනය උපදනේ වේ ද ... ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වූ සුඛසහගත විපාක වූ කායවිඥනය උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, සුඛය වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, සුඛෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපි ධර්මකෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

445. කවරෙක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශාකාරයෙක් මොනවට ස්පර්ශ කරන ආකාරයෙක් මොනවට ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශ වේ.

446. කවරෙක් එසමයෙහි වේදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ කායවිඥනධාතු සංස්පර්ශයෙන් උපන් යම් කායික වූ මිහිරි බවෙක් කායික වූ සුඛයෙක් කායසංස්පර්ශයෙන් උපන් සාත වූ සුඛ වූ වෙදයිතයෙක් කායසංස්පර්ශයෙන් උපන් සාත වූ සුඛ වූ වේදනායෙක් වේ ද, මේ එසමයෙහි වේදනා වේ.

447. කතමා තස්මිං සමයෙ සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාකායවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං තස්මිං සමයෙ සඤ්ඤා හොති.

448. කතමා තස්මිං සමයෙ චෙතනා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාකායවිඤ්ඤාණධාතුසම්ඵස්සජා චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං, අයං තස්මිං සමයෙ චෙතනා හොති.

449. කතමං තස්මිං සමයෙ චිත්තං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං, මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාකායවිඤ්ඤාණධාතු, ඉදං තස්මිං සමයෙ චිත්තං හොති.

450. කතමං තස්මිං සමයෙ සුඛං හොති?

යං තස්මිං සමයෙ කායිකං සාතං කායිකං සුඛං කායසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං, කායසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ සුඛං හොති.

451. කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති -පෙ- අයං තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති.

452. කතමං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං, මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාකායවිඤ්ඤාණධාතු, ඉදං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති.

453. කතමං තස්මිං සමයෙ සුඛින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ කායිකං සාතං කායිකං සුඛං කායසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං, කායසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ සුඛින්ද්‍රියං හොති.

454. කතමං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති?

යං තෙසං අරූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති.

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා.

447. කවරක් එසමයෙහි සංඥා වේ ද යත්:

එසමයෙහි තදනුරූප වූ කායවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් සංඥාවෙක් සඤ්ජානනාකාරයෙක් සඤ්ජානිත (හැඳිනගත්) බවෙක් වේ ද, මේ එසමයෙහි සංඥා වේ.

448. කවරක් එසමයෙහි චේතනා වේ ද යත්:

එසමයෙහි තදනුරූපවූ කායවිඥානධාතු සංස්පර්ශයෙන් උපන් යම් චේතනාවෙක් සඤ්චේතනාවෙක් සිතන ලද බවෙක් වේ ද, මේ එසමයෙහි චේතනා වේ.

449. කවරේක් එසමයෙහි චිත්ත වේ ද යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක්, මනයෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥාන ස්කන්ධයෙක් තදනුරූප වූ කායවිඥානධාතුවෙක් වේ ද, මේ එසමයෙහි චිත්ත වේ.

450. කවරේක් එසමයෙහි සුඛ වේ ද යත්:

එසමයෙහි යම් කායික වූ සාතයෙක් කායික වූ සුඛයෙක් කාය-සංස්පර්ශයෙන් උපන් සාත වූ සුඛ වූ වේදයිතයෙක්, කායසංස්පර්ශයෙන් උපන් සාත වූ සුඛ වූ වේදනාවෙක් වේ ද, මේ එසමයෙහි සුඛ වේ.

451. කවරක් එසමයෙහි චිත්තෛකාග්‍රතා වේ ද යත්:
එසමයෙහි චිත්තයාගේ යම් ස්ථිතියෙක් ... මේ එසමයෙහි චිත්තෛ-කාග්‍රතා වේ.

452. කවරේක් එසමයෙහි මනින්ද්‍රිය වේ ද යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනයෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක්, මනයෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධ-යෙක් තදනුරූප කායවිඥානධාතුයෙක් වේ ද, මේ එසමයෙහි මනින්ද්‍රිය වේ.

453. කවරේක් එසමයෙහි සුඛෙන්ද්‍රිය වේ ද යත්:

එසමයෙහි යම් කායික වූ සාතයෙක් කායික වූ සුඛයෙක් කාය-සංස්පර්ශයෙන් උපන් සාත වූ සුඛ වූ වේදයිතයෙක්, කායසංස්පර්ශයෙන් උපන් සාත වූ සුඛ වූ වේදනාවෙක් වේ ද, මේ එසමයෙහි සුඛෙන්ද්‍රිය වේ.

454. කවරේක් එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වේ ද යත්:

ඒ අරූපීධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යැපීමෙක් යාපනයෙක් ඉරියව් පැවැත්මෙක් වැටුමෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ එසමයෙහි ජීවිතේන්ද්‍රිය වේ.

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, තීණින්ද්‍රියානි හොන්ති, එකො ඵස්සො හොති -පෙ- එකා කායවිඤ්ඤාණධාතු හොති, එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා -පෙ-

455. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා චිත්තස්සෙකග්ගතා ජීවිතින්ද්‍රියං. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති. -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

## කුසලවිපාකානි පඤ්චවිඤ්ඤාණානි.

### [කුසලවිපාකා මනොධාතු]

456. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොධාතු උප්පන්නා හොති උපෙක්ඛාසහගතා රූපාරම්මණා වා සද්දාරම්මණා වා ගන්ධාරම්මණා වා ඵොට්ඨබ්බාරම්මණා වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා.

457. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

458 කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාමනොධාතුසම්ඵස්සජං චෙතසිකං නෙවසාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, අයං තස්මිං සමයෙ වෙදනා හොති.

459. කතමා තස්මිං සමයෙ සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොධාතුසම්ඵස්සජා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං තස්මිං සමයෙ සඤ්ඤා හොති.

460. කතමා තස්මිං සමයෙ චෙතනා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොධාතුසම්ඵස්සජා චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං, අයං තස්මිං සමයෙ චෙතනා හොති.

තවද එසමයෙහි ස්කන්ධයෝ සතරදෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතූහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ තිදෙනෙක් වෙති, එක් මැ ස්පර්ශයෙක් වෙයි ... එක් මැ කායවිඥානධාතුයෙක් වෙයි, එක් මැ ධර්මායතනය වෙයි, එක් මැ ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි ...

455. කවරේක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය චිත්තෙකාග්‍රතා ය ජීවිතේන්ද්‍රිය යි. එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

**කුශලවිපාක පඤ්චවිඥානයෝ යි.**

**[කුශලවිපාකමනෝධාතු]**

456. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙක කාමාවචර කුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන ඇති වේවයි ශබ්දාලම්බන ඇති වේවයි ගන්ධාලම්බන ඇති වේවයි රසාලම්බන ඇති වේවයි ස්ප්‍රෂ්ටව්‍යාලම්බන ඇති වේවයි යමක් යමක් හෝ අරමුණු කොට උපේක්ෂාසහගත වූ විපාකමනෝධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි, වේදනාව වෙයි, සංඥාව වෙයි, චෙතනාව වෙයි, චිත්තය වෙයි, විතර්කය වෙයි, විචාරය වෙයි, උපෙක්ෂාව වෙයි, චිත්තෙකාග්‍රතාව වෙයි, මනින්ද්‍රිය වෙයි, උපේක්ෂෙන්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වෙයි. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

457. කවරේක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්: ...

එසමයෙහි යම් ස්පර්ශයෙක් ස්පර්ශකාරයෙක් මොනොවට ස්පර්ශ කරන අයුරෙක් මොනොවට ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශය වේ.

458. කවරක් එසමයෙහි වේදනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනොධාතුසංස්පර්ශයෙන් උපන් චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ යම් වේදයිතයෙක්, චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ යම් වේදනායෙක් වේ ද, මේ එසමයෙහි වේදනා වේ.

459. කවරක් එසමයෙහි සංඥා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනොධාතුසංස්පර්ශයෙන් උපන් යම් හැඳිනී-මෙක් හඳුනන අයුරෙක් හැඳිනගත් බවෙක් වේ ද, මේ එසමයෙහි සංඥා වේ.

460. කවරක් එසමයෙහි චෙතනා වෙයි යත්:

එසමයෙහි තදනුරූප වූ මනොධාතු සංස්පර්ශයෙන් උපන් යම් චෙතනායෙක් සංචෙතනායෙක් සිතන ලද බවෙක් වේ ද, මේ එසමයෙහි චෙතනා වේ.

461. කතමං තස්මිං සමයෙ චිත්තං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං, මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොධාතු, ඉදං තස්මිං සමයෙ චිත්තං හොති.

462. කතමො තස්මිං සමයෙ විතක්කො හොති?

යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා, අයං තස්මිං සමයෙ විතක්කො හොති.

463. කතමො තස්මිං සමයෙ විචාරො හොති?

යො තස්මිං සමයෙ චාරො විචාරො අනුවිචාරො උපවිචාරො චිත්තස්ස අනුසන්ධානතා අනුපෙක්ඛනතා, අයං තස්මිං සමයෙ විචාරො හොති.

464. කතමා තස්මිං සමයෙ උපෙක්ඛා හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, අයං තස්මිං සමයෙ උපෙක්ඛා හොති.

465. කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති?

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති -පෙ- අයං තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති.

466. කතමං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොධාතු, ඉදං තස්මිං සමයෙ මනින්ද්‍රියං හොති.

467. කතමං තස්මිං සමයෙ උපෙක්ඛින්ද්‍රියං හොති?

යං තස්මිං සමයෙ චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, ඉදං තස්මිං සමයෙ උපෙක්ඛින්ද්‍රියං හොති.

468. කතමං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති?

යං තෙසං අරූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තස්මිං සමයෙ ජීවිතින්ද්‍රියං හොති.

යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා.

461. කවරෙක් එසමයෙහි චිත්ත වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් සිතෙක් භවාඞ්ග සිතෙක්, මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥාන-ස්කන්ධයෙක් තදනුරූප වූ මනොධාතුයෙක් වේ ද, මේ එසමයෙහි චිත්ත වේ.

462. කවරෙක් එසමයෙහි විතර්ක වෙයි යත්:

එසමයෙහි යම් තර්කයෙක් විතර්කයෙක් සංකල්පයෙක් අර්පණායෙක් බලවත් අර්පණායෙක් සිත අරමුණුව නැඟීමෙක් වේ ද, මේ එසමයෙහි විතර්ක වේ.

463. කවරෙක් එසමයෙහි විචාර වෙයි යත්:

එසමයෙහි යම් චාරයෙක් විචාරයෙක් අනුවිචාරයෙක් උපවිචාරයෙක් (අරමුණෙහි) සිත ගලපන බවෙක් අනුප්‍රෙක්‍ෂණතායෙක් වේ ද, මේ එසමයෙහි විචාර වේ.

464. කවරක් එසමයෙහි උපෙක්‍ෂා වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්ත-සංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ වෙදයිතයෙක්, චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ වෙදනායෙක් වේ ද, මේ එසමයෙහි උපෙක්‍ෂා වේ.

465. කවරක් එසමයෙහි චිත්තෛකාග්‍රතා වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක් ... මේ එසමයෙහි චිත්තෛ-කාග්‍රතා වේ.

466. කවරෙක් එසමයෙහි මනින්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් ... තදනුරූපමනො-ධාතුයෙක් වේ ද, මේ එසමයෙහි මනින්ද්‍රිය වේ.

467. කවරෙක් එසමයෙහි උපෙක්ෂෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ නො මැ මිහිරි වූ අමිහිරි නො වූ චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ වෙදයිතයෙක්, චිත්ත-සංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වූ වෙදනායෙක් වේ ද, මේ එසමයෙහි උපෙක්ෂෙන්ද්‍රිය වේ.

468. කවරෙක් එසමයෙහි ජීවිතෙන්ද්‍රිය වෙයි යත්:

ඒ අරූපීධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යැපීමෙක් යාපනයෙක් ඉරියව් පැවැත්මෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රිය-යෙක් වේ ද, මේ එසමයෙහි ජීවිතේන්ද්‍රිය වේ.

තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපීධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති, ද්වායතනානි හොන්ති, ද්වෙ ධාතුයො හොන්ති, තයො ආහාරා හොන්ති, තීණි ඉන්ද්‍රියානි හොන්ති, එකො ඵස්සො හොති. -පෙ- එකා මනොධාතු හොති, එකං ධම්මායතනං හොති, එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා.

469. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා ජීවිතින්ද්‍රියං. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

## කුසලවිපාකා මනොධාතු.

### [කුසලවිපාකා මනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතා]

470. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති සොමනස්සසහගතා රූපාරම්මණා වා සද්දාරම්මණා වා ගන්ධාරම්මණා වා රසාරම්මණා වා ඵොට්ඨබ්බාරම්මණා වා ධම්මාරම්මණා වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, පීති හොති, සුඛං හොති, චිත්තස්සෙකග්ගතා හොති, මනින්ද්‍රියං හොති, සොමනස්සින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා.

471. කතමො තස්මිං සමයෙ ඵස්සො හොති?

යො තස්මිං සමයෙ ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං තස්මිං සමයෙ ඵස්සො හොති.

472. කතමා තස්මිං සමයෙ වෙදනා හොති?

යං තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, අයං තස්මිං සමයෙ වෙදනා හොති.

473. කතමා තස්මිං සමයෙ සඤ්ඤා හොති?

යා තස්මිං සමයෙ තජ්ජාමනොවිඤ්ඤාණධාතුසම්ඵස්සජා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං තස්මිං සමයෙ සඤ්ඤා හොති.

යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං, ඉදං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති -පෙ- යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා.

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති. ද්වායතනානි හොන්ති. ද්වෙ ධාතුයො හොන්ති. තයො ආහාරා හොන්ති. පඤ්චින්ද්‍රියානි හොන්ති. එකො ඵස්සො හොති. -පෙ- එකා මනොවිඤ්ඤාණධාතු හොති. එකං ධම්මායතනං හොති. එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අබ්‍යාකතා. -පෙ-

574. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අබ්‍යාකතා.

**කිරියාමනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතනිට්ඨිතං.**

570. කවරෙක් එසමයෙහි ස්පර්ශ වෙයි යත්:

එසමයෙහි යම් ස්පර්ශයෙක්, ස්පර්ශාකාරයෙක්, මොනොවට ස්පර්ශ කරන අයුරෙක්, මොනොවට ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ එසමයෙහි ස්පර්ශ වේ ...

671. කවරක් එසමයෙහි චිත්තෛකාග්‍රතා වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් (අරමුණෙහි) සිටීමෙක්, මොනොවට සිටීමෙක්, බැසගෙන සිටීමෙක්, නො විසිරීමෙක්, අවික්ෂෙපයෙක්, නො විසුල සිත ඇති බවෙක්, ශමථයෙක්, සමාධීන්ද්‍රියයෙක්, සමාධිබලයෙක් වේ ද, මේ එසමයෙහි චිත්තෛකාග්‍රතා වේ.

572. කවරෙක් එසමයෙහි වීර්‍ය්‍යෙන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි යම් චෛතසික වූ වීර්‍ය්‍යාරම්භයෙක්, නිෂ්ක්‍රමයෙක්, පරාක්‍රමයෙක්, උද්‍යමයෙක්, ව්‍යායාමයෙක්, උත්සාහයෙක්, අධිමාත්‍ර උත්සාහයෙක්, දෘඪපරාක්‍රමයෙක්, ධෛර්‍ය්‍යයෙක්, ස්ථිරපරාක්‍රමිතායෙක්, නො හැඹූ ඡන්දය ඇති බවෙක්, නො හැඹූ වීර්‍ය්‍යධුර ඇති බවෙක්, වීර්‍ය්‍යය දැඩි ව ගැනීමෙක්, වීර්‍ය්‍යයෙක්, වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක්, වීර්‍ය්‍යබලයෙක් වේ ද, මේ එසමයෙහි වීර්‍ය්‍යෙන්ද්‍රිය වේ.

573. කවරෙක් එසමයෙහි සමාධීන්ද්‍රිය වෙයි යත්:

එසමයෙහි චිත්තයාගේ යම් සිටීමෙක්, මොනොවට සිටීමෙක්, බැසගෙන සිටීමෙක්, නො විසිරීමෙක්, අවික්ෂෙපයෙක්, නො විසුල සිත ඇති බවෙක්, ශමථයෙක්, සමාධීන්ද්‍රියයෙක්, සමාධිබලයෙක් වේ ද, මේ එසමයෙහි සමාධීන්ද්‍රිය වේ, තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

තවද එසමයෙහි ස්කන්ධයෝ සතර දෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතුහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති, එක් ම ස්පර්ශයෙක් වෙයි ... එක් ම මනොවිඥානධාතුයෙක් වෙයි, එක් ම ධර්මායතනය වෙයි, එක් ම ධර්මධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපි ධර්ම කෙනෙක් ඇද්ද, මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි ...

574. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පර්ශ ය චේතනා ය විතර්ක ය විචාර ය ප්‍රීති ය චිත්තෛකාග්‍රතා ය, වීර්‍ය්‍යෙන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥාස්කන්ධය තබා විඥානස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධර්ම කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාරස්කන්ධ වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

**ක්‍රියාමනෝවිඥානධාතු සෞමනස්සසහගත චිත්තය යි.**

[කිරියාමනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතචිත්තං.]

575. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා උපෙක්ඛාසහගතා රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති, වෙදනා හොති, සඤ්ඤා හොති, චෙතනා හොති, චිත්තං හොති, විතක්කො හොති, විචාරො හොති, උපෙක්ඛා හොති, චිත්තස්සෙකග්ගතා හොති, විරියින්ද්‍රියං හොති, සමාධින්ද්‍රියං හොති, මනින්ද්‍රියං හොති, උපෙක්ඛින්ද්‍රියං හොති, ජීවිතින්ද්‍රියං හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා. -පෙ-

තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති ද්වායතනානි හොන්ති. ද්වෙ ධාතුයො හොන්ති. තයො ආහාරා හොන්ති. පඤ්චින්ද්‍රියානි හොන්ති එකො ඵස්සො හොති. -පෙ- එකා මනොවිඤ්ඤාණධාතු හොති. එකං ධම්මායතනං හොති. එකා ධම්මධාතු හොති. යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා, ඉමෙ ධම්මා අව්‍යාකතා. -පෙ-

576. කතමො තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති?

ඵස්සො චෙතනා විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්ච සමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං ඨපෙත්වා සඤ්ඤාක්ඛන්ධං ඨපෙත්වා විඤ්ඤාණක්ඛන්ධං, අයං තස්මිං සමයෙ සඞ්ඛාරක්ඛන්ධො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

කිරියාමනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතචිත්තං.

[කාමාවචරකිරියා.]

577. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා සොමනස්සසහගතා ඤාණසම්පයුත්තා රූපාරම්මණං වා -පෙ- යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා -පෙ- අලොභො අව්‍යාකතමූලං -පෙ- අදොසො අව්‍යාකතමූලං -පෙ- අමොහො අව්‍යාකතමූලං -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

## [ක්‍රියාමනොවිඥ්ඤාණධාතු උපෙක්ඛාසහගත චිත්තය]

575. කවර ධම්යෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි, ... ධම්ාලම්බන වේවයි, යන් යමක් යමක් හෝ අරමුණු කොට ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කම්විපාක වූ උපෙක්ෂාසහගත වූ මනොවිඥනධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පශ්ය වෙයි, වේදනාව වෙයි, සංඥව වෙයි, චේතනාව වෙයි, චිත්තය වෙයි, විතකීය වෙයි, විචාරය වෙයි, උපෙක්‍ෂාව වෙයි, චිත්තෛකාග්‍රතාව වෙයි, වීයෙ‍්‍යීන්ද්‍රිය වෙයි, සමාධීන්ද්‍රිය වෙයි, මනින්ද්‍රිය වෙයි, උපෙක්ඛින්ද්‍රිය වෙයි, ජීවිතෙන්ද්‍රිය වේ, තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධම් කෙනෙක් ඇද්ද, මේ ධම්යෝ අව්‍යාකෘතයෝ යි. ...

තවද එසමයෙහි ස්කන්ධයෝ සතරදෙනෙක් වෙති, ආයතනයෝ දෙදෙනෙක් වෙති, ධාතුහු දෙදෙනෙක් වෙති, ආහාරයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති, එක් ම ස්පශ්යෙක් වෙයි ... එක් මනොවිඥනධාතුයෙක් වෙයි, එක් ම ධම්ායතනය වෙයි, එක් ම ධම්ධාතුව වේ. තවද එසමයෙහි අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධම් කෙනෙක් ඇද්ද, මේ ධම්යෝ අව්‍යාකෘතයෝ යි ...

576. කවරෙක් එසමයෙහි සංස්කාරස්කන්ධ වෙයි යත්:

ස්පශ් ය චේතනා ය විතක් ය විචාර ය චිත්තෛකාග්‍රතා ය වීයෙ‍්‍යීන්ද්‍රිය ය සමාධීන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, තවද එසමයෙහි වේදනාස්කන්ධය තබා සංඥස්කන්ධය තබා විඥනස්කන්ධය තබා අන්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ යම් අරූපිධම් කෙනෙක් ඇද්ද, මේ එසමයෙහි සංස්කාර ස්කන්ධ වේ ... මේ ධම්යෝ අව්‍යාකෘතයෝ යි.

ක්‍රියාමනෝවිඥනධාතු උපේක්‍ෂාසහගත චිත්තය යි.

## [කාමාවචරක්‍රියා]

577. කවර ධම්යෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි ... යන් යමක් යමක් හෝ අරමුණු කොට ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කම්විපාක වූ සොමනස් සහගත ඥනසම්ප්‍රයුක්ත වූ මනොවිඥනධාතුව උපදනේ වේ ද, එසමයෙහි ස්පශ්ය වෙයි ... අවික්‍ෂෙපය වෙයි ... මේ ධම්යෝ අව්‍යාකෘතයෝ යි ... අලොභ සඞ්ඛ්‍යාත අව්‍යාකෘතමූල යැ ... අදොස සඞ්ඛ්‍යාත අව්‍යාකෘතමූල යැ ... අමොහ සඞ්ඛ්‍යාත අව්‍යාකෘතමූල යැ ... මේ ධම්යෝ අව්‍යාකෘතයෝ යි.

578. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා සොමනස්සසහගතා ඤාණසම්පයුත්තා සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- සොමනස්සසහගතා ඤාණවිප්පයුත්තා -පෙ- සොමනස්සසහගතා ඤාණවිප්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතා ඤාණසම්පයුත්තා -පෙ- උපෙක්ඛාසහගතා ඤාණසම්පයුත්තා සසඞ්ඛාරෙන -පෙ- උපෙක්ඛාසහගතා ඤාණවිප්පයුත්තා -පෙ- උපෙක්ඛාසහගතා ඤාණවිප්පයුත්තා සසඞ්ඛාරෙන රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා, යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා -පෙ- අලොභො අව්‍යාකතමූලං -පෙ- අදොසො අව්‍යාකතමූලං -පෙ-[1] ඉමෙ ධම්මා අව්‍යාකතා.

කාමාවචරකිරියා.

[රූපාවචරකිරියා]

579. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ රූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති පථවීකසිණං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

580. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ රූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- පඨමං ඣානං -පෙ- පඤ්චමං ඣානං උපසම්පජ්ජ විහරති පථවීකසිණං, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

රූපාවචරකිරියා.

[අරූපාවචරකිරියා]

581. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ අරූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං, සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

---

1. අමොහො අව්‍යාකතමූලං -පෙ- PTS.

578. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙකැ රූපාලම්බන වේවයි ... ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ සෞමනස්‍ය සහගත ඥානසම්ප්‍රයුක්ත වූ මනොවිඥානධාතුව සංස්කාර සහිත වැ ... සෞමනස්‍ය සහගත ඥාන-විප්‍රයුක්ත ... සෞමනස්‍ය සහගත ඥානවිප්‍රයුක්ත (මනොවිඥාන ධාතුව) සංස්කාර සහිත වැ ... උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත ... උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත (මනොවිඥානධාතුව) සංස්කාර සහිත ව ... උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත ... රූපාලම්බන වේවයි ... ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ අරමුණු කොට උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත (මනොවිඥානධාතුව) උපදනේ වේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වෙයි ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි ... අලෝභ සඞ්ඛ්‍යාත අව්‍යාකෘතමූල ය ... අද්වේෂ සඞ්ඛ්‍යාත අව්‍යාකෘතමූල ය ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

කාමාවචරක්‍රියා යි.

[රූපාවචරක්‍රියා]

579. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙකැ ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්ම සුඛවිහරණ ඇති රූපාවචරධ්‍යානය වඩා ද, කාම-යන්ගෙන් වෙන් ව ම ... පෘථිවීකසිණ සඞ්ඛ්‍යාත ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

580. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙකැ ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්ම සුඛවිහරණ ඇති රූපාවචරධ්‍යානය වඩා ද, විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ප්‍රථමධ්‍යානයට ... පෘථිවීකසිණ සඞ්ඛ්‍යාත පඤ්චමධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

රූපාවචරක්‍රියා යි.

[අරූපාවචරක්‍රියා]

581. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙකැ ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්ම සුඛවිහරණ ඇති අරූපාවචර ධ්‍යානය වඩා ද, සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්ත-ඞ්ගමයෙන්, නානාත්ව සංඥාවන්ගේ නො මෙනෙහි කිරීමෙන්, ආකාසානඤ්චා-යතන සහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

582. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ අරූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං, සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

583. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ අරූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

584. කතමෙ ධම්මා අව්‍යාකතා?

යස්මිං සමයෙ අරූපාවචරං ඣානං භාවෙති කිරියං නෙව කුසලං නාකුසලං න ච කම්මවිපාකං දිට්ඨධම්මසුඛවිහාරං, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා -පෙ- අලොභො අව්‍යාකතමූලං -පෙ- අදොසො අව්‍යාකතමූලං -පෙ- අමොහො අව්‍යාකතමූලං -පෙ- ඉමෙ ධම්මා අව්‍යාකතා.

අරූපාවචරකිරියා.

චිත්තුප්පාදකණ්ඩං.

582. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙක්‍හි ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්මසුඛවිහරණ ඇති අරූපාවචරධ්‍යානය වඩා ද, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම විඤ්ඤාණඤ්චායතන සංඥා සහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

583. කවර, ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙක්‍හි ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්මසුඛවිහරණ ඇති අරූපාවචරධ්‍යානය වඩා ද, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම ආකිඤ්චඤ්ඤායතන සංඥා සහගත වූ සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

584. කවර, ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

යම් කලෙක්‍හි ක්‍රියාමාත්‍ර වූ නො ම කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ ඉහාත්මසුඛවිහරණ ඇති අරූපාවචරධ්‍යානය වඩා ද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥා සහගත වූ, සුඛයාගේ ද ප්‍රහාණයෙන් ... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, එසමයෙහි ස්පර්ශය වෙයි ... අවික්ෂෙපය වේ ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි ... අලෝභ සඞ්ඛ්‍යාත අව්‍යාකෘතමූල ය ... අද්වේෂ සඞ්ඛ්‍යාත අව්‍යාකෘත මූල ය ... අමෝහ සඞ්ඛ්‍යාත අව්‍යාකෘතමූල ය ... මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි

අරූපාවචරක්‍රියා යි.

චිත්තොත්පාදකාණ්ඩය නිමි.

# 2. රූපකණ්ඩං

585. කතමෙ ධම්මා අබ්‍යාකතා?

කුසලාකුසලානං ධම්මානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, යෙ ච ධම්මා කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා, සබ්බඤ්ච රූපං අසඞ්ඛතා ච ධාතු. ඉමෙ ධම්මා අබ්‍යාකතා.

[මාතිකා]

586. තත්ථ කතමං සබ්බං රූපං?

චත්තාරො ච මහාභූතා, චතුන්නඤ්ච මහාභූතානං උපාදායරූපං, ඉදං වුච්චති සබ්බං රූපං.

587. එකවිධෙන රූපසඞ්ගහො:

සබ්බං රූපං න හෙතු අහෙතුකං හෙතුවිප්පයුත්තං සප්පච්චයං සඞ්ඛතං රූපී[1] ලොකියං සාසවං සඤ්ඤොජනියං ගන්ථනියං ඔඝනියං යොගනියං[2] නීවරණියං පරාමට්ඨං උපාදානියං සඞ්කිලෙසිකං අබ්‍යාකතං අනාරම්මණං අචෙතසිකං චිත්තවිප්පයුත්තං නෙවවිපාකනවිපාකධම්මධම්මං අසඞ්කිලිට්ඨසඞ්කිලෙසිකං න සවිතක්කසවිචාරං න අවිතක්කවිචාරමත්තං අවිතක්කඅවිචාරං න පීතිසහගතං න සුඛසහගතං න උපෙක්ඛාසහගතං නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බං නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකං නෙව ආචයගාමි න අපචයගාමි නෙව සෙක්ඛං නාසෙක්ඛං පරිත්තං කාමාවචරං න රූපාවචරං න අරූපාවචරං පරියාපන්නං නො අපරියාපන්නං අනියතං අනිය්‍යානිකං උප්පන්නං ඡහි විඤ්ඤාණෙහි විඤ්ඤෙය්‍යං අනිච්චං ජරාභිභූතං, එවං එකවිධෙන රූපසඞ්ගහො.

එකකං.

588. දුවිධෙන රූපසඞ්ගහො:

අත්ථි රූපං උපාදා, අත්ථිරූපං නො උපාදා

අත්ථි රූපං උපාදින්නං, අත්ථි රූපං අනුපාදින්නං.

අත්ථි රූපං උපාදින්නුපාදානියං, අත්ථි රූපං අනුපාදින්නුපාදානියං.

අත්ථි රූපං සනිදස්සනං, අත්ථි රූපං අනිදස්සනං.

අත්ථි රූපං සප්පටිඝං, අත්ථි රූපං අප්පටිඝං.

1. රූපියං - සිමු. 3. PTS. රූපං - සිමු. 1, මජසං.
2. යොගනියං - සිමු. 1, 3, මජසං. PTS.

## 2. රූපකාණ්ඩය

585. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

කාමාවචර වූ රූපාවචර වූ අරූපාවචර වූ අපරියාපන්න වූ කුශලාකුශලධර්මයන්ගේ විපාකයෝ ය, වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, විඥානස්කන්ධ ය, නො ම කුශල වූ අකුශල නො වූ නො ද කර්මවිපාක වූ යම් ක්‍රියාධර්ම කෙනෙක් වෙත් ද, හැම රූපය ද, අසංඛත ධාතුව ද යන මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

586. එහි හැම රූපය කවරේ යත්:

සතර මහාභූතයෝ ද, සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද යන මේ හැම රූප යයි කියනු ලැබේ.

587. එක් කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

හැම රූපය නහේතු ය, අහේතුක ය, හේතුවිප්‍රයුක්ත ය, සප්‍රත්‍යය ය, සංඛත ය, රූපවත් ය, ලෞකික ය, සාස්‍රව ය, සංයෝජනීය ය, ග්‍රන්ථනීය ය. ඕඝනීය ය, යෝගනීය ය, නීවරණීය ය, පරාමෘෂ්ට ය, උපාදානීය ය, සාංක්ලේශික ය, අව්‍යාකෘත ය, අනාලම්බන ය, අචෛතසික ය, චිත්තවිප්‍රයුක්ත ය, නෛවවිපාකනවිපාකධර්මධර්ම ය, අසංක්ලිෂ්ටසාංක්ලේශික ය, නසවිතර්කසවිචාර ය, නඅවිතර්කවිචාරමාත්‍ර ය, අවිතර්කඅවිචාර ය, නප්‍රීතිසහගත ය, නසුඛසහගත ය, නඋපෙක්ෂා සහගත ය, නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය ය, නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යහේතුක ය, නො ම ආචයගාමී නො ද අපචයගාමී ය, නො ම ශෛක්ෂ නාශෛක්ෂ ය, පරිත්ත ය, කාමාවචර ය, නරූපාවචර ය, නඅරූපාවචර ය, පරියාපන්න ය, නො ම අපරියාපන්න ය, අනියත ය, අනෛර්‍යාණික ය, උත්පන්න ය, ෂඩ්විඥානයෙන් විඥෙය ය, අනිත්‍ය ය, ජරාභිභූත යි. මෙසේ එක් කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

එකක යි.

588. දෙකොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

උපාදාරූපයෙක් ඇත, උපාදා නො වූ රූපයෙක් ඇත.

උපාදින්නරූපයෙක් ඇත, අනුපාදින්නරූපයෙක් ඇත.

උපාදින්නෝපාදානීය රූපයෙක් ඇත, අනුපාදින්නෝපාදානීය රූපයෙක් ඇත;

සනිදර්ශනරූපයෙක් ඇත, අනිදර්ශනරූපයෙක් ඇත.

සප්‍රතිඝරූපයෙක් ඇත, අප්‍රතිඝරූපයෙක් ඇත.

අත්ථි රූපං ඉන්ද්‍රියං, අත්ථි රූපං න ඉන්ද්‍රියං.

අත්ථි රූපං මහාභූතං, අත්ථි රූපං න මහාභූතං.

අත්ථි රූපං විඤ්ඤත්ති, අත්ථි රූපං න විඤ්ඤත්ති.

අත්ථි රූපං චිත්තසමුට්ඨානං, අත්ථි රූපං න චිත්තසමුට්ඨානං.

අත්ථි රූපං චිත්තසහභූ, අත්ථි රූපං න චිත්තසහභූ.

අත්ථි රූපං චිත්තානුපරිවත්ති, අත්ථි රූපං න චිත්තානුපරිවත්ති.

අත්ථි රූපං අජ්ඣත්තිකං, අත්ථි රූපං බාහිරං.

අත්ථි රූපං ඔළාරිකං, අත්ථි රූපං සුඛුමං.

අත්ථි රූපං දූරෙ, අත්ථි රූපං සන්තිකෙ.

### පකිණ්ණකදුකං. (14)

අත්ථි රූපං චක්ඛුසම්ඵස්සස්ස වත්ථු, අත්ථි රූපං චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු. අත්ථි රූපං චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථු, අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු.

අත්ථි රූපං සොතසම්ඵස්සස්ස -පෙ- ඝානසම්ඵස්සස්ස -පෙ- ජිව්හාසම්ඵස්සස්ස -පෙ- කායසම්ඵස්සස්ස වත්ථු, අත්ථි රූපං කායසම්ඵස්සස්ස න වත්ථු. අත්ථි රූපං කායසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- කායවිඤ්ඤාණස්ස වත්ථු, අත්ථි රූපං කායවිඤ්ඤාණස්ස න වත්ථු

### වත්ථුදුකං. (25)

අත්ථි රූපං චක්ඛුසම්ඵස්සස්ස ආරම්මණං, අත්ථි රූපං චක්ඛුසම්ඵස්සස්ස නාරම්මණං. අත්ථි රූපං චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණං, අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස නාරම්මණං.

අත්ථි රූපං සොතසම්ඵස්සස්ස -පෙ- ඝානසම්ඵස්සස්ස -පෙ- ජිව්හාසම්ඵස්සස්ස -පෙ- කායසම්ඵස්සස්ස ආරම්මණං, අත්ථි රූපං කායසම්ඵස්සස්ස නාරම්මණං. අත්ථි රූපං කායසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- කායවිඤ්ඤාණස්ස ආරම්මණං, අත්ථි රූපං කායවිඤ්ඤාණස්ස නාරම්මණං.

### ආරම්මණදුකං. (25)

ඉන්ද්‍රියරූපයෙක් ඇත, ඉන්ද්‍රිය නො වූ රූපයෙක් ඇත.

මහාභූත රූපයෙක් ඇත, මහාභූත නො වූ රූපයෙක් ඇත.

විඤ්ඤත්තිරූපයෙක් ඇත, විඤ්ඤත්ති නො වූ රූපයෙක් ඇත.

චිත්තසමුට්ඨානරූපයෙක් ඇත, චිත්තසමුට්ඨාන නො වූ රූපයෙක් ඇත

සිත සමග උපන් රූපයෙක් ඇත, සිත සමග නූපන් රූපයෙක් ඇත.

චිත්තානුපරිවර්ති වූ රූපයෙක් ඇත, චිත්තානුපරිවර්ති නො වූ රූපයෙක් ඇත.

ආධ්‍යාත්මිකරූපයෙක් ඇත, බාහ්‍යරූපයෙක් ඇත.

ඖදාරික රූපයෙක් ඇත, සූක්ෂ්මරූපයෙක් ඇත.

දූරෙ රූපයෙක් ඇත, සන්තිකෙ රූපයෙක් ඇත.

### ප්‍රකීර්ණකදුක යි. (14)

චක්ඛුසම්ඵස්සයට වස්තු වූ රූපයෙක් ඇත, චක්ඛු සම්ඵස්සයට වස්තු නො වූ රූපයෙක් ඇත. චක්ඛුසම්ඵස්සජ වූ වෙදනාවට ... සංඥාවට ... චෙතනාවට ... චක්ෂුර්විඥානයට වස්තු වූ රූපයෙක් ඇත, චක්ෂුර්විඥානට වස්තු නො වූ රූපයෙක් ඇත.

සොතසම්ඵස්සයට ... ඝානසම්ඵස්සයට ... ජිව්හාසම්ඵස්සයට ... කායසම්ඵස්සයට වස්තු වූ රූපයෙක් ඇත. කායසම්ඵස්සයට වස්තු නො වූ රූපයෙක් ඇත. කායසම්ඵස්සජවෙදනාවට ... සංඥාවට ... චෙතනාවට ... කායවිඥානයට වස්තු වූ රූපයෙක් ඇත, කායවිඥානයට වස්තු නො වූ රූපයෙක් ඇති.

### වස්තුදුක යි. (25)

චක්ඛුසම්ඵස්සයට අරමුණු වූ රූපයෙක් ඇත, චක්ඛුසම්ඵස්සයට අරමුණු නො වූ රූපයෙක් ඇත. චක්ඛුසම්ඵස්සජවෙදනාවට ... සංඥාවට ... චෙතනාවට ... චක්ඛුවිඤ්ඤාණයට අරමුණු වූ රූපයෙක් ඇත, චක්ඛුවිඤ්ඤාණයට අරමුණු නො වූ රූපයෙක් ඇත.

සොතසම්ඵස්සයට ... ඝානසම්ඵස්සයට ... ජිව්හාසම්ඵස්සයට ... කායසම්ඵස්සයට අරමුණු වූ රූපයෙක් ඇත, කායසම්ඵස්සයට අරමුණු නො වූ රූපයෙක් ඇත. කායසම්ඵස්සජවෙදනාවට ... සංඥාවට ... චෙතනාවට ... කායවිඤ්ඤාණයට අරමුණු වූ රූපයෙක් ඇත, කායවිඤ්ඤාණයට අරමුණු නො වූ රූපයෙක් ඇති.

### ආලම්බනදුක යි. (25)

අත්ථි රූපං චක්ඛායතනං, අත්ථි රූපං න චක්ඛායතනං.

අත්ථි රූපං සෝතායතනං -පෙ- ඝානායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං, අත්ථි රූපං න කායායතනං.

අත්ථි රූපං රූපායතනං, අත්ථි රූපං න රූපායතනං.

අත්ථි රූපං සද්දායතනං, අත්ථි රූපං න සද්දායතනං.

අත්ථි රූපං ගන්ධායතනං, අත්ථි රූපං න ගන්ධායතනං.

අත්ථි රූපං රසායතනං, අත්ථි රූපං න රසායතනං.

අත්ථි රූපං ඵොට්ඨබ්බායතනං, අත්ථි රූපං න ඵොට්ඨබ්බායතනං.

ආයතනදුකං. (10)

අත්ථි රූපං චක්ඛු ධාතු, අත්ථි රූපං න චක්ඛුධාතු.

අත්ථි රූපං සෝතධාතු, අත්ථි රූපං න සෝතධාතු.

අත්ථි රූපං ඝානධාතු, අත්ථි රූපං න ඝානධාතු.

අත්ථි රූපං ජිව්හාධාතු, අත්ථි රූපං න ජිව්හාධාතු.

අත්ථි රූපං කායධාතු, අත්ථි රූපං න කායධාතු.

අත්ථි රූපං රූපධාතු, අත්ථි රූපං න රූපධාතු

අත්ථි රූපං සද්දධාතු, අත්ථි රූපං න සද්දධාතු.

අත්ථි රූපං ගන්ධධාතු, අත්ථි රූපං න ගන්ධධාතු.

අත්ථි රූපං රසධාතු, අත්ථි රූපං න රසධාතු.

අත්ථි රූපං ඵොට්ඨබ්බධාතු, අත්ථි රූපං න ඵොට්ඨබ්බධාතු.

ධාතුදුකං. (10)

අත්ථි රූපං චක්ඛුන්ද්‍රියං, අත්ථි රූපං න චක්ඛුන්ද්‍රියං.

අත්ථි රූපං සෝතින්ද්‍රියං, අත්ථි රූපං න සෝතින්ද්‍රියං.

අත්ථි රූපං ඝානින්ද්‍රියං, අත්ථි රූපං න ඝානින්ද්‍රියං.

අත්ථි රූපං ජිව්හින්ද්‍රියං, අත්ථි රූපං න ජිව්හින්ද්‍රියං.

අත්ථි රූපං කායින්ද්‍රියං, අත්ථි රූපං න කායින්ද්‍රියං.

අත්ථි රූපං ඉත්ථින්ද්‍රියං, අත්ථි රූපං න ඉත්ථින්ද්‍රියං.

අත්ථි රූපං පුරිසින්ද්‍රියං, අත්ථි රූපං න පුරිසින්ද්‍රියං.

අත්ථි රූපං ජීවිතින්ද්‍රියං, අත්ථි රූපං න ජීවිතින්ද්‍රියං.

ඉන්ද්‍රියදුකං. (8)

චක්ඛායතන රූපයෙක් ඇත, චක්ඛායතන නො වූ රූපයෙක් ඇත.

සොතායතන ... ඝානායතන ... ජිව්හායතන ... කායායතනරූපයෙක් ඇත, කායායතන නො වූ රූපයෙක් ඇත.

රූපායතන වූ රූපයෙක් ඇත, රූපායතන නො වූ රූපයෙක් ඇත.

ශබ්දායතනරූපයෙක් ඇත, ශබ්දායතන නො වූ රූපයෙක් ඇත.

ගන්ධායතනරූපයෙක් ඇත, ගන්ධායතන නො වූ රූපයෙක් ඇත.

රසායතනරූපයෙක් ඇත, රසායතන නො වූ රූපයෙක් ඇත.

ඵොට්ඨබ්බායතනරූපයෙක් ඇත, ඵොට්ඨබ්බායතන නො වූ රූපයෙක් ඇති.

### ආයතන ද්‍රික සි. (10)

චක්ඛුධාතුරූපයෙක් ඇත, චක්ඛුධාතු නො වූ රූපයෙක් ඇත.

සොතධාතු රූපයෙක් ඇත, සොතධාතු නො වූ රූපයෙක් ඇත.

ඝානධාතුරූපයෙක් ඇත, ඝානධාතු නො වූ රූපයෙක් ඇත.

ජිව්හාධාතුරූපයෙක් ඇත, ජිව්හාධාතු නො වූ රූපයෙක් ඇත.

කායධාතුරූපයෙක් ඇත, කායධාතු නො වූ රූපයෙක් ඇත.

රූපධාතුරූපයෙක් ඇත, රූපධාතු නො වූ රූපයෙක් ඇත.

ශබ්දධාතුරූපයෙක් ඇත, ශබ්දධාතු නො වූ රූපයෙක් ඇත.

ගන්ධධාතුරූපයෙක් ඇත, ගන්ධධාතු නො වූ රූපයෙක් ඇත.

රසධාතුරූපයෙක් ඇත, රසධාතු නො වූ රූපයෙක් ඇත.

සප්‍රෂ්ටව්‍යධාතුරූපයෙක් ඇත, සප්‍රෂ්ටව්‍යධාතු නො වූ රූපයෙක් ඇති.

### ධාතු ද්‍රික සි. (10)

චක්ෂුරින්ද්‍රියරූපයෙක් ඇත, චක්ෂුරින්ද්‍රිය නො වූ රූපයෙක් ඇත.

ශ්‍රොත්‍රෙන්ද්‍රියරූපයෙක් ඇත, ශ්‍රොත්‍රෙන්ද්‍රිය නො වූ රූපයෙක් ඇත.

ඝ්‍රාණෙන්ද්‍රියරූපයෙක් ඇත, ඝ්‍රාණෙන්ද්‍රිය නො වූ රූපයෙක් ඇත.

ජිහ්වෙන්ද්‍රියරූපයෙක් ඇත, ජිහ්වෙන්ද්‍රිය නො වූ රූපයෙක් ඇත.

කායෙන්ද්‍රියරූපයෙක් ඇත, කායෙන්ද්‍රිය නො වූ රූපයෙක් ඇත.

ස්ත්‍රීන්ද්‍රියරූපයෙක් ඇත, ස්ත්‍රීන්ද්‍රිය නො වූ රූපයෙක් ඇත.

පුරුෂෙන්ද්‍රියරූපයෙක් ඇත, පුරුෂෙන්ද්‍රිය නො වූ රූපයෙක් ඇත.

ජීවිතෙන්ද්‍රියරූපයෙක් ඇත, ජීවිතෙන්ද්‍රිය නො වූ රූපයෙක් ඇති.

### ඉන්ද්‍රිය ද්‍රික සි. (8)

අත්ථි රූපං කායවිඤ්ඤත්ති, අත්ථි රූපං න කායවිඤ්ඤත්ති.

අත්ථි රූපං වචීවිඤ්ඤත්ති, අත්ථි රූපං න වචීවිඤ්ඤත්ති.

අත්ථි රූපං ආකාසධාතු, අත්ථි රූපං න ආකාසධාතු.

අත්ථි රූපං ආපොධාතු, අත්ථි රූපං න ආපොධාතු.

අත්ථි රූපං රූපස්ස ලහුතා, අත්ථි රූපං රූපස්ස න ලහුතා.

අත්ථි රූපං රූපස්ස මුදුතා, අත්ථි රූපං රූපස්ස න මුදුතා.

අත්ථි රූපං රූපස්ස කම්මඤ්ඤතා, අත්ථි රූපං රූපස්ස න කම්මඤ්ඤතා.

අත්ථි රූපං රූපස්ස උපචයො, අත්ථි රූපං රූපස්ස න උපචයො.

අත්ථි රූපං රූපස්ස සන්තති, අත්ථි රපං රූපස්ස න සන්තති.

අත්ථි රූපං රූපස්ස ජරතා, අත්ථි රූපං රූපස්ස න ජරතා.

අත්ථි රූපං රූපස්ස අනිච්චතා, අත්ථි රූපං රූපස්ස න අනිච්චතා.

අත්ථි රූපං කබළීකාරො ආහාරො, අත්ථි රූපං න කබළීකාරො ආහාරො.

එවං දුවිධෙන රූපසඞ්ගහො.

[සුඛුමරූපදුකං. 12]

දුකං.

584. තිවිධෙන රූපසඞ්ගහො:

යං තං රූපං අජ්ඣත්තිකං තං උපාදා. යං තං රූපං බාහිරං තං අත්ථි උපාදා, අත්ථි නො උපාදා.

යං තං රූපං අජ්ඣත්තිකං තං උපාදින්නං. යං තං රූපං බාහිරං තං අත්ථි උපාදින්නං, අත්ථි අනුපාදින්නං.

යං තං රූපං අජ්ඣත්තිකං තං උපාදින්නුපාදානියං. යං තං රූපං බාහිරං තං අත්ථි උපාදින්නුපාදානියං, අත්ථි අනුපාදින්නුපාදානියං.

යං තං රූපං අජ්ඣත්තිකං තං අනිදස්සනං. යං තං රූපං බාහිරං තං අත්ථි සනිදස්සනං, අත්ථි අනිදස්සනං.

කායවිඤ්ඤත්තිරූපයෙක් ඇත, කායවිඤ්ඤත්ති නො වූ රූපයෙක් ඇත.

වාග්විඤ්ඤප්තිරූපයෙක් ඇත, වාග්විඤ්ඤප්ති නො වූ රූපයෙක් ඇත.

ආකාශධාතුරූපයෙක් ඇත, ආකාශධාතු නො වූ රූපයෙක් ඇත.

අබ්ධාතුරූපයෙක් ඇත, අබ්ධාතු නො වූ රූපයෙක් ඇත.

රූපයාගේ ලඝුත්වරූපයෙක් ඇත, රූපයාගේ ලඝුත්ව නො වූ රූපයෙක් ඇත;

රූපයාගේ මෘදුත්වරූපයෙක් ඇත, රූපයාගේ මෘදුත්ව නො වූ රූපයෙක් ඇත.

රූපයාගේ කර්මණ්‍යතා රූපයෙක් ඇත, රූපයාගේ කර්මණ්‍යතා නො වූ රූපයෙක් ඇත.

රූපයාගේ උපචයරූපයෙක් ඇත, රූපයාගේ උපචය නො වූ රූපයෙක් ඇත.

රූපයාගේ සන්තතිරූපයෙක් ඇත, රූපයාගේ සන්තති නො වූ රූපයෙක් ඇත.

රූපයාගේ ජරතාරූපයෙක් ඇත, රූපයාගේ ජරතා නො වූ රූපයෙක් ඇත.

රූපයාගේ අනිත්‍යතාරූපයෙක් ඇත, රූපයාගේ අනිත්‍යතා නො වූ රූපයෙක් ඇත.

කවලීකාරාහාරරූපයෙක් ඇත, කවලීකාරාහාර නො වූ රූපයෙක් ඇති.

මෙසේ දෙකොටසින් රූපසඞ්ග්‍රහය වේ.

[සූක්ෂ්මරූප දුක සි. 12]

දුවිකය යි.

589. තුන් කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එ උපාදාරූප ය. යම් බාහිරරූපයෙක් වේ ද එ උපාදාවූයේ ඇත, උපාදා නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එ උපාදින්න ය. යම් බාහිර රූපයෙක් වේ ද එය උපදින්න වූයේ ඇත, අනුපාදින්න වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය උපාදින්නුපාදානීය ය. යම් බාහිර රූපයෙක් වේ ද එය උපාදින්නුපාදානීය වූයේ ඇත, අනුපාදින්නුපාදානීය වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය අනිදර්ශන ය. යම් බාහිර රූපයෙක් වේ ද එය සනිදර්ශන වූයේ ඇත, අනිදර්ශන වූයේ ඇති.

යං තං රූපං අජ්ඣත්තිකං තං සප්පටිඝං. යං තං රූපං බාහිරං තං අත්ථි සප්පටිඝං, අත්ථි අප්පටිඝං.

යං තං රූපං අජ්ඣත්තිකං තං ඉන්ද්‍රියං. යං තං රූපං බාහිරං තං අත්ථි ඉන්ද්‍රියං, අත්ථි න ඉන්ද්‍රියං.

යං තං රූපං අජ්ඣත්තිකං තං න මහාභූතං. යං තං රූපං බාහිරං තං අත්ථි මහාභූතං, අත්ථි න මහාභූතං.

යං තං රූපං අජ්ඣත්තිකං තං න විඤ්ඤත්ති. යං තං රූපං බාහිරං තං අත්ථි විඤ්ඤත්ති, අත්ථි න විඤ්ඤත්ති.

යං තං රූපං අජ්ඣත්තිකං තං න චිත්තසමුට්ඨානං. යං තං රූපං බාහිරං තං අත්ථි චිත්තසමුට්ඨානං, අත්ථි න චිත්තසමුට්ඨානං.

යං තං රූපං අජ්ඣත්තිකං තං න චිත්තසහභූ. යං තං රූපං බාහිරං තං අත්ථි චිත්තසහභූ, අත්ථි න චිත්තසහභූ.

යං තං රූපං අජ්ඣත්තිකං තං න චිත්තානුපරිවත්ති. යං තං රූපං බාහිරං තං අත්ථි චිත්තානුපරිවත්ති, අත්ථි න චිත්තානුපරිවත්ති.

යං තං රූපං අජ්ඣත්තිකං තං ඔළාරිකං. යං තං රූපං බාහිරං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං.

යං තං රූපං අජ්ඣත්තිකං තං සන්තිකෙ. යං තං රූපං බාහිරං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ.

### පකිණ්ණක තිකං. (13)

යං තං රූපං බාහිරං තං චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි චක්ඛුසම්ඵස්සස්ස වත්ථු, අත්ථි චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු.

යං තං රූපං බාහිරං තං චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථු, අත්ථි චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු.

යං තං රූපං බාහිරං තං සොතසම්ඵස්සස්ස -පෙ- ඝානසම්ඵස්සස්ස -පෙ- ජිව්හාසම්ඵස්සස්ස -පෙ- කායසම්ඵස්සස්ස න වත්ථු. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි කායසම්ඵස්සස්ස වත්ථු, අත්ථි කායසම්ඵස්සස්ස න වත්ථු.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය සප්‍රතිඝ (-ගැටුම් සහිත) ය. යම් බාහිර රූපයෙක් වේ ද එය සප්‍රතිඝ වූයේ ඇත, අප්‍රතිඝ වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය ඉන්ද්‍රිය ය. යම් බාහිරරූපයෙක් වේ ද එය ඉන්ද්‍රිය වූයේ ඇත, ඉන්ද්‍රිය නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය මහාභූත නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය මහාභූත වූයේ ඇත, මහාභූත නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය විඥප්ති නො වූයේ ය. යම් බාහිර රූපයෙක් වේ ද එය විඥප්ති වූයේ ඇත, විඥප්ති නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය චිත්තසමුට්ඨාන නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය චිත්තසමුට්ඨාන වූයේ ඇත, චිත්ත-සමුට්ඨාන නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය චිත්තසහභූ නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය චිත්තසහභූ වූයේ (-සිත සමග උපන්නේ) ඇත. චිත්තසහභූ නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය චිත්තානුපරිවර්ත්ති නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය චිත්තානුපරිවර්ත්ති වූයේ ඇත, චිත්තා-නුපරිවර්ත්ති නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය ඖදාරික ය. යම් බාහිරරූප-යෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය සන්තික වූයේ ය. යම් බාහිර රූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇති.

ප්‍රකීර්ණක ත්‍රික යි. (13)

යම් බාහිරරූපයෙක් වේ ද එය චක්ඛුසම්ඵස්සයට වස්තු නො වූයේ ය. යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය චක්ඛුසම්ඵස්සයට වස්තු වූයේ ඇත, චක්ඛුසම්ඵස්සයට වස්තු නො වූයේ ඇති.

යම් බාහිරරූපයෙක් වේ ද එය චක්ඛුසම්ඵස්සජවේදනාවට ... සංඥා-වට ... චේතනාවට ... චක්ඛුවිඤ්ඤාණයට වස්තු නො වූයේ ය. යම් ආධ්‍යා-ත්මික රූපයෙක් වේ ද එය චක්ඛුවිඤ්ඤාණයට වස්තු වූයේ ඇත, චක්ඛු-විඤ්ඤාණයට වස්තු නො වූයේ ඇති.

යම් බාහිරරූපයෙක් වේ ද එය සොතසම්ඵස්සයට ... ඝානසම්ඵස්සයට ... ජිව්හාසම්ඵස්සයට ... කායසම්ඵස්සයට වස්තු නො වූයේ ය. යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය කායසම්ඵස්සයට වස්තු වූයේ ඇත, කායසම්ඵස්සයට වස්තු නො වූයේ ඇති.

යං තං රූපං බාහිරං තං කායසම්ඵස්සජාය වේදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චේතනාය -පෙ- කායවිඤ්ඤාණස්ස න වත්ථු. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි කායවිඤ්ඤාණස්ස වත්ථු, අත්ථි කායවිඤ්ඤාණස්ස න වත්ථු.

### වත්ථුතිකං. (25)

යං තං රූපං අජ්ඣත්තිකං තං චක්ඛුසම්ඵස්සස්ස නාරම්මණං. යං තං රූපං බාහිරං තං අත්ථි චක්ඛුසම්ඵස්සස්ස ආරම්මණං, අත්ථි චක්ඛුසම්ඵස්සස්ස නාරම්මණං.

යං තං රූපං අජ්ඣත්තිකං තං චක්ඛුසම්ඵස්සජාය වේදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චේතනාය -පෙ- චක්ඛුවිඤ්ඤාණස්ස නාරම්මණං. යං තං රූපං බාහිරං තං අත්ථි චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණං, අත්ථි චක්ඛුවිඤ්ඤාණස්ස නාරම්මණං.

යං තං රූපං අජ්ඣත්තිකං තං සෝතසම්ඵස්සස්ස -පෙ- ඝානසම්ඵස්සස්ස -පෙ- ජිව්හාසම්ඵස්සස්ස -පෙ- කායසම්ඵස්සස්ස නාරම්මණං. යං තං රූපං බාහිරං තං අත්ථි කායසම්ඵස්සස්ස ආරම්මණං, අත්ථි කායසම්ඵස්සස්ස නාරම්මණං.

යං තං රූපං අජ්ඣත්තිකං තං කායසම්ඵස්සජාය වේදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චේතනාය -පෙ- කායවිඤ්ඤාණස්ස නාරම්මණං. යං තං රූපං බාහිරං තං අත්ථි කායවිඤ්ඤාණස්ස ආරම්මණං, අත්ථි කායවිඤ්ඤාණස්ස නාරම්මණං.

### ආරම්මණතිකං. (26)

යං තං රූපං බාහිරං තං න චක්ඛායතනං. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි චක්ඛායතනං, අත්ථි න චක්ඛායතනං.

යං තං රූපං බාහිරං තං න සෝතායතනං. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි සෝතායතනං, අත්ථි න සෝතායතනං.

යං තං රූපං බාහිරං තං න ඝානායතනං -පෙ- න ජිව්හායතනං -පෙ- න කායායතනං. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි කායායතනං අත්ථි න කායායතනං.

යං තං රූපං අජ්ඣත්තිකං තං න රූපායතනං. යං තං බාහිරං තං අත්ථි රූපායතනං, අත්ථි න රූපායතනං.

යම් බාහිරරූපයෙක් වේ ද එය කායසම්ඵස්සජ වේදනාවට ... සංඥාවට ... චේතනාවට ... කායවිඥානයට වස්තු නො වූයේ ය. යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය කායවිඥානයට වස්තු වූයේ ඇත, කාය විඥානයට වස්තු නො වූයේ ඇති.

වස්තු ත්‍රික යි. (25)

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය චක්ඛුසම්ඵස්සයට අරමුණු නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය චක්ඛුසම්ඵස්සයට අරමුණු වූයේ ඇත, චක්ඛුසම්ඵස්සයට අරමුණු නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය චක්ඛුසම්ඵස්සජවේදනාවට ... සංඥාවට ... චේතනාවට ... චක්ඛුවිඤ්ඤාණයට අරමුණු නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය චක්ඛුවිඤ්ඤාණයට අරමුණු වූයේ ඇත, චක්ඛු-විඤ්ඤාණයට අරමුණු නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය සොතසම්ඵස්සයට ... ඝාන-සම්ඵස්සයට ... ජිව්හාසම්ඵස්සයට ... කායසම්ඵස්සයට අරමුණු නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය කායසම්ඵස්සයට අරමුණු වූයේ ඇත, කායසම්ඵස්සයට අරමුණු නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය කායසම්ඵස්සජවේදනාවට ... සංඥාවට ... චේතනාවට ... කායවිඥානයට අරමුණු නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය කායවිඥානයට අරමුණු වූයේ ඇත, කාය-විඥානයට අරමුණු නො වූයේ ඇති.

ආලම්බන ත්‍රික යි. (25)

යම් බාහිරරූපයෙක් වේ ද එය චක්ෂුරායතන නො වූයේ ය. යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය චක්ෂුරායතන වූයේ ඇත, චක්ෂුරායතන නො වූයේ ඇති.

යම් බාහිරරූපයෙක් වේ ද එය ශ්‍රොත්‍රායතන නො වූයේ ය. යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය ශ්‍රොත්‍රායතන වූයේ ඇත, ශ්‍රොත්‍රායතන නො වූයේ ඇති.

යම් බාහිරරූපයෙක් වේ ද එය ඝ්‍රාණායතන නො වූයේ ය ... ජිහ්වා-යතන නො වූයේ ය. ... කායායතන නො වූයේ ය. යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය කායායතන වූයේ ඇත, කායායතන නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපායතන නො වූයේ ය. යම් බාහිර රූපයෙක් වේ ද එය රූපායතන වූයේ ඇත, රූපායතන නො වූයේ ඇති.

යං තං රූපං අජ්ඣත්තිකං තං න සද්දායතනං -පෙ- න ගන්ධායතනං -පෙ- න රසායතනං -පෙ- න ඵොට්ඨබ්බායතනං. යං තං රූපං බාහිරං තං අත්ථි ඵොට්ඨබ්බායතනං, අත්ථි න ඵොට්ඨබ්බායතනං.

### ආයතනතිකං. (10)

යං තං රූපං බාහිරං තං න චක්ඛුධාතු. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි චක්ඛුධාතු, අත්ථි න චක්ඛුධාතු.

යං තං රූපං බාහිරං තං න සොතධාතු -පෙ- න ඝානධාතු -පෙ- න ජිව්හාධාතු -පෙ- න කායධාතු. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි කායධාතු, අත්ථි න කායධාතු.

යං තං රූපං අජ්ඣත්තිකං තං න රූපධාතු. යං තං රූපං බාහිරං තං අත්ථි රූපධාතු, අත්ථි න රූපධාතු.

යං තං රූපං අජ්ඣත්තිකං තං න සද්දධාතු -පෙ- න ගන්ධධාතු -පෙ- න රසධාතු -පෙ- න ඵොට්ඨබ්බධාතු. යං තං රූපං බාහිරං තං අත්ථි ඵොට්ඨබ්බධාතු, අත්ථි න ඵොට්ඨබ්බධාතු.

### ධාතුතිකං (10)

යං තං රූපං බාහිරං තං න චක්ඛුන්ද්‍රියං. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි චක්ඛුන්ද්‍රියං, අත්ථි න චක්ඛුන්ද්‍රියං.

යං තං රූපං බාහිරං තං න සොතින්ද්‍රියං -පෙ- න ඝානින්ද්‍රියං -පෙ- න ජිව්හින්ද්‍රියං -පෙ- න කායින්ද්‍රියං. යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි කායින්ද්‍රියං, අත්ථි න කායින්ද්‍රියං.

යං තං රූපං අජ්ඣත්තිකං තං න ඉත්ථින්ද්‍රියං. යං තං රූපං බාහිරං තං අත්ථි ඉත්ථින්ද්‍රියං, අත්ථි න ඉත්ථින්ද්‍රියං.

යං තං රූපං අජ්ඣත්තිකං තං න පුරිසින්ද්‍රියං. යං තං රූපං බාහිරං තං අත්ථි පුරිසින්ද්‍රියං, අත්ථි න පුරිසින්ද්‍රියං.

යං තං රූපං අජ්ඣත්තිකං තං න ජීවිතින්ද්‍රියං. යං තං රූපං බාහිරං තං අත්ථි ජීවිතින්ද්‍රියං, අත්ථි න ජීවිතින්ද්‍රියං,

### ඉන්ද්‍රියතිකං. (8)

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය ශබ්දායතන නො වූයේ ය. ... ගන්ධායතන නො වූයේ ය ... රසායතන නො වූයේ ය. ... ස්ප්‍රෂ්ටව්‍යායතන නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය ස්ප්‍රෂ්ටව්‍යායතන වූයේ ඇත, ස්ප්‍රෂ්ටව්‍යායතන නො වූයේ ඇති.

ආයතන ත්‍රික සි. (10)

යම් බාහිරරූපයෙක් වේ ද එය චක්ඛුධාතු නො වූයේ ය. යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය චක්ඛුධාතු වූයේ ඇත, චක්ඛුධාතු නො වූයේ ඇති.

යම් බාහිරරූපයෙක් වේ ද එය ශ්‍රොත්‍රධාතු නො වූයේ ය. ... ඝ්‍රාණ ධාතු නො වූයේ ය. ... ජිහ්වාධාතු නො වූයේ ය. ... කායධාතු නො වූයේ ය. යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය කායධාතු වූයේ ඇත, කායධාතු නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපධාතු නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය රූපධාතු වූයේ ඇත, රූපධාතු නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය ශබ්දධාතු නො වූයේ ය. ... ගන්ධධාතු නො වූයේ ය ... රසධාතු නො වූයේ ය. ... ස්ප්‍රෂ්ටව්‍යධාතු නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය ස්ප්‍රෂ්ටව්‍යධාතු වූයේ ඇත, ස්ප්‍රෂ්ටව්‍යධාතු නො වූයේ ඇති.

ධාතු ත්‍රික සි. (10)

යම් බාහිරරූපයෙක් වේ ද එය චක්ෂුරින්ද්‍රිය නො වූයේ ය. යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය චක්ෂුරින්ද්‍රිය වූයේ ඇත, චක්ෂුරින්ද්‍රිය නො වූයේ ඇති.

යම් බාහිරරූපයෙක් වේ ද එය ශ්‍රොත්‍රෙන්ද්‍රිය නො වූයේ ය ... ඝ්‍රාණේන්ද්‍රිය නො වූයේ ය ... ජිහෙවන්ද්‍රිය නො වූයේ ය ... කායෙන්ද්‍රිය නො වූයේ ය. යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය කායෙන්ද්‍රිය වූයේ ඇත, කායෙන්ද්‍රිය නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය ස්ත්‍රීන්ද්‍රිය නො වූයේ ය. යම් බාහිර රූපයෙක් වේ ද එය ස්ත්‍රීන්ද්‍රිය වූයේ ඇත, ස්ත්‍රීන්ද්‍රිය නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය පුරුෂෙන්ද්‍රිය නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය පුරුෂෙන්ද්‍රිය වූයේ ඇත, පුරුෂෙන්ද්‍රිය නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය ජීවිතෙන්ද්‍රිය නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය ජීවිතෙන්ද්‍රිය වූයේ ඇත, ජීවිතෙන්ද්‍රිය නො වූයේ ඇති.

ඉන්ද්‍රිය ත්‍රික සි. (8)

යං තං රූපං අජ්ඣත්තිකං තං න කායවිඤ්ඤත්ති. යං තං රූපං බාහිරං තං අත්ථි කායවිඤ්ඤත්ති, අත්ථි න කායවිඤ්ඤත්ති.

යං තං රූපං අජ්ඣත්තිකං තං න වචීවිඤ්ඤත්ති. යං තං රූපං බාහිරං තං අත්ථි වචීවිඤ්ඤත්ති, අත්ථි න වචීවිඤ්ඤත්ති.

යං තං රූපං අජ්ඣත්තිකං තං න ආකාසධාතු. යං තං රූපං බාහිරං තං අත්ථි ආකාසධාතු, අත්ථි න ආකාසධාතු.

යං තං රූපං අජ්ඣත්තිකං තං න ආපොධාතු. යං තං රූපං බාහිරං තං අත්ථි ආපොධාතු, අත්ථි න ආපොධාතු.

යං තං රූපං අජ්ඣත්තිකං තං රූපස්ස න ලහුතා. යං තං රූපං බාහිරං තං අත්ථි රූපස්ස ලහුතා, අත්ථි රූපස්ස න ලහුතා.

යං තං රූපං අජ්ඣත්තිකං තං රූපස්ස න මුදුතා. යං තං රූපං බාහිරං තං අත්ථි රූපස්ස මුදුතා, අත්ථි රූපස්ස න මුදුතා.

යං තං රූපං අජ්ඣත්තිකං තං රූපස්ස න කම්මඤ්ඤතා. යං තං රූපං බාහිරං තං අත්ථි රූපස්ස කම්මඤ්ඤතා, අත්ථි රූපස්ස න කම්මඤ්ඤතා.

යං තං රූපං අජ්ඣත්තිකං තං රූපස්ස න උපචයො. යං තං රූපං බාහිරං තං අත්ථි රූපස්ස උපචයො, අත්ථි රූපස්ස න උපචයො.

යං තං රූපං අජ්ඣත්තිකං තං රූපස්ස න සන්තති. යං තං රූපං බාහිරං තං අත්ථි රූපස්ස සන්තති, අත්ථි රූපස්ස න සන්තති.

යං තං රූපං අජ්ඣත්තිකං තං රූපස්ස න ජරතා. යං තං රූපං බාහිරං තං අත්ථි රූපස්ස ජරතා, අත්ථි රූපස්ස න ජරතා.

යං තං රූපං අජ්ඣත්තිකං තං රූපස්ස න අනිච්චතා. යං තං රූපං බාහිරං තං අත්ථි රූපස්ස අනිච්චතා, අත්ථි රූපස්ස න අනිච්චතා.

යං තං රූපං අජ්ඣත්තිකං තං න කබළීකාරො ආහාරො[1]. යං තං රූපං බාහිරං තං අත්ථි කබළීකාරො ආහාරො, අත්ථි න කබළීකාරො ආහාරො.

එවං තිවිධෙන රූපසඞ්ගහො.

[සුඛුමරූපතිකං. 12]

තිකං.

1. කවළීකාරො - සිමු 1, 2, 3. මජසං.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය කායවිඥප්ති නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය කායවිඥප්ති වූයේ ඇත, කායවිඥප්ති නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මික රූපයෙක් වේ ද එය වාග්විඥප්ති නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය වාග්විඥප්ති වූයේ ඇත, වාග්විඥප්ති නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය ආකාශධාතු නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය ආකාශධාතු වූයේ ඇත, ආකාශධාතු නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය අබ්ධාතු නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය අබ්ධාතු වූයේ ඇත, අබ්ධාතු නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපයාගේ ලඝුතා නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය රූපයාගේ ලඝුතා වූයේ ඇත, රූපයාගේ ලඝුතා නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපයාගේ මෘදුතා නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය රූපයාගේ මෘදුතා වූයේ ඇත, රූපයාගේ මෘදුතා නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපයාගේ කර්මණ්‍යතා නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය රූපයාගේ කර්මණ්‍යතා වූයේ ඇත, රූපයාගේ කර්මණ්‍යතා නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපයාගේ උපචය නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය රූපයාගේ උපචය වූයේ ඇත, රූපයාගේ උපචය නො වූයේ ඇති

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපයාගේ සන්තති නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය රූපයාගේ සන්තති වූයේ ඇත, රූපයාගේ සන්තති නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපයාගේ ජරතා නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය රූපයාගේ ජරතා වූයේ ඇත, රූපයාගේ ජරතා නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය රූපයාගේ අනිත්‍යතා නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය රූපයාගේ අනිත්‍යතා වූයේ ඇත, රූපයාගේ අනිත්‍යතා නො වූයේ ඇති.

යම් ආධ්‍යාත්මිකරූපයෙක් වේ ද එය කවලීකාරාහාර නො වූයේ ය. යම් බාහිරරූපයෙක් වේ ද එය කවලීකාරාහාර වූයේ ඇත, කවලීකාරාං-හාර නො වූයේ ඇති.

මෙසේ තුන් කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

[සූක්ෂමරූප ත්‍රිකය යි. 12]

ත්‍රිකය යි.

590. චතුබ්බිධෙන රූපසඞ්ගහො:

යං තං රූපං උපාදා තං අත්ථි උපාදින්නං, අත්ථි අනුපාදින්නං. යං තං රූපං නො උපාදා තං අත්ථි උපාදින්නං, අත්ථි අනුපාදින්නං.

යං තං රූපං උපාදා තං අත්ථි උපාදින්නුපාදානියං, අත්ථි අනුපාදින්නුපාදානියං. යං තං රූපං නො උපාදා තං අත්ථි උපාදින්නුපාදානියං, අත්ථි අනුපාදින්නුපාදානියං.

යං තං රූපං උපාදා තං අත්ථි සප්පටිඝං, අත්ථි අප්පටිඝං. යං තං රූපං නො උපාදා තං අත්ථි සප්පටිඝං, අත්ථි අප්පටිඝං.

යං තං රූපං උපාදා තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං. යං තං රූපං නො උපාදා තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං.

යං තං රූපං උපාදා තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ. යං තං රූපං නො උපාදා තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ.

යං තං රූපං උපාදින්නං තං අත්ථි සනිදස්සනං, අත්ථි අනිදස්සනං. යං තං රූපං අනුපාදින්නං තං අත්ථි සනිදස්සනං, අත්ථි අනිදස්සනං.

යං තං රූපං උපාදින්නං තං අත්ථි සප්පටිඝං, අත්ථි අප්පටිඝං. යං තං රූපං අනුපාදින්නං තං අත්ථි සප්පටිඝං, අත්ථි අප්පටිඝං.

යං තං රූපං උපාදින්නං තං අත්ථි මහාභූතං, අත්ථි න මහාභූතං. යං තං රූපං අනුපාදින්නං තං අත්ථි මහාභූතං, අත්ථි න මහාභූතං.

යං තං රූපං උපාදින්නං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං. යං තං රූපං අනුපාදින්නං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං.

යං තං රූපං උපාදින්නං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ. යං තං රූපං අනුපාදින්නං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ.

යං තං රූපං උපාදින්නුපාදානියං තං අත්ථි සනිදස්සනං, අත්ථි අනිදස්සනං. යං තං රූපං අනුපාදින්නුපාදානියං තං අත්ථි සනිදස්සනං, අත්ථි අනිදස්සනං.

යං තං රූපං උපාදින්නුපාදානියං තං අත්ථි සප්පටිඝං, අත්ථි අප්පටිඝං. යං තං රූපං අනුපාදින්නුපාදානියං තං අත්ථි සප්පටිඝං, අත්ථි අප්පටිඝං.

590. සතර කොට්ඨාසකින් රූපසඞ්ග්‍රහය වෙයි:

යම් උපාදාරූපයෙක් වේ ද එය උපාදින්න වූයේ ඇත, අනුපාදින්න වූයේ ඇත යම් උපාදා නො වූ රූපයෙක් වේ ද එය උපාදින්න වූයේ ඇත, අනුපාදින්න වූයේ ඇති.

යම් උපාදාරූපයෙක් වේ ද එය උපාදින්නුපාදානිය වූයේ ඇත, අනුපාදින්නුපාදානිය වූයේ ඇත. යම් උපාදා නො වූ රූපයෙක් වේ ද එය උපාදින්නුපාදානිය වූයේ ඇත, අනුපාදින්නුපාදානිය වූයේ ඇති.

යම් උපාදාරූපයෙක් වේ ද එය සප්‍රතිඝ වූයේ ඇත, අප්‍රතිඝ වූයේ ඇති යම් උපාදා නො වූ රූපයෙක් වේ ද එය සප්‍රතිඝ වූයේ ඇත, අප්‍රතිඝ වූයේ ඇති.

යම් උපාදාරූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සියුම් වූයේ ඇත. යම් උපාදා නො වූ රූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සියුම් වූයේ ඇති.

යම් උපාදාරූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇත. යම් උපාදා නො වූ රූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇති.

යම් උපාදින්නරූපයෙක් වේ ද එය සනිදර්ශන වූයේ ඇත, අනිදර්ශන වූයේ ඇත. යම් අනුපාදින්නරූපයෙක් වේ ද එය සනිදර්ශන (=චක්ෂුර්-විඥානයට ගොචර බව සහිත) වූයේ ඇත, අනිදර්ශන වූයේ ඇති.

යම් උපාදින්නරූපයෙක් වේ ද එය සප්‍රතිඝ (-ගැටීම් සහිත) වූයේ ඇත, අප්‍රතිඝ වූයේ ඇත. යම් අනුපාදින්නරූපයෙක් වේ ද එය සප්‍රතිඝ වූයේ ඇත, අප්‍රතිඝ වූයේ ඇති.

යම් උපාදින්නරූපයෙක් වේ ද එය මහාභූත වූයේ ඇත, මහාභූත නො වූයේ ඇත. යම් අනුපාදින්නරූපයෙක් වේ ද එය මහාභූත වූයේ ඇත, මහාභූත නො වූයේ ඇති.

යම් උපාදින්නරූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇත. යම් අනුපාදින්නරූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇති.

යම් උපාදින්නරූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇත. යම් අනුපාදින්නරූපයෙක් වේ ද එය දූර වූයේ ඇත සන්තික වූයේ ඇති.

යම් උපාදින්නුපාදානියරූපයෙක් වේ ද එය සනිදර්ශන වූයේ ඇත, අනිදර්ශන වූයේ ඇත. යම් අනුපාදින්නුපාදානිය රූපයෙක් වේ ද එය සනිදර්ශන වූයේ ඇත, අනිදර්ශන වූයේ ඇති.

යම් උපාදින්නුපාදානියරූපයෙක් වේ ද එය සප්‍රතිඝ වූයේ ඇත, අප්‍රතිඝ වූයේ ඇත. යම් අනුපාදින්නුපාදානිය රූපයෙක් වේ ද එය සප්‍රතිඝ වූයේ ඇත, අප්‍රතිඝ වූයේ ඇති.

යං තං රූපං උපාදින්නුපාදානියං තං අත්ථි මහාභූතං, අත්ථි න මහාභූතං. යං තං රූපං අනුපාදින්නුපාදානියං තං අත්ථි මහාභූතං, අත්ථි න මහාභූතං.

යං තං රූපං උපාදින්නුපාදානියං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං. යං තං රූපං අනුපාදින්නුපාදානියං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං.

යං තං රූපං උපාදින්නුපාදානියං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ. යං තං රූපං අනුපාදින්නුපාදානියං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ.

යං තං රූපං සප්පටිඝං තං අත්ථි ඉන්ද්‍රියං, අත්ථි න ඉන්ද්‍රියං. යං තං රූපං අප්පටිඝං තං අත්ථි ඉන්ද්‍රියං, අත්ථි න ඉන්ද්‍රියං.

යං තං රූපං සප්පටිඝං තං අත්ථි මහාභූතං, අත්ථි න මහාභූතං. යං තං රූපං අප්පටිඝං තං අත්ථි මහාභූතං, අත්ථි න මහාභූතං.

යං තං රූපං ඉන්ද්‍රියං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං. යං තං රූපං න ඉන්ද්‍රියං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං.

යං තං රූපං ඉන්ද්‍රියං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ. යං තං රූපං න ඉන්ද්‍රියං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ.

යං තං රූපං මහාභූතං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං. යං තං රූපං න මහාභූතං තං අත්ථි ඔළාරිකං, අත්ථි සුඛුමං.

යං තං රූපං මහාභූතං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ. යං තං රූපං න මහාභූතං තං අත්ථි දූරෙ, අත්ථි සන්තිකෙ.

දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං රූපං.

එවං චතුබ්බිධෙන රූපසඞ්ගහො.

චතුක්කං. (22)

591. පඤ්චවිධෙන රූපසඞ්ගහො:

පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු, යං ච රූපං උපාදා.

එවං පඤ්චවිධෙන රූපසඞ්ගහො.

පඤ්චකං.

යම් උපාදින්නුපාදානියරූපයෙක් වේ ද එය මහාභූත වූයේ ඇත, මහාභූත නො වූයේ ඇත. යම් අනුපාදින්නුපාදානිය රූපයෙක් වේ ද එය මහාභූත වූයේ ඇත, මහාභූත නො වූයේ ඇති.

යම් උපාදින්නුපාදානියරූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇත. යම් අනුපාදින්නාරූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇති.

යම් උපාදින්නුපාදානිය රූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇත. යම් අනුපාදින්නුපාදානියරූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇති.

යම් සප්‍රතිඝරූපයෙක් වේ ද එය ඉන්ද්‍රිය වූයේ ඇත, ඉන්ද්‍රිය නො වූයේ ඇත. යම් අප්‍රතිඝරූපයෙක් වේ ද එය ඉන්ද්‍රිය වූයේ ඇත, ඉන්ද්‍රිය නො වූයේ ඇති.

යම් සප්‍රතිඝරූපයෙක් වේ ද එය මහාභූත වූයේ ඇත, මහාභූත නො වූයේ ඇත. යම් අප්‍රතිඝරූපයෙක් වේ ද එය මහාභූත වූයේ ඇත, මහාභූත නො වූයේ ඇති.

යම් ඉන්ද්‍රියරූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇත. යම් ඉන්ද්‍රිය නො වූ රූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇති.

යම් ඉන්ද්‍රියරූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇත. යම් ඉන්ද්‍රිය නො වූ රූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇති.

යම් මහාභූතරූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇත. යම් මහාභූත නො වූ රූපයෙක් වේ ද එය ඖදාරික වූයේ ඇත, සූක්ෂ්ම වූයේ ඇති.

යම් මහාභූතරූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇත. යම් මහාභූත නො වූ රූපයෙක් වේ ද එය දූර වූයේ ඇත, සන්තික වූයේ ඇති.

රූපායතන සඞ්ඛ්‍යාත දෘෂ්ටරූප ය, ශබ්දායතන සඞ්ඛ්‍යාත ශ්‍රුතරූපය, ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යායතන සඞ්ඛ්‍යාත මුතරූප ය, ධර්මායතන සඞ්ඛ්‍යාත විඥාතරූප යයි.

මෙසේ සතර කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

චතුෂ්ක යි. (22)

591. පස් කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

පෘථිවිධාතු ය, අබ්ධාතු ය, තේජෝධාතු ය, වායෝධාතු ය, යම් උපාදාරූපයෙකුත් වේ ද ඒ යැයි.

මෙසේ පස් කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

පඤ්චකය යි.

592. ඡබ්බිධෙන රූපසඞ්ගහො:

චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං, සොතවිඤ්ඤෙය්‍යං රූපං, ඝානවිඤ්ඤෙය්‍යං රූපං, ජිව්හාවිඤ්ඤෙය්‍යං රූපං, කායවිඤ්ඤෙය්‍යං රූපං, මනොවිඤ්ඤෙය්‍යං රූපං.

එවං ඡබ්බිධෙන රූපසඞ්ගහො.

ඡක්කං.

593. සත්තවිධෙන රූපසඞ්ගහො:

චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං, සොතවිඤ්ඤෙය්‍යං රූපං, ඝානවිඤ්ඤෙය්‍යං රූපං, ජිව්හාවිඤ්ඤෙය්‍යං රූපං, කායවිඤ්ඤෙය්‍යං රූපං, මනොධාතුවිඤ්ඤෙය්‍යං රූපං, මනොවිඤ්ඤාණධාතුවිඤ්ඤෙය්‍යං රූපං.

එවං සත්තවිධෙන රූපසඞ්ගහො.

සත්තකං.

594. අට්ඨවිධෙන රූපසඞ්ගහො:

චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං, සොතවිඤ්ඤෙය්‍යං රූපං, ඝානවිඤ්ඤෙය්‍යං රූපං, ජිව්හාවිඤ්ඤෙය්‍යං[1] රූපං, කායවිඤ්ඤෙය්‍යං රූපං අත්ථි සුඛසම්ඵස්සං, අත්ථි දුක්ඛසම්ඵස්සං, මනොධාතුවිඤ්ඤෙය්‍යං රූපං, මනොවිඤ්ඤාණධාතුවිඤ්ඤෙය්‍යං රූපං.

එවං අට්ඨවිධෙන රූපසඞ්ගහො.

අට්ඨකං.

595. නවවිධෙන රූපසඞ්ගහො:

චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, පුරිසින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, යඤ්ච රූපං න ඉන්ද්‍රියං.

එවං නවවිධෙන රූපසඞ්ගහො.

නවකං.

596 දසවිධෙන රූපසඞ්ගහො:

චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, පුරිසින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, න ඉන්ද්‍රියං රූපං අත්ථි සප්පටිඝං, අත්ථි අප්පටිඝං.

එවං දසවිධෙන රූපසඞ්ගහො.

දසකං.

597 එකාදසවිධෙන රූපසඞ්ගහො:

චක්ඛායතනං, සොතායතනං, ඝානායතනං, ජිව්හායතනං, කායායතනං, රූපායතනං, සද්දායතනං, ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං, යඤ්ච රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං.

එවං එකාදසවිධෙන රූපසඞ්ගහො.

එකාදසකං.

මාතිකා.

1. ජිව්හායවිඤ්ඤෙය්‍යං, සිමු 3.

592. ස කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

චක්ඛුර්විඤ්ඤෙයරූප ය, ශ්‍රොත්‍රවිඤ්ඤෙයරූප ය, ඝ්‍රාණවිඤ්ඤෙයරූප ය, ජිහ්වාවිඤ්ඤෙයරූප ය, කායවිඤ්ඤෙයරූප ය, මනොවිඤ්ඤෙයරූප යයි.

මෙසේ ස කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

ෂට්කය යි.

593. සත් කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

චක්ඛුර්විඤ්ඤෙයරූප ය, ශ්‍රොත්‍රවිඤ්ඤෙයරූප ය, ඝ්‍රාණවිඤ්ඤෙයරූප ය, ජිහ්වාවිඤ්ඤෙයරූප ය, කායවිඤ්ඤෙයරූප ය, මනොධාතුවිඤ්ඤෙයරූප ය, මනොවිඤ්ඤාණධාතුවිඤ්ඤෙයරූප යයි.

මෙසේ සත් කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

සප්තකය යි.

594. අට කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

චක්ඛුර්විඤ්ඤෙයරූප ය, ශ්‍රොත්‍රවිඤ්ඤෙයරූප ය, ඝ්‍රාණවිඤ්ඤෙයරූප ය, ජිහ්වාවිඤ්ඤෙයරූප ය, කායවිඤ්ඤෙයරූපය සුඛසංස්පර්ශී වූයෙක් ඇත, දුඃඛසංස්පර්ශී වූයෙක් ඇත, මනොධාතුවිඤ්ඤෙයරූප ය, මනොවිඤ්ඤාණධාතුවිඤ්ඤෙයරූප යයි.

මෙසේ අට කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

අෂ්ටකය යි.

595. නව කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

චක්ඛුරින්ද්‍රිය ය, ශ්‍රොත්‍රෙන්ද්‍රිය ය, ඝ්‍රාණෙන්ද්‍රිය ය, ජිහ්වෙන්ද්‍රිය ය, කායෙන්ද්‍රිය ය, ස්ත්‍රීන්ද්‍රිය ය, පුරුෂෙන්ද්‍රිය ය, ජීවිතෙන්ද්‍රිය ය, යම් ඉන්ද්‍රිය නො වූ රූපයෙකුත් වේ ද, ඒ ය යි.

මෙසේ නව කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

නවකය යි.

596. දස කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

චක්ඛුරින්ද්‍රිය ය, ශ්‍රොත්‍රෙන්ද්‍රිය ය, ඝ්‍රාණෙන්ද්‍රිය ය, ජිහ්වෙන්ද්‍රිය ය, කායෙන්ද්‍රිය ය, ස්ත්‍රීන්ද්‍රිය ය, පුරුෂෙන්ද්‍රිය ය, ජීවිතෙන්ද්‍රිය ය, ඉන්ද්‍රිය නො වූ සප්‍රතිඝරූපයෙක් ඇත, අප්‍රතිඝරූපයෙක් ඇත.

මෙසේ දස කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

දශකය යි.

597. එකොළොස් කොටසෙකින් රූපසඞ්ග්‍රහය වෙයි:

චක්ඛුරායතන ය, ශ්‍රොත්‍රායතන ය, ඝ්‍රාණායතන ය, ජිහ්වායතන ය, කායායතන ය, රූපායතන ය, ශබ්දායතන ය, ගන්ධායතන ය, රසායතන ය, ස්ප්‍රෂ්ටව්‍යායතන ය, යම් අනිදර්ශන වූ අප්‍රතිඝ වූ ධර්මායතනපර්‍ය්‍යාපන්න වූ රූපයෙකුත් වේ ද, ඒ ය යි.

මෙසෙයින් එකොළොස් කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

එකාදශකය යි.

මාතෘකා යි.

[එකකනිද්දෙසො]

598. සබ්බං රූපං න හෙතුමෙව, අහෙතුකමෙව, හෙතුවිප්පයුත්තමෙව, සප්පච්චයමෙව, සඞ්ඛතමෙව, රූපිමෙව,[1] ලොකියමෙව, සාසවමෙව, සඤ්ඤොජනියමෙව, ගන්ථනියමෙව, ඔඝනියමෙව, යොගනියමෙව, නීවරණියමෙව, පරාමට්ඨමෙව, උපාදානියමෙව, සංකිලෙසිකමෙව, අබ්‍යාකතමෙව, අනාරම්මණමෙව, අචෙතසිකමෙව, චිත්තවිප්පයුත්තමෙව, නෙවවිපාකනවිපාකධම්මධම්මමෙව, අසංකිලිට්ඨසංකිලෙසිකමෙව, න සවිතක්කසවිචාරමෙව, න අවිතක්කවිචාරමත්තමෙව, අවිතක්කඅවිචාරමෙව, න පීතිසහගතමෙව, න සුඛසහගතමෙව, න උපෙක්ඛාසහගතමෙව, නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බමෙව, නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකමෙව, නෙව ආචයගාමි න අපචයගාමිමෙව, නෙවසෙක්ඛනාසෙක්ඛමෙව, පරිත්තමෙව, කාමාවචරමෙව, න රූපාවචරමෙව, න අරූපාවචරමෙව, පරියාපන්නමෙව, නො අපරියාපන්නමෙව, අනියතමෙව, අනිය්‍යානිකමෙව, උප්පන්නං ඡහි විඤ්ඤාණෙහි විඤ්ඤෙය්‍යමෙව, අනිච්චමෙව, ජරාභිභූතමෙව, එවං එකවිධෙන රූපසඞ්ගහො.

එකකනිද්දෙසො.

[දුකනිද්දෙසො]

(උපාදාරූපං)

599. කතමං තං රූපං උපාදා?

චක්ඛායතනං, සොතායතනං, ඝානායතනං, ජිව්හායතනං, කායායතනං, රූපායතනං, සද්දායතනං, ගන්ධායතනං, රසායතනං, ඉත්ථින්ද්‍රියං, පුරිසින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති, ආකාසධාතු, රූපස්ස ලහුතා, රූපස්ස මුදුතා, රූපස්ස කම්මඤ්ඤතා, රූපස්ස උපචයො, රූපස්ස සන්තති, රූපස්ස ජරතා, රූපස්ස අනිච්චතා, කබළිංකාරො ආහාරො.

600. කතමං තං රූපං චක්ඛායතනං?

යං චක්ඛුං[2] චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යෙන චක්ඛුනා අනිදස්සනෙන සප්පටිඝෙන රූපං සනිදස්සනං සප්පටිඝං පස්සි වා පස්සති වා පස්සිස්සති වා පස්සෙ වා, චක්ඛුමෙපතං, චක්ඛායතනමෙපතං, චක්ඛුධාතුපෙසා, චක්ඛුන්ද්‍රියමෙපතං, ලොකොපෙසො, ද්වාරාපෙසා[3], සමුද්දොපෙසො, පණ්ඩරමෙපතං, ඛෙත්තමෙපතං, වත්ථුමෙපතං, නෙත්තමෙපතං, නයනමෙපතං, ඔරිමං තීරමෙපතං, සුඤ්ඤො ගාමොපෙසො ඉදං තං රූපං චක්ඛායතනං.

1. රූපමෙව - සීමු, 2. මජසං. සයා අ.
රූපියමෙව - සීමු 3.
2. චක්ඛු - සීමු. 1, 2. මජසං. 3. ද්වාරොපෙසො - සීමු 3.

## [ඒකකනිද්දේශය]

598. හැම රූපය හෙතු නො වූයේ ම ය, අහෙතුක ම ය, හෙතුවිප්‍රයුක්ත ම ය, සප්‍රත්‍යය ම ය, සඞ්ඛත (-ප්‍රත්‍යයසමවායෙන් කරන ලද) ම ය, රූපී ම ය, ලෞකික ම ය, සාස්‍රව ම ය, සංයෝජනීය ම ය, ග්‍රන්ථනීය ම ය, ඔඝනීය ම ය, යෝගනීය ම ය, නීවරණීය ම ය, පරාමෘෂ්ට ම ය, උපාදානීය ම ය, සාංක්ලෙශික ම ය, අව්‍යාකෘත ම ය, අනාලම්බන ම ය, අචෛතසික ම ය, චිත්තවිප්‍රයුක්ත ම ය, නෙව විපාක න විපාකසවභාවධර්ම ම ය, අසඞ්ක්ලිෂ්ටසාංක්ලෙශික ම ය, සවිතර්කසවිචාර නො වූයේ ම ය, අවිතර්කවිචාරමාත්‍ර නො වූයේ ම ය, අවිතර්ක - අවිචාර ම ය, ප්‍රීතිසහගත නො වූයේ ම ය, සුඛසහගත නො වූයේ ම ය, උපෙක්ෂාසහගත නො වූයේ ම ය, නො ම දර්ශනයෙන් නො ම භාවනායෙන් ප්‍රහාතව්‍ය ම ය, නො ම දර්ශනයෙන් නො ම භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත් ම ය, නො ම ආචයගාමී නො ම අපචයගාමී ම ය, නො ම ශෛක්ෂ නාශෛක්ෂ ම ය, පරිත්ත ම ය, කාමාවචර ම ය, රූපාවචර නො වූයේ ම ය, අරූපාවචර නො වූයේ ම ය, පර්‍ය්‍යාපන්න ම ය, අපර්‍ය්‍යාපන්න නො වූයේ ම ය, අනියත ම ය, අනෛර්‍ය්‍යාණික ම ය, උත්පන්න වූයේ ෂඩ්විඥානයන් විසින් විඥෙය ම ය, අනිත්‍ය ම ය, ජරාභිභූත මැ යි. මෙසෙයින් එක් කොටසින් රූපසඞ්ග්‍රහය වේ.

ඒකකනිද්දේශය යි.

## [දුකනිද්දේශය] - (උපාදාරූප)

599. ඒ උපාදාරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ශ්‍රොත්‍රායතන ය ඝ්‍රාණායතන ය ජිහ්වායතන ය කායායතන ය රූපායතන ය ශබ්දායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය ආකාශධාතු ය රූපලඝුතා ය රූපමෘදුතා ය රූපකර්මණ්‍යතා ය උපචය රූප ය සන්තතිරූප ය ජරතාරූප ය අනිත්‍යතාරූප ය කවලීකාරාහාර යි.

600. ඒ චක්ෂුරායතනරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා (උපන්) ආත්මභාවපර්‍ය්‍යාපන්න වූ අනිදර්ශන වූ සප්‍රතිඝ වූ ප්‍රසාදය වේ ද, අනිදර්ශන වූ සප්‍රතිඝ වූ යම් ඇසෙකින් සනිදර්ශන වූ සප්‍රතිඝ වූ රූපය දුටුයේ හෝ දකී හෝ දක්නේ හෝ දකි නම් හෝ, (දර්ශනපරිණායකාර්ථයෙන්) තෙලෙ චක්ඛු නමුදු වෙයි, (සඤ්ජාතිසමොසරණාර්ථයෙන්) තෙලෙ චක්ඛායතන නමුදු වෙයි, (ශූන්‍යතාදි අර්ථයෙන්) තෙල චක්ඛුධාතු නමුදු වෙයි, (දර්ශන ලක්ෂණයෙහි ඉන්ද්‍රාර්ථය කරවා නුයි) තෙලෙ චක්ඛුන්ද්‍රිය නමුදු වෙයි, (ලුජ්ජන පලුජ්ජනාර්ථයෙන්) තෙලෙ ලෝක නමුදු වෙයි, (වලඤ්ජනාර්ථයෙන්) තෙල ද්වාර නමුදු වෙයි, (අපරිපූරණීයාර්ථයෙන්) තෙලෙ සමුද්ද නමුදු වෙයි, (පරිශුද්ධාර්ථයෙන්) තෙලෙ පණ්ඩර නමුදු වෙයි, (ස්පර්ශාදීන් උපදනා හෙයින්) තෙලෙ ඛෙත්ත නමුදු වෙයි, (ඔවුනට මැ ප්‍රතිෂ්ඨා වන හෙයින්) තෙලෙ වත්ථු නමුදු වෙයි, (සමවිෂම දක්වමින් ආත්මභාවය පමුණුවානුයි) තෙලෙ නෙත්ත නමුදු වෙයි, (එ අරුතින් ම) තෙලෙ නයන නමුදු වෙයි, (සත්කාය පර්‍ය්‍යාපන්නාර්ථයෙන්) තෙලෙ ඔරිමතීර නමුදු වෙයි, (බහුසාධාරණාර්ථයෙන් අස්වාමිකාර්ථයෙන්) තෙලෙ සුඤ්ඤගාම නමුදු වේ. මේ ඒ චක්ෂුරායතනරූප නම් වේ.

601. කතමං තං රූපං චක්ඛායතනං?

යං චක්ඛුං[1] චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යම්හි චක්ඛුම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි රූපං සනිදස්සනං සප්පටිඝං පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, චක්ඛුම්පෙතං, චක්ඛායතනම්පෙතං, චක්ඛුධාතුපෙසා, චක්ඛුන්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා[2], සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, නෙත්තම්පෙතං, නයනම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං චක්ඛායතනං.

602. කතමං තං රූපං චක්ඛායතනං?

යං චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං චක්ඛුං අනිදස්සනං සප්පටිඝං රූපම්හි සනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, චක්ඛුම්පෙතං, චක්ඛායතනම්පෙතං, චක්ඛුධාතුපෙසා, චක්ඛුන්ද්‍රියම්පෙතං, ලොකොපෙසො ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, නෙත්තම්පෙතං, නයනම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං චක්ඛායතනං.

603. කතමං තං රූපං චක්ඛායතනං?

යං චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං චක්ඛුං නිස්සාය රූපං ආරබ්භ චක්ඛුසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං චක්ඛුං නිස්සාය රූපං ආරබ්භ චක්ඛුසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං චක්ඛුං නිස්සාය රූපාරම්මණො චක්ඛුසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං චක්ඛුං නිස්සාය රූපාරම්මණා චක්ඛුසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා චක්ඛුම්පෙතං, චක්ඛායතනම්පෙතං, චක්ඛුධාතුපෙසා, චක්ඛුන්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, නෙත්තම්පෙතං, නයනම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං චක්ඛායතනං.

---

1. චක්ඛු - සීමු 1, 2, මජසං.
2. ද්වාරොපෙසො - සීමු 3.

601. ඒ චක්ෂුරායතනරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා (උපන්) ආත්මභාවපර්‍යාපන්න වූ අනිදර්ශන වූ සප්‍රතිඝ වූ ප්‍රසාදය වේ ද, අනිදර්ශන වූ සප්‍රතිඝ වූ යම් ඇසෙකැ සනිදර්ශන වූ සප්‍රතිඝ වූ රූපය ගැටුණේ හෝ ගැටෙයි හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ (චක්ෂුඃප්‍රසාදය) චක්ෂු නමුදු වෙයි, තෙලෙ චක්ෂුරායතන නමුදු වෙයි, තෙල චක්ෂුර්ධාතු නමුදු වෙයි, තෙලෙ චක්ෂුරින්ද්‍රිය නමුදු වෙයි, තෙලෙ ලෝක නමුදු වෙයි, තෙල ද්වාර නමුදු වෙයි, තෙලෙ සමුද්‍ර නමුදු වෙයි, තෙලෙ පණ්ඩර නමුදු වෙයි, තෙලෙ ක්ෂෙත්‍ර නමුදු වෙයි, තෙලෙ වාස්තු නමුදු වෙයි, තෙලෙ නෙත්‍ර නමුදු වෙයි, තෙලෙ නයන නමුදු වෙයි, තෙලෙ ඕරිමතීර නමුදු වෙයි, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ චක්ෂුරායතන රූප යයි.

602. ඒ චක්ෂුරායතනරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා උපන් ආත්මභාවපර්‍යාපන්න වූ අනිදර්ශන වූ සප්‍රතිඝ වූ ප්‍රසාදය වේ ද, අනිදර්ශන වූ සප්‍රතිඝ වූ යම් ඇසෙක් සනිදර්ශන වූ සප්‍රතිඝ වූ රූපයෙහි ගැටුණේ හෝ ගැටෙයි හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ චක්ෂු නමුදු වෙයි, තෙලෙ චක්ෂුරායතන ද වෙයි, තෙල චක්ෂුර්ධාතු ද වෙයි, තෙලෙ චක්ෂුරින්ද්‍රිය ද වෙයි, තෙලෙ ලෝක ද වෙයි, තෙල ද්වාර ද වෙයි, තෙලෙ සමුද්‍ර ද වෙයි, තෙලෙ පඬෙර ද වෙයි, තෙලෙ කෙතු දු වෙයි, තෙලෙ වාස්තු දු වෙයි, තෙලෙ නෙතු දු වෙයි, තෙලෙ නයන දු වෙයි, තෙලෙ මෙතෙර දු වෙයි, තෙලෙ සිස්ගමු දු වේ. මේ ඒ චක්ෂුරායතනරූප යයි.

603. ඒ චක්ෂුරායතනරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා උපන් ආත්මභාවපර්‍යාපන්න වූ අනිදර්ශන වූ සප්‍රතිඝ වූ ප්‍රසාදය වේ ද, යම් චක්ෂුසක් නිසා රූපය අරමුණු කොට චක්ඛුසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් චක්ෂුසක් නිසා රූපය අරමුණු කොට චක්ඛු-සම්ඵස්සයෙන් උපන් වේදනාව ... සංඥාව ... චක්ෂුර්විඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් චක්ෂුසක් නිසා රූපාලම්බන වූ චක්ෂුසංස්පර්ශය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් චක්ෂුසක් නිසා රූපාලම්බන වූ චක්ෂුසංස්පර්ශයෙන් උපන් වේදනාව ... සංඥාව ... චේතනාව ... චක්ෂුර්විඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ, තෙලෙ චක්ෂු ද වෙයි, තෙලෙ චක්ෂුරායතන ද වෙයි, තෙල චක්ෂුර්ධාතු ද වෙයි, තෙලෙ චක්ෂුරින්ද්‍රිය ද වෙයි, තෙලෙ ලෝක ද වෙයි, තෙල ද්වාර ද වෙයි, තෙලෙ සමුද්‍ර ද වෙයි, තෙලෙ පණ්ඩර ද වෙයි, තෙලෙ ක්ෂෙත්‍ර ද වෙයි, තෙලෙ වාස්තු ද වෙයි, තෙලෙ නෙත්‍ර ද වෙයි, තෙලෙ නයන ද වෙයි, තෙලෙ ඕරිමතීර ද වෙයි, තෙලෙ ශූන්‍යග්‍රාම ද වේ. මේ ඒ චක්ෂුරායතන රූප යයි.

604. කතමං තං රූපං සොතායතනං?

යං සොතං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යෙන සොතෙන අනිදස්සනෙන සප්පටිඝෙන සද්දං අනිදස්සනං සප්පටිඝං සුණි වා සුණාති වා සුණිස්සති වා සුණෙ වා, සොතම්පෙතං, සොතායතනම්පෙතං, සොතධාතුපෙසා සොතින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං සොතායතනං.

605. කතමං තං රූපං සොතායතනං?

යං සොතං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යම්හි සොතම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි සද්දො අනිදස්සනො සප්පටිඝො පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, සොතම්පෙතං, සොතායතනම්පෙතං, සොතධාතුපෙසා, සොතින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං සොතායතනං.

606. කතමං තං රූපං සොතායතනං?

යං සොතං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං සොතං අනිදස්සනං සප්පටිඝං සද්දම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, සොතම්පෙතං, සොතායතනම්පෙතං, සොතධාතුපෙසා, සොතින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං සොතායතනං.

607. කතමං තං රූපං සොතායතනං?

යං සොතං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං සොතං නිස්සාය සද්දං ආරබ්භ සොතසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං සොතං නිස්සාය සද්දං ආරබ්භ සොතසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- සොතවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං සොතං නිස්සාය සද්දාරම්මණො සොතසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං සොතං නිස්සාය සද්දාරම්මණා සොතසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- සොතවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, සොතම්පෙතං, සොතායතනම්පෙතං, සොතධාතුපෙසා, සොතින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං සොතායතනං.

604. ඒ ශ්‍රොත්‍රායතනරූපය කවරේ යත්:

යම් ශ්‍රොත්‍රයෙක් සතර මහාභූතයන් නිසා උපන් ආත්මභාවපර්‍ය්‍යා-පන්න වූ අනිදර්‍ශන වූ සප්‍රතිඝ වූ ප්‍රසාදය වේ ද, අනිදර්‍ශන වූ සප්‍රතිඝ වූ යම් ශ්‍රොත්‍රයෙකින් අනිදර්‍ශන වූ සප්‍රතිඝ වූ ශබ්දය ඇසුයේ හෝ අසා හෝ අසන්නේ හෝ අසා නම් හෝ තෙලෙ (ශ්‍රොත්‍රප්‍රසාදය) ශ්‍රොත්‍ර නමුදු වෙයි, තෙලෙ ශ්‍රොත්‍රායතන නමුදු වෙයි, තෙල ශ්‍රොත්‍රධාතු නමුදු වෙයි, තෙලෙ ශ්‍රොත්‍රෙන්‍ද්‍රිය නමුදු වෙයි, තෙලෙ ලොක නමුදු වෙයි, තෙල ද්වාර නමුදු වෙයි, තෙලෙ සමුද්‍ර නමුදු වෙයි, තෙලෙ පණ්ඩර නමුදු වෙයි, තෙලෙ ක්‍ෂෙත්‍ර නමුදු වෙයි, තෙලෙ වාස්තු නමුදු වෙයි, තෙලෙ ඔරිමතීර නමුදු වෙයි, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ශ්‍රොත්‍රායතනරූප ය යි.

605. ඒ ශ්‍රොත්‍රායතනරූපය කවරේ යත්:

යම් ශ්‍රොත්‍රයෙක් සතර මහාභූතයන් නිසා උපන් ආත්මභාවපර්‍ය්‍යා-පන්න වූ අනිදර්‍ශන වූ සප්‍රතිඝ වූ ප්‍රසාදය වේ ද, අනිදර්‍ශන වූ සප්‍රතිඝ වූ යම් ශ්‍රොත්‍රයෙක්හි අනිදර්‍ශන වූ සප්‍රතිඝ වූ ශබ්දය ගැටුණේ හෝ ගැටෙයි හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ ශ්‍රොත්‍ර ද වෙයි, තෙලෙ ශ්‍රොත්‍රායතන ද වෙයි, තෙල ශ්‍රොත්‍රධාතු ද වෙයි, තෙලෙ ශ්‍රොත්‍රෙන්‍ද්‍රිය ද වෙයි, තෙලෙ ලොක ද වෙයි, තෙල ද්වාර ද වෙයි, තෙලෙ සමුද්‍ර ද වෙයි, තෙලෙ පණ්ඩර ද වෙයි, තෙලෙ ක්‍ෂෙත්‍ර ද වෙයි, තෙල වාස්තු ද වෙයි, තෙලෙ ඔරිමතීර ද වෙයි, තෙලෙ ශූන්‍යග්‍රාම ද වේ. මේ ඒ ශ්‍රොත්‍රායතනරූප ය යි.

606. ඒ ශ්‍රොත්‍රායතනරූපය කවරේ යත්:

යම් ශ්‍රොත්‍රයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍ය්‍යාපන්න අනිදර්‍ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්‍ශන සප්‍රතිඝ වූ යම් ශ්‍රොත්‍රයෙක් අනිදර්‍ශන සප්‍රතිඝ වූ ශබ්දයෙහි ගැටුණේ හෝ ගැටෙයි ගැටෙන්නේ ගැටේ නම් හෝ තෙලෙ (ශොත්‍ර ප්‍රසාදය) ශොත්‍ර නමුදු, තෙලෙ ශ්‍රොත්‍රායතන නමුදු, තෙල ශ්‍රොත්‍රධාතු නමුදු, තෙලෙ ශොත්‍රෙන්‍ද්‍රිය නමුදු, තෙලෙ ලොක නමුදු, තෙල ද්වාර නමුදු, තෙලෙ සමුද්‍ර නමුදු, තෙලෙ පණ්ඩර නමුදු, තෙලෙ ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ වාස්තු නමුදු, තෙලෙ ඔරිමතීර නමුදු, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. ඒ ශ්‍රොත්‍රායතන රූප ය යි.

607. ඒ ශ්‍රොත්‍රායතනරූපය කවරේ යත්:

යම් ශ්‍රොත්‍රයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍ය්‍යාපන්න අනිදර්‍ශන සප්‍රතිඝ වූයේ ද, යම් ශ්‍රොත්‍රයක් නිසා ශබ්දය අරමුණු කොට ශ්‍රොත්‍රසංස්පර්‍ශය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ ... යම් ශ්‍රොත්‍රයක් නිසා ශබ්දය අරමුණු කොට ශ්‍රොත්‍රසංස්පර්‍ශයෙන් උපදනා වෙදනාව ... සංඥව ... චෙතනාව ... ශ්‍රොත්‍ර-විඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ ... යම් ශ්‍රොත්‍රයක් නිසා ශබ්දාලම්බන වූ ශ්‍රොත්‍රසංස්පර්‍ශය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ ... යම් ශ්‍රොත්‍රයක් නිසා ශබ්දාලම්බන වූ සොතසම්ඵස්සජ වෙදනාව ... සංඥාව ... චෙතනාව ... ශ්‍රොත්‍රවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ, තෙල (ශ්‍රොත්‍ර ප්‍රසාදය) ශ්‍රොත්‍ර නමුදු, තෙලෙ ශ්‍රොත්‍රායතන නමුදු, තෙල ශ්‍රොත්‍රධාතු නමුදු, තෙලෙ ශ්‍රොත්‍රෙන්‍ද්‍රිය නමුදු, තෙලෙ ලොක නමුදු, තෙල ද්වාර නමුදු, තෙලෙ සමුද්‍ර නමුදු, තෙලෙ පණ්ඩර නමුදු, තෙලෙ ක්‍ෂෙත්‍ර නමුදු, තෙලෙ වාස්තු නමුදු, තෙලෙ ඔරිමතීර නමුදු, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ශ්‍රොත්‍රායතනරූප ය යි.

608. කතමං තං රූපං ඝානායතනං?

යං ඝානං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යෙන ඝානෙන අනිදස්සනෙන සප්පටිඝෙන ගන්ධං අනිදස්සනං සප්පටිඝං ඝායි වා ඝායති වා ඝායිස්සති වා ඝායෙ වා ඝානම්පෙතං, ඝානායතනම්පෙතං, ඝානධාතුපෙසා, ඝානින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං. වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං ඝානායතනං.

609. කතමං තං රූපං ඝානායතනං?

යං ඝානං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යම්හි ඝානම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි ගන්ධො අනිදස්සනො සප්පටිඝො පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, ඝානම්පෙතං, ඝානායතනම්පෙතං, ඝානධාතුපෙසා, ඝානින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං ඝානායතනං.

610. කතමං තං රූපං ඝානායතනං?

යං ඝානං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං ඝානං අනිදස්සනං සප්පටිඝං ගන්ධම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, ඝානම්පෙතං, ඝානායතනම්පෙතං, ඝානධාතුපෙසා, ඝානින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං ඝානායතනං.

611 කතමං තං රූපං ඝානායතනං?

යං ඝානං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං ඝානං නිස්සාය ගන්ධං ආරබ්භ ඝානසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ඝානං නිස්සාය ගන්ධං ආරබ්භ ඝානසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- ඝානවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ඝානං නිස්සාය ගන්ධාරම්මණො ඝානසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ඝානං නිස්සාය ගන්ධාරම්මණා ඝානසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- ඝානවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, ඝානම්පෙතං, ඝානායතනම්පෙතං, ඝානධාතුපෙසා, ඝානින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං ඝානායතනං.

608. ඒ ඝ්‍රාණායතනරූපය කවරේ යත්:

යම් ඝ්‍රාණයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්ශන වූ සප්‍රතිඝ වූ යම් ඝ්‍රාණයෙකින් අනිදර්ශන සප්‍රතිඝ වූ ගන්ධය ඇසී හෝ අසා හෝ අසන්නේ හෝ අසා නම් හෝ තෙලෙ (ඝ්‍රාණප්‍රසාදය) ඝ්‍රාණ නමුදු, තෙලෙ ඝ්‍රාණායතන නමුදු, තෙල ඝ්‍රාණධාතු නමුදු, තෙලෙ ඝ්‍රාණෙන්ද්‍රිය නමුදු, තෙලෙ ලොක නමුදු, තෙල ද්වාර නමුදු, තෙලෙ සමුද්‍ර නමුදු, තෙලෙ පණ්ඩර නමුදු, තෙලෙ ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ වාස්තු නමුදු, තෙලෙ ඔරිමතීර නමුදු, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ඝ්‍රාණායතනරූප ය යි.

609. ඒ ඝ්‍රාණායතනරූපය කවරේ යත්:

යම් ඝ්‍රාණයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ඝ්‍රාණයෙක්හි අනිදර්ශන සප්‍රතිඝ වූ ගන්ධය ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ (ඝ්‍රාණප්‍රසාදය) ඝ්‍රාණ-නමුදු, තෙලෙ ඝ්‍රාණායතන නමුදු. තෙල ඝ්‍රාණධාතු නමුදු තෙලෙ ඝ්‍රාණෙ-න්ද්‍රිය නමුදු, තෙලෙ ලොක නමුදු, තෙල ද්වාර නමුදු, තෙලෙ සමුද්‍ර නමුදු, තෙලෙ පණ්ඩර නමුදු, තෙලෙ ක්‍ෂෙත්‍ර නමුදු, තෙලෙ වාස්තු නමුදු, තෙලෙ ඔරිමතීර නමුදු, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ඝ්‍රාණායතනරූප ය යි

610 ඒ ඝ්‍රාණායතනරූපය කවරේ යත්:

යම් ඝ්‍රාණයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ඝ්‍රාණයෙක් අනිදර්ශන සප්‍රතිඝ වූ ගන්ධයෙහි ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ (ඝ්‍රාණප්‍රසාදය) ඝ්‍රාණ නමුදු, තෙලෙ ඝ්‍රාණායතන නමුදු, තෙල ඝ්‍රාණධාතු නමුදු, තෙලෙ ඝ්‍රාණෙන්ද්‍රිය නමුදු, තෙලෙ ලොක නමුදු, තෙල ද්වාර නමුදු, තෙලෙ සමුද්‍ර නමුදු, තෙලෙ පණ්ඩර නමුදු, තෙලෙ ක්‍ෂෙත්‍ර නමුදු, තෙලෙ වාස්තු නමුදු තෙලෙ ඔරිමතීර නමුදු, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ඝ්‍රාණායතනරූප ය යි.

611. ඒ ඝ්‍රාණායතනරූපය කවරේ යත්:

යම් ඝ්‍රාණයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද, යම් ඝ්‍රාණයක් නිසා ගන්ධය අරමුණු කොට ඝානසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් ඝ්‍රාණයක් නිසා ගන්ධය අරමුණු කොට ඝානසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... ඝ්‍රාණවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් ඝ්‍රාණයක් නිසා ගන්ධාලම්බන වූ ඝානසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ. හෝ උපදී නම් හෝ ... යම් ඝ්‍රාණයක් නිසා ගන්ධාලම්බන වූ ඝානසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... ඝ්‍රාණවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ තෙලෙ (ප්‍රසාදය) ඝ්‍රාණ නමුදු, තෙලෙ ඝ්‍රාණායතන නමුදු, තෙල ඝ්‍රාණධාතු නමුදු, තෙලෙ ඝ්‍රාණෙන්ද්‍රිය නමුදු, තෙලෙ ලොක නමුදු, තෙල ද්වාර නමුදු, තෙලෙ සමුද්‍ර නමුදු, තෙලෙ පණ්ඩර නමුදු, තෙලෙ ක්‍ෂෙත්‍ර නමුදු, තෙලෙ වාස්තු නමුදු, තෙලෙ ඔරිමතීර නමුදු, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ඝ්‍රාණායතනරූප ය යි

612. කතමං තං රූපං ජිව්හායතනං?

යා ජිව්හා චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යාය ජිව්හාය අනිදස්සනාය සප්පටිඝාය රසං අනිදස්සනං සප්පටිඝං සායි වා සායති වා සායිස්සති වා සායෙ වා, ජිව්හාපෙසා ජිව්හායතනම්පෙතං, ජිව්හාධාතුපෙසා, ජිව්හින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං ජිව්හායතනං.

613. කතමං තං රූපං ජිව්හායතනං?

යා ජිව්හා චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යාය ජිව්හාය අනිදස්සනාය සප්පටිඝාය රසො අනිදස්සනො සප්පටිඝො පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, ජිව්හාපෙසා, ජිව්හායතනම්පෙතං, ජිව්හාධාතුපෙසා, ජිව්හින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං රූපං ජිව්හායතනං.

614. කතමං තං රූපං ජිව්හායතනං?

යා ජිව්හා චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යා ජිව්හා අනිදස්සනා සප්පටිඝා රසම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, ජිව්හාපෙසා, ජිව්හායතනම්පෙතං, ජිව්හාධාතුපෙසා, ජිව්හින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං ජිව්හායතනං.

615. කතමං තං රූපං ජිව්හායතනං?

යා ජිව්හා චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං ජිව්හං නිස්සාය රසං ආරබ්භ ජිව්හාසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ජිව්හං නිස්සාය රසං ආරබ්භ ජිව්හාසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- ජිව්හාවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ජිව්හං නිස්සාය රසාරම්මණො ජිව්හාසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ජිව්හං නිස්සාය රසාරම්මණා ජිව්හාසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- ජිව්හාවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, ජිව්හාපෙසා, ජිව්හායතනම්පෙතං, ජිව්හාධාතුපෙසා, ජිව්හින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං ජිව්හායතනං.

612. ඒ ජිහ්වායතනරූපය කවරේ යත්:

යම් ජිහ්වාවක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්‍ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්‍ශන සප්‍රතිඝ වූ යම් දිවෙකින් අනිදර්‍ශන සප්‍රතිඝ වූ රසය විඳිද්දේ හෝ විඳී හෝ විඳුනේ හෝ විඳි නම් හෝ, තෙල (ජිහ්වාප්‍රසාදය) ජිහ්වා නමුදු, තෙල ජිහ්වායතන නමුදු, තෙල ජිහ්වාධාතු නමුදු, තෙලෙ ජිහ්වෙන්‍ද්‍රිය නමුදු, තෙලෙ ලොක නමුදු, තෙල ද්වාර නමුදු, තෙලෙ සමුද්‍ර නමුදු, තෙලෙ පණ්ඩර නමුදු, තෙලෙ ක්‍ෂෙත්‍ර නමුදු, තෙලෙ වාස්තු නමුදු, තෙලෙ ඔරමතීර නමුදු, තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ජිහ්වායතනරූප ය යි.

613. ඒ ජිහ්වායතනරූපය කවරේ යත්:

යම් දිවක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්‍ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්‍ශන සප්‍රතිඝ වූ යම් දිවෙක්හි අනිදර්‍ශන සප්‍රතිඝ වූ රසය ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, ජිහ්වා නමුදු තෙල ය, ජිහ්වායතන නමුදු තෙල ය, ජිහ්වාධාතු නමුදු තෙල ය, ජිහ්වෙන්‍ද්‍රිය නමුදු තෙලෙ ය, ලොක නමුදු තෙලෙ ය, ද්වාර නමුදු තෙල ය, සමුද්‍ර නමුදු තෙලෙ ය, පණ්ඩර නමුදු තෙලෙ ය, ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ ය, වාස්තු නමුදු තෙලෙ ය, ඔරිමතීර නමුදු තෙලෙ ය, ශූන්‍යග්‍රාම නමුදු තෙලෙ යි. මේ ඒ ජිහ්වායතනරූප ය යි.

614. ඒ ජිහ්වායතන රූපය කවරේ යත්:

යම් දිවක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්‍ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්‍ශන සප්‍රතිඝ වූ යම් දිවෙක් අනිදර්‍ශන සප්‍රතිඝ වූ රසයෙහි ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ ජිහ්වා නමුදු තෙල (ජිහ්වාප්‍රසාද) ය, ජිහ්වායතන නමුදු තෙලෙ ය, ජිහ්වාධාතු නමුදු තෙල ය, ජිහ්වෙන්‍ද්‍රිය නමුදු තෙලෙ ය, ලොක නමුදු තෙලෙ ය, ද්වාර නමුදු තෙල ය, සමුද්‍ර නමුදු තෙලෙ ය, පණ්ඩර නමුදු තෙලෙ ය, ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ ය, වාස්තු නමුදු තෙලෙ ය, ඔරිමතීර නමුදු තෙලෙ ය, ශූන්‍යග්‍රාම නමුදු තෙලෙ යි. මේ ඒ ජිහ්වායතනරූප ය යි.

615. ඒ ජිහ්වායතනරූපය කවරේ යත්:

යම් දිවෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්‍ශන සප්‍රතිඝ වූයේ ද, යම් දිවක් නිසා රසය අරමුණු කොට ජිව්හාසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් දිවක් නිසා රසය අරමුණු කොට ජිව්හාසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... ජිහ්වාවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ ... යම් දිවක් නිසා රසාලම්බන වූ ජිව්හාසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ ... යම් දිවක් නිසා රසාලම්බන වූ ජිව්හාසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... ජිහ්වාවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ, ජිව්හා නමුදු තෙල (ජිහ්වාප්‍රසාද) ය, ජිහ්වායතන නමුදු තෙල ය, ජිහ්වාධාතු නමුදු තෙල ය, ජිහ්වෙන්‍ද්‍රිය නමුදු තෙලෙ ය, ලොක නමුදු තෙලෙ ය, ද්වාර නමුදු තෙල ය, සමුද්‍ර නමුදු තෙලෙ ය, පණ්ඩර නමුදු තෙලෙ ය, ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ ය, වාස්තු නමුදු තෙලෙ ය, ඔරිමතීර නමුදු තෙලෙ ය, ශූන්‍යග්‍රාම නමුදු තෙලෙ යි මේ ඒ ජිහ්වායතනරූප ය යි.

616. කතමං තං රූපං කායායතනං?

යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යෙන කායෙන අනිදස්සනෙන සප්පටිඝෙන ඵොට්ඨබ්බං අනිදස්සනං සප්පටිඝං ඵුසි වා ඵුසති වා ඵුසිස්සති වා ඵුසෙ වා, කායොපෙසො, කායායතනම්පෙතං, කායධාතුපෙසා, කායින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං කායායතනං.

617. කතමං තං රූපං කායායතනං?

යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො සප්පටිඝො, යම්හි කායම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි ඵොට්ඨබ්බං අනිදස්සනො සප්පටිඝො පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, කායොපෙසො, කායායතනම්පෙතං, කායධාතුපෙසා, කායින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං කායායතනං.

618. කතමං තං රූපං කායායතනං?

යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යො කායො අනිදස්සනො සප්පටිඝො ඵොට්ඨබ්බම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, කායොපෙසො, කායායතනම්පෙතං, කායධාතුපෙසා, කායින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤොගාමොපෙසො. ඉදං තං රූපං කායායතනං.

619. කතමං තං රූපං කායායතනං?

යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං කායං නිස්සාය ඵොට්ඨබ්බං ආරබ්භ කායසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං කායං නිස්සාය ඵොට්ඨබ්බං ආරබ්භ කායසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- කායවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං කායං නිස්සාය ඵොට්ඨබ්බාරම්මණො කායසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං කායං නිස්සාය ඵොට්ඨබ්බාරම්මණා කායසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- කායවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, කායොපෙසො, කායායතනම්පෙතං, කායධාතුපෙසා, කායින්ද්‍රියම්පෙතං, ලොකොපෙසො, ද්වාරාපෙසා, සමුද්දොපෙසො, පණ්ඩරම්පෙතං, ඛෙත්තම්පෙතං, වත්ථුම්පෙතං, ඔරිමං තීරම්පෙතං, සුඤ්ඤොගාමොපෙසො. ඉදං තං රූපං කායායතනං.

616. ඒ කායායතනරූපය කවරේ යත්:

යම් කයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් කයෙකින් අනිදර්ශන සප්‍රතිඝ වූ ස්ප්‍රෂ්ටව්‍යය පැහැපී හෝ පහසා හෝ පහස්නේ හෝ පහසා නම් හෝ, කාය නමුදු තෙලෙ (කායප්‍රසාද) ය, කායායතන නමුදු තෙලෙ ය, කායධාතු නමුදු තෙල ය, කායෙන්ද්‍රිය නමුදු තෙලෙ ය, ලෝක නමුදු තෙලෙ ය, ද්වාර නමුදු තෙල ය, සමුද්‍ර නමුදු තෙලෙ ය, පණ්ඩර නමුදු තෙලෙ ය, ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ ය, වාස්තු නමුදු තෙලෙ ය, ඔරිමතීර නමුදු තෙලෙ ය, ශුන්‍යග්‍රාම නමුදු තෙලෙ යි. මේ ඒ කායායතනරූප යි.

617. ඒ කායායතනරූපය කවරේ යත්:

යම් කයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් කයෙක්හි යම් ස්ප්‍රෂ්ටව්‍යයෙක් ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ කාය නමුදු තෙලෙ ය, කායායතන නමුදු තෙලෙ ය, කායධාතු නමුදු තෙල ය, කායෙන්ද්‍රිය නමුදු තෙලෙ ය, ලෝක නමුදු තෙලෙ ය, ද්වාර නමුදු තෙල ය, සමුද්‍ර නමුදු තෙලෙ ය, පණ්ඩර නමුදු තෙලෙය, ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ ය, වාස්තු නමුදු තෙලෙ ය, ඔරිමතීර නමුදු තෙලෙ ය, ශුන්‍යග්‍රාම නමුදු තෙලෙ යි. මේ ඒ කායායතනරූප ය යි.

618. ඒ කායායතනරූපය කවරේ යත්:

යම් කයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් කයෙක් අනිදර්ශන සප්‍රතිඝ වූ ස්ප්‍රෂ්ටව්‍යයෙහි ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, කාය නමුදු තෙලෙ ය, කායායතන නමුදු තෙලෙ ය, කායධාතු නමුදු තෙල ය, කායෙන්ද්‍රිය නමුදු තෙලෙ ය, ලෝක නමුදු තෙලෙ ය, ද්වාර නමුදු තෙල ය, සමුද්‍ර නමුදු තෙලෙ ය, පණ්ඩර නමුදු තෙලෙ ය, ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ ය, වාස්තු නමුදු තෙලෙ ය, ඔරිමතීර නමුදු තෙලෙ ය, ශුන්‍යග්‍රාම නමුදු තෙලෙ යි. මේ ඒ කායායතන රූප යි.

619. ඒ කායායතනරූපය කවරේ යත්:

යම් කයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ආත්මභාවපර්‍යාපන්න අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද, යම් කයක් නිසා ස්ප්‍රෂ්ටව්‍යය අරමුණු කොට කායසංස්පර්ශය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් කයක් නිසා ස්ප්‍රෂ්ටව්‍යය අරමුණු කොට කායසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... කායවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් කයක් නිසා ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වූ කායසංස්පර්ශය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් කයක් නිසා ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වූ කායසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... කායවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ කාය නමුදු තෙලෙ (කායප්‍රසාද) ය, කායායතන නමුදු තෙලෙ ය, කායධාතු නමුදු තෙල ය, කායෙන්ද්‍රිය නමුදු තෙලෙ ය, ලෝක නමුදු තෙලෙ ය, ද්වාර නමුදු තෙල ය, සමුද්‍ර නමුදු තෙලෙ ය, පණ්ඩර නමුදු තෙලෙ ය, ක්‍ෂෙත්‍ර නමුදු තෙලෙ ය, වාස්තු නමුදු තෙලෙ ය, ඔරිමතීර නමුදු තෙලෙ ය, ශුන්‍යග්‍රාම නමුදු තෙලෙ යි. මේ ඒ කායායතන රූප යි.

620. කතමං තං රූපං රූපායතනං?

යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං: නීලං පීතකං ලොහිතකං ඔදාතං කාළකං මඤ්ජෙට්ඨකං[1] හරි[2] හරිවණ්ණං අම්බඞ්කුරවණ්ණං දීඝං රස්සං අණුං ථූලං වට්ටං පරිමණ්ඩලං චතුරස්සං[3] ඡළංසං අට්ඨංසං සොළසංසං නින්නං ථලං ඡායා ආතපො ආලොකො අන්ධකාරො අබ්භා මහිකා ධූමො රජො චන්දමණ්ඩලස්ස වණ්ණනිභා සූරියමණ්ඩලස්ස[4] වණ්ණනිභා තාරකරූපානං වණ්ණනිභා ආදාසමණ්ඩලස්ස වණ්ණනිභා මණිසඞ්ඛමුත්තාවෙළුරියස්ස වණ්ණනිභා ජාතරූපරජතස්ස වණ්ණනිභා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං, යං රූපං සනිදස්සනං සප්පටිඝං චක්ඛුනා අනිදස්සනෙන සප්පටිඝෙන පස්සි වා පස්සති වා පස්සිස්සති වා පස්සෙ වා, රූපමෙතං, රූපායතනමෙතං, රූපධාතුපෙසා. ඉදං තං රූපං රූපායතනං.

621. කතමං තං රූපං රූපායතනං?

යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං: නීලං පීතකං ලොහිතකං ඔදාතං කාළකං මඤ්ජෙට්ඨකං හරි හරිවණ්ණං අම්බඞ්කුරවණ්ණං දීඝං රස්සං අණුං ථූලං වට්ටං පරිමණ්ඩලං චතුරස්සං[3] ඡළංසං අට්ඨංසං සොළසංසං නින්නං ථලං ඡායා ආතපො ආලොකො අන්ධකාරො අබ්භා මහිකා ධූමො රජො චන්දමණ්ඩලස්ස වණ්ණනිභා සූරියමණ්ඩලස්ස වණ්ණනිභා තාරකරූපානං වණ්ණනිභා ආදාසමණ්ඩලස්ස වණ්ණනිභා මණිසඞ්ඛමුත්තාවෙළුරියස්ස වණ්ණනිභා ජාතරූපරජතස්ස වණ්ණනිභා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං, යම්හි රූපම්හි සනිදස්සනම්හි සප්පටිඝම්හි චක්ඛුං අනිදස්සනං සප්පටිඝං පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, රූපමෙතං, රූපායතනමෙතං රූපධාතුපෙසා. ඉදං තං රූපං රූපායතනං.

622. කතමං තං රූපං රූපායතනං?

යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං: නීලං පීතකං ලොහිතකං ඔදාතං කාළකං මඤ්ජෙට්ඨකං හරි හරිවණ්ණං අම්බඞ්කුරවණ්ණං දීඝං රස්සං අණුං ථූලං වට්ටං පරිමණ්ඩලං චතුරස්සං ඡළංසං අට්ඨංසං සොළසංසං නින්නං ථලං ඡායා ආතපො ආලොකො අන්ධකාරො අබ්භා මහිකා ධූමො රජො චන්දමණ්ඩලස්ස වණ්ණනිභා සූරියමණ්ඩලස්ස වණ්ණනිභා තාරකරූපානං වණ්ණනිභා ආදාසමණ්ඩලස්ස වණ්ණනිභා මණිසඞ්ඛමුත්තාවෙළුරියස්ස වණ්ණනිභා ජාතරූපරජතස්ස වණ්ණනිභා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං, යං රූපං සනිදස්සනං සප්පටිඝං චක්ඛුම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, රූපමෙතං, රූපායතනමෙතං, රූපධාතුපෙසා ඉදං තං රූපං රූපායතනං.

1. මඤ්ජිට්ඨකං - මජසං. 2. 'හරි' ඉති ඌනං - PTS.
3. චතුරංසං - සභා, PTS 4. සුරියමණ්ඩලස්ස - මජසං.

620. ඒ රූපායතනරූපය කවරේ යත්:

යම් රූපයෙක් සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහන වූයේ සනිදර්ශන සප්‍රතිඝ වූ නිල් ය - කසාවනැ ලේපැහැ ය පුදු ය කළු ය මදට-වනැ සම්වනැ නිල්තණපැහැ ය අඹදළුපැහැ ය උස් ය මිටි ය කුඩු ය මහතැ වට ය පිරිමඬුලු ය සියුරැසැ සඇසැ අටැසැ සොළොසැසැ වල ය ගොබ ය සෙවණ ය අව් ය එළි ය අඳුරු වලා ය හිම ය දුම් ය රජසැ සඳමඬලෙහි පැහැ ය හිරු මඬලෙහි පැහැ ය තරුපැහැ ය කැටපත්-මඬලෙහි පැහැ ය මිණි සක් මුතු වෙරළුමිණි පැහැ ය රන් රිදී පැහැ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහනැ යි කියන ලද සනිදර්ශන සප්‍රතිඝ වූ යම් රූපයෙක් ඇද්ද, සනිදර්ශන සප්‍රතිඝ වූ යම් රූපයක් අනිදර්ශන සප්‍රතිඝ වූ ඇසින් දුටුයේ හෝ දකී හෝ දක්නේ හෝ දකී නම් හෝ තෙලෙ (රූසටහන) රූප නමුදු වෙයි, තෙලෙ රූපායතන නමුදු වෙයි, තෙල රූපධාතු නමුදු වේ. මේ ඒ රූපායතනරූප යි.

621. ඒ රූපායතනරූපය කවරේ යත්:

යම් රූපයෙක් සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහන වූයේ සනිදර්ශන සප්‍රතිඝ වූ - නිල් ය කහවනැ ලේපැහැ ය පුදු ය කළු ය මදට-වනැ සම්වනැ නිල්තණපැහැ ය අඹදළුපැහැ ය උස් ය මිටි ය කුඩු ය මහතැ වට ය පිරිමඬුලු ය සිවුරැසැ සඇසැ අටැසැ සොළොසැසැ වල ය ගොබ ය සෙවණ ය අව් ය එළි ය අඳුරු වලා ය හිම ය දුම් ය රජසැ සඳමඬලෙහි පැහැ ය හිරුමඬලෙහි පැහැ ය තරුපැහැ ය කැටපත් මඬලෙහි පැහැ ය හිරමඬලෙහි පැහැය තරුපැහැය කැටපත්මඬලෙහි පැහැය මිණි සක් මුතු වෙරළුමිණිපැහැ ය රන් රිදීපැහැ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහනැ යි කියන ලද සනිදර්ශන සප්‍රතිඝ වූ යම් රූපයෙක් ඇද්ද, සනිදර්ශන සප්‍රතිඝ වූ යම් රූපයෙක්හි අනිදර්ශන සප්‍රතිඝ වූ ඇස ගැටුණේ හෝ ගැටෙයි හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ (රූසටහන) රූප නමුදු වෙයි, තෙලෙ රූපායතන නමුදු වෙයි, තෙල රූපධාතු නමුදු වේ. මේ ඒ රූපායතනරූප යි.

622. ඒ රූපායතනරූපය කවරේ යත්:

යම් රූපයෙක් සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහන වූයේ සනිදර්ශන සප්‍රතිඝ වූ - නිල් ය කහවනැ ලේපැහැ ය පුදු ය කළු ය මදට-වනැ සම්වනැ නිල්තණපැහැ ය අඹදළුපැහැ ය උස් ය මිටි ය කුඩු ය මහතැ වට ය පිරිමඬුලු ය සියුරැසැ සඇසැ අටැසැ සොළොසැසැ වල ය ගොබ ය සෙවණ ය අව් ය එළි ය අඳුරු වලා ය හිම ය දුම් ය රජසැ සඳමඬලෙහි පැහැ ය හිරමඬලෙහි පැහැය තරුපැහැ ය කැටපත්මඬලෙහි පැහැ ය මිණි සක් මුතු වෙරළුමිණිපැහැ ය රන් රිදීපැහැ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහනැයි කියන ලද සනිදර්ශන සප්‍රතිඝ වූ යම් රූපයෙක් ඇද්ද, සනිදර්ශන සප්‍රතිඝ වූ යම් රූපයෙක් අනිදර්ශන සප්‍රතිඝ වූ ඇසෙහි ගැටුණේ හෝ ගැටෙයි හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ රූප නමුදු වෙයි, තෙලෙ රූපායතන නමුදු වෙයි, තෙල රූපධාතු නමුදු වේ. මේ ඒ රූපායතන රූප යි.

623. කතමං තං රූපං රූපායතනං?

යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං: නීලං පීතකං ලොහිතකං ඔදාතං කාළකං මඤ්ජෙට්ඨකං හරි හරිවණ්ණං අම්බඞ්කුරවණ්ණං දීඝං රස්සං අණුං ථූලං වට්ටං පරිමණ්ඩලං චතුරස්සං ඡළංසං අට්ඨංසං සොළසංසං නින්නං ථලං ඡායා ආතපො ආලොකො අන්ධකාරො අබ්භා මහිකා ධූමො රජො චන්දමණ්ඩලස්ස වණ්ණනිභා සුරියමණ්ඩලස්ස වණ්ණනිභා තාරකරූපානං වණ්ණනිභා ආදාසමණ්ඩලස්ස වණ්ණනිභා මණිසඞ්ඛමුත්තාවෙළුරියස්ස වණ්ණනිභා ජාතරූපරජතස්ස වණ්ණනිභා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං, යං රූපං ආරබ්භ චක්ඛුං නිස්සාය චක්ඛුසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං රූපං ආරබ්භ චක්ඛුං නිස්සාය චක්ඛුසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං චක්ඛුං නිස්සාය රූපාරම්මණො[1] චක්ඛුසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං චක්ඛුං නිස්සාය රූපාරම්මණා චක්ඛුසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, රූපමෙතං, රූපායතනමෙතං, රූපධාතුපෙසා ඉදං තං රූපං රූපායතනං.

624. කතමං තං රූපං සද්දායතනං?

යො සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: භෙරිසද්දො මුදිඞ්ගසද්දො සඞ්ඛසද්දො පණවසද්දො ගීතසද්දො වාදිතසද්දො සම්මසද්දො පාණිසද්දො සත්තානං නිග්ඝොසසද්දො ධාතූනං සන්නිඝාතසද්දො වාතසද්දො උදකසද්දො මනුස්සසද්දො අමනුස්සසද්දො, යො වා පනඤ්ඤොපි අත්ථි සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යං සද්දං අනිදස්සනං සප්පටිඝං සොතෙන අනිදස්සනෙන සප්පටිඝෙන සුණි වා සුණාති වා සුණිස්සති වා සුණෙ වා, සද්දොපෙසො, සද්දායතනමෙතං, සද්දධාතුපෙසා. ඉදං තං රූපං සද්දායතනං.

625. කතමං තං රූපං සද්දායතනං?

යො සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: භෙරිසද්දො මුදිඞ්ගසද්දො සඞ්ඛසද්දො පණවසද්දො ගීතසද්දො වාදිතසද්දො සම්මසද්දො පාණිසද්දො සත්තානං නිග්ඝොසසද්දො ධාතූනං සන්නිඝාතසද්දො වාතසද්දො උදකසද්දො මනුස්සසද්දො අමනුස්සසද්දො, යො වා පනඤ්ඤොපි අත්ථි සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යම්හි සද්දම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි සොතං අනිදස්සනං සප්පටිඝං පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, සද්දොපෙසො, සද්දායතනමෙතං, සද්දධාතුපෙසා. ඉදං තං රූපං සද්දායතනං.

---

1. යං රූපාරම්මණො චක්ඛුං නිස්සාය - සීමු 1, 2, 3, මජසං. සතා.
යං රූපාරම්මණා චක්ඛුං නිස්සාය, PTS.

623. ඒ රූපායතනරූපය කවරේ යත්:

යම් රූපයෙක් සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහන වූයේ සනිදර්ශන සප්‍රතිඝ වූ - නිල් ය කහවතැ ලේපැහැ ය සුදු ය කළු ය මදටවතැ සම්වතැ නිල්තණපැහැ ය අඹදළුපැහැ ය උස් ය මිටි ය කුඩු ය මහතැ වට ය පිරිමඬුලු ය සිවුරැසැ සඅැසැ අටැසැ සොළොසැසැ වල ය ගොඩ ය සෙවණ ය අව් ය එළි ය අඳුරු වලා ය හිම ය දුම් ය රජසැ සඳමඬලෙහි පැහැ ය හිරුමඬලෙහි පැහැ ය තරුපැහැ ය කැටපත් මඬලෙහි පැහැ ය මිණි සක් මුතු වෙරළුමිණිපැහැ ය රන් රිදීපැහැ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහනැ යි කියන ලද සනිදර්ශන සප්‍රතිඝ වූ යම් රූපයෙක් ඇද්ද, යම් රූපයක් අරමුණු කොට ඇස නිසා චක්ඛුසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් රූපයක් අරමුණු කොට ඇස නිසා චක්ඛුසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... චක්ෂුර්විඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් ඇසක් නිසා රූපාලම්බන වූ චක්ඛුසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් ඇසක් නිසා රූපාලම්බන වූ චක්ඛුසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... චක්ෂුර්විඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ, තෙලෙ රූප නමුදු වෙයි, තෙලෙ රූපායතන නමුදු වෙයි, තෙල රූපධාතු නමුදු වේ. මේ ඒ රූපායතන රූප යි.

624. ඒ ශබ්දයතනරූපය කවරේ යත්:

යම් ශබ්දයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ ද - බෙරහඬ ය මිහිඟුහඬ ය සක්හඬ ය පණාබෙරහඬ ය ගීහඬ ය වැයුම් හඬ ය කස්තලහඬ ය අත්තලහඬ ය සත්ත්වයන්ගේ නිඝෝෂය (-අවියත්) හඬ ය ධාතූන් ගේ (උනුනුන්) ගැටුම් හඬ ය සුළං හඬ ය දියහඬ ය මිනිස් හඬ ය නොමිනිස්හඬ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ශබ්දයෙකුත් ඇද්ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ශබ්දයක් අනිදර්ශන සප්‍රතිඝ වූ ශ්‍රොත්‍රයෙන් ඇසී හෝ අසා හෝ අසන්නේ හෝ අසා නම් හෝ, තෙලෙ ශබ්ද නමුදු වෙයි, තෙලෙ ශබ්දායතන නමුදු වෙයි, තෙල ශබ්දධාතු නමුදු වේ. මේ ඒ ශබ්දායතනරූප යි.

625. ඒ ශබ්දායතනරූපය කවරේ යත්:

යම් ශබ්දයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - බෙරහඬ ය මිහිඟු හඬ ය සක්හඬ ය පණාබෙරහඬ ය ගීහඬ ය වැයුම්හඬ ය කස්තලහඬ ය අත්තලහඬ ය සත්ත්වයන්ගේ අවියත් හඬ ය ධාතූන්ගේ ගැටුම් හඬ ය සුළංහඬ ය දියහඬ ය මිනිස්හඬ ය නොමිනිස් හඬ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ශබ්දයක් හෝ ඇද්ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ශබ්දයෙක්හි අනිදර්ශන සප්‍රතිඝ වූ ශ්‍රොත්‍රය ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ ශබ්ද නමුදු වෙයි, තෙලෙ ශබ්දායතන නමුදු වෙයි, තෙල ශබ්දධාතු නමුදු වේ. මේ ඒ ශබ්දායතනරූප යි.

626. කතමං තං රූපං සද්දායතනං?

යො සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: භෙරිසද්දො මුදිඞ්ගසද්දො සඞ්ඛසද්දො පණවසද්දො ගීතසද්දො වාදිතසද්දො සම්මසද්දො පාණිසද්දො සත්තානං නිග්ඝොසසද්දො ධාතූනං සන්නිඝාතසද්දො වාතසද්දො උදකසද්දො මනුස්සසද්දො අමනුස්සසද්දො, යො වා පනඤ්ඤොපි අත්ථි සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යො සද්දො අනිදස්සනො සප්පටිඝො සොතම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, සද්දොපෙසො, සද්දායතනමෙපතං, සද්දධාතුපෙසා. ඉදං තං රූපං සද්දායතනං.

627. කතමං තං රූපං සද්දායතනං?

යො සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: භෙරිසද්දො මුදිඞ්ගසද්දො සඞ්ඛසද්දො පණවසද්දො ගීතසද්දො වාදිතසද්දො සම්මසද්දො පාණිසද්දො සත්තානං නිග්ඝොසසද්දො ධාතූනං සන්නිඝාතසද්දො වාතසද්දො උදකසද්දො මනුස්සසද්දො අමනුස්සසද්දො, යො වා පනඤ්ඤොපි අත්ථි සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යං සද්දං ආරබ්භ සොතං නිස්සාය සොතසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං සද්දං ආරබ්භ සොතං නිස්සාය සොතසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- සොතවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං සොතං නිස්සාය සද්දාරම්මණො සොතසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං සොතං නිස්සාය සද්දාරම්මණා සොතසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- සොතවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, සද්දොපෙසො, සද්දායතනමෙපතං, සද්දධාතුපෙසා. ඉදං තං රූපං සද්දායතනං.

628. කතමං තං රූපං ගන්ධායතනං?

යො ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: මූලගන්ධො සාරගන්ධො තචගන්ධො පත්තගන්ධො පුප්ඵගන්ධො ඵලගන්ධො ආමකගන්ධො[1] විස්සගන්ධො සුගන්ධො දුග්ගන්ධො, යො වා පනඤ්ඤොපි අත්ථි ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යං ගන්ධං අනිදස්සනං සප්පටිඝං ඝානෙන අනිදස්සනෙන සප්පටිඝෙන ඝායි වා ඝායති වා ඝායිස්සති වා ඝායෙ වා, ගන්ධොපෙසො, ගන්ධායතනමෙපතං, ගන්ධධාතුපෙසා. ඉදං තං රූපං ගන්ධායතනං.

1. ආමගන්ධො - සීමු 1, 3, සයා, PTS

626. ඒ ශබ්දායතනරූපය කවරේ යත්:

යම් ශබ්දයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - බෙරහඬ ය මිහිඟුහඬ ය සක්හඬ ය පණාබෙරහඬ ය ගීහඬ ය වැයුම්හඬ ය කස්තලහඬ ය අත්තලහඬ ය සත්ත්වයන්ගේ අවියත් හඬ ය ධාතූන්ගේ ගැටුම්හඬ ය සුළංහඬ ය දියහඬ ය මිනිස්හඬ ය නොමිනිස් හඬ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ශබ්දයෙක් හෝ ඇද්ද, අනිදර්ශන වූ සප්‍රතිඝ වූ යම් ශබ්දයෙක් අනිදර්ශන සප්‍රතිඝ වූ ශ්‍රොත්‍රයෙහි ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ ශබ්ද නමුදු වෙයි, තෙලෙ ශබ්දායතන නමුදු වෙයි, තෙල ශබ්දධාතු නමුදු වේ. මේ ඒ ශබ්දායතනරූප යි.

627. ඒ ශබ්දායතනරූපය කවරේ යත්:

යම් ශබ්දයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - බෙරහඬ ය මිහිඟුහඬ ය සක්හඬ ය පණාබෙරහඬ ය ගීහඬ ය වැයුම් හඬය කස්තලහඬ ය අත්තලහඬ ය සත්ත්වයන්ගේ අවියත් හඬ ය ධාතූන්ගේ ගැටුම් හඬ ය සුළංහඬ ය දියහඬ ය මිනිස්හඬ ය නොමිනිස්-හඬ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ශබ්දයෙක් හෝ ඇද්ද, යම් ශබ්දයක් අරමුණු කොට ශ්‍රොත්‍රය නිසා සොතසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් ශබ්දයක් අරමුණු කොට ශ්‍රොත්‍රය නිසා සොතසම්ඵස්සජ වෙදනාව ... සංඥාව ... චෙතනාව ... ශ්‍රොත්‍රවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් ශ්‍රොත්‍රයක් නිසා ශබ්දාලම්බන වූ සොතසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් ශ්‍රොත්‍රයක් නිසා ශබ්දාලම්බන වූ සොතසම්ඵස්සජ වෙදනාව ... සංඥාව ... චෙතනාව ... ශ්‍රොත්‍රවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ, තෙලෙ ශබ්ද නමුදු වෙයි, තෙලෙ ශබ්දායතන නමුදු වෙයි, තෙල ශබ්දධාතු නමුදු වේ. මේ ඒ ශබ්දායතන රූප යි.

628. ඒ ගන්ධායතන රූපය කවරේ යත්:

යම් ගන්ධයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - මුල්ගඳ ය හරගඳ ය පොතුගඳ ය පත්ගඳ ය මල්ගඳ ය පලගඳ ය අමුගඳ ය කුණුගඳ ය සුවඳ ය දුගඳ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ගන්ධයේක් හෝ ඇද්ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ගන්ධයක් අනිදර්ශන සප්‍රතිඝ වූ ඝ්‍රාණයෙහි ඇසී හෝ අසා හෝ අසන්නේ හෝ අසා නම් හෝ, ගඳ නමුදු තෙලෙ ය, ගන්ධායතන නමුදු තෙලෙ ය, ගන්ධධාතු නමුදු තෙල යි. මේ ඒ ගන්ධායතන රූප යි.

629. කතමං තං රූපං ගන්ධායතනං?

යො ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: මූලගන්ධො සාරගන්ධො තචගන්ධො පත්තගන්ධො පුප්ඵගන්ධො ඵලගන්ධො ආමකගන්ධො විස්සගන්ධො සුගන්ධො දුග්ගන්ධො, යො වා පනඤ්ඤොපි අත්ථි ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යම්හි ගන්ධම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි ඝානං අනිදස්සනං සප්පටිඝං පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, ගන්ධොපෙසො, ගන්ධායතනම්පෙතං, ගන්ධධාතුපෙසා. ඉදං තං රූපං ගන්ධායතනං.

630. කතමං තං රූපං ගන්ධායතනං?

යො ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: මූලගන්ධො සාරගන්ධො තචගන්ධො පත්තගන්ධො පුප්ඵගන්ධො ඵලගන්ධො ආමකගන්ධො විස්සගන්ධො සුගන්ධො දුග්ගන්ධො, යො වා පනඤ්ඤොපි අත්ථි ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යො ගන්ධො අනිදස්සනො සප්පටිඝො ඝානම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, ගන්ධොපෙසො, ගන්ධායතනම්පෙතං, ගන්ධධාතුපෙසා. ඉදං තං රූපං ගන්ධායතනං.

631. කතමං තං රූපං ගන්ධායතනං?

යො ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: මූලගන්ධො සාරගන්ධො තචගන්ධො පත්තගන්ධො පුප්ඵගන්ධො ඵලගන්ධො ආමකගන්ධො විස්සගන්ධො සුගන්ධො දුග්ගන්ධො, යො වා පනඤ්ඤොපි අත්ථි ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යං ගන්ධං ආරබ්භ ඝානං නිස්සාය ඝානසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ගන්ධං ආරබ්භ ඝානං නිස්සාය ඝානසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- ඝානවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ඝානං නිස්සාය ගන්ධාරම්මණො ඝානසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ඝානං නිස්සාය ගන්ධාරම්මණා ඝානසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- ඝානවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, ගන්ධොපෙසො, ගන්ධායතනම්පෙතං, ගන්ධධාතුපෙසා. ඉදං තං රූපං ගන්ධායතනං.

632. කතමං තං රූපං රසායතනං?

යො රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො අම්බිලං මධුරං තිත්තකං කටුකං ලොණිකං ඛාරිකං ලපිලං[1] කසාවො සාදු අසාදු, යො වා පනඤ්ඤොපි අත්ථි රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යං රසං අනිදස්සනං සප්පටිඝං ජිව්හාය අනිදස්සනාය සප්පටිඝාය සායි වා සායති වා සායිස්සති වා සායෙ වා, රසොපෙසො, රසායතනම්පෙතං, රසධාතුපෙසා. ඉදං තං රූපං රසායතනං.

1. ලම්බිලං - මජසං, ලපිලකං - සීමු 1, 2, 3, අ.

629. ඒ ගන්ධායතනරූපය කවරේ යත්:

යම් ගන්ධයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - මූලගන්ධ ය සාරගන්ධ ය ත්වගගන්ධ ය පත්‍රගන්ධ ය පුෂ්පගන්ධ ය ඵලගන්ධ ය ආමකගන්ධ ය විස්‍රගන්ධ ය සුගන්ධ ය දුර්ගන්ධ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ගන්ධයෙක් හෝ ඇද්ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ගන්ධයෙක්හි අනිදර්ශන සප්‍රතිඝ වූ ඝ්‍රාණය ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, ගන්ධ නමුදු තෙලෙය ගන්ධායතන නමුදු තෙලෙ ය, ගන්ධධාතු නමුදු තෙල යි. මේ ඒ ගන්ධායතනරූප යි.

630. ඒ ගන්ධායතනරූපය කවරේ යත්:

යම් ගන්ධයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - මුල්ගඳ ය හරගඳ ය පොතුගඳ ය පත්ගඳ ය මල්ගඳ ය පලගඳ ය අමුගඳ ය කුණුගඳ ය සුවඳ ය දුගඳ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ගන්ධයෙක් හෝ ඇද්ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ගන්ධයෙක් අනිදර්ශන සප්‍රතිඝ වූ ඝ්‍රාණයෙහි හැපුණේ හෝ හැපේ හෝ හැපෙන්නේ හෝ හැපේ නම් හෝ, ගන්ධ නමුදු තෙලෙ ය, ගන්ධායතන නමුදු තෙලෙ ය, ගන්ධධාතු නමුදු තෙල යි. මේ ඒ ගන්ධායතනරූප යි.

631. ඒ ගන්ධායතනරූපය කවරේ යත්:

යම් ගන්ධයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - මුල්ගඳ ය හරගඳ ය පොතුගඳ ය පත්ගඳ ය මල්ගඳ ය පලගඳ ය අමුගඳ ය කුණුගඳ ය සුවඳ ය දුගඳ ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ගන්ධයෙක් හෝ ඇද්ද, යම් ගන්ධයක් අරමුණු කොට ඝ්‍රාණය නිසා ඝානසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ ... යම් ගන්ධයක් අරමුණු කොට ඝ්‍රාණය නිසා ඝානසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... ඝ්‍රාණවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ ... යම් ඝ්‍රාණයක් නිසා ගන්ධාලම්බන වූ ඝානසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ ... යම් ඝ්‍රාණයක් නිසා ගන්ධාලම්බන වූ ඝානසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... ඝ්‍රාණවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදි නම් හෝ, ගන්ධ නමුදු තෙලෙ ය, ගන්ධායතන නමුදු තෙලෙ ය, ගන්ධධාතු නමුදු තෙල යි. මේ ඒ ගන්ධායතන රූප යි.

632. ඒ රසායතනරූපය කවරේ යත්:

යම් රසයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - මුල්රස ය කඳරස ය පොතුරස ය පත්රස ය මල්රස ය පලරස ය ඇඹුල මිහිරු තිත්ත ය කුළු ය ලුණු ය ඛාර ය ලවිල (-දිවුල් ඈ කසටැඹුල) ය කසට ය මිහිරි ය නොමිහිරි ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් රසයෙක් හෝ ඇද්ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් රසයක් අනිදර්ශන සප්‍රතිඝ වූ දිවින් වින්දේ හෝ විඳී හෝ විඳිනේ හෝ විඳි නම් හෝ, තෙලෙ රස නමුදු වෙයි, තෙලෙ රසායතන නමුදු වෙයි, තෙල රසධාතු නමුදු වේ. මේ ඒ රසායතන රූප යි.

633. කතමං තං රූපං රසායතනං?

යො රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො අම්බිලං මධුරං තිත්තකං කටුකං ලොණිකං ඛාරිකං ලපිලං කසාවො සාදු අසාදු, යො වා පනඤ්ඤොපි අත්ථි රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යම්හි රසම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි ජිව්හා අනිදස්සනා සප්පටිඝා පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, රසොපෙසො, රසායතනම්පෙතං, රසධාතුපෙසා. ඉදං තං රූපං රසායතනං.

634. කතමං තං රූපං රසායතනං?

යො රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො අම්බිලං මධුරං තිත්තකං කටුකං ලොණිකං ඛාරිකං ලපිලං කසාවො සාදු අසාදු, යො වා පනඤ්ඤොපි අත්ථි රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යො රසො අනිදස්සනො සප්පටිඝො ජිව්හාය අනිදස්සනාය සප්පටිඝාය පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, රසොපෙසො, රසායතනම්පෙතං, රසධාතුපෙසා. ඉදං තං රූපං රසායතනං.

635. කතමං තං රූපං රසායතනං?

යො රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො: මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො අම්බිලං මධුරං තිත්තකං කටුකං ලොණිකං ඛාරිකං ලපිලං කසාවො සාදු අසාදු, යො වා පනඤ්ඤොපි අත්ථි රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො, යං රසං ආරබ්භ ජිව්හං නිස්සාය ජිව්හාසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං රසං ආරබ්භ ජිව්හං නිස්සාය ජිව්හාසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- ජිව්හාවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ජිව්හං නිස්සාය රසාරම්මණො ජිව්හාසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං ජිව්හං නිස්සාය රසාරම්මණා ජිව්හාසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- ජිව්හාවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, රසොපෙසො, රසායතනම්පෙතං, රසධාතුපෙසා. ඉදං තං රූපං රසායතනං.

636. කතමං තං රූපං ඉත්ථින්ද්‍රියං?

යං ඉත්ථියා ඉත්ථිලිඞ්ගං[1] ඉත්ථිනිමිත්තං ඉත්ථිකුත්තං ඉත්ථාකප්පො ඉත්ථත්තං[2] ඉත්ථිභාවො, ඉදං තං රූපං ඉත්ථින්ද්‍රියං.

1. ඉත්ථීලිඞ්ගං - සයා. 2. ඉත්ථීත්තං - සයා.

633. ඒ රසායතනරූපය කවරේ යත්:

යම් රසයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ- මූලරස ය ඛන්ධරස ය තචග්රස ය පත්‍රරස ය පුෂ්පරස ය අම්බිල ය මධුර ය තික්ත ය කටුක ය ලවණ ය ක්‍ෂාර ය ලම්බිල ය කසාව ය සවාදු ය අසවාදු ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් රසයෙක් හෝ ඇද්ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් රසයෙක්හි අනිදර්ශන සප්‍රතිඝ වූ දිව ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ රස නමුදු වෙයි, තෙලෙ රසායතන නමුදු වෙයි, තෙල රසධාතු නමුදු වේ. මේ ඒ රසායතනරූප යි.

634. ඒ රසායතනරූපය කවරේ යත්:

යම් රසයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - මුල්රස ය කඳරස ය පොතුරස ය පත්රස ය මල්රස ය පලරස ය ඇඹුලැ මිහිරැ තිත්ත ය කුළුරස ය ලුණුරස ය කරරස ය ලපිලරස ය කසටරස ය මිහිරි ය නොමිහිරි ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් යම් රසයෙක් හෝ ඇද්ද, අනිදර්ශන සප්‍රතිඝ වූ යම් රසයෙක් අනිදර්ශන සප්‍රතිඝ වූ දිවෙහි ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ රස නමුදු වෙයි, තෙලෙ රසායතන නමුදු වෙයි, තෙල රසධාතු නමුදු වේ. මේ ඒ රසායතනරූප යි.

635. ඒ රසායතනරූපය කවරේ යත්:

යම් රසයෙක් සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූයේ - මුල්රස ය කඳරස ය පොතුරස ය පත්රස ය මල්රස ය පල-රස ය ඇඹුලැ මිහිරි ය තිත්ත ය කටුක ය ලුණු ය කර ය ලපිලරස ය කසට ය මිහිරි ය නොමිහිරි ය, යළි අන්‍ය වූ ද සතර මහාභූතයන් නිසා උපන් අනිදර්ශන සප්‍රතිඝ වූ යම් රසයෙක් හෝ ඇද්ද, යම් රසයක් අරමුණු කොට දිව නිසා ජිව්හාසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් රසයක් අරමුණු කොට දිව නිසා ජිව්හාසම්ඵස්සජ වෙදනාව ... සංඥව ... චෙතනාව ... ජිහ්වාවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් දිවක් නිසා රසා-ලම්බන වූ ජිව්හාසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් දිවක් නිසා රසාලම්බන වූ ජිව්හාසම්ඵස්සජ වෙදනාව ... සංඥව ... චෙතනාව ... ජිහ්වාවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ, තෙලෙ රස නමුදු වෙයි, තෙලෙ රසායතන නමුදු වෙයි, තෙල රසධාතු නමුදු වේ. මේ ඒ රසායතන රූප යි.

636. ඒ ඉත්ථින්ද්‍රිය රූපය කවරේ යත්:

යම් කරුණෙකින් ස්ත්‍රිය පිළිබඳ ස්ත්‍රීසටහන ස්ත්‍රීලකුණ ස්ත්‍රීක්‍රියා ස්ත්‍රීආකල්පය ස්ත්‍රීත්වය ස්ත්‍රීභාවය වේ ද, මේ ඒ ස්ත්‍රීන්ද්‍රියරූප යි.

637. කතමං තං රූපං පුරිසින්ද්‍රියං?

යං පුරිසස්ස පුරිසලිඞ්ගං පුරිසනිමිත්තං පුරිසකුත්තං පුරිසාකප්පො පුරිසත්තං පුරිසභාවො, ඉදං තං රූපං පුරිසින්ද්‍රියං.

638. කතමං තං රූපං ජීවිතින්ද්‍රියං?

යං තෙසං රූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං ජීවිතින්ද්‍රියං.

639. කතමං තං රූපං කායවිඤ්ඤත්ති?

යා කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අව්‍යාකතචිත්තස්ස වා අභික්කමන්තස්ස වා පටික්කමන්තස්ස වා ආලොකෙන්තස්ස වා විලො-කෙන්තස්ස වා සම්මිඤ්ජෙන්තස්ස වා පසාරෙන්තස්ස වා කායස්ස ථම්භනා සන්ථම්භනා සන්ථම්භිතත්තං විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපිතත්තං, ඉදං තං රූපං කායවිඤ්ඤත්ති.

640. කතමං තං රූපං වචීවිඤ්ඤත්ති?

යා කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අව්‍යාකතචිත්තස්ස වා වාචා ගිරා ව්‍යප්පථො උදීරණං ඝොසො ඝොසකම්මං වාචා වචීභෙදො, අයං වුච්චති වාචා. යා තාය වාචාය විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපිතත්තං, ඉදං තං රූපං වචීවිඤ්ඤත්ති.

641. කතමං තං රූපං ආකාසධාතු?

යො ආකාසො ආකාසගතං අඝං අඝගතං විවරො විවරගතං අසම්ඵුට්ඨං චතූහි මහාභූතෙහි, ඉදං තං රූපං ආකාසධාතු.

642. කතමං තා රූපං රූපස්ස ලහුතා?

යා රූපස්ස ලහුතා ලහුපරිණාමතා අදන්ධනතා අවිත්ථනතා, ඉදං තං රූපං රූපස්ස ලහුතා.

643. කතමං තං රූපං රූපස්ස මුදුතා?

යා රූපස්ස මුදුතා මද්දවතා අකක්ඛළතා අකථිනතා, ඉදං තං රූපං රූපස්ස මුදුතා.

637. ඒ පුරිසින්ද්‍රියරූපය කවරේ යත්:

යම් කරුණෙකින් පුරුෂයාගේ පුරුෂසටහන පුරුෂසලකුණ පුරුෂ-ක්‍රියා පුරුෂාකල්පය පුරුෂත්වය පුරුෂභාවය වේ ද, මේ ඒ පුරුෂෙන්ද්‍රියරූපයි.

638. ඒ ජීවිතින්ද්‍රියරූපය කවරේ යත්:

ඒ රූපිධම්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යපනයෙක් යාපනයෙක් ඉරියනයෙක් පැවැත්මෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ ඒ ජීවිතෙන්ද්‍රියරූප යි.

639. ඒ කායවිඤ්ඤත්තිරූපය කවරේ යත්:

කුසල්සිත් ඇත්තහුගේ හෝ අකුසල්සිත් ඇත්තහුගේ හෝ අව්‍යාකෘත සිත් ඇත්තහුගේ හෝ ඉදිරියට යන්නහුගේ හෝ පෙරළා එන්නහුගේ හෝ ඍජු ව බලන්නහුගේ හෝ හාත්පස බලන්නහුගේ හෝ සඳි හකුළුවන්නහුගේ හෝ දිගහරින්නහුගේ හෝ ශරීරය පිළිබඳ යම් තද කිරීමෙක් බලවත් තද කිරීමෙක් තද කළ බවෙක් විඥපනයෙක් විඥපනාකාරයෙක් විඥාපනය කළ බවෙක් වේ ද, මේ ඒ කායවිඥප්තිරූප යි.

640. ඒ වචීවිඤ්ඤත්තිරූපය කවරේ යත්:

කුසල් සිත් ඇත්තහුගේ හෝ අකුසල්සිත් ඇත්තහුගේ හෝ අව්‍යාකෘත සිත් ඇත්තහුගේ හෝ යම් වචනයෙක් තෙපුලෙක් වාක්‍ය-භෙදයෙක් උදීරණයෙක් ඝොෂයෙක් ඝොෂකර්මයෙක් වාක්සඞ්ඛ්‍යාත වාග්භෙදයෙක් වේ ද, මේ වාචා යයි කියනු ලැබේ. ඒ වචනයෙන් යම් විඥප්තියෙක් විඥපනාකාරයෙක් විඥපනය කළ බවෙක් වේ ද, මේ ඒ වාග්විඥප්තිරූප යි.

641. ඒ ආකාසධාතුරූපය කවරේ යත්:

යම් ආකාශයෙක් ආකාශගතයෙක් (නො ගැටිය හැකි) අඝයෙක් අඝගතයෙක් විවරයෙක් විවරගතයෙක් සතර මහාභූතයන් විසින් නො පහස්නා ලද්දෙක් වේ ද, මේ ඒ ආකාශධාතුරූප යි.

642. ඒ රූපයාගේ ලහුතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් ලඝුත්වාකාරයෙක් ලුහු ව පරිවර්තන වන බවෙක් නො බර බවෙක් නො තද බවෙක් වේ ද, මේ ඒ රූපයාගේ ලඝුත්ව-රූප යි.

643. ඒ රූපයාගේ මුදුතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් මෘදුත්වයෙක් මාර්දවයෙක් (-සිනිඳු බවෙක්) නො කැකුළු බවෙක් නො තද බවෙක් වේ ද, මේ ඒ රූපයාගේ මෘදුත්වරූප යි.

644. කතමං තං රූපං රූපස්ස කම්මඤ්ඤතා?

යා රූපස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවො, ඉදං තං රූපං රූපස්ස කම්මඤ්ඤතා.

645. කතමං තං රූපං රූපස්ස උපචයො?

යො ආයතනානං ආචයො, සො රූපස්ස උපචයො. ඉදං තං රූපං රූපස්ස උපචයො.

646. කතමං තං රූපං රූපස්ස සන්තති?

යො රූපස්ස උපචයො, සා රූපස්ස සන්තති. ඉදං තං රූපං රූපස්ස සන්තති.

647. කතමං තං රූපං රූපස්ස ජරතා?

යා රූපස්ස ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, ඉදං තං රූපං රූපස්ස ජරතා.

648. කතමං තං රූපං රූපස්ස අනිච්චතා?

යො රූපස්ස ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං, ඉදං තං රූපං රූපස්ස අනිච්චතා.

649. කතමං තං රූපං කබලිංකාරො ආහාරො?

ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං ඛීරං දධි සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං යම්හි යම්හි ජනපදෙ තෙසං තෙසං සත්තානං මුඛාසියං දන්තවිඛාදනං ගලජ්ඣොහරණියං කුච්ඡිවිත්ථම්භනං යාය ඕජාය සත්තා යාපෙන්ති, ඉදං තං රූපං කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං උපාදා.

උපාදා භාජනියං.

රූපකණ්ඩෙ පඨමභාණවාරං.

644. ඒ රූපයාගේ කම්මඤ්ඤතා රූපය කවරේ යත්:

රූපයාගේ යම් කර්මණ්‍ය බවෙක් කර්මණ්‍යත්වයෙක් කර්මණ්‍යභාවයෙක් වේ ද, මේ ඒ රූපයාගේ කර්මණ්‍යතාරූප යි.

645. ඒ රූපයාගේ උපචයරූපය කවරේ යත්:

(අඩකොළොස් රූපායතන සඞ්ඛ්‍යාත) ආයතනයන්ගේ යම් නිපැද්මෙක් වේ ද, හේ රූපයාගේ උපචය නම්. මේ ඒ රූපයාගේ උපචයරූප යි.

646. ඒ රූපයාගේ සන්තතිරූපය කවරේ යත්:

රූපයාගේ යම් වැඩීමෙක් වේ ද, ඒ රූපයාගේ සන්තති නම්. මේ ඒ රූපයාගේ සන්තතිරූප යි.

647. ඒ රූපයාගේ ජරතාරූපය කවරේ යත්:

රූපයාගේ ජරාවක් ජීර්ණාකාරයෙක් (දන්තාදිය) කැඩුණු බවෙක් (කෙශයන්ගේ) පලිත බවෙක් රැලි වැටුණු සම ඇති බවෙක් ආයුෂයාගේ පිරිහීමෙක් ඉන්ද්‍රියයන් මිහිකිරීමෙක් වේ ද, මේ ඒ රූපයාගේ ජරතාරූප යි.

648. ඒ රූපයාගේ අනිච්චතා රූපය කවරේ යත්:

රූපයාගේ යම් ක්ෂය වීමෙක් විනාශයෙක් බිඳීමෙක් පරිභෙදයෙක් අනිත්‍යතායෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ ඒ රූපයාගේ අනිත්‍යතා රූප යි.

649. ඒ කවලීකාරාහාරරූපය කවරේ යත්:

ඔදන ය කුල්මාස ය හත්වට ය මාළු මස් ය කිරි ය දිහි ය ගිතෙල් ය වෙඬරු ය තෙල් ය මිහි ය පැණි ය, තවද යම් යම් ජනපදයෙක්හි ඒ ඒ සත්ත්වයන් විසින් මුවින් කෑ යුතු දතින් විකිය යුතු ගෙලෙන් ගිලිය යුතු කුස පුරාලන යම් ඕජාවෙකින් සත්ත්වයෝ යැපෙත් නම්, එබඳු වූ අන්‍ය වූත් යම් රූපයෙක් ඇද්ද, මේ ඒ කවලීකාරාහාර රූප යි. මේ ඒ උපාදාරූප යි.

උපාදාභාජනීය යි.

රූපකාණ්ඩයෙහි පළමුවැනි බණවර යි.

650. කතමං තං රූපං නො උපාදා?

ඵොට්ඨබ්බායතනං ආපොධාතු, ඉදං තං රූපං නො උපාදා.

651. කතමං තං ඵොට්ඨබ්බායතනං?

පඨවීධාතු තෙජොධාතු වායොධාතු කක්ඛළං මුදුකං සණ්හං ඵරුසං සුඛසම්ඵස්සං දුක්ඛසම්ඵස්සං ගරුකං ලහුකං, යං ඵොට්ඨබ්බං අනිදස්සනං සප්පටිඝං කායෙන අනිදස්සනෙන සප්පටිඝෙන ඵුසි වා ඵුසති වා ඵුසිස්සති වා ඵුසෙ වා, ඵොට්ඨබ්බොපෙසො, ඵොට්ඨබ්බායතනමෙපතං, ඵොට්ඨබ්බධාතුපෙසා. ඉදං තං රූපා ඵොට්ඨබ්බායතනං.

652. කතමං තං රූපං ඵොට්ඨබ්බායතනං?

පඨවීධාතු තෙජොධාතු වායොධාතු කක්ඛළං මුදුකං සණ්හං ඵරුසං සුඛසම්ඵස්සං දුක්ඛසම්ඵස්සං ගරුකං ලහුකං, යම්හි ඵොට්ඨබ්බම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි කායො අනිදස්සනො සප්පටිඝො පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, ඵොට්ඨබ්බොපෙසො, ඵොට්ඨබ්බායතනමෙපතං, ඵොට්ඨබ්බධාතුපෙසා. ඉදං තං රූපං ඵොට්ඨබ්බායතනං.

653. කතමං තං රූපං ඵොට්ඨබ්බායතනං?

පඨවීධාතු තෙජොධාතු වායොධාතු කක්ඛළං මුදුකං සණ්හං ඵරුසං සුඛසම්ඵස්සං දුක්ඛසම්ඵස්සං ගරුකං ලහුකං, යො ඵොට්ඨබ්බො අනිදස්සනො සප්පටිඝො කායම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, ඵොට්ඨබ්බොපෙසො, ඵොට්ඨබ්බායතනමෙපතං, ඵොට්ඨබ්බධාතුපෙසා. ඉදං තං රූපං ඵොට්ඨබ්බායතනං.

654. කතමං තං රූපං ඵොට්ඨබ්බායතනං?

පඨවීධාතු තෙජොධාතු වායොධාතු කක්ඛළං මුදුකං සණ්හං ඵරුසං සුඛසම්ඵස්සං දුක්ඛසම්ඵස්සං ගරුකං ලහුකං, යං ඵොට්ඨබ්බං ආරබ්භ කායං නිස්සාය කායසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා වා උප්පජ්ජෙ වා -පෙ- යං ඵොට්ඨබ්බං ආරබ්භ කායං නිස්සාය කායසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- කායවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං කායං නිස්සාය ඵොට්ඨබ්බාරම්මණො කායසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා -පෙ- යං කායං නිස්සාය ඵොට්ඨබ්බාරම්මණා කායසම්ඵස්සජා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- කායවිඤ්ඤාණං උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා, ඵොට්ඨබ්බොපෙසො, ඵොට්ඨබ්බායතනමෙපතං, ඵොට්ඨබ්බධාතුපෙසා. ඉදං තං රූපං ඵොට්ඨබ්බායතනං.

650. ඒ උපාදා නො වූ රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන ය, අබ්ධාතු යි. මේ ඒ උපාදා නො වූ රූප යි.

651. ඒ ඵොට්ඨබ්බායතනය කවරේ යත්:

තද වූ මොලොක් වූ සිලුටු වූ රළු වූ සුවපහස් වූ දුක්පහස් වූ බර වූ නොබර වූ (කක්ඛලත්වලක්ෂණ) පෘථිවිධාතු ය උෂ්ණත්වලක්ෂණ වූ තේජෝධාතු ය (විෂ්ටම්භනලක්ෂණ වූ) වායෝධාතු යි. අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ස්ප්‍රෂ්ටව්‍යයක් අනිදර්ශන සප්‍රතිඝ වූ කයින් පැහැසී හෝ පහසා හෝ පහස්නේ හෝ පහසා නම් හෝ, තෙමේ (පඨවි - තේජෝ - වායෝධාතුව) ඵොට්ඨබ්බ නමුදු වෙයි, තෙලෙ ඵොට්ඨබ්බායතන නමුදු වෙයි, තෙල ඵොට්ඨබ්බධාතු නමුදු වේ. මේ ඒ ස්ප්‍රෂ්ටව්‍යායතනරූප යි.

652. ඒ ඵොට්ඨබ්බායතනරූපය කවරේ යත්:

කර්කශ වූ මෘදු වූ සිලුටු වූ පරුෂ වූ සුවපහස් වූ දුක්පහස් වූ බර වූ නො බර වූ පෘථිවිධාතු ය තේජෝධාතු ය වායෝධාතු යි. අනිදර්ශන සප්‍රතිඝ වූ යම් ස්ප්‍රෂ්ටව්‍යයෙක්හි අනිදර්ශන සප්‍රතිඝ වූ කය ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ ඵොට්ඨබ්බ නමුදු වෙයි, තෙලෙ ඵොට්ඨබ්බායතන නමුදු වෙයි, තෙල ඵොට්ඨබ්බධාතු නමුදු වේ. මේ ඒ ස්ප්‍රෂ්ටව්‍යායතනරූප යි.

653. ඒ ඵොට්ඨබ්බායතන රූපය කවරේ යත්:

තද වූ මොලොක් වූ සිලුටු වූ රළු වූ සුවපහස් වූ දුක්පහස් වූ බර වූ නොබර වූ පෘථිවිධාතු ය තේජෝධාතු ය වායෝධාතු යි. අනිදර්ශන සප්‍රතිඝ වූ යම් සප්‍රෂ්ටව්‍යයෙක් අනිදර්ශන සප්‍රතිඝ වූ කයෙහි ගැටුණේ හෝ ගැටේ හෝ ගැටෙන්නේ හෝ ගැටේ නම් හෝ, තෙලෙ ඵොට්ඨබ්බ නමුදු වෙයි, තෙලෙ ඵොට්ඨබ්බායතන නමුදු වෙයි, තෙල ඵොට්ඨබ්බධාතු නමුදු වේ. මේ ඒ ඵොට්ඨබ්බායතනරූප යි.

654. ඒ ඵොට්ඨබ්බායතනරූපය කවරේ යත්:

තද වූ මොලොක් වූ සිලුටු වූ රළු වූ සුවපහස් වූ දුක් පහස් වූ බර වූ නොබර වූ පෘථිවිධාතු ය තේජෝධාතු ය වායෝධාතු යි. යම් ස්ප්‍රෂ්ට-ව්‍යයක් අරමුණු කොට කය නිසා කායසංස්පර්ශය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් ස්ප්‍රෂ්ටව්‍යයක් අරමුණු කොට කය නිසා කායසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... කායවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් කයක් නිසා ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වූ කායසම්ඵස්සය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ ... යම් කයක් නිසා ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වූ කායසම්ඵස්සජ වේදනාව ... සංඥාව ... චේතනාව ... කායවිඥානය උපනේ හෝ උපදී හෝ උපදනේ හෝ උපදී නම් හෝ තෙමේ ඵොට්ඨබ්බ නමුදු වෙයි, තෙලෙ ඵොට්ඨබ්බායතන නමුදු වෙයි තෙල ඵොට්ඨබ්බධාතු නමුදු වේ. මේ ඒ ස්ප්‍රෂ්ටව්‍යායතනරූප යි.

655. කතමං තං රූපං ආපොධාතු?

යං ආපො ආපොගතං සිනෙහො සිනෙහගතං බන්ධනත්තං රූපස්ස, ඉදං තං රූපං ආපොධාතු. ඉදං තං රූපං නො උපාදා.

656. කතමං තං රූපං උපාදින්නං?

චක්ඛායතනං සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නං.

657. කතමං තං රූපං අනුපාදින්නං?

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නං.

658. කතමං තං රූපං උපාදින්නුපාදානියං?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නුපාදානියං.

659. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං?

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නුපාදානියං.

660. කතමං තං රූපං සනිදස්සනං?

රූපායතනං, ඉදං තං රූපං සනිදස්සනං.

661. කතමං තං රූපං අනිදස්සනං?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනිදස්සනං.

655. ඒ ආපොධාතුරූපය කවරේ යත්:

යම් ආපයෙක් ආපොගතයෙක් ස්නෙහයෙක් ස්නෙහගතයෙක් (පෑවිච් බැන්ධාදී) භූතරූපයාගේ බන්ධනභාවයෙක් වේ ද, මේ ඒ ආපොධාතුරූප යයි. මේ ඒ උපාදා නො වූ රූප යි.

656. ඒ උපාදින්නරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ශ්‍රොත්‍රායතන ය ඝ්‍රාණායතන ය ජිහ්වායතන ය කායායතන ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, යළි අන්‍ය වූ ද කර්මසමුත්ථාන වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසා-යතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර යි. මේ ඒ උපාදින්න-රූප යි.

657. ඒ අනුපාදින්නරූපය කවරේ යත්:

ශබ්දායතන ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, යළි අන්‍ය වූ ද කර්මසමුත්ථාන නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලී-කාරාහාර යි. මේ ඒ අනුපාදින්නරූප යි.

658. ඒ උපාදින්නුපාදානියරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, යළි අන්‍ය වූ ද කර්මසමුත්ථාන වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරා-හාර යි. මේ ඒ උපාදින්නුපාදානියරූප යි.

659. ඒ අනුපාදින්නුපාදානියරූපය කවරේ යත්:

ශබ්දායතන ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, යළි අන්‍ය වූ ද කර්මසමුත්ථාන නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ශබ්දායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ට-ව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර ය යි. මේ ඒ අනුපාදින්නුපාදානිය රූප යි.

660 ඒ සනිදර්ශනරූපය කවරේ යත්:

රූපායතන යි. මේ ඒ සනිදර්ශනරූප යි.

661. ඒ අනිදර්ශනරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ අනිදර්ශනරූප යි.

662. කතමං තං රූපං සප්පටිඝං?

චක්ඛායතනං සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං සප්පටිඝං.

663. කතමං තං රූපං අප්පටිඝං?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අප්පටිඝං.

664. කතමං තං රූපං ඉන්ද්‍රියං?

චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං ඉන්ද්‍රියං.

665. කතමං තං රූපං න ඉන්ද්‍රියං?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න ඉන්ද්‍රියං.

666. කතමං තං රූපං මහාභූතං?

ඵොට්ඨබ්බායතනං ආපොධාතු, ඉදං තං රූපං මහාභූතං.

667. කතමං තං රූපං න මහාභූතං?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න මහාභූතං.

668. කතමං තං රූපං විඤ්ඤත්ති?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති, ඉදං තං රූපං විඤ්ඤත්ති.

669. කතමං තං රූපං න විඤ්ඤත්ති?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න විඤ්ඤත්ති.

670. කතමං තං රූපං චිත්තසමුට්ඨානං?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං චිත්තජං චිත්තහෙතුකං චිත්තසමුට්ඨානං රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං චිත්තසමුට්ඨානං.

662. ඒ සප්පටිඝරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ශ්‍රොත්‍රායතන ය ඝ්‍රාණායතන ය ජිහ්වායතන ය කායායතන ය රූපායතන ය ශබ්දායතන ය ගන්ධායතන ය රසායතනය ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ සප්‍රතිඝරූප යි.

663 ඒ අප්පටිඝරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර යි. මේ ඒ අප්‍රතිඝරූප යි.

664. ඒ ඉන්ද්‍රියරූපය කවරේ යත්:

චක්ෂුරින්ද්‍රිය ය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ය ඝ්‍රාණෙන්ද්‍රිය ය ජිහ්වේන්ද්‍රිය ය කායෙන්ද්‍රිය ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය යි. මේ ඒ ඉන්ද්‍රියරූප යි.

665. ඒ ඉන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ ඉන්ද්‍රිය නො වූ රූප යි.

666. ඒ මහාභූතරූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන ය අබ්ධාතු යි. මේ ඒ මහාභූතරූප යි.

667. ඒ මහාභූත නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ මහාභූත නො වූ රූප යි.

668. ඒ විඥප්තිරූපය කවරේ යත්:

කායවිඥප්ති ය, වාග්විඥප්ති යි. මේ ඒ විඥප්තිරූප යි.

669. විඥප්ති නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ විඥප්ති නො වූ රූප යි.

670. ඒ චිත්තසමුට්ඨානරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති ය, යම් අන්‍ය වූ ද චිත්තජ වූ චිත්ත-හෙතුක වූ චිත්තසමුත්ථාන වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ශබ්දායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශ-ධාතු ය අබ්ධාතු ය රූපලඝුතා ය රූපමෘදුතා ය රූපකර්මණ්‍යතා ය රූපොප-චය ය රූපසන්තති ය කවලීකාරාහාර යි. මේ ඒ චිත්තසමුත්ථානරූප යි.

671. කතමං තං රූපං න චිත්තසමුට්ඨානං?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න චිත්තජං න චිත්තහෙතුකං න චිත්තසමුට්ඨානං රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න චිත්තසමුට්ඨානං.

672. කතමං තං රූපං චිත්තසහභු?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති, ඉදං තං රූපං චිත්තසහභු.

673. කතමං තං රූපං න චිත්තසහභු?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න චිත්ත-සහභු.

674. කතමං තං රූපං චිත්තානුපරිවත්ති?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති, ඉදං තං රූපං චිත්තානුපරිවත්ති.

675. කතමං තං රූපං න චිත්තානුපරිවත්ති?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න චිත්තා-නුපරිවත්ති.

676. කතමං තං රූපං අජ්ඣත්තිකං?

චක්ඛායතනං -පෙ- කායායතනං, ඉදං තං රූපං අජ්ඣත්තිකං.

677. කතමං තං රූපං බාහිරං?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං බාහිරං.

678. කතමං තං රූපං ඔළාරිකං?

චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං ඔළාරිකං.

679. කතමං තං රූපං සුඛුමං?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං සුඛුමං.

680. කතමං තං රූපං දූරෙ?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං දූරෙ.

671. ඒ චිත්තසමුට්ඨාන නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කායායතන ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, යම් අන්‍ය වූ ද චිත්තජ නො වූ චිත්තහෙතුක නො වූ චිත්තසමුට්ඨාන නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ශබ්දායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපලඝුත්ව ය රූපමෘදුත්ව ය රූපකර්මණ්‍යත්ව ය රූපොපචය ය රූපසන්තති ය කවලීකාරාහාර සි. මෙ ඒ චිත්තසමුට්ඨාන නො වූ රූප සි.

672. ඒ චිත්තසහභූරූපය කවරෙ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති සි. මෙ ඒ චිත්ත සහභූරූප සි.

673. ඒ චිත්තසහභූ නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කවලීකාරාහාර සි. මෙ ඒ චිත්තසහභූ නො වූ රූප සි.

674. ඒ චිත්තානුපරිවර්ති රූපය කවරෙ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති සි. මෙ ඒ චිත්තානුපරිවර්ති රූප සි.

675. ඒ චිත්තානුපරිවර්ති නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කවලීකාරාහාර සි. මෙ ඒ චිත්තානුපරිවර්ති නො වූ රූප සි.

676. ඒ අජ්ඣත්තිකරූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කායායතන සි. මෙ ඒ ආධ්‍යාත්මිකරූප සි.

677. ඒ බාහිරරූපය කවරෙ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර සි. මෙ ඒ බාහ්‍යරූප සි.

678. ඒ ඔළාරිකරූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මෙ ඒ ඖදාරිකරූප සි.

679. ඒ සුඛුමරූපය කවරෙ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර සි. මෙ ඒ සූක්ෂ්මරූප සි.

680. ඒ දූරෙරූපය කවරෙ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර සි. මෙ ඒ දූරෙරූප සි.

681. කතමං තං රූපං සන්තිකෙ?

චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං සන්තිකෙ.

682. කතමං තං රූපං චක්ඛුසම්ඵස්සස්ස වත්ථු?

චක්ඛායතනං, ඉදං තං රූපං චක්ඛුසම්ඵස්සස්ස වත්ථු.

683. කතමං තං රූපං චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු?

සොතායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු.

684. කතමං තං රූපං චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථු?

චක්ඛායතනං, ඉදං තං රූපං චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථු.

685. කතමං තං රූපං චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු?

සොතායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු.

686. කතමං තං රූපං සොතසම්ඵස්සස්ස -පෙ- ඝානසම්ඵස්සස්ස -පෙ- ජිව්හාසම්ඵස්සස්ස -පෙ- කායසම්ඵස්සස්ස වත්ථු?

කායායතනං, ඉදං තං රූපං කායසම්ඵස්සස්ස වත්ථු.

687. කතමං තං රූපං කායසම්ඵස්සස්ස න වත්ථු?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං කායසම්ඵස්සස්ස න වත්ථු.

638. කතමං තං රූපං කායසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- කායවිඤ්ඤාණස්ස වත්ථු?

කායායතනං, ඉදං තං රූපං කායවිඤ්ඤාණස්ස වත්ථු.

689. කතමං තං රූපං කායවිඤ්ඤාණස්ස න වත්ථු?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං කායවිඤ්ඤාණස්ස න වත්ථු.

(වත්ථු දුකං)

690. කතමං තං රූපං චක්ඛුසම්ඵස්සස්ස ආරම්මණං?

රූපායතනං, ඉදං තං රූපං චක්ඛුසම්ඵස්සස්ස ආරම්මණං.

681. ඒ සනතිකෙරූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ සනතිකෙරූප යි.

682. ඒ චක්ඛුසම්ඵස්සයට වස්තු වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය, මේ ඒ චක්ඛුසම්ඵස්සයට වස්තු වූ රූප යි.

683. ඒ චක්ඛුසම්ඵස්සයට වස්තු නො වූ රූපය කවරේ යත්:

ශ්‍රොත්‍රායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ චක්ඛුසම්ඵස්සයට වස්තු නො වූ රූප ය යි.

684. ඒ චක්ඛුසම්ඵස්සජ වේදනාවට ... සංඥවට ... චේතනාවට ... චක්‍ෂුර්විඥනයට වස්තු වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතනය යි. මේ ඒ චක්‍ෂුර්විඥනයට වස්තු වූ රූප යි.

685. ඒ චක්‍ෂුර්විඥනයට වස්තු නො වූ රූපය කවරේ යත්:

ශ්‍රොත්‍රායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ චක්‍ෂුර්විඥනයට වස්තු නො වූ රූප යි.

686. ඒ සොතසම්ඵස්සයට ... ඝානසම්ඵස්සයට ... ජිව්හාසම්ඵස්සයට ... කායසම්ඵස්සයට වස්තු වූ රූපය කවරේ යත්:

කායායතන යි. මේ ඒ කායසංස්පර්ශයට වස්තු වූ රූප යි.

687. ඒ කායසම්ඵස්සයට වස්තු නො වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ කායසංස්පර්ශයට වස්තු නො වූ රූප යි.

688. ඒ කායසම්ඵස්සජවේදනාවට ... සංඥවට ... චේතනාවට ... කායවිඥනයට වස්තු වූ රූපය කවරේ යත්:

කායායතන යි. මේ ඒ කායවිඥනයට වස්තු වූ රූප යි.

689. ඒ කායවිඥනයට වස්තු නො වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ කායවිඥනයට වස්තු නො වූ රූප යි.

(වස්තු දුක යි.)

690. ඒ චක්ඛුසම්ඵස්සයට ආලම්බන වූ රූපය කවරේ යත්:

රූපායතන ය, මේ ඒ චක්ඛුසම්ඵස්සයට ආලම්බන වූ රූප යි.

691. කතමං තං රූපං චක්ඛුසම්ඵස්සස්ස න ආරම්මණං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං චක්ඛු-සම්ඵස්සස්ස න ආරම්මණං.

692. කතමං තං රූපං චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණං?

රූපායතනං, ඉදං තං රූපං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණං.

693. කතමං තං රූපං චක්ඛුවිඤ්ඤාණස්ස න ආරම්මණං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං චක්ඛු-විඤ්ඤාණස්ස න ආරම්මණං.

694. කතමං තං රූපං සොතසම්ඵස්සස්ස -පෙ- ඝානසම්ඵස්සස්ස -පෙ- ජිව්හාසම්ඵස්සස්ස -පෙ- කායසම්ඵස්සස්ස ආරම්මණං?

ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං කායසම්ඵස්සස්ස ආරම්මණං.

695. කතමං තං රූපං කායසම්ඵස්සස්ස න ආරම්මණං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං කාය-සම්ඵස්සස්ස න ආරම්මණං.

696. කතමං තං රූපං කායසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- කායවිඤ්ඤාණස්ස ආරම්මණං?

ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං කායවිඤ්ඤාණස්ස ආරම්මණං.

697. කතමං තං රූපං කායවිඤ්ඤාණස්ස න ආරම්මණං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං කාය-විඤ්ඤාණස්ස න ආරම්මණං.

(ආරම්මණදුකං.)

698. කතමං තං රූපං චක්ඛායතනං?

යං චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො, ඉදං තං රූපං චක්ඛායතනං.

699. කතමං තං රූපං න චක්ඛායතනං?

සොතායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න චක්ඛායතනං.

700. කතමං තං රූපං සොතායතනං -පෙ- ඝානායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං?

යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො, ඉදං තං රූපං කායායතනං.

691. ඒ චක්ඛුසම්ඵස්සයට ආලම්බන නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ චක්ඛුසම්ඵස්සයට ආලම්බන නො වූ රූප සි.

692. ඒ චක්ඛුසම්ඵස්සජ වෙදනාවට ... සංඥවට ... චේතනාවට ... චක්ෂුර්විඥනයට ආලම්බන වූ රූපය කවරේ යත්:

රූපායතන සි. මේ ඒ චක්ෂුර්විඥනයට ආලම්බන වූ රූප සි.

693. ඒ චක්ෂුර්විඥනයට ආලම්බන නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ චක්ෂුර්විඥනයට ආලම්බන නො වූ රූප සි.

694. ඒ සොතසම්ඵස්සයට ඝානසම්ඵස්සයට ... ජිව්හාසම්ඵස්සයට ... කායසම්ඵස්සයට ආලම්බන වූ රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මේ ඒ කායසම්ඵස්සයට ආලම්බන වූ රූප සි.

695. ඒ කායසම්ඵස්සයට ආලම්බන නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ කායසම්ඵස්සයට අරමුණු නො වූ රූප සි.

696. ඒ කායසම්ඵස්සජවෙදනාවට ... සංඥවට ... චේතනාවට ... කායවිඥනයට අරමුණු වූ රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මේ ඒ කායවිඥනයට අරමුණු වූ රූප සි.

697. ඒ කායවිඥනයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ කායවිඥනයට අරමුණු නො වූ රූප සි.

(ආලම්බන දුක සි.)

698. ඒ චක්ඛායතනරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ද ... තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ චක්ෂුරායතන රූප සි.

699. ඒ චක්ෂුරායතන නො වූ රූපය කවරේ යත්:

ශ්‍රොත්‍රායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ චක්ෂුරායතන නො වූ රූප සි.

700. ඒ ශ්‍රොත්‍රායතන ... ඝ්‍රාණායතන ... ජිහ්වායතන ... කායායතන රූපය කවරේ යත්:

යම් කයෙක් සතරමහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ද ... තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ කායායතනරූප සි.

701. කතමං තං රූපං න කායායතනං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න කායායතනං.

702. කතමං තං රූපං රූපායතනං?

යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා -පෙ- රූපධාතුපෙසා, ඉදං තං රූපං රූපායතනං.

703. කතමං තං රූපං න රූපායතනං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න රූපායතනං.

704. කතමං තං රූපං සද්දායතනං -පෙ- ගන්ධායතනං -පෙ- රසායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං?

පඨවීධාතු -පෙ- ඵොට්ඨබ්බධාතුපෙසා, ඉදං තං රූපං ඵොට්ඨබ්බායතනං.

705. කතමං තං රූපං න ඵොට්ඨබ්බායතනං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න ඵොට්ඨබ්බායතනං.

(ආයතන දුකං.)

706. කතමං තං රූපං චක්ඛුධාතු?

චක්ඛායතනං, ඉදං තං රූපං චක්ඛුධාතු.

707. කතමං තං රූපං න චක්ඛුධාතු?

සොතායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න චක්ඛුධාතු.

708. කතමං තං රූපං සොතධාතු -පෙ- ඝානධාතු -පෙ- ජිව්හාධාතු -පෙ- කායධාතු?

කායායතනං, ඉදං තං රූපං කායධාතු.*

709 කතමං තං රූපං න කායධාතු?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න කායධාතු*.

710. කතමං තං රූපං රූපධාතු?

රූපායතනං, ඉදං තං රූපං රූපධාතු.

711. කතමං තං රූපං න රූපධාතු?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න රූපධාතු.

---

* ඉමෙ දෙවචාර PTS. පොත්හි නො දක්නා.

701. ඒ කායායතනය නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතනය ය ... කවලීකාරාහාර සි. මේ ඒ කායායතනය නො වූ රූප සි.

702. ඒ රූපායතනරූපය කවරේ යත්:

යම් රූපයෙක් සතර මහාභූතයන් නිසා උපන් පැහැසටහන වූයේ ද ... තෙල රූපධාතු තමුදු වේ. මේ ඒ රූපායතනරූප සි.

703. ඒ රූපායතන නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ රූපායතන නො වූ රූප සි.

704. ඒ ශබ්දායතනරූපය .... ගන්ධායතන ... රසායතන ... ස්ප්‍රෂ්ට-ව්‍යායතනරූපය කවරේ යත්:

පෘථිවීධාතු ය ... තෙල ස්ප්‍රෂ්ටව්‍යධාතු තමුදු වේ. මේ ඒ ස්ප්‍රෂ්ටව්‍යා-යතනරූපය සි.

705. ඒ ඵොට්ඨබ්බායතන නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ ස්ප්‍රෂ්ටව්‍යායතන නො වූ රූප සි.

(ආයතන ද්‍රක සි.)

706. ඒ චක්ඛුධාතු රූපය කවරේ යත්:

චක්ෂුරායතන සි. මේ ඒ චක්ෂුර්ධාතුරූප සි.

707. ඒ චක්ඛුධාතු නො වූ රූපය කවරේ යත්:

ශ්‍රොත්‍රායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ චක්ෂුර්ධාතු නො වූ රූප සි.

708. ඒ සොතධාතුරූපය ... ඝානධාතු ... ජිව්හාධාතු ... කායධාතු-රූපය කවරේ යත්:

කායායතන සි. මේ ඒ කායධාතුරූප සි.

709. ඒ කායධාතු නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ කායධාතු නො වූ රූප සි.

710. ඒ රූපධාතුරූපය කවරේ යත්:

රූපායතන සි. මේ ඒ රූපධාතුරූප සි.

711. ඒ රූපධාතු නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ රූපධාතු නොවූ රූප සි.

712. කතමං තං රූපං සද්දධාතු -පෙ- ගන්ධධාතු -පෙ- රසධාතු -පෙ- ඵොට්ඨබ්බධාතු?

ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං ඵොට්ඨබ්බධාතු.

713. කතමං තං රූපං න ඵොට්ඨබ්බධාතු?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න ඵොට්ඨබ්බධාතු.

(ධාතුදුකං.)

714. කතමං තං රූපං චක්ඛුන්ද්‍රියං?

යං චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො, ඉදං තං රූපං චක්ඛුන්ද්‍රියං.

715. කතමං තං රූපං න චක්ඛුන්ද්‍රියං?

සොතායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න චක්ඛුන්ද්‍රියං.

716. කතමං තං රූපං සොතින්ද්‍රියං -පෙ- ඝානින්ද්‍රියං -පෙ- ජිව්හින්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං?

යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො, ඉදං තං රූපං කායින්ද්‍රියං.

717. කතමං තං රූපං න කායින්ද්‍රියං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න කායින්ද්‍රියං.

718. කතමං තං රූපං ඉත්ථින්ද්‍රියං?

යං ඉත්ථියා ඉත්ථිලිඞ්ගං ඉත්ථිනිමිත්තං ඉත්ථිකුත්තං ඉත්ථාකප්පො ඉත්ථත්තං ඉත්ථිභාවො, ඉදං තං රූපං ඉත්ථින්ද්‍රියං.

719. කතමං තං රූපං න ඉත්ථින්ද්‍රියං?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න ඉත්ථින්ද්‍රියං.

720. කතමං තං රූපං පුරිසින්ද්‍රියං?

යං පුරිසස්ස පුරිසලිඞ්ගං පුරිසනිමිත්තං පුරිසකුත්තං පුරිසාකප්පො පුරිසත්තං පුරිසභාවො, ඉදං තං රූපං පුරිසින්ද්‍රියං.

712. ඒ ශබ්දධාතුරූපය ... ගන්ධධාතු ... රසධාතු ... ඵොට්ඨබ්බධාතු රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මේ ඒ ස්ප්‍රෂ්ටව්‍යධාතුරූප සි.

713. ඒ ඵොට්ඨබ්බධාතු නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ ස්ප්‍රෂ්ටව්‍යධාතු නො වූ රූප සි.

(ධාතු දුක සි.)

714. ඒ චක්ඛුන්ද්‍රියරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතරමහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ද ... නෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ චක්ෂුරින්ද්‍රිය රූප සි.

715. ඒ චක්ඛුන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

ශ්‍රොත්‍රායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ චක්ෂුරින්ද්‍රිය නො වූ රූප සි.

716. ඒ සොතින්ද්‍රියරූපය ... ඝාණින්ද්‍රිය ... ජිව්හින්ද්‍රිය ... කායින්ද්‍රියරූපය කවරේ යත්:

යම් කයෙක් සතරමහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ද ... නෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ කායෙන්ද්‍රියරූප සි.

717. ඒ කායෙන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ කායෙන්ද්‍රිය නො වූ රූප සි.

718. ඒ ඉත්ථින්ද්‍රියරූපය කවරේ යත්:

යම් කරුණෙකින් ස්ත්‍රිය පිළිබඳ ස්ත්‍රීසටහන ස්ත්‍රීනිමිත්ත ස්ත්‍රීක්‍රියා ස්ත්‍රීආකල්පය ස්ත්‍රීත්වය ස්ත්‍රීභාවය වේ ද, මේ ඒ ස්ත්‍රීන්ද්‍රියරූප සි.

719. ඒ ස්ත්‍රීන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ ස්ත්‍රීන්ද්‍රිය නො වූ රූප සි.

720. ඒ පුරිසින්ද්‍රියරූපය කවරේ යත්:

යම් කරුණෙකින් පුරුෂයාගේ පුරුෂ සටහන පුරුෂනිමිත්ත පුරුෂ-ක්‍රියා පුරුෂාකල්පය පුරුෂත්වය පුරුෂභාවය වේ ද, මේ ඒ පුරුෂෙන්ද්‍රිය රූප සි.

721. කතමං තං රූපං න පුරිසින්ද්‍රියං?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න පුරිසින්ද්‍රියං.

722. කතමං තං රූපං ජීවිතින්ද්‍රියං?

යො තෙසං රූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං ජීවිතින්ද්‍රියං,

723. කතමං තං රූපං න ජීවිතින්ද්‍රියං?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න ජීවිතින්ද්‍රියං.

(ඉන්ද්‍රියදුකං.)

724. කතමං තං රූපං කායවිඤ්ඤත්ති?

යා කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අබ්‍යාකතචිත්තස්ස වා අභික්කමන්තස්ස වා පටික්කමන්තස්ස වා ආලොකෙන්තස්ස වා විලොකෙන්තස්ස වා සම්මිඤ්ජෙන්තස්ස වා පසාරෙන්තස්ස වා කායස්ස ථම්භනා සන්ථම්භනා සන්ථම්භිතත්තං විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපිතත්තං, ඉදං තං රූපං කායවිඤ්ඤත්ති.

725. කතමං තං රූපං න කායවිඤ්ඤත්ති?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න කායවිඤ්ඤත්ති.

726. කතමං තං රූපං වචීවිඤ්ඤත්ති?

යා කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අබ්‍යාකතචිත්තස්ස වා වාචා ගිරා බ්‍යප්පථො උදීරණං ඝොසො ඝොසකම්මං වාචා වචීභෙදො, අයං වුච්චති වාචා. යා තාය වාචාය විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපිතත්තං, ඉදං තං රූපං වචීවිඤ්ඤත්ති.

727. කතමං තං රූපං න වචීවිඤ්ඤත්ති?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං න වචීවිඤ්ඤත්ති.

721. ඒ පුරුෂෙන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ පුරුෂෙන්ද්‍රිය නො වූ රූප සි.

722. ඒ ජීවිතින්ද්‍රියරූපය කවරේ යත්:

ඒ රූපීධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යපනයෙක් යාපනයෙක් ඉරියනයෙක් පැවැත්මෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ ඒ ජීවිතෙන්ද්‍රියරූප සි.

723. ඒ ජීවිතෙන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ ජීවිතෙන්ද්‍රිය නො වූ රූප සි.

(ඉන්ද්‍රිය දුකය සි.)

724. ඒ කායවිඥප්තිරූපය කවරේ යත්:

කුසල්සිත් ඇත්තහුගේ හෝ අකුසල්සිත් ඇත්තහුගේ හෝ අව්‍යාකෘතසිත් ඇත්තහුගේ හෝ ඉදිරියට යන්නහුගේ හෝ පෙරළා එන්නහුගේ හෝ සෘජු වැ බලන්නහුගේ හෝ හාත්පසැ බලන්නහුගේ හෝ සන්ධි හකුළුවන්නහුගේ හෝ විහිදුවන්නහුගේ හෝ ශරීරය පිළිබඳ යම් තද කිරීමෙක් බලවත් තද කිරීමෙක් තද කළ බවෙක් විඥප්තියෙක් විඥපනාකාරයෙක් විඥපනය කළ බවෙක් වේ ද, මේ ඒ කායවිඥප්ති රූප සි.

725. ඒ කායවිඥප්ති නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ කායවිඥප්ති නො වූ රූප සි.

726 ඒ වචීවිඥප්තිරූපය කවරේ යත්:

කුසල්සිත් ඇත්තහුගේ හෝ අකුසල්සිත් ඇත්තහුගේ හෝ අව්‍යාකෘතසිත් ඇත්තහුගේ හෝ යම් වචනයෙක් තෙපුලෙක් වාක්‍යභෙදයෙක් උදීරණයෙක් ඝොෂයෙක් ඝොෂකර්මයෙක් වාක් සඞ්ඛ්‍යාත වාග්භෙදයෙක් වේ ද, මේ වාචා යි (කියනු ලැබේ.) ඒ වචනයෙන් යම් විඥප්තියෙක් විඥපනාකාරයෙක් විඥපනය කළ බවෙක් වේ ද, මේ ඒ වාග්විඥප්ති රූප සි.

727. ඒ වචීවිඥප්ති නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාරය සි මේ ඒ වාග්විඥප්ති නො වූ රූප සි.

728. කතමං තං රූපං ආකාසධාතු?

යෝ ආකාසෝ ආකාසගතං අඝං අඝගතං විවරෝ විවරගතං අසම්ඵුට්ඨං චතූහි මහාභූතේහි, ඉදං තං රූපං ආකාසධාතු.

729. කතමං තං රූපං න ආකාසධාතු?

චක්ඛායතනං -පෙ- කබලිංකාරෝ ආහාරෝ. ඉදං තං රූපං න ආකාසධාතු.

730. කතමං තං රූපං ආපෝධාතු?

යං ආපෝ ආපෝගතං සිනේහෝ සිනේහගතං බන්ධනත්තං රූපස්ස, ඉදං තං රූපං ආපෝධාතු.

731. කතමං තං රූපං න ආපෝධාතු?

චක්ඛායතනං -පෙ- කබලිංකාරෝ ආහාරෝ. ඉදං තං රූපං න ආපෝධාතු.

732. කතමං තං රූපං රූපස්ස ලහුතා?

යා රූපස්ස ලහුතා ලහුපරිණාමතා අදන්ධනතා අවිත්ථනතා, ඉදං තං රූපං රූපස්ස ලහුතා.

733. කතමං තං රූපං රූපස්ස න ලහුතා?

චක්ඛායතනං -පෙ- කබලිංකාරෝ ආහාරෝ. ඉදං තං රූපං රූපස්ස න ලහුතා.

734. කතමං තං රූපං රූපස්ස මුදුතා?

යා රූපස්ස මුදුතා මද්දවතා අකක්ඛලතා අකථිනතා, ඉදං තං රූපං රූපස්ස මුදුතා.

735. කතමං තං රූපං රූපස්ස න මුදුතා?

චක්ඛායතනං -පෙ- කබලිංකාරෝ ආහාරෝ. ඉදං තං රූපං රූපස්ස න මුදුතා.

736. කතමං තං රූපං රූපස්ස කම්මඤ්ඤතා?

යා රූපස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවෝ, ඉදං තං රූපං රූපස්ස කම්මඤ්ඤතා.

737. කතමං තං රූපං රූපස්ස න කම්මඤ්ඤතා?

චක්ඛායතනං -පෙ- කබලිංකාරෝ ආහාරෝ, ඉදං තං රූපං රූපස්ස න කම්මඤ්ඤතා.

728. ඒ ආකාසධාතුරූපය කවරේ යත්:

යම් ආකාශයෙක් ආකාශගතයෙක් (නො ගැටිය හැකි) අඝයෙක් අඝගතයෙක් විවරයෙක් විවරගතයෙක් සතර මහාභූතයන් විසින් නො පහස්නාලද්දයෙක් වේ ද, මේ ඒ ආකාශධාතුරූප සි.

729. ඒ ආකාසධාතු නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ... කවලීකාරාහාර සි. මේ ඒ ආකාශධාතු නො වූ රූප සි.

730 ඒ ආපොධාතුරූපය කවරේ යත්:

යම් ආපයෙක් ආපොගතයෙක් ස්නෙහයෙක් ස්නෙහගතයෙක් රූපයාගේ බන්ධනභාවයෙක් වේ ද, මේ ඒ අබ්ධාතුරූප සි.

731. ඒ ආපොධාතු නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ... කවලීකාරාහාර සි. මේ ඒ අබ්ධාතු නො වූ රූප සි.

732. ඒ රූපයාගේ ලහුතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් ලඝුත්වයෙක් යුහු වැ පරිවර්තන වන බවෙක් නො බර බවෙක් වේ ද, මේ ඒ රූපයාගේ ලඝුත්වරූප සි.

733. ඒ රූපයාගේ ලහුතා නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ... කවලීකාරාහාර සි. මේ ඒ රූපයාගේ ලහුතා නො වූ රූප සි.

734. ඒ රූපයාගේ මුදුතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් මෘදුත්වයෙක් මාර්දවයෙක් අකර්කශ බවෙක් නො තද බවෙක් වේ ද, මේ ඒ රූපයාගේ මෘදුත්වරූප සි.

735. ඒ රූපයාගේ මුදුතා නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ... කවලීකාරාහාර සි. මේ ඒ රූපයාගේ මුදුතා නො වූ රූප සි.

736. ඒ රූපයාගේ කම්මඤ්ඤතා රූපය කවරේ යත්:

රූපයාගේ යම් කර්මණ්‍යතාවයෙක් කර්මණ්‍යත්වයෙක් කර්මණ්‍යභාවයෙක් වේ ද, මේ ඒ රූපයාගේ කර්මණ්‍යත්වරූප සි.

737. ඒ රූපයාගේ කම්මඤ්ඤතා නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ... කවලීකාරාහාර සි. මේ ඒ රූපයාගේ කර්මණ්‍යත්ව නො වූ රූප සි.

738. කතමං තං රූපං රූපස්ස උපචයො?

යො ආයතනානං ආචයො, සො රූපස්ස උපචයො. ඉදං තං රූපං රූපස්ස උපචයො.

739. කතමං තං රූපං රූපස්ස න උපචයො?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං රූපස්ස න උපචයො.

740. කතමං තං රූපං රූපස්ස සන්තති?

යො රූපස්ස උපචයො, සා රූපස්ස සන්තති. ඉදං තං රූපං රූපස්ස සන්තති.

741. කතමං තං රූපං රූපස්ස න සන්තති?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං රූපස්ස න සන්තති.

742. කතමං තං රූපං රූපස්ස ජරතා?

යා රූපස්ස ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, ඉදං තං රූපං රූපස්ස ජරතා.

743. කතමං තං රූපං රූපස්ස න ජරතා?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං රූපස්ස න ජරතා.

744 කතමං තං රූපං රූපස්ස අනිච්චතා?

යො රූපස්ස ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං, ඉදං තං රූපං රූපස්ස අනිච්චතා.

745. කතමං තං රූපං රූපස්ස න අනිච්චතා?

චක්ඛායතනං -පෙ- කබලිංකාරො ආහාරො ඉදං තං රූපං රූපස්ස න අනිච්චතා.

746. කතමං තං රූපං කබලිංකාරො ආහාරො?

ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං ඛීරං දධි සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං යම්හි යම්හි ජනපදෙ තෙසං තෙසං සත්තානං මුඛාසියං දන්තවිඛාදනං ගලජ්ඣොහරණියං කුච්ඡිවිත්ථම්භනං යාය ඔජාය සත්තා යාපෙන්ති, ඉදං තං රූපං කබලිංකාරො ආහාරො.

738. ඒ රූපයාගේ උපචයරූපය කවරෙ යත්:

ආයතනයන්ගේ යම් නිපැද්මෙක් වේ ද, හේ රූපයාගේ උපචය නමි. මේ ඒ රූපයාගේ උපචයරූප යි.

739. ඒ රූපයාගේ උපචය නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ රූපයාගේ උපචය නො වූ රූප යි.

740. ඒ රූපයාගේ සන්තතිරූපය කවරෙ යත්:

රූපයාගේ යම් වැඩීමෙක් වේ ද, ඒ රූපයාගේ සන්තති නමි. මේ ඒ රූපයාගේ සන්තතිරූප යි.

741. ඒ රූපයාගේ සන්තති නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ රූපයාගේ සන්තති නො වූ රූප යි.

742. ඒ රූපයාගේ ජරතාරූපය කවරෙ යත්:

රූපයාගේ යම් ජරාවෙක් ජිණ්ණාකාරයෙක් කැඩුණු බවෙක් පැසුණු බවෙක් රැලි වැටුණු සම ඇති බවෙක් ආයුෂයාගේ පිරිහීමෙක් ඉන්ද්‍රියයන් මිහිකිරීමෙක් වේ ද, මේ ඒ රූපයාගේ ජරතාරූප යි.

743. ඒ රූපයාගේ ජරතා නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ රූපයාගේ ජරතා නො වූ රූප යි.

744. ඒ රූපයාගේ අනිච්චතාරූපය කවරෙ යත්:

රූපයාගේ යම් ක්ෂය වීමෙක් විනාශයෙක් බිඳීමෙක් පරිභෙදයෙක් අනිත්‍යතාවෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ ඒ රූපයාගේ අනිත්‍යතා රූප යි.

745. ඒ රූපයාගේ අනිච්චතා නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ රූපයාගේ අනිත්‍යතා නො වූ රූප යි.

746 ඒ කවලීකාරාහාරරූපය කවරෙ යත්:

ඔදන ය කුල්මාෂ ය සත්වට ය මාළු ය මස් ය කිරි ය දිකි ය ගිතෙල් ය වෙඩරු ය තෙල් ය මීකි ය පැණි ය, තවද යම් යම් ජනපදයෙක්හි ඒ ඒ සත්ත්වයන් විසින් මුවින් කෑමට තිබී දතින් විකිය යුතු ගෙලෙන් ගලනට තිබී කුස පුරාලන යම් ඕජාවෙකින් සත්ත්වයෝ යැපෙත් නම්, එබඳු වූ අන්‍ය වූත් යම් රූපයෙක් ඇද්ද, මේ ඒ කවලීකාරාහාරරූප යි.

747. කතමං තං රූපං න කබලිංකාරො ආහාරො?

චක්ඛායතනං -පෙ- රූපස්ස අනිච්චතා. ඉදං තං රූපං න කබලිංකාරො ආහාරො.

එවං දුවිධෙන රූපසඞ්ගහො.

(සුඛුමරූපදුකං.)

දුකනිද්දෙසො.

[තිකනිද්දෙසො]

748. කතමං තං රූපං අජ්ඣත්තිකං උපාදා?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං උපාදා.

749. කතමං තං රූපං බාහිරං උපාදා?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං උපාදා.

750. කතමං තං රූපං බාහිරං නො උපාදා?

ඵොට්ඨබ්බායතනං ආපොධාතු. ඉදං තං රූපං බාහිරං නො උපාදා.

751. කතමං තං රූපං අජ්ඣත්තිකං උපාදින්නං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං උපාදින්නං.

752. කතමං තං රූපං බාහිරං උපාදින්නං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං බාහිරං උපාදින්නං.

753. කතමං තං රූපං බාහිරං අනුපාදින්නං?

සද්දායතනං කායවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්සකතත්තා රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං බාහිරං අනුපාදින්නං.

754. කතමං තං රූපං අජ්ඣත්තිකං උපාදින්නුපාදානියං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං උපාදින්නුපාදානියං.

747. ඒ කවලීකාරාහාර නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... රූපයාගේ අනිත්‍යතාරූප යි. මේ ඒ කවලීකාරාහාර නො වූ රූප යි. මෙසේ ද අයුරින් රූපසඞ්ග්‍රහය වේ.

(සූක්ෂ්මරූප දුක යි.)

දුවිකනිදේශ යි.

[ත්‍රිකනිදේශය]

748. ඒ ආධ්‍යාත්මික උපාදාරූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික උපාදාරූප යි.

749. ඒ බාහිර උපාදාරූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර උපාදාරූප යි.

750. ඒ උපාදා නො වූ බාහිරරූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආපෝධාතු යි. මේ ඒ උපාදා නො වූ බාහිරරූප යි.

751. ඒ ආධ්‍යාත්මික උපාදින්නරූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික උපාදින්න රූප යි.

752. ඒ බාහිර උපාදින්නරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර යි. මේ ඒ බාහිර උපාදින්නරූප යි.

753. ඒ බාහිර අනුපාදින්නරූපය කවරේ යත්:

ශබ්දායතන ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා යි. යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර යි මේ ඒ බාහිර අනුපාදින්නරූප යි.

754. ඒ ආධ්‍යාත්මික උපාදින්නුපාදානියරූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික උපාදින්නොපාදානියරූප යි.

755. කතමං තං රූපං බාහිරං උපාදින්නුපාදානියං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං බාහිරං උපාදින්නුපාදානියං.

756. කතමං තං රූපං බාහිරං අනුපාදින්නුපාදානියං?

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං බාහිරං අනුපාදින්නුපාදානියං.

757. කතමං තං රූපං අජ්ඣත්තිකං අනිදස්සනං?

චක්ඛායතනං -පෙ- කායායතනං, ඉදං තං රූපං අජ්ඣත්තිකං අනිදස්සනං.

758. කතමං තං රූපං බාහිරං සනිදස්සනං?

රූපායතනං, ඉදං තං රූපං බාහිරං සනිදස්සනං.

759. කතමං තං රූපං බාහිරං අනිදස්සනං?

සද්දායතනං -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං බාහිරං අනිදස්සනං.

760. කතමං තං රූපං අජ්ඣත්තිකං සප්පටිඝං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං සප්පටිඝං.

761. කතමං තං රූපං බාහිරං සප්පටිඝං?

රූපායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං ඉදං තං රූපං බාහිරං සප්පටිඝං.

762. කතමං තං රූපං බාහිරං අප්පටිඝං?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං අප්පටිඝං.

763. කතමං තං රූපං අජ්ඣත්තිකං ඉන්ද්‍රියං?

චක්ඛුන්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං. ඉදං තං රූපං අජ්ඣත්තිකං ඉන්ද්‍රියං.

764. කතමං තං රූපං බාහිරං ඉන්ද්‍රියං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං. ඉදං තං රූපං බාහිරං ඉන්ද්‍රියං.

755. ඒ බාහිර උපාදින්නුපාදානියරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි. මේ ඒ බාහිර උපාදින්නුපාදානියරූප යි.

756. ඒ බාහිර අනුපාදින්නුපාදානියරූපය කවරේ යත්:

ශබ්දායතන ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූප-යාගේ අනිත්‍යතා යි. යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි. මේ ඒ බාහ්‍ය අනුපාදින්නුපාදානියරූප යි.

757. ඒ ආධ්‍යාත්මික අනිදස්සනරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික අනිදර්ශන රූප යි.

758. ඒ බාහිර සනිදස්සනරූපය කවරේ යත්:

රූපායතන යි. මේ ඒ සනිදර්ශනබාහිරරූප යි.

759. ඒ බාහිරඅනිදස්සනරූපය කවරේ යත්:

ශබ්දායතන ය ... කබලීකාරාහාර යි. මේ ඒ බාහිර අනිදර්ශනරූප යි.

760. ඒ ආධ්‍යාත්මික සප්‍රතිඝරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික සප්‍රතිඝ-රූප යි.

761. ඒ බාහිර සප්පටිඝරූපය කවරේ යත්:

රූපායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ බාහිර සප්‍රතිඝරූප යි.

762. ඒ බාහිර අප්පටිඝරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කබලීකාරාහාර යි. මේ ඒ බාහිර අප්‍රතිඝරූප යි.

763. ඒ ආධ්‍යාත්මික ඉන්ද්‍රියරූපය කවරේ යත්:

චක්ෂුරින්ද්‍රිය ය ... කායෙන්ද්‍රිය යි. මේ ඒ ආධ්‍යාත්මික ඉන්ද්‍රියරූප යි.

764. ඒ බාහිරඉන්ද්‍රියරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය යි. මේ ඒ බාහිර ඉන්ද්‍රිය-රූප යි.

765. කතමං තං රූපං බාහිරං න ඉන්ද්‍රියං?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න ඉන්ද්‍රියං.

766. කතමං තං රූපං අජ්ඣත්තිකං න මහාභූතං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න මහාභූතං.

767. කතමං තං රූපං බාහිරං මහාභූතං?

ඵොට්ඨබ්බායතනං ආපොධාතු. ඉදං තං රූපං බාහිරං මහාභූතං.

768. කතමං තං රූපං බාහිරං න මහාභූතං?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න මහාභූතං.

769. කතමං තං රූපං අජ්ඣත්තිකං න විඤ්ඤත්ති?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න විඤ්ඤත්ති.

770. කතමං තං රූපං බාහිරං විඤ්ඤත්ති?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති. ඉදං තං රූපං බාහිරං විඤ්ඤත්ති.

771. කතමං තං රූපං බාහිරං න විඤ්ඤත්ති?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න විඤ්ඤත්ති.

772. කතමං තං රූපං අජ්ඣත්තිකං න චිත්තසමුට්ඨානං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න චිත්තසමුට්ඨානං.

773. කතමං තං රූපං බාහිරං චිත්තසමුට්ඨානං?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං චිත්තජං චිත්තහෙතුකං චිත්තසමුට්ඨානං රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස උපචයො රූපස්ස සන්තති කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං බාහිරං චිත්තසමුට්ඨානං.

765. ඒ බාහිර ඉන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර ඉන්ද්‍රිය නො වූ රූප සි.

766. ඒ ආධ්‍යාත්මික මහාභූත නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික මහාභූත නො වූ රූප සි.

767. ඒ බාහිර මහාභූතරූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන ය අබ්ධාතු සි. මේ ඒ බාහිර මහා භූතරූප සි.

768. ඒ බාහිර මහාභූත නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර මහාභූත නො වූ රූප සි.

769. ඒ ආධ්‍යාත්මික විඥප්ති නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික විඥප්ති නො වූ රූප සි.

770. ඒ බාහිර විඥප්තිරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති සි. මේ ඒ බාහිරවිඥප්තිරූප සි.

771. ඒ බාහිර විඥප්ති නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර විඥප්ති නො වූ රූප සි.

772. ඒ ආධ්‍යාත්මික චිත්තසමුට්ඨාන නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික චිත්තසමුට්ඨාන නො වූ රූප සි.

773. ඒ බාහිර චිත්තසමුට්ඨානරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්තිය, යළි අන්‍ය වූ ද චිත්තජ වූ චිත්තහේතුක වූ චිත්තසමුට්ඨාන වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ශබ්දායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර සි. මේ ඒ බාහිර චිත්තසමුට්ඨානරූප සි.

774. කතමං තං රූපං බාහිරං න චිත්තසමුට්ඨානං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න චිත්තජං න චිත්තහේතුකං න චිත්තසමුට්ඨානං රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලීංකාරො ආහාරො, ඉදං තං රූපං බාහිරං න චිත්තසමුට්ඨානං.

775. කතමං තං රූපං අජ්ඣත්තිකං න චිත්තසහභු?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න චිත්තසහභු

776. කතමං තං රූපං බාහිරං චිත්තසහභු?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති. ඉදං තං රූපං බාහිරං චිත්තසහභු.

777. කතමං තං රූපං බාහිරං න චිත්තසහභු?

රූපායතනං -පෙ- කබලීංකාරො, ආහාරො ඉදං තං රූපං බාහිරං න චිත්තසහභු.

778. කතමං තං රූපං අජ්ඣත්තිකං න චිත්තානුපරිවත්ති?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න චිත්තානුපරිවත්ති.

779. කතමං තං රූපං බාහිරං චිත්තානුපරිවත්ති?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති. ඉදං තං රූපං බාහිරං චිත්තානුපරිවත්ති.

780. කතමං තං රූපං බාහිරං න චිත්තානුපරිවත්ති?

රූපායතනං -පෙ- කබලීංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න චිත්තානුපරිවත්ති.

781. කතමං තං රූපං අජ්ඣත්තිකං ඔළාරිකං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං ඔළාරිකං.

782. කතමං තං රූපං බාහිරං ඔළාරිකං?

රූපායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං. ඉදං රූපං බාහිරං ඔළාරිකං.

783. කතමං තං රූපං බාහිරං සුඛුමං?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබලීංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං සුඛුමං.

774. ඒ බාහිර චිත්තසමුට්ඨාන නො වූ රූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, යම් අන්‍ය වූ ද චිත්තජ නො වූ චිත්තහෙතුක නො වූ චිත්තසමුට්ඨාන නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ශබ්දායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශ-ධාතු ය අබ්ධාතු ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලී-කාරාහාර යි. මේ ඒ බාහිර චිත්තසමුට්ඨාන නො වූ රූප යි.

775. ඒ ආධ්‍යාත්මික චිත්තසහභූ නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික චිත්තසහභූ නො වූ රූප යි.

776. ඒ බාහිර චිත්තසහභූරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති යි. මේ ඒ බාහිර චිත්තසහභූරූප යි.

777. ඒ බාහිර චිත්තසහභූ නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර චිත්තසහභූ නො වූ රූප යි.

778. ඒ ආධ්‍යාත්මික චිත්තානුපරිවර්ති නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික චිත්තානු-පරිවර්ති නො වූ රූප යි.

779. ඒ බාහිර චිත්තානුපරිවර්ති රූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති යි. මේ ඒ බාහිර චිත්තානුපරිවර්ති රූප යි.

780. ඒ බාහිර චිත්තානුපරිවර්ති නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර චිත්තානුපරි-වර්ති නො වූ රූප යි.

781. ඒ ආධ්‍යාත්මික ඖදාරිකරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික ඖදාරික-රූප යි.

782. ඒ බාහිර ඖදාරිකරූපය කවරේ යත්:

රූපායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ බාහිර ඖදාරිකරූප යි.

783. ඒ බාහිර සූක්ෂ්මරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර සූක්ෂ්මරූප යි.

784. කතමං තං රූපං අජ්ඣත්තිකං සන්තිකෙ?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං සන්තිකෙ.

785. කතමං තං රූපං බාහිරං දූරෙ?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං දූරෙ.

786. කතමං තං රූපං බාහිරං සන්තිකෙ?

රූපායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං බාහිරං සන්තිකෙ.

(පකිණ්ණකතිකා.)

787. කතමං තං රූපං බාහිරං චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු.

788 කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුසම්ඵස්සස්ස වත්ථු?

චක්ඛායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුසම්ඵස්සස්ස වත්ථු.

789. කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු?

සොතායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුසම්ඵස්සස්ස න වත්ථු.

790 කතමං තං රූපං බාහිරං චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ චෙතනාය -පෙ- චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු.

791. කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථු?

චක්ඛායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථු.

792. කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු?

සොතායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු.

793. කතමං තං රූපං බාහිරං සොතසම්ඵස්සස්ස -පෙ- ඝානසම්ඵස්සස්ස -පෙ- ජිව්හාසම්ඵස්සස්ස -පෙ- කායසම්ඵස්සස්ස න වත්ථු?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං කායසම්ඵස්සස්ස න වත්ථු.

784. ඒ ආධ්‍යාත්මික සන්තිකෙරූපය කවරේ යත්:

චක්ෂුරායතනය ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික සන්තිකෙ රූප සි.

785. ඒ බාහිර දූරෙරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර දූරෙරූප සි.

786. ඒ බාහිර සන්තිකෙරූපය කවරේ යත්:

රූපායතනය ය ... ස්ප්‍රෂ්ටව්‍යායතනය සි. මේ ඒ බාහිර සන්තිකෙරූප සි.

(ප්‍රකීර්ණක ත්‍රිකයෝ සි.)

787. ඒ බාහිර චක්ඛුසම්ඵස්සයට වස්තු නො වූ රූපය කවරේ යත්:

රූපායතනය ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර චක්ඛුසම්ඵස්සයට වස්තු නො වූ රූප සි.

788. ඒ ආධ්‍යාත්මික චක්ඛුසම්ඵස්සයට වස්තු වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන සි. මේ ඒ ආධ්‍යාත්මික චක්ඛුසම්ඵස්සයට වස්තු වූ රූප සි.

789. ඒ ආධ්‍යාත්මික චක්ඛුසම්ඵස්සයට වස්තු නො වූ රූපය කවරේ යත්:

ශ්‍රෝත්‍රායතනය ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික චක්ඛුසම්ඵස්සයට වස්තු නො වූ රූප සි.

790. ඒ බාහිර චක්ඛුසම්ඵස්සජ වේදනාවට ... සංඥාවට ... චේතනාවට ... චක්ඛුවිඤ්ඤාණයට වස්තු නො වූ රූපය කවරේ යත්:

රූපායතනය ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහ්‍ය චක්ෂුර්විඥානයට වස්තු නො වූ රූප සි.

791. ඒ ආධ්‍යාත්මික චක්ෂුර්විඥානයට වස්තු වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන සි. මේ ඒ ආධ්‍යාත්මික චක්ෂුර්විඥානයට වස්තු වූ රූප සි.

792. ඒ ආධ්‍යාත්මික චක්ඛුවිඤ්ඤාණයට වස්තු නො වූ රූපය කවරේ යත්:

ශ්‍රෝත්‍රායතනය ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික චක්ෂුර්විඥානයට වස්තු නො වූ රූප සි.

793. ඒ බාහිර සෝතසම්ඵස්සයට ... ඝානසම්ඵස්සයට ... ජිව්හාසම්ඵස්සයට ... කායසම්ඵස්සයට වස්තු නො වූ රූපය කවරේ යත්:

රූපායතනය ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර කායසංස්පර්ශයට වස්තු නො වූ රූප සි.

794. කතමං තං රූපං අජ්ඣත්තිකං කායසම්ඵස්සස්ස වත්ථු?

කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායසම්ඵස්සස්ස වත්ථු.

795. කතමං තං රූපං අජ්ඣත්තිකං කායසම්ඵස්සස්ස න වත්ථු?

චක්ඛායතනං -පෙ- ජිව්හායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායසම්ඵස්සස්ස න වත්ථු.

796. කතමං තං රූපං බාහිරං කායසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- කායවිඤ්ඤාණස්ස න වත්ථු?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං කායවිඤ්ඤාණස්ස න වත්ථු

797 කතමං තං රූපං අජ්ඣත්තිකං කායවිඤ්ඤාණස්ස වත්ථු?

කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායවිඤ්ඤාණස්ස වත්ථු.

798. කතමං තං රූපං අජ්ඣත්තිකං කායවිඤ්ඤාණස්ස න වත්ථු?

චක්ඛායතනං -පෙ- ජිව්හායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායවිඤ්ඤාණස්ස න වත්ථු.

(වත්ථුතිකං.)

799. කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුසම්ඵස්සස්ස න ආරම්මණං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුසම්ඵස්සස්ස න ආරම්මණං.

800. කතමං තං රූපං බාහිරං චක්ඛුසම්ඵස්සස්ස ආරම්මණං?

රූපායතනං. ඉදං තං රූපං බාහිරං චක්ඛුසම්ඵස්සස්ස ආරම්මණං.

801. කතමං තං රූපං බාහිරං චක්ඛුසම්ඵස්සස්ස න ආරම්මණං?

සද්දායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං චක්ඛුසම්ඵස්සස්ස න ආරම්මණං.

802. කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- චක්ඛුවිඤ්ඤාණස්ස න ආරම්මණං.

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුවිඤ්ඤාණස්ස න ආරම්මණං.

794. ඒ ආධ්‍යාත්මික කායසම්ඵස්සයට වස්තු වූ රූපය කවරේ යත්:

කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායසංස්පර්ශයට වස්තු වූ රූප යි.

795. ඒ ආධ්‍යාත්මික කායසම්ඵස්සයට වස්තු නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... ජිහ්වායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායසංස්පර්ශයට වස්තු නො වූ රූප යි.

796. ඒ බාහිර කායසම්ඵස්සජ වේදනාවට ... සංඥවට ... චේතනාවට ... කායවිඥානයට වස්තු නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර කායවිඥනයට වස්තු නො වූ රූප යි.

797. ඒ ආධ්‍යාත්මික කායවිඥානයට වස්තු වූ රූපය කවරේ යත්:

කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායවිඥනයට වස්තු වූ රූප යි.

798. ඒ ආධ්‍යාත්මික කායවිඥානයට වස්තු නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... ජිහ්වායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායවිඥනයට වස්තු නො වූ රූප යි.

(වස්තු ත්‍රිකයෝ යි.)

799. ඒ ආධ්‍යාත්මික චක්ඛුසම්ඵස්සයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික චක්ඛුසම්ඵස්සට අරමුණු නො වූ රූප යි.

800. ඒ බාහිර චක්ඛුසම්ඵස්සයට අරමුණු වූ රූපය කවරේ යත්:

රූපායතන යි. මේ ඒ බාහිර චක්ඛුසම්ඵස්සයට අරමුණු වූ රූප යි.

801. ඒ බාහිර චක්ඛුසම්ඵස්සයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

ශබ්දායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර චක්ඛුසම්ඵස්සයට අරමුණු නො වූ රූප යි.

802. ඒ ආධ්‍යාත්මික චක්ඛුසම්ඵස්සජවේදනාවට ... සංඥවට ... චේතනාවට ... චක්ඛුවිඥානයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික චක්ෂුර්විඥනයට අරමුණු නො වූ රූප යි.

803. කතමං තං රූපං බාහිරං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණං?

රූපායතනං. ඉදං තං රූපං බාහිරං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණං.

804. කතමං තං රූපං බාහිරං චක්ඛුවිඤ්ඤාණස්ස න ආරම්මණං?

සද්දායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං චක්ඛුවිඤ්ඤාණස්ස න ආරම්මණං.

805. කතමං තං රූපං අජ්ඣත්තිකං සොතසම්ඵස්සස්ස -පෙ- ඝානසම්ඵස්සස්ස -පෙ- ජිව්හාසම්ඵස්සස්ස -පෙ- කායසම්ඵස්සස්ස න ආරම්මණං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායසම්ඵස්සස්ස න ආරම්මණං.

806. කතමං තං රූපං බාහිරං කායසම්ඵස්සස්ස ආරම්මණං?

ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං බාහිරං කායසම්ඵස්සස්ස ආරම්මණං.

807. කතමං තං රූපං බාහිරං කායසම්ඵස්සස්ස න ආරම්මණං?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං කායසම්ඵස්සස්ස න ආරම්මණං.

808. කතමං තං රූපං අජ්ඣත්තිකං කායසම්ඵස්සජාය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- චෙතනාය -පෙ- කායවිඤ්ඤාණස්ස න ආරම්මණං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායවිඤ්ඤාණස්ස න ආරම්මණං.

809. කතමං තං රූපං බාහිරං කායවිඤ්ඤාණස්ස ආරම්මණං?

ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං බාහිරං කායවිඤ්ඤාණස්ස ආරම්මණං.

810. කතමං තං රූපං බාහිරං කායවිඤ්ඤාණස්ස න ආරම්මණං?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං කායවිඤ්ඤාණස්ස න ආරම්මණං.

### ආරම්මණතිකා.

811. කතමං තං රූපං බාහිරං න චක්ඛායතනං?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න චක්ඛායතනං.

812. කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛායතනං?

යං චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමො පෙසො. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛායතනං.

803. ඒ බාහිර චක්ඛුවිඤ්ඤාණයට අරමුණු වූ රූපය කවරේ යත්:

රූපායතන යි. මේ ඒ බාහිර චක්‍ෂුර්විඥානයට අරමුණු වූ රූප යි.

804. ඒ බාහිර චක්ඛුවිඤ්ඤාණයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

ශබ්දායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර චක්‍ෂුර්විඥානයට අරමුණු නො වූ රූප යි.

805. ඒ ආධ්‍යාත්මික සොතසම්ඵස්සයට ... ඝානසම්ඵස්සයට ... ජිව්හාසම්ඵස්සයට ... කායසම්ඵස්සයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායසංස්පර්ශයට අරමුණු නො වූ රූප යි.

806. ඒ බාහිර කායසම්ඵස්සයට අරමුණු වූ රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ බාහිර කායසංස්පර්ශයට අරමුණු වූ රූප යි.

807. ඒ බාහිර කායසම්ඵස්සයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර කායසංස්පර්ශයට අරමුණු නො වූ රූප යි.

808. ඒ ආධ්‍යාත්මික කායසම්ඵස්සජ වේදනාවට ... සංඥාවට ... චේතනාවට ... කායවිඤ්ඤාණයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායවිඥානයට අරමුණු නො වූ රූප යි.

809. ඒ බාහිර කායවිඤ්ඤාණයට අරමුණු වූ රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ බාහිර කායවිඥානයට අරමුණු වූ රූප යි.

810. ඒ බාහිර කායවිඤ්ඤාණයට අරමුණු නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර කායවිඥානයට අරමුණු නො වූ රූප යි.

**ආලම්බන ත්‍රිකයෝ යි.**

811. ඒ බාහිර චක්‍ෂුරායතන නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර චක්‍ෂුරායතන නො වූ රූප යි.

812. ඒ ආධ්‍යාත්මික චක්ඛායතනරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වේ ද ... තෙල 'ශූන්‍යග්‍රාම' නමුදු වේ. මේ ඒ ආධ්‍යාත්මික චක්‍ෂුරායතනරූප යි.

813. කතමං තං රූපං අජ්ඣත්තිකං න චක්ඛායතනං?

සොතායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න චක්ඛායතනං.

814. කතමං තං රූපං බාහිරං න සොතායතනං -පෙ- න ඝානායතනං -පෙ- න ජිව්හායතනං -පෙ- න කායායතනං?

රූපායතනං -පෙ- කබළීංකාරො ආහාරො. ඉදං තං බාහිරං න කායායතනං.

815. කතමං තං රූපං අජ්ඣත්තිකං කායායතනං?

යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායායතනං.

816. කතමං තං රූපං අජ්ඣත්තිකං න කායායතනං?

චක්ඛායතනං -පෙ- ජිව්හායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න කායායතනං.

817. කතමං තං රූපං අජ්ඣත්තිකං න රූපායතනං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න රූපායතනං.

818. කතමං තං රූපං බාහිරං රූපායතනං?

යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා -පෙ- රූපධාතුපෙසා. ඉදං තං රූපං බාහිරං රූපායතනං.

819. කතමං තං රූපං බාහිරං න රූපායතනං?

සද්දායතනං -පෙ- කබළීංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න රූපායතනං.

820. කතමං තං රූපං අජ්ඣත්තිකං න සද්දායතනං -පෙ- න ගන්ධායතනං -පෙ- න රසායතනං -පෙ- න ඵොට්ඨබ්බායතනං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න ඵොට්ඨබ්බායතනං.

821. කතමං තං රූපං බාහිරං ඵොට්ඨබ්බායතනං?

පඨවීධාතු -පෙ- ඵොට්ඨබ්බධාතුපෙසා. ඉදං තං රූපං බාහිරං ඵොට්ඨබ්බායතනං.

822. කතමං තං රූපං බාහිරං න ඵොට්ඨබ්බායතනං?

රූපායතනං -පෙ- කබළීංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න ඵොට්ඨබ්බායතනං.

ආයතනතිකා.

813. ඒ ආධ්‍යාත්මික චක්ඛායතන නො වූ රූපය කවරේ යත්:

ශ්‍රොත්‍රායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික චක්ෂුරායතන නො වූ රූප යි.

814. ඒ බාහිර සොතායතන නො වූ ... ඝානායතන නො වූ ... ජිව්හායතන නො වූ ... කායායතන නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර කායායතන නො වූ රූප යි.

815. ඒ ආධ්‍යාත්මික කායායතනරූපය කවරේ යත්:

යම් කයෙක් සතරමහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ද ... මෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ආධ්‍යාත්මික කායායතනරූප යි.

816. ඒ ආධ්‍යාත්මික කායායතන නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... ජිහ්වායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායායතන නො වූ රූප යි.

817. ඒ ආධ්‍යාත්මික රූපායතන නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික රූපායතන නො වූ රූප යි.

818. ඒ බාහිර රූපායතනරූපය කවරේ යත්:

යම් රූපයෙක් සතරමහාභූතයන් නිසා උපන් පැහැසටහන වූයේ ද ... මෙලෙ රූපධාතු නමුදු වේ. මේ ඒ බාහිර රූපායතනරූප යි.

819. ඒ බාහිර රූපායතන නො වූ රූපය කවරේ යත්:

ශබ්දායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර රූපායතන නො වූ රූප යි.

820. ඒ ආධ්‍යාත්මික ශබ්දායතන නො වූ ... ගන්ධායතන නො වූ ... රසායතන නො වූ ... ස්ප්‍රෂ්ටව්‍යායතන නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික ස්ප්‍රෂ්ටව්‍යා-යතන නො වූ රූප යි.

821. ඒ බාහිර ඵොට්ඨබ්බායතන රූපය කවරේ යත්:

පෘථිවිධාතු ය ... තෙල ඵොට්ඨබ්බධාතු නමුදු වේ. මේ ඒ බාහිර ස්ප්‍රෂ්ට-ව්‍යායතනරූප යි.

822. ඒ බාහිර ඵොට්ඨබ්බායතන නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර ස්ප්‍රෂ්ටව්‍යා-යතන නො වූ රූප යි.

ආයතන ත්‍රිකයෝ යි.

823. කතමං තං රූපං බාහිරං න චක්ඛුධාතු?

රූපායතනං -පෙ- කබළිංකාරෙ ආහාරෙ. ඉදං තං රූපං බාහිරං න චක්ඛුධාතු.

824. කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුධාතු?

චක්ඛායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුධාතු.

825. කතමං තං රූපං අජ්ඣත්තිකං න චක්ඛුධාතු?

සොතායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න චක්ඛුධාතු.

826. කතමං තං රූපං බාහිරං න සොතධාතු -පෙ- න ඝානධාතු -පෙ- න ජිව්හාධාතු -පෙ- න කායධාතු?

රූපායතනං -පෙ- කබළිංකාරෙ ආහාරෙ. ඉදං තං රූපං බාහිරං න කායධාතු.

827. කතමං තං රූපං අජ්ඣත්තිකං කායධාතු?

කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායධාතු.

828. කතමං තං රූපං අජ්ඣත්තිකං න කායධාතු?

චක්ඛායතනං -පෙ- ජිව්හායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න කායධාතු.

829. කතමං තං රූපං අජ්ඣත්තිකං න රූපධාතු?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න රූපධාතු.

830. කතමං තං රූපං බාහිරං රූපධාතු?

රූපායතනං. ඉදං තං රූපං බාහිරං රූපධාතු.

831. කතමං තං රූපං බාහිරං න රූපධාතු?

සද්දායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න රූපධාතු.

832. කතමං රූපං අජ්ඣත්තිකං න සද්දධාතු -පෙ- න ගන්ධධාතු -පෙ- න රසධාතු -පෙ- න ඵොට්ඨබ්බධාතු?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න ඵොට්ඨබ්බධාතු.

823. ඒ බාහිර චක්ඛුධාතු නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර චක්‍ෂුර්ධාතු නො වූ රූප යි.

824. ඒ ආධ්‍යාත්මික චක්ඛුධාතු රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන යි. මේ ඒ ආධ්‍යාත්මික චක්‍ෂුර්ධාතුරූප යි.

825. ඒ ආධ්‍යාත්මික චක්ඛුධාතු නො වූ රූපය කවරේ යත්:

ශ්‍රොත්‍රායතන ය ... කායායතන යි. මේ ඒ අධ්‍යාත්මික චක්‍ෂුර්ධාතු නො වූ රූප යි.

826. ඒ බාහිර සොතධාතු නො වූ රූපය ... ඝානධාතු නො වූ ... ජිව්හාධාතු නො වූ ... කායධාතු නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර කායධාතු නො වූ රූප යි.

827. ඒ අධ්‍යාත්මික කායධාතු රූපය කවරේ යත්:

කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මිකකායධාතු රූප යි.

828 ඒ ආධ්‍යාත්මික කායධාතු නො වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... ජිහ්වායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායධාතු නො වූ රූප යි.

829. ඒ ආධ්‍යාත්මික රූපධාතු නො වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික රූපධාතු නො වූ රූප යි.

830. ඒ බාහිර රූපධාතු රූපය කවරේ යත්:

රූපායතන යි. මේ ඒ බාහිර රූපධාතු රූප යි.

831. ඒ බාහිර රූපධාතු නො වූ රූපය කවරේ යත්:

ශබ්දායතන ය ... කවලීකාරාහාරයි. මේ ඒ බහිර රූපධාතු නො වූ රූප යි.

832. ඒ ආධ්‍යාත්මික ශබ්දධාතු නො වූ රූපය ... ගන්ධධාතු නො වූ ... රසධාතු නො වූ ... ඵොට්ඨබ්බධාතු නො වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික ස්ප්‍රෂ්ටව්‍ය-ධාතු නො වූ රූප යි.

833. කතමං තං රූපං බාහිරං ඵොට්ඨබ්බධාතු?

ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං බාහිරං ඵොට්ඨබ්බධාතු.

834. කතමං තං රූපං බාහිරං න ඵොට්ඨබ්බධාතු?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න ඵොට්ඨබ්බධාතු.

ධාතුතිකා.

835. කතමං තං රූපං බාහිරං න චක්ඛුන්ද්‍රියං?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න චක්ඛුන්ද්‍රියං.

836. කතමං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුන්ද්‍රියං?

යං චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං අජ්ඣත්තිකං චක්ඛුන්ද්‍රියං.

837. කතමං තං රූපං අජ්ඣත්තිකං න චක්ඛුන්ද්‍රියං?

සොතායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න චක්ඛුන්ද්‍රියං.

838. කතමං තං රූපං බාහිරං න සොතින්ද්‍රියං -පෙ- න ඝානින්ද්‍රියං -පෙ- න ජිව්හින්ද්‍රියං -පෙ- න කායින්ද්‍රියං?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං රූපං බාහිරං න කායින්ද්‍රියං.

839. කතමං තං රූපං අජ්ඣත්තිකං කායින්ද්‍රියං?

යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං අජ්ඣත්තිකං කායින්ද්‍රියං.

840. කතමං තං රූපං අජ්ඣත්තිකං න කායින්ද්‍රියං?

චක්ඛායතනං -පෙ- ජිව්හායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න කායින්ද්‍රියං.

841. කතමං තං රූපං අජ්ඣත්තිකං න ඉත්ථින්ද්‍රියං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න ඉත්ථින්ද්‍රියං.

842. කතමං තං රූපං බාහිරං ඉත්ථින්ද්‍රියං?

යං ඉත්ථියා ඉත්ථිලිඞ්ගං ඉත්ථිනිමිත්තං ඉත්ථිකුත්තං ඉත්ථාකප්පො ඉත්ථත්තං ඉත්ථිභාවො, ඉදං තං රූපං බාහිරං ඉත්ථින්ද්‍රියං.

833. ඒ බාහිර ඵොට්ඨබ්බධාතුරූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මේ ඒ බාහිර ස්ප්‍රෂ්ටව්‍යධාතු රූප සි.

834. ඒ බාහිර ඵොට්ඨබ්බධාතු නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර ස්ප්‍රෂ්ටව්‍ය නො වූ රූප සි.

ධාතු ත්‍රිකයෝ සි.

835. ඒ බාහිර චක්ඛුන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර චක්ෂුරින්ද්‍රිය නො වූ රූප සි.

836. ඒ ආධ්‍යාත්මික චක්ඛුන්ද්‍රියරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතරමහාභූතයන් නිසා ප්‍රසාදය වූයේ ද ... තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ආධ්‍යාත්මික චක්ෂුරින්ද්‍රියරූප සි.

837. ඒ ආධ්‍යාත්මික චක්ඛුන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

ශ්‍රොත්‍රායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික චක්ෂුරින්ද්‍රිය නො වූ රූප සි.

838. ඒ බාහිර සොතින්ද්‍රිය නො වූ ... ඝානින්ද්‍රිය නො වූ ... ජිව්හින්ද්‍රිය නො වූ ... කායින්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර සි. මේ ඒ බාහිර කායින්ද්‍රිය නො වූ රූප සි.

839. ඒ ආධ්‍යාත්මික කායින්ද්‍රියරූපය කවරේ යත්:

යම් කයෙක් සතරමහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ද ... තෙලෙ ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ ආධ්‍යාත්මික කායින්ද්‍රියරූප සි.

840. ඒ ආධ්‍යාත්මික කායින්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... ජිහ්වායතන සි. මේ ඒ ආධ්‍යාත්මික කායින්ද්‍රිය නො වූ රූප සි.

841. ඒ ආධ්‍යාත්මික ඉත්ථින්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික ස්ත්‍රීන්ද්‍රිය නො වූ රූප සි.

842. ඒ බාහිර ඉත්ථින්ද්‍රියරූපය කවරේ යත්:

යම් කරුණෙකින් ස්ත්‍රිය පිළිබඳ ස්ත්‍රීසටහන ස්ත්‍රීලකුණ ස්ත්‍රීක්‍රියා ස්ත්‍රීආකල්පය ස්ත්‍රීත්වය ස්ත්‍රීභාවය වේ ද, මේ ඒ බාහිර ස්ත්‍රීන්ද්‍රියරූප සි.

843. කතමං තං රූපං බාහිරං න ඉත්ථින්ද්‍රියං?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න ඉත්ථින්ද්‍රියං.

844. කතමං තං රූපං අජ්ඣත්තිකං න පුරිසින්ද්‍රියං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න පුරිසින්ද්‍රියං.

845. කතමං තං රූපං බාහිරං පුරිසින්ද්‍රියං?

යං පුරිසස්ස පුරිසලිඞ්ගං පුරිසනිමිත්තං පුරිසකුත්තං පුරිසාකප්පො පුරිසත්තං පුරිසභාවො. ඉදං තං රූපං බාහිරං පුරිසින්ද්‍රියං.

846. කතමං තං රූපං බාහිරං න පුරිසින්ද්‍රියං.

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න පුරිසින්ද්‍රියං.

847. කතමං තං රූපං අජ්ඣත්තිකං න ජීවිතින්ද්‍රියං?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න ජීවිතින්ද්‍රියං.

848. කතමං තං රූපං බාහිරං ජීවිතින්ද්‍රියං?

යො තෙසං රූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං බාහිරං ජීවිතින්ද්‍රියං.

849. කතමං තං රූපං බාහිරං න ජීවිතින්ද්‍රියං?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න ජීවිතින්ද්‍රියං.

ඉන්ද්‍රිය තිකා.

850. කතමං තං රූපං අජ්ඣත්තිකං න කායවිඤ්ඤත්ති?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න කායවිඤ්ඤත්ති.

851. කතමං තං රූපං බාහිරං කායවිඤ්ඤත්ති?

යා කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අව්‍යාකතචිත්තස්ස වා අභික්කමන්තස්ස වා පටික්කමන්තස්ස වා ආලොකෙන්තස්ස ව විලොකෙන්තස්ස වා සම්මිඤ්ජන්තස්ස වා පසාරෙන්තස්ස වා කායස්ස ථම්භනා සන්ථම්භනා සන්ථම්භිතත්තං විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපිතත්තං. ඉදං තං රූපං බාහිරං කායවිඤ්ඤත්ති.

843. ඒ බාහිර ඉත්ථින්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි, මේ ඒ බාහිර ස්ත්‍රීන්ද්‍රිය නො වූ රූප යි.

844. ඒ ආධ්‍යාත්මික පුරිසින්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික පුරුෂේන්ද්‍රිය නො වූ රූප යි.

845. ඒ බාහිර පුරිසින්ද්‍රියරූපය කවරේ යත්:

යම් කරුණෙකින් පුරුෂයාගේ පුරුෂසටහන පුරුෂසලකුණ පුරුෂක්‍රියා පුරුෂාකල්පය පුරුෂත්වය පුරුෂභාවය වේ ද, මේ ඒ වාහ්‍ය පුරුෂේන්ද්‍රියරූප යි.

846. ඒ බාහිර පුරිසින්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ වාහ්‍ය පුරුෂේන්ද්‍රිය නො වූ රූප යි.

847. ඒ ආධ්‍යාත්මික ජීවිතින්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික ජීවිතේන්ද්‍රිය නො වූ රූප යි.

848. ඒ බාහිර ජීවිතින්ද්‍රිය රූපය කවරේ යත්:

ඒ රූපිධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යපනයෙක් යාපනයෙක් ඉරියනයෙක් පැවැත්මෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතේන්ද්‍රියයෙක් වේ ද, මේ ඒ බාහ්‍ය ජීවිතේන්ද්‍රිය රූප යි.

849. ඒ බාහිර ජීවිතින්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර ජීවිතේන්ද්‍රිය නො වූ රූප යි.

ඉන්ද්‍රිය ත්‍රිකයෝ යි.

850. ඒ ආධ්‍යාත්මික කායවිඤ්ඤත්ති නො වූ රූපය කවරේ යත්:
චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කායවිඤ්ඤත්ති නො වූ රූප යි.

851. ඒ බාහිර කායවිඤ්ඤත්තිරූපය කවරේ යත්:

කුසල්සිත් ඇත්තහුගේ හෝ අකුසල්සිත් ඇත්තහුගේ හෝ අව්‍යාකෘත සිත් ඇත්තහුගේ හෝ ඉදිරියට යන්නහුගේ හෝ පෙරළා එන්නහුගේ හෝ සෘජු වැ බලන්නහුගේ හෝ හාත්පසැ බලන්නහුගේ හෝ සඟි හකුළුවන්නහුගේ හෝ විදහන්නහුගේ හෝ ශරීරය පිළිබඳ යම් තද කිරීමෙක් බලවත් තද කිරීමෙක් තද කළ බවෙක් විඥපනයෙක් විඥපනාකාරයෙක් විඥපනය කළ බවෙක් වේ ද, මේ ඒ වාහ්‍ය කායවිඥප්ති රූප යි.

852. කතමං තං රූපං බාහිරං න කායවිඤ්ඤත්ති?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න කායවිඤ්ඤත්ති.

853. කතමං තං රූපං අජ්ඣත්තිකං න වචීවිඤ්ඤත්ති?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න වචීවිඤ්ඤත්ති.

854. කතමං තං රූපං බාහිරං වචීවිඤ්ඤත්ති?

යා කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අබ්‍යාකතචිත්තස්ස වා වාචා ගිරා බ්‍යප්පථො උදීරණං ඝොසො ඝොසකම්මං වාචා වචීභෙදො, අයං වුච්චති වාචා. යා තාය වාචාය විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපිතත්තං, ඉදං තං රූපං බාහිරං වචීවිඤ්ඤත්ති.

855. කතමං තං රූපං බාහිරං න වචීවිඤ්ඤත්ති?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න වචීවිඤ්ඤත්ති.

856. කතමං තං රූපං අජ්ඣත්තිකං න ආකාසධාතු?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න ආකාසධාතු.

857. කතමං තං රූපං බාහිරං ආකාසධාතු?

යො ආකාසො ආකාසගතං අඝං අඝගතං විවරො විවරගතං අසම්ඵුට්ඨං චතූහි මහාභූතෙහි. ඉදං තං රූපං බාහිරං ආකාසධාතු.

858. කතමං තං රූපං බාහිරං න ආකාසධාතු?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න ආකාසධාතු.

859. කතමං තං රූපං අජ්ඣත්තිකං න ආපොධාතු?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න ආපොධාතු.

860. කතමං තං රූපං බාහිරං ආපොධාතු?

යං ආපො ආපොගතං සිනෙහො සිනෙහගතං බන්ධනත්තං රූපස්ස. ඉදං තං රූපං බාහිරං ආපොධාතු.

852. ඒ බාහිර කායවිඤ්ඤප්ති නො වූ රූපය කවරෙ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර කායවිඥප්ති නො වූ රූප යි.

853. ඒ ආධ්‍යාත්මික වචීවිඤ්ඤත්ති නො වූ රූපය යත්:

චක්ඛුරායතන ය .... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික වාග්විඥප්ති නො වූ රූප යි.

851. ඒ බාහිර වචීවිඤ්ඤත්තිරූපය කවරෙ යත්:

කුසල්සිත් ඇත්තහුගේ හෝ අකුසල්සිත් ඇත්තහුගේ හෝ අව්‍යාකෘත-සිත් ඇත්තහුගේ හෝ යම් වචනයෙක් නෙපුලෙක් වාක්‍යභෙදයෙක් උදීරණයෙක් ඝොෂයෙක් ඝොෂකම්මයෙක් වාක්සඞ්ඛ්‍යාත වාග්භෙදයෙක් වේ ද, මේ වාචා යයි කියනු ලැබේ. ඒ වචනයෙන් යම් විඥප්තියෙක් විඥපනාකාරයෙක් විඥපනය කළ බවෙක් වේ ද, මේ ඒ වාග්විඥප්ති රූප යි.

855. ඒ බාහිර වචීවිඤ්ඤත්ති නො වූ රූපය කවරෙ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ වාහ්‍ය වාග්විඥප්ති නො වූ රූප යි.

856. ඒ ආධ්‍යාත්මික ආකාසධාතු නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික ආකාශ ධාතු නො වූ රූප යි.

857. ඒ බාහිර ආකාසධාතු රූපය කවරෙ යත්:

යම් ආකාශයෙක් ආකාශගතයෙක් අඝයෙක් අඝගතයෙක් විවරයෙක් විවරගතයෙක් සතරමහාභූතයන් විසින් නො පහස්නා ලදුයෙක් වේ ද, මේ ඒ බාහිර ආකාශධාතු රූප යි.

858. ඒ බාහිර ආකාසධාතු නො වූ රූපය කවරෙ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහිර ආකාශධාතු නො වූ රූප යි.

859. ඒ ආධ්‍යාත්මික ආපොධාතු නො වූ රූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික අබ්ධාතු නො වූ රූප යි.

860. ඒ බාහිර ආපොධාතුරූපය කවරෙ යත්:

යම් ආපයෙක් ආපොගතයෙක් ස්නෙහයෙක් ස්නෙහගතයෙක් රූප-යාගේ බන්ධන භාවයෙක් වේ ද, මේ ඒ වාහ්‍ය අබ්ධාතුරූප යි.

861. කතමං තං රූපං බාහිරං න ආපොධාතු?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං න ආපොධාතු.

862. කතමං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න ලහුතා?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න ලහුතා.

863. කතමං තං රූපං බාහිරං රූපස්ස ලහුතා?

යා රූපස්ස ලහුතා ලහුපරිණාමතා අදන්ධනතා අවිත්ථනතා, ඉදං තං රූපං බාහිරං රූපස්ස ලහුතා.

864. කතමං තං රූපං බාහිරං රූපස්ස න ලහුතා?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං රූපස්ස න ලහුතා.

865. කතමං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න මුදුතා?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න මුදුතා.

866. කතමං තං රූපං බාහිරං රූපස්ස මුදුතා?

යා රූපස්ස මුදුතා මද්දවතා අකක්ඛළතා අකථිනතා, ඉදං තං රූපං බාහිරං රූපස්ස මුදුතා.

867. කතමං තං රූපං බාහිරං රූපස්ස න මුදුතා?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං රූපස්ස න මුදුතා?

868. කතමං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න කම්මඤ්ඤතා?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න කම්මඤ්ඤතා.

869. කතමං තං රූපං බාහිරං රූපස්ස කම්මඤ්ඤතා?

යා රූපස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවො, ඉදං තං රූපං බාහිරං රූපස්ස කම්මඤ්ඤතා.

870. කතමං තං රූපං බාහිරං රූපස්ස න කම්මඤ්ඤතා?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං රූපස්ස න කම්මඤ්ඤතා.

861. ඒ බාහිර ආපොධාතු නො වූ රූපය කවරේ යත්:

රූපායතනය ය ... කවලීකාරාහාරයයි මේ ඒ බාහ්‍ය අබ්ධාතු නො වූ රූප යි.

862. ඒ ආධ්‍යාත්මික රූපයාගේ ලහුතා නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ය ... කායායතනය යි. මේ ඒ ආධ්‍යාත්මිකරූපයාගේ ලහුත්‍ව නො වූ රූප යි.

863. ඒ බාහිර රූපයාගේ ලහුතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් ලහුත්‍වයෙක් යුහු වැ පරිවර්තන වන බවෙක් නො බර බවෙක් නො තද බවෙක් වේ ද, මේ ඒ බාහ්‍ය රූපයාගේ ලහුත්‍වරූප යි.

864. ඒ බාහිර රූපයාගේ ලහුතා නො වූ රූපය කවරේ යත්:

රූපායතනය ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහ්‍ය රූපයාගේ ලහුත්‍ව නො වූ රූප යි.

865. ඒ ආධ්‍යාත්මික රූපයාගේ මුදුතා නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ය ... කායායතනය යි. මේ ඒ ආධ්‍යාත්මික රූපයාගේ මෘදුත්‍ව නො වූ රූප යි.

866. ඒ බාහිර රූපයාගේ මුදුතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් මෘදුත්‍වයෙක් මාර්දවයෙක් නො කැකුළු බවක් නො තද බවෙක් වේ ද, මේ ඒ බාහ්‍ය රූපයාගේ මෘදුත්‍වරූප යි.

867. ඒ බාහිර රූපයාගේ මුදුතා නො වූ රූපය කවරේ යත්:

රූපායතනය ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහ්‍ය රූපයාගේ මෘදුත්‍ව නො වූ රූප යි.

868. ඒ ආධ්‍යාත්මික රූපයාගේ කම්මඤ්ඤතා නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ය ... කායායතනය යි. මේ ඒ ආධ්‍යාත්මික රූපයාගේ කර්මණ්‍යතා නො වූ රූප යි.

869. ඒ බාහිර රූපයාගේ කම්මඤ්ඤතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් කර්මණ්‍ය බවෙක් කර්මණ්‍යත්‍වයෙක් කර්මණ්‍ය භාවයෙක් වේ ද, මේ ඒ බාහ්‍ය රූපයාගේ කර්මණ්‍යතාරූප යි.

870. ඒ බාහිර රූපයාගේ කම්මඤ්ඤතා නො වූ රූපය කවරේ යත්:

රූපායතනය ය ... කවලීකාරාහාර යි. මේ ඒ බාහ්‍ය රූපයාගේ කර්මණ්‍යතා නො වූ රූප යි.

871. කතමං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න උපචයො?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න උපචයො.

872. කතමං තං රූපං බාහිරං රූපස්ස උපචයො?

යො ආයතනානං ආචයො, සො රූපස්ස උපචයො. ඉදං තං රූපං බාහිරං රූපස්ස උපචයො.

873. කතමං තං රූපං බාහිරං රූපස්ස න උපචයො?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං රූපස්ස න උපචයො*.

874. කතමං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න සන්තති?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න සන්තති.*

875. කතමං තං රූපං බාහිරං රූපස්ස සන්තති?

යො රූපස්ස උපචයො, සා රූපස්ස සන්තති. ඉදං තං රූපං බාහිරං රූපස්ස සන්තති.

876. කතමං තං රූපං බාහිරං රූපස්ස න සන්තති?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං රූපස්ස න සන්තති.

877. කතමං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න ජරතා?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉදං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න ජරතා.

878. කතමං තං රූපං බාහිරං රූපස්ස ජරතා?

යා රූපස්ස ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො. ඉදං තං රූපං බාහිරං රූපස්ස ජරතා.

779 කතමං තං රූපං බාහිරං රූපස්ස න ජරතා?

රූපායතනං -පෙ- කබළිංකාරො ආහාරො. ඉදං තං රූපං රූපස්ස න ජරතා.

880. කතමං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න අනිච්චතා?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං රූපස්ස න අනිච්චතා.

---

* ඉමෙ ද්වෙ වාර PTS පොත්ථකෙ න සන්ති.

871. ඒ ආධ්‍යාත්මික රූපයාගේ උපචය නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික රූපයාගේ උපචය නො වූ රූප සි.

872. ඒ බාහිර රූපයාගේ උපචයරූපය කවරේ යත්:

ආයතනයන්ගේ යම් නිපැද්මෙක් වේ ද, ඒ රූපයාගේ උපචය සි. මේ ඒ බාහ්‍යරූපයාගේ උපචයරූප සි.

873. ඒ බාහිර රූපයාගේ උපචය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කබලීකාරාහාර සි. මේ ඒ බාහ්‍ය රූපයාගේ උපචය නො වූ රූප සි

874. ඒ ආධ්‍යාත්මික රූපයාගේ සන්තති නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික රූපයාගේ සන්තති නො වූ රූප සි.

875. ඒ බාහිර රූපයාගේ සන්තතිරූපය කවරේ යත්:

රූපයාගේ යම් වැඩීමෙක් වේ ද, ඒ රූපයාගේ සන්තති සි. මේ ඒ බාහ්‍ය රූපයාගේ සන්තතිරූප සි.

876 ඒ බාහිර රූපයාගේ සන්තති නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කබලීකාරාහාර සි. මේ ඒ බාහ්‍ය රූපයාගේ සන්තති නො වූ රූප සි.

877. ඒ ආධ්‍යාත්මික රූපයාගේ ජරතා නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික රූපයාගේ ජරතා නො වූ රූප සි.

878. ඒ බාහිර රූපයාගේ ජරතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් ජරාවක් ජීර්ණාකාරයෙක් කැඩුණු බවෙක් නරකැසි බවෙක් රැළි වැටුණු සම ඇති බවෙක් ආයුෂයාගේ පිරිහීමෙක් ඉන්ද්‍රියයන්ගේ මිහිකිරීමෙක් වේ ද, මේ ඒ බාහ්‍යරූපයාගේ ජරතාරූප සි.

879. ඒ බාහිර රූපයාගේ ජරතා නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කබලීකාරාහාර සි. මේ ඒ බාහ්‍ය රූපයාගේ ජරතා නො වූ රූප සි.

880. ඒ ආධ්‍යාත්මික රූපයාගේ අනිච්චතා නො වන රූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... කායායතන සි. මේ ඒ ආධ්‍යාත්මික රූපයාගේ අනිත්‍යතා නො වන රූප සි.

881. කතමං තං රූපං බාහිරං රූපස්ස අනිච්චතා?

යො රූපස්ස ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං, ඉදං තං රූපං බාහිරං රූපස්ස අනිච්චතා.

882. කතමං තං රූපං බාහිරං රූපස්ස න අනිච්චතා?

රූපායතනං -පෙ- කබලීංකාරො ආහාරො. ඉදං තං රූපං බාහිරං රූපස්ස න අනිච්චතා.

883. කතමං තං රූපං අජ්ඣත්තිකං න කබලීංකාරො ආහාරො?

චක්ඛායතනං -පෙ- කායායතනං. ඉදං තං රූපං අජ්ඣත්තිකං න කබලීංකාරො ආහාරො.

884. කතමං තං රූපං බාහිරං කබලීංකාරො ආහාරො?

ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං ඛීරං දධි සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං යම්හි යම්හි ජනපදෙ තෙසං තෙසං සත්තානං මුඛාසියං දන්තවිඛාදනං ගලජ්ඣොහරණීයං කුච්ඡිවිත්ථම්භනං යාය ඔජාය සත්තා යාපෙන්ති, ඉදං තං රූපං බාහිරං කබලීංකාරො ආහාරො.

885. කතමං තං රූපං බාහිරං න කබලීංකාරො ආහාරො?

රූපායතනං -පෙ- රූපස්ස අනිච්චතා, ඉදං තං රූපං බාහිරං න කබලීංකාරො ආහාරො. එවං තිවිධෙන රූපසඞ්ගහො.

(සුඛුමරූපතිකා)

තිකනිද්දෙසො.

චතුක්කං

886. කතමං තං රූපං උපාදා උපාදින්නං?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලීංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදා උපාදින්නං.

887. කතමං තං රූපං උපාදා අනුපාදින්නං?

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලීංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදා අනුපාදින්නං.

881. ඒ බාහිර රූපයාගේ අනිච්චතාරූපය කවරේ යත්:

රූපයාගේ යම් ක්‍ෂය වීමක් විනාශයෙක් බිඳීමෙක් පරිභෙදයෙක් අනිත්‍යතායෙක් අතුරුදහන් වීමක් වේ ද, මේ ඒ බාහිර රූපයාගේ අනිත්‍යතාරූප යි.

882. ඒ බාහිර රූපයාගේ අනිච්චතා නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි මේ ඒ බාහිර රූපයාගේ අනිත්‍යතා නො වූ රූප යි.

883. ඒ ආධ්‍යාත්මික කවලීකාරාහාර නො වූ රූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... කායායතන යි. මේ ඒ ආධ්‍යාත්මික කවලී-කාරාහාර නො වූ රූප යි.

884. ඒ බාහිර කවලීකාරාහාරරූපය කවරේ යත්:

ඔදන ය කුල්මාස ය හත්වට ය මාළු ය මස් ය කිරි ය දිහි ය ගිතෙල් ය වෙඬරු ය තෙල් ය මීහි ය පැණි ය, තවද යම් යම් දනව්යෙක්හි ඒ ඒ සත්ත්වයන් විසින් මුවින් කෑ යුතු දතින් විකිය යුතු කෙලෙන් ගිලිය යුතු කුස පුරාලන යම් ඕජාවෙකින් සත්ත්වයෝ යැපෙත් නම් එබඳු වූ අන්‍ය වූ ද යම් රූපයෙක් ඇද්ද, මේ ඒ බාහ්‍ය කවලීකාරාහාර රූප යි.

885. ඒ බාහිර කවලීකාරාහාර නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... රූපයාගේ අනිත්‍යතා යි. මේ ඒ බාහ්‍ය කවලීකාරා-හාරරූප යි. මෙසේ තුන් අයුරෙකින් රූපසඞ්ග්‍රහය වේ.

සුක්ෂ්මරූප ත්‍රිකයෝ යි.

ත්‍රිකනිර්දේශය යි.

චතුෂ්කය

886. ඒ උපාදාඋපාදින්නරූපය කවරේ යත්:

චක්‍ෂුරායතන ය ... කායායතන ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ රූපායතනය ගන්ධායතන ය රසායතන ය ආකාශධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ උපාදාඋපාදින්න රූපය යි.

887. ඒ උපාදාඅනුපාදින්නරූපය කවරේ යත්:

ශබ්දායතන ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපලඝුතා ය රූපමෘදුතා ය රූපකර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය නො වූ රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ආකාශධාතු ය රූපොපචය ය රූපසන්තති ය කවලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ උපාදාඅනුපාදින්නරූප යි

888. කතමං තං රූපං නො උපාදාඋපාදින්නං?

කම්මස්ස කතත්තා ඵොට්ඨබ්බායතනං ආපොධාතු. ඉදං තං රූපං නො උපාදාඋපාදින්නං.

889. කතමං තං රූපං නො උපාදාඅනුපාදින්නං?

න කම්මස්ස කතත්තා ඵොට්ඨබ්බායතනං, ආපොධාතු. ඉදං තං රූපං නො උපාදාඅනුපාදින්නං.

890. කතමං තං රූපං උපාදාඋපාදින්නුපාදානියං?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං උපාදාඋපාදින්නුපාදානියං.

891. කතමං තං රූපං උපාදාඅනුපාදින්නුපාදානියං?

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං උපාදාඅනුපාදින්නුපාදානියං.

892. කතමං තං රූපං නො උපාදාඋපාදින්නුපාදානියං?

කම්මස්ස කතත්තා ඵොට්ඨබ්බායතනං ආපොධාතු. ඉදං තං රූපං නො උපාදාඋපාදින්නුපාදානියං.

893. කතමං තං රූපං නො උපාදාඅනුපාදින්නුපාදානියං?

න කම්මස්ස කතත්තා ඵොට්ඨබ්බායතනං ආපොධාතු. ඉදං තං රූපං නො උපාදාඅනුපාදින්නුපාදානියං.

894. කතමං තං රූපං උපාදාසප්පටිඝං?

චක්ඛායතනං -පෙ- රසායතනං. ඉදං තං රූපං උපාදාසප්පටිඝං.

895. කතමං තං රූපං උපාදාඅප්පටිඝං?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං උපාදාඅප්පටිඝං.

896. කතමං තං රූපං නො උපාදාසප්පටිඝං?

ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං නො උපාදාසප්පටිඝං.

897. කතමං තං රූපං නො උපාදාඅප්පටිඝං?

ආපොධාතු. ඉදං තං රූපං නො උපාදාඅප්පටිඝං.

888. ඒ උපාදාඋපාදින්න නො වූ රූපය කවරේ යත්:

කර්මප්‍රත්‍ය වූ ස්ප්‍රෂ්ටව්‍යායතන ය අබ්ධාතු යි. මේ ඒ උපාදාඋපාදින්න නො වූ රූප යි.

889. ඒ උපාදාඅනුපාදින්න නො වූ රූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය නො වූ ස්ප්‍රෂ්ටව්‍යායතන ය, අබ්ධාතු යි. මේ ඒ උපාදා අනුපාදින්න නො වූ රූපය යි.

890. ඒ උපාදාඋපාදින්නුපාදානියරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, යම් අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ආකාශධාතු ය රූපෝපචය ය රූපසන්තති ය කබලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ උපාදාඋපාදින්නුපාදානිය රූප යි.

891. ඒ උපාදාඅනුපාදින්නුපාදානිය රූපය කවරේ යත්:

ශබ්දායතන ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතාවය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, යම් අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය නො වූ රූපායතන ය ගන්ධායතන ය රසායතනය ආකාශධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ උපාදා-අනුපාදින්නුපාදානියරූප යි.

892. ඒ උපාදාඋපාදින්නුපාදානිය නො වූ රූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය වූ ස්ප්‍රෂ්ටව්‍යායතන ය අබ්ධාතු යි. මේ ඒ උපාදාඋපාදින්නු-පාදානිය නො වූ රූප යි.

893. ඒ උපාදාඅනුපාදින්නුපාදානිය නො වූ රූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය නො වූ ස්ප්‍රෂ්ටව්‍යායතන ය අබ්ධාතු යි. මේ ඒ උපාදා අනුපාදින්නුපාදානිය නො වූ රූප යි.

894. ඒ උපාදාසප්පටිඝරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... රසායතන යි. මේ ඒ උපාදාසප්‍රතිඝරූප යි.

895. ඒ උපාදාඅප්පටිඝරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කබලීකාරාහාර යි. මේ ඒ උපාදා අප්‍රතිඝරූප යි.

896. ඒ උපාදාසප්පටිඝ නො වූ රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන යි· මේ ඒ උපාදාසප්‍රතිඝ නො වූ රූප යි.

897. ඒ උපාදාඅප්පටිඝ නො වූ රූපය කවරේ යත්:

අබ්ධාතු යි. මේ ඒ උපාදාඅප්‍රතිඝ නො වූ රූප යි.

898. කතමං තං රූපං උපාදාඔළාරිකං?

චක්ඛායතනං -පෙ- රසායතනං. ඉදං තං රූපං උපාදාඔළාරිකං.

899. කතමං තං රූපං උපාදාසුඛුමං?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං උපාදාසුඛුමං.

900. කතමං තං රූපං නො උපාදාඔළාරිකං?

ඵොට්ඨබ්බායතනං ඉදං තං රූපං නො උපාදාඔළාරිකං.

901. කතමං තං රූපං නො උපාදාසුඛුමං?

ආපොධාතු. ඉදං තං රූපං නො උපාදාසුඛුමං.

902. කතමං තං රූපං උපාදාදූරෙ?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබලිංකාරො ආහාරො ඉදං තං රූපං උපාදාදූරෙ.

903. කතමං තං රූපං උපාදාසන්තිකෙ?

චක්ඛායතනං -පෙ- රසායතනං. ඉදං තං රූපං උපාදාසන්තිකෙ.

904. කතමං තං රූපං නො උපාදාදූරෙ?

ආපොධාතු. ඉදං තං රූපං නො උපාදාදූරෙ.

905. කතමං තං රූපං නො උපාදාසන්තිකෙ?

ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං නො උපාදාසන්තිකෙ.

906. කතමං තං රූපං උපාදින්නං සනිදස්සනං?

කම්මස්ස කතත්තා රූපායතනං. ඉදං තං රූපං උපාදින්නං සනිදස්සනං.

907. කතමං තං රූපං උපාදින්නං අනිදස්සනං?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නං අනිදස්සනං.

908. කතමං තං රූපං අනුපාදින්නං සනිදස්සනං?

න කම්මස්ස කතත්තා රූපායතනං. ඉදං තං රූපං අනුපාදින්නං සනිදස්සනං.

898. ඒ උපාදඔළාරිකරූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... රසායතන යි. මේ ඒ උපාදඕදාරිකරූප යි.

899. ඒ උපාදසුඛුමරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර යි. මේ ඒ උපාද සුඛුමරූප යි.

900. ඒ උපාදඔළාරික නො වූ රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ උපාදඕදාරික නො වූ රූප යි.

901. ඒ උපාදසුඛුම නො වූ රූපය කවරේ යත්:

අබ්ධාතු යි. මේ ඒ උපාදසුඛුම නො වූ රූප යි.

902. ඒ උපාදදූරෙ රූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර යි. මේ ඒ උපාදදූරෙ රූප යි.

903. ඒ උපාද සන්තිකෙරූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... රසායතන යි. මේ ඒ උපාදසන්තිකෙ රූප යි.

904. ඒ උපාදදූරෙ නො වූ රූපය කවරේ යත්:

අබ්ධාතු යි. මේ ඒ උපාදදූරෙ නො වූ රූප යි.

905. ඒ උපාදසන්තිකෙ නො වූ රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ උපාදසන්තිකෙ නො වූ රූප යි.

906. ඒ උපාදින්න වූ සනිදස්සනරූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය වූ රූපායතන යි. මේ ඒ උපාදින්න වූ සනිදර්ශන රූප යි.

907. ඒ උපාදින්න වූ අනිදර්ශනරූපය කවරේ යත්:

චක්ඛුරායතන ය... කායායතනය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, යම් අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ උපාදින්න වූ අනිදර්ශන රූප යි.

908. ඒ අනුපාදින්න වූ සනිදස්සනරූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය නො වූ රූපායතන යි. මේ ඒ අනුපාදින්න වූ සනිදර්ශන රූප යි.

909. කතමං තං රූපං අනුපාදින්නං අනිදස්සනං?

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නං අනිදස්සනං.

910. කතමං තං රූපං උපාදින්නං සප්පටිඝං?

චක්ඛායතනං -පෙ- කායායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං උපාදින්නං සප්පටිඝං.

911. කතමං තං රූපං උපාදින්නං අප්පටිඝං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නං අප්පටිඝං.

912. කතමං තං රූපං අනුපාදින්නං සප්පටිඝං?

සද්දායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං අනුපාදින්නං සප්පටිඝං.

913. කතමං තං රූපං අනුපාදින්නං අප්පටිඝං?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නං අප්පටිඝං.

914. කතමං තං රූපං උපාදින්නං මහාභූතං?

කම්මස්ස කතත්තා ඵොට්ඨබ්බායතනං, ආපොධාතු. ඉදං තං රූපං උපාදින්නං මහාභූතං.

915. කතමං තං රූපං උපාදින්නං න මහාභූතං?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නං න මහාභූතං.

909. ඒ අනුපාදින්න අනිදස්සන වූ රූපය කවරේ යත්:

ශබ්දායතනය ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපලඝුතා ය රූපමෘදුතා ය රූපකර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය නො වූ ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපෝපචය ය රූපසන්තති ය කවලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ අනුපාදින්න වූ අනිදර්ශන රූප යි.

910. ඒ උපාදින්න වූ සප්පටිඝරූපය කවරේ යත්:

චක්ෂුරායතනය ය ... කායායතනය ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ උපාදින්න වූ සප්‍රතිඝරූප යි.

911. ඒ උපාදින්න වූ අප්පටිඝරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ උපාදින්න වූ අප්‍රතිඝරූප යි.

912. ඒ අනුපාදින්න වූ සප්පටිඝරූපය කවරේ යත්:

ශබ්දායතනය ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ අනුපාදින්න වූ සප්‍රතිඝරූප යි.

913. ඒ අනුපාදින්න වූ අප්පටිඝරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපලඝුතා ය රූපමෘදුතා ය රූපකර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය නො වූ ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ අනුපාදින්න වූ අප්‍රතිඝරූප යි.

914. ඒ උපාදින්න වූ මහාභූතරූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය වූ ස්ප්‍රෂ්ටව්‍යායතන ය, අබ්ධාතු යි. මේ ඒ උපාදින්න වූ මහාභූතරූප යි.

915. ඒ උපාදින්න වූ මහාභූත නො වූ රූපය කවරේ යත්:

චක්ෂුරායතනය ය ... කායායතනය ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, යළි අන්‍ය වූ ද කර්මප්‍රත්‍යය වූ රූපායතනය ය ගන්ධායතනය ය රසායතන ය ආකාශධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර ය යන යම් රූපයෙක් හෝ ඇද්ද, මේ ඒ උපාදින්න වූ මහාභූත නො වූ රූප යි.

916. කතමං තං රූපං අනුපාදින්නං මහාභූතං?

න කම්මස්ස කතත්තා ඵොට්ඨබ්බායතනං ආපොධාතු. ඉදං තං රූපං අනුපාදින්නං මහාභූතං.

917. කතමං තං රූපං අනුපාදින්නං න මහාභූතං?

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නං න මහාභූතං.

918. කතමං තං රූපං උපාදින්නං ඔළාරිකං?

චක්ඛායතනං -පෙ- කායායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං උපාදින්නං ඔළාරිකං.

919. කතමං තං රූපං උපාදින්නං සුඛුමං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නං සුඛුමං.

920. කතමං තං රූපං අනුපාදින්නං ඔළාරිකං?

සද්දායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං අනුපාදින්නං ඔළාරිකං.

921. කතමං තං රූපං අනුපාදින්නං සුඛුමං?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නං සුඛුමං.

922. කතමං තං රූපං උපාදින්නං දූරෙ?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නං දූරෙ.

916. ඒ අනුපාදින්න වූ මහාභූතරූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය නො වූ ස්ප්‍රෂ්ටව්‍යායතන ය, අබ්ධාතු යි. මේ ඒ අනුපාදින්න වූ මහාභූතරූප යි.

917. ඒ අනුපාදින්න මහාභූත නො වූ රූපය කවරේ යත්:

ශබ්දායතන ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ආකාශධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි. මේ ඒ අනුපාදින්න මහාභූත නො වූ රූප යි.

918. ඒ උපාදින්න ඖළාරිකරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කායායතන ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍ය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ උපාදින්න ඖදාරිකරූප යි.

919. ඒ උපාදින්න සූක්ෂ්මරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි මේ ඒ උපාදින්න සූක්ෂ්මරූප යි.

920. ඒ අනුපාදින්න ඖළාරිකරූපය කවරේ යත්:

ශබ්දායතන ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ අනුපාදින්න ඖදාරිකරූප යි

921. ඒ අනුපාදින්න සූක්ෂ්මරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතාය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි. මේ ඒ අනුපාදින්න සූක්ෂ්මරූප යි.

922. ඒ උපාදින්න දූරේරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි. මේ ඒ උපාදින්න දූරේරූප යි.

923. කතමං තං රූපං උපාදින්නං සන්තිකෙ?

චක්ඛායතනං -පෙ- කායායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං උපාදින්නං සන්තිකෙ.

924. කතමං තං රූපං අනුපාදින්නං දූරෙ?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නං දූරෙ.

925. කතමං තං රූපං අනුපාදින්නං සන්තිකෙ?

සද්දායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං අනුපාදින්නං සන්තිකෙ.

926. කතමං තං රූපං උපාදින්නුපාදානියං සනිදස්සනං?

කම්මස්ස කතත්තා රූපායතනං, ඉදං තං රූපං උපාදින්නුපාදානියං සනිදස්සනං.

927. කතමං තං රූපං උපාදින්නුපාදානියං අනිදස්සනං?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නුපාදානියං අනිදස්සනං.

928. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං සනිදස්සනං?

න කම්මස්ස කතත්තා රූපායතනං, ඉදං තං රූපං අනුපාදින්නුපා-දානියං සනිදස්සනං.

929. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං අනිදස්සනං?

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නුපාදානියං අනිදස්සනං.

923. ඒ උපාදින්න සනිඝෙරූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කායායතන ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ට-ව්‍යායතන සි. මේ ඒ උපාදින්න සනිඝෙරූප සි.

924. ඒ අනුපාදින්න දූරෙරූපය කවරෙ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාරසි. මේ ඒ අනුපාදින්න දූරෙරූප සි.

925. ඒ අනුපාදින්න සනිඝෙරූපය කවරෙ යත්:

ශබ්දායතන ය. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මේ ඒ අනුපාදින්න සනිඝෙරූප සි.

926. ඒ උපාදින්නුපාදනීය සනිදශ්‍යනරූපය කවරෙ යත්:

කර්මප්‍රත්‍යය වූ රූපායතන සි. මේ ඒ උපාදින්නොපාදනීය සනි-දර්ශනරූප සි.

927. ඒ උපාදින්නුපාදනීය අනිදශ්‍යනරූපය කවරෙ යත්:

චක්ඛුරායතන ය ... කායායතන ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය, ජීවි-තෙන්ද්‍රිය ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, ගන්ධා-යතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර සි. මේ ඒ උපාදින්නොපාදනීය අනිදර්ශනරූප සි.

928. ඒ අනුපාදින්නුපාදනීය සනිදශ්‍යනරූපය කවරෙ යත්:

කර්මප්‍රත්‍යය නො වූ රූපායතන සි. මේ ඒ අනුපාදින්නොපාදනීය සනිදර්ශනරූප සි.

929. ඒ අනුපාදින්නුපාදනීය අනිදශ්‍යනරූපය කවරෙ යත්:

ශබ්දායතන ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන ය ආකාශ ධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර සි. මේ ඒ අනුපාදින්නොපාදනීය අනිදර්ශනරූප සි.

930. කතමං තං රූපං උපාදින්නුපාදානියං සප්පටිඝං?

චක්ඛායතනං -පෙ- කායායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං උපාදින්නුපාදානියං සප්පටිඝං.

931. කතමං තං රූපං උපාදින්නුපාදානියං අප්පටිඝං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලීකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නුපාදානියං අප්පටිඝං.

932. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං සප්පටිඝං?

සද්දායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං අනුපාදින්නුපාදානියං සප්පටිඝං.

933. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං අප්පටිඝං?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලීකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නුපාදානියං අප්පටිඝං

934 කතමං තං රූපං උපාදින්නුපාදානියං මහාභූතං?

කම්මස්ස කතත්තා ඵොට්ඨබ්බායතනං ආපොධාතු. ඉදං තං රූපං උපාදින්නුපාදානියං මහාභූතං.

935. කතමං තං රූපං උපාදින්නුපාදානියං න මහාභූතං?

චක්ඛායතනං -පෙ- කායායතනං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලීකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නුපාදානියං න මහාභූතං.

936. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං මහාභූතං?

න කම්මස්ස කතත්තා ඵොට්ඨබ්බායතනං ආපොධාතු. ඉදං තං රූපං අනුපාදින්නුපාදානියං මහාභූතං.

930. ඒ උපාදින්නුපාදානිය සප්පටිඝරූපය කවරේ යත්:

චක්ඛුරායතනය ... කායායතනය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතනය ගන්ධායතනය රසායතනය ස්ප්‍රෂ්ටව්‍යායතන යි, මේ ඒ උපාදින්නොපාදානිය සප්‍රතිඝරූප යි.

931. ඒ උපාදින්නුපාදානිය අප්පටිඝරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂේන්ද්‍රිය ය ජීවිතේන්ද්‍රිය ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි. මේ ඒ උපාදින්නොපාදානිය අප්‍රතිඝරූප යි.

932. ඒ අනුපාදින්නුපාදානිය සප්පටිඝරූපය කවරේ යත්:

ශබ්දායතනය ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතනය ගන්ධායතනය රසායතනය ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ අනුපාදින්නොපාදානිය සප්‍රතිඝ රූප යි.

933. ඒ අනුපාදින්නුපාදානිය අප්පටිඝරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතා ය රූපයාගේ මෘදුතා ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි. මේ ඒ අනුපාදින්නොපාදානිය අප්‍රතිඝරූප යි.

934. ඒ උපාදින්නුපාදානිය මහාභූතරූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය වූ ස්ප්‍රෂ්ටව්‍යායතනය ය අබ්ධාතු යි. මේ ඒ උපාදින්නොපාදානිය මහාභූතරූප යි.

935. ඒ උපාදින්නුපාදානිය මහාභූත නො වූ රූපය කවරේ යත්:

චක්ඛුරායතනය ය ... කායායතනය ය ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂේන්ද්‍රිය ය ජීවිතේන්ද්‍රිය ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතනය ය ගන්ධායතනය ය රසායතනය ය ආකාශධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර යි. මේ ඒ උපාදින්නොපාදානිය මහාභූත නො වූ රූප යි.

936. ඒ අනුපාදින්නුපාදානිය මහාභූතරූපය කවරේ යත්:

කර්මප්‍රත්‍යය නො වූ ස්ප්‍රෂ්ටව්‍යායතනය ය අබ්ධාතු යි. මේ ඒ අනුපාදින්නුපාදානිය මහාභූතරූප යි.

937. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං න මහාභූතං.

සද්දායතනං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ආකාසධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නුපාදානියං න මහාභූතං.

938. කතමං තං රූපං උපාදින්නුපාදානියං ඔළාරිකං?

චක්ඛායතනං -පෙ- කායායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං උපාදින්නුපාදානියං ඔළාරිකං.

939. කතමං තං රූපං උපාදින්නුපාදානියං සුඛුමං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නුපාදානියං සුඛුමං.

940. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං ඔළාරිකං?

සද්දායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං අනුපාදින්නුපාදානියං ඔළාරිකං.

941. කතමං තං රූපං අනුපාදින්නුපාදානියං සුඛුමං?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නුපාදානියං සුඛුමං.

942. කතමං තං රූපං උපාදින්නුපාදානියං දූරෙ?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදින්නුපාදානියං දූරෙ.

943. කතමං තං රූපං උපාදින්නුපාදානියං සන්තිකෙ?

චක්ඛායතනං -පෙ- කායායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං උපාදින්නුපාදානියං සන්තිකෙ.

937. ඒ අනුපාදින්නුපාදනීය මහාභූත නො වූ රූපය කවරේ යත්:

ශබ්දායතනය ය කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතාව ය රූපයාගේ මෘදුතාව ය රූපයාගේ කර්මණ්‍යතාය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා ය, තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතනය ය ගන්ධායතනය ය රසායතනය ය ආකාශධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර යි. මේ ඒ අනුපාදින්නොපාදනීය මහාභූතරූප යි

938. ඒ උපාදින්නුපාදනීය ඖලාරිකරූපය කවරේ යත්:

චක්ෂුරායතනය ය ... කායායතනය යි. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතනය ය ගන්ධායතනය ය රසායතනය ය ස්ප්‍රෂ්ටව්‍යායතනය යි. මේ ඒ උපාදින්නොපාදනීය ඖදාරිකරූප යි.

939. ඒ උපාදින්නුපාදනීය සූක්ෂ්මරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය යි. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර යි. මේ ඒ උපාදින්නොපාදනීය සූක්ෂ්මරූප යි.

940. ඒ අනුපාදින්නුපාදනීය ඖලාරිකරූපය කවරේ යත්:

ශබ්දායතනය ය යි. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතනය ය ගන්ධායතනය ය රසායතනය ය ස්ප්‍රෂ්ටව්‍යායතනය යි. මේ ඒ අනුපාදින්නොපාදනීය ඖදාරිකරූප යි.

941 ඒ අනුපාදින්නොපාදනීය සූක්ෂ්මරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලඝුතාව ය රූපයාගේ මෘදුතාව ය රූපයාගේ කර්මණ්‍යතාව ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා යි. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් හෝ ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර යි. මේ ඒ අනුපාදින්නොපාදනීය සූක්ෂ්මරූප යි.

942. ඒ උපාදින්නොපාදනීය දූරේරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය යි. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කවලීකාරාහාර යි. මේ ඒ උපාදින්නොපාදනීය දූරේරූප යි.

943. ඒ උපාදින්නොපාදනීය සන්තිකේරූපය කවරේ යත්:

චක්ෂුරායතනය ය ... කායායතනය යි. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතනය ය ගන්ධායතනය ය රසායතනය ය ස්ප්‍රෂ්ටව්‍යායතනය යි. මේ ඒ උපාදින්නොපාදනීය සන්තිකේරූප යි

944. කතමං තං රූපං අනුපාදින්නුපාදනියං දූරේ?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා. යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා ආකාසධාතු ආපොධාතු රූපස්ස උපචයො රූපස්ස සන්තති කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අනුපාදින්නු-පාදනියං දූරේ.

945. කතමං තං රූපං අනුපාදින්නුපාදනියං සන්තිකෙ?

සද්දායතනං. යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං න කම්මස්ස කතත්තා රූපායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං අනුපාදින්නුපාදනියං සන්තිකෙ.

946. කතමං තං රූපං සප්පටිඝං ඉන්ද්‍රියං?

චක්ඛුන්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං, ඉදං තං රූපං සප්පටිඝං ඉන්ද්‍රියං.

947. කතමං තං රූපං සප්පටිඝං න ඉන්ද්‍රියං?

රූපායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං සප්පටිඝං න ඉන්ද්‍රියං.

948. කතමං තං රූපං අප්පටිඝං ඉන්ද්‍රියං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං අප්පටිඝං ඉන්ද්‍රියං.

949. කතමං තං රූපං අප්පටිඝං න ඉන්ද්‍රියං?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති -පෙ- කබලිංකාරො ආහාරො, ඉදං තං රූපං අප්පටිඝං න ඉන්ද්‍රියං.

950. කතමං තං රූපං සප්පටිඝං මහාභූතං?

ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං සප්පටිඝං මහාභූතං.

951. කතමං තං රූපං සප්පටිඝං න මහාභූතං?

චක්ඛායතනං -පෙ- රසායතනං, ඉදං තං රූපං සප්පටිඝං න මහාභූතං.

952. කතමං තං රූපං අප්පටිඝං මහාභූතං?

ආපොධාතු. ඉදං තං රූපං අප්පටිඝං මහාභූතං.

944. ඒ අනුපාදින්නනුපාදානිය දූරේරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති ය රූපයාගේ ලහුතාව ය රූපයාගේ මෘදුතාව ය රූපයාගේ කර්මණ්‍යතා ය රූපයාගේ ජරතා ය රූපයාගේ අනිත්‍යතා සි. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, ආකාශධාතු ය අබ්ධාතු ය රූපයාගේ උපචය ය රූපයාගේ සන්තති ය කබලීකාරාහාර සි. මේ ඒ අනුපාදින්නොපාදානිය දූරේරූප සි.

945. ඒ අනුපාදින්නනුපාදානිය සන්තිකෙ රූපය කවරෙ යත්:

ශබ්දායතන සි. තවද අන්‍ය වූත් කර්මප්‍රත්‍යය නො වූ යම් රූපයෙක් ඇද්ද, රූපායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මේ ඒ අනුපාදින්නොපාදානිය සන්තිකෙ රූප සි.

946. ඒ සප්‍රතිඝ ඉන්ද්‍රිය රූපය කවරෙ යත්:

චක්ෂුරින්ද්‍රිය ය ... කායෙන්ද්‍රිය සි. මේ ඒ සප්‍රතිඝ වූ ඉන්ද්‍රියරූප සි.

947. ඒ සප්‍රතිඝ ඉන්ද්‍රිය නො වූ රූපය කවරෙ යත්:

රූපායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මේ ඒ සප්‍රතිඝ ඉන්ද්‍රිය නො වූ රූප සි.

948. ඒ අප්‍රතිඝ ඉන්ද්‍රිය රූපය කවරෙ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය සි. මේ ඒ අප්‍රතිඝ ඉන්ද්‍රිය රූප සි.

949. ඒ අප්‍රතිඝ ඉන්ද්‍රිය නො වූ රූපය කවරෙ යත්:

කායවිඥප්තිය වාග්විඥප්ති ය ... කබලීකාරාහාර සි. මේ ඒ අප්‍රතිඝ ඉන්ද්‍රිය නොවූ රූප සි.

950. ඒ සප්‍රතිඝ වූ මහාභූත රූපය කවරෙ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන සි. මේ ඒ සප්‍රතිඝ වූ මහාභූත රූප සි.

951. ඒ සප්‍රතිඝ වූ මහාභූත නො වූ රූපය කවරෙ යත්:

චක්ෂුරායතන ය ... රසායතන සි. මේ ඒ සප්‍රතිඝ වූ මහාභූත නො වූ රූප සි.

952. ඒ අප්‍රතිඝ වූ මහාභූත රූපය කවරෙ යත්:

අබ්ධාතු සි. මේ ඒ අප්‍රතිඝ වූ මහාභූත රූප සි

953. කතමං තං රූපං අප්පටිඝං න මහාභූතං?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං අප්පටිඝං න මහාභූතං.

954. කතමං තං රූපං ඉන්ද්‍රියං ඔළාරිකං?

චක්ඛුන්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං, ඉදං තං රූපං ඉන්ද්‍රියං ඔළාරිකං.

955. කතමං තං රූපං ඉන්ද්‍රියං සුඛුමං?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං ඉන්ද්‍රියං සුඛුමං.

956. කතමං තං රූපං න ඉන්ද්‍රියං ඔළාරිකං?

රූපායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං න ඉන්ද්‍රියං ඔළාරිකං.

957. කතමං තං රූපං න ඉන්ද්‍රියං සුඛුමං?

කායවිඤ්ඤත්ති -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න ඉන්ද්‍රියං සුඛුමං.

958. කතමං තං රූපං ඉන්ද්‍රියං දූරෙ?

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං ඉන්ද්‍රියං දූරෙ.

959 කතමං තං රූපං ඉන්ද්‍රියං සන්තිකෙ?

චක්ඛුන්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං, ඉදං තං රූපං ඉන්ද්‍රියං සන්තිකෙ.

960. කතමං තං රූපං න ඉන්ද්‍රියං දූරෙ?

කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං න ඉන්ද්‍රියං දූරෙ.

961. කතමං තං රූපං න ඉන්ද්‍රියං සන්තිකෙ?

රූපායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං න ඉන්ද්‍රියං සන්තිකෙ.

962. කතමං තං රූපං මහාභූතං ඔළාරිකං?

ඵොට්ඨබ්බායතනං, ඉදං තං රූපං මහාභූතං ඔළාරිකං.

963. කතමං තං රූපං මහාභූතං සුඛුමං?

ආපොධාතු, ඉදං තං රූපං මහාභූතං සුඛුමං.

953. ඒ අප්‍රතිඝ වූ මහාභූත නො වූ රූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර යි. මේ ඒ අප්‍රතිඝ වූ මහාභූත නො වූ රූප යි.

954. ඒ ඉන්ද්‍රිය වූ ඖදාරික රූපය කවරේ යත්:

චක්ෂුරින්ද්‍රි ය ... කායෙන්ද්‍රිය යි. මේ ඒ ඉන්ද්‍රිය වූ ඖදාරිකරූප යි.

955. ඒ ඉන්ද්‍රිය වූ සුඛුම රූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය යි. මේ ඒ ඉන්ද්‍රිය වූ සූක්ෂ්මරූප යි.

956. ඒ ඉන්ද්‍රිය නො වූ ඖදාරික රූපය කවරේ යත්:

රූපායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ ඉන්ද්‍රිය නො වූ ඖදාරික රූප යි.

957. ඒ ඉන්ද්‍රිය නො වූ සුඛුම රූපය කවරේ යත්:

කායවිඥප්ති ය ... කවලීකාරාහාර යි. මේ ඒ ඉන්ද්‍රිය නො වූ සූක්ෂ්ම රූප යි.

958. ඒ ඉන්ද්‍රිය වූ දූරෙ රූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය පුරුෂෙන්ද්‍රිය ය ජීවිතෙන්ද්‍රිය යි. මේ ඒ ඉන්ද්‍රිය වූ දූරෙ රූප යි.

959. ඒ ඉන්ද්‍රිය වූ සන්තිකෙරූපය කවරේ යත්:

චක්ෂුරින්ද්‍රිය ය ... කායෙන්ද්‍රිය යි. මේ ඒ ඉන්ද්‍රිය වූ සන්තිකෙරූප යි.

960. ඒ ඉන්ද්‍රිය නො වූ දූරෙරූපය කවරේ යත්:

කායවිඥප්ති ය වාග්විඥප්ති ය ... කවලීකාරාහාර යි. මේ ඒ ඉන්ද්‍රිය නො වූ දූරෙරූප යි.

961. ඒ ඉන්ද්‍රිය නො වූ සන්තිකෙරූපය කවරේ යත්:

රූපායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ ඉන්ද්‍රිය නො වූ සන්තිකෙ රූප යි.

962. ඒ මහාභූත වූ ඖදාරික රූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතනය යි. මේ ඒ මහාභූත වූ ඖදාරිකරූප යි

963. ඒ මහාභූත වූ සුඛුමරූපය කවරේ යත්:

අබ්ධාතු යි. මේ ඒ මහාභූත වූ සූක්ෂ්මරූප යි.

964. කතමං තං රූපං න මහාභූතං ඔළාරිකං?

චක්ඛායතනං -පෙ- රසායතනං, ඉදං තං රූපං න මහාභූතං ඔළාරිකං.

965. කතමං තං රූපං න මහාභූතං සුඛුමං?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබළිංකාරෙ ආහාරෙ, ඉදං තං රූපං න මහාභූතං සුඛුමං.

966. කතමං තං රූපං මහාභූතං දූරෙ?

ආපොධාතු. ඉදං තං රූපං මහාභූතං දූරෙ.

967. කතමං තං රූපං මහාභූතං සන්තිකෙ?

ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං මහාභූතං සන්තිකෙ.

968. කතමං තං රූපං න මහාභූතං දූරෙ?

ඉත්ථින්ද්‍රියං -පෙ- කබළිංකාරෙ ආහාරෙ, ඉදං තං රූපං න මහාභූතං දූරෙ.

969. කතමං තං රූපං න මහාභූතං සන්තිකෙ?

චක්ඛායතනං -පෙ- රසායතනං. ඉදං තං රූපං න මහාභූතං සන්තිකෙ.

970. රූපායතනං දිට්ඨං, සද්දායතනං සුතං, ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මුතං, සබ්බං රූපං මනසා විඤ්ඤාතං රූපං.

එවං චතුබ්බිධෙන රූපසඞ්ගහො.

චතුක්කං.

971. කතමං තං රූපං පථවීධාතු?

යං කක්ඛළං ඛරිගතං[1] කක්ඛළත්තං කක්ඛළභාවො අජ්ඣත්තං වා බහිද්ධා වා උපාදින්නං වා අනුපාදින්නං වා, ඉදං තං රූපං පථවීධාතු.

972. කතමං තං රූපං ආපොධාතු?

යං ආපො ආපොගතං සිනෙහො සිනෙහගතං බන්ධනත්තං රූපස්ස අජ්ඣත්තං වා බහිද්ධා වා උපාදින්නං වා අනුපාදින්නං වා, ඉදං තං රූපං ආපොධාතු.

---

1 ඛරගතං - සිමු. 1, 2, 3, මජසං, සතා

964. ඒ මහාභූත නො වූ ඖළාරිකරූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... රසායතන යි. මේ ඒ මහාභූත නො වූ ඖදාරික රූප යි.

965. ඒ මහාභූත නො වූ සූක්ෂ්මරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර යි. මේ ඒ මහාභූත නො වූ සූක්ෂ්ම-රූප යි.

966. ඒ මහාභූත වූ දූරේරූපය කවරේ යත්:

අබ්ධාතු යි. මේ ඒ මහාභූත වූ දූරෙරරූප යි.

967. ඒ මහාභූත වූ සන්තිකෙරූපය කවරේ යත්:

ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ මහාභූත වූ සන්තිකෙරූප යි.

968. ඒ මහාභූත නො වූ දූරෙරරූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර යි. මේ ඒ මහාභූත නො වූ දූරෙරරූප යි.

969. ඒ මහාභූත නො වූ සන්තිකෙරූපය කවරේ යත්:

චක්ඛුරායතන ය ... රසායතන යි. මේ ඒ මහාභූත නො වූ සන්තිකෙ රූප යි.

970. රූපායතනය දෘෂ්ට ය, ශබ්දායතනය ශ්‍රැත ය, ගන්ධායතන-රසායතන - ස්ප්‍රෂ්ටව්‍යායතනය මුත ය, හැම රූපය මනසින් විඥතරූප යි.

මෙසේ චතුස්ප්‍රකාරයෙකින් රූපසඞ්ග්‍රහය වේ.

චතුෂ්කය යි.

971. ඒ පඨවිධාතුරූපය කවරේ යත්:

අධ්‍යාත්ම වූ හෝ බාහිර වූ හෝ උපාදින්න (· ශරීරස්ථ) වූ හෝ අනුපාදින්න වූ හෝ යම් කක්ඛශයෙක් පරුෂයෙක් කක්ඛළත්වයෙක් කඨින භාවයෙක් වේ ද, මේ ඒ පෘථිවිධාතුරූප යි.

972. ඒ ආපොධාතු රූපය කවරේ යත්:

අධ්‍යාත්ම වූ හෝ බාහිර වූ හෝ උපාදින්න වූ හෝ අනුපාදින්න වූ හෝ යම් ආපයෙක් ආපොගතයෙක් ස්නෙහයෙක් ස්නෙහගතයෙක් රූපයාගේ බන්ධනත්වයෙක් වේ ද, මේ ඒ අබ්ධාතුරූප යි.

973. කතමං තං රූපං තෙජොධාතු?

යං තෙජො තෙජොගතං උස්මා උස්මාගතං උසුමං උසුමගතං අජ්ඣත්තං වා බහිද්ධා වා උපාදින්නං වා අනුපාදින්නං වා, ඉදං තං රූපං තෙජොධාතු.

974. කතමං තං රූපං වායොධාතු?

යං වායො වායොගතං ථම්භිතත්තං රූපස්ස අජ්ඣත්තං වා බහිද්ධා වා උපාදින්නං වා අනුපාදින්නං වා, ඉදං තං රූපං වායොධාතු.

975. කතමං තං රූපං උපාදා?

චක්ඛායතනං -පෙ- කබළිංකාරො ආහාරො, ඉදං තං රූපං උපාදා.

එවං පඤ්චවිධෙන රූපසඞ්ගහො.

පඤ්චකං.

976. රූපායතනං චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං, සද්දායතනං සොතවිඤ්ඤෙය්‍යං රූපං, ගන්ධායතනං ඝානවිඤ්ඤෙය්‍යං රූපං, රසායතනං ජිව්හාවිඤ්ඤෙය්‍යං රූපං, ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤෙය්‍යං රූපං, සබ්බං රූපං මනොවිඤ්ඤෙය්‍යං රූපං.

එවං ඡබ්බිධෙන රූපසඞ්ගහො.

ඡක්කං.

977. රූපායතනං චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං, සද්දායතනං සොතවිඤ්ඤෙය්‍යං රූපං, ගන්ධායතනං ඝානවිඤ්ඤෙය්‍යං රූපං, රසායතනං ජිව්හාවිඤ්ඤෙය්‍යං රූපං, ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤෙය්‍යං රූපං, රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුවිඤ්ඤෙය්‍යං රූපං, සබ්බං රූපං මනොවිඤ්ඤාණධාතුවිඤ්ඤෙය්‍යං රූපං.

එවං සත්තවිධෙන රූපසඞ්ගහො.

සත්තකං.

978. රූපායතනං චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං, සද්දායතනං සොතවිඤ්ඤෙය්‍යං රූපං, ගන්ධායතනං ඝානවිඤ්ඤෙය්‍යං රූපං, රසායතනං ජිව්හාවිඤ්ඤෙය්‍යං රූපං, මනාපියො ඵොට්ඨබ්බො සුඛසම්ඵස්සො කායවිඤ්ඤෙය්‍යං රූපං, අමනාපියො ඵොට්ඨබ්බො දුක්ඛසම්ඵස්සො කායවිඤ්ඤෙය්‍යං රූපං, රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුවිඤ්ඤෙය්‍යං රූපං, සබ්බං රූපං මනොවිඤ්ඤාණධාතුවිඤ්ඤෙය්‍යං රූපං.

එවං අට්ඨවිධෙන රූපසඞ්ගහො.

අට්ඨකං.

973. ඒ තෙජොධාතුරූපය කවරේ යත්:

අධ්‍යාත්ම වූ හෝ බාහිර වූ හෝ උපාදින්න වූ හෝ අනුපාදින්න වූ හෝ තෙජසෙක් තෙජෝගතයක් උණුසුමෙක් උණුසුම් අයුරෙක් තද උණුසුමෙක් තද උණුසුම් අයුරෙක් වේ ද, මේ ඒ තෙජොධාතුරූප යි.

974. ඒ වායොධාතුරූපය කවරේ යත්:

අධ්‍යාත්ම වූ හෝ බාහිර වූ හෝ උපාදින්න වූ හෝ අනුපාදින්න වූ හෝ යම් වායුවෙක් වායොගතයෙක් රූපයාගේ පිරුණුබවෙක් වේ ද, මේ ඒ වායොධාතුරූප යි.

975. ඒ උපාදාරූපය කවරේ යත්:

චක්ෂුරායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ උපාදාරූප යි

මෙසේ පඤ්චප්‍රකාරයෙකින් රූපසඞ්ග්‍රහය වේ.

පඤ්චකය යි.

976. රූපායතනය චක්ෂුර්විඥෙය (-චක්ෂුර්විඥානයෙන් දත හැකි) රූප ය, ශබ්දායතනය ශ්‍රොත්‍රවිඥෙය රූපය, ගන්ධායතනය ඝ්‍රාණවිඥෙය රූප ය, රසායතනය ජිහ්වාවිඥෙය රූප ය, ස්ප්‍රෂ්ටව්‍යායතනය කායවිඥෙය රූප ය, හැම රූපය මනොවිඥෙය රූප යි.

මෙසේ ෂට්ප්‍රකාරයෙකින් රූපසඞ්ග්‍රහය වේ.

ෂට්කය යි.

977. රූපායතනය චක්ෂුර්විඥෙයරූප ය, ශබ්දායතනය ශ්‍රොත්‍රවිඥෙය රූප ය, ගන්ධායතනය ඝ්‍රාණවිඥෙයරූප ය, රසායතනය ජිහ්වාවිඥෙයරූප ය, ස්ප්‍රෂ්ටව්‍යායතනය කායවිඥෙයරූප ය, රූපායතනය ශබ්දායතනය ගන්ධායතනය රසායතනය ස්ප්‍රෂ්ටව්‍යායතනය මනොධාතුවිඥෙය (-ත්‍රිවිධ මනොධාතුයෙන් දත හැකි) රූප ය, හැම රූපය මනොවිඥානධාතුයෙන් දත හැකි රූප යි.

මෙසේ සප්තප්‍රකාරයෙකින් රූප සඞ්ග්‍රහය වේ.

සප්තකය යි.

978 රූපායතනය චක්ෂුර්විඥෙය රූප ය, ශබ්දායතනය ශ්‍රොත්‍ර-විඥෙයරූප ය, ගන්ධායතනය ඝ්‍රාණවිඥෙයරූප ය, රසායතනය ජිහ්වාවිඥෙය රූප ය, සුවපහස් වූ මනවඩන පහස කායවිඥෙයරූප ය, දුක්පහස් වූ නොමනවඩන පහස කායවිඥෙයරූප ය, රූපායතනය ශබ්දායතනය ගන්ධායතනය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතනය මනොධාතුවිඥෙයරූප ය, හැම රූපය මනොවිඥානධාතුයෙන් දත හැකි රූප යි.

මෙසේ අෂ්ටප්‍රකාරයෙකින් රූපසඞ්ග්‍රහය වේ.

අෂ්ටකය යි.

979. කතමං තං රූපං චක්ඛුන්ද්‍රියං?

යං චක්ඛුං[1] චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං චක්ඛුන්ද්‍රියං.

980. කතමං තං රූපං සොතින්ද්‍රියං -පෙ- ඝාණින්ද්‍රියං -පෙ- ජිව්හින්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං -පෙ- ඉත්ථින්ද්‍රියං -පෙ- පුරිසින්ද්‍රියං -පෙ- ජීවිතින්ද්‍රියං?

යො තෙසං[2] රූපිනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං ජීවිතින්ද්‍රියං.

981. කතමං තං රූපං න ඉන්ද්‍රියං?

රූපායතනං -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං න ඉන්ද්‍රියං.

එවං නවවිධෙන රූපසඞ්ගහො.

නවකං.

982. කතමං තං රූපං චක්ඛුන්ද්‍රියං?

යං චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං චක්ඛුන්ද්‍රියං.

983. කතමං තං රූපං සොතින්ද්‍රියං -පෙ- ඝාණින්ද්‍රියං -පෙ- ජිව්හින්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං -පෙ- ඉත්ථින්ද්‍රියං -පෙ- පුරිසින්ද්‍රියං -පෙ- ජීවිතින්ද්‍රියං?

යො තෙසං රූපිනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං තං රූපං ජීවිතින්ද්‍රියං.

984. කතමං තං රූපං න ඉන්ද්‍රියං සප්පටිඝං?

රූපායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං. ඉදං තං රූපං න ඉන්ද්‍රියං සප්පටිඝං.

985. කතමං තං රූපං න ඉන්ද්‍රියං අප්පටිඝං?

කායවිඤ්ඤත්ති -පෙ- කබලිංකාරො ආහාරො. ඉදං තං රූපං න ඉන්ද්‍රියං අප්පටිඝං.

එවං දසවිධෙන රූපසඞ්ගහො.

දසකං.

986. කතමං තං රූපං චක්ඛායතනං?

යං චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො. ඉදං තං රූපං චක්ඛායතනං.

1. යං චක්ඛු - සීමු 1, 2, මජසං, PTS.
2. යං තෙසං - සීමු 3.

979. ඒ චක්ඛුන්ද්‍රියරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ... තෙල ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ චක්‍ෂුරින්ද්‍රියරූප යි.

980. ඒ සෝතින්ද්‍රියරූපය ... ඝාණින්ද්‍රිය ... ජිව්හින්ද්‍රිය ... කායින්ද්‍රිය ... ඉත්ථින්ද්‍රිය ... පුරිසින්ද්‍රිය ... ජීවිතින්ද්‍රියරූපය කවරේ යත්:

ඒ රූපීධර්මයන්ගේ ආයුෂයෙක් සිටීමෙක් යපනයෙක් යාපනයෙක් ඉරියනයෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ ඒ ජීවිතෙන්ද්‍රියරූප යි.

981. ඒ ඉන්ද්‍රිය නො වූ රූපය කවරේ යත්:

රූපායතන ය ... කවලීකාරාහාර යි. මේ ඒ ඉන්ද්‍රිය නො වූ රූප යි.

මෙසේ නවප්‍රකාරයෙකින් රූපසඞ්ග්‍රහය වේ.

**නවකය යි.**

982. ඒ චක්ඛුන්ද්‍රියරූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ... තෙල ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ චක්‍ෂුරින්ද්‍රිය රූප යි.

983. ඒ සෝතින්ද්‍රියරූපය ... ඝාණින්ද්‍රිය ... ජිව්හින්ද්‍රිය ... කායින්ද්‍රිය ... ඉත්ථින්ද්‍රිය ... පුරිසින්ද්‍රිය ... ජීවිතින්ද්‍රිය රූපය කවරේ යත්:

ඒ රූපීධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යපනයෙක් යාපනයෙක් ඊර්‍ය්‍යාපථයෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ ඒ ජීවිතෙන්ද්‍රියරූප යි.

984. ඒ ඉන්ද්‍රිය නො වූ සප්‍රතිඝරූපය කවරේ යත්:

රූපායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ඒ ඉන්ද්‍රිය නො වූ සප්‍රතිඝ රූප යි.

985. ඒ ඉන්ද්‍රිය නො වූ අප්‍රතිඝරූපය කවරේ යත්:

කායවිඥප්ති ය ... කවලීකාරාහාර යි. මේ ඒ ඉන්ද්‍රිය නො වූ අප්‍රතිඝ රූප යි.

මෙසේ දශප්‍රකාරයෙකින් රූපසඞ්ග්‍රහය වේ.

**දශකය යි.**

986. ඒ චක්ඛායතන රූපය කවරේ යත්:

යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වූයේ ... තෙල ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ ඒ චක්‍ෂුරායතන රූප යි.

987. කතමං තං රූපං සොතායතනං -පෙ- ඝානායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං -පෙ- රූපායතනං -පෙ- සද්දායතනං -පෙ- ගන්ධායතනං -පෙ- රසායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං?

පඨවීධාතු -පෙ- ඵොට්ඨබ්බධාතුපෙසා. ඉදං තං රූපං ඵොට්ඨබ්බායතනං.

988. කතමං තං රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං.

ඉත්ථින්ද්‍රියං -පෙ- කබළිංකාරෙ ආහාරෙ, ඉදං තං රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං.

එවං එකාදසවිධෙන රූපසඞ්ගහො.

එකාදසකං.

රූපවිභත්ති

අට්ඨමං භාණවාරං.

[නික්ඛෙපකණ්ඩං]

989. කතමෙ ධම්මා කුසලා?

තීණි කුසලමූලානි: අලොභො අදොසො අමොහො, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා කුසලා.

990. කතමෙ ධම්මා අකුසලා?

තීණි අකුසලමූලානි: ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා අකුසලා.

991. කතමෙ ධම්මා අබ්‍යාකතා?

කුසලාකුසලානං ධම්මානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, යෙ ච ධම්මා කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු. ඉමෙ ධම්මා අබ්‍යාකතා.

987. ඒ සෝතායතනරූපය ... ඝානායතන ... ජිව්හායතන ... කායායතන ... රූපායතන ... සද්දායතන ... ගන්ධායතන ... රසායතන ... ඵොට්ඨබ්බායතනරූපය කවරේ යත්:

පඨවිධාතු ය ... තෙල ස්ප්‍රෂ්ටව්‍යධාතු නමුදු වේ. මේ ඒ ස්ප්‍රෂ්ටව්‍යායතනරූප යි.

988. ඒ අනිදස්සන අප්පටිඝ වූ ධම්මායතනපරියාපන්න රූපය කවරේ යත්:

ස්ත්‍රීන්ද්‍රිය ය ... කවලීකාරාහාර යි. මේ ඒ අනිදර්ශන අප්‍රතිඝ වූ ධර්මායතනපර්‍ය්‍යාපන්නරූප යි.

මෙසේ එකාදශප්‍රකාරයෙකින් රූපසඞ්ග්‍රහය වේ.

එකාදශකය යි.

රූපකාණ්ඩය නිමි.

අටවැනි බණවර යි.

[නික්ෂේපකාණ්ඩය]

989. කවර ධර්මයෝ කුශල වෙති යත්:

අලෝභ ය අද්වේෂ ය අමෝහ ය යන තුන් කුශලමූලයෝ ය. උන් (-ඒ අලෝභාදීන්) හා සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ විඥානස්කන්ධ ය, ඒ අලෝභාදීන් විසින් සමුත්ථිත වූ කායකර්ම ය වාක්කර්මය මනඃකර්ම ය, මේ ධර්මයෝ කුශලයෝ යි.

990. කවර ධර්මයෝ අකුශල වෙති යත්:

ලෝභ ය ද්වේෂ ය මෝහ ය යන තුන් අකුශලමූලයෝ ය, තදේකස්ථ (ඒ ලෝභාදිය සමග එක් සිතෙක සිටියා) වූ කෙලශයෝ ය, ඒ ලෝභාදීන් හා සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ විඥානස්කන්ධ ය, ඒ ලෝභාදීන් විසින් සමුත්ථිත වූ කායකර්ම ය වාක්කර්ම ය මනඃකර්ම ය, මේ ධර්මයෝ අකුශලයෝ යි.

991. කවර ධර්මයෝ අව්‍යාකෘත වෙති යත්:

කාමාවචර වූ රූපාවචර වූ අරූපාවචර වූ අපරියාපන්න වූ (-තුන් වටහි ඇතුළු නො වූ) කුශලාකුශලධර්මයන්ගේ විපාකයෝ ය, වේදනාස්කන්ධ සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ විඥානස්කන්ධ ය, නො ම කුශලාකුශල වූ නො ද කර්මවිපාක වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඔහු ද, සියලු රූපය ද අසඞ්ඛතධාතු (නිර්වාණ) ද, යන මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි

992. කතමෙ ධම්මා සුඛාය වෙදනාය සම්පයුත්තා?

සුඛභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ සුඛං වෙදනං ඨපෙත්වා තංසම්පයුත්තො සඤ්ඤක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සුඛාය වෙදනාය සම්පයුත්තා.

993. කතමෙ ධම්මා දුක්ඛාය වෙදනාය සම්පයුත්තා?

දුක්ඛභූමියං කාමාවචරෙ දුක්ඛං වෙදනං ඨපෙත්වා තංසම්පයුත්තො සඤ්ඤක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා දුක්ඛාය වෙදනාය සම්පයුත්තා

994. කතමෙ ධම්මා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා?

අදුක්ඛමසුඛභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ අදුක්ඛමසුඛං වෙදනං ඨපෙත්වා තංසම්පයුත්තො සඤ්ඤක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා.

995. කතමෙ ධම්මා විපාකා?

කුසලාකුසලානං ධම්මානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා විපාකා.

996. කතමෙ ධම්මා විපාකධම්මධම්මා?

කුසලාකුසලා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා විපාකධම්මධම්මා

997. කතමෙ ධම්මා නෙවවිපාකනවිපාකධම්මධම්මා?

යෙ ච ධම්මා කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නෙවවිපාකනවිපාකධම්මධම්මා.

998. කතමෙ ධම්මා උපාදින්නුපාදානියා?

සාසවා කුසලාකුසලානං ධම්මානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, යං ච රූපං කම්මස්ස කතත්තා, ඉමෙ ධම්මා උපාදින්නුපාදානියා

992. කවර ධම් කෙනෙක් සුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වෙති යත්:

කාමාවචරයෙහි රූපාවචරයෙහි අපරියාපන්නයෙහි සුඛභූමි වූ සිත්හි සුඛවේදනාව් තබා ඒ සුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වූ සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ ය, මේ ධම්යෝ සුඛ වේදනාව හා සම්ප්‍රයුක්ත වෙත්.

993. කවර ධම්යෝ දුඃඛවේදනාව හා සම්ප්‍රයුක්ත වෙති යත්:

කාමාවචරයෙහි දුකට භූමි වූ සිත්හි දුඃඛවේදනාව තබා ඒ දුඃඛවේදනාව හා සම්ප්‍රයුක්ත වූ සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ ය, මේ ධම්යෝ දුඃඛවේදනාව හා සම්ප්‍රයුක්ත වෙත්.

994. කවර ධම්යෝ අදුක්ඛමසුඛ (-උපෙක්ෂා) වේදනාව හා සම්ප්‍රයුක්ත වෙති යත්:

කාමාවචරයෙහි රූපාවචරයෙහි අරූපාවචරයෙහි අපරියාපන්නයෙහි උපෙක්ෂාභූමි වූ සිත්හි උපෙක්ෂාවේදනාව තබා තත්සම්ප්‍රයුක්ත වූ සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ ය, මේ ධම්යෝ අදුක්ඛමසුඛ (-උපෙක්ෂා) වේදනාව හා සම්ප්‍රයුක්ත වෙත්.

995 කවර ධම්යෝ විපාක වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශල ධම්-යන්ගේ විපාකයෝ ය, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, මේ ධම්යෝ විපාකයෝ යි.

996. කවර ධම්යෝ විපාකස්වභාවධම් වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලධම්යෝ ය, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, මේ ධම්යෝ විපාකධම් (-විපාකස්වභාව) ධම්යෝ යි.

997. කවර ධම්යෝ නො ම විපාක වූවාහු විපාකස්වභාවධම් නො වූවාහු වෙති යත්:

නො ම කුශල වූ අකුශල නො වූ නො ද කම්විපාක වූ යම් ක්‍රියාධම් කෙනෙක් වෙත් ද, සියලු රූපය ද, අසංඛතධාතු (නිවන) ද යන මේ ධම්යෝ නෙව විපාක න විපාකස්වභාව ධම්යෝ යි.

998. කවර ධම්යෝ උපාදින්න - උපාදානීය වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාකුශල ධම්යන්ගේ විපාකයෝ ය, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, කම්ය කළ හෙයින් යම් රූපයකුත් වේ ද, මේ ධම්යෝ උපාදින්න උපාදානීයයෝ යි

999. කතමෙ ධම්මා අනුපාදින්නානුපාදානියා?

සාසවා කුසලාකුසලා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, යෙ ච ධම්මා කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා, යං ච රූපං න කම්මස්ස කතත්තා, ඉමෙ ධම්මා අනුපාදින්නානුපාදානියා.

1000. කතමෙ ධම්මා අනුපාදින්නඅනුපාදානියා?

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනුපාදින්නඅනුපාදානියා.

1001. කතමෙ ධම්මා සඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා?

තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා සඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා.

1002. කතමෙ ධම්මා අසඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා?

සාසවා කුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා අසඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා.

1003. කතමෙ ධම්මා අසඞ්කිලිට්ඨඅසඞ්කිලෙසිකා?

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අසඞ්කිලිට්ඨඅසඞ්කිලෙසිකා

1004. කතමෙ ධම්මා සවිතක්කසවිචාරා?

සවිතක්කසවිචාරභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ විතක්කවිචාරෙ ඨපෙත්වා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සවිතක්කසවිචාරා.

1005. කතමෙ ධම්මා අවිතක්කවිචාරමත්තා?

අවිතක්කවිචාරමත්තභූමියං රූපාවචරෙ අපරියාපන්නෙ විචාරං ඨපෙත්වා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා අවිතක්කවිචාරමත්තා.

999. කවර ධර්මයෝ අනුපාදින්න - උපාදානිය වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාකුශල ධර්මයෝ ය, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, නො ම කුශල වූ අකුශල නො වූ නො ද කර්මවිපාක වූ යම් ක්‍රියාධර්ම කෙනෙකුත් වෙත් ද, කර්මය කළ හෙයින් නො වූ යම් රූපයෙකුත් වේ ද, මේ ධර්මයෝ අනුපාදින්න - උපාදානියයෝ යි.

1000. කවර ධර්මයෝ අනුපාදින්න - අනුපාදානිය වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසඞ්ඛත (-නිබ්බාන) ධාතුව දැයි මේ ධර්මයෝ අනුපාදින්න - අනුපාදානියයෝ යි.

1001. කවර ධර්මයෝ සඞ්කිලිට්ඨ සඞ්කිලෙසික වෙති යත්:

ලෝභ දෝෂ මෝහ යන තුන් අකුශලමූලයෝ ය, තත්සහජෛකස්ථ වූ ක්ලේශයෝ ය, තත්සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, තත්සමුත්ථිත වූ කායකර්ම ය වාක්කර්ම ය මනඃකර්ම ය, මේ ධර්මයෝ සංක්ලිෂ්ටසාංක්ලේශිකයෝ යි.

1002. කවර ධර්මයෝ අසඞ්කිලිට්ඨසඞ්කිලෙසික වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාව්‍යාකෘතධර්මයෝ ය, රූපස්කන්ධ ය වේදනාස්කන්ධ ය සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ ය, මේ ධර්මයෝ අසංක්ලිෂ්ටසාංක්ලේශිකයෝ යි.

1003. කවර ධර්මයෝ අසඞ්කිලිට්ඨ අසඞ්කිලෙසික වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසංඛත (-නිබ්බාන) ධාතුව දැයි මේ ධර්මයෝ අසංක්ලිෂ්ට - අසාංක්ලේශිකයෝ යි.

1004. කවර ධර්මයෝ සවිතක්ක - සවිචාර වෙති යත්:

කාමාවචරයෙහි රූපාවචරයෙහි, අපරියාපන්නයෙහි සවිතර්ක සවිචාර-භූමියෙහි වූ විතර්කවිචාරයන් තබා තත් (-සවිතර්කසවිචාර චිත්තය හා) සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය. මේ ධර්මයෝ සවිතර්ක සවිචාරයෝ යි.

1005. කවර ධර්මයෝ අවිතක්කවිචාරමාත්‍ර වෙති යත්.

රූපාවචරයෙහි අපරියාපන්නයෙහි අවිතර්ක විචාරමාත්‍රභූමියෙහි වූ විචාරය තබා ඒ අවිතර්කවිචාරමාත්‍රචිත්තය හා සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ ය... විඥානස්කන්ධ ය, මේ ධර්මයෝ අවිතර්කවිචාරමාත්‍රයෝ යි

1006. කතමෙ ධම්මා අවිතක්කඅවිචාරා?

අවිතක්කඅවිචාරභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අවිතක්කඅවිචාරා

1007 කතමෙ ධම්මා පීතිසහගතා?

පීතිභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ පීතිං ඨපෙත්වා තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා පීතිසහගතා.

1008. කතමෙ ධම්මා සුඛසහගතා?

සුඛභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ සුඛං ඨපෙත්වා තං සම්පයුත්තො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සුඛසහගතා.

1009. කතමෙ ධම්මා උපෙක්ඛාසහගතා?

උපෙක්ඛාභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ උපෙක්ඛං ඨපෙත්වා තං සම්පයුත්තො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා උපෙක්ඛාසහගතා.

1010. කතමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා?

තීණි සඤ්ඤොජනානි: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො.

1011. තත්ථ කතමා සක්කායදිට්ඨි?

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො. රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං වා අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං. සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං. විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.-

1006. කවර ධර්මයෝ අවිතර්ක - අවිචාර වෙති යත්:

කාමාවචරයෙහි රූපාවචරයෙහි අරූපාවචරයෙහි අපරියාපන්නයෙහි අවිතර්ක - අවිචාරභූමියෙහි වූ වේදනාසකන්ධ ය ... විඥානසකන්ධ ය, සියලු රූපය ද, අසඞ්ඛත (නිබ්බාන) ධාතුව දැයි මේ ධර්මයෝ අවිතර්ක - අවිචාරයෝ සි.

1007. කවර ධර්මයෝ ප්‍රීතිසහගත වෙති යත්:

කාමාවචරයෙහි රූපාවචරයෙහි අපරියාපන්නයෙහි ප්‍රීතිභූමියෙහි වූ, ප්‍රීතිය තබා ඒ (ප්‍රීතිය උපදනා සිත හා) සම්ප්‍රයොග වූ වේදනාසකන්ධ ය... විඥානස්කන්ධ සි. මේ ධර්මයෝ ප්‍රීතිසහගතයෝ සි.

1008. කවර ධර්මයෝ සුඛසහගත වෙති යත්:

කාමාවචරයෙහි රූපාවචරයෙහි අපරියාපන්නයෙහි සුඛභූමියෙහි වූ සුඛය තබා ඒ (සුඛභූමිය) හා සම්ප්‍රයොග වූ සංඥාස්කන්ධ ය සංස්කාර-ස්කන්ධ ය විඥානසකන්ධ සි. මේ ධර්මයෝ සුඛසහගතයෝ සි

1009. කවර ධර්මයෝ උපෙක්ෂාසහගත වෙති යත්:

කාමාවචරයෙහි රූපාවචරයෙහි අරූපාවචරයෙහි අපරියාපන්නයෙහි උපෙක්ෂාභූමියෙහි වූ, උපෙක්ෂාව තබා ඒ (උපෙක්ෂාව උපදනා සිත) හා සම්ප්‍රයොග වූ සංඥාසකන්ධ ය සංස්කාරසකන්ධ ය විඥානසකන්ධ සි. මේ ධර්මයෝ උපෙක්ෂාසහගතයෝ සි.

1010. කවර ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වෙති යත්:

සත්කායදෘෂ්ටි ය විචිකිත්සා ය ශීලව්‍රතපරාමර්ශ ය යන තුන් සංයොජ-නයෝ සි.

1011. එහි සත්කායදෘෂ්ටි කවරේ යත්:

මෙලොවැ අශ්‍රුතවත් පෘථග්ජන තෙමේ ආර්යයන් නො දක්නාසුලු වූයේ ආර්යධර්මයෙහි අකොවිද (අදක්ෂ) වූයේ ආර්යධර්මයෙහි අවිනීත වූයේ, සත්පුරුෂයන් නො දක්නාසුලු වූයේ සත්පුරුෂධර්මයෙහි අකොවිද වූයේ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූයේ රූපය ආත්මයැයි (දෘෂ්ටිවශයෙන්) දකී. (සෙවණ ඇති රුකක් මෙන්) ආත්මය රූපවත් කොට හෝ, (මලෙහි සුවඳ මෙන්) ආත්මයෙහි රූපය හෝ, (කරඬුයෙහි මැණික මෙන්) රූපයෙහි ආත්මය හෝ දකී වේදනාව ආත්මය සි (දෘෂ්ටිදර්ශනයෙන්) දකී. ආත්මය වේදනාවත් කොට හෝ, ආත්මයෙහි වේදනාව හෝ, වේදනා-යෙහි ආත්මය හෝ දකී. සංඥාව ආත්මයයි දකී ආත්මය සංඥාවත් කොට හෝ, ආත්මයෙහි සංඥාව හෝ, සංඥායෙහි ආත්මය හෝ දකී. සංස්කාරයන් ආත්මය සි දකී. ආත්මය සංස්කාරවත් කොට හෝ, ආත්ම-යෙහි සංස්කාරයන් හෝ, සංස්කාරයන්හි ආත්මය හෝ දකී. විඥානය ආත්මය සි දකී. ආත්මය විඥානවත් කොට හෝ, ආත්මයෙහි විඥානය හෝ, විඥානයෙහි ආත්මය හෝ දකී.-

යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං[1] දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො[2] අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො,[3] අයං වුච්චති සක්කායදිට්ඨි.

1012. තත්ථ කතමා විචිකිච්ඡා?

සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති, සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති, සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, අපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචිකිච්ඡති. යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ඡම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො, අයං වුච්චති විචිකිච්ඡා.

1013. තත්ථ කතමො සීලබ්බතපරාමාසො?

ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි වතෙන සුද්ධි සීලබ්බතෙන සුද්ධීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං[1] දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො[2] අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො[3], අයං වුච්චති සීලබ්බතපරාමාසො.

ඉමානි තීණි සංයොජනානි, තදෙකට්ඨා ච කිලෙසා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා.

1014. කතමෙ ධම්මා භාවනාය පහාතබ්බා?

අවසෙසො ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බා.

1015. කතමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා?

කුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා.

---

1 දිට්ඨිවිසූකායිතං - සීමු 1, 2, 3. 2. පටිග්ගාහො - සීමු 3, මජසං, සයා, PTS
3. විපරියාසගාහො - මජසං. විපරියෙසග්ගාහො - සයා, PTS.

මෙබඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිසූකායිකයෙක් දෘෂ්ටිවිෂ්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක්, (දැඩිව) ගැනීමෙක් පිහිටා ගැනීමෙක් (නිත්‍යාදි විසින්) අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ සත්කායදෘෂ්ටි යයි කියනු ලැබේ.

1012. එහි විචිකිත්සා කවර යත්:

ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, නවලොවුතුරා දහම්හි ... අට අරි සඟුන් කෙරෙහි ... ත්‍රිවිධ ශික්ෂායෙහි, (අතීතස්කන්ධාදි) පූර්වාන්තයෙහි, (අනාගතස්කන්ධාදි) අපරාන්තයෙහි, පූර්වාන්ත අපරාන්තයෙහි, ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන්හි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. යම් මෙබඳු වූ සැකයෙක් සැක කරන අයුරෙක් සැකයට පමුණුවන ලද බවෙක් විමතියෙක් විචිකිත්සාවක් ද්වෛළහකයෙක් ද්විධාපථයෙක් සංශයයෙක් අනේකාංශග්‍රාහයෙක් ආසප්පණයෙක් පරිසප්පණයෙක් (අරමුණට) නො බැසගැනීමෙක් චිත්තයාගේ තද බවෙක් මනෝවිලේඛයෙක් වේ ද, මේ විචිකිත්සා යයි කියනු ලැබේ.

1013. එහි ශීලව්‍රතපරාමර්ශය කවරේ යත්:

මෙ සස්නෙන් බැහැර මහණබමුණන්ගේ ශීලයෙන් ශුද්ධි ය, ව්‍රතයෙන් ශුද්ධි ය, ශීලව්‍රතයෙන් ශුද්ධි ය යි යම් මෙබඳු වූ දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිසූකායිකයෙක් දෘෂ්ටිවිෂ්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් ග්‍රාහයෙක් පිහිටා සිටීමෙක් අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ ශීලව්‍රතපරාමර්ශ යයි කියනු ලැබේ.

මේ තුන් සංයෝජනයෝ ය, ඔවුන් හා ප්‍රහාණෛකස්ථ වූ ක්ලේශයෝ ද, ඒ තදෙකස්ථ වූ ලෝභාදි අට කෙලෙසුන් හා සම්ප්‍රයෝග වූ වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, ඒ ලෝභාදිය විසින් උපදවන ලද කායකර්ම ය වාක්කර්ම ය මනඃකර්ම ය, මේ ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ යි.

1014. කවර ධර්මයෝ භාවනායෙන් ප්‍රහාතව්‍ය වෙති යත්:

අවශේෂ වූ ලෝභ ය ද්වේෂ ය මෝහ ය, (ප්‍රහාණවශයෙන්) තදෙකස්ථ වූ ක්ලේශයෝ ද, ඒ කෙලෙසුන් හා සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, තත්සමුට්ඨිත වූ කායකර්ම ය වාක්කර්ම ය මනඃකර්ම යි. මේ ධර්මයෝ භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ යි.

1015. කවර ධර්මයෝ දර්ශනයෙන් - භාවනායෙන් නො ම ප්‍රහාතව්‍ය වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපර්‍යාපන්න වූ කුශලාව්‍යාකෘත ධර්මයෝ ය, වේදනාස්කන්ධ ය .... විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසංඛත (නිර්වාණ) ධාතු දැයි මේ ධර්මයෝ නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ යි.

1016 කතමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා?

තීණි සඤ්ඤොජනානි: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො.

තත්ථ කතමා සක්කායදිට්ඨි? ඉධ අස්සුතවා පුථුජ්ජනො -පෙ- රූපං අත්තතො සමනුපස්සති -පෙ- අයං වුච්චති සක්කායදිට්ඨි.

තත්ථ කතමා විචිකිච්ඡා? සත්ථරි කඞ්ඛති -පෙ- අයං වුච්චති විචිකිච්ඡා.

තත්ථ කතමො සීලබ්බතපරාමාසො? ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි -පෙ- අයං වුච්චති සීලබ්බතපරාමාසො.

ඉමානි තීණි සංයොජනානි තදෙකට්ඨා ච කිලෙසා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා. තීණි සඤ්ඤොජනානි සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා. තදෙකට්ඨො ලොභො දොසො මොහො, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා. තදෙකට්ඨා ච කිලෙසා තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා.

1017. කතමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා?

අවසෙසො ලොභො දොසො මොහො, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා තදෙකට්ඨා ච කිලෙසා තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා.

1018. කතමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා?

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා.

1019. කතමෙ ධම්මා ආචයගාමිනො?

සාසවා කුසලාකුසලා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා ආචයගාමිනො.

1020. කතමෙ ධම්මා අපචයගාමිනො?

චත්තාරො මග්ගා අපරියාපන්නා, ඉමෙ ධම්මා අපචයගාමිනො

1016. කවර ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇතියහ යත්:

සත්කායදෘෂ්ටි ය විචිකිත්සා ය ශීලව්‍රතපරාමර්ශ ය යන තුන් සංයෝජනයෝ යි.

එහි සත්කායදෘෂ්ටි කවරේ යත්: මෙ ලොව්හි අශ්‍රුතවත් පෘථග්ජන තෙමේ ... රූපය ආත්මයයි දකී ... මේ සත්කායදෘෂ්ටි යයි කියනු ලැබේ.

එහි විචිකිත්සා කවර යත්: ශාස්තෘහු කෙරෙහි සැක කෙරෙයි ... මේ විචිකිත්සා යයි කියනු ලැබේ.

එහි ශීලව්‍රතපරාමර්ශය කවරේ යත්: මෙ සස්නෙන් බැහැර මහණ බමුණන්ගේ ශීලයෙන් ශුද්ධිය, ... මේ ශීලව්‍රතපරාමර්ශ යයි කියනු ලැබේ.

මේ තුන් සංයෝජනයෝ ය, තදෙකස්ථ වූ කෙලශයෝ ද, තත්සම්ප්‍රයුක්ත වූ වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, ඒ කෙලෙසුන් විසින් සමුත්ථිත වූ කායකර්ම ය වාක්කර්ම ය මනඃකර්ම ය, යන මේ ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇත්තාහු ය. සක්කායදිට්ඨි ය විචිකිච්ඡා ය සීලබ්බතපරාමාස ය යන තුන් සංයොජනයෝ ය, මේ දහම්හු දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ ය. තදෙකස්ථ වූ ලොභ ය ද්වෙෂ ය මොහ ය, යන මේ දහම්හු දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතුහු ය. තදෙකස්ථ වූ කෙලශයෝ ද, තත්සම්ප්‍රයුක්ත වූ වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, ඒ ලොභාදිය විසින් සමුත්ථිත වූ කායකර්මය වාක්කර්මය මනඃකර්ම ය, මේ දහම්හු දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුකයෝ යි.

1017. කවර දහම්හු භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇතියහ යත්:

අවශේෂ වූ ලොභ ය ද්වෙෂ ය මොහ ය, යන මේ දහම්හු භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතු ඇතියහ. තදේකස්ථ වූ කෙලශයෝ ද, ඒ කෙලෙසුන් හා සම්ප්‍රයුක්ත වූ වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, ඒ ලොභාදිය විසින් සමුත්ථිත වූ කායකර්ම ය වාක්කර්ම ය මනඃකර්ම ය, මේ ධර්මයෝ භාවනායෙන් ප්‍රහාතව්‍ය හෙතුකයෝ යි.

1018. කවර ධර්මයෝ නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යහේතු ඇතියහ යත්:

ඒ ධර්මයන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘත වූ ධර්මයෝ ය, වෙදනාස්කන්ධ සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසංඛතධාතු ද යි මේ ධර්මයෝ නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුකයෝ යි.

1019. කවර දහම්හු ආචයගාමී වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාකුශල ධර්මයෝ ය, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, මේ ධර්මයෝ ආචයගාමීහු ය.

1020. කවර දහම්හු අපචයගාමී වෙති යත්:

අපරියාපන්න වූ සතර මාර්ගයෝ යි. මේ ධර්මයෝ අපචයගාමීහු ය.

1021. කතමෙ ධම්මා නෙව ආචයගාමිනො න අපචයගාමිනො?

කුසලාකුසලානං ධම්මානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, යෙ ච ධම්මා කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නෙව ආචයගාමිනො න අපචයගාමිනො.

1022. කතමෙ ධම්මා සෙඛා[1]?

චත්තාරො මග්ගා අපරියාපන්නා, හෙට්ඨිමානි ච තීණි සාමඤ්ඤඵලානි ඉමෙ ධම්මා සෙඛා.

1023. කතමෙ ධම්මා අසෙඛා[2]?

උපරිට්ඨිමං අරහත්තඵලං, ඉමෙ ධම්මා අසෙඛා.

1024. කතමෙ ධම්මා නෙවසෙඛා නාසෙඛා?

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නෙව සෙඛා නාසෙඛා.

1025. කතමෙ ධම්මා පරිත්තා?

සබ්බෙව කාමාවචරා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා පරිත්තා.

1026. කතමෙ ධම්මා මහග්ගතා?

රූපාවචරා අරූපාවචරා කුසලාබ්‍යාකතා ධම්මා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා මහග්ගතා.

1027. කතමෙ ධම්මා අප්පමාණා?

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අප්පමාණා.

1028. කතමෙ ධම්මා පරිත්තාරම්මණා?

පරිත්තෙ ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා පරිත්තාරම්මණා.

1 සෙක්ඛා - සීමු 1, 2, 3, මජසං සයා PTS.
2. අසෙක්ඛා - සීමු 1, 2, 3, මජසං, සයා, PTS.

1021. කවර දහම්හු නො ම ආචයගාමී නො ද අපචයගාමී වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලධර්මයන් ගේ විපාකයෝ ය, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, නො ම කුශල වූ අකුශල නො වූ නො ද කර්මවිපාක වූ යම් ක්‍රියාධර්ම කෙනෙක් වෙත් ද, සියලු රූපය ද, අසඞ්ඛත (නිර්වාණ) ධාතුව ද යි මේ ධර්මයෝ නො ම ආචයගාමී නො ද අපචයගාමී වෙත්.

1022. කවර දහම්හු ශෛක්ෂ වෙති යත්:

අපරියාපන්න වූ සතරමාර්ගයෝ ද, හෙට්ඨිම වූ තුන් ශ්‍රාමණ්‍යඵලයෝ ද යි මේ ධර්මයෝ ශෛක්ෂයෝ යි.

1023. කවර දහම්හු අශෛක්ෂ වෙති යත්:

මතුයෙහි වූ අර්හත්ඵල ය. මේ ධර්මයෝ අශෛක්ෂ යෝ යි.

1024. කවර ධර්මයෝ නෛව ශෛක්ෂ නාශෛක්ෂ වෙති යත්:

ඒ (ශෛක්ෂාශෛක්ෂ) ධර්මයන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසඞ්ඛතධාතුව ද යි මේ ධර්මයෝ නෛවශෛක්ෂ නාශෛක්ෂයෝ යි.

1025. කවර ධර්මයෝ පරිත්ත වෙති යත්:

සියලු ම කාමාවචර වූ කුශල - අකුශල - අව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ යි. මේ ධර්මයෝ පරිත්තයෝ යි.

1026. කවර ධර්මයෝ මහද්ගත වෙති යත්:

රූපාවචර අරූපාවචර වූ කුශලාව්‍යාකෘතධර්මයෝ ය, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ යි. මේ ධර්මයෝ මහද්ගතයෝ ය.

1027. කවර ධර්මයෝ අප්‍රමාණ වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසඞ්ඛත (නිර්වාණ) ධාතුව ද යි මේ ධර්මයෝ අප්‍රමාණයෝ යි.

1028. කවර ධර්මයෝ පරිත්තාලම්බන වෙති යත්:

පරිත්ත වූ ධර්මයන් අරභයා (-අරමුණු කොට) යම් චිත්තචෛතසික ධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ ධර්මයෝ පරිත්තාලම්බනයෝ යි.

1029. කතමෙ ධම්මා මහග්ගතාරම්මණා?

මහග්ගතෙ ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා මහග්ගතාරම්මණා.

1030. කතමෙ ධම්මා අප්පමාණාරම්මණා?

අප්පමාණෙ ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා අප්පමාණාරම්මණා.

1031. කතමෙ ධම්මා හීනා?

තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා හීනා.

1032. කතමෙ ධම්මා මජ්ඣිමා?

සාසවා කුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා මජ්ඣිමා.

1033. කතමෙ ධම්මා පණීතා?

අපරියාපන්නා මග්ගා ච, මග්ගඵලානි ච, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා පණීතා.

1034. කතමෙ ධම්මා මිච්ඡත්තනියතා?

පඤ්ච කම්මානි ආනන්තරිකානි, යා ච මිච්ඡාදිට්ඨි නියතා, ඉමෙ ධම්මා මිච්ඡත්තනියතා.

1035. කතමෙ ධම්මා සම්මත්තනියතා?

චත්තාරො මග්ගා අපරියාපන්නා, ඉමෙ ධම්මා සම්මත්තනියතා.

1036. කතමෙ ධම්මා අනියතා?

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනියතා

1037. කතමෙ ධම්මා මග්ගාරම්මණා?

අරියමග්ගං ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා මග්ගාරම්මණා.

1029. කවර ධම්හයෝ මහද්ගතාලම්බන වෙති යත්:

මහද්ගත වූ ධම්යන් අරමුණු කොට යම් චිත්තචෛතසික ධම් කෙනෙක් උපදනාහු නම්, මේ ධම්යෝ මහද්ගතාලම්බනයෝ යි.

1030. කවර ධම්යෝ අප්‍රමාණාලම්බන වෙති යත්:

අප්‍රමාණ වූ ධම්යන් අරමුණු කොට යම් චිත්තචෛතසිකධම් කෙනෙක් උපදනාහු නම්, මේ ධම්යෝ අප්‍රමාණාලම්බනයෝ යි.

1031. කවර ධම්යෝ හීන වෙති යත්:

ලොභ ය දෙස ය මොහ ය යන තුන් අකුශලමූලයෝ ය, (සහජ වශයෙන්) තදෙකස්ථ වූ කෙලශයෝ ද, උන් හා සම්ප්‍රයුක්ත වූ වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, තත්සමුත්ථිත වූ කායකම් ය වාක්කම් ය මනඃකම් යි. මේ ධම්යෝ හීනයෝ යි.

1032. කවර ධම්යෝ මධ්‍යම වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාව්‍යාකෘත ධම්යෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ යි. මේ ධම්යෝ මධ්‍යමයෝ යි.

1033. කවර ධම්යෝ ප්‍රණීත වෙති යත්:

අපරියාපන්න වූ මාගීයෝ ද, මාගීඵලයෝ ද, අසඞ්ඛත ධාතුව ද යි. මේ ධම්යෝ ප්‍රණීතයෝ යි.

1034. කවර ධම්යෝ මිථ්‍යාත්වනියත වෙති යත්:

මාතෘවධාදි පඤ්ච ආනන්තරික කම්යෝ ද, යම් නියත මිථ්‍යාදෘෂ්ටියකුත් වේ ද, මේ ධම්යෝ මිථ්‍යාත්වනියතයෝ යි.

1035. කවර ධම්යෝ සම්‍යක්ත්වනියත වෙති යත්:

අපරියාපන්න වූ සතර මාගීයෝ යි. මේ ධම්යෝ සම්‍යක්ත්ව නියතයෝ යි.

1036. කවර ධම්යෝ අනියත වෙති යත්:

ඒ ධම්යන් තබා අවශෙෂ වූ කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘත ධම්යෝ ය, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසඞ්ඛතධාතුව ද යි මේ ධම්යෝ අනියතයෝ යි.

1037. කවර ධම්යෝ මාගීාලම්බන වෙති යත්:

ආය්‍යීමාගීය අරමුණු කොට යම් චිත්තචෛතසිකධම් කෙනෙක් උපදනාහු නම්, මේ ධම්යෝ මාගීාලම්බනයෝ යි

1038. කතමෙ ධම්මා මග්ගහෙතුකා?

අරියමග්ගසමඞ්ගිස්ස මග්ගඞ්ගානි ඨපෙත්වා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා මග්ගහෙතුකා. අරියමග්ගසමඞ්ගිස්ස සම්මාදිට්ඨි මග්ගො චෙව හෙතු ච. සම්මාදිට්ඨිං ඨපෙත්වා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා මග්ගහෙතුකා. අරියමග්ගසමඞ්ගිස්ස අලොභො අදොසො අමොහො, ඉමෙ ධම්මා මග්ගහෙතු. තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා මග්ගහෙතුකා.

1039. කතමෙ ධම්මා මග්ගාධිපතිනො?

අරියමග්ගං අධිපතිං කරිත්වා යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා මග්ගාධිපතිනො. අරියමග්ගසමඞ්ගිස්ස වීමංසාධිපතෙය්‍යං මග්ගං භාවයන්තස්ස වීමංසං ඨපෙත්වා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො, -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා මග්ගාධිපතිනො.

1040. කතමෙ ධම්මා උප්පන්නා?

යෙ ධම්මා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා උප්පන්නා සමුප්පන්නා උට්ඨිතා සමුට්ඨිතා උප්පන්නා උප්පන්නංසෙන සඞ්ගහිතා රූපං[1] වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, ඉමෙ ධම්මා උප්පන්නා

1041. කතමෙ ධම්මා අනුප්පන්නා?

යෙ ධම්මා අජාතා අභූතා අසඤ්ජාතා අනිබ්බත්තා අනභිනිබ්බත්තා අපාතුභූතා අනුප්පන්නා අසමුප්පන්නා අනුට්ඨිතා අසමුට්ඨිතා අනුප්පන්නා අනුප්පන්නංසෙන සඞ්ගහිතා රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, ඉමෙ ධම්මා අනුප්පන්නා.

1042. කතමෙ ධම්මා උප්පාදිනො?

කුසලාකුසලානං ධම්මානං අවිපක්කවිපාකානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, යඤ්ච රූපං කම්මස්ස කතත්තා උප්පජ්ජිස්සති, ඉමෙ ධම්මා උප්පාදිනො.

1043. කතමෙ ධම්මා අතීතා?

යෙ ධම්මා අතීතා නිරුද්ධා විගතා විපරිණතා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා උප්පජ්ජිත්වා විගතා අතීතා අතීතංසෙන සඞ්ගහිතා රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, ඉමෙ ධම්මා අතීතා.

---

2. රූපා - සිමු 2

1038 කවර ධර්මයෝ මාර්ගහෙතුක වෙති යත්:

ආර්‍යමාර්ගසමඞ්ගීහුගේ මාර්ගාඞ්ගයන් තබා ඒ මාර්ගසම්ප්‍රයුක්ත වූ වෙද-නාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය යන මේ ධර්මයෝ මාර්ගහෙතුකයෝ ය, ආර්‍යමාර්ගසමඞ්ගීහුගේ සම්‍යග්දෘෂ්ටිය මාර්ග ද හෙතු ද වෙයි. සම්‍යග්දෘෂ්ටිය තබා තත්සම්ප්‍රයුක්ත වූ වෙදනාස්කන්ධ ය .. විඥානස්කන්ධ ය, යන මේ ධර්මයෝ මාර්ගහෙතුකයෝ ය. ආර්‍යමාර්ගසමඞ්ගීහුගේ අලොභ ය අදොස ය අමොහ ය යන මේ ධර්මයෝ මාර්ගහෙතූහු ය. උන් හා සම්ප්‍රයුක්ත වූ වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය. මේ ධර්මයෝ මාර්ගහෙතුකයෝ යි.

1039 කවර ධර්මයෝ මාර්ගාධිපති වෙති යත්:

ආර්‍යමාර්ගය ආරම්මණාධිපති කොට යම් චිත්තචෛතසිකධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ ධර්මයෝ මාර්ගාධිපතීහු ය. වීමංසාව අධිපති කොට මාර්ගය වඩන ආර්‍යමාර්ගසමඞ්ගීහුගේ වීමංසාව තබා තත්සම්ප්‍රයුක්ත වූ වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, මේ ධර්මයෝ මාර්ගාධිපති වෙත්.

1040. කවර ධර්මයෝ උත්පන්න වෙති යත්:

යම් ධර්ම කෙනෙක් හටගත්තාහු පහළ වූවාහු මොනොවට හටගත්තාහු නිපන්නාහු වෙසෙසින් නිපන්නාහු ප්‍රකට වූවාහු උපන්නාහු වෙසෙසින් උපන්නාහු උත්ථිත වූවාහු සමුත්ථිත වූවාහු උපන්නාහු උපන් කොටසින් ගැණුනාහු ද, ඒ රූප ය වෙදනා ය සංඥා ය සංස්කාර ය විඥාන යි. මේ ධර්මයෝ උත්පන්නයෝ යි.

1041. කවර ධර්මයෝ අනුත්පන්න වෙති යත්:

යම් ධර්ම කෙනෙක් අජාත අභූත අසඤ්ජාත අනිර්වෘත අනභිනිර්වෘත අප්‍රාදුර්භූත අනුත්පන්න අසමුත්පන්න අනුත්ථිත අසමුත්ථිත අනුත්පන්න වූවාහු අනුත්පන්නාංශයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ඒ රූප ය වෙදනා ය සංඥා ය සංස්කාර ය විඥාන යි. මේ ධර්මයෝ අනුත්පන්නයෝ යි.

1042. කවර ධර්මයෝ උත්පාදී (අවශ්‍යයෙන් උපදනා) වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ නො මූ කළ විපාක ඇති කුශලාකුශල ධර්මයන්ගේ විපාකයෝ ය, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, කර්මය කළ හෙයින් යම් රූපයෙකුත් උපදනේ ද, මේ ධර්මයෝ උත්පාදීහ.

1043. කවර ධර්මයෝ අතීත වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ක්ෂණත්‍රය ඉක්මවූවාහු නිරුද්ධ වූවාහු පහව ගියාහු (ප්‍රකෘතිය හැරීමෙන්) විපරිණාමයට ගියාහු අස්තයට ගියාහු අභ්‍යස්තයට ගියාහු ඉපිද පහව ගියාහු ද, අතීත වූවාහු අතීතාංශයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ඒ රූප ය වෙදනා ය සංඥා ය සංස්කාර ය විඥාන යි. මේ ධර්මයෝ අතීතයෝ යි.

1044. කතමෙ ධම්මා අනාගතා?

යෙ ධම්මා අජාතා අභූතා අසඤ්ජාතා අනිබ්බත්තා අනභිනිබ්බත්තා අපාතුභූතා අනුප්පන්නා අසමුප්පන්නා අනුට්ඨිතා අසමුට්ඨිතා අනාගතා අනාගතංසෙන සඞ්ගහිතා රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, ඉමෙ ධම්මා අනාගතා.

1045. කතමෙ ධම්මා පච්චුප්පන්නා?

යෙ ධම්මා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා උප්පන්නා සමුප්පන්නා උට්ඨිතා සමුට්ඨිතා පච්චුප්පන්නා පච්චුප්පන්නංසෙන සඞ්ගහිතා රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, ඉමෙ ධම්මා පච්චුප්පන්නා

1046. කතමෙ ධම්මා අතීතාරම්මණා?

අතීතෙ ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා අතීතාරම්මණා.

1047. කතමෙ ධම්මා අනාගතාරම්මණා?

අනාගතෙ ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා අනාගතාරම්මණා.

1048. කතමෙ ධම්මා පච්චුප්පන්නාරම්මණා?

පච්චුප්පන්නෙ ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා පච්චුප්පන්නාරම්මණා.

1049. කතමෙ ධම්මා අජ්ඣත්තා?

යෙ ධම්මා තෙසං තෙසං සත්තානං අජ්ඣත්තං පච්චත්තං නියකා[1] පාටිපුග්ගලිකා උපාදින්නා රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, ඉමෙ ධම්මා අජ්ඣත්තා.

1050. කතමෙ ධම්මා බහිද්ධා?

යෙ ධම්මා තෙසං තෙසං පරසත්තානං පරපුග්ගලානං අජ්ඣත්තං පච්චත්තං නියකා පාටිපුග්ගලිකා උපාදින්නා රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, ඉමෙ ධම්මා බහිද්ධා.

1051. කතමෙ ධම්මා අජ්ඣත්තබහිද්ධා?

තදුභයං, ඉමෙ ධම්මා අජ්ඣත්තබහිද්ධා

---

1. නියතා - සිමු. 1, 2, 3 මජසං. සතා. PTS

1044. කවර ධර්මයෝ, අනාගත වෙති යත්:

යම් ධර්ම කෙනෙක් අජාත අභූත අසඤ්ජාත අනිර්වෘත අනභිනිර්වෘත අප්‍රාදුර්භූත අනුත්පන්න අසමුත්පන්න අනුත්ථිත අසමුත්ථිත වූවාහු අනාගත වූවාහු අනාගතාංශයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ඒ රූප ය වෙදනා ය සංඥා ය සංස්කාර ය විඥාන යි. මේ ධර්මයෝ අනාගතයෝ යි.

1045. කවර ධර්මයෝ ප්‍රත්‍යුත්පන්න වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ජාත භූත සඤ්ජාත නිර්වෘත අභිනිර්වෘත ප්‍රාදුර්භූත උත්පන්න සමුත්පන්න උත්ථිත සමුත්ථිත වූවාහු ප්‍රත්‍යුත්පන්න වූවාහු ප්‍රත්‍යුත්පන්නාංශයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ඒ රූපයෝ ය වෙදනා ය සංඥා ය සංස්කාරයෝ ය විඥාන යි. මේ ධර්මයෝ ප්‍රත්‍යුත්පන්නයෝ යි.

1046. කවර ධර්මයෝ අතීතාලම්බන වෙති යත්:

(පරිත්ත - මහද්ගත වූ) අතීත ධර්මයන් අරමුණු කොට යම් චිත්ත චෛතසික ධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ ධර්මයෝ අතීතාලම්බනයෝ ය.

1047. කවර ධර්මයෝ අනාගතාලම්බන වෙති යත්:

අනාගත ධර්මයන් අරමුණු කොට යම් චිත්ත චෛතසිකධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ ධර්මයෝ අනාගතාලම්බනයෝ යි.

1048. කවර ධර්මයෝ ප්‍රත්‍යුත්පන්නාලම්බන වෙති යත්:

ප්‍රත්‍යුත්පන්න ධර්මයන් අරමුණු කොට යම් චිත්තචෛතසිකධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ ධර්මයෝ ප්‍රත්‍යුත්පන්නාලම්බනයෝ යි.

1049. කවර ධර්මයෝ අධ්‍යාත්ම වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ඒ සත්ත්වයන්ගේ අධ්‍යාත්ම වූවාහු ප්‍රත්‍යාත්ම වූවාහු (සිය සිය සන්තානෙ උපන්නාහු) නිජක (තමා කෙරෙහි) වූවාහු ප්‍රාතිපෞද්ගලික (වෙන් වෙන් ව පුද්ගලයන්සතු) වූවාහු උපාදින්න (-ශරීරස්ථ) වූවාහු ද, ඒ රූප ය වෙදනා ය සංඥා ය සංස්කාරයෝ ය විඥාන යි. මේ ධර්මයෝ අධ්‍යාත්මයෝ යි.

1050. කවර ධර්මයෝ බාහ්‍ය වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ඒ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ අධ්‍යාත්ම වූවාහු ප්‍රත්‍යාත්ම වූවාහු නිජාත්මයෙහි උපන්නාහු ප්‍රාතිපෞද්ගලික වූවාහු උපාදින්න වූවාහු ද, ඒ රූප - වෙදනා - සංඥා - සංස්කාර - විඥාන යි. මේ ධර්මයෝ බාහ්‍යයෝ යි.

1051 කවර ධර්මයෝ අධ්‍යාත්ම - බාහ්‍ය වෙති යත්:

ඒ (අධ්‍යාත්ම - බාහ්‍ය යන) දෙක ය. මේ ධර්මයෝ අධ්‍යාත්ම බාහ්‍යයෝ යි

1052. කතමෙ ධම්මා අජ්ඣත්තාරම්මණා?

අජ්ඣත්තෙ ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා අජ්ඣත්තාරම්මණා.

1053. කතමෙ ධම්මා බහිද්ධාරම්මණා?

බහිද්ධා ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා බහිද්ධාරම්මණා.

1054. කතමෙ ධම්මා අජ්ඣත්තබහිද්ධාරම්මණා?

අජ්ඣත්තබහිද්ධා ධම්මෙ ආරබ්භ යෙ උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා අජ්ඣත්තබහිද්ධාරම්මණා.

1055. කතමෙ ධම්මා සනිදස්සනසප්පටිඝා?

රූපායතනං, ඉමෙ ධම්මා සනිදස්සනසප්පටිඝා.

1056. කතමෙ ධම්මා අනිදස්සනසප්පටිඝා?

චක්ඛායතනං සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං, ඉමෙ ධම්මා අනිදස්සනසප්පටිඝා.

1057 කතමෙ ධම්මා අනිදස්සනඅප්පටිඝා?

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, යං රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනිදස්සනඅප්පටිඝා.

තිකං.

1058. කතමෙ ධම්මා හෙතු?

තයො කුසලහෙතු තයො අකුසලහෙතු තයො අව්‍යාකතහෙතු නව කාමාවචරහෙතු ඡ රූපාවචරහෙතු ඡ අරූපාවචරහෙතු ඡ අපරියාපන්නහෙතු.

1059. තත්ථ කතමෙ තයො කුසලහෙතු?

අලොභො අදොසො අමොහො.

1060. තත්ථ කතමො අලොභො?

යො අලොභො අලුබ්භනා අලුබ්භිතත්තං අසාරාගො අසාරජ්ජනා අසාරජ්ජිතත්තං අනභිජ්ඣා අලොභො කුසලමූලං, අයං වුච්චති අලොභො.

1052. කවර ධර්මයෝ අධ්‍යාත්මාලම්බන වෙති යත්:

අධ්‍යාත්ම වූ ධර්මයන් අරමුණු කොට යම් චිත්තචෛතසික ධර්මකෙනෙක් උපදනාහු නම්, මේ ධර්මයෝ අධ්‍යාත්මාලම්බනයෝ යි.

1053. කවර ධර්මයෝ බාහ්‍යාලම්බන වෙති යත්:

බාහ්‍ය වූ ධර්මයන් අරමුණු කොට යම් චිත්තචෛතසික ධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ ධර්මයෝ බාහ්‍යාලම්බනයෝ යි.

1054. කවර ධර්මයෝ අධ්‍යාත්ම - බාහ්‍යාලම්බන වෙති යත්:

අධ්‍යාත්ම - බාහ්‍ය වූ ධර්මයන් අරභයා (අරමුණු කොට) යම් චිත්ත-චෛතසික ධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ ධර්මයෝ අධ්‍යාත්ම බාහ්‍යා-ලම්බනයෝ යි.

1055. කවර ධර්මයෝ සනිදර්ශන - සප්‍රතිඝ වෙති යත්:

රූපායතන ය, මේ ධර්මයෝ සනිදර්ශන - සප්‍රතිඝයෝ යි.

1056. කවර ධර්මයෝ අනිදර්ශන - සප්‍රතිඝ වෙති යත්:

චක්ෂුරායතන ය ශ්‍රොත්‍රායතන ය ඝ්‍රාණායතන ය ජිහ්වායතන ය කායා-යතන ය ශබ්දායතන ය ගන්ධායතන ය රසායතන ය ස්ප්‍රෂ්ටව්‍යායතන යි. මේ ධර්මයෝ අනිදර්ශන - සප්‍රතිඝයෝ යි.

1057. කවර ධර්මයෝ අනිදර්ශන - අප්‍රතිඝ වෙති යත්:

වේදනාස්කන්ධ ය සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ ය, අනිදර්ශන - අප්‍රතිඝ වූ ධර්මායතනපර්යාපන්න වූ යම් රූපයකුත් වේ ද, අසඞ්ඛත (නිබ්බාන) ධාතුව ද යි මේ ධර්මයෝ අනිදර්ශන - අප්‍රතිඝයෝ යි.

ත්‍රික නිර්දේශ යි.

1058. කවර ධර්මයෝ හේතු වෙති යත්:

තුන් කුශලහේතු ය තුන් අකුශලහේතු ය තුන් අව්‍යාකෘතහේතු ය නව කාමාවචරහේතු ය ෂඩ් රූපාවචරහේතු ය ෂඩ් අරූපාවචරහේතු ය ෂඩ් අපර්‍යාපන්නහේතු යි.

1059. එහි තුන් කුශලහේතු කවරහ යත්:

අලෝභ ය අද්වේෂ ය අමෝහ යි.

1060. එහි අලෝභ කවරේ යත්:

යම් අලෝභයෙක් අලෝභාකාරයෙක් අලුබ්ධ බවෙක් නො ඇලීමෙක් නො ඇලෙන අයුරෙක් නො ඇලුණු බවෙක් අනභිධ්‍යායෙක් අලෝභ සංඛ්‍යාත කුශලමූලයෙක් වේ ද, මේ අලෝභ ය යි කියනු ලැබේ.

1061 තත්ථ කතමො අදොසො?

යො අදොසො අදුස්සනා අදුස්සිතත්තං මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං අනුද්දයා අනුද්දයනා අනුද්දයිතත්තං හිතෙසිතා අනුකම්පා අව්‍යාපාදො අව්‍යාපජ්ජො අදොසො කුසලමූලං, අයං වුච්චති අදොසො.

1062 තත්ථ කතමො අමොහො?

දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං පුබ්බන්තෙ ඤාණං අපරන්තෙ ඤාණං පුබ්බන්තාපරන්තෙ ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු ඤාණං, යා එවරූපා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අමොහො.

ඉමෙ තයො කුසලහෙතූ.

1063 තත්ථ කතමෙ තයො අකුසලහෙතූ?

ලොභො දොසො මොහො.

1064 තත්ථ කතමො ලොභො?

යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දි නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පලිගෙධො සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා සඤ්ජනනී සිබ්බනී[1] ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසටා ආයූහනී[2] දුතියා පණිධි භවනෙත්ති වනං වනථො සන්ථවො සිනෙහො අපෙක්ඛා පටිබන්ධු ආසා ආසිංසනා ආසිංසිතත්තං[3] රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා[4] ජප්පිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා[5] සාධුකම්‍යතා අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සම්පත්ථනා කාමතණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං[6] බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබලිසං මාරවිසයො තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො අභිජ්ඣා ලොභො අකුසලමූලං, අයං වුච්චති ලොභො.

---

1. සිබ්බිනී, මජසං, PTS. 2. ආයුහිනී, සිමු මජසං
3. ආසිසනා ආසිසිතත්තං, මජසං 4. ජප්පා ජප්පනා, මජසං.
5. පුච්ඡඤ්ජිකතා, මජසං, සිමු 1, 2. පුච්ඡිකතා - සිමු 3, PTS.
6. ඡාදනං, සිමු 1 2, 3, මජසං, සනා ඡන්දනා, PTS.

1061. එහි අද්වේෂ කවරේ යත්:

යම් අද්වේෂයෙක් අද්වේෂාකාරයෙක් අද්විෂට බවෙක් මෛත්‍රියක් මෛත්‍ර්‍යාකාරයෙක් මෛත්‍රී ඇති බවෙක් අනුදයාවෙක් (-රැකීමෙක්) අනුදයාකාරයෙක් අනුදයා ඇති බවෙක් හිතෛෂී බවෙක් අනුකම්පාවෙක් අව්‍යාපාදයෙක් ක්‍රොධදුඃඛය නැති බවෙක් අද්වේෂ සංඛ්‍යාත කුශලමූල-යෙක් වේ ද, මේ අද්වේෂයයි කියනු ලැබේ.

1062. එහි අමෝහ කවරේ යත්:

දුඃඛසත්‍යයෙහි ඥානය දුඃඛසමුදයෙහි ඥානය දුඃඛනිරෝධයෙහි ඥානය දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදායෙහි ඥානය පූර්වාන්තයෙහි ඥානය අපරාන්තයෙහි ඥානය පූර්වාන්තාපරාන්තයෙහි ඥානය ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්ම-යන්හි ඥානය, යන මෙබඳු වූ යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් (අනිත්‍යා දිය) විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් (අනිත්‍යාදීන්ගේ ලක්ෂණවශයෙන්) සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිත බවෙක් කුසල බවෙක් නිපුණ බවෙක් (අනිත්‍යාදීන්ගේ) විභාවනයෙක් චින්තායෙක් උප-පරීක්ෂාවෙක් භූරිප්‍රඥාවෙක් මෙධා (-ධාරණප්‍රඥා) වෙක් පරිණායිකාවක් විදර්ශනාවක් සම්‍යග්ඥානයෙක් (ප්‍රඥා) ප්‍රතොදයෙක් ප්‍රඥාවක් ප්‍රඥෙන්ද්‍රි-යයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥා - ආලෝකයෙක් ප්‍රඥා - අවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යෝතයෙක් ප්‍රඥාරත්නයෙක් අමෝහයෙක් ධර්ම-විචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, මේ අමෝහය යි කියනු ලැබේ.

මේ තුන් කුශලහේතු වෙත්.

1063. එහි තුන් අකුශලහේතු කවරහ යත්:

ලෝභ ය ද්වේෂ ය මෝහ යි.

1064. එහි ලෝභ කවරේ යත්:

යම් රාගයෙක් බලවත් රාගයෙක් අනුනයෙක් (විෂයයන්හි පැමි-ණැවීමෙක්) අනුරෝධයෙක් (-ඇලීමෙක්) නන්දියෙක් නන්දිරාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් ඉච්ඡායෙක් මූර්ඡායෙක් බැසැගෙන සිටීමෙක් ගිජු වීමෙක් හාත්පසින් ගිජු වීමෙක් ඇලීමෙක් පඞ්කයෙක් එජායෙක් මායාවක් (සසර උපදවන) ජනිකාවක් සඤ්ජනනියක් (චුති - පිළිසඳ විසින්) හිවීමෙක් ජාලිනියක් සරිතාවක් විසත්තිකායෙක් සූත්‍ර (-හූ) යෙක් පැතිරීමෙක් ආයූහිනියක් ද්විතීයාවක් ප්‍රණිධියෙක් භවරජ්ජු (-රැහැන)-යෙක් වනයෙක් වනථයෙක් සන්ථවයෙක් ස්නේහයෙක් අපේක්ෂායෙක් ප්‍රතිබන්ධුයෙක් ආශායෙක් ආශංසනයෙක් ආශංසිත බවෙක් රූපාශායෙක් ශබ්දාශායෙක් ගන්ධාශායෙක් රසාශායෙක් ස්ප්‍රෂ්ටව්‍යාශායෙක් ලාභාශායෙක් ධනාශායෙක් පුත්‍රාශායෙක් ජීවිතාශායෙක් ජල්පායෙක් ප්‍රජල්පායෙක් අභි-ජල්පායෙක් ජල්පනාකාරයෙක් ජල්පිත බවෙක් ලොලුප බවෙක් ලොලු-පාකාරයෙක් ලොලුපායිත බවෙක් නගුට සලන බවෙක් සාධු කාම්‍යතා-යෙක් අධර්මරාගයෙක් විෂමලෝභයෙක් නිකාන්තියෙක් කැමැතිවන අයුරෙක් ප්‍රාර්ථනායෙක් රිසි වීමෙක් සම්ප්‍රාර්ථනායෙක් කාමතෘෂ්ණායෙක් භවතෘෂ්ණා යෙක් විභවතෘෂ්ණායෙක් රූප (භව) තෘෂ්ණායෙක් අරූපතෘෂ්ණායෙක් නිරෝධතෘෂ්ණායෙක් රූපයෙහි තෘෂ්ණායෙක් ශබ්දතෘෂ්ණායෙක් ගන්ධ-තෘෂ්ණායෙක් රසතෘෂ්ණායෙක් ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණායෙක් ධර්මතෘෂ්ණායෙක් ඔඝයෙක් යොගයෙක් ග්‍රන්ථයෙක් උපාදානයෙක් (කුශලයන්ගේ) ආවරණ-යෙක් නීවරණයෙක් ඡාදනයෙක් බන්ධනයෙක් උපක්ලේශයෙක් අනුශය-යෙක් (පර්යුත්ථාන-) කුශලවාරය ගැනීමෙක් ලතායෙක් විවිධ ඉච්ඡායෙක් දුඃඛමූලයෙක් දුඃඛනිදානයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබලිශ (-බිලී) යෙක් මාරවිෂයයෙක් තෘෂ්ණානදියක් තෘෂ්ණාජාලයෙක් තෘෂ්ණා ගර්දූලයෙක් තෘෂ්ණාසමුද්‍රයෙක් අභිධ්‍යායෙක් ලොභ - අකුශලමූලයෙක් වේ ද, මේ ලොභ යයි කියනු ලැබේ.

1065. තත්ථ කතමො දොසො?

අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතීති ආඝාතො ජායති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතො ජායති. අට්ඨානෙ වා පන ආඝාතො ජායති. යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති දොසො.

1066. තත්ථ කතමො මොහො?

දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං, පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසංගාහනා අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති මොහො.

ඉමෙ තයො අකුසලහෙතූ.

1067. තත්ථ කතමෙ තයො අව්‍යාකතහෙතූ?

කුසලානං වා ධම්මානං විපාකතො කිරියාව්‍යාකතෙසු වා ධම්මෙසු අලොභො අදොසො අමොහො. ඉමෙ තයො අව්‍යාකතහෙතූ.

1068. තත්ථ කතමෙ නව කාමාවචරහෙතූ?

තයො කුසලහෙතූ, තයො අකුසලහෙතූ, තයො අව්‍යාකතහෙතූ. ඉමෙ නව කාමාවචරහෙතූ.

1069. තත්ථ කතමෙ ඡ රූපාවචර හෙතූ?

තයො කුසලහෙතූ, තයො අව්‍යාකතහෙතූ. ඉමෙ ඡ රූපාවචරහෙතූ.

1070. තත්ථ කතමෙ ඡ අරූපාවචරහෙතූ?

තයො කුසලහෙතූ, තයො අව්‍යාකතහෙතූ. ඉමෙ ඡ අරූපාවචරහෙතූ.

1065. එහි ද්වේෂය කවරේ යත්:

'මට අවැඩ කෙළේ'යි ආඝාත උපදී. 'මට අවැඩ කෙරෙයි' ආඝාත උපදී. 'මට අවැඩ කරන්නේ'යි ආඝාත උපදී. 'මාගේ ප්‍රිය මනාපය හට අනර්ථ කෙළේ ය ... දුන් අනර්ථ කෙරෙයි ... මතු අනර්ථ කරන්නේ ය'යි ආඝාත උපදී. 'මාගේ අප්‍රිය අමනාපය හට අර්ථ කෙළේ ය ... අර්ථ කෙරෙයි ... අර්ථ කරන්නේ ය' යි ආඝාත උපදී. යම් අස්ථානයෙහි ද ආඝාත උපදී. යම් මෙබඳු චිත්තයාගේ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් දෙෂයෙක් ප්‍රදෙෂයෙක් සම්ප්‍රදෙෂයෙක් චිත්තයාගේ ව්‍යාපන්න බවෙක් මනස්ප්‍රදෙෂයෙක් ක්‍රොධයෙක් කිපෙන අයුරෙක් කිපුණු බවෙක් දෙෂයෙක් දූෂණාකාරයෙක් දූෂිත බවෙක්, ප්‍රකෘතිය හැරීමෙක් ප්‍රකෘතිය හරන අයුරෙක් ප්‍රකෘතිය හල බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩ බවෙක් නො පිරිපුන් වචන ඇති බවෙක් චිත්තයාගේ අනත්තමන (-නො සතුටු) භාවයෙක් වේ ද, මේ ද්වේෂ යයි කියනු ලැබේ.

1066. එහි මෝහය කවරේ යත්:

දුඃඛසත්‍යයෙහි නො දැනීම දුඃඛසමුදයෙහි නො දැනීම දුඃඛනිරොධයෙහි නො දැනීම දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදයෙහි නො දැනීම, පූර්වාන්තයෙහි නො දැනීම අපරාන්තයෙහි නො දැනීම පූර්වාන්තාපරාන්තයෙහි නො දැනීම, ඉදම්ප්‍රත්‍යතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි නො දැනීම, යන යම් මෙබඳු වූ අඥානයෙක් අදර්ශනයෙක් අනභිසමයෙක් අනනුබොධයෙක් අසම්බොධයෙක් අප්‍රතිවෙධයෙක් (අනිත්‍යාදි සාමාන්‍ය හෙයින්) මොනොවට නො ගැනීමෙක් හාත්පසින් නො ගැනීමෙක් සම ව නො දැකීමෙක් (ධර්මස්වභාවය) නො දැකීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් දුර්මෙධ්‍යයෙක් බාල බවෙක් අසම්ප්‍රජ්ඥනයෙක් මොහයෙක් ප්‍රමොහයෙක් සම්මොහයෙක් අවිද්‍යාවක් අවිද්‍යෞඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යාපර්යුත්‍ථානයෙක් අවිද්‍යාලඞ්ගියෙක් මොහ - අකුශලමූලයෙක් වේ ද, මේ මොහ යයි කියනු ලැබේ.

මේ තුන් අකුශල හේතු යි.

1067. එහි තුන් අව්‍යාකෘතහේතු කවරහ යත්:

කුශලධර්මයන්ගේ විපාක හෙයින් හෝ ක්‍රියා - අව්‍යාකෘත ධර්මයන්හි හෝ අලොභ ය අදෙස ය අමොහය යි. මොහු තුන් අව්‍යාකෘත හේතු යි.

1068. එහි නව කාමාවචරහේතු කවරහ යත්:

තුන් කුසලහේතු ය තුන් අකුසලහෙතු ය තුන් අව්‍යාකතහේතු යි. මොහු නව කාමාවචර හේතු යි.

1069. එහි සදි රූපාවචරහේතු කවරහ යත්:

තුන් කුසලහේතු ය තුන් අව්‍යාකතහේතු යි. මොහු සදි රූපාවචර-හේතු යි.

1070. එහි සදි අරූපාවචරහේතු කවරහ යත්:

තුන් කුසලහේතු ය තුන් අව්‍යාකතහේතු යි. මොහු සදි අරූපාවචරහේතු යි.

1071. තත්ථ කතමෙ ඡ අපරියාපන්නහෙතූ?

තයො කුසලහෙතූ, තයො අව්‍යාකතහෙතූ, ඉමෙ ඡ අපරියාපන්නහෙතූ.

1072. තත්ථ කතමෙ තයො කුසලහෙතූ?
අලොභො අදොසො අමොහො.

1073. තත්ථ කතමො අලොභො?

යො අලොභො අලුබ්භනා අලුබ්භිතත්තං අසාරාගො අසාරජ්ජනා අසාරජ්ජිතත්තං අනභිජ්ඣා අලොභො කුසලමූලං, අයං වුච්චති අලොභො.

1074. තත්ථ කතමො අදොසො?

යො අදොසො අදුස්සනා අදුස්සිතත්තං -පෙ- අව්‍යාපාදො අව්‍යාපජ්ජො අදොසො කුසලමූලං, අයං වුච්චති අදොසො.

1075. තත්ථ කතමො අමොහො?

දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං පුබ්බන්තෙ ඤාණං අපරන්තෙ ඤාණං පුබ්බන්තාපරන්තෙ ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු ඤාණං, යා එවරූපා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, අයං වුච්චති අමොහො.

ඉමෙ තයො කුසලහෙතූ.

1076. තත්ථ කතමෙ තයො අව්‍යාකතහෙතූ?

කුසලානං ධම්මානං විපාකතො අලොභො අදොසො අමොහො, ඉමෙ තයො අව්‍යාකතහෙතූ.

ඉමෙ ඡ අපරියාපන්නහෙතූ.

ඉමෙ ධම්මා හෙතූ.

1077. කතමෙ ධම්මා න හෙතූ?

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො සබ්බඤ්ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න හෙතූ.

1071. එහි ෂඩ් අපරියාපන්නහේතු කවරහ යත්:

තුන් කුසලහේතු ය, තුන් අව්‍යාකතහේතු සි. මොහු ෂඩ් අපරියාපන්නහෙතු සි.

1072. එහි තුන් කුශලහේතු කවරහ යත්:

අලෝභ ය අදෝස ය අමෝහ සි.

1073. එහි අලෝභය කවරේ යත්:

යම් අලොභයෙක් අලොභාකාරයෙක් අලුබ්ධ බවෙක් අසංරාගයෙක් අසංරක්තාකාරයෙක් අසංරක්ත බවෙක් අනභිධ්‍යාවක් අලොභ - කුශලමූලයෙක් වේ ද, මේ අලොභ සි කියනු ලැබේ.

1074. එහි අදෝසය කවරේ යත්:

යම් අදොෂයෙක් අදූෂ්‍යාකාරයෙක් අදූෂිත බවෙක් ... අව්‍යාපාදයෙක් නිදුක් බවෙක් අදොෂ - කුශලමූලයෙක් වේ ද, මේ අදෝස යැයි කියනු ලැබේ.

1075. එහි අමෝහය කවරේ යත්:

දුඃඛසත්‍යයෙහි ඥානය දුඃඛසමුදයෙහි ඥානය දුඃඛනිරොධයෙහි ඥානය දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාවෙහි ඥානය පූර්වාන්තයෙහි ඥානය අපරාන්තයෙහි ඥානය පූර්වාන්තාපරාන්තයෙහි ඥානය ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන්හි ඥානය, යන මෙබඳු වූ යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් විචයයෙක් ප්‍රවිචයයෙක් ධර්මවිචයයෙක් සංලක්ෂණයෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කෞශල්‍යයෙක් නෛපුණ්‍යයෙක් විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂාවෙක් භූරිප්‍රඥයෙක් ධාරණප්‍රඥායෙක් පරිණායිකාවක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් ප්‍රතොදයෙක්, ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥා - ආලොකයෙක් ප්‍රඥා - අවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් මාර්ගාඞ්ගයෙක් මාර්ගපර්යාපන්නයෙක් වේ ද, මේ අමොහ සි කියනු ලැබේ.

මොහු තුන් කුශල හේතු සි.

1076. එහි තුන් අව්‍යාකෘතහේතු කවරහ යත්:

කුශලධර්මයන්ගේ විපාක හෙයින් අලොභ ය අදොස ය අමොහ ය, යන මොහු තුන් අව්‍යාකෘතහෙතු සි.

මොහු සදෙන අපරියාපන්නහෙතු සි.

මේ ධර්මයෝ හේතු නම් වෙත්.

1077. කවර ධර්මයෝ නහෙතු (හේතු නො වූවාහු) වෙති යත්:

ඒ (හෙතු) ධර්මයන් තබා අවශෙෂ කාමාවචර - රූපාවචර - අරූපාවචර - අපරියාපන්න වූ කුශල - අකුශල - අව්‍යාකෘත ධර්මයෝ ය, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසංඛත (නිර්වාණ) ධාතුව ද, යන මේ ධර්මයෝ නහේතු නම් වෙත්.

1078. කතමෙ ධම්මා සහෙතුකා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සහෙතුකා: වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සහෙතුකා.

1079. කතමෙ ධම්මා අහෙතුකා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා අහෙතුකා: වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අහෙතුකා.

1080. කතමෙ ධම්මා හෙතුසම්පයුත්තා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා: වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා හෙතුසම්පයුත්තා.

1081. කතමෙ ධම්මා හෙතුවිප්පයුත්තා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා: වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා හෙතුවිප්පයුත්තා.

1082. කතමෙ ධම්මා හෙතු චෙව සහෙතුකා ච?

ලොභො මොහෙන හෙතු චෙව සහෙතුකො ච, මොහො ලොභෙන හෙතු චෙව සහෙතුකො ච, දොසො මොහෙන හෙතු චෙව සහෙතුකො ච, මොහො දොසෙන හෙතු චෙව සහෙතුකො ච. අලොභො අදොසො අමොහො තෙ අඤ්ඤමඤ්ඤං හෙතු චෙව සහෙතුකා ච. ඉමෙ ධම්මා හෙතු චෙව සහෙතුකා ච.

1083. කතමෙ ධම්මා සහෙතුකා චෙව න ච හෙතු?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සහෙතුකා තෙ ධම්මෙ ඨපෙත්වා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සහෙතුකා චෙව න ච හෙතු.

1084. කතමෙ ධම්මා හෙතු චෙව හෙතුසම්පයුත්තා ච?

ලොභො මොහෙන හෙතු චෙව හෙතුසම්පයුත්තො ච, මොහො ලොභෙන හෙතු චෙව හෙතුසම්පයුත්තො ච, දොසො මොහෙන හෙතු චෙව හෙතුසම්පයුත්තො ච, මොහො දොසෙන හෙතු චෙව හෙතුසම්පයුත්තො ච. අලොභො අදොසො අමොහො තෙ අඤ්ඤමඤ්ඤං හෙතු චෙව හෙතුසම්පයුත්තා ච. ඉමෙ ධම්මා හෙතු චෙව හෙතුසම්පයුත්තා ච.

1078. කවර ධර්මයෝ සහේතුක වෙති යත්:

ඒ හේතුධර්මයන්ගෙන් යම් ධර්ම කෙනෙක් සහේතුක වෙත් ද, වේදනා ස්කන්ධය ... විඥානස්කන්ධය යන මේ ධර්මයෝ සහේතුකයෝ යි.

1079. කවර ධර්මයෝ අහේතුක වෙති යත්:

ඒ හේතුධර්මයන්ගෙන් යම් ධර්ම කෙනෙක් අහේතුක වෙත් ද, වේදනා ස්කන්ධය ... විඥානස්කන්ධය, සියලු රූපය ද, අසංඛතධාතුව ද, යන මේ ධර්මයෝ අහේතුකයෝ යි.

1080. කවර ධර්මයෝ හේතු සම්ප්‍රයුක්ත වෙති යත්:

ඒ හේතුධර්මයන්ගෙන් යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, වේදනාස්කන්ධය ... විඥානස්කන්ධය, යන මේ ධර්මයෝ හේතුසම්ප්‍රයුක්ත යෝ යි.

1081. හේතු විප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

ඒ හේතුධර්මයන්ගෙන් යම් ධර්මකෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, වේදනා ස්කන්ධය ... විඥානස්කන්ධය, සියලු රූපය ද, අසංඛතධාතුව ද, යන මේ ධර්මයෝ හේතුවිප්‍රයුක්තයෝ යි.

1082. කවර ධර්මයෝ හේතු ද සහේතුක ද වෙති යත්:

ලෝභය මෝහය සමග වූයේ හේතු ද සහේතුක ද වෙයි, මෝහය ලෝභය සමග වූයේ හේතු ද සහේතුක ද වෙයි, ද්වේෂය මෝහය සමග වූයේ හේතු ද සහේතුක ද වෙයි, මෝහය ද්වේෂය සමග වූයේ හේතු ද සහේතුක ද වෙයි අලෝභ ය අද්වේෂ ය අමෝහ ය යන මොහු ඔවුනොවුන් හේතු වූවාහු ද සහේතුක වූවාහු ද වෙත්. මේ ධර්මයෝ හේතු ද සහේතුක ද වෙත්.

1083. කවර ධර්මයෝ සහේතුක ද නො ද හේතු ද වෙති යත්:

ඒ හේතුධර්මයන්ගෙන් යම් ධර්ම කෙනෙක් සහේතුක වූවාහු ද, ඒ ධර්මයන් තබා වේදනාස්කන්ධය ... විඥානස්කන්ධය යන මේ ධර්මයෝ සහේතුක ද නො ද හේතු වූවාහු ද වෙත්.

1084. කවර ධර්මයෝ, හේතු ද හේතු සම්ප්‍රයුක්ත ද වෙති යත්:

ලෝභය මෝහය සමග වූයේ හේතු ද හේතුසම්ප්‍රයුක්ත ද වෙයි, මෝහය ලෝභය සමග වූයේ හේතු ද හේතුසම්ප්‍රයුක්ත ද වෙයි, ද්වේෂය මෝහය සමග වූයේ හේතු ද හේතුසම්ප්‍රයුක්ත ද වෙයි, මෝහය ද්වේෂය සමග වූයේ හේතු ද හේතුසම්ප්‍රයුක්ත ද වෙයි. අලෝභ ය අද්වේෂ ය අමෝහ ය යන මොහු ඔවුනොවුන් හේතු ද හේතුසම්ප්‍රයුක්ත ද වෙත්. මේ ධර්මයෝ හේතු ද හේතු සම්ප්‍රයුක්ත ද වෙත්.

1085. කතමෙ ධම්මා හෙතුසම්පයුත්තා චෙව න ච හෙතූ?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා තෙ ධම්මෙ ඨපෙත්වා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා හෙතුසම්පයුත්තා චෙව න ච හෙතූ.

1086. කතමෙ ධම්මා න හෙතූ සහෙතුකා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා න හෙතූ සහෙතුකා: වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා න හෙතූ සහෙතුකා.

1087. කතමෙ ධම්මා න හෙතූ අහෙතුකා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා න හෙතූ අහෙතුකා: වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න හෙතූ අහෙතුකා.

හෙතුගොච්ඡකං.

1088. කතමෙ ධම්මා සප්පච්චයා?

පඤ්චක්ඛන්ධා: රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සප්පච්චයා.

1089. කතමෙ ධම්මා අප්පච්චයා?

අසඞ්ඛතා ධාතු, ඉමෙ ධම්මා අප්පච්චයා.

1090. කතමෙ ධම්මා සඞ්ඛතා?

යෙව තෙ ධම්මා සප්පච්චයා, තෙව තෙ ධම්මා සඞ්ඛතා.

1091. කතමෙ ධම්මා අසඞ්ඛතා?

යො එව සො ධම්මො අප්පච්චයො සො එව සො ධම්මො අසඞ්ඛතො

1092. කතමෙ ධම්මා සනිදස්සනා?

රූපායතනං, ඉමෙ ධම්මා සනිදස්සනා

1093. කතමෙ ධම්මා අනිදස්සනා?

චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, වෙදනාක්ඛන්ධො, -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, යඤ්ච රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනිදස්සනා.

1094 කතමෙ ධම්මා සප්පටිඝා?

චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, ඉමෙ ධම්මා සප්පටිඝා.

1085. කවර ධර්මයෝ හේතුසම්ප්‍රයුක්ත ද නො ද හේතු ද වෙති යත්:

ඒ හේතුධර්මයන්ගෙන් යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් තබා වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය යන මේ ධර්මයෝ හේතුසම්ප්‍රයුක්ත ද නො ද හේතු ද වෙත්.

1086. කවර ධර්මයෝ න හේතු සහේතුක වෙති යත්:

ඒ හේතුධර්මයන්ගෙන් යම් ධර්ම කෙනෙක් හේතු නො වැ සහේතුක වූවාහු ද, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය යන මේ ධර්මයෝ න හේතු සහේතුකයෝ යි.

1087. කවර ධර්මයෝ න හේතු අහේතුක වෙති යත්:

ඒ හේතුධර්මයන්ගෙන් යම් ධර්ම කෙනෙක් හේතු නො වැ අහේතුක වූවාහු ද, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසංඛත-ධාතුව ද, යන මේ ධර්මයෝ න හේතු අහේතුකයෝ යි

හේතුගොච්ඡකය යි.

1088. කවර, ධර්මයෝ සප්‍රත්‍යය වෙති යත්:

පඤ්චස්කන්ධයෝ යැ: රූපස්කන්ධ ය වේදනාස්කන්ධ ය සංඥාස්කන්ධ ය සංස්කාරස්කන්ධ ය විඥානස්කන්ධ යි. මේ ධර්මයෝ සප්‍රත්‍යයෝ යි.

1089. කවර ධර්මයෝ අප්‍රත්‍යය වෙති යත්:

අසංඛත (නිබ්බාන) ධාතුව ය. මේ ධර්මයෝ අප්‍රත්‍යයෝ යි.

1090. කවර ධර්මයෝ සංඛත වෙති යත්:

ඒ යම් ම ධර්ම කෙනෙක් සප්‍රත්‍යයෝ ද, එ ම ධර්මයෝ සංඛතයෝ යි.

1091. කවර ධර්මයෝ අසංඛත වෙති යත්:

ඒ යම් ම ධර්මයෙක් අප්‍රත්‍යය වේ ද, එ ම ධර්මය අසංඛත යි.

1092. කවර, ධර්මයෝ සනිදර්ශන වෙති යත්:

රූපායතන ය මේ ධර්මයෝ සනිදර්ශනයෝ යි.

1093. කවර ධර්මයෝ අනිදර්ශන වෙති යත්:

චක්ෂුරායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන ය, වේදනාස්කන්ධ ය ... විඥාන-ස්කන්ධ ය, අනිදර්ශන අප්‍රතිඝ වූ ධර්මායතනපර්යාපන්න වූ යම් රූපයෙකුත් වේ ද, අසංඛතධාතුව ද, යන මේ ධර්මයෝ අනිදර්ශනයෝ යි.

1094. කවර ධර්මයෝ සප්‍රතිඝ වෙති යත්:

චක්ෂුරායතන ය ... ස්ප්‍රෂ්ටව්‍යායතන ය, යන මේ ධර්මයෝ සප්‍රතිඝයෝ යි.

1095. කතමෙ ධම්මා අප්පටිඝා?

වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, යං ච රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අප්පටිඝා.

1096. කතමෙ ධම්මා රූපිනො?

චත්තාරො ච මහාභූතා චතුන්නං ච මහාභූතානං උපාදාය රූපං, ඉමෙ ධම්මා රූපිනො.

1097. කතමෙ ධම්මා අරූපිනො?

වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අරූපිනො.

1098. කතමෙ ධම්මා ලොකියා?

සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා ලොකියා.

1099. කතමෙ ධම්මා ලොකුත්තරා?

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා ලොකුත්තරා.

1100. කතමෙ ධම්මා කෙනචි විඤ්ඤෙය්‍යා කෙනචි න විඤ්ඤෙය්‍යා?

යෙ තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා. යෙවා පන තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා.

1095. කවර ධර්මයෝ අප්‍රතිඝ වෙති යත්:

වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, අනිදර්ශන අප්‍රතිඝ වූ ධර්මායතනයෙහි ඇතුළු වූ යම් රූපයෙකුත් වේ ද, අසංඛතධාතුව ද, යන මේ ධර්මයෝ අප්‍රතිඝයෝ යි.

1096. කවර ධර්මයෝ රූපී වෙති යත්:

සතර මහාභූතයෝ ද, සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද, යන මේ ධර්මයෝ රූපී වෙත්.

1097. කවර ධර්මයෝ අරූපී වෙති යත්:

වේදනාස්කන්ධය ... විඥානස්කන්ධය, අසංඛතධාතුව ද, යන මේ ධර්මයෝ අරූපී වෙත්.

1098. කවර ධර්මයෝ ලෞකික වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ ආස්‍රව සහිත වූ කුශලාකුශල අව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධය ... විඥානස්කන්ධය, යන මේ ධර්මයෝ ලෞකිකයෝ යි.

1099. කවර ධර්මයෝ ලෝකෝත්තර වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසංඛතධාතුව ද, යන මේ ධර්මයෝ ලෝකෝත්තරයෝ යි.

1100. කවර ධර්මයෝ චක්ෂුරාදි කිසි විඥානයෙකින් දතයුතු ද කිසි විඥානයකින් නො දතයුතු ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් චක්ෂුර්විඥානයෙන් දත යුත්තාහු නම්, ඒ ධර්මයෝ ශ්‍රොත්‍රවිඥානයෙන් නො දත යුත්තාහ. යළි යම් ධර්ම කෙනෙක් ශ්‍රොත්‍ර-විඥානයෙන් දතයුත්තාහු නම්, ඒ ධර්මයෝ චක්ෂුර්විඥානයෙන් නො දත යුත්තාහ.

යම් ධර්ම කෙනෙක් චක්ෂුර්විඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ඝ්‍රාණවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ඝ්‍රාණවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ චක්ෂුර්විඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් චක්ෂුර්විඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ජිහ්වාවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ජිහ්වාවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ චක්ෂුර්විඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් චක්ෂුර්විඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ කායවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් කායවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ චක්ෂුර්විඥෙය නො වෙත්.

යෙ තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා යෙ වා පන තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා යෙ වා පන තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා.. යෙ වා පන තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා.

යම් ධර්ම කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ඝ්‍රාණවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ඝ්‍රාණවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ශ්‍රොත්‍රවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ජිහ්වා-විඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ජිහ්වාවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ශ්‍රොත්‍රවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ කායවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් කායවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ශ්‍රොත්‍රවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ චක්ෂුර්-විඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් චක්ෂුර්විඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ශ්‍රොත්‍රවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ඝ්‍රාණවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ජිහ්වා-විඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ජිහ්වාවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ඝ්‍රාණවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ඝ්‍රාණවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ කායවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් කායවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ඝ්‍රාණවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ඝ්‍රාණවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ චක්ෂුර්විඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් චක්ෂුර්විඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ඝ්‍රාණවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ඝ්‍රාණවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ශ්‍රොත්‍රවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ඝ්‍රාණවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ජිහ්වාවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ කාය-විඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් කායවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ජිහ්වාවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ජිහ්වාවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ චක්ෂුර්-විඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් චක්ෂුර්විඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ජිහ්වාවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් ජිහ්වාවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ශ්‍රොත්‍ර-විඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ජිහ්වාවිඥෙය නො වෙත්

යම් ධර්ම කෙනෙක් ජිහ්වාවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ඝ්‍රාණවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ඝ්‍රාණවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ජිහ්වාවිඥෙය නො වෙත්.

යෙ තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා චක්ඛුවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා සොතවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා ඝානවිඤ්ඤෙය්‍යා න තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා.

යෙ තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා. යෙ වා පන තෙ ධම්මා ජිව්හාවිඤ්ඤෙය්‍යා, න තෙ ධම්මා කායවිඤ්ඤෙය්‍යා.

ඉමෙ ධම්මා කෙහචි විඤ්ඤෙය්‍යා කෙහචි න විඤ්ඤෙය්‍යා.

## චුල්ලන්තරදුකං.

1101. කතමෙ ධම්මා ආසවා?

චත්තාරො ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො.

1102. තත්ථ කතමො කාමාසවො?

යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං, අයං වුච්චති කාමාසවො.

1103. තත්ථ කතමො භවාසවො?

යො භවෙසු භවච්ඡන්දො භවරාගො භවනන්දි භවතණ්හා භවසිනෙහො භවපරිළාහො භවමුච්ඡා භවජ්ඣොසානං, අයං වුච්චති භවාසවො.

1104. තත්ථ කතමො දිට්ඨාසවො?

සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මණාති වා නෙව හොති න නහොති තථාගතො පරම්මණාති වා, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො, අයං වුච්චති දිට්ඨාසවො. සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨාසවො.

යම් ධර්ම කෙනෙක් කායවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ චක්ෂුර්විඥාන-යෙන් නො දත යුත්තාහ. යළි යම් ධර්ම කෙනෙක් චක්ෂුර්විඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ කායවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් කායවිඥානයෙන් දත යුත්තාහු නම්, ඒ ධර්මයෝ ශ්‍රොත්‍රවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ කායවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් කායවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ඝ්‍රාණවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ඝ්‍රාණවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ කායවිඥෙය නො වෙත්.

යම් ධර්ම කෙනෙක් කායවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ ජිහ්වාවිඥෙය නො වෙති. යළි යම් ධර්ම කෙනෙක් ජිහ්වාවිඥෙය වෙත් නම්, ඒ ධර්මයෝ කායවිඥෙය නො වෙත්.

මේ ධර්මයෝ (චක්ෂුරාදි) කිසි විඥානයකින් දත යුත්තාහු, කිසි විඥාන-යකින් නො දත යුත්තාහු වෙත්.

චූලන්තරදුකය යි.

1101. කවර ධර්මයෝ ආස්‍රව වෙති යත්:

ආස්‍රවයෝ සතර දෙනෙකි: කාමාස්‍රව ය භවාස්‍රව ය දෘෂ්ට්‍යාස්‍රව ය අවිද්‍යාස්‍රව යි.

1102. එහි කාමාස්‍රව කවරේ යත්:

පඤ්ච කාමගුණයෙහි යම් කාම සඞ්ඛ්‍යාත ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණාවෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාම මූර්ච්ඡාවෙක් කාමයන්හි බැසගෙන සිටීමෙක් වේ ද, මේ කාමාස්‍රව යයි කියනු ලැබේ.

1103. එහි භවාස්‍රව කවරේ යත්:

රූපාරූපභවයන්හි (ප්‍රාර්ථනා වශයෙන් පැවැති) යම් භවච්ඡන්දයෙක් භවරාගයෙක් භවනන්දියෙක් භවතෘෂ්ණාවෙක් භවස්නෙහයෙක් භවපරි-දාහයෙක් භවමූර්ච්ඡාවෙක් භවයන්හි බැසගෙන සිටීමෙක් වේ ද, මේ භවාස්‍රව යයි කියනු ලැබේ.

1104. එහි දෘෂ්ට්‍යාස්‍රව කවරේ යත්:

ස්කන්ධ සඞ්ඛ්‍යාත ලෝකය ශාශ්වත යයි හෝ, ලෝකය අශාශ්වත යයි හෝ, ලෝකය අන්තවත් යයි හෝ, ලෝකය අනන්තවත් යයි හෝ, එ ම ජීව ය එ ම ශරීර යයි හෝ, ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ, තථාගත (-සත්ත්වයා) මරණින් මතුයෙහි වෙයි හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි නො වෙයි හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි වන්නේත් නො වන්නේත් වේ යයි හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි නො ම වෙයි නො වන්නේ නො වේ යයි හෝ, මෙබඳු වූ යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටි ගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිලොමයෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් (දැඩි වූ) ග්‍රාහයෙක් පිහිටා ගැනීමෙක් අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්යාසග්‍රාහයෙක් වේ ද, මේ දෘෂ්ට්‍යාස්‍රව යයි කියනු ලැබේ.

1105. තත්ථ කතමො අවිජ්ජාසවො?

දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසංගාහනා අපරියොගාහනා අසම්පෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති අවිජ්ජාසවො.

ඉමෙ ධම්මා ආසවා.

1106. කතමෙ ධම්මා නො ආසවා?

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො ආසවා.

1107. කතමෙ ධම්මා සාසවා?

කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සාසවා.

1108. කතමෙ ධම්මා අනාසවා?

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනාසවා.

1109. කතමෙ ධම්මා ආසවසම්පයුත්තා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා ආසවසම්පයුත්තා.

1110. කතමෙ ධම්මා ආසවවිප්පයුත්තා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො සබ්බඤ්ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා ආසවවිප්පයුත්තා.

1111. කතමෙ ධම්මා ආසවා චෙව සාසවා ච?

තෙයෙව ආසවා ආසවා චෙව සාසවා ච.

1105. එහි අවිද්‍යාස්‍රව කවරෙ යත්:

දුඃඛසත්‍යයෙහි නො දැනීම දුඃඛසමුදයෙහි නො දැනීම දුඃඛනිරොධයෙහි නො දැනීම දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදායෙහි නො දැනීම පූර්වාන්තයෙහි නො දැනීම අපරාන්තයෙහි නො දැනීම පූර්වාන්තාපරාන්තයෙහි නො දැනීම ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන්හි නො දැනීම ය යන යම් මෙබඳු වූ නො දැනීමෙක් අදර්ශනයෙක් අනභිසමයෙක් අනනුබොධයෙක් අසම්බොධයෙක් අප්‍රතිවෙධයෙක් අසඞ්ගාහනයෙක් හාත්පසින් නො බැසගැනීමෙක් සම ව නො දැකීමෙක් (ධර්මස්වභාවය) ප්‍රත්‍යවෙක්ෂණය නො කිරීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් (චිත්තසන්තානයාගේ) අපවිත්‍ර බවෙක් බාල බවෙක් අසම්ප්‍රජන්‍යයෙක් මෝහයෙක් බලවත් මෝහයෙක් හාත්පසින් මුලාවීමෙක් අවිද්‍යායෙක් අවිද්‍යා සඞ්ඛ්‍යාත ඔඝයෙක් අවිද්‍යා යොගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යාපර්‍ය්‍යුත්ථානයෙක් අවිද්‍යාපරිඝයෙක් මෝහ අකුශල මූලයෙක් වේ ද, මේ අවිද්‍යාස්‍රව යයි කියනු ලැබේ.

මේ ධර්මයෝ ආස්‍රවයෝ යි.

1106. කවර ධර්මයෝ ආස්‍රව නො වූවාහු වෙති යත්:

ඒ ආස්‍රවධර්මයන් තබා කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ අවශේෂ කුශල - අකුශල - අව්‍යාකෘත ධර්මයෝ ය, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසංඛත ධාතුව ද යන මේ ධර්මයෝ ආස්‍රව නො වූවෝ යි.

1107. කවර ධර්මයෝ සාස්‍රව වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ කුශල - අකුශල - අව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, යන මේ ධර්මයෝ සාස්‍රවයෝ යි.

1108. කවර ධර්මයෝ, අනාස්‍රවහ යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසංඛත නිර්වාණධාතුව ද, යන මේ ධර්මයෝ අනාස්‍රවයෝ යි.

1109. කවර ධර්මයෝ ආස්‍රව සම්ප්‍රයුක්තහ යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ආස්‍රවධර්මයන් හා සම්ප්‍රයුක්ත වූවාහු ද, වෙදනාස්කන්ධ ය, ... විඥානස්කන්ධය, යන මේ ධර්මයෝ ආස්‍රවසම්ප්‍රයුක්තයෝ යි.

1110. කවර ධර්මයෝ ආස්‍රවවිප්‍රයුක්තහ යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ආස්‍රවධර්මයන් හා විප්‍රයුක්ත වූවාහු ද වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසංඛත ධාතුව ද, යන මේ ධර්මයෝ ආස්‍රවවිප්‍රයුක්තයෝ යි.

1111. කවර ධර්මයෝ ආස්‍රව ද සාස්‍රව ද වෙති යත්:

ඒ ආස්‍රවයෝ ආස්‍රව ද ආස්‍රව සහිත ද වෙත්.

1112. කතමෙ ධම්මා සාසවා චෙව නො ච ආසවා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සාසවා තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සාසවා චෙව නො ච ආසවා.

1113. කතමෙ ධම්මා ආසවා චෙව ආසවසම්පයුත්තා ච?

කාමාසවො අවිජ්ජාසවෙන ආසවො චෙව ආසවසම්පයුත්තො ච, අවිජ්ජාසවො කාමාසවෙන ආසවො චෙව ආසවසම්පයුත්තො ච, භවාසවො අවිජ්ජාසවෙන ආසවො චෙව ආසවසම්පයුත්තො ච, අවිජ්ජාසවො භවාසවෙන ආසවො චෙව ආසවසම්පයුත්තො ච, දිට්ඨාසවො අවිජ්ජාසවෙන ආසවො චෙව ආසවසම්පයුත්තො ච, අවිජ්ජාසවො දිට්ඨාසවෙන ආසවො චෙව ආසවසම්පයුත්තො ච, ඉමෙ ධම්මා ආසවා චෙව ආසවසම්පයුත්තා ච.

1114. කතමෙ ධම්මා ආසවසම්පයුත්තා චෙව නො ච ආසවා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා තෙ ධම්මෙ ඨපෙත්වා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා ආසවසම්පයුත්තා චෙව නො ච ආසවා.

1115. කතමෙ ධම්මා ආසවවිප්පයුත්තා සාසවා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා ආසවවිප්පයුත්තා සාසවා.

1116. කතමෙ ධම්මා ආසවවිප්පයුත්තා අනාසවා?

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා ආසවවිප්පයුත්තා අනාසවා.

ආසවගොච්ඡකං.

නික්ඛෙපකණ්ඩෙ පඨමකභාණවාරං.

සඤ්ඤොජනං.

1117. කතමෙ ධම්මා සඤ්ඤොජනා?

දස සඤ්ඤොජනානි: කාමරාගසඤ්ඤොජනං, පටිඝසඤ්ඤොජනං, මානසඤ්ඤොජනං, දිට්ඨිසඤ්ඤොජනං, විචිකිච්ඡාසඤ්ඤොජනං, සීලබ්බතපරාමාසසඤ්ඤොජනං, භවරාගසඤ්ඤොජනං, ඉස්සාසඤ්ඤොජනං, මච්ඡරියසඤ්ඤොජනං, අවිජ්ජාසඤ්ඤොජනං.

1112. කවර ධර්මයෝ සාස්‍රව ද නො ද ආස්‍රව ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ආස්‍රවධර්මයන් ගෙන් සාස්‍රව වූවාහු ද ඒ ධර්මයන් තබා, කාමාවචර රූපාවචර අරූපාවචර වූ සෙසු ආස්‍රව සහිත වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, යන මේ ධර්මයෝ සාස්‍රව ද නො ද ආස්‍රව ද වෙත්.

1113. කවර ධර්මයෝ ආස්‍රව ද ආස්‍රවසම්ප්‍රයුක්ත ද වෙති යත්:

කාමාස්‍රවය අවිද්‍යාස්‍රවය හා ආස්‍රව වූයේ ද ආස්‍රවසම්ප්‍රයුක්ත වූයේ ද වෙයි. අවිද්‍යාස්‍රවය කාමාස්‍රවය හා ආස්‍රව වූයේ ද ආස්‍රවසම්ප්‍රයුක්ත වූයේ ද වෙයි. භවාස්‍රවය අවිද්‍යාස්‍රවය හා ආස්‍රව වූයේ ද ආස්‍රවසම්ප්‍රයුක්ත වූයේ ද වෙයි, අවිද්‍යාස්‍රවය භවාස්‍රවය හා ආස්‍රව වූයේ ද ආස්‍රව සම්ප්‍රයුක්ත වූයේ ද වෙයි. දෘෂ්ට්‍යාස්‍රවය අවිද්‍යාස්‍රවය හා ආස්‍රව වූයේ ද ආස්‍රවසම්ප්‍රයුක්ත වූයේ ද වෙයි. අවිද්‍යාස්‍රවය දෘෂ්ට්‍යාස්‍රවය හා ආස්‍රව වූයේ ද ආස්‍රව සම්ප්‍රයුක්ත වූයේ ද වේ. මේ ධර්මයෝ ආස්‍රව ද ආස්‍රව සම්ප්‍රයුක්ත ද වෙත්.

1114. කවර ධර්මයෝ ආස්‍රවසම්ප්‍රයුක්ත ද නො ද ආස්‍රව ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ආස්‍රවධර්මයන් හා සම්ප්‍රයුක්ත වූවාහු නම්, ඒ ධර්මයන් තබා, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, යන මේ ධර්මයෝ ආස්‍රවසම්ප්‍රයුක්ත වූවාහු ද නො ද ආස්‍රව වූවාහු ද වෙත්.

1115. කවර ධර්මයෝ ආස්‍රව විප්‍රයුක්ත සාස්‍රව වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ආස්‍රවධර්මයන් හා විප්‍රයුක්ත වූවාහු ද, කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය, ...විඥානස්කන්ධය, යන මේ ධර්මයෝ ආස්‍රවවිප්‍රයුක්ත වූ සාස්‍රවයෝ යි.

1116. කවර ධර්මයෝ ආස්‍රවවිප්‍රයුක්ත අනාස්‍රව වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසංඛත (නිර්වාණ) ධාතුව ද, යන මොහු ආස්‍රවවිප්‍රයුක්ත වූ අනාස්‍රව ධර්මයෝ යි.

ආසවගොච්ඡකය යි.

නික්ෂෙපකාණ්ඩයෙහි

පළමුවන බණවර නිමි.

1117. කවර ධර්මයෝ සංයෝජන වෙති යත්:

දශ සංයෝජනයෝ ය: කාමරාගසංයෝජන ය, ප්‍රතිඝ සංයෝජන ය, මාන සංයෝජන ය, දෘෂ්ටිසංයෝජන ය, විචිකිත්සා සංයෝජන ය, ශීලව්‍රතපරාමර්ශ සංයෝජන ය, භවරාගසංයෝජන ය, ඊර්ෂ්‍යාසංයෝජන ය, මාත්සර්යසංයෝජනය, අවිද්‍යාසංයෝජන යි.

1118. තත්ථ කතමං කාමරාගසඤ්ඤොජනං?

යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං, ඉදං වුච්චති කාමරාගසඤ්ඤොජනං.

1119. තත්ථ කතමං පටිඝසඤ්ඤොජනං?

අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අට්ඨානෙ වා පන ආඝාතො ජායති. යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, ඉදං වුච්චති පටිඝසඤ්ඤොජනං.

1120. තත්ථ කතමං මානසඤ්ඤොජනං?

සෙය්‍යොහමස්මීති මානො සදිසොහමස්මීති මානො හීනොහමස්මීති මානො, යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, ඉදං වුච්චති මානසඤ්ඤොජනං.

1121. තත්ථ කතමං දිට්ඨිසඤ්ඤොජනං?

සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහණං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පටිග්ගාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො, ඉදං වුච්චති දිට්ඨිසඤ්ඤොජනං. ඨපෙත්වා සීලබ්බතපරාමාසසඤ්ඤොජනං සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨිසඤ්ඤොජනං.

1118. එහි කාමරාගසංයෝජන කවරේ යත්:

පස්කම් ගුණයෙහි යම් කාමසඞ්ඛ්‍යාත ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණාවෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ච්ඡායෙක් කාමාධ්‍යවසානයෙක් (කාමයන්හි ගැලීසිටීමෙක්) වේ ද, මේ කාමරාගසංයොජන යයි කියනු ලැබේ.

1119. එහි ප්‍රතිඝසංයෝජන කවරේ යත්:

‘මට අනර්ථ කළැ’යි ආඝාත උපදී. ‘මට අනර්ථ කෙරෙයි’ ආඝාත උපදී. ‘මට අනර්ථ කරන්නේ ය’ යි ආඝාත උපදී. මාගේ ප්‍රිය මනාපය හට අනර්ථ කෙළේ ය ... අනර්ථ කෙරෙයි... අනර්ථ කරන්නේ ය’යි ආඝාත උපදී. ‘මාගේ අප්‍රිය අමනාපය හට අර්ථ කෙළේ ය ... අර්ථ කෙරෙයි ... අර්ථ කරන්නේ ය’ යි ආඝාත උපදී. යළි අස්ථානයෙහි හෝ ආඝාත උපදී. යම් මෙබඳු වූ චිත්තයාගේ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් දෝෂයෙක් ප්‍රදෝෂයෙක් සම්ප්‍රදෝෂයෙක් චිත්තයාගේ විපරීත බවෙක් චිත්තයාගේ ද්වෙෂයෙක් ක්‍රොධයෙක් කිපෙන අයුරෙක් කිපුණු බවෙක් ද්වෙෂයෙක් ද්වෙෂාකාරයෙක් දුෂ්ට බවෙක් විපරීතයෙක් විපරීතාකාරයෙක් විපර්‍යස්ත බවෙක් විරොධයෙක් පුනපුනා විරොධයෙක් සැඩබවෙක් නො පිරුණු වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ ප්‍රතිඝසංයොජන යයි කියනු ලැබේ.

1120. එහි මානසංයෝජන කවරේ යත්:

‘මම ශ්‍රෙෂ්ඨයෙමි’ මාන ය, ‘මම සදෘශයෙමි’ මාන ය, ‘මම හීනයෙමි’ මාන ය, යම් මෙබඳු වූ මානයෙක් මානාකාරයෙක් මඤ්ඤිත බවෙක් උන්නතියෙක් ඔසොවා තැබීමෙක් ධවජයෙක් සිත දැඩි ව ගැනීමෙක් චිත්තයාගේ කෙතුකාම්‍යතාවෙක් වේ ද, මේ මානසංයොජන යයි කියනු ලැබේ.

1121. එහි දෘෂ්ටිසංයොජන කවරේ යත්:

ලෝකය ශාශ්වත ය හෝ, ලෝකය අශාශ්වත ය හෝ, ලෝකය අන්තවත් ය හෝ, ලෝකය අනන්තවත් ය හෝ, එ ම ජීව ය ඒ ශරීර යයි හෝ, ජීවය අනෙකෙකැ, ශරීරය අනෙකෙකැ’යි හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි වේ යයි හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි නො වේ යයි හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි වන්නේත් නො වන්නේත් වේ යයි හෝ, සත්ත්වයා මරණින් මතුයෙහි නො ම වෙයි නො වන්නේ නො වේ යයි හෝ, යම් මෙබඳු වූ දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලොමදෘෂ්ටියෙක් දෘෂ්ටිවිෂ්පන්දිතයෙක් දෘෂ්ටිසංයොජනයෙක් ග්‍රාහයෙක් පිහිටාසිටීමෙක් පිවිසීමෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ දෘෂ්ටිසංයොජන යයි කියනු ලැබේ. ශීලව්‍රතපරාමර්ශසංයොජනය තබා සියලු මිථ්‍යාදෘෂ්ටි දෘෂ්ටිසංයොජන යි.

1122. තත්ථ කතමං විචිකිච්ඡාසඤ්ඤොජනං?

සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති, සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති, සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, අපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචිකිච්ඡති. යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ථම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො, ඉදං වුච්චති විචිකිච්ඡාසඤ්ඤොජනං.

1123. තත්ථ කතමං සීලබ්බතපරාමාසසඤ්ඤොජනං?

ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි වතෙන සුද්ධි සීලබ්බතෙන සුද්ධීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො, ඉදං වුච්චති සීලබ්බතපරාමාසසඤ්ඤොජනං.

1124. තත්ථ කතමං භවරාගසඤ්ඤොජනං?

යො භවෙසු භවච්ඡන්දො භවරාගො භවනන්දි භවතණ්හා භවසිනෙහො භවපරිළාහො භවමුච්ඡා භවජ්ඣොසානං, ඉදං වුච්චති භවරාගසඤ්ඤොජනං.

1125. තත්ථ කතමං ඉස්සාසඤ්ඤොජනං?

යා පර ලාභ සක්කාර ගරුකාර මානන වන්දන පූජනාසු ඉස්සා ඉස්සායනා ඉස්සායිතත්තං උසූයා උසූයනා උසූයිතත්තං, ඉදං වුච්චති ඉස්සාසඤ්ඤොජනං.

1126. තත්ථ කතමං මච්ඡරියසඤ්ඤොජනං?

පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං, යං එවරූපං මච්ඡරං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියසඤ්ඤොජනං.

1122. එහි විචිකිත්සාසංයෝජන කවරේ යත්:

ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ධර්මයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ත්‍රිවිධ ශික්ෂාවෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, පූර්වාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. අපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. පූර්වාන්තාපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ඉදම්ප්‍රත්‍යයතා ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන්හි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. යම් මෙබඳු වූ සැකයෙක් සැකයට පැමිණීමෙක් සැකයට පැමිණි බවෙක් විමතියෙක් විචිකිත්සායෙක් ද්වෙළ්හකයෙක් ද්විධාපථයෙක් සංශයෙක් අනෙකාංශග්‍රාහයෙක් පසුබැසීමෙක් හාත්පසින් පසුබැසීමෙක් නො බැසගැනීමෙක් චිත්තයාගේ තදබවෙක් මනොවිලෙඛයෙක් වේ ද, මේ විචිකිත්සාසංයොජන යයි කියනු ලැබේ.

1123. එහි ශීලව්‍රතපරාමර්ශසංයොජන කවරේ යත්:

මේ සස්නෙන් බැහැර මහණබමුණන්ගේ 'ශීලයෙන් ශුද්ධිය, ව්‍රතයෙන් ශුද්ධි ය'යි යම් මෙබඳු වූ දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලොම දෘෂ්ටියෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයොජනයෙක් ග්‍රාහයෙක් පිහිටා සිටීමෙක් අභිනිවෙශයෙක් පරාමර්ශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්යාසග්‍රාහයෙක් වේ ද, මේ ශීලව්‍රතපරාමර්ශසංයොජන යයි කියනු ලබේ.

1124. එහි භවරාගසංයොජන කවරේ යත්:

රූපාරූපභවයන්හි යම් භවච්ඡන්දයෙක් භවරාගයෙක් භවනන්දියෙක් භවතෘෂ්ණායෙක් භවස්නෙහයෙක් භවපරිදාහයෙක් භවමූර්ච්ඡායෙක් භවයන්හි බැසගැනීමෙක් වේ ද, මේ භවරාගසංයොජන යයි කියනු ලැබේ.

1125. එහි ඊර්ෂ්‍යාසංයොජන කවරේ යත්:

මෙරමා පිළිබඳ ලාභ - සත්කාර - ගරුකාර - මානන - වන්දන - පූජනා විෂයෙහි යම් ඊර්ෂ්‍යාවක් ඊර්ෂ්‍යාකාරයෙක් ඊර්ෂ්‍යාවට පැමිණි බවෙක්, අසූයා (-දොස් පහල කිරීමෙක්) අසූයාකාරයෙක් අසූයාවට පැමිණි බවෙක් වේ ද, මේ ඊර්ෂ්‍යාසංයොජන යයි කියනු ලැබේ.

1126. එහි මාත්සර්යසංයොජන කවරේ යත්:

මාත්සර්ය (මසුරුබැව්) පසෙකි: ආවාසමාත්සර්ය ය කුලමාත්සර්ය ය ලාභමාත්සර්ය ය වර්ණමාත්සර්ය ය ධර්මමාත්සර්ය යයි. යම් මෙ බඳු වූ මාත්සර්යයෙක් මාත්සර්යාකාරයෙක් මාත්සර්යයට පැමිණි බවෙක් වෙවිච්ඡායෙක් අත්‍යාගී (තදමසුරු) බවෙක් කටුකභාවයෙන් සිත හැකිළීමෙක් සිත හාත්පසින් ගත්බවෙක් වේ ද, මේ මාත්සර්යසංයොජන යයි කියනු ලැබේ.

1127. තත්ථ කතමං අවිජ්ජාසඤ්ඤොජනං?

දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසංගාහණා අපරියොගාහණා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, ඉදං වුච්චති අවිජ්ජා සඤ්ඤොජනං.

ඉමෙ ධම්මා සඤ්ඤොජනා.

1128. කතමෙ ධම්මා නො සඤ්ඤොජනා?

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො සඤ්ඤොජනා.

1129. කතමෙ ධම්මා සඤ්ඤොජනියා?

සාසවා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඤ්ඤොජනියා.

1130. කතමෙ ධම්මා අසඤ්ඤොජනියා?

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අසඤ්ඤොජනියා.

1131. කතමෙ ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා.

1132. කතමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා.

1127. එහි අවිද්‍යාසංයෝජන කවරේ යත්:

දුඃඛසත්‍යයෙහි නො දැනීම දුඃඛසමුදයෙහි නො දැනීම දුඃඛනිරොධයෙහි නො දැනීම දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි නො දැනීම පූර්වාන්තයෙහි නො දැනීම අපරාන්තයෙහි නො දැනීම පූර්වාන්තාපරාන්තයෙහි නො දැනීම ඉදප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි නො දැනීම ය, යන මෙබඳු වූ යම් අඥානයෙක් අදර්ශනයෙක් අනභිසමයෙක් අනවබොධයෙක් අසම්බොධයෙක් අප්‍රතිවෙධයෙක් (අනිත්‍යාදි සාමාන්‍ය හෙයින්) මොනොවට නො ගැනීමෙක් හාත්පසින් නො බැස ගැනීමෙක් සම ව නො බැලීමෙක් ප්‍රත්‍යවෙක්‍ෂා නො කිරීමෙක් ප්‍රත්‍යක්‍ෂ නො කිරීමෙක් දුර්මේධ්‍යයෙක් බාල්‍යයෙක් අසම්‍යග් ඥානයෙක් මොහයෙක් ප්‍රමොහයෙක් සම්මොහයෙක් අවිද්‍යාවෙක් අවිද්‍යෞඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යානුශයෙක් අවිද්‍යාපර්‍ය්‍යුත්ථානයෙක් අවිද්‍යාපරිඝයෙක් මොහ - අකුශලමූලයෙක් වේ ද, මේ අවිද්‍යාසංයොජන යයි කියනු ලැබේ.

මෙ ධර්මයෝ සංයොජනයෝ යි.

1128. කවර ධර්මයෝ සංයොජන නො වූවාහු වෙති යත්:

ඒ සංයොජනධර්මයන් තබා අවශෙෂ වූ කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශල - අකුශල - අව්‍යාකෘත ධර්මයෝ ය, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, සියලු රූපය ද, අසංඛතධාතුව ද යන මේ ධර්මයෝ සංයොජන නො වූවෝ යි.

1129. කවර ධර්මයෝ සංයොජනීය වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ ය යන මොහු සංයොජනීය ධර්මයෝ ය.

1130. කවර ධර්මයෝ අසංයොජනීය වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසංඛතධාතුව ද යන මොහු අසංයොජනීය ධර්මයෝ යි.

1131. කවර ධර්මයෝ සංයෝජනසම්ප්‍රයුක්ත වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ සංයොජනධර්මයන් හා සම්ප්‍රයුක්ත වූ වාහු ද, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, යන මොහු සංයොජනසම්ප්‍රයුක්ත ධර්මයෝ යි.

1132. කවර ධර්මයෝ සංයොජන විප්‍රයුක්ත වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ සංයොජනධර්මයන් හා විප්‍රයුක්ත වූවාහු ද, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය සියලු රූපය ද, අසංඛත ධාතුව ද, යන මේ ධර්මයෝ සංයොජනවිප්‍රයුක්තයෝ යි

1133. කතමෙ ධම්මා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනියා ච?

තානෙව සංයොජනානි සඤ්ඤොජනා චෙව සංයොජනියා ච.

1134. කතමෙ ධම්මා සඤ්ඤොජනියා චෙව නො ච සඤ්ඤොජනා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සඤ්ඤොජනියා තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා සාසවා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඤ්ඤොජනියා චෙව නො ච සඤ්ඤොජනා.

1135. කතමෙ ධම්මා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනසම්පයුත්තා ච?

කාමරාගසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච, අවිජ්ජාසඤ්ඤොජනං කාමරාගසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච. පටිඝසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච, අවිජ්ජාසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච. මානසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනං චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච, අවිජ්ජාසඤ්ඤොජනං මානසඤ්ඤොජනෙන සඤ්ඤොජනං චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච. දිට්ඨිසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනං චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච, අවිජ්ජාසඤ්ඤොජනං දිට්ඨිසඤ්ඤොජනෙන සඤ්ඤොජනං චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච. විචිකිච්ඡාසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච, අවිජ්ජාසඤ්ඤොජනං විචිකිච්ඡාසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච. සීලබ්බතපරාමාසසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච, අවිජ්ජාසඤ්ඤොජනං සීලබ්බතපරාමාසසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච. භවරාගසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච, අවිජ්ජාසඤ්ඤොජනං භවරාගසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තඤ්ච. ඉස්සාසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච, අවිජ්ජාසඤ්ඤොජනං ඉස්සාසඤ්ඤොජනෙන සඤ්ඤොජනං චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච. මච්ඡරියසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනෙන සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තඤ්ච, අවිජ්ජාසඤ්ඤොජනං මච්ඡරියසඤ්ඤොජනෙන සඤ්ඤොජනං චෙව සඤ්ඤොජනසම්පයුත්තං ච. ඉමෙ ධම්මා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනසම්පයුත්තා ච.

1136. කතමෙ ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා චෙව නො ච සඤ්ඤොජනා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා තෙ ධම්මෙ ඨපෙත්වා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා චෙව නො ච සඤ්ඤොජනා.

1133. කවර ධර්මයෝ සංයෝජනත් සංයෝජනියත් වෙති යත්:

ඒ සංයෝජනයෝ මැ සංයෝජන ද සංයෝජනිය ද වෙත්.

1134. කවර ධර්මයෝ සංයෝජනිය ද නො ද සංයෝජන ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ සංයෝජනධර්මයන්ගෙන් සංයෝජනිය වෙත් නම්, ඒ ධර්මයන් තබා අවශේෂ කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධය, යන මේ ධර්මයෝ සංයෝජනිය ද නො ද සංයෝජන ද වෙත්.

1135. කවර ධර්මයෝ සංයොජන ද සංයොජන සම්ප්‍රයුක්ත ද වෙති යත්:

කාමරාගසංයෝජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යාසංයෝජනය කාමරාගසංයෝජනය සමග සංයොජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි. ප්‍රතිඝසංයෝජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජන සම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යාසංයෝජනය ප්‍රතිඝසංයෝජනය සමග සංයොජන ද සංයොජනසම්ප්‍රයුක්ත ද වෙයි. මානසංයෝජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යාසංයෝජනය මානසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි. දෘෂ්ටිසංයෝජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යාසංයෝජනය දෘෂ්ටිසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි. විචිකිත්සාසංයෝජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යාසංයොජනය විචිකිත්සාසංයොජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි. ශීලව්‍රතපරාමර්ශ සංයොජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යාසංයෝජනය ශීලව්‍රතපරාමර්ශසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි. භවරාග සංයෝජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යාසංයෝජනය භවරාගසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි. ඊර්ෂ්‍යාසංයෝජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජන සම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යාසංයෝජනය ඊර්ෂ්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි. මාත්සර්‍ය්‍යසංයෝජනය අවිද්‍යාසංයෝජනය සමග සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙයි, අවිද්‍යා සංයෝජනය මාත්සර්‍ය්‍යසංයොජනය සමග සංයෝජන ද සංයෝජන සම්ප්‍රයුක්ත ද වේ. මේ ධර්මයෝ සංයෝජන ද සංයෝජනසම්ප්‍රයුක්ත ද වෙත්.

1136. කවර ධර්මයෝ සංයොජනසම්ප්‍රයුක්ත ද නො ද සංයොජන ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ සංයෝජනධර්මයන් හා සම්ප්‍රයුක්ත වූවාහු නම්, ඒ ධර්මයන් තබා, වෙදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය. යන මේ ධර්මයෝ සංයෝජනසම්ප්‍රයුක්ත ද නො ද සංයෝජන ද වෙත්.

1137. කතමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා සඤ්ඤොජනියා?

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා සාසවා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා සඤ්ඤොජනියා.

1138. කතමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා අසඤ්ඤොජනියා?

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා අසඤ්ඤොජනියා.

### සංයොජන ගොච්ඡකං.

1139. කතමෙ ධම්මා ගන්ථා?

චත්තාරො ගන්ථා: අභිජ්ඣා කායගන්ථො, ව්‍යාපාදො කායගන්ථො, සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො.

1140. තත්ථ කතමො අභිජ්ඣාකායගන්ථො?

යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දි නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පලිගෙධො සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා සඤ්ජනනී සිබ්බනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසටා ආයූහනී දුතියා පණිධි භවනෙත්ති වනං වනථො සන්ථවො සිනෙහො අපෙක්ඛා පටිබන්ධු ආසා ආසිංසනා ආසිංසිතත්තං රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා සාධුකම්‍යතා අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සම්පත්ථනා කාමතණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රස-තණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබළිසං මාරවිසයො තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දූලං තණ්හාසමුද්දො අභිජ්ඣා ලොභො අකුසලමූලං, අයං වුච්චති අභිජ්ඣාකායගන්ථො.

1137. කවර ධර්මයෝ සංයෝජනවිප්‍රයුක්ත සංයෝජනීය වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ සංයෝජනධර්මයන් හා විප්‍රයුක්ත වූවාහු නම්, කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, යන මේ ධර්මයෝ සංයෝජන විප්‍රයුක්ත සංයොජනීය වෙත්.

1138. කවර ධර්මයෝ සංයෝජනවිප්‍රයුක්ත අසංයොජනීය වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද, මාර්ගඵලයෝ ද, අසංඛත (නිබ්බාන) ධාතුව ද, යන මේ ධර්මයෝ සංයෝජනවිප්‍රයුක්ත අසංයෝජනීය වෙත්.

සංයොජනගොච්ඡකය යි.

1139. කවර ධර්මයෝ ග්‍රන්ථ වෙති යත්:

ග්‍රන්ථයෝ සතර දෙනෙක් වෙති: අභිධ්‍යාකායග්‍රන්ථ ය, ව්‍යාපාද කායග්‍රන්ථ ය, ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ ය, ඉදංසත්‍යාභිනිවෙශකායග්‍රන්ථ යයි.

1140. එහි අභිධ්‍යාකායග්‍රන්ථය කවරෙ යත්:

යම් රාගයෙක් බලවත් රාගයෙක් අනුනයෙක් අනුරොධයෙක් නන්දියෙක් නන්දිරාගයෙක් චිත්තයාගේ සංරාගයෙක් ඉච්ඡාවක් මූර්ච්ඡාවක් අධ්‍යවසානයෙක් ගේධයෙක් පරිගේධයෙක් ඇලීමෙක් පඞ්කයෙක් එජාවක් මායාවක් ජනිකාවක් සංජනනියක් සිබ්බනියක් ජාලිනියක් සරිතාවක් විසත්තිකාවක් සූත්‍රයෙක් පැතිරීමෙක් ආයූහනියක් ද්විතීයාවක් ප්‍රණිධියෙක් භවනෙත්තියෙක් වනයෙක් වනථයෙක් සන්ථවයෙක් ස්නෙහයෙක් අපෙක්ෂාවක් ප්‍රතිබන්ධයෙක් ආශායෙක් ආශංසනයෙක් ආශංසිත බවෙක් රූපාශායෙක් ශබ්දාශායෙක් ගන්ධාශායෙක් රසාශායෙක් ස්ප්‍රෂ්ටව්‍යාශායෙක් ලාභාශායෙක් ධනාශායෙක් පුත්‍රාශායෙක් ජීවිතාශායෙක් ජල්පනය කිරීමෙක් ප්‍රජල්පයෙක් අභිජල්පයෙක් ජල්පනයෙක් ජල්පනාකාරයෙක් ජල්පිත බවෙක් නගුට සැලුමෙක් ස්වාදුකාම්‍යතායෙක් අධර්මරාගයෙක් විෂමලොභයෙක් නිකාන්තියෙක් කැමැති වන අයුරෙක් ප්‍රාර්ථනයෙක් පිහායෙක් සම්ප්‍රාර්ථනයෙක් කාමතෘෂ්ණායෙක් භවතෘෂ්ණායෙක් විභවතෘෂ්ණායෙක් රූප (භව) තෘෂ්ණයෙක් අරූපතෘෂ්ණයෙක් නිරොධතෘෂ්ණායෙක්, රූපතෘෂ්ණායෙක් ශබ්දතෘෂ්ණායෙක් ගන්ධතෘෂ්ණායෙක් රසතෘෂ්ණායෙක් ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණයෙක් ධර්මතෘෂ්ණායෙක් ඕඝයෙක් යෝගයෙක් ග්‍රන්ථයෙක් උපාදානයෙක් ආවරණයෙක් නීවරණයෙක් ඡදනයෙක් බන්ධනයෙක් උපක්ලෙශයෙක් අනුශයෙක් පර්‍යුත්ථානයෙක් ලතායෙක් වෙවිච්ඡායෙක් දුඃඛමූලයෙක් දුඃඛනිදානයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබලිසයෙක් මාරවිෂයෙක් තෘෂ්ණානදියක් තෘෂ්ණාජාලයෙක් තෘෂ්ණාගර්දූලයෙක් තෘෂ්ණාසමුද්‍රයෙක් අභිධ්‍යාවක් ලෝභඅකුශල මූලයෙක් වේ ද, මේ අභිධ්‍යාකායග්‍රන්ථ යයි කියනු ලැබේ.

1141. තත්ථ කතමො ව්‍යාපාදො කායගන්ථො?

අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතීති ආඝාතො ජායති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතො ජායති. අට්ඨානෙ වා පන ආඝාතො ජායති. යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති ව්‍යාපාදො කායගන්ථො.

1142. තත්ථ කතමො සීලබ්බතපරාමාසො කායගන්ථො?

ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි වතෙන සුද්ධි සීලබ්බතෙන සුද්ධීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො, අයං වුච්චති සීලබ්බතපරාමාසො කායගන්ථො.

1143. තත්ථ කතමො ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො?

සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, අන්තවා ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, අනන්තවා ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, තං ජීවං තං සරීරං ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො, අයං වුච්චති ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො. ඨපෙත්වා සීලබ්බතපරාමාසං කායගන්ථං සබ්බාපි මිච්ඡාදිට්ඨි ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො.

ඉමෙ ධම්මා ගන්ථා.

1141. එහි ව්‍යාපාද කායග්‍රන්ථ කවරේ යෑ:

‘මට අවැඩ කළැ’යි කෝප උපදී, ‘මට අවැඩ කෙරෙයි’ කෝප උපදී, ‘මට අවැඩ කරන්නේ වනැ’යි කෝප උපදී, ‘මාගේ ප්‍රිය මනාප වූවහුට අවැඩ කළැ’යි ... අවැඩ කෙරෙයි ... අවැඩ කරන්නේ වනැ’යි කෝප උපදී, ‘මාගේ අප්‍රිය අමනාප වූවහුට වැඩ කළැ’යි ... වැඩ කෙරෙයි ... වැඩ කරන්නේ වනැ’යි කෝප උපදී, යළි නො තැන්හි හෝ කෝප උපදී. මෙබඳු වූ යම් සිත පිළිබඳ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරෝධයෙක් කෝපයෙක් ප්‍රකෝපයෙක් සම්ප්‍රකෝපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් සිත පෙරළීමෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රෝධයෙක් කිපෙන අයුරෙක් කිපුණු බවෙක් ද්වෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිත බවෙක් පෙරළීමෙක් පෙරළෙන අයුරෙක් පෙරළුණු බවෙක් විරෝධයෙක් ප්‍රති-විරෝධයෙක් සැඩබවෙක් නො පිරිපුන් වචන ඇතිබවෙක් චිත්තයාගේ නො සියමන් බවෙක් වේ ද, මේ ව්‍යාපාද කායග්‍රන්ථ යයි කියනු ලැබේ.

1142. එහි ශීලව්‍රතපරාමර්ශ කායග්‍රන්ථ කවරේ යෑ:

මේ සස්නෙන් බැහැර මහණබමුණන්ගේ ‘ශීලයෙන් ශුද්ධි යෑ, ව්‍රතයෙන් ශුද්ධි යෑ, ශීලව්‍රතයෙන් ශුද්ධි යෑ’යි මෙබඳු යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලෝම දෘෂ්ටියෙක් දෘෂ්ටිවිෂ්පන්දිත-යෙක් දෘෂ්ටිසංයෝජනයෙක් දැඩිව ගැනීමෙක් පිහිටා සිටීමෙක් අභිනිවේශ-යෙක් පරාමර්ශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථා-යතනයෙක් විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ ශීලව්‍රතපරාමර්ශ කායග්‍රන්ථ යි කියනු ලැබේ.

1143. එහි ඉදම්සත්‍යාභිනිවේශ කායග්‍රන්ථ කවරේ යෑ:

ඇතැම් සඞ්ඛ්‍යාත ලෝකය ශාශ්වත යෑ, මෙය මැ සැබව, අන්‍යය තුච්ඡ යැයි හෝ, ලෝකය අශාශ්වත යෑ, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, ලෝකය අන්තවත් යෑ, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, ලෝකය අනන්තවත් යෑ, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, එ මැ ජීවය එ මැ ශරීර යෑ, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, තථාගත (-සත්ත්වයා) මරණින් මතුයෙහි වෙයි, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, තථාගත මරණින් මතුයෙහි නො වෙයි, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, තථාගත මරණින් මතුයෙහි වන්නේත් නො ද වන්නේත් වෙයි, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, තථාගත මරණින් මතුයෙහි නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මෙය මැ සැබෑව, අන්‍යය තුච්ඡ යැයි හෝ, මෙබඳු වූ යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටි-කාන්තාරයෙක් දෘෂ්ටිවිලෝමයෙක් දෘෂ්ටිවිෂ්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් දැඩිව ගැනීමෙක් පිහිටා සිටීමෙක් අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුමාර්ග-යෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපරීතග්‍රාහයෙක් වේ ද, මේ ඉදම්සත්‍යාභිනිවේශ කායග්‍රන්ථ යයි කියනු ලැබේ. ශීලව්‍රතපරා-මර්ශ කායග්‍රන්ථය තබා හැම මිථ්‍යාදෘෂ්ටි ඉදම්සත්‍යාභිනිවේශ කායග්‍රන්ථ යි.

මේ ධර්මයෝ ග්‍රන්ථයෝ යි.

1144. කතමෙ ධම්මා නො ගන්ථා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො ගන්ථා.

1145. කතමෙ ධම්මා ගන්ථනීයා:

සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො ඉමෙ ධම්මා ගන්ථනීයා.

1146. කතමෙ ධම්මා අගන්ථනීයා:

අපරියාපන්නා මග්ගා ච, මග්ගඵලානි ච, අසඞ්ඛතා ච ධාතු ඉමෙ ධම්මා අගන්ථනීයා.

1147. කතමෙ ධම්මා ගන්ථසම්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො ඉමෙ ධම්මා ගන්ථසම්පයුත්තා.

1148. කතමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා.

1149 කතමෙ ධම්මා ගන්ථා චෙව ගන්ථනීයා ච:

තෙව ගන්ථා ගන්ථා චෙව ගන්ථනීයා ච.

1150. කතමෙ ධම්මා ගන්ථනීයා චෙව නො ච ගන්ථා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා ගන්ථනීයා තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා ගන්ථනීයා චෙව නො ච ගන්ථා.

1151. කතමෙ ධම්මා ගන්ථා චෙව ගන්ථසම්පයුත්තා ච:

සීලබ්බතපරාමාසො කායගන්ථො අභිජ්ඣාකායගන්ථෙන ගන්ථො චෙව ගන්ථසම්පයුත්තො ච, අභිජ්ඣාකායගන්ථො සීලබ්බතපරාමාසෙන කායගන්ථෙන ගන්ථො චෙව ගන්ථසම්පයුත්තො ච, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො අභිජ්ඣාකායගන්ථෙන ගන්ථො චෙව ගන්ථසම්පයුත්තො ච, අභිජ්ඣාකායගන්ථො ඉදංසච්චාභිනිවෙසෙන කායගන්ථෙන ගන්ථො චෙව ගන්ථසම්පයුත්තො ච ඉමෙ ධම්මා ගන්ථා චෙව ගන්ථසම්පයුත්තා ච.

1144. ග්‍රන්ථ නො වූ ධර්මයෝ කවරහු යත්:

ඒ ග්‍රන්ථධර්මයන් තබා ශේෂ වූ කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, වේදනාස්කන්ධ ය .. විඥානස්කන්ධ ය, හැම රූප ද, අසංඛතධාතු ද යන මේ ධර්මයෝ ග්‍රන්ථ නො වූවෝ යි.

1145. කවර ධර්මයෝ ග්‍රන්ථනීය වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ ය යන මේ ධර්මයෝ ග්‍රන්ථනීය වෙති.

1146. කවර ධර්මයෝ අග්‍රන්ථනීය වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතුව ද යන මොහු අග්‍රන්ථනීය ධර්මයෝ යි.

1147. ග්‍රන්ථසම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහු යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ග්‍රන්ථධර්මයන් හා සම්ප්‍රයුක්ත වූවාහු ද ඒ වේදනාස්කන්ධය ... විඥානස්කන්ධය යන මේ ධර්මයෝ ග්‍රන්ථසම්ප්‍රයුක්තයෝ යි.

1148. ග්‍රන්ථවිප්‍රයුක්ත ධර්මයෝ කවරහු යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ග්‍රන්ථධර්මයන්ගෙන් විප්‍රයුක්ත වූවාහු ද වේදනාස්කන්ධය ... විඥානස්කන්ධය සියලු රූප ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ ග්‍රන්ථවිප්‍රයුක්තයෝ යි.

1149. කවර ධර්මයෝ ග්‍රන්ථ වූවාහු ද ග්‍රන්ථනීය වූවාහු ද වෙති යත්:

ඒ ග්‍රන්ථයෝ මැ ග්‍රන්ථ ද ග්‍රන්ථනීය ද වෙත්.

1150. කවර ධර්මයෝ ග්‍රන්ථනීය ද නො ද ග්‍රන්ථ ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ග්‍රන්ථධර්මයන්ගෙන් ග්‍රන්ථනීය වෙත් නම් ඒ ධර්මයන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ ය යන මේ ධර්මයෝ ග්‍රන්ථනීය වූවාහු ද නො ද ග්‍රන්ථ වූවාහු ද වෙත්.

1151. කවර ධර්මයෝ ග්‍රන්ථ වූවාහු ද ග්‍රන්ථසම්ප්‍රයුක්ත වූවාහු ද වෙති යත්:

ශීලව්‍රතපරාමර්ශ කායග්‍රන්ථය අභිධ්‍යාකායග්‍රන්ථය හා ග්‍රන්ථ ද ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වෙයි. අභිධ්‍යාකායග්‍රන්ථය ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථය හා ග්‍රන්ථ වූයේ ද ග්‍රන්ථසම්ප්‍රයුක්ත වූයේ ද වෙයි ඉදම්සත්‍යාභිනිවේශකායග්‍රන්ථය අභිධ්‍යාකායග්‍රන්ථය හා ග්‍රන්ථ ද ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වෙයි. අභිධ්‍යාකායග්‍රන්ථය ඉදම්සත්‍යාභිනිවේශ කායග්‍රන්ථය හා ග්‍රන්ථ ද ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වේ. මේ ධර්මයෝ ග්‍රන්ථ වූවාහු ද ග්‍රන්ථසම්ප්‍රයුක්ත වූවාහු ද වෙත්.

1152. කතමෙ ධම්මා ගන්ථසම්පයුත්තා චෙව නො ච ගන්ථා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා තෙ ධම්මෙ ඨපෙත්වා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා ගන්ථසම්පයුත්තා චෙව නො ච ගන්ථා.

1153. කතමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා ගන්ථනියා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා ගන්ථනියා.

1154. කතමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා අගන්ථනියා:

අපරියාපන්නා මග්ගා ච, මග්ගඵලානි ච, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා අගන්ථනියා.

ගන්ථගොච්ඡකං

1155. කතමෙ ධම්මා ඔඝා -පෙ-

ඔඝගොච්ඡකං

1156. කතමෙ ධම්මා යොගා -පෙ-

යොගගොච්ඡකං

1157. කතමෙ ධම්මා නීවරණා:

ඡ නීවරණා: කාමච්ඡන්දනීවරණං, ව්‍යාපාදනීවරණං, ථිනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණං, විචිකිච්ඡානීවරණං, අවිජ්ජානීවරණං.

1158. තත්ථ කතමං කාමච්ඡන්දනීවරණං:

යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං, ඉදං වුච්චති කාමච්ඡන්දනීවරණං.

1159. තත්ථ කතමං ව්‍යාපාදනීවරණං:

'අනත්ථං මෙ අචරී'ති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතී'ති ආඝාතො ජායති. 'අනත්ථං මෙ චරිස්සතී'ති ආඝාතො ජායති, 'පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතී'ති ආඝාතො ජායති: 'අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතී'ති ආඝාතො ජායති, අට්ඨානෙ වා පන ආඝාතො ජායති, යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං විරොධො පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා[1] දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, ඉදං වුච්චති ව්‍යාපාදනීවරණං.

1. දූසනා - සිමු 2

1152. කවර ධර්මයෝ ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද නො ද ග්‍රන්ථ ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ග්‍රන්ථධර්මයන් හා සම්ප්‍රයුක්ත වූවාහු නම් ඒ ධර්මයන් තබා වේදනාස්කන්ධය .. විඥානස්කන්ධය යන මේ ධර්මයෝ ග්‍රන්ථ-සම්ප්‍රයුක්ත ද නො ද ග්‍රන්ථ ද වෙත්.

1153. කවර ධර්මයෝ ග්‍රන්ථවිප්‍රයුක්ත ග්‍රන්ථනීය වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ ග්‍රන්ථධර්මයන්ගෙන් විප්‍රයුක්ත වූවාහු නම් කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ යැ රූපස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ ග්‍රන්ථවිප්‍ර-යුක්ත ග්‍රන්ථනීය වූවාහු වෙත්.

1154. කවර ධර්මයෝ ග්‍රන්ථවිප්‍රයුක්ත අග්‍රන්ථනීය වූවාහු වෙති යත්:

අපර්‍යාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ ග්‍රන්ථවිප්‍රයුක්ත අග්‍රන්ථනීය වූවාහු වෙත්.

ග්‍රන්ථගොච්ඡක යි.

1155. කවර ධර්මයෝ ඕඝ වෙති යත්: ...

ඕඝගොච්ඡක යි.

1156. කවර ධර්මයෝ යොග වෙති යත්: ...

යොගගොච්ඡක යි.

1157. කවර ධර්මයෝ නීවරණ වෙති යත්:

නීවරණයෝ සදෙනෙකි: කාමච්ඡන්දනීවරණ යැ ව්‍යාපාදනීවරණ යැ ථිනමිද්ධනීවරණ යැ උද්ධච්චකුක්කුච්චනීවරණ යැ විචිකිච්ඡානීවරණ යැ අවිජ්ජානීවරණ යි.

1158. එහි කාමච්ඡන්දනීවරණය කවරේ යත්:

කාමවිෂයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ඡායෙක් කාමාධ්‍යවසානයෙක් ඇද්ද මේ කාමච්ඡන්දනීවරණ යයි කියනු ලැබේ.

1159. එහි ව්‍යාපාදනීවරණ කවරේ යත්:

මට අනර්ථ කළැයි ආඝාත උපදී. මට අනර්ථ කෙරෙයි ආඝාත උපදී. මට අනර්ථ කරන්නේ යයි ආඝාත උපදී, මාගේ ප්‍රියමනාප වූවහුට අනර්ථ කෙළේ ... අනර්ථ කෙරෙයි ... අනර්ථ කරන්නේ යයි ආඝාත උපදී. මාගේ අප්‍රිය අමනාප වූවහුට අර්ථ කෙළේ යැ ... අර්ථ කෙරෙයි ... අර්ථ කරන්නේ යයි ආඝාත උපදී: යළි අස්ථානයෙහි හෝ ආඝාත උපදී. මෙබඳු වූ යම් චිත්තයාගේ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් විරොධයෙක් ප්‍රති-විරොධයෙක් කොපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් චිත්තයාගේ පෙරළීමෙක් චිත්තයාගේ ප්‍රදූෂයෙක් ක්‍රොධයෙක් කිපෙන අයුරෙක් කිපුණ බවෙක් දෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂ්‍ය බවෙක් පෙරළීමෙක් පෙරළෙන අයුරෙක් පෙරළුණු බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් චණ්ඩ බවෙක් වාක් අපරිපූර්ණතා-යෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් ඇද්ද මේ ව්‍යාපාදනීවරණ යයි කියනු ලැබේ.

1160. තත්ථ කතමං ථිනමිද්ධනීවරණං:

අත්ථි ථිනං අත්ථි මිද්ධං.

1161. තත්ථ කතමං ථිනං:

යා චිත්තස්ස අකල්ලතා අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථිනං ථියනා ථියිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති ථිනං.

1162. තත්ථ කතමං මිද්ධං:

යා කායස්ස අකල්ලතා අකම්මඤ්ඤතා ඔනාහො පරියොනාහො අන්තොසමොරොධො මිද්ධං සොප්පං පචලායිකා සුපනා සුපිතත්තං, ඉදං වුච්චති මිද්ධං. ඉති ඉදඤ්ච ථිනං, ඉදඤ්ච මිද්ධං, ඉදං වුච්චති ථිනමිද්ධනීවරණං.

1163 තත්ථ කතමං උද්ධච්චකුක්කුච්චනීවරණං:

අත්ථි උද්ධච්චං, අත්ථි කුක්කුච්චං.

1164 තත්ථ කතමං උද්ධච්චං:

යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං වුච්චති උද්ධච්චං.

1165. තත්ථ කතමං කුක්කුච්චං:

අකප්පියෙ කප්පියසඤ්ඤිතා, කප්පියෙ අකප්පියසඤ්ඤිතා, අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා, වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං. ඉති ඉදං ච උද්ධච්චං ඉදං ච කුක්කුච්චං, ඉදං වුච්චති උද්ධච්චකුක්කුච්චනීවරණං.

1166 තත්ථ කතමං විචිකිච්ඡානීවරණං:

සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති, සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති, සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, අපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචිකිච්ඡති, යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං, විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ථම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො, ඉදං වුච්චති විචිකිච්ඡානීවරණං

1160. එහි ථිනමිද්ධනීවරණ කවරේ යත්:

ථිනයෙක් ඇත, මිද්ධයෙක් ඇති.

1161. එහි ථිනය කවරේ යත්:

චිත්තයාගේ යම් අකල්‍ය (ගිලන්) බවෙක් අකර්මණ්‍ය බවෙක් එලෙන අයුරෙක් මොනොවට එලෙන අයුරෙක් හැකිළීමෙක් හැකිළෙන අයුරෙක් හැකුළුණු බවෙක් ස්ත්‍යානයෙක් ස්ත්‍යානාකාරයෙක් ස්ත්‍යානභාවයෙක් (තද බවෙක්) වේ ද, මේ ථින යයි කියනු ලැබේ.

1162. එහි මිද්ධය කවරේ යත්:

කයෙහි යම් ගිලන් බවෙක් අකර්මණ්‍යභාවයෙක් බැඳීමෙක් හාත්පසින් බැඳීමෙක් ඇතුළත ඇවිරීමෙක් (අකර්මණ්‍යභාවයෙක්) පෙළීමෙක් නිද්‍රායෙක් (ඇස්පියහැලීම් ආදි) සල බවෙක් නිදන අයුරෙක් නිදිගත් බවෙක් ඇද්ද, මේ මිද්ධ යයි කියනු ලැබේ. මෙසේ මේ ථිනයත් මේ මිද්ධයත් ථිනමිද්ධ-නීවරණ යයි කියනු ලැබේ.

1163. එහි උද්ධච්චකුක්කුච්චනීවරණ කවරේ යත්:

උද්ධච්චයෙක් ඇත, කුක්කුච්චයෙක් ඇති.

1164 එහි උද්ධච්ච කවරේ යත්:

චිත්තයාගේ යම් උද්ධත භාවයෙක් නොසන්හිඳීමෙක් චිත්තවික්ෂෙප-යෙක් චිත්තයාගේ භ්‍රාන්ත බවෙක් ඇද්ද, මේ උද්ධච්ච යයි කියනු ලැබේ.

1165. එහි කුක්කුච්ච කවරේ යත්:

අකැපයෙහි කැප සංඥ ඇති බව යැ කැපයෙහි අකප්‍යසංඥ ඇති බව යැ අවද්‍යයෙහි වද්‍යසංඥ ඇති බව යැ වද්‍යයෙහි අවද්‍යසංඥ ඇති බව යැ යන මෙබඳු යම් කුකුසෙක් කුකුස් අයුරෙක් කුකුස් කල බවෙක් චිත්තයාගේ විපිළිසරයෙක් සිත හිරිනැඟීමෙක් ඇද්ද, මේ කුක්කුච්ච යයි කියනු ලැබේ මෙසේ මේ උද්ධච්චයත් මේ කුක්කුච්චයත් යන මේ උද්ධච්චකුක්කුච්චනීවරණ යයි කියනු ලැබේ.

1166. එහි විචිකිච්ඡානීවරණ කවරේ යත්:

ශාස්තෘන් කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ධර්මයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. සඞ්ඝයා කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ත්‍රිවිධ ශික්ෂායෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. පූර්වාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. අපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. පූර්වාපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ඉදම්-ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. මෙබඳු වූ යම් සැකයෙක් සැකයට පැමිණීමෙක් සැකයට පැමිණි බවෙක් විමතියෙක් විචිකිත්සායෙක් ද්වෛධකයෙක් ද්වීධාපථයෙක් සැකයෙක් අනෙකාන්තග්‍රාහයෙක් පසුබැසීමෙක් හාත්පසින් පසුබැසීමෙක් නොබැසගැනීමෙක් චිත්තයාගේ තද බවෙක් මනෝවිලෙඛයෙක් ඇද්ද, මේ විචිකිච්ඡානීවරණ යයි කියනු ලැබේ.

1167. තත්ථ කතමං අවිජ්ජානීවරණං:

දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසඞ්ගාහනා අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගි මොහො අකුසලමූලං, ඉදං වුච්චති අවිජ්ජානීවරණං.

ඉමෙ ධම්මා නීවරණා.

1168. කතමෙ ධම්මා නො නීවරණා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො නීවරණා.

1169 කතමෙ ධම්මා නීවරණියා:

සාසවා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා නීවරණියා.

1170 කතමෙ ධම්මා අනීවරණියා:

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනීවරණියා.

1171. කතමෙ ධම්මා නීවරණසම්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා නීවරණසම්පයුත්තා.

1172. කතමෙ ධම්මා නීවරණවිප්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො සබ්බඤ්ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නීවරණවිප්පයුත්තා.

1173. කතමෙ ධම්මා නීවරණා චෙව නීවරණියා ච:

තානෙව නීවරණානි නීවරණා චෙව නීවරණියා ච.

1167. එහි අවිද්‍යානීවරණ කවරේ යත්:

දුඃඛසත්‍යයෙහි නො දැනීම යැ දුඃඛසමුදයෙහි නො දැනීම යැ දුඃඛනිරෝධසත්‍යයෙහි නො දැනීම යැ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදායෙහි නො දැනීම යැ පූර්වාන්තයෙහි නො දැනීම යැ අපරාන්තයෙහි නො දැනීම යැ පූර්වාපරාන්තයෙහි නො දැනීම යැ ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පාදධර්මයෙහි නො දැනීම යැ යන නො දැනීමෙක් අදර්ශනයෙක් ධර්මයට නුවණින් අනභිමුඛ වීමෙක් අනවබෝධයෙක් අනිත්‍යාදි විසින් නො දැනීමෙක් සිවුසත් නො දැනීමෙක් (අනිත්‍යාදි වශයෙන්) සඟහා නො ගැනීමෙක් හාත්පසින් නො ගැනීමෙක් සමව නො දක්මෙක් ධර්මස්වභාවය නො දැකීමෙක් (කුශලාකුශලයන්) ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් අපවිත්‍ර බවෙක් බාල බවෙක් මුළාවෙක් බලවත් මෝහයෙක් සම්මෝහයෙක් අවිද්‍යාවෙක් අවිද්‍යාඕඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යාපර්‍ය්‍යුත්ථානයෙක් අවිද්‍යාලඞ්ගියෙක් අකුශලමූලයෙක් ඇද්ද, මේ අවිද්‍යානීවරණ යී කියනු ලැබේ.

මේ ධර්මයෝ නීවරණයෝ යි.

1168. නීවරණ නො වූ ධර්මයෝ කවරහ යත්:

ඒ නීවරණධර්මයන් තබා ශේෂ වූ කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘත වූ ධර්මයෝ යැ වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ හැම රූප ද අසංඛතධාතු ද යන මොහු නීවරණ නො වූ ධර්මයෝ යි.

1169. කවර ධර්මයෝ නීවරණීය වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ යැ රූපස්කන්ධ යැ විඥානස්කන්ධ යැ යන මොහු නීවරණීය ධර්මයෝ යි.

1170. කවර දහම්හු අනීවරණීය වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ අනීවරණීය වෙත්.

1171. කවර ධර්මයෝ නීවරණසම්ප්‍රයුක්ත වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ නීවරණධර්මයන් හා සම්ප්‍රයුක්ත වූවාහු ද, වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ නීවරණසම්ප්‍රයුක්තයෝ යි.

1172. කවර ධර්මයෝ නීවරණවිප්‍රයුක්ත වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ නීවරණධර්මයන්ගෙන් විප්‍රයුක්ත වූවාහු ද, වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ හැම රූප ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ නීවරණවිප්‍රයුක්තයෝ යි.

1173. කවර ධර්මයෝ නීවරණ ද නීවරණීය ද වෙති යත්:

ඒ නීවරණයෝ මැ නීවරණයෝ ද නීවරණීය වූවාහු ද වෙත්.

1174. කතමෙ ධම්මා නීවරණියා චෙව නො ච නීවරණා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා නීවරණියා තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා රූපක්ඛන්ධො. -පෙ- විඤ්ඤාණක්ඛන්ධො ච, ඉමෙ ධම්මා නීවරණියා චෙව නො ච නීවරණා.

1175. කතමෙ ධම්මා නීවරණා චෙව නීවරණසම්පයුත්තා ච:

කාමච්ඡන්දනීවරණං අවිජ්ජානීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, අවිජ්ජානීවරණං කාමච්ඡන්දනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, බ්‍යාපාදනීවරණං අවිජ්ජානීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච. අවිජ්ජානීවරණං බ්‍යාපාදනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, ථිනමිද්ධනීවරණං අවිජ්ජානීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, අවිජ්ජානීවරණං ථිනමිද්ධනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, උද්ධච්චනීවරණං අවිජ්ජානීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, අවිජ්ජානීවරණං උද්ධච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, කුක්කුච්චනීවරණං අවිජ්ජානීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, අවිජ්ජානීවරණං කුක්කුච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, විචිකිච්ඡානීවරණං අවිජ්ජානීවරණෙන නීවරණඤ්චෙව නීවරණසම්පයුත්තඤ්ච, අවිජ්ජානීවරණං විචිකිච්ඡානීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, කාමච්ඡන්දනීවරණං උද්ධච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, උද්ධච්චනීවරණං කාමච්ඡන්දනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, බ්‍යාපාදනීවරණං උද්ධච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, උද්ධච්චනීවරණං බ්‍යාපාදනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, ථිනමිද්ධනීවරණං උද්ධච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, උද්ධච්චනීවරණං ථිනමිද්ධනීවරණෙන නීවරණඤ්චෙව නීවරණසම්පයුත්තං ච, කුක්කුච්චනීවරණං උද්ධච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, උද්ධච්චනීවරණං කුක්කුච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, විචිකිච්ඡානීවරණං උද්ධච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, උද්ධච්චනීවරණං විචිකිච්ඡානීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, අවිජ්ජානීවරණං උද්ධච්චනීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, උද්ධච්චනීවරණං අවිජ්ජානීවරණෙන නීවරණං චෙව නීවරණසම්පයුත්තං ච, ඉමෙ ධම්මා නීවරණා චෙව නීවරණසම්පයුත්තා ච.

1176. කතමෙ ධම්මා නීවරණසම්පයුත්තා චෙව නො ච නීවරණා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා තෙ ධම්මෙ ඨපෙත්වා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා නීවරණසම්පයුත්තා චෙව නො ච නීවරණා.

1177. කතමෙ ධම්මා නීවරණවිප්පයුත්තා නීවරණියා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා නීවරණවිප්පයුත්තා නීවරණියා.

1174. කවර ධම්යෝ නීවරණීය ද නො ද නීවරණ ද වෙති යත්:

යම් ධම් කෙනෙක් ඒ නීවරණධම්යන්ගෙන් නීවරණීය වෙත් ද ඒ ධම්යන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධම්යෝ ය, රූපස්කන්ධ ය, ... විඥනස්කන්ධ ය, යන මේ ධම්යෝ නීවරණීය ද නො ද නීවරණ ද වෙත්.

1175. කවර ධම්යෝ නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙති යත්:

කාමච්ඡන්දනීවරණය අවිද්‍යානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. අවිද්‍යානීවරණය කාමච්ඡන්දනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. ව්‍යාපාදනීවරණය අවිද්‍යානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. අවිද්‍යානීවරණය ව්‍යාපාදනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. ථිනමිද්ධනීවරණය අවිද්‍යානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. අවිද්‍යානීවරණය ථිනමිද්ධනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චනීවරණය අවිද්‍යානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. අවිද්‍යානීවරණය උද්ධච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. කුක්කුච්චනීවරණය අවිද්‍යානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. අවිද්‍යානීවරණය කුක්කුච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. විචිකිච්ඡානීවරණය අවිජ්ජානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. අවිජ්ජානීවරණය විචිකිච්ඡානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. කාමච්ඡන්දනීවරණය උද්ධච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චනීවරණය කාමච්ඡන්දනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. ව්‍යාපාදනීවරණය උද්ධච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි උද්ධච්චනීවරණය ව්‍යාපාදනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. ථිනමිද්ධනීවරණය උද්ධච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චනීවරණය ථිනමිද්ධනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. කුක්කුච්චනීවරණය උද්ධච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්ච නීවරණය කුක්කුච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි විචිකිච්ඡානීවරණය උද්ධච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චනීවරණය විචිකිච්ඡානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි අවිජ්ජානීවරණය උද්ධච්චනීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වෙයි උද්ධච්චනීවරණය අවිජ්ජානීවරණය හා නීවරණ ද නීවරණසම්ප්‍රයුක්ත ද වේ. මේ ධම්යෝ නීවරණ වූවාහු ද නීවරණසම්ප්‍රයුක්ත වූවාහු ද වෙත්.

1176 කවර ධම්යෝ නීවරණසම්ප්‍රයුක්ත වූවාහු ද නො ද නීවරණ වූවාහු ද වෙති යත්:

යම් ධම් කෙනෙක් ඒ නීවරණධම්යන් හා සම්ප්‍රයුක්ත වූවාහු ද ඒ ධම්යන් තබා වෙදනාස්කන්ධ ය, ... විඥනස්කන්ධ ය, යන මේ ධම්යෝ නීවරණසම්ප්‍රයුක්ත වූවාහු ද නො ද නීවරණ වූවාහු ද වෙත්.

1177. කවර ධම්යෝ නීවරණවිප්‍රයුක්ත නීවරණීය වෙති යත්:

යම් ධම් කෙනෙක් ඒ නීවරණධම්යෙන් විප්‍රයුක්ත වූවාහු කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධම් කෙනෙක් ඇද්ද, රූපස්කන්ධ ය, ... විඥනස්කන්ධ ය, යන මේ ධම්යෝ නීවරණවිප්‍රයුක්ත නීවරණීය වෙත්.

1178. කතමෙ ධම්මා නීවරණවිප්පයුත්තා අනීවරණියා:

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නීවරණවිප්පයුත්තා අනීවරණියා.

නීවරණගොච්ඡකං.

1179. කතමෙ ධම්මා පරාමාසා:

දිට්ඨිපරාමාසො.

1180. තත්ථ කතමො දිට්ඨිපරාමාසො:

සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං[1] දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො[2] අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො, අයං වුච්චති දිට්ඨිපරාමාසො, සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨිපරාමාසො. ඉමෙ ධම්මා පරාමාසා.

1181. කතමෙ ධම්මා නො පරාමාසා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො පරාමාසා.

1182. කතමෙ ධම්මා පරාමට්ඨා:

සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා පරාමට්ඨා.

1183. කතමෙ ධම්මා අපරාමට්ඨා:

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අපරාමට්ඨා.

1184. කතමෙ ධම්මා පරාමාසසම්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා පරාමාසසම්පයුත්තා.

1185. කතමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා.

---

1 විසූකායිතං – සීමු. 2, 3    2 පතිග්ගාහො – සීමු. 3

1178. කවර ධම්මයෝ නීවරණවිප්‍රයුක්ත අනීවරණීය වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසඞ්ඛතධාතු ද යන මේ ධම්මයෝ නීවරණවිප්‍රයුක්ත අනීවරණීය වෙත්.

නීවරණගොච්ඡක යි.

1179. කවර ධම්මයෝ පරාමාස වෙති යත්:

දෘෂ්ටිපරාමර්ශය යි.

1180. එහි දෘෂ්ටිපරාමර්ශ කවරේ යත්:

සකන්ධ සඞ්ඛ්‍යාත ලෝකය ශාශ්වත යැ හෝ ලෝකය අශාශ්වත යැ හෝ ලෝකය අන්තවත් යැ හෝ ලෝකය අනන්තවත් යැ හෝ එ මැ ජීව යැ එ මැ ශරීර යැ යි හෝ ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ'යි හෝ සත්ත්වයා මරණින් මතුයෙහි වේ යයි හෝ සත්ත්වයා මරණින් මතුයෙහි නො වේ යයි හෝ සත්ත්වයා මරණින් මතුයෙහි වන්නේත් නො ද වන්නේත් වේ යයි හෝ සත්ත්වයා මරණින් මතුයෙහි නො මැ වෙයි නො වන්නේ නො වේ යයි හෝ මෙබඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිලෝමයෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් ග්‍රාහයෙක් පිහිටාසිටීමෙක් අභිනිවේශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්යාසග්‍රාහයෙක් ඇද්ද මේ දෘෂ්ටිපරාමර්ශය යි කියනු ලැබේ. හැම මිථ්‍යාදෘෂ්ටි දෘෂ්ටිපරාමර්ශ යි. මේ ධම්මයෝ පරාමර්ශයෝ යි.

1181. කවර ධම්මයෝ පරාමාස නො වෙති යත්:

ඒ පරාමාස ධම්මයන් තබා අවශේෂ කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘත ධම්මයෝ යැ වේදනාසකන්ධ යැ ... විඥානසකන්ධ යැ හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධම්මයෝ පරාමාස නො වෙත්.

1182. කවර ධම්මයෝ පරාමෘෂ්ට වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධම්මයෝ යැ රූපසකන්ධ යැ ... විඥානසකන්ධ යැ යන මේ ධම්මයෝ පරාමෘෂ්ටයෝ යි.

1183. කවර ධම්මයෝ අපරාමෘෂ්ට වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසඞ්ඛතධාතු ද යන මේ ධම්මයෝ අපරාමෘෂ්ටයෝ යි.

1184. කවර ධම්මයෝ පරාමර්ශසම්ප්‍රයුක්ත වෙති යත්:

යම් ධම් කෙනෙක් ඒ පරාමර්ශ ධම්මයන් හා සම්ප්‍රයුක්ත වූවාහු ද, වේදනාසකන්ධ යැ ... විඥානසකන්ධ යැ යන මේ ධම්මයෝ පරාමර්ශසම්ප්‍රයුක්තයෝ යි.

1185. කවර ධම්මයෝ පරාමර්ශවිප්‍රයුක්ත වෙති යත්:

යම් ධම් කෙනෙක් ඒ පරාමර්ශ ධම්මයන්ගෙන් විප්‍රයුක්ත වූවාහු ද, වේදනාසකන්ධ යැ ... විඥානසකන්ධ යැ, හැම රූප ද, අසඞ්ඛතධාතු ද යන මේ ධම්මයෝ පරාමර්ශවිප්‍රයුක්තයෝ යි.

1186 කතමෙ ධම්මා පරාමාසා චෙව පරාමට්ඨා ච:

සොවව පරාමාසො පරාමාසො චෙව පරාමට්ඨො ච.

1187. කතමෙ ධම්මා පරාමට්ඨා චෙව නො ච පරාමාසා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා පරාමට්ඨා, තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා සාසවා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා පරාමට්ඨා චෙව නො ච පරාමාසා.

1188. කතමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා පරාමට්ඨා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා සාසවා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා පරාමට්ඨා.

1189. කතමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨා:

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨා.

පරාමාසගොච්ඡකං.

1190. කතමෙ ධම්මා සාරම්මණා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සාරම්මණා.

1191 කතමෙ ධම්මා අනාරම්මණා:

සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනාරම්මණා.

1192. කතමෙ ධම්මා චිත්තා:

චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝානවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං කායවිඤ්ඤාණං මනොධාතු මනොවිඤ්ඤාණධාතු, ඉමෙ ධම්මා චිත්තා.

1193. කතමෙ ධම්මා නො චිත්තා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො චිත්තා.

1194. කතමෙ ධම්මා චෙතසිකා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චෙතසිකා.

1195. කතමෙ ධම්මා අචෙතසිකා:

චිත්තං ච සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අචෙතසිකා.

1186 කවර ධර්මයෝ පරාමර්ශ වූවාහු ද පරාමෘෂ්ට වූවාහු ද වෙති යත්:

ඒ පරාමර්ශ මැ පරාමර්ශ ද පරාමෘෂ්ට ද වෙත්.

1187. කවර ධර්මයෝ පරාමෘෂ්ට වූවාහු ද නො ද පරාමර්ශ වූවාහු ද වෙති යත්:

ඒ පරාමර්ශ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් පරාමෘෂ්ට වෙත් ද ඒ ධර්මයන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර සාස්‍රව වූ කුශලා-කුශලාව්‍යාකෘත ධර්මයෝ යැ, රූපස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ පරාමෘෂ්ට ද නො ද පරාමර්ශ ද වෙත්.

1188. කවර ධර්මයෝ පරාමර්ශ විප්‍රයුක්ත වූ පරාමෘෂ්ටයෝ වෙති යත්.

ඒ ධර්මයන්ගෙන් යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් ද, කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ යැ, රූපස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ පරාමර්ශවිප්‍රයුක්ත වූ පරාමෘෂ්ටයෝ යි.

1189. කවර ධර්මයෝ පරාමර්ශවිප්‍රයුක්ත අපරාමෘෂ්ටයෝ වෙති යත්:

අපර්යාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ පරාමර්ශවිප්‍රයුක්ත වූ අපරාමෘෂ්ටයෝ යි.

**පරාමාසගොච්ඡක යි.**

1190. කවර ධර්මයෝ සාරම්මණ වෙති යත්:

වේදනාස්කන්ධ යැ සංඥාස්කන්ධ යැ සංස්කාරස්කන්ධ යැ විඥානස්කන්ධ යි. මේ ධර්මයෝ සාලම්බනයෝ යි.

1191. කවර ධර්මයෝ අනාලම්බන වෙති යත්.

හැම රූප ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ අනාලම්බනයෝ යි.

1192. කවර ධර්මයෝ චිත්ත වෙති යත්:

චක්ෂුර්විඥාන යැ ශ්‍රොත්‍රවිඥාන යැ ඝ්‍රාණවිඥාන යැ ජිහ්වාවිඥාන යැ කායවිඥාන යැ මනොධාතු යැ මනොවිඥානධාතු යි. මේ ධර්මයෝ චිත්තයෝ යි.

1193. චිත්ත නො වූ ධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ යැ සංඥාස්කන්ධ යැ සංස්කාරස්කන්ධ යැ හැම රූප ද අසංඛතධාතු ද යන මොහු චිත්ත නො වූ ධර්මයෝ යි,

1194. කවර ධර්මයෝ චෛතසික වෙති යත්:

වේදනාස්කන්ධ යැ සංඥාස්කන්ධ යැ සංස්කාරස්කන්ධ යි. මේ ධර්මයෝ චෛතසිකයෝ යි

1195. කවර ධර්මයෝ අචෛතසික වෙති යත්:

චිත්තය ද හැම රූප ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ අචෛත-සිකයෝ යි.

1196. කතමෙ ධම්මා චිත්තසම්පයුත්තා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො. ඉමෙ ධම්මා චිත්තසම්පයුත්තා.

1197. කතමෙ ධම්මා චිත්තවිප්පයුත්තා:

සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා චිත්තවිප්පයුත්තා. චිත්තං න වත්තබ්බං චිත්තෙන සම්පයුත්තන්තිපි චිත්තෙන විප්පයුත්තන්තිපි.

1198. කතමෙ ධම්මා චිත්තසංසට්ඨා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො. ඉමෙ ධම්මා චිත්තසංසට්ඨා.

1199. කතමෙ ධම්මා චිත්තවිසංසට්ඨා:

සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා චිත්තවිසංසට්ඨා. චිත්තං න වත්තබ්බං චිත්තෙන සංසට්ඨන්තිපි චිත්තෙන විසංසට්ඨන්ති පි.

1200. කතමෙ ධම්මා චිත්තසමුට්ඨානා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං චිත්තජං චිත්තහෙතුකං චිත්තසමුට්ඨානං රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු අපොධාතු රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස උපචයො රූපස්ස සන්තති කබළීකාරො ආහාරො, ඉමෙ ධම්මා චිත්තසමුට්ඨානා.

1201. කතමෙ ධම්මා නො චිත්තසමුට්ඨානා:

චිත්තං ච අවසෙසං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො චිත්තසමුට්ඨානා.

1202. කතමෙ ධම්මා චිත්තසහභුනො:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො කායවිඤ්ඤත්ති වචී-විඤ්ඤත්ති, ඉමෙ ධම්මා චිත්තසහභුනො.

1203. කතමෙ ධම්මා නො චිත්තසහභුනො:

චිත්තං ච අවසෙසං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො චිත්තසහභුනො.

1204. කතමෙ ධම්මා චිත්තානුපරිවත්තිනො:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති, ඉමෙ ධම්මා චිත්තානුපරිවත්තිනො.

1196. කවර ධර්මයෝ චිත්තසම්ප්‍රයුක්ත වෙති යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ යි. මේ ධර්මයෝ චිත්තසම්ප්‍රයුක්තයෝ යි.

1197. කවර ධර්මයෝ චිත්තවිප්‍රයුක්ත වෙති යත්:

හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ චිත්තවිප්‍රයුක්තයෝ ය. චිත්තය චිත්තය හා සම්ප්‍රයුක්ත ය යි ද චිත්තයෙන් විප්‍රයුක්ත ය යි ද නො කියයුතු ය.

1198. කවර ධර්මයෝ චිත්තසංසෘෂ්ට වෙති යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ යි. මේ ධර්මයෝ චිත්තසංසෘෂ්ටයෝ යි.

1199. කවර ධර්මයෝ චිත්තවිසංසෘෂ්ට වෙති යත්:

හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ චිත්තවිසංසෘෂ්ටයෝ ය. චිත්තය සිත හා සංසෘෂ්ට යයි ද සිත හා විසංසෘෂ්ට යයි ද නො කියයුතු ය.

1200. චිත්තසමුට්ඨානධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, කායවිඥප්ති ය, වාග්විඥප්ති ය, යළි චිත්තජ වූ චිත්තහේතුක වූ චිත්තසමුට්ඨාන වූ යම් අන්‍ය රූපයෙකුත් ඇද්ද, රූපායතන ය, ශබ්දායතන ය, ගන්ධායතන ය, රසායතන ය, ස්ප්‍රෂ්ටව්‍යායතන ය, ආකාශධාතු ය, අබ්ධාතු ය, රූපයාගේ ලඝුතා ය, රූපයාගේ මෘදුතා ය, රූපයාගේ කර්මණ්‍යතා ය, රූපයාගේ උපචය ය, රූපයාගේ සන්තති ය, කවලීකාරාහාර ය, යන මේ ධර්මයෝ චිත්තසමුට්ඨානයෝ යි.

1201. කවර ධර්මයෝ චිත්තසමුට්ඨාන නො වෙති යත්:

චිත්තය ද අවශේෂරූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ චිත්තසමුට්ඨාන නො වූවාහු වෙත්.

1202. කවර ධර්මයෝ චිත්තසහභූ වෙති යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, කායවිඥප්ති ය, වාග්විඥප්ති ය, යන මේ ධර්මයෝ චිත්තසහභූ (සිත හා එක්ව උපදනාහු) වෙත්.

1203. කවර ධර්මයෝ චිත්තසහභූ නො වෙති යත්:

චිත්තය ද අවශේෂ රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ සිත හා එක් ව නූපදනාහු වෙත්.

1204. කවර ධර්මයෝ චිත්තානුපරිවර්ති වෙති යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, කායවිඥප්ති ය, වාග්විඥප්ති ය, යන මේ ධර්මයෝ චිත්තානුපරිවර්තිහු වෙත්.

1205. කතමෙ ධම්මා නො චිත්තානුපරිවත්තිනො:

චිත්තං ච අවසෙසං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො චිත්තානුපරිවත්තිනො.

1206. කතමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානා.

1207. කතමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානා:

චිත්තං ච සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානා.

1208. කතමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො.

1209. කතමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො:

චිත්තං ච සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො.

1210. කතමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො

1211. කතමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො:

චිත්තං ච සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො.

1212. කතමෙ ධම්මා අජ්ඣත්තිකා:

චක්ඛායතනං -පෙ- මනායතනං, ඉමෙ ධම්මා අජ්ඣත්තිකා.

1213. කතමෙ ධම්මා බාහිරා:

රූපායතනං -පෙ- ධම්මායතනං, ඉමෙ ධම්මා බාහිරා.

1214. කතමෙ ධම්මා උපාදා:

චක්ඛායතනං -පෙ- කබළිඞ්කාරො[1] ආහාරො, ඉමෙ ධම්මා උපාදා.

1215. කතමෙ ධම්මා නො උපාදා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො චත්තාරො ච මහාභූතා අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො උපාදා.

1. කබළීකාරො - සීමු. 2, 3.

1205. කවර ධර්මයෝ චිත්තානුපරිවර්ති නො වෙති යත්:

චිත්තය ද අවශේෂ රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ චිත්තානුපරිවර්ති නො වෙත්.

1206. කවර ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථාන වෙති යත්:

වෙදනාස්කන්ධ යැ සංඥාස්කන්ධ යැ සංස්කාරස්කන්ධ යැ යන මේ ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානයෝ යි.

1207. කවර ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථාන නො වෙති යත්:

චිත්තය ද හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථාන නො වෙත්.

1208. කවර ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ වෙති යත්:

වෙදනාස්කන්ධ යැ සංඥාස්කන්ධ යැ සංස්කාරස්කන්ධ යැ යන මේ ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ වෙත්.

1209. කවර ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ නො වෙති යත්:

චිත්තය ද හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ නො වෙත්.

1210. කවර ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්ති වෙති යත්:

වෙදනාස්කන්ධ යැ සංඥාස්කන්ධ යැ සංස්කාරස්කන්ධ යැ යන මේ ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානඅනුපරිවර්ති වෙත්.

1211. කවර ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්ති නො වෙති යත්:

චිත්තය ද හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ චිත්තසංසෘෂ්ටසමුත්ථානඅනුපරිවර්ති නො වෙත්

1212. ආධ්‍යාත්මික ධර්මයෝ කවරහ යත්:

චක්ෂුරායතන යැ ... මනායතන යැ යන මේ ධර්මයෝ ආධ්‍යාත්මිකයෝ යි.

1213. බාහ්‍ය ධර්මයෝ කවරහ යත්:

රූපායතන යැ ... ධර්මායතන යැ යන මේ ධර්මයෝ බාහ්‍යයෝ යි.

1214. උපාදා ධර්මයෝ කවරහ යත්:

චක්ෂුරායතන යැ .. කවලීකාරාහාර යැ යන මොහු උපාදා (භූතයන් නිසා පවත්නා) ධර්මයෝ යි.

1215. උපාදා නො වූ ධර්මයෝ කවරහ යත්:

වෙදනාස්කන්ධ යැ සංඥාස්කන්ධ යැ සංස්කාරස්කන්ධ යැ විඥානස්කන්ධ යැ සතර මහාභූතයෝ යැ අසඞ්ඛතධාතු යැ යන මොහු උපාදා නො වූ (භූතයන් නො නිසා පවත්නා) ධර්මයෝ යි.

1216. කතමෙ ධම්මා උපාදින්නා:

සාසවා කුසලාකුසලානං ධම්මානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, යං ච රූපං කම්මස්ස කතත්තා, ඉමෙ ධම්මා උපාදින්නා.

1217. කතමෙ ධම්මා අනුපාදින්නා:

සාසවා කුසලාකුසලා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, යෙ ච ධම්මා කිරියා නෙව කුසලා නාකුසලා න ච කම්මවිපාකා, යං ච රූපං න කම්මස්ස කතත්තා, අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනුපාදින්නා.

**මහන්තරදුකං**

1218. කතමෙ ධම්මා උපාදානා:

චත්තාරි උපාදානානි: කාමූපාදානං දිට්ඨුපාදානං සීලබ්බතුපාදානං අත්තවාදුපාදානං.

1219. තත්ථ කතමං කාමූපාදානං:

යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං, ඉදං වුච්චති කාමූපාදානං.

1220. තත්ථ කතමං දිට්ඨුපාදානං:

නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො නත්ථි පරො ලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො, ඉදං වුච්චති දිට්ඨුපාදානං, ඨපෙත්වා සීලබ්බතුපාදානං ච අත්තවාදුපාදානං ච, සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨුපාදානං.

1221. තත්ථ කතමං සීලබ්බතුපාදානං:

ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි වතෙන සුද්ධි සීලබ්බතෙන සුද්ධීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො, ඉදං වුච්චති සීලබ්බතුපාදානං.

1216. උපාදින්නධර්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලධර්මයන්ගේ විපාකයෝ යැ වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යම් කර්මයාගේ කෘතත්වාත් රූපයෙක් ඇද්ද එ ද යන මේ ධර්මයෝ උපාදින්නයෝ යි

1217. අනුපාදින්න ධර්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර සාස්‍රව වූ කුශලාකුශල ධර්මයෝ යැ. වේදනාස්කන්ධ යැ .. විඥානස්කන්ධ යැ නො මැ කුසල් වූ අකුසල් නො වූ නො ද කර්මවිපාක වූ යම් ක්‍රියා ධර්ම කෙනෙකුත් ඇද්ද, කර්මයාගේ කෘතත්වාත් නො වූ යම් රූපයෙකුත් ඇද්ද, අපර්යාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ අනුපාදින්නයෝ යි.

මහන්තරදුක යි.

1218. උපාදානධර්මයෝ කවරහ යත්:

උපාදානයෝ සතර දෙනෙකි: කාමූපාදාන යැ දිට්ඨුපාදාන යැ සීලබ්බතුපාදාන යැ අත්තවාදූපාදාන යි.

1219. එහි කාමූපාදාන කවරෙ යත්:

පඤ්චකාමගුණයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නේහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ඡායෙක් කාමාධ්‍යවසානයෙක් ඇද්ද, මේ කාමූපාදාන යයි කියනු ලැබේ.

1220. එහි දිට්ඨුපාදාන කවරෙ යත්:

දුන් දූය ඵලවිපාක නැත යාගයෙහි ඵලවිපාක නැත හෝමයෙහි ඵලවිපාක නැත සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක නැත මෙ ලොව නැත පරලොව නැත මවු නැත පියා නැත ඖපපාතික සත්ත්වයෝ නැත ලොවැ යම් කෙනෙක් මෙලොව ද පරලොව ද තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් ද එබඳු වූ සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න ශ්‍රමණබ්‍රාහ්මණයෝ නැතැ’යි මෙබඳු යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිලෝමයෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් ග්‍රාහයෙක් පිහිටාසිටීමෙක් අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුන්මාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්යාසග්‍රාහයෙක් ඇද්ද, මේ දිට්ඨුපාදාන යයි කියනු ලැබේ. සීලබ්බතුපාදානය ද අත්තවාදූපාදානය ද තබා හැම මිථ්‍යාදෘෂ්ටි දිට්ඨුපාදාන නමි.

1221. එහි සීලබ්බතුපාදාන කවරෙ යත්:

මෙ සස්නෙන් බැහැර මහණබමුණන්ගේ ශීලයෙන් ශුද්ධි යැ ව්‍රතයෙන් ශුද්ධි යැ ශීලව්‍රතයෙන් ශුද්ධි යැ යි මෙබඳු යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිලෝමයෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් දෘඪග්‍රාහයෙක් පිහිටාසිටීමෙක් බැසගෙන සිටීමෙක් පරාමර්ශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්යාසග්‍රාහයෙක් ඇද්ද, මේ සීලබ්බතුපාදාන නමි.

1222. තත්ථ කතමං අත්තවාදුපාදානං:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො, ඉදං වුච්චති අත්තවාදුපාදානං.

ඉමෙ ධම්මා උපාදානා.

1223. කතමෙ ධම්මා නො උපාදානා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො උපාදානා.

1224. කතමෙ ධම්මා උපාදානියා:

සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා උපාදානියා.

1225. කතමෙ ධම්මා අනුපාදානියා:

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනුපාදානියා.

1226. කතමෙ ධම්මා උපාදානසම්පයුත්තා

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා උපාදානසම්පයුත්තා.

1227. කතමෙ ධම්මා උපාදානවිප්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා උපාදානවිප්පයුත්තා

1228. කතමෙ ධම්මා උපාදානා චෙව උපාදානියා ච:

තානෙව උපාදානානි උපාදානා චෙව උපාදානියා ච.

1222. එහි අත්තවාදුපාදාන කවරේ යත්:

මෙලොව්හි අශ්‍රැතවත් පෘථග්ජන ආර්‍ය්‍යයන් නො දක්නේ ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ වූයේ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූයේ සත්පුරුෂයන් නො දක්නේ සත්පුරුෂධර්මයට අදක්ෂ වූයේ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූයේ රූපය ආත්ම හෙයින් දකී, ආත්මය රූපවත් යයි හෝ දකී, ආත්මයෙහි රූපය ඇතැයි හෝ දකී, රූපයෙහි ආත්මය ඇතැ යි හෝ දකී, වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ආත්ම හෙයින් දකී, ආත්මය විඥානවත් යයි හෝ දකී, ආත්මයෙහි විඥානය ඇතැයි හෝ දකී, විඥානයෙහි ආත්මය ඇතැයි හෝ දකී, මෙබඳු යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලොමදෘෂ්ටියෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් ග්‍රාහයෙක් පිහිටා සිටීමෙක් බැසගෙන සිටීමෙක් පරාමර්ශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්‍ය්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ ආත්මවාදෝපාදාන යයි කියනු ලැබේ.

මේ ධර්මයෝ උපාදානයෝ යි.

1223. උපාදාන නො වූ ධර්මයෝ කවරහ යත්:

ඒ උපාදානධර්මයන් තබා කාමාවචර රූපාවචර අරූපාවචර අපර්‍ය්‍යාපන්න වූ සෙසු කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය. වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, හැම රූප ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ උපාදාන නො වෙත්.

1224. කවර ධර්මයෝ උපාදානීය වෙති යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ ය, රූපස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, යන මේ ධර්මයෝ උපාදානීය වෙත්.

1225. කවර ධර්මයෝ අනුපාදානීය වෙති යත්:

අපර්‍ය්‍යාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මොහු අනුපාදානීය ධර්මයෝ වෙත්.

1226. කවර ධර්මයෝ උපාදානසම්ප්‍රයුක්ත වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ උපාදානධර්මයන් හා සම්ප්‍රයුක්ත වෙත් ද, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, යන මේ ධර්මයෝ උපාදානසම්ප්‍රයුක්ත වෙත්.

1227 කවර ධර්මයෝ උපාදානවිප්‍රයුක්ත වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ උපාදානධර්මයන්ගෙන් විප්‍රයුක්ත වෙත් ද, වේදනාස්කන්ධ ය ... විඥානස්කන්ධ ය, හැම රූප ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ උපාදානවිප්‍රයුක්ත වෙත්.

1228. කවර ධර්මයෝ උපාදාන ද උපාදානීය ද වෙති යත්:

ඒ උපාදානයෝ මැ උපාදාන ද උපාදානීය ද වෙත්.

1229. කතමෙ ධම්මා උපාදානියා චෙව නො ච උපාදානා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා උපාදානියා තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා උපාදානියා චෙව නො ච උපාදානා.

1230. කතමෙ ධම්මා උපාදානා චෙව උපාදානසම්පයුත්තා ච:

දිට්ඨුපාදානං කාමුපාදානෙන උපාදානං චෙව උපාදානසම්පයුත්තං ච, කාමුපාදානං දිට්ඨුපාදානෙන උපාදානං චෙව උපාදානසම්පයුත්තං ච, සීලබ්බතුපාදානං කාමුපාදානෙන උපාදානං චෙව උපාදානසම්පයුත්තං ච, කාමුපාදානං සීලබ්බතුපාදානෙන උපාදානං චෙව උපාදානසම්පයුත්තං ච, අත්තවාදුපාදානං කාමුපාදානෙන උපාදානං චෙව උපාදානසම්පයුත්තං ච, කාමුපාදානං අත්තවාදුපාදානෙන උපාදානං චෙව උපාදානසම්පයුත්තං ච, ඉමෙ ධම්මා උපාදානා චෙව උපාදානසම්පයුත්තා ච.

1231. කතමෙ ධම්මා උපාදානසම්පයුත්තා චෙව නො ච උපාදානා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා තෙ ධම්මෙ ඨපෙත්වා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා උපාදානසම්පයුත්තා චෙව නො ච උපාදානා.

1232. කතමෙ ධම්මා උපාදානවිප්පයුත්තා උපාදානියා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා උපාදානවිප්පයුත්තා උපාදානියා.

1233. කතමෙ ධම්මා උපාදානවිප්පයුත්තා අනුපාදානියා:

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා උපාදානවිප්පයුත්තා අනුපාදානියා.

උපාදානගොච්ඡකං

නික්ඛෙප කණ්ඩෙ

දුතියක භාණවාරං නිට්ඨිතං.

1229. කවර ධර්මයෝ උපාදානීය ද නො ද උපාදාන ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ උපාදානධර්මයන් විසින් උපාදානීය වෙත් ද ඒ ධර්මයන් තබා කාමාවචර රූපාවචර අරූපාවචර වූ සෙසු සාස්‍රව කුශලා-කුශලාව්‍යාකෘත ධර්මයෝ යැ රූපස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ උපාදානීය ද නො ද උපාදාන ද වෙත්.

1230. කවර ධර්මයෝ උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වෙති යත්:

දිට්ඨුපාදානය කාමුපාදානය හා උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වෙයි. කාමුපාදානය දිට්ඨුපාදානය හා උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වෙයි. සීලබ්බතුපාදානය කාමුපාදානය හා උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වෙයි. කාමුපාදානය සීලබ්බතුපාදානය හා උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වෙයි. අත්තවාදුපාදානය කාමුපාදානය හා උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වෙයි. කාමුපාදානය අත්තවාදුපාදානය හා උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වෙයි. මේ ධර්මයෝ උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වෙත්.

1231. කවර ධර්මයෝ උපාදානසම්ප්‍රයුක්ත ද නො ද උපාදාන ද වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ උපාදානධර්මයන් හා සම්ප්‍රයුක්ත වෙත්ද, ඒ ධර්මයන් තබා වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ උපාදානසම්ප්‍රයුක්ත ද නො ද උපාදාන ද වෙත්.

1232. කවර ධර්මයෝ උපාදානවිප්‍රයුක්ත වූ උපාදානීය වෙති යත්:

යම් ධර්ම කෙනෙක් ඒ උපාදානධර්මයන්ගෙන් විප්‍රයුක්ත වූවාහු වෙත් ද කාමාවචර රූපාවචර අරූපාවචර සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ යැ රූපස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ උපාදානවිප්‍රයුක්ත උපාදානීය වෙත්.

1233. කවර ධර්මයෝ උපාදානවිප්‍රයුක්ත අනුපාදානීය වෙති යත්:

අපර්‍යාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ උපාදානවිප්‍රයුක්ත අනුපාදානීය වෙත්.

උපාදානගොච්ඡක යි.

නික්ෂෙපකාණ්ඩයෙහි

දෙවැනි බණවර නිමි.

1234. කතමෙ ධම්මා කිලෙසා:

දස කිලෙසවත්ථූනි. ලොභො දොසො මොහො මානො දිට්ඨි විචිකිච්ඡා ථිනං උද්ධච්චං අහිරිකං අනොත්තප්පං.

1235. තත්ථ කතමො ලොභො:

යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දී නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පලිගෙධො සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා සඤ්ජනනී සිබ්බනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසටා ආයූහනී දුතියා පණිධි භවනෙත්ති වනං වනථො සන්ථවො සිනෙහො අපෙක්ඛා පටිබන්ධු ආසා ආසිංසනා ආසිංසිතත්තං රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා සාධුකම්‍යතා අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සම්පත්ථනා කාමතණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡාදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබළිසං මාරවිසයො තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො අභිජ්ඣා ලොභො අකුසලමූලං, අයං වුච්චති ලොභො.

1236. තත්ථ කතමො දොසො:

අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති, ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අට්ඨානෙ වා පන ආඝාතො ජායති, යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති දොසො.

1234. කවර ධර්මයෝ ක්ලේශ වෙති යත්:

ක්ලේශ වස්තූහු දශ දෙනෙකි. ලෝභ යැ ද්වෙෂ යැ මෝහ යැ මාන යැ දෘෂ්ටි යැ විචිකිත්සා යැ ස්ත්‍යාන යැ මිද්ධ යැ අහ්‍රීක යැ අනපත්‍රපා යි.

1235. එහි ලෝභ කවරේ යත්:

යම් රාගයෙක් බලවත් රාගයෙක් අරමුණෙහි සත්ත්වයන්ගේ පැමිණ-වීමෙක් ඇවිරීමෙක් (භවයෙහි) ඇලීමෙක් නන්දි සඞ්ඛ්‍යාත රාගයෙක් චිත්තයාගේ සංරාගයෙක් ඉච්ඡායෙක් මූර්ඡායෙක් බැසගෙන සිටීමෙක් ගිජු වීමෙක් හාත්පසින් ගිජු වීමෙක් ඇලීමෙක් පඞ්කයෙක් භවයට ඇදීමෙක් වඤ්චායෙක් (සසරවට සත්ත්වයන්) ඉපැදවීමෙක් (සත්ත්වයන් දුක හා සමග යොදමින්) ඉපැදවීමෙක් (සසරවට) තිවීමෙක් ජාලිනියක් (තෘෂ්ණා සඞ්ඛ්‍යාත) නදියක් විසත්තිකායෙක් විසතායෙක් ආයූහනියෙක් (සහාය වන හෙයින්) දෙවැන්නක් ප්‍රණිධියෙක් භවනෙත්තියෙක් (ඒ ඒ අරමුණෙහි ඇලෙන හෙයින්) වනයෙක් බලවත් වූ ගහනයෙක් සන්ථවයෙක් ස්නෙහයෙක් අපෙක්ෂායෙක් ප්‍රතිබන්ධුයෙක් ආශායෙක් ආශංසායෙක් ආශංසිත බවෙක් රූපයෙහි ආශායෙක් ශබ්දාශායෙක් ගන්ධාශායෙක් රසාශායෙක් ස්ප්‍රෂ්ටව්‍යා-ශායෙක් ධනාශායෙක් පුත්‍රාශායෙක් ජීවිතාශායෙක් (ජල්පන කරන හෙයින්) ජල්පායෙක් ප්‍රකෘෂ්ටජල්පායෙක් අභිජල්පායෙක් ජල්පනයෙක් ජල්පිත බවෙක් පුනපුනා අරමුණෙහි ලොල් වීමෙක් ලොලුපාකාරයෙක් ලොලුපායිත බවෙක් නගුට සලන බවෙක් මිහිරි අරමුණු කැමැති වන බවෙක් අධර්මරාගයෙක් විෂමලොභයෙක් නිකාන්තියෙක් නිකාමනයෙක් ප්‍රාර්ථනායෙක් පිහායෙක් සම්ප්‍රාර්ථනායෙක් කාමතෘෂ්ණායෙක් භවතෘෂ්ණායෙක් විභවතෘෂ්ණායෙක් රූපතෘෂ්ණායෙක් අරූපතෘෂ්ණායෙක් නිරොධතෘෂ්ණායෙක් රූපතෘෂ්ණා-යෙක් ශබ්දතෘෂ්ණායෙක් ගන්ධතෘෂ්ණායෙක් රසතෘෂ්ණායෙක් ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණායෙක් ධර්මතෘෂ්ණායෙක් ඔඝයෙක් යොගයෙක් ග්‍රන්ථයෙක් උපාදාන යෙක් ආවරණයෙක් නීවරණයෙක් (කුසල්දහම් වසන හෙයින්) ඡාදනයෙක් බන්ධනයෙක් උපක්ලේශයෙක් අනුශයයෙක් (උපදනා කුශලවාරයගත්තා) පර්‍ය්‍යුත්ථානයෙක් (පරිවේෂ්ටන කරන හෙයින්) ලතායෙක් (විවිධ වස්තු කැමැති වන හෙයින්) විවිධ වීප්සායෙක් දුඃඛමූලයෙක් දුඃඛනිදානයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබඩිශයෙක් මාරවිෂයයෙක් තෘෂ්ණා නදියෙක් තෘෂ්ණාසඞ්ඛ්‍යාත ජාලයෙක් තෘෂ්ණා සඞ්ඛ්‍යාත ගර්දුල (බලුබැඳුම) යෙක් තෘෂ්ණාසමුද්‍රයෙක් දූෂිලොභයෙක් ලොභ අකුශලමූලයෙක් ඇද්ද මේ ලොභ යයි කියනු ලැබේ.

1236. එහි ද්වෙෂ කවරේ යත්:

මට අවැඩ කළැයි කෝප උපදී. මට අවැඩ කෙරෙයි කෝප උපදී. මට අවැඩ කරන්නේ වනැයි කෝප උපදී. මාගේ ප්‍රිය මනාප වූවහුට අවැඩකළැයි අවැඩ කෙරෙයි... අවැඩ කරන්නේ යයි කෝප උපදී. මාගේ අප්‍රිය අමනාප වූවහුට අර්ථ කළැයි ... අර්ථ කෙරෙයි ... අර්ථ කරන්නේ යයි කෝප උපදී. යම් අස්ථානයෙහි හෝ කෝප උපදී. මෙබඳු චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කෝපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකෝපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් සිත පෙරළීමෙක් චිත්තයාගේ ප්‍රද්වෙෂයෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාරයෙක් ක්‍රොධ කරන බවෙක් දෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිත බවෙක් ව්‍යාපත්ති-යෙක් ව්‍යාපත්ති ආකාරයෙක් ව්‍යාපාදිත බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධ යෙක් සැඩ බවෙක් අපරිපූර්ණ වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් ඇද්ද මේ ද්වෙෂ යයි කියනු ලැබේ.

1237. තත්ථ කතමො මොහො:

දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසංගාහනා අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති මොහො.

1238. තත්ථ කතමො මානො:

සෙය්‍යොහමස්මීති මානො, සදිසොහමස්මීති මානො, හීනොහමස්මීති මානො, යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මානො

1239. තත්ථ කතමා දිට්ඨි:

සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං[1], දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො, අයං වුච්චති දිට්ඨි සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨි

1240. තත්ථ කතමා විචිකිච්ඡා:

සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති, සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති, සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, අපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචි-කිච්ඡති, යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා, ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසග්ගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ථම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො, අයං වුච්චති විචිකිච්ඡා.

1 දිට්ඨිවිසූකායිතං - සිමු 2

1237. එහි මෝහ කවරේ යත්:

දුඃඛය නො දැනීම දුඃඛසමුදය නො දැනීම දුඃඛනිරොධය නො දැනීම දුඃඛනිරොධගාමිනීප්‍රතිපත් නො දැනීම පූර්වාන්තය නො දැනීම අපරාන්තය නො දැනීම පූර්වාන්තාපරාන්තය නො දැනීම ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන් නො දැනීම යන මෙබඳු වූ යම් නො දැනීමෙක් අදර්ශනයෙක් අනභිසමයෙක් අනවබෝධයෙක් අසම්බෝධයෙක් අප්‍රතිවෙධයෙක් අසංගාහනායෙක් දුර්මේධායෙක් බාල්‍යයෙක් අසම්ප්‍රජන්‍යයෙක් මොහයෙක් ප්‍රමොහයෙක් සම්මොහයෙක් අවිද්‍යායෙක් අවිද්‍යෞඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යානුශයෙක් අවිද්‍යාපර්‍ය්‍යුත්ථානයෙක් අවිද්‍යාලඞ්ගියෙක් මොහ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් ඇද්ද, මේ 'මොහ' යයි කියනු ලැබේ.

1238. එහි මාන කවරේ යත්:

'මම ශ්‍රෙෂ්ඨ වෙමි'යි මාන යැ 'මම සදෘශ වෙමි'යි මාන යැ 'මම හීන වෙමි'යි මාන යැ මෙබඳු වූ යම් මානයෙක් මාන ආකාරයෙක් මානිතු බවෙක් උන්නතියෙක් නගාතැබීමෙක් (මාන සඞ්ඛ්‍යාත) ධවජයෙක් සම්ප්‍රග්‍රාහයෙක් (චිත්තයාගේ) කෙතුකම්‍යතායෙක් ඇද්ද, මේ 'මාන' යයි කියනු ලැබේ.

1239. එහි දෘෂ්ටි කවර යත්:

'ලෝකය ශාශ්වත' යයි හෝ 'ලෝකය අශාශ්වත' යයි හෝ 'ලෝකය අන්තවත්' යයි හෝ 'ලෝකය අනන්තවත්' යයි හෝ 'එ මැ ජීව යැ එ මැ ශරීර යැ' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ' යි හෝ 'සත්ත්වයා මරණින් මතු වෙයි' හෝ 'සත්ත්වයා මරණින් මතු නො වෙයි' හෝ 'සත්ත්වයා මරණින් මතුයෙහි වන්නේත් නො වන්නේත් වේ' යයි හෝ 'සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වේ' යයි හෝ මෙබඳු යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිලොමයෙක් දෘෂ්ටිවිෂ්පන්දිතයෙක් දෘෂ්ටිසංයොජනයෙක් (දෘඪ) ග්‍රාහයෙක් පිහිටාගැන්මෙක් අභිනිවෙශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්‍ය්‍යාසග්‍රාහයෙක් වේ ද, මේ 'දෘෂ්ටි' යයි කියනු ලැබේ. හැම මිථ්‍යාදෘෂ්ටි මැ දෘෂ්ටි වේ.

1240. එහි විචිකිත්සා කවර යත්:

ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ධර්මයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. සඞ්ඝයා කෙරෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ශික්ෂායෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. පූර්වාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. අපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. පූර්වාන්තාපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පාදයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි. මෙබඳු වූ යම් සැකයෙක් සැකයට පැමිණීමෙක් සැකයට පැමිණි බවෙක් විමතියෙක් විචිකිත්සායෙක් ද්වෛළහකයෙක් ද්විධාපථයෙක් සංශයෙක් අනේකාන්තග්‍රාහයෙක් පසුබැසීමෙක් හාත්පසින් පසුබැසීමෙක් නො බැසගැනීමෙක් චිත්තයාගේ තද බවෙක් මනොවිලෙඛයෙක් ඇද්ද, මේ 'විචිකිත්සා' යයි කියනු ලැබේ.

1241. තත්ථ කතමං ථීනං:

යා චිත්තස්ස අකල්ලතා අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථීනං ථීයනා ථීයිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති ථීනං.

1242. තත්ථ කතමං උද්ධච්චං:

යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං වුච්චති උද්ධච්චං.

1243. තත්ථ කතමං අහිරිකං:

යං න හිරීයති හිරීයිතබ්බෙන, න හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති අහිරිකං.

1244. තත්ථ කතමං අනොත්තප්පං:

යං න ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන, න ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති අනොත්තප්පං.

ඉමෙ ධම්මා කිලෙසා.

1245. කතමෙ ධම්මා නො කිලෙසා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා නො කිලෙසා.

1246. කතමෙ ධම්මා සඞ්කිලෙසිකා:

සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඞ්කිලෙසිකා.

1247. කතමෙ ධම්මා අසඞ්කිලෙසිකා:

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අසඞ්කිලෙසිකා.

1248. කතමෙ ධම්මා සඞ්කිලිට්ඨා:

තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො තං සමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා සඞ්කිලිට්ඨා.

1241. එහි ථීනය කවරේ යත්:

චිත්තයාගේ යම් අකල්‍යතායෙක් අකම්මණ්‍යතායෙක් අවලීනයෙක් (පසුබැසීමෙක්) මොනොවට එල්බසිටීමෙක් හැකිළීමෙක් හැකුළුණු අයුරෙක් හැකුළුණු බවෙක් චිත්තයාගේ නො පැතිරීමෙක් නො පැතිරෙන අයුරෙක් නො පතල බවෙක් ඇද්ද, මේ 'ථීන' යයි කියනු ලැබේ.

1242. එහි ඖද්ධත්‍ය කවරේ යත්:

චිත්තයාගේ යම් උඩඟු බවෙක් අව්‍යුපශමයෙක් චිත්තයාගේ වික්ෂෙපයෙක් චිත්තයාගේ භ්‍රාන්ත බවෙක් ඇද්ද, මේ 'ඖද්ධත්‍ය' යයි කියනු ලැබේ.

1243. එහි අහ්‍රීක කවරේ යත්:

ජුගුප්සා කටයුතු යම් කායදුශ්චරිතාදියක් ජුගුප්සා නො කෙරේ ද, ලාමක අකුශලධර්මයන්ගේ පැමිණීම ජුගුප්සා නො කෙරේ ද, මේ 'අහ්‍රීක' යයි කියනු ලැබේ.

1243. එහි අනපත්‍රපා කවරේ යත්:

බිය වියයුතු කායදුශ්චරිතාදි හේතුයෙන් යම් නො බියවීමෙක් ඇද්ද ලාමක අකුශලධර්මයන්ගේ පැමිණීමෙන් නො බිය වීමෙක් ඇද්ද, මේ 'අනපත්‍රපා' යයි කියනු ලැබේ.

මේ ධර්මයෝ කෙලෙශයෝ යි.

1245. කෙලෙශ නො වූ ධර්මයෝ කවරහු යත්:

ඒ කෙලෙශධර්මයන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්ම කෙනෙක් ඇද්ද, වෙදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ, සියලු රූපය ද අසංඛතධාතු ද යන මොහු කෙලෙශ නො වූ ධර්මයෝ යි.

1246. සාංකෙලෙශිකධර්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ යැ රූපස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මොහු සාංකෙලෙශික ධර්මයෝ යි.

1247. අසාංකෙලෙශිකධර්මයෝ කවරහු යත්:

අපර්‍යාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මොහු අසාංකෙලශිකධර්මයෝ යි.

1248. සංක්ලිෂ්ටධර්මයෝ කවරහු යත්:

ලෝභ දේෂ මෝහ යන තුන් අකුශලමූලයෝ යැ එය හා එක් වැ සිටි කෙලශයෝ යැ එය හා සම්ප්‍රයුක්ත වූ වෙදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ තත්සමුත්ථාන වූ කායකර්ම යැ වාක්කර්ම යැ මනඃකර්ම යැ යන මොහු සංක්ලිෂ්ටධර්මයෝ යි.

1249. කතමෙ ධම්මා අසඞ්කිලිට්ඨා:

කුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අසඞ්කිලිට්ඨා.

1250. කතමෙ ධම්මා කිලෙසසම්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා කිලෙසසම්පයුත්තා.

1251 කතමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා.

1252. කතමෙ ධම්මා කිලෙසා චෙව සඞ්කිලෙසිකා ච:

තෙව කිලෙසා කිලෙසා චෙව සඞ්කිලෙසිකා ච.

1253. කතමෙ ධම්මා සඞ්කිලෙසිකා චෙව නො ච කිලෙසා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සඞ්කිලෙසිකා, තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඞ්කිලෙසිකා චෙව නො ච කිලෙසා.

1254. කතමෙ ධම්මා කිලෙසා චෙව සඞ්කිලිට්ඨා ච:

තෙව කිලෙසා කිලෙසා චෙව සඞ්කිලිට්ඨා ච.

1255. කතමෙ ධම්මා සඞ්කිලිට්ඨා චෙව නො ච කිලෙසා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සඞ්කිලිට්ඨා, තෙ ධම්මෙ ඨපෙත්වා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඞ්කිලිට්ඨා චෙව නො ච කිලෙසා.

1256. කතමෙ ධම්මා කිලෙසා චෙව කිලෙසසම්පයුත්තා ච:

ලොභො මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, මොහො ලොභෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, දොසො මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, මොහො දොසෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, මානො මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, මොහො මානෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, දිට්ඨි මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තා ච, මොහො දිට්ඨියා කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, විචිකිච්ඡා මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තා ච, මොහො විචිකිච්ඡාය කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, ථීනං මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මොහො ථීනෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, උද්ධච්චං මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මොහො උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අහිරිකං මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මොහො අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අනොත්තප්පං මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මොහො අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච.

1249. අසංකලිෂ්ටධම්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලඅව්‍යාකෘත ධම්මයෝ ය, වෙදනාස්කන්ධ ය, ... විඥානස්කන්ධ ය, හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධම්මයෝ අසංකලිෂ්ටයෝ යි.

1250. ක්ලේශසම්ප්‍රයුක්තධම්මයෝ කවරහ යත්:

ඒ ක්ලේශධම්මයන් හා යම් ධම් කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද වෙදනාස්කන්ධ ය, ... විඥානස්කන්ධ ය, යන මොහු ක්ලේශසම්ප්‍රයුක්තධම්මයෝ යි.

1251. ක්ලේශවිප්‍රයුක්තධම්මයෝ කවරහ යත්:

ඒ ක්ලේශධම්මයන් කෙරෙන් යම් ධම් කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද වෙදනාස්කන්ධ ය, .. විඥානස්කන්ධ ය, හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මොහු ක්ලේශවිප්‍රයුක්තධම්මයෝ යි.

1252 ක්ලේශ වූ ද සාංක්ලේශික වූ ධම්මයෝ කවරහ යත්:

එ මැ ක්ලේශයෝ ක්ලේශයෝත් සාංක්ලේශිකයෝත් වෙති.

1253. සාංක්ලේශික වූ ද නො ද ක්ලේශ වූ ධම්මයෝ කවරහ යත්:

යම් ධම් කෙනෙක් ඒ ක්ලේශධම්මයන් විසින් සාංක්ලේශික වූවාහු ද ඒ ධම්මයන් තබා අවශෙෂ වූ කාමාවචර රූපාවචර අරූපාවචර සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘතධම්මයෝ ය, රූපස්කන්ධ ය, ... විඥානස්කන්ධ ය, යන මොහු සාංක්ලේශික වූ ද නො ද ක්ලේශ වූ ධම්මයෝ යි.

1254. ක්ලේශ වූ ද සංකලිෂ්ට වූ ද ධම්මයෝ කවරහ යත්:

එ මැ ක්ලේශයෝ ක්ලේශයෝ ද සංකලිෂ්ටයෝ ද වෙති

1255. සංකලිෂ්ට වූ ද නො ද ක්ලේශ වූ ධම්මයෝ කවරහ යත්:

ඒ ක්ලේශධම්මයන් විසින් යම් ධම් කෙනෙක් සංකලිෂ්ට වූවාහු ද ඒ ධම්මයන් තබා වෙදනාස්කන්ධ ය, .. විඥානස්කන්ධ ය, යන මොහු සංකලිෂ්ට වූ ද නො ද ක්ලේශ වූ ධම්මයෝ යි.

1256. කවර ධම්මයෝ ක්ලේශ වූවාහු ද ක්ලේශසම්ප්‍රයුක්ත වූවාහු ද වෙති යත්:

ලෝභය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය ලොභය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි ද්වෙෂය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය ද්වෙෂය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මානය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය මානය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. දෘෂ්ටිය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය දෘෂ්ටිය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. විචිකිත්සාව මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය විචිකිච්ඡාව හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. ථීනය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය ථීනය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි.

ලොභො උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, උද්ධච්චං ලොභෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච දොසො උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, උද්ධච්චං දොසෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මොහො උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, උද්ධච්චං මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, මානො උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, උද්ධච්චං මානෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, දිට්ඨි උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තා ච, උද්ධච්චං දිට්ඨියා කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, විචිකිච්ඡා උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තා ච, උද්ධච්චං විචිකිච්ඡාය කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, ථීනං උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, උද්ධච්චං ථීනෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, අහිරිකං උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, උද්ධච්චං අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, අනොත්තප්පං උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, උද්ධච්චං අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච.

ලොභො අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අහිරිකං ලොභෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, දොසො අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අහිරිකං දොසෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මොහො අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අහිරිකං මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මානො අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අහිරිකං මානෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, දිට්ඨි අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තා ච, අහිරිකං දිට්ඨියා කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, විචිකිච්ඡා අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තා ච, අහිරිකං විචිකිච්ඡාය කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, ථීනං අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච අහිරිකං ථීනෙන කිලෙසො. චෙව කිලෙසසම්පයුත්තං ච, උද්ධච්චං අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච අහිරිකං උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, අනොත්තප්පං අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, අහිරිකං අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච.

ලොභො අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අනොත්තප්පං ලොභෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, දොසො අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අනොත්තප්පං දොසෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මොහො අනොත්තප්පෙන කිලෙසො චෙව, කිලෙසසම්පයුත්තො ච, අනොත්තප්පං මොහෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, මානො අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තො ච, අනොත්තප්පං මානෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, දිට්ඨි අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තා ච, අනොත්තප්පං දිට්ඨියා කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, විචිකිච්ඡා අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තා ච, අනොත්තප්පං විචිකිච්ඡාය කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, ථීනං අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, අනොත්තප්පං ථීනෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, උද්ධච්චං අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, අනොත්තප්පං උද්ධච්චෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, අහිරිකං අනොත්තප්පෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, අනොත්තප්පං අහිරිකෙන කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, ඉමෙ ධම්මා කිලෙසා චෙව කිලෙසසම්පයුත්තා ච.

ලෝභය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය ලෝභය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. ද්වේෂය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය ද්වේෂය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මානය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය මානය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. දෘෂ්ටිය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය දෘෂ්ටිය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. විචිකිච්ඡාව උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය විචිකිච්ඡාව හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. ථීනය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය ථීනය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වේ.

ලෝභය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය ලෝභය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. ද්වේෂය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය ද්වේෂය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මානය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය මානය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. දෘෂ්ටිය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය දෘෂ්ටිය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. විචිකිච්ඡාව අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය විචිකිච්ඡාව හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. ථීනය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය ථීනය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වේ.

ලෝභය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය ලෝභය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. ද්වේෂය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය ද්වේෂය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මෝහය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය මෝහය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. මානය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය මානය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. දිට්ඨිය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය දිට්ඨිය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. විචිකිච්ඡාව අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය විචිකිච්ඡාව හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. ථීනය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය ථීනය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. උද්ධච්චය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය උද්ධච්චය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අහිරිකය අනොත්තප්පය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වෙයි. අනොත්තප්පය අහිරිකය හා ක්ලේශ ද ක්ලේශසම්ප්‍රයුක්ත ද වේ.

මේ ධර්මයෝ ක්ලේශයෝත් ක්ලේශසම්ප්‍රයුක්තයෝත් වෙත්.

1257. කතමෙ ධම්මා කිලෙසසම්පයුත්තා චෙව නො ච කිලෙසා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා තෙ ධම්මෙ ඨපෙත්වා වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා කිලෙසසම්පයුත්තා චෙව නො ච කිලෙසා.

1258. කතමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා සඞ්කිලෙසිකා:

තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා සාසවා කුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා සඞ්කිලෙසිකා.

1259. කතමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා අසඞ්කිලෙසිකා:

අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා අසඞ්කිලෙසිකා

## කිලෙසගොච්ඡකං

1260 කතමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා:

තීණි සංයොජනානි: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො.

1261. තත්ථ කතමා සක්කායදිට්ඨි:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං -පෙ- යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං[1] දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං[2] දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො, අයං වුච්චති සක්කායදිට්ඨි.

1262. තත්ථ කතමා විචිකිච්ඡා:

සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති, සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති, සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, අපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචිකිච්ඡති යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා, ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ථම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො, අයං වුච්චති විචිකිච්ඡා.

1. ගහණං - සිමු, 2,
2. දිට්ඨිවිසූකායිකං - සිමු. 2

1257. කවර ධර්මයෝ ක්ලේශසම්ප්‍රයුක්ත ද නො ද ක්ලේශ ද වෙති යත්:

ඒ ක්ලේශධර්මයන් සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් තබා වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ ක්ලේශසම්ප්‍රයුක්ත ද නො ද ක්ලේශ ද වෙත්.

1258. කවර ධර්මයෝ ක්ලේශවිප්‍රයුක්ත සාංක්ලේශික වෙති යත්:

ඒ ක්ලේශධර්මයන් කෙරෙන් යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශල අව්‍යාකෘතධර්මයෝ යැ, රූපස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ ක්ලේශවිප්‍රයුක්ත ද සාංක්ලේශික ද වෙත්.

1259. කවර ධර්මයෝ ක්ලේශවිප්‍රයුක්ත අසාංක්ලේශික වෙති යත්:

අපරියාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මේ ධර්මයෝ ක්ලේශවිප්‍රයුක්ත අසාංක්ලේශිකයෝ යි.

**ක්ලේශගොච්ඡක යි**

1260. කවර ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වෙති යත්:

සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන තුන් සංයෝජනයෝ යැ.

1261. එහි සක්කායදිට්ඨි කවර යත්:

මෙලොව අශ්‍රුතවත් පෘථග්ජන ආර්‍යයන් නො දක්නේ ආර්‍යධර්මයට අදක්ෂ වූයේ ආර්‍යධර්මයෙහි නො හික්මුණේ සත්පුරුෂයන් නො දක්නේ සත්පුරුෂධර්මයට අදක්ෂ වූයේ සත්පුරුෂධර්මයෙහි නො හික්මුණේ රූපය ආත්ම හෙයින් දකී. රූපවත් වූ ආත්මය හෝ දකී. ආත්මයෙහි හෝ රූපය දකී. රූපයෙහි හෝ ආත්මය දකී. වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ආත්ම හෙයින් දකී. ආත්මය විඥානවත් කොට හෝ දකී. ආත්මයෙහි විඥානය ඇතැයි හෝ දකී. විඥානයෙහි හෝ ආත්මය ඇතැයි දකී. මෙබඳු වූ යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිසූකායිකයෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් ග්‍රාහයෙක් පිහිටාසිටීමෙක් අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'සක්කායදිට්ඨි' යයි කියනු ලැබේ

1262 එහි විචිකිච්ඡා කවර යත්:

ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කෙරෙයි. ධර්මයෙහි සැක කෙරෙයි. සංඝයා කෙරෙහි සැක කෙරෙයි. ශික්ෂායෙහි සැක කෙරෙයි පූර්වාන්තයෙහි සැක කෙරෙයි. අපරාන්තයෙහි සැක කෙරෙයි. පූර්වාන්තාපරාන්තයෙහි සැක කෙරෙයි. ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පාදයෙහි සැක කෙරෙයි. මෙබඳු යම් සැකයෙක් සැක කරන අයුරෙක් සැකයට පැමිණි බවෙක් විමතියෙක් විචිකිත්සායෙක් දෙලුහකයෙක් දෙඩාපථයෙක් සංශයෙක් අනෙකාංශග්‍රාහයෙක් ආසප්පණයෙක් පරිසප්පණයෙක් අපරියෝගාහනයෙක් චිත්තයාගේ දැඩි බවෙක් මනොවිලෙඛයෙක් ඇද්ද, මේ ''විචිකිච්ඡා' යයි කියනු ලැබේ

1263. තත්ථ කතමො සීලබ්බතපරාමාසො:

ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි, වතෙන සුද්ධි, සීලබ්බතෙන සුද්ධීති යා එවරූපා දිට්ඨි -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති සීලබ්බතපරාමාසො. ඉමානි තීණි සංයොජනානි, තදෙකට්ඨා ච කිලෙසා, තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා.

1264. කතමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බා

1265 කතමෙ ධම්මා භාවනාය පහාතබ්බා:

අවසෙසො ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා, තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තං සමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බා.

1266 කතමෙ ධම්මා න භාවනාය පහාතබ්බා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාව්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න භාවනාය පහාතබ්බා

1267. කතමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා:

තීණි සංයොජනානි: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො.

1268 තත්ථ කතමා සක්කායදිට්ඨි,

ඉධ අස්සුතවා පුථුජ්ජනො -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති සක්කායදිට්ඨි.

1269. තත්ථ කතමා විචිකිච්ඡා:

සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති -පෙ- ඡම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො, අයං වුච්චති විචිකිච්ඡා.

1270. තත්ථ කතමො සීලබ්බතපරාමාසො:

ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති සීලබ්බතපරාමාසො.

ඉමානි තීණි සංයොජනානි, තදෙකට්ඨා ච කිලෙසා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා.

1263 එහි සීලබ්බතපරාමාස කවරේ යත්:

මෙ සස්නෙන් බැහැර මහණබමුණන්ගේ ශීලයෙන් ශුද්ධි යැ. ව්‍රතයෙන් ශුද්ධි යැ. ශීලව්‍රතයෙන් ශුද්ධි යැ යි මෙබඳුවූ යම් දෘෂ්ටියෙක් ... විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'සීලබ්බතපරාමාස' යයි කියනුලැබේ

මේ තුන් සංයොජනයෝ යැ. තදෙකට්ඨ කෙලශයෝ ද තත්සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ තත්සමුත්ථාන වූ කායකර්ම යැ වාක්කර්ම යැ මනඃකර්ම යැ යන මේ ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ යි.

1264. කවර ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො වෙති යත්:

ඒ ධර්මයන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘතධර්මයෝ යැ, වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මේ ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො වෙත්.

1265. භාවනායෙන් ප්‍රහාතව්‍යධර්මයෝ කවරහ යත්:

අවශිෂ්ට වූ ලොභ යැ ද්වෙෂ යැ මොහ යැ තදෙකට්ඨ කෙලශයෝ ද තත්සම්ප්‍රයුක්ත වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ තත්සමුත්ථාන වූ කායකර්ම යැ වාක්කර්ම යැ මනඃකර්ම යැ යන මොහු භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ යි.

1266 භාවනායෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ කවරහ යත්:

ඒ ධර්මයන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ යැ, වේදනාස්කන්ධ යැ විඥානස්කන්ධ යැ හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මොහු භාවනායෙන් ප්‍රහාතව්‍ය නො වන ධර්මයෝ යි

1267. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයෝ කවරහ යත්:

සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන තුන් සංයොජනයෝ යැ

1268. එහි සක්කායදිට්ඨි කවර යත්:

මෙලො වැ අශ්‍රුතවත් පෘථග්ජන ... විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'සක්කායදිට්ඨි' යයි කියනුලැබේ

1269 එහි විචිකිච්ඡා කවර යත්:

ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කෙරෙයි විචිකිච්ඡා කෙරෙයි ... චිත්තයාගේ දැඩි බවෙක් මනොවිලෙඛයෙක් ඇද්ද, මේ 'විචිකිච්ඡා' යයි කියනුලැබේ.

1270. එහි සීලබ්බතපරාමාස කවරේ යත්:

මෙ සස්නෙන් බැහැර මහණබමුණන්ගේ ශීලයෙන් ශුද්ධි යැ ... විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'සීලබ්බතපරාමාස' යයි කියනුලැබේ

මේ තුන් සංයොජනයෝ ද තදෙකට්ඨ කෙලශයෝ ද තත්සම්ප්‍රයුක්ත වේදනාස්කන්ධ යැ .. විඥානස්කන්ධ යැ තත්සමුත්ථාන වූ කායකර්ම යැ වාක්කර්ම යැ මනඃකර්ම යැ යන මොහු දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයෝ යි.

තීණි සඤ්ඤොජනානි සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා. තදෙකට්ඨො ලොභො දොසො මොහො, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතූ. තදෙකට්ඨා ච කිලෙසා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තං සමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා.

1271. කතමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බහෙතුකා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බහෙතුකා

1272. කතමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා:

අවසෙසො ලොභො දොසො මොහො, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතූ, තදෙකට්ඨා ච කිලෙසා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තංසමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා.

1273. කතමෙ ධම්මා න භාවනාය පහාතබ්බහෙතුකා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න භාවනාය පහාතබ්බහෙතුකා.

1274. කතමෙ ධම්මා සවිතක්කා:

සවිතක්කභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ විතක්කං ඨපෙත්වා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සවිතක්කා.

1275. කතමෙ ධම්මා අවිතක්කා:

අවිතක්කභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ. වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, විතක්කො ච, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අවිතක්කා.

1276. කතමෙ ධම්මා සවිචාරා:

සවිචාරභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ විචාරං ඨපෙත්වා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සවිචාරා:

1277. කතමෙ ධම්මා අවිචාරා:

අවිචාරභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, විචාරො ච සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අවිචාරා.

සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන මේ ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ යැ. තදෙකට්ඨ වූ ලෝභ යැ ද්වේෂ යැ මෝහ යැ යන මේ ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතූහු යැ. තදෙකට්ඨ ක්ලේශයෝ ද තත්සම්ප්‍රයුක්ත වේදනාස්කන්ධ යැ .. විඥානස්කන්ධ යැ තත්සමුට්ඨාන කායකර්ම යැ වාක්කර්ම යැ මනඃකර්ම යැ යන මොහු දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතු ඇති ධර්මයෝ යි.

1271. දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතු නැති ධර්මයෝ කවරහ යත්:

ඒ ධර්මයන් තබා අවශේෂ කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ යැ වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ හැම රූප ද අසංඛතධාතු ද යන මොහු දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතු නැති ධර්මයෝ යි.

1272. භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇති ධර්මයෝ කවරහ යත්:

සෙසු ලෝභ යැ ද්වේෂ යැ මෝහ යැ යන මේ ධර්මයෝ භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු වෙති. තදෙකට්ඨ ක්ලේශයෝ ද තත්සම්ප්‍රයුක්ත වේදනාස්කන්ධ යැ .. විඥානස්කන්ධ යැ තත්සමුට්ඨාන කායකර්ම යැ වාක්කර්ම යැ මනඃකර්ම යැ යන මොහු භාවනායෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයෝ යි.

1273. භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු නැති ධර්මයෝ කවරහ යත්:

ඒ ධර්මයන් තබා අවශේෂ වූ කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න කුශල-අව්‍යාකෘතධර්මයෝ යැ වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ හැම රූප ද අසංඛතධාතු ද යන මොහු භාවනායෙන් ප්‍රහාතව්‍ය හෙතු නැති ධර්මයෝ යැ.

1274. සවිතර්කධර්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අපරියාපන්න වූ සවිතර්කභූමියෙහි විතර්කය තබා ඒ විතර්කය හා සම්ප්‍රයුක්ත වේදනාස්කන්ධ යැ විඥානස්කන්ධ යැ යන මේ ධර්මයෝ සවිතර්කයෝ යි.

1275. අවිතර්කධර්මයෝ කවරහ යත්.

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න අවිතර්කභූමියෙහි වේදනාස්කන්ධ යැ විඥානස්කන්ධ යැ විතර්කය ද හැම රූප ද අසංඛතධාතු ද යන මොහු අවිතර්කධර්මයෝ යි.

1276. සවිචාරධර්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අපරියාපන්න සවිචාරභූමියෙහි විචාරය තබා තත්සම්ප්‍රයුක්ත වූ වේදනාස්කන්ධ යැ විඥානස්කන්ධ යැ යන මොහු සවිචාරධර්මයෝ යි.

1277. අවිචාරධර්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න අවිචාරභූමියෙහි වේදනාස්කන්ධ යැ... විඥානස්කන්ධ යැ විචාරය ද හැම රූප ද අසංඛතධාතු ද යන මොහු අවිචාරධර්මයෝ යි.

1278. කතමෙ ධම්මා සප්පීතිකා:

සප්පීතිකභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ පීතිං ඨපෙත්වා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සප්පීතිකා.

1279. කතමෙ ධම්මා අප්පීතිකා.

අප්පීතිකභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, පීති ච සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අප්පීතිකා.

1280 කතමෙ ධම්මා පීතිසහගතා:

පීතිභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ පීතිං ඨපෙත්වා තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා පීතිසහගතා.

1281. කතමෙ ධම්මා න පීතිසහගතා:

න පීතිභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, පීති ච සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න පීතිසහගතා.

1282. කතමෙ ධම්මා සුඛසහගතා:

සුඛභූමියං කාමාවචරෙ රූපාවචරෙ අපරියාපන්නෙ සුඛං ඨපෙත්වා තංසම්පයුත්තො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සුඛසහගතා.

1283. කතමෙ ධම්මා න සුඛසහගතා:

න සුඛභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො සුඛං ච, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න සුඛසහගතා.

1284. කතමෙ ධම්මා උපෙක්ඛාසහගතා:

උපෙක්ඛාභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ උපෙක්ඛං ඨපෙත්වා තංසම්පයුත්තො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා උපෙක්ඛාසහගතා.

1285 කතමෙ ධම්මා න උපෙක්ඛාසහගතා:

න උපෙක්ඛාභූමියං කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ අපරියාපන්නෙ වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, උපෙක්ඛා ච සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා න උපෙක්ඛාසහගතා.

1286. කතමෙ ධම්මා කාමාවචරා:

හෙට්ඨතො අවීචිනිරයං පරියන්තං කරිත්වා උපරිතො පරනිම්මිතවසවත්තී දෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධා ධාතු ආයතනා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, ඉමෙ ධම්මා කාමාවචරා.

1278. සප්‍රීතිකධම්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අපරියාපන්න සප්‍රීතිකභූමියෙහි ප්‍රීතිය තබා තත්සම්ප්‍රයුක්ත වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මොහු සප්‍රීතික ධම්මයෝ යි.

1279. අප්‍රීතිකධම්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න අප්‍රීතිකභූමියෙහි වේදනාස්කන්ධ යැ .. විඥානස්කන්ධ යැ ප්‍රීතිය ද හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මොහු අප්‍රීතිකධම්මයෝ යි.

1280 ප්‍රීතිසහගතධම්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අපරියාපන්න ප්‍රීතිභූමියෙහි ප්‍රීතිය තබා තත්-සම්ප්‍රයුක්ත වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මොහු ප්‍රීතිසහගත ධම්මයෝ යි.

1281. ප්‍රීතිසහගත නො වූ ධම්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න ප්‍රීති නො වූ භූමියෙහි වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ ප්‍රීතිය ද හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මොහු ප්‍රීතිසහගත නො වූ ධම්මයෝ යි

1282. සුඛසහගතධම්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අපරියාපන්න සුඛභූමියෙහි සුවය තබා තත්-සම්ප්‍රයුක්ත සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ විඥානස්කන්ධ යන මොහු සුඛසහගත ධම්මයෝ යි.

1283. සුඛසහගත නො වූ ධම්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න සුඛ නො වූ භූමියෙහි වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ සුවය ද හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මොහු සුඛසහගත නො වූ ධම්මයෝ යි

1284. උපෙක්ෂා සහගතධම්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න උපෙක්ෂා භූමියෙහි උපේක්ෂාව තබා තත්සම්ප්‍රයුක්ත සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ විඥානස්කන්ධ යන මොහු උපෙක්ෂාසහගත ධම්මයෝ යි.

1285. උපෙක්ෂාසහගත නො වූ ධම්මයෝ කවරහු යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න උපේක්ෂා නො වූ භූමියෙහි වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ උපෙක්ෂාව ද හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මොහු උපෙක්ෂාසහගත නො වූ ධම්මයෝ යි.

1286. කාමාවචර ධම්මයෝ කවරහු යත්:

යටින් අවීචිනිරය හිමි කොට මතුභාගයෙන් පරනිර්මිතවශවර්ති දෙවියන් ඇතුළු කොට මෙ අතුරෙහි මෙහි හැසිරෙන මෙහි පර්‍යාපන්න වූ යම් ස්කන්ධ ධාතු ආයතන රූප වේදනා සංඥා සංස්කාර විඥානයෙක් ඇද්ද, මොහු කාමාවචර ධම්මයෝ යි.

1287. කතමෙ ධම්මා න කාමාවචරා.

රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, ඉමෙ ධම්මා න කාමාවචරා.

1288. කතමෙ ධම්මා රූපාවචරා:

හෙට්ඨතො බ්‍රහ්මලොකං පරියන්තං කරිත්වා උපරිතො අකනිට්ඨෙ දෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා රූපාවචරා.

1289. කතමෙ ධම්මා න රූපාවචරා:

කාමාවචරා අරූපාවචරා අපරියාපන්නා, ඉමෙ ධම්මා න රූපාවචරා.

1290. කතමෙ ධම්මා අරූපාවචරා:

හෙට්ඨතො ආකාසානඤ්චායතනූපගෙ දෙවෙ පරියන්තං කරිත්වා උපරිතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා, ඉමෙ ධම්මා අරූපාවචරා.

1291. කතමෙ ධම්මා න අරූපාවචරා:

කාමාවචරා රූපාවචරා අපරියාපන්නා, ඉමෙ ධම්මා න අරූපාවචරා

1292. කතමෙ ධම්මා පරියාපන්නා:

සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා පරියාපන්නා.

1293. කතමෙ ධම්මා අපරියාපන්නා:

මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අපරියාපන්නා.

1294. කතමෙ ධම්මා නිය්‍යානිකා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, ඉමෙ ධම්මා නිය්‍යානිකා.

1295. කතමෙ ධම්මා අනිය්‍යානිකා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනිය්‍යානිකා.

1287. කාමාවචර නො වූ ධම්මයෝ කවරහ යත්:

රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ යම් ධම් කෙනෙක් ඇද්ද, මොහු කාමාවචර නො වූ ධම්මයෝ යි.

1288. රූපාවචරධම්මයෝ කවරහ යත්:

යට භාගයෙන් බඹලොව පිරියත් කොට මතුභාගයෙන් අකනිට්ඨ දෙවියන් ඇතුළු කොට මේ අතුරෙහි මෙහි හැසිරෙන මෙහි ඇතුළු වූ සමාපන්නයාගේ හෝ උපපන්නයාගේ හෝ දෘෂ්ටධම්මසුඛවිහාර ඇත්තහුගේ හෝ යම් චිත්තචෛතසිකධම් කෙනෙක් ඇද්ද, මොහු රූපාවචර ධම්මයෝ යි.

1289. රූපාවචර නො වූ ධම්මයෝ කවරහ යත්:

කාමාවචර අරූපාවචර අපරියාපන්න වූ යම් ධම් කෙනෙක් ඇද්ද, මොහු රූපාවචර නො වූ ධම්මයෝ යි.

1290. අරූපාවචරධම්මයෝ කවරහ යත්:

යටින් ආකාසානඤ්චායතනූපග දෙවියන් පිරියත් කොට උඩින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන් ඇතුළු කොට මේ අතුරෙහි මෙහි හැසිරෙන මෙහි ඇතුළු වැ සිටි සමාපන්නයාගේ හෝ උපපන්නයාගේ හෝ දිට්ඨධම්මසුඛවිහාරිහුගේ හෝ යම් චිත්තචෛතසික ධම් කෙනෙක් ඇද්ද, මොහු අරූපාවචර ධම්මයෝ යි.

1291. අරූපාවචර නො වූ ධම්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අපරියාපන්න වූ යම් ධම් කෙනෙක් ඇද්ද, මොහු අරූපාවචර නො වූ ධම්මයෝ යි.

1292. පරියාපන්නධම්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධම්මයෝ යැ රූපස්කන්ධ යැ … විඤ්ඤාණස්කන්ධ යැ යන මොහු පරියාපන්න ධම්මයෝ යි.

1293. අපරියාපන්නධම්මයෝ කවරහ යත්:

මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසඞ්ඛතධාතු ද යන මොහු අපරියාපන්න ධම්මයෝ යි.

1294. නෛර්‍යාණිකධම්මයෝ කවරහ යත්:

අපරියාපන්න වූ සතර මාර්ගයෝ යි. මොහු නෛර්‍යාණික ධම්මයෝ යි.

1295. අනෛර්‍යාණිකධම්මයෝ කවරහ යත්:

ඒ නෛර්‍යාණිකධම්මයන් තබා සෙසු කාමාවචර රූපාවචර අරූපාවචර අපරියාපන්න වූ කුශලාකුශලාව්‍යාකෘතධම්මයෝ යැ, වෙදනාස්කන්ධ යැ … විඤ්ඤාණස්කන්ධ යැ හැම රූප ද අසඞ්ඛතධාතු ද යන මොහු අනෛර්‍යාණික ධම්මයෝ යි.

1296. කතමෙ ධම්මා නියතා:

පඤ්චකම්මානි ආනන්තරිකානි, යා ච මිච්ඡාදිට්ඨි නියතා, චත්තාරො මග්ගා අපරියාපන්නා, ඉමෙ ධම්මා නියතා.

1297. කතමෙ ධම්මා අනියතා:

තෙ ධම්මෙ ඨපෙත්වා අවසෙසා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනියතා

1298. කතමෙ ධම්මා සඋත්තරා:

සාසවා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා, රූපක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, ඉමෙ ධම්මා සඋත්තරා.

1299. කතමෙ ධම්මා අනුත්තරා:

අපරියාපන්නා මග්ගා ච, මග්ගඵලානි ච, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අනුත්තරා.

1300 කතමෙ ධම්මා සරණා:

තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා, තංසම්පයුත්තො වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, තං සමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා සරණා.

1301. කතමෙ ධම්මා අරණා:

කුසලාබ්‍යාකතා ධම්මා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා, වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො, සබ්බං ච රූපං, අසඞ්ඛතා ච ධාතු, ඉමෙ ධම්මා අරණාති.

## පිට්ඨිදුකං

1302. කතමෙ ධම්මා විජ්ජාභාගිනො:

විජ්ජාය සම්පයුත්තකා ධම්මා, ඉමෙ ධම්මා විජ්ජාභාගිනො.

1303. කතමෙ ධම්මා අවිජ්ජාභාගිනො:

අවිජ්ජාය සම්පයුත්තකා ධම්මා, ඉමෙ ධම්මා අවිජ්ජාභාගිනො.

1304. කතමෙ ධම්මා විජ්ජූපමා:

හෙට්ඨිමෙසු තීසු අරියමග්ගෙසු පඤ්ඤා, ඉමෙ ධම්මා විජ්ජූපමා.

1305. කතමෙ ධම්මා වජිරූපමා:

උපරිමෙ[1] අරහත්තමග්ගෙ පඤ්ඤා, ඉමෙ ධම්මා වජිරූපමා.

---

1. උපරිට්ඨිමෙ - සිමු. 2

1296. නියතධර්මයෝ කවරහ යත්:

ආනන්තර්‍ය්‍ය වූ පඤ්චකර්මයෝ ද යම් නියතමිථ්‍යාදෘෂ්ටියෙකුත් ඇද්ද, අපර්‍ය්‍යාපන්න සතර මාර්ගයෝ ද යන මොහු නියතධර්මයෝ යි.

1297. අනියතධර්මයෝ කවරහ යත්:

ඒ නියතධර්මයන් තබා අවශිෂ්ට වූ කාමාවචර රූපාවචර අරූපාවචර අපර්‍ය්‍යාපන්න කුශලාකුශලාව්‍යාකෘතධර්මයෝ යැ වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ හැම රූප ද අසංඛතධාතු ද යන මොහු අනියතධර්මයෝ යි.

1298 සඋත්තරධර්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර වූ සාස්‍රව කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝ යැ රූපස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ යන මොහු සඋත්තර ධර්මයෝ යි.

1299. අනුත්තරධර්මයෝ කවරහ යත්:

අපර්‍ය්‍යාපන්න වූ මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසංඛතධාතු ද යන මොහු අනුත්තරධර්මයෝ යි.

1300. සරණධර්මයෝ කවරහ යත්:

ලෝභ ද්වේෂ මෝහ යන තුන් අකුශලමූලයෝ ද තදේකස්ථ ක්ලේශයෝ ද තත්සම්ප්‍රයුක්ත වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ තත්සමුත්ථාන කායකර්ම වාක්කර්ම මනඃකර්ම ද යන මොහු සරණධර්මයෝ යි.

1301. අරණධර්මයෝ කවරහ යත්:

කාමාවචර රූපාවචර අරූපාවචර අපර්‍ය්‍යාපන්න වූ කුශලාව්‍යාකෘත ධර්මයෝ යැ වේදනාස්කන්ධ යැ ... විඥානස්කන්ධ යැ හැම රූප ද අසංඛත-ධාතු ද යන මොහු අරණධර්මයෝ යි.

පිට්ඨිදුක යි.

1302. විද්‍යාභාගිධර්මයෝ කවරහ යත්:

අෂ්ටවිද්‍යායෙන් සම්ප්‍රයුක්ත වූ ධර්මයෝ යැ. මොහු විද්‍යාභාගී ධර්මයෝ යි.

1303. අවිද්‍යාභාගිධර්මයෝ කවරහ යත්:

සත්‍යප්‍රතිච්ඡාදක අවිද්‍යාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ යැ. මොහු අවිද්‍යාභාගී ධර්මයෝ යි.

1304. විදුලි උපමා කොට ඇති ධර්මයෝ කවරහ යත්:

යට තුන් අරිමඟ වූ ප්‍රඥා යැ. මොහු විදුලි උපමා කොට ඇති ධර්මයෝ යි.

1305. වජ්‍රෝපමධර්මයෝ කවරහ යත්:

උපරිම වූ රහත්මඟ ප්‍රඥා යැ. මොහු වජ්‍රෝපමධර්මයෝ යි.

1306. කතමෙ ධම්මා බාලා:

අහිරිකං ච අනොත්තප්පං ච, ඉමෙ ධම්මා බාලා, සබ්බෙපි අකුසලා ධම්මා බාලා.

1307. කතමෙ ධම්මා පණ්ඩිතා:

හිරි ච ඔත්තප්පං ච, ඉමෙ ධම්මා පණ්ඩිතා, සබ්බෙපි කුසලා ධම්මා පණ්ඩිතා.

1308. කතමෙ ධම්මා කණ්හා:

අහිරිකං ච අනොත්තප්පං ච, ඉමෙ ධම්මා කණ්හා, සබ්බෙපි අකුසලා ධම්මා කණ්හා.

1309. කතමෙ ධම්මා සුක්කා:

හිරි ච ඔත්තප්පං ච, ඉමෙ ධම්මා සුක්කා, සබ්බෙපි කුසලා ධම්මා සුක්කා.

1310. කතමෙ ධම්මා තපනීයා:

කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, ඉමෙ ධම්මා තපනීයා, සබ්බෙපි අකුසලා ධම්මා තපනීයා.

1311. කතමෙ ධම්මා අතපනීයා:

කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං, ඉමෙ ධම්මා අතපනීයා, සබ්බෙපි කුසලා ධම්මා අතපනීයා.

1312. කතමෙ ධම්මා අධිවචනා:

යා තෙසං තෙසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති ව්‍යඤ්ජනං අභිලාපො, ඉමෙ ධම්මා අධිවචනා.

සබ්බෙව ධම්මා අධිවචනපථා.

1313. කතමෙ ධම්මා නිරුත්ති:

යා තෙසං තෙසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති ව්‍යඤ්ජනං අභිලාපො, ඉමෙ ධම්මා නිරුත්ති.

සබ්බෙව ධම්මා නිරුත්තිපථා.

1314. කතමෙ ධම්මා පඤ්ඤත්ති:

යා තෙසං තෙසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති ව්‍යඤ්ජනං අභිලාපො, ඉමෙ ධම්මා පඤ්ඤත්ති,

සබ්බෙව ධම්මා පඤ්ඤත්තිපථා.

1306. බාලධර්මයෝ කවරහ යත්:

අහ්‍රීක ද අනපත්‍රපා ද යන මොහු බාලධර්මයෝ යැ. හැම අකුසල්හු බාලධර්මයෝ යි.

1307 පණ්ඩිතධර්මයෝ කවරහ යත්:

හ්‍රී ද අපත්‍රපා ද යන මොහු පණ්ඩිතධර්මයෝ යැ. හැම කුසල්දහම්හු පණ්ඩිතධර්මයෝ යි.

1308 කෘෂ්ණධර්මයෝ කවරහ යත්:

අහ්‍රීක ද අනපත්‍රපා ද යන මොහු කෘෂ්ණධර්මයෝ යැ. හැම අකුසල්හු කෘෂ්ණධර්මයෝ යි.

1309. ශුක්ලධර්මයෝ කවරහ යත්:

හ්‍රී ද අපත්‍රපා ද යන මොහු ශුක්ලධර්මයෝ යැ. හැම කුසල්හු ශුක්ල-ධර්මයෝ යි.

1310. තපනීයධර්මයෝ කවරහ යත්:

කායදුශ්චරිත යැ වාක්දුශ්චරිත යැ යන මොහු තපනීයධර්මයෝ යැ. හැම අකුසල්හු තපනීයධර්මයෝ යි.

1311. අතපනීයධර්මයෝ කවරහ යත්:

කායසුචරිත යැ වාක්සුචරිත යැ මනසුචරිත යැ යන මොහු අතපනීයධර්මයෝ යැ. හැම කුසල්හු අතපනීයධර්මයෝ යි

1312. අධිවචනධර්මයෝ කවරහ යත්:

ඒ ඒ ධර්මයන්ගේ යම් සඞ්ඛ්‍යාවක් සංඥාවක් ප්‍රඥප්තියෙක් ව්‍යවහාරයෙක් නාමයෙක් නාමකර්මයෙක් නාමධෙයයෙක් නිරුක්තියෙක් ව්‍යඤ්ජනයෙක් අභිලාපයෙක් ඇද්ද, මොහු අධිවචනධර්මයෝ යි.

හැම ධර්මයෝ මැ අධිවචනපථයෝ යි.

1313. නිරුක්තිධර්මයෝ කවරහ යත්:

ඒ ඒ ධර්මයන්ගේ සඞ්ඛ්‍යාවක් සංඥාවක් ප්‍රඥප්තියෙක් ව්‍යවහාරයෙක් නාමයෙක් නාමකර්මයෙක් නාමධෙයයෙක් නිරුක්තියෙක් ව්‍යඤ්ජනයෙක් අභිලාපයෙක් ඇද්ද, මොහු නිරුක්තිධර්මයෝ යි.

හැම ධර්මයෝ මැ නිරුක්තිපථයෝ යි.

1314 ප්‍රඥප්තිධර්මයෝ කවරහ යත්:

ඒ ඒ ධර්මයන්ගේ යම් සඞ්ඛ්‍යාවක් සංඥාවක් ප්‍රඥප්තියෙක් ව්‍යවහාරයෙක් නාමයෙක් නාමකර්මයෙක් නාමධෙයයෙක් නිරුක්තියෙක් ව්‍යඤ්ජනයෙක් අභිලාපයෙක් ඇද්ද, මොහු ප්‍රඥප්තිධර්මයෝ යි.

හැම ධර්මයෝ මැ ප්‍රඥප්තිපථයෝ යි.

1315 තත්ථ කතමං නාමං:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො, අසඞ්ඛතා ච ධාතු, ඉදං වුච්චති නාමං.

1316 තත්ථ කතමං රූපං:

චත්තාරො මහාභූතා, චතුන්නං ච මහාභූතානං උපාදායරූපං, ඉදං වුච්චති රූපං.

1317. තත්ථ කතමා අවිජ්ජා:

යං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසංගාහනා අපරියොගාහනා අසම්පෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති අවිජ්ජා.

1318. තත්ථ කතමා භවතණ්හා:

යො භවෙසු භවච්ඡන්දො භවතණ්හා භවසිනෙහො භවපරිළාහො භවමුච්ඡා භවජ්ඣොසානං, අයං වුච්චති භවතණ්හා.

1319. තත්ථ කතමා භවදිට්ඨි:

භවිස්සති අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති භවදිට්ඨි.

1320. තත්ථ කතමා විභවදිට්ඨි:

න භවිස්සති අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති විභවදිට්ඨි.

1321. තත්ථ කතමා සස්සතදිට්ඨි:

සස්සතො අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති සස්සතදිට්ඨි.

1322. තත්ථ කතමා උච්ඡෙදදිට්ඨි:

උච්ඡිජ්ජිස්සති අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති උච්ඡෙදදිට්ඨි.

1323 තත්ථ කතමා අන්තවාදිට්ඨි:

අන්තවා අත්තා ච ලොකො චා ති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ විපරියෙසග්ගාහො, අයං වුච්චති අන්තවාදිට්ඨි

1315. එහි නාම කවරෙ යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, විඥානස්කන්ධ ය, අසංඛතධාතු ද යන මේ 'නාම' යි කියනු ලැබේ.

1316. එහි රූප කවරෙ යත්:

සතර මහාභූතයෝ ය, සතර මහාභූතයන් නිසා පවත්නා රූප ය, යන මේ 'රූප' යි කියනු ලැබේ.

1317. එහි විද්‍යා කවර යත්:

යම් නො දැනීමෙක් නො දක්මෙක් අනභිසමයෙක් අනවබෝධයෙක් අසම්බෝධයෙක් අප්‍රතිවේධයෙක් අනිත්‍යාදිවශයෙන් නො ගැනීමෙක් නො බැසගැනීමෙක් සම වැ නො දැකීමෙක් (ධර්මස්වභාව) ප්‍රත්‍යවේක්ෂා නො කිරීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් (චිත්තසන්තානයාගේ) අපවිත්‍රතායෙක් බාලබවෙක් අසම්ප්‍රජන්‍යයෙක් මෝහයෙක් ප්‍රමෝහයෙක් සම්මෝහයෙක් අවිද්‍යායෙක් අවිද්‍යාඕඝයෙක් අවිද්‍යායෝගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යාපර්‍යුත්ථානයෙක් අවිද්‍යාපරිඝයෙක් මෝහ අකුශලමූලයෙක් ඇද්ද, මේ 'අවිද්‍යා' යි කියනු ලබා.

1318. එහි භවතෘෂ්ණා කවර යත්:

රූපාරූපභවයෙහි යම් භවච්ඡන්දයෙක් භවතෘෂ්ණායෙක් භවස්නෙහ-භවපරිදාහයෙක් භවමූර්ඡායෙක් භවයෙහි බැසගෙනසිටීමෙක් ඇද්ද, මේ 'භවතෘෂ්ණා' යි කියනු ලබා.

1319. එහි භවදෘෂ්ටි කවර යත්:

'ආත්මය ද ලෝකය ද මතුයෙහි වෙයි' යන මෙබඳු යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'භවදෘෂ්ටි' යයි කියනු ලබා·

1320. එහි විභවදෘෂ්ටි කවර යත්:

'ආත්මය ද ලෝකය ද මතුයෙහි නො වෙයි' යන මෙබඳු යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් ... විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'භවදෘෂ්ටි' යයි කියනු ලබා.

1321. එහි ශාශ්වතදෘෂ්ටි කවර යත්:

'ආත්මය ද ලෝකය ද ශාශ්වත යැ' යන මෙබඳු යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් ... විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'ශාශ්වතදෘෂ්ටි' යයි කියනු ලබා.

1322. එහි උච්ඡෙදදෘෂ්ටි කවර යත්:

ආත්මය ද ලෝකය ද සිඳී යෙයි යන මෙබඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් ... විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'උච්ඡෙදදෘෂ්ටි' යයි කියනු ලබා.

1323. එහි අන්තවත් දෘෂ්ටි කවර යත්:

'ආත්මය ද ලෝකය ද අන්තවත්' යයි මෙබඳු යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් ... විපර්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'අන්තවත්දෘෂ්ටි' යයි කියනු ලබා.

1324. තත්ථ කතමං අනන්තවාදිට්ඨි:

අනන්තවා අත්තා ච ලොකො චාති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති අනන්තවාදිට්ඨි

1325 තත්ථ කතමා පුබ්බන්තානුදිට්ඨි:

පුබ්බන්තං ආරබ්භ යා උප්පජ්ජති දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති පුබ්බන්තානුදිට්ඨි.

1326. තත්ථ කතමා අපරන්තානුදිට්ඨි:

අපරන්තං ආරබ්භ යා උප්පජ්ජති දිට්ඨි දිට්ඨිගතං -පෙ- විපරියෙසග්ගාහො, අයං වුච්චති අපරන්තානුදිට්ඨි.

1327 තත්ථ කතමං අහිරිකං:

යං න හිරීයති හිරියිතබ්බෙන, න හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති අහිරිකං.

1328 තත්ථ කතමං අනොත්තප්පං:

යං න ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන න ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති අනොත්තප්පං.

1329. තත්ථ කතමා හිරි:

යං හිරීයති හිරියිතබ්බෙන, හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියං, අයං වුච්චති හිරි.

1330 තත්ථ කතමං ඔත්තප්පං:

යං ඔත්තප්පති[1], ඔත්තප්පිතබ්බෙන, ඔත්තප්පති[1] පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති ඔත්තප්පං.

1331. තත්ථ කතමා දොවචස්සතා:

සහධම්මිකෙ වුච්චමානෙ දොවචස්සායං[2] දොවචස්සියං දොවචස්සතා විප්පටිකූලගාහිතා විපච්චනීකසාතතා අනාදරියං අනාදරතා අගාරවතා අප්පතිස්සවතා,[3] අයං වුච්චති දොවචස්සතා.

1332 තත්ථ කතමා පාපමිත්තතා:

යෙ තෙ පුග්ගලා අස්සද්ධා දුස්සීලා අප්පස්සුතා මච්ඡරිනො දුප්පඤ්ඤා, යා තෙසං සෙවනා නිසෙවනා සංසෙවනා භජනා සම්භජනා භත්ති සම්භත්ති තංසම්පවඞ්කතා, අයං වුච්චති පාපමිත්තතා.

1. ඔත්තාපති - සිමු, 2. දොවචස්සාය - සිමු. 3. අප්පටිස්සවතා - මජසං.

1324. එහි අනන්තවත් දෘෂ්ටි කවර යත්:

ආත්මය ද ලෝකය ද 'අනන්තවත්' යයි මෙබඳු යම් දෘෂ්ටියක් දෘෂ්ටි-ගතයෙක් ... විපය්‍යාසග්‍රාහයෙක් ඇද්ද, මේ 'අනන්තවත් දෘෂ්ටි' යයි කියනු ලැබේ.

1325. එහි පූර්වාන්තානුගත දෘෂ්ටි කවර යත්:

පූර්වාන්තය අරභයා යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් .. විපය්‍යාසග්‍රාහයෙක් උපදී ද, මේ 'පූර්වාන්තානුගතදෘෂ්ටි' යයි කියනු ලැබේ

1326. එහි අපරාන්තානුගතදෘෂ්ටි කවර යත්:

අපරාන්තය අරභයා යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් .. විපය්‍යාසග්‍රාහ-යෙක් උපදී ද, මේ 'අපරාන්තානුගත දෘෂ්ටි' යයි කියනු ලැබේ.

1327. එහි අහ්‍රීක කවරේ යත්:

යම් කරුණෙකින් ලජ්ජාවියයුත්තෙන් ලජ්ජා නො වේ ද ලාමක අකුශලධර්මයන්ගේ පැමිණීමෙන් ලජ්ජා නො වේ ද, මේ 'අහ්‍රීක' යයි කියනු ලැබේ.

1328. එහි අනපත්‍රපා කවර යත්:

යම් කරුණෙකින් තැවියයුත්තෙන් නො තැවේ ද, ලාමක අකුශල ධර්මයන්ගේ පැමිණීමෙන් නො තැවේ ද, මේ 'අනපත්‍රපා' යයි කියනු ලැබේ

1329. එහි හිරි කවර යත්:

යම් කරුණෙකින් ලජ්ජා වියයුත්තෙන් ලජ්ජාවට පැමිණේ ද, ලාමක අකුශලධර්මයන්ගේ පැමිණීමෙන් ලජ්ජාවට පැමිණේ ද, මේ 'හිරි' යයි කියනු ලැබේ.

1330. එහි ඔත්තප්ප කවරේ යත්:

යම් කරුණෙකින් තැති ගතයුත්තෙන් තැතිගනී ද, ලාමක අකුශල-ධර්මයන්ගේ පැමිණීමෙන් තැතිගනී ද, මේ 'ඔත්තප්ප' යයි කියනු ලැබේ.

1331. එහි 'දෞර්වචස්‍යතා' කවර යත්:

ප්‍රඥප්තශික්ෂාපදය කියනු ලබන කල්හි දුර්වචකමෙක් දුර්වචබවෙක් දුර්වච-තායෙක් විලෝමග්‍රාහී බවෙක් විලෝමග්‍රහණයෙහි සුව ඇති බවෙක් අනාදර බවෙක් අනාදරතායෙක් අගෞරවතායෙක් නිශ්‍රයවාස රහිත බවෙක් වේ ද, මේ 'දෞර්වචස්‍යතා' යයි කියනු ලැබේ.

1332. එහි පාපමිත්‍රතා කවර යත්:

ශ්‍රද්ධා නැති දුශ්ශීල වූ අල්පශ්‍රැත වූ මාත්සය්‍ය ඇති දුෂ්ප්‍රාඥ වූ යම් පුද්ගල කෙනෙක් ඇද්ද, ඔවුන්ගේ යම් සෙවනයෙක් නිෂෙවනයෙක් සංසෙවනයෙක් භජනයෙක් සම්භජනයෙක් භක්තියෙක් සම්භක්තියෙක් උන් කෙරෙහි නැමුණු බවෙක් ඇද්ද, මේ 'පාපමිත්‍රතා' යයි කියනු ලැබේ.

1333. තත්ථ කතමා සොවචස්සතා:

සහධම්මිකෙ වුච්චමානෙ සොවචස්සායං සොවචස්සියං සොවචස්සතා අප්පටිකූලග්ගාහිතා අවිපච්චනීකසාතතා සගාරවතා සප්පතිස්සවතා, අයං වුච්චති සොවචස්සතා.

1334. තත්ථ කතමා කල්‍යාණමිත්තතා:

යෙ තෙ පුග්ගලා සද්ධා සීලවන්තො බහුස්සුතා චාගවන්තො පඤ්ඤවන්තො, යා තෙසං සෙවනා නිසෙවනා සංසෙවනා භජනා සම්භජනා භත්ති සම්භත්ති තංසම්පවඞ්කතා, අයං වුච්චති කල්‍යාණමිත්තතා.

1335. තත්ථ කතමා ආපත්තිකුසලතා:

පඤ්චපි ආපත්තික්ඛන්ධා ආපත්තියො, සත්තපි ආපත්තික්ඛන්ධා ආපත්තියො, යා තාසං ආපත්තීනං ආපත්තිකුසලතා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති ආපත්ති කුසලතා.

1336. තත්ථ කතමා ආපත්තිවුට්ඨානකුසලතා:

යා තාහි ආපත්තීහි වුට්ඨානකුසලතා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති ආපත්තිවුට්ඨාන කුසලතා.

1337. තත්ථ කතමා සමාපත්තිකුසලතා:

අත්ථි සවිතක්කසවිචාරා සමාපත්ති, අත්ථි අවිතක්කවිචාරමත්තා සමාපත්ති, අත්ථි අවිතක්ක අවිචාරා සමාපත්ති, යා තාසං සමාපත්තීනං සමාපත්තිකුසලතා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති සමාපත්තිකුසලතා.

1338. තත්ථ කතමා සමාපත්තිවුට්ඨානකුසලතා:

යා තාහි සමාපත්තීහි වුට්ඨානකුසලතා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි අයං වුච්චති සමාපත්තිවුට්ඨානකුසලතා.

1339. තත්ථ කතමා ධාතුකුසලතා:

අට්ඨාරස ධාතුයො: චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු ධාතු කායවිඤ්ඤාණධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු යා තාසං ධාතූනං ධාතුකුසලතා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති ධාතුකුසලතා.

1333. එහි සොවචස්සතා කවර යත්:

ප්‍රඥප්තිශික්ෂාපදය එලවා කියනුලබන කල්හි සුවචකමෙක් සුවචබවෙක් සුවචතායෙක් අවිරුද්ධග්‍රාහ ඇති බවෙක් අනුකූලග්‍රහණයෙහි සුව ඇති බවෙක් සගෞරවතායෙක් නිග්‍රයවාස ඇති බවෙක් ඇද්ද, මේ 'සොවචස්සතා' යයි කියනුලබා.

1334. එහි කල්‍යාණමිත්‍රතා කවර යත්:

ශ්‍රද්ධා ඇති සිල්වත් වූ බහුශ්‍රැත වූ ත්‍යාගවත් වූ ප්‍රඥාවත් වූ යම් පුද්ගල කෙනෙක් ඇද්ද, ඔවුන්ගේ යම් සෙවනයෙක් බලවත් සේවනයෙක් හාත්පසින් සේවනයෙක් භජනයෙක් සම්භජනයෙක් භක්තියෙක් සම්භක්තියෙක් ඔවුන් කෙරෙහි නැමුණු බවෙක් ඇද්ද, මේ 'කල්‍යාණමිත්තතා' යයි කියනුලබා.

1335 එහි ආපත්තිකුසලතා කවර යත්:

පඤ්ච ආපත්තිස්කන්ධයෝ ද ආපත්තීහු යැ. සප්ත ආපත්තිස්කන්ධයෝ ද ආපත්තිහු යැ. ඒ ආපත්තීන්ගේ පරිච්ඡෙද දන්නා බවෙක් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් ... අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යක්දෘෂ්ටියෙක් ඇද්ද, මේ 'ආපත්තිකුසලතා' යයි කියනුලබා.

1336. එහි ආපත්තිවුට්ඨානකුසලතා කවර යත්:

ඒ ආපත්තීන්ගෙන් නැගීසිටීමෙහි දක්ෂමෙක් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් ... අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, මේ 'ආපත්තිවුට්ඨානකුසලතා' යයි කියනුලබා.

1337. එහි සමාපත්තිකුසලතා කවර යත්:

සවිතර්කසවිචාර සමාපත්තියෙක් ඇත අවිතර්කවිචාරමාත්‍ර සමාපත්තියෙක් ඇත. අවිතර්කඅවිචාරසමාපත්තියෙක් ඇත. ඒ සමාපත්තීන්ගේ පරිකර්ම සහිත අර්පණා පරිච්ඡේදයෙහි කුසල බවෙක් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් .. අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, මේ 'සමාපත්තිකුසලතා' යයි කියනුලබා

1338. එහි සමාපත්තිවුට්ඨානකුසලතා කවර යත්:

ඒ සමාපත්තීන්ගෙන් යම් නැගීසිටීමෙහි නිපුණ බවෙක් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් ... අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, මේ 'සමාපත්තිවුට්ඨානකුසලතා' යයි කියනුලබා.

1339 එහි ධාතුකුසලතා කවර යත්:

අටළොස් ධාතු කෙනෙක් වෙති: චක්ඛුධාතු යැ රූපධාතු යැ චක්ඛුවිඤ්ඤාණධාතු යැ ඝ්‍රාණධාතු යැ ගන්ධධාතු යැ ඝ්‍රාණවිඤ්ඤාණධාතු යැ ජිව්හාධාතු යැ රසධාතු යැ ජිව්හාවිඤ්ඤාණධාතු යැ කායධාතු යැ ඵොට්ඨබ්බධාතු යැ කායවිඤ්ඤාණධාතු යැ මනොධාතු යැ ධම්මධාතු යැ මනොවිඤ්ඤාණධාතු යි. ඒ ධාතූන්ගේ යම් උද්ග්‍රහමනසිකාරාදි ධාතුකුසලතායෙක් ප්‍රඥයෙක් ප්‍රජානනයෙක් .. අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, මේ 'ධාතුකුසලතා' යයි කියනුලබා.

1340. තත්ථ කතමා මනසිකාරකුසලතා:

යා තාසං ධාතූනං මනසිකාරකුසලතා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති මනසිකාරකුසලතා

1341. තත්ථ කතමා ආයතනකුසලතා:

ද්වාදසායතනානි: චක්ඛායතනං රූපායතනං සොතායතනං සද්දායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං, යා තෙසං ආයතනානං ආයතනකුසලතා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති ආයතනකුසලතා.

1342. තත්ථ කතමා පටිච්චසමුප්පාදකුසලතා:

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති; එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතීති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති පටිච්චසමුප්පාදකුසලතා.

1343 තත්ථ කතමා ඨානකුසලතා:

යෙ යෙ ධම්මා යෙසං යෙසං ධම්මානං හෙතූ පච්චයා උප්පාදාය[1] තං තං ඨානන්ති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි' අයං වුච්චති ඨානකුසලතා.

1344. තත්ථ කතමා අට්ඨානකුසලතා:

යෙ යෙ ධම්මා යෙසං යෙසං ධම්මානං න හෙතූ න පච්චයා උප්පාදාය තං තං අට්ඨානන්ති යා තත්ථ පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අට්ඨානකුසලතා.

1345. තත්ථ කතමො අජ්ජවො

යා උජ්ජුතා[2] අජිම්හතා අවඞ්කතා අකුටිලතා, අයංවුච්චති අජ්ජවො.

1346. තත්ථ කතමො මද්දවො:

යා මුදුතා මද්දවතා අකක්ඛලතා අකථිනතා[3] නීචචිත්තතා, අයං වුච්චති මද්දවො

---

1. උපාදාය සිමු. 2    2 අජ්ජවතා -සිමු. 2    3. අකඨිනතා මජසං.

1340. එහි මනසිකාරකුසලතා කවර යත්:

ඒ ධාතූන්ගේ උද්ග්‍රහමනසිකාර දැනීමෙක් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් ... අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, මෝ 'මනසිකාරකුසලතා' යයි කියනුලබා.

1341. එහි ආයතනකුසලතා කවර යත්:

දොළොස් ආයතන කෙනෙක් වෙති: චක්ඛායතන යැ රූපායතන යැ සෝතායතන යැ සද්දායතන යැ ඝානායතන යැ ගන්ධායතන යැ ජිව්හායතන යැ රසායතන යැ මනායතන යැ ධම්මායතන යි. ඒ ආයතනයන්ගේ යම් (උද්ග්‍රහමනසිකාරාදි) ආයතනකුසලතායෙක් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් ... අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, මෝ 'ආයතනකුසලතා' යයි කියනුලබා.

1342. එහි පටිච්චසමුප්පාදකුසලතා කවර යත්:

අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි. විඥානප්‍රත්‍යයෙන් නාමරූප වෙයි. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වෙයි. ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශ වෙයි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනා වෙයි. වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණා වෙයි තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදාන වෙයි. උපාදානප්‍රත්‍යයෙන් භවය වෙයි. භවප්‍රත්‍යයෙන් ජාති වෙයි. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණශෝකපරිදේවදුඃඛදෞර්මනස්‍යෝපායාසයෝ සම්භව වෙත්. මෙසේ මේ කෙවලදුඃඛරාශිහුගේ සමුදය වේ යයි එහි යම් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් ... අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද මෝ 'පටිච්චසමුප්පාදකුසලතා' යයි කියනුලබා

1343. එහි ස්ථානකුශලතා කවර යත්:

යම් යම් ධර්ම කෙනෙක් යම් යම් ධර්ම කෙනකුන්ගේ උත්පාදය පිණිස හේතුප්‍රත්‍යය වෙත් ද, ඒ ඒ ධර්මය කාරණ වේ යයි එහි යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් ... අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්මාදිට්ඨියෙක් වේ ද, මෝ 'ඨානකුසලතා' යයි කියනුලබා.

1344. එහි අස්ථානකුසලතා කවර යත්:

යම් යම් ධර්ම කෙනෙක් යම් යම් ධර්ම කෙනකුන්ගේ උත්පාදය පිණිස හේතු නො වෙත් ද ප්‍රත්‍යය නො වෙත් ද ඒ ඒ ධර්මය අස්ථාන යයි එහි යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක් .. අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, මෝ 'අස්ථානකුසලතා' යයි කියනුලබා.

1345. එහි ආර්ජව කවරේ යත්:

යම් ඍජු බවෙක් නො ඇද බවෙක් නො වක් බවෙක් අකුටිල බවෙක් ඇද්ද, මේ 'ආර්ජව' යයි කියනුලැබේ.

1346. එහි මාර්දව කවරේ යත්:

යම් මෘදු බවෙක් සිනිඳු බවෙක් නො කැකුළු බවෙක් නො තද බවෙක් යටත් සිත් ඇති බවෙක් වේ ද, මේ 'මාර්දව' යයි කියනුලැබේ.

1347. තත්ථ කතමා ඛන්ති:

යා ඛන්ති ඛමනතා අධිවාසනතා අචණ්ඩික්කං අනසුරොපො අත්තමනතා චිත්තස්ස, අයං වුච්චති ඛන්ති.

1348. තත්ථ කතමං සොරච්චං:

යො කායිකො අවීතික්කමො වාචසිකො අවීතික්කමො කායිකවාචසිකො අවීතික්කමො, ඉදං වුච්චති සොරච්චං; සබ්බොපි සීලසංවරො සොරච්චං.

1349. තත්ථ කතමං සාඛල්‍යං:

යා සා වාචා අණ්ඩකා කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා, තථාරූපිං වාචං පහාය, යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති, යා තත්ථ සණ්හවාචතා සඛිලවාචතා අඵරුසවාචතා, ඉදං වුච්චති සාඛල්‍යං.

1350. තත්ථ කතමො පටිසන්ථාරො:

ද්වෙ පටිසන්ථාරා. ආමිසපටිසන්ථාරො ච ධම්මපටිසන්ථාරො ච, ඉධෙකච්චො පටිසන්ථාරකො හොති ආමිසපටිසන්ථාරෙන වා ධම්මපටිසන්ථාරෙන වා, අයං වුච්චති පටිසන්ථාරො.

1351. තත්ථ කතමා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා:

ඉධෙකච්චො චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති, සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ න සංවරං ආපජ්ජති, යා ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං අගුත්ති අගොපනා අනාරක්ඛො අසංවරො, අයං වුච්චති ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා.

1352. තත්ථ කතමා භොජනෙ අමත්තඤ්ඤුතා:

ඉධෙකච්චො අප්පටිසඞ්ඛා අයොනිසො ආහාරං ආහාරෙති දවාය මදාය මණ්ඩනාය විභූසනාය, යා තත්ථ අසන්තුට්ඨිතා අමත්තඤ්ඤුතා අප්පටිසඞ්ඛා භොජනෙ, අයං වුච්චති භොජනෙ අමත්තඤ්ඤුතා.

1347. එහි ක්ෂාන්ති කවර යත්.

යම් ක්ෂාන්තියක් සහන බවක් අධිවාසනා කරන බවෙක් නො සැඩ බවෙක් පිරිපුන් වචන ඇති බවෙක් චිත්තයාගේ සියමන බවෙක් ඇද්ද, මෝ 'ක්ෂාන්ති' යයි කියනුලබා.

1348. එහි සුරතතා කවර යත්.

යම් කායික අව්‍යතික්‍රමයෙක් වාචසික අව්‍යතික්‍රමයෙක් කායිකවාචසික අව්‍යතික්‍රමයෙක් ඇද්ද, මේ 'සොරච්ච' යයි කියනු ලැබේ. හැම සීලසංවර 'සොරච්ච' නම්

1349. එහි සඛිල බව කවරෙ යත්:

යම් තෙපුලෙක් (භ්‍රංසන වම්භනාදීන්) හටගත් අණ්ඩක ඇති පූතික වූ පරාහට කටුක වූ මෙරමා ලැගෙනසුලු ක්‍රොධයට ආසන්න වූ සමාධිය පිණිස නො පවත්නේ වේ ද, එබඳු වූ තෙපුල් හැරපියා යම් තෙපුලෙක් නිදෝෂ ද කනට සුව එළවා ද ප්‍රේමනීය ද හෘදයඞ්ගම ද නාගරික ද බොහෝ දෙනාට කාන්ත ද බොහෝ දෙනාට මනවඩා ද එබඳු තෙපුල් කියන්නේ වෙයි. ඒ පුගුල් කෙරෙහි යම් සිලුටු වචන ඇති බවෙක් මෘදු වචන ඇති බවෙක් නො පරොස් වචන ඇති බවෙක් ඇද්ද, මේ 'සාඛල්‍ය' (සඛිල බව) යයි කියනුලැබේ.

1350. එහි පටිසන්ථාර කවරෙ යත්:

පටිසන්ථාරයෝ දෙදෙනෙකි: ආමිසපටිසන්ථාර ද ධම්මපටිසන්ථාර ද යි. මෙලොව් කිසිවෙක් ආමිසපටිසන්ථාරයෙන් හෝ ධම්මපටිසන්ථාරයෙන් හෝ අතුරු නැති කරන්නේ වෙයි. මේ 'පටිසන්ථාර' යයි කියනුලැබේ.

1351. එහි ඉන්ද්‍රියයන්හි අගුප්තද්වාරතා කවර යත්:

මෙලොව් කිසිවෙක් ඇසින් රූ දැක නිමිති වශයෙන් ගන්නේ වෙයි. අනුව්‍යඤ්ජන වශයෙන් ගන්නේ වෙයි. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට වසන මෙ පුගුල්හු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත පාපක අකුශලධර්මයෝ ලුහුබඳනාහු ද ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදී. චක්ෂුරින්ද්‍රිය නො රක්නේ වෙයි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි. කනින් ශබ්ද අසා ... නැහැයෙන් ගඳ අසා ... දිවින් රස විඳ ... කයින් පැහැසි පැහැස .. මනසින් දහම් දැන නිමිත්තග්‍රාහී අනුව්‍යඤ්ජනග්‍රාහී වෙයි. යම් කරුණෙකින් මනින්ද්‍රිය අසංවෘත කොට වාස කරන මොහු අභිධ්‍යා දෞර්මනස්‍ය පාපක අකුශලධර්මයෝ මැඩැපවත්නාහු වෙත් ද ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදී, මනින්ද්‍රිය නො රක්නේ වෙයි. මනින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි මේ ෂඩින්ද්‍රියයන්ගේ යම් අගුප්තියක් අගොපනයෙක් නො රැක්මෙක් අසංවරයෙක් ඇද්ද, මේ 'ඉන්ද්‍රියයන්හි නො පියූ දොර ඇති බව' යයි කියනුලැබේ.

1352. එහි භොජනයෙහි අමාත්‍රඥතා කවර යත්:

මෙහි කිසිවෙක් ප්‍රත්‍යවෙක්ෂා ප්‍රඥයෙන් නො දැන, නො විමසා අනුපායයෙන් කෙළි පිණිස මද පිණිස මණ්ඩන පිණිස විභූෂණ පිණිස ආහාර වළඳ කෙරෙයි, ඒ ප්‍රත්‍යවෙක්ෂා නො කොට වැළැඳීමෙහි යම් අසන්තුෂ්ටතායෙක් අමාත්‍රඥතායෙක් ඇද්ද, මේ 'භොජනයෙහි අමාත්‍රඥතා' යයි කියනුලබා.

1353. තත්ථ කතමා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා:

ඉධෙකච්චො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති න අනුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති, යා ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං ගුත්ති ගොපනා ආරක්ඛා සංවරො, අයං වුච්චති ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා.

1354. තත්ථ කතමා භොජනෙ මත්තඤ්ඤුතා:

ඉධෙකච්චො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණං ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති, යා තත්ථ සන්තුට්ඨිතා මත්තඤ්ඤුතා පටිසඞ්ඛා භොජනෙ, අයං වුච්චති භොජනෙ මත්තඤ්ඤුතා

1355. තත්ථ කතමං මුට්ඨස්සච්චං:

යා අසති අනනුස්සති[1] අප්පටිස්සති[2] අසති, අසරණතා අධාරණතා පිලාපනතා[3] පම්මුස්සනතා[4] ඉදං වුච්චති මුට්ඨස්සච්චං.

1356. තත්ථ කතමං අසම්පජඤ්ඤං:

යං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසංගාහනා අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, ඉදං වුච්චති අසම්පජඤ්ඤං.

1357. තත්ථ කතමා සති:

යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අපම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති, අයං වුච්චති සති.

---

1. අනුස්සති අනනුස්සති - PTS, 2. අපටිස්සති - සිමු. 2,
3. අපිලාපනතා - PTS, 4. අපම්මුස්සනතා PTS,
සමුස්සනතා - අස, සම්මුස්සනතා - මජසං,

1353 එහි ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර බව කවරේ යත්:

මෙ ලොවැ කිසිවෙක් ඇසින් රූ දැක නිමිත්ත විසින් නො ගන්නේ වෙයි. අනුව්‍යඤ්ජන විසින් නො ගන්නේ වෙයි. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය සංවෘත කොට වෙසෙන තෙල පුගුල්හු අභිධ්‍යාදෞර්මනස්‍ය ලාමක අකුශලධර්මයෝ මැඩැගෙන සිටුනාහු ද, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරයට පැමිණෙයි චක්ෂුරින්ද්‍රියය රකී. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කනින් ශබ්ද අසා ... නැහැයෙන් ගඳ අසා දිවින් රස විඳ ... කයින් පැහැසි පැහැසැ .. මනසින් දහම් දැන නිමිත්ත විසින් නො ගන්නේ වෙයි අනුව්‍යඤ්ජන විසින් නො ගන්නේ වෙයි යම් කරුණෙකින් මනින්ද්‍රිය අසංවෘත වැ වෙසෙන මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු ද ඒ මනින්ද්‍රියයාගේ සංවරයට පිළිපන්නේ වෙයි. මනින්ද්‍රිය රකී. මනින්ද්‍රියයාගේ සංවරයට පැමිණෙයි. මේ ෂඩින්ද්‍රියයන්ගේ යම් ගුප්තියක් ගොපනයෙක් ආරක්ෂායෙක් සංවරයෙක් ඇද්ද, මේ 'ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර බව' යයි කියනුලැබේ.

1354. එහි භොජනයෙහි මාත්‍රඥතා කවර යත්:

මෙ ලොවැ කිසිවෙක් නුනුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ආහාර වළඳ කෙරෙයි. කෙළි පිණිස නො මැ වෙයි. මදයට නො වෙයි. මණ්ඩනයට නො වෙයි. මේ ශරීරයාගේ ස්ථිතියට යැපීමට වෙහෙස සන්සිඳුවීමට බ්‍රහ්මචර්‍යානුග්‍රහයට පමණ වෙයි. මෙසේ පැරැණි බඩගිනි වේදනාත් නසමි. අලුත් බඩගිනි වේදනාත් නූපදවමි. මාගේ ජීවිතයාත්‍රාව ද අනවද්‍ය භාවය ද සුඛවිහරණ ද වේ යයි කියා යි. ඒ ප්‍රත්‍යවෙක්ෂා කොට වැළඳීමෙහි යම් සතුටු බවෙක් පමණ දන්නා බවෙක් ඇද්ද, මේ 'භොජනයෙහි මාත්‍රඥ බව' යයි කියනුලැබේ.

1355. එහි මුසස්මෘති බව කවරෙ යත්:

යම් අස්මෘතියක් අනුස්මෘති රහිත බවෙක් ප්‍රතිස්මෘති රහිත බවෙක් අස්මෘතියක් සිහි නො කරන බවෙක් නො දරන බවෙක් අරමුණෙහි ඉල්පෙන බවෙක් නටසිහි ඇති බවෙක් ඇද්ද, මේ 'මුළාසිහි ඇති බව' යයි කියනුලැබේ.

1356. එහි අසම්ප්‍රජන්‍ය කවරෙ යත්:

යම් නො දැනීමෙක් නො දක්වෙක් අනභිසමයෙක් අනනුබොධයෙක් අසම්බොධයෙක් (සිවුසස් දහම්) අප්‍රතිවෙධයෙක් අසඞ්ග්‍රාහයෙක් නො බැසගැනීමෙක් සමව නො දක්මෙක් ධර්මස්වභාව නො දක්මෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් චිත්තසන්තානයාගේ අපවිත්‍ර බවෙක් බාල බවෙක් සම්‍යක්-ප්‍රඥ රහිත බවෙක් මොහයෙක් ප්‍රමොහයෙක් සම්මොහයෙක් අවිද්‍යායෙක් අවිද්‍යා-ඕඝයෙක් අවිද්‍යා-යොගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යා-පර්‍ය්‍යුත්ථානයෙක් අවිද්‍යාලඞ්ගියෙක් මොහ - අකුසලමූලයෙක් ඇද්ද, මේ 'අසම්ප්‍රජන්‍ය' යයි කියනුලැබේ.

1357. එහි ස්මෘති කවර යත්:

යම් ස්මෘතියක් පුනපුනා සිහිකිරීමෙක් අභිමුඛ වැ මෙන් සිහිකිරීමෙක් ස්මෘතියක් සිහිකරණ අයුරෙක් ධරණබවෙක් අරමුණෙහි නො ඉල්පෙන බවෙක් නො මුළාවන බවෙක් ස්මෘතියක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියෙක් ඇද්ද, මේ 'ස්මෘති' යයි කියනුලැබේ.

1358. තත්ථ කතමං සම්පජඤ්ඤං:

යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සම්පජඤ්ඤං.

1359 තත්ථ කතමං පටිසඞ්ඛානබලං:

යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති පටිසඞ්ඛාන බලං.

1360. තත්ථ කතමං භාවනාබලං:

යා කුසලානං ධම්මානං ආසෙවනා භාවනා බහුලීකම්මං, ඉදං වුච්චති භාවනාබලං. සත්තපි බොජ්ඣඞ්ගා භාවනාබලං.

1361. තත්ථ කතමො සමථො:

යා චිත්තස්ස ඨිති -පෙ- සම්මාසමාධි, අයං වුච්චති සමථො.

1362. තත්ථ කතමා විපස්සනා:

යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති විපස්සනා.

1363. තත්ථ කතමං සමථනිමිත්තං:

යා චිත්තස්ස ඨිති -පෙ- සම්මා සමාධි, ඉදං වුච්චති සමථනිමිත්තං.

1364. තත්ථ කතමං පග්ගාහනිමිත්තං:

යො චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො, ඉදං වුච්චති පග්ගාහනිමිත්තං.

1365. තත්ථ කතමො පග්ගාහො:

යො චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො, අයං වුච්චති පග්ගාහො.

1366. තත්ථ කතමො අවික්ඛෙපො:

යා චිත්තස්ස ඨිති -පෙ- සම්මාසමාධි, අයං වුච්චති අවික්ඛෙපො.

1367. තත්ථ කතමා සීලවිපත්ති:

යො කායිකො වීතික්කමො වාචසිකො වීතික්කමො කායිකවාචසිකො වීතික්කමො, අයං වුච්චති සීලවිපත්ති, සබ්බම්පි දුස්සීල්‍යං සීලවිපත්ති.

1358. එහි සම්‍යක්ප්‍රඥ කවර යත්:

යම් ප්‍රඥවක් දන්නා අයුරෙක් ... අමෝහයෙක් ධම්මවිචයයෙක් සම්‍යග්-දෘෂ්ටියක් ඇද්ද, මෙ 'සම්ප්‍රජන්‍ය' යයි කියනුලැබේ.

1359. එහි පටිසඞ්ඛාන (ප්‍රත්‍යවෙක්‍ෂා) බල කවරෙ යත්:

යම් ප්‍රඥවක් ප්‍රජානනාකාරයෙක් ... අමෝහයෙක් ධම්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ඇද්ද, මෙ 'ප්‍රත්‍යවෙක්‍ෂාබල' යයි කියනුලැබේ.

1360. එහි භාවනාබල කවරෙ යත්:

බොධපාක්‍ෂික කුශලධර්මයන්ගේ යම් ආසෙවනායෙක් භාවනායෙක් පුනපුනා වැඩීමෙක් ඇද්ද, මෙ 'භාවනාබල' යයි කියනුලැබේ. සප්ත බොධ්‍යඞ්ගයෝ මැ භාවනාබල යි.

1361. එහි සමථ කවරෙ යත්:

චිත්තයාගේ යම් අරමුණෙහි අචල වැ සිටීමෙක් ... සම්‍යක්සමාධියෙක් ඇද්ද, මෙ 'සමථ' යයි කියනුලැබේ.

1362. එහි විපශ්‍යනා කවර යත්:

යම් ප්‍රඥවක් ප්‍රජානනාකාරයෙක් ... අමෝහයෙක් ධම්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ඇද්ද, මේ 'විපශ්‍යනා' යයි කියනුලබා.

1363. එහි සමථනිමිත්ත කවරෙ යත්:

චිත්තයාගේ අරමුණෙහි යම් අචල වැ සිටීමෙක් ... සම්‍යක්සමාධියෙක් ඇද්ද, මෙ 'සමථනිමිත්ත' යයි කියනුලැබේ.

1364. එහි ප්‍රග්‍රාහනිමිත්ත කවරෙ යත්:

යම් චෛතසික වීර්‍යාරම්භයෙක් ... සම්‍යක්ව්‍යායාමයෙක් ඇද්ද, මෙ 'ප්‍රග්‍රාහනිමිත්ත' යයි කියනුලැබේ.

1365. එහි ප්‍රග්‍රාහ කවරෙ යත්:

යම් චෛතසික වීර්‍යාරම්භයෙක් ... සම්‍යග්ව්‍යායාමයෙක් ඇද්ද, මෙ 'ප්‍රග්‍රාහ' යයි කියනුලැබේ.

1366. එහි අවික්ෂෙප කවරෙ යත්:

චිත්තයාගේ යම් අරමුණෙහි අචල වැ සිටීමෙක් ... සම්‍යක්සමාධියෙක් ඇද්ද, මෙ 'අවික්ෂෙප' යයි කියනුලැබේ.

1367. එහි ශීලවිපත්ති කවර යත්:

යම් කායික ව්‍යතික්‍රමයෙක් වාචසික ව්‍යතික්‍රමයෙක් කායිකවාචසික ව්‍යතික්‍රමයෙක් ඇද්ද, මේ 'ශීලවිපත්ති' යයි කියනුලබා. හැම දුශ්ශීල්‍යය ශීලවිපත්ති නමි.

1368. තත්ථ කතමා දිට්ඨිවිපත්ති:

නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො, අයං වුච්චති දිට්ඨිවිපත්ති. සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති.

1369. තත්ථ කතමා සීලසම්පදා:

යො කායිකො අවීතික්කමො වාචසිකො අවීතික්කමො කායිකවාචසිකො අවීතික්කමො, අයං වුච්චති සීලසම්පදා, සබ්බොපි සීලසංවරො සීලසම්පදා.

1370. තත්ථ කතමා දිට්ඨිසම්පදා:

අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො. අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති යා එවරූපා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති දිට්ඨිසම්පදා. සබ්බාපි සම්මාදිට්ඨි දිට්ඨිසම්පදා.

1371. තත්ථ කතමා සීලවිසුද්ධි:

යො කායිකො අවීතික්කමො වාචසිකො අවීතික්කමො කායිකවාචසිකො අවීතික්කමො, අයං වුච්චති සීලවිසුද්ධි. සබ්බොපි සීලසංවරො සීලවිසුද්ධි.

1372. තත්ථ කතමා දිට්ඨිවිසුද්ධි:

කම්මස්සකතාඤාණං[1] සච්චානුලොමිකඤාණං මග්ගසමඞ්ගිස්ස ඤාණං ඵලසමඞ්ගිස්ස ඤාණං.

1373. දිට්ඨිවිසුද්ධි ඛො පනාති: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි.

1374. යථා දිට්ඨිස්ස ච පධානන්ති: යො චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො.

1375. සංවෙගොති: ජාතිභයං ජරාභයං ව්‍යාධිභයං මරණභයං. සංවෙජනීයං ඨානන්ති: ජාති ජරා ව්‍යාධි මරණං.

---

1. කම්මස්සකතඤාණං - සිමු. 2

1368. එහි දෘෂ්ටිවිපත්ති කවර යත්:

දුන් දෑය විපාක නැත, පූජායෙහි විපාක නැත, හොම්යෙහි විපාක නැත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක නැත, මෙලොව නැත, පරලොව නැත, මවු නැත, පියා නැත, උපපාදුක සත්ත්වයෝ නැත, ලොව්හි යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් ද, එබඳු වූ සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න මහණබමුණු කෙනෙක් නැතැයි මෙබඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලොමදෘෂ්ටි ඇති බවෙක් දෘෂ්ටිවිෂ්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් ග්‍රාහයෙක් පිහිටාසිටීමෙක් අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාත්වයෙක් තීර්ථායතනයෙක් විපර්යාසග්‍රාහයෙක් ඇද්ද, මෝ 'දෘෂ්ටිවිපත්ති' යයි කියනු ලබා. හැම මිථ්‍යාදෘෂ්ටි දෘෂ්ටිවිපත්ති නමූ.

1369. එහි ශීලසම්පත් කවර යත්:

යම් කායික අව්‍යතික්‍රමයෙක් වාචසික අව්‍යතික්‍රමයෙක් කායිකවාචසික අව්‍යතික්‍රමයෙක් ඇද්ද, මෝ 'ශීලසම්පත්' යයි කියනුලබා. හැම ශීලසංවර ශීලසම්පත් නමූ.

1370. එහි දෘෂ්ටිසම්පත් කවර යත්:

'දුන් දෑය විපාක ඇත, පුද්ගලද්දෙහි විපාක ඇත, හොම (ආගන්තුක සත්කාර) යෙහි විපාක ඇත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක ඇත, මෙලොව ඇත, පරලොව ඇත, මවු ඇත, පියා ඇත, උපපාදුක සත්ත්වයෝ ඇත, ලොව සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න වූ යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් ද එබඳු ශ්‍රමණබ්‍රාහ්මණයෝ ඇතැ'යි යම් මෙබඳු වූ ප්‍රඥාවක් ප්‍රජානනයෙක් ... අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, මේ 'දිට්ඨිසම්පදා'යි කියනුලැබේ. හැම සම්‍යග්දෘෂ්ටි දිට්ඨිසම්පදා යි.

1371. එහි සීලවිසුද්ධි කවර යත්:

යම් කායික අව්‍යතික්‍රමයෙක් වාචසික අව්‍යතික්‍රමයෙක් කායිකවාචසික අව්‍යතික්‍රමයෙක් ඇද්ද, මේ 'සීලවිසුද්ධි' යයි කියනුලබා. හැම සීලසංවරය සීලවිසුද්ධි යි.

1372. එහි දිට්ඨිවිසුද්ධි කවර යත්:

කම්මස්සකතාඥානය සච්චානුලෝමිකඥානය මාර්ගසමඞ්ගීහුගේ ඥානය ඵලසමඞ්ගීහුගේ ඥාන යි

1373. 'දිට්ඨිවිසුද්ධි ඛෝ පන' යනු යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් ... අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, එය යි.

1374. 'යථාදිට්ඨිස්ස ච පධානං' යනු යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් ... සම්‍යග්ව්‍යායාමයෙක් ඇද්ද, එය යි.

1375. 'සංවේගො' යනු ජාතිභය ජරාභය ව්‍යාධිභය මරණභය යි.
'සංවේජනීයං ඨානං' යනු ජාති ජරා ව්‍යාධි මරණ යි.

1376. සංවිග්ගස්ස ච යොනිසො පධානන්ති. ඉධ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.

1377. අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසූති: යා කුසලානං ධම්මානං භාවනාය අසන්තුට්ඨස්ස භිය්‍යොකම්‍යතා.

1378. අප්පටිවානිතා ච පධානස්මින්ති: යා කුසලානං ධම්මානං භාවනාය සක්කච්චකිරියතා සාතච්චකිරියතා අට්ඨිතකිරියතා අනොලීනවුත්තිතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ආසෙවනා භාවනා බහුලීකම්මං.

1379. විජ්ජාති: තිස්සො විජ්ජා: පුබ්බෙනිවාසානුස්සති ඤාණං විජ්ජා, සත්තානං චුතූපපාතෙ ඤාණං විජ්ජා, ආසවානං ඛයෙ ඤාණං විජ්ජා.

1380. විමුත්තීති: ද්වෙ විමුත්තියො, චිත්තස්ස ච අධිමුත්ති නිබ්බානඤ්ච.

1381. ඛයෙ ඤාණන්ති: මග්ගසමඞ්ගිස්ස ඤාණං.

1382 අනුප්පාදෙ ඤාණන්ති ඵලසමඞ්ගිස්ස ඤාණං.

සුත්තන්තමාතිකා.

## නික්ඛෙපකණ්ඩං නිට්ඨිතං.

1376. 'සංවිග්ගස්ස ච යෝනිසො පධානං' යනු මේ සස්නෙහි මහණ නූපන් ලාමක අකුශලධර්මයන්ගේ නො ඉපැදීම පිණිස කුශලච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත දැඩි කොටගනියි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. උපන් ලාමක අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත දැඩි කොටගනියි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. නූපන් කුශලධර්මයන්ගේ ඉපැදීම පිණිස ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත දැඩි කොටගනියි. ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. උපන් කුශලධර්මයන්ගේ ස්ථිතිය පිණිස අවිනාශයට බහුලභාවයට විපුලත්වයට වැඩීමට සම්පූර්ණ වීමට කුශලච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත දැඩි කොටගනියි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරේ.

1377. 'අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු' යනු කුශලධර්මයන්ගේ වැඩීමෙහි අසන්තුෂ්ට වූවහුගේ බොහෝ කොට කැමැතිබවෙක් ඇද්ද එය යි.

1378. 'අප්පටිවානිතා ච පධානස්මිං' යනු කුශලධර්මයන්ගේ වැඩීමෙහි යම් සකස් කොට කරන බවෙක් නිරතුරු වැ කරන බවෙක් නො නැවත කරන බවෙක් නො හැකුළුණු පැවතුම් ඇති බවෙක් නො පියූ කුශලච්ඡන්දය ඇති බවෙක් නො පියූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් ආසෙවනායෙක් භාවනායෙක් බහුල කිරීමෙක් ඇද්ද එය යි.

1379. 'විජ්ජා' යනු ත්‍රිවිද්‍යා යැ. පූර්වනිවාසානුස්මෘතිඥානය විද්‍යා යැ, සත්ත්වයන්ගේ ච්‍යුති උපපාත්තියෙහි ඥානය විද්‍යා යැ, ආශ්‍රවයන්ගේ ක්‍ෂය වීමෙහි ඥානය විද්‍යා යි.

1380. 'විමුක්ති' යනු විමුක්ති දෙකෙකි: අෂ්ටසමාපත්ති සඞ්ඛ්‍යාත වූ චිත්තයාගේ අධිමුක්තිය ද නිර්වාණය ද යි.

1381. 'ඛයෙඤාණං' යනු මාර්ගසමඞ්ගීහුගේ ඥානය යි

1382. 'අනුප්පාදෙඤාණං' යනු ඵලසමඞ්ගීහුගේ ඥානය යි.

සුත්තන්තික මාතෘකාවයි

# නික්ෂෙපකාණ්ඩය නිමි.

# අට්ඨකථාකණ්ඩං

1383. කතමෙ ධම්මා කුසලා:

චතූසු භූමීසු කුසලං, ඉමෙ ධම්මා කුසලා.

1384. කතමෙ ධම්මා අකුසලා:

ද්වාදස අකුසලචිත්තුප්පාදා, ඉමෙ ධම්මා අකුසලා.

1385. කතමෙ ධම්මා අබ්‍යාකතා:

චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාබ්‍යාකතං, රූපඤ්ච නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා අබ්‍යාකතා.

1386. කතමෙ ධම්මා සුඛාය වෙදනාය සම්පයුත්තා:

කාමාවචරකුසලතො චත්තාරො සොමනස්සසහගතචිත්තුප්පාදා, අකුසලතො චත්තාරො, කාමාවචරකුසලස්ස විපාකතො ච කිරියතො ච පඤ්ච, රූපාවචරතිකචතුක්කජ්ඣානා කුසලතො ච විපාකතො ච කිරියතො ච, ලොකුත්තරතිකචතුක්කජ්ඣානා කුසලතො ච විපාකතො ච, එත්ථුප්පන්නං සුඛං වෙදනං ඨපෙත්වා, ඉමෙ ධම්මා සුඛාය වෙදනාය සම්පයුත්තා.

1387. කතමෙ ධම්මා දුක්ඛාය වෙදනාය සම්පයුත්තා:

ද්වෙ දොමනස්සසහගතා චිත්තුප්පාදා, දුක්ඛසහගතං කායවිඤ්ඤාණං එත්ථුප්පන්නං දුක්ඛං වෙදනං ඨපෙත්වා, ඉමෙ ධම්මා දුක්ඛාය වෙදනාය සම්පයුත්තා.

1388. කතමෙ ධම්මා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා:

කාමාවචරකුසලතො චත්තාරො උපෙක්ඛාසහගතචිත්තුප්පාදා, අකුසලතො ඡ, කාමාවචරකුසලස්ස විපාකතො දස, අකුසලස්ස විපාකතො ඡ, කිරියතො ඡ, රූපාවචරං චතුත්ථං ඣානං කුසලතො ච විපාකතො ච කිරියතො ච, චත්තාරො අරූපාවචරා කුසලතො ච විපාකතො ච කිරියතො ච, ලොකුත්තරං චතුත්ථං ඣානං කුසලතො ච විපාකතො ච, එත්ථුප්පන්නං අදුක්ඛමසුඛං වෙදනං ඨපෙත්වා, ඉමෙ ධම්මා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා.

තිස්සො ච වෙදනා රූපඤ්ච නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා න වත්තබ්බා සුඛාය වෙදනාය සම්පයුත්තාතිපි, දුක්ඛාය වෙදනාය සම්පයුත්තාතිපි, අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තාතිපි.

1389. කතමෙ ධම්මා විපාකා:

චතූසු භූමීසු විපාකො, ඉමෙ ධම්මා විපාකා.

1390. කතමෙ ධම්මා විපාකධම්මධම්මා:

චතූසු භූමීසු කුසලං, අකුසලං, ඉමෙ ධම්මා විපාකධම්මධම්මා.

# අර්ථකථාකාණ්ඩය

1383. කුශලධර්මයෝ කවරහ යත්:

සතර භූමියෙහි කුශල යැ. මේ ධර්මයෝ කුශලයෝ යි.

1384 අකුශලධර්මයෝ කවරහ යත්:

දොළොස් අකුශලචිත්තොත්පාදයෝ යැ. මේ ධර්මයෝ අකුශලයෝ යි.

1385 අව්‍යාකෘතධර්මයෝ කවරහ යත්:

සතර භූමියෙහි විපාකය ද තුන් භූමියෙහි ක්‍රියාව්‍යාකෘතය ද රූපය ද නිර්වාණය ද යන මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ යි.

1386. සුඛවේදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

කාමාවචරකුශලයෙන් සතර සොමනස් සහගිය චිත්තොත්පාදයෝ යැ අකුශලයෙන් (සොමනස් සහගිය චිත්තොත්පාදයෝ) සතර දෙන යැ කාමාවචරකුශලයාගේ විපාකයෙන් ද ක්‍රියායෙන් ද (සොමනස්සසහගත විපාක සතර යැ හසිතුප්පාදචිත්තය දු යි චිත්තොත්පාදයෝ) පස්දෙන යැ කුශලයෙන් ද විපාකයෙන් ද ක්‍රියායෙන් ද රූපාවචර ත්‍රිකචතුෂ්කධ්‍යාන චිත්තයෝ යැ කුශලයෙන් ද විපාකයෙන් ද ලෝකෝත්තර ත්‍රිකචතුෂ්කධ්‍යාන චිත්තයෝ යැ යන මොහු යැ. මෙහි උපන් සුඛවේදනාව තබා මේ ධර්මයෝ සුඛවේදනාව හා සම්ප්‍රයුක්තයෝ යි.

1387. දුඃඛවේදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

දොම්නස් සහගිය චිත්තොත්පාදයෝ දෙදෙන යැ දුක්සහගිය කායවිඥාන යි. මෙහි උපන් දුඃඛවේදනාව තබා මේ ධර්මයෝ දුඃඛවේදනාව හා සම්ප්‍රයුක්තයෝ යි.

1388. අදුඃඛාසුඛ වේදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

කාමාවචර-කුශලයන් කෙරෙන් සතර උපෙක්‍ෂා සහගත චිත්තොත්පාදයෝ යැ. අකුශලයන් කෙරෙන් (චිත්තොත්පාද) සයෙක. කාමාවචර කුශලවිපාකයන් කෙරෙන් දශයෙක අකුශලවිපාකයන් කෙරෙන් සයෙක. ක්‍රියා සිත් අතුරෙන් සයෙක. කුශල විපාක-ක්‍රියා විසින් රූපාවචර චතුර්ථධ්‍යානය ද කුශල විපාක-ක්‍රියා විසින් සතර අරූපාවචරයෝ ද කුශල විසින් ද විපාක විසින් ද ලෝකෝත්තර චතුර්ථධ්‍යානය ද යන මෙහි උපන් අදුක්ඛමසුඛවේදනාව තබා මේ ධර්මයෝ අදුක්ඛමසුඛවේදනාව හා සම්ප්‍රයුක්තයෝ යි.

ත්‍රිවිධ වේදනාවෝ ද රූපය ද නිර්වාණය ද යන මේ ධර්මයෝ 'සුඛවේදනාව හා සම්ප්‍රයුක්තයහ' යි ද 'දුක්ඛවේදනාව හා සම්ප්‍රයුක්තයහ' යි ද 'අදුක්ඛමසුඛවේදනාව හා සම්ප්‍රයුක්තයහ' යි ද නො කියැයුත්තාහ.

1389. විපාකධර්මයෝ කවරහ යත්:

සතර භූමියෙහි විපාක යැ. මේ ධර්මයෝ විපාකයෝ යි.

1390. විපාකධර්මධර්මයෝ කවරහ යත්:

සතර භූමියෙහි කුශල යැ, අකුශල යැ යන මේ ධර්මයෝ විපාකධර්මධර්මයෝ යි.

1391. කතමෙ ධම්මා නෙවවිපාකනවිපාකධම්මධම්මා:

තීසු භූමීසු කිරියාව්‍යාකතං රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා නෙවවිපාකනවිපාකධම්මධම්මා

1392. කතමෙ ධම්මා උපාදින්නුපාදානියා:

තීසු භූමීසු විපාකො, යං ච රූපං කම්මස්සකතත්තා, ඉමෙ ධම්මා උපාදින්නුපාදානියා.

1393. කතමෙ ධම්මා අනුපාදින්නුපාදානියා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු කිරියාව්‍යාකතං, යං ච රූපං න කම්මස්සකතත්තා, ඉමෙ ධම්මා අනුපාදින්නුපාදානියා.

1394. කතමෙ ධම්මා අනුපාදින්නඅනුපාදානියා

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අනුපාදින්නඅනුපාදානියා.

1395 කතමෙ ධම්මා සඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා:

ද්වාදස අකුසලචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා.

1396. කතමෙ ධම්මා අසඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා:

තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා අසඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා.

1397. කතමෙ ධම්මා අසඞ්කිලිට්ඨඅසඞ්කිලෙසිකා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අසඞ්කිලිට්ඨඅසඞ්කිලෙසිකා

1398. කතමෙ ධම්මා සවිතක්කසවිචාරා:

කාමාවචරං කුසලං, අකුසලං, කාමාවචරකුසලස්ස විපාකතො එකාදස චිත්තුප්පාදා, අකුසලස්ස විපාකතො ද්වෙ, කිරියතො එකාදස, රූපාවචරං පඨමං ඣානං කුසලතො ච විපාකතො ච කිරියතො ච, ලොකුත්තරං පඨමං ඣානං කුසලතො ච විපාකතො ච එත්ථුප්පන්නෙ විතක්කවිචාරෙ ඨපෙත්වා, ඉමෙ ධම්මා සවිතක්කසවිචාරා.

1399. කතමෙ ධම්මා අවිතක්කවිචාරමත්තා:

රූපාවචරපඤ්චකනයෙ දුතියං ඣානං කුසලතො ච විපාකතො ච කිරියතො ච, ලොකුත්තරපඤ්චකනයෙ දුතියං ඣානං කුසලතො ච විපාකතො ච එත්ථුප්පන්නං විචාරං ඨපෙත්වා, විතක්කො ච, ඉමෙ ධම්මා අවිතක්කවිචාරමත්තා.

1391 නො මැ විපාක වූ විපාකසවභාවධර්ම නො වූ ධර්මයෝ කවරහ යත්:

තුන් භූමියෙහි ක්‍රියාව්‍යාකෘතය ද රූපය ද නිර්වාණය ද යන මේ ධර්මයෝ නො මැ විපාක වූ විපාකසවභාවධර්ම නො වූ ධර්මයෝ යි.

1392. උපාදින්නඋපාදානීය ධර්මයෝ කවරහ යත්:

තුන් භූමියෙහි විපාක ද කර්මය කළ හෙයින් යම් රූපයෙකුත් වේ ද, මොහු උපාදින්නඋපාදානීය ධර්මයෝ යි.

1393 අනුපාදින්නඋපාදානීය ධර්මයෝ කවරහ යත්:

තුන් භූමියෙහි කුශල යෑ අකුශල යෑ තුන් භූමියෙහි ක්‍රියාව්‍යාකෘත යෑ කර්මය කළ හෙයින් නො වූ යම් රූපයෙකුත් ඇද්ද, මොහු අනුපාදින්න උපාදානීය ධර්මයෝ යි.

1394. අනුපාදින්නඅනුපාදානීය ධර්මයෝ කවරහ යත්:

අපර්යාපන්න වූ සතර මාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍ය ඵලයෝ ද නිර්වාණය ද යන මොහු අනුපාදින්නඅනුපාදානීය ධර්මයෝ යි.

1395. සංකිලිට්ඨසංකිලෙසික වූ ධර්මයෝ කවරහ යත්:

දොළොස් අකුශලචිත්තොත්පාදයෝ යෑ. මොහු සංකිලිට්ඨසංකිලෙසික වූ ධර්මයෝ යි.

1396. අසංකිලිට්ඨසංකිලෙසික වූ ධර්මයෝ කවරහ යත්:

තුන් භූමියෙහි කුශල යෑ තුන් භූමියෙහි විපාක යෑ තුන් භූමියෙහි ක්‍රියාව්‍යාකෘත යෑ හැම රූප ද යන මොහු අසංකිලිට්ඨසංකිලෙසික වූ ධර්මයෝ යි.

1397. අසංකිලිට්ඨඅසංකිලෙසික වූ ධර්මයෝ කවරහ යත්:

අපර්යාපන්න සතර මාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මොහු අසංකිලිට්ඨඅසංකිලෙසික වූ ධර්මයෝ යි.

1398. සවිතර්කසවිචාර ධර්මයෝ කවරහ යත්:

කාමාවචර කුශල යෑ අකුශල යෑ කාමාවචර කුශලයාගේ විපාකයෙන් එකොළොස් චිත්තොත්පාදයෝ යෑ, අකුශලවිපාකයෙන් දෙකෙක, ක්‍රියායෙන් එකොළොසෙක, කුශල විසින් ද විපාක විසින් ද ක්‍රියා විසින් ද රූපාවචර ප්‍රථමධ්‍යාන යෑ, කුශල විසින් ද විපාක විසින් ද ලෝකෝත්තර ප්‍රථමධ්‍යාන යෑ, යන මෙතෙක් තැන්හි උපන් විතර්කවිචාරයන් තබා මේ ධර්මයෝ සවිතර්කසවිචාරයෝ යි.

1399 අවිතර්කවිචාරමාත්‍ර ධර්මයෝ කවරහ යත්:

කුශල විසින් ද විපාක විසින් ද ක්‍රියා විසින් ද රූපාවචර පඤ්චක නයෙහි ද්විතීයධ්‍යානය ද කුශල විසින් ද විපාක විසින් ද ලෝකෝත්තර පඤ්චක නයෙහි ද්විතීයධ්‍යානය ද මෙහි උපන් විචාරය තබා, විතර්කය ද යන මොහු අවිතර්කවිචාරමාත්‍ර ධර්මයෝ යි

1400. කතමෙ ධම්මා අවිතක්කඅවිචාරා:

ද්වෙ පඤ්චවිඤ්ඤාණානි, රූපාවචරතිකජ්ඣානා කුසලතො ච විපාකතො ච කිරියතො ච, චත්තාරො ආරුප්පා කුසලතො ච විපාකතො ච කිරියතො ච, ලොකුත්තරතිකජ්ඣානා කුසලතො ච විපාකතො ච, පඤ්චකනයෙ දුතියජ්ඣානෙ උප්පන්නො ච විචාරො, රූපඤ්ච නිබ්බානං ච, ඉමෙ ධම්මා අවිතක්කඅවිචාරා.

විතක්කසහජාතො විචාරො න වත්තබ්බො සවිතක්කසවිචාරොතිපි, අවිතක්කවිචාරමත්තොතිපි, අවිතක්කඅවිචාරොතිපි.

1401. කතමෙ ධම්මා පීතිසහගතා:

කාමාවචරකුසලතො චත්තාරො සොමනස්සසහගතචිත්තුප්පාදා, අකුසලතො චත්තාරො, කාමාවචරකුසලස්ස විපාකතො පඤ්ච, කිරියතො පඤ්ච, රූපාවචරදුකතිකජ්ඣානා කුසලතො ච විපාකතො ච කිරියතො ච, ලොකුත්තරදුකතිකජ්ඣානා කුසලතො ච විපාකතො ච එත්ථුප්පන්නං පීතිං ඨපෙත්වා, ඉමෙ ධම්මා පීතිසහගතා.

1402. කතමෙ ධම්මා සුඛසහගතා:

කාමාවචරකුසලතො චත්තාරො සොමනස්සසහගතචිත්තුප්පාදා, අකුසලතො චත්තාරො, කාමාවචරස්ස කුසලස්ස විපාකතො ඡ, කිරියතො පඤ්ච, රූපාවචරතිකචතුක්කජ්ඣානා කුසලතො ච විපාකතො ච කිරියතො ච, ලොකුත්තරතිකචතුක්කජ්ඣානා කුසලතො ච විපාකතො ච එත්ථුප්පන්නං සුඛං ඨපෙත්වා, ඉමෙ ධම්මා සුඛසහගතා.

1403. කතමෙ ධම්මා උපෙක්ඛාසහගතා:

කාමාවචරකුසලතො චත්තාරො උපෙක්ඛාසහගතචිත්තුප්පාදා, අකුසලතො ඡ, කාමාවචරස්ස කුසලස්ස විපාකතො දස, අකුසලස්ස විපාකතො ඡ, කිරියතො ඡ, රූපාවචරං චතුත්ථං ඣානං කුසලතො ච විපාකතො ච කිරියතො ච, චත්තාරො ආරුප්පා කුසලතො ච විපාකතො ච කිරියතො ච, ලොකුත්තරං චතුත්ථං ඣානං කුසලතො ච විපාකතො ච එත්ථුප්පන්නං උපෙක්ඛං ඨපෙත්වා, ඉමෙ ධම්මා උපෙක්ඛාසහගතා.

පීති න පීතිසහගතා, සුඛසහගතා න උපෙක්ඛාසහගතා, සුඛං න සුඛසහගතං සියා පීතිසහගතං න උපෙක්ඛාසහගතං, සියා න වත්තබ්බං පීතිසහගතන්ති. ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා දුක්ඛසහගතං කායවිඤ්ඤාණං, යා ච වෙදනා උපෙක්ඛා, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා න වත්තබ්බා පීතිසහගතාතිපි, සුඛසහගතාතිපි, උපෙක්ඛාසහගතාතිපි.

1400. අවිතර්කඅවිචාර ධර්මයෝ කවරහ යත්:

දෙ පස් විඥානයෝ ද, කුශල විපාක ක්‍රියා වීසින් රූපාවචර ත්‍රික-ධ්‍යානයෝ ද, කුශල විපාක ක්‍රියා විසින් සතර ආරූප්‍යයෝ ද, කුශල විපාක විසින් ලොකොත්තර ත්‍රිකධ්‍යානයෝ ද, පඤ්චක නයෙහි ද්විතීය ධ්‍යානයේ උපන් විචාරය ද, රූපය ද, නිර්වාණය ද යන මොහු අවිතර්ක-අවිචාර ධර්මයෝ යි.

විතර්කසහජාත වූ විචාරය සවිතර්කසවිචාර යි ද, අවිතර්කවිචාරමාත්‍ර යයි ද, අවිතර්කඅවිචාර යයි ද නො කියැයුත්තේ යි.

1401. ප්‍රීතිසහගත ධර්මයෝ කවරහ යත්:

කාමාවචර කුශලයන් කෙරෙහි සතර සොමනස් සහගිය චිත්තොත්පා-දයෝ ද, අකුශලයන් කෙරෙහි (සොමනස් සහගිය) සතර චිත්තොත්පාදයෝ ද, කාමාවචර කුශලයාගේ විපාකයන් කෙරෙහි (සිත්) පසෙක් ද, ක්‍රියා චිත්තයන් කෙරෙහි පසෙක් ද, කුශල විපාක ක්‍රියා විසින් රූපාවචර ද්වික-ත්‍රිකධ්‍යානයෝ ද, කුශල විපාක විසින් ලොකොත්තර ද්වික-ත්‍රිකධ්‍යානයෝ ද යන මෙහි උපන් ප්‍රීතිය තබා, මේ ධර්මයෝ ප්‍රීතිසහගතයෝ යි.

1402. සුඛසහගත ධර්මයෝ කවරහ යත්:

කාමාවචර කුශලයන් කෙරෙහි සතර සොමනස්සහගිය චිත්තොත්පාද යෝ ද, අකුශලයන් කෙරෙහි (සිත්) සතරෙක් ද, කාමාවචර කුශලයාගේ විපාකයන් කෙරෙන් සයෙක් ද, ක්‍රියා (සිත්) අතුරෙහි පසෙක් ද, කුශල විපාක ක්‍රියා විසින් රූපාවචර ත්‍රික-චතුෂ්කධ්‍යානයෝ ද, කුශල විපාක විසින් ලොකොත්තර ත්‍රික-චතුෂ්කධ්‍යානයෝ ද යන මෙහි උපන් සුවය තබා, මේ ධර්මයෝ සුඛසහගතයෝ යි.

1403. උපෙක්ෂාසහගත ධර්මයෝ කවරහ යත්:

කාමාවචර කුශලයන් කෙරෙහි සතර උපෙක්ෂාසහගත චිත්තොත්පාද-යෝ ද, අකුශලයන් කෙරෙහි (සිත්) සයෙක් ද, කාමාවචර කුශලයාගේ විපාකයන් කෙරෙහි දසයෙක, අකුශලවිපාකයෙහි සයෙක, ක්‍රියායෙහි සයෙක, කුශලවිපාකක්‍රියා විසින් රූපාවචර චතුර්ථධ්‍යාන යැ, කුශලවිපාක ක්‍රියා විසින් සතර ආරූප්‍යයෝ යැ, කුශලවිපාක විසින් ලොකොත්තර චතුර්ථධ්‍යාන යැ යන මෙහි උපන් උපෙක්ෂාව තබා, මේ ධර්මයෝ උපෙක්ෂා සහගතයෝ යි.

ප්‍රීතිය ප්‍රීතිසහගත නො වෙයි, සුඛසහගත යැ, උපෙක්ෂාසහගත නො වේ. සුවය සුඛසහගත නො වෙයි, ප්‍රීතිසහගත වන්නේ යැ, උපෙක්ෂාසහගත නො වේ, ප්‍රීතිසහගත යයි නො කියැයුතු ද වන්නේ යැ. දෙම්නස්සහගත චිත්තොත්පාදයෝ දෙදෙන යැ දුඃඛසහගත කායවිඥන යැ උපෙක්ෂා-වෙදනාව ද රූපය ද නිර්වාණය ද යන මේ ධර්මයෝ ප්‍රීතිසහගතයෝ යයි ද සුඛසහගතයෝ යයි ද උපෙක්ෂාසහගතයෝ යයි ද නො කියැයුත්තාහ.

1404. කතමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තචිත්තුප්පාදා, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා.

1405. කතමෙ ධම්මා භාවනාය පහාතබ්බා:

උද්ධච්චසහගතො චිත්තුප්පාදො, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බා.

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තා ලොභසහගතචිත්තුප්පාදා ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා දස්සනෙන පහාතබ්බා සියා භාවනාය පහාතබ්බා

1406. කතමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා:

චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා.

1407. කතමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තචිත්තුප්පාදා, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, එත්ථුප්පන්නං මොහං ඨපෙත්වා, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා.

1408. කතමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා:

උද්ධච්චසහගතො චිත්තුප්පාදො, එත්ථුප්පන්නං මොහං ඨපෙත්වා, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තා ලොභසහගතචිත්තුප්පාදා, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා දස්සනෙන පහාතබ්බහෙතුකා, සියා භාවනාය පහාතබ්බහෙතුකා.

1409 කතමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා:

විචිකිච්ඡාසහගතො මොහො, උද්ධච්චසහගතො මොහො, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා.

1410. කතමෙ ධම්මා ආචයගාමිනො:

තීසු භූමීසු කුසලං, අකුසලං, ඉමෙ ධම්මා ආචයගාමිනො.

1411. කතමෙ ධම්මා අපචයගාමිනො:

චත්තාරො මග්ගා අපරියාපන්නා, ඉමෙ ධම්මා අපචයගාමිනො.

1404. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ කවරහ යත්:

සතර දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෝ යැ විචිකිත්සාසහගත චිත්තොත්පාදය යන මේ ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ යි.

1405. භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ කවරහ යත්:

ඖද්ධත්‍යසහගත චිත්තොත්පාද යි. මේ ධර්මයෝ භාවනායෙන් ප්‍රහා-තව්‍යයෝ යැ

දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත චිත්තොත්පාදයෝ සතර දෙන යැ දෞර්මනස්‍යසහගත චිත්තොත්පාදයෝ දෙදෙන යැ යන මේ ධර්මයෝ දර්ශන-යෙන් ප්‍රහාතව්‍ය ද වන්නාහ, භාවනායෙන් ප්‍රහාතව්‍ය ද වන්නාහ.

1406. නො මැ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ භාවනායෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ කවරහ යත්:

සතරභූමියෙහි කුශල යැ සතරභූමියෙහි විපාක යැ තුන්බිම්හි ක්‍රියා-ව්‍යාකෘත යැ රූපය ද නිර්වාණය ද යන මොහු නො මැ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ භාවනායෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ යි.

1407. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයෝ කවරහ යත්:

සතර දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෝ යැ විචිකිත්සාසහගත චිත්තොත්පාද යැ යන මෙහි උපන් මෝහය තබා මේ ධර්මයෝ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇත්තාහු යි.

1408. භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇති ධර්මයෝ කවරහ යත්:

ඖද්ධත්‍යසහගත චිත්තොත්පාද යැ මෙහි උපන් මෝහය තබා මේ ධර්මයෝ භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු ය.

දෘෂ්ටිගතවිප්‍රයුක්ත වූ ලෝභසහගත චිත්තොත්පාදයෝ සතරදෙන යැ දෞර්මනස්‍යසහගත චිත්තොත්පාදයෝ දෙදෙන යැ යන මේ ධර්මයෝ දර්ශන-යෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු ද වන්නාහ, භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇත්තාහු ද වන්නාහ.

1409 නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ කවරහ යත්:

විචිකිච්ඡා සහගත මෝහ යැ ඖද්ධත්‍ය සහගත මෝහ යැ සියුබිම්හි කුශල යැ සියුබිම්හි විපාක යැ තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යැ රූපය ද නිර්වාණය ද යන මොහු නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයෝ යි.

1410 ආචයගාමී ධර්මයෝ කවරහ යත්:

තුන්බිම්හි කුශල යැ අකුශල යැ යන මොහු ආචයගාමී (ප්‍රතිසන්ධි, ච්‍යුති, ගති, ප්‍රවෘත්තීන්ට පමුණුවන) ධර්මයෝ යි.

1411. අපචයගාමී ධර්මයෝ කවරහ යත්:

අපර්යාපන්න වූ සතර මාර්ගයෝ යැ. මොහු අපචයගාමී (නිවනට පමුණුවන) ධර්මයෝ යි.

1412. කතමෙ ධම්මා නෙව ආචයගාමිනො න අපචයගාමිනො:

චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා නෙව ආචයගාමිනො න අපචයගාමිනො.

1413. කතමෙ ධම්මා සෙඛා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, හෙට්ඨිමානි ච තීණි සාමඤ්ඤඵලානි, ඉමෙ ධම්මා සෙඛා.

1414. කතමෙ ධම්මා අසෙඛා:

උපරිට්ඨිමං අරහත්තඵලං, ඉමෙ ධම්මා අසෙඛා.

1415. කතමෙ ධම්මා නෙවසෙඛා නාසෙඛා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා නෙවසෙඛා නාසෙඛා.

1416. කතමෙ ධම්මා පරිත්තා:

කාමාවචරකුසලං, අකුසලං, සබ්බො කාමාවචරස්ස විපාකො, කාමාවචරකිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා පරිත්තා.

1417. කතමෙ ධම්මා මහග්ගතා:

රූපාවචරා අරූපාවචරා කුසලාව්‍යාකතා, ඉමෙ ධම්මා මහග්ගතා.

1418. කතමෙ ධම්මා අප්පමාණා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අප්පමාණා.

1419. කතමෙ ධම්මා පරිත්තාරම්මණා:

සබ්බො කාමාවචරස්ස විපාකො, කිරියාමනොධාතු, කිරියාහෙතුකමනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතා, ඉමෙ ධම්මා පරිත්තාරම්මණා.

1420. කතමෙ ධම්මා මහග්ගතාරම්මණා:

විඤ්ඤාණඤ්චායතනං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, ඉමෙ ධම්මා මහග්ගතාරම්මණා.

1421. කතමෙ ධම්මා අප්පමාණාරම්මණා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, ඉමෙ ධම්මා අප්පමාණාරම්මණා.

1412 නො මැ ආචයගාමී නො ද අපචයගාමී ධම්මයෝ කවරහ යත්:

සතර බිම්හි විපාක යැ, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යැ, මොහු නො මැ ආචයගාමී නො ද අපචයගාමී ධම්මයෝ යි.

1413. ශෛක්‍ෂධම්මයෝ කවරහ යත්:

අපයාපන්න සතර මාර්ගයෝ ද හෙට්ඨිම වූ තුන් ශ්‍රාමණ්‍යඵලයෝ ද යන මොහු ශෛක්‍ෂධම්මයෝ යි.

1414. අශෛක්‍ෂධම්මයෝ කවරහ යත්:

මතුයෙහි සිටි අර්හත්ඵලය යි මේ ධම්මයෝ අශෛක්‍ෂයෝ යි.

1415 නො මැ ශෛක්‍ෂ වූ නො ද අශෛක්‍ෂ වූ ධම්මයෝ කවරහ යත්:

තුන්බිම්හි කුශල යැ අකුශල යැ තුන්බිම්හි විපාක යැ තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යැ රූපය ද නිර්වාණය ද යන මොහු නො මැ ශෛක්‍ෂ වූ නො ද අශෛක්‍ෂ වූ ධම්මයෝ යි.

1416. පරිත්ත (කාමාවචර) ධම්මයෝ කවරහ යත්.

කාමාවචර කුශල යැ අකුශල යැ කාමාවචරයාගේ හැම විපාක යැ කාමාවචර ක්‍රියාව්‍යාකෘත යැ හැම රූප ද යන මොහු පරිත්තධම්මයෝ යි.

1417. මහද්ගතධම්මයෝ කවරහ යත්:

රූපාවචර අරූපාවචර කුශලාව්‍යාකෘතයෝ යැ. මොහු මහද්ගත ධම්මයෝ යි.

1418. අප්‍රමාණධම්මයෝ කවරහ යත්:

අපයාපන්න වූ සතර මාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මොහු අප්‍රමාණධම්මයෝ යි.

1419 පරිත්තාලම්බන ධම්මයෝ කවරහ යත්:

සියලු කාමාවචර විපාක යැ ක්‍රියා මනොධාතු යැ සොමනස් සහගිය ක්‍රියාඅහෙතුක මනොවිඥානධාතු යැ යන මොහු පරිත්තාලම්බනධම්මයෝ යි.

1420. මහද්ගතාලම්බනධම්මයෝ කවරහ යත්:

විඥානඤ්චායතන යැ නෙවසඤ්ඤානාසඤ්ඤායතන යැ යන මොහු මහද්ගතාලම්බනධම්මයෝ යි.

1421. අප්‍රමාණාලම්බන ධම්මයෝ කවරහ යත්:

අපයාපන්න සතර මාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද යන මොහු අප්‍රමාණාලම්බන ධම්මයෝ යැ.

කාමාවචර කුශලයෙහි සතර ඥානවිප්‍රයුක්ත චිත්තොත්පාදයෝ යැ. ක්‍රියායෙහි සතර ඥානවිප්‍රයුක්ත චිත්තොත්පාදයෝ යැ සියලු අකුශල යැ යන මේ ධම්මයෝ පරිත්තාලම්බන ද වන්නාහ, මහද්ගතාලම්බන ද වන්නාහ, අප්‍රමාණාලම්බන නො වෙති. 'පරිත්තාලම්බනහ'යි ද 'මහද්ගතාලම්බනහ'යි ද නො කියයුතු ද වන්නාහ.

කාමාවචරකුසලතො චත්තාරො ඤාණවිප්පයුත්තචිත්තුප්පාදා, කිරියතො චත්තාරො ඤාණවිප්පයුත්තචිත්තුප්පාදා, සබ්බං අකුසලං, ඉමෙ ධම්මා සියා පරිත්තාරම්මණා, සියා මහග්ගතාරම්මණා, න අප්පමාණාරම්මණා, සියා න වත්තබ්බා පරිත්තාරම්මණාතිපි, මහග්ගතාරම්මණාතිපි.

කාමාවචරකුසලතො චත්තාරො ඤාණසම්පයුත්තචිත්තුප්පාදා, කිරියතො චත්තාරො ඤාණසම්පයුත්තචිත්තුප්පාදා, රූපාවචරචතුත්ථං ඣානං කුසලතො ච කිරියතො ච, කිරියාහෙතුකමනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතා, ඉමෙ ධම්මා සියා පරිත්තාරම්මණා, සියා මහග්ගතාරම්මණා, සියා අප්පමාණාරම්මණා, සියා න වත්තබ්බා පරිත්තාරම්මණාතිපි, මහග්ගතාරම්මණාතිපි, අප්පමාණාරම්මණාතිපි.

රූපාවචරතිකචතුක්කජ්ඣානා කුසලතො ච විපාකතො ච කිරියතො ච, චතුත්ථස්ස ඣානස්ස විපාකො, ආකාසානඤ්චායතනං, ආකිඤ්චඤ්ඤායතනං, ඉමෙ ධම්මා න වත්තබ්බා පරිත්තාරම්මණාතිපි, මහග්ගතාරම්මණාතිපි.

රූපං ච නිබ්බානං ච අනාරම්මණා.

**1422.** කතමෙ ධම්මා හීනා:

ද්වාදස අකුසලචිත්තුප්පාදා, ඉමෙ ධම්මා හීනා.

**1423.** කතමෙ ධම්මා මජ්ඣිමා:

තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා මජ්ඣිමා:

**1424.** කතමෙ ධම්මා පණීතා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා පණීතා.

**1425.** කතමෙ ධම්මා මිච්ඡත්තනියතා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තචිත්තුප්පාදා, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා මිච්ඡත්තනියතා සියා අනියතා.

**1426** කතමෙ ධම්මා සම්මත්තනියතා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, ඉමෙ ධම්මා සම්මත්තනියතා.

**1427.** කතමෙ ධම්මා අනියතා:

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තා ලොභසහගතචිත්තුප්පාදා, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, උද්ධච්චසහගතො චිත්තුප්පාදො, තීසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා අනියතා.

කාමාවචර කුශලයෙහි සතර ඥානසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෝ ද ක්‍රියායෙහි සතර ඥානසම්ප්‍රයුක්තචිත්තොත්පාදයෝ ද කුශලක්‍රියා හෙයින් රූපාවචර චතුර්ථධ්‍යානය ද උපේක්ෂාසහගත ක්‍රියාඅහේතුක මනොවිඥානධාතු ද යන මේ ධර්මයෝ පරිත්තාලම්බන ද වන්නාහ. මහද්ගතාලම්බන ද වන්නාහ. අප්‍රමාණාලම්බන ද වන්නාහ. 'පරිත්තාලම්බනහ'යි ද මහද්ගතාලම්බනහ'යිද 'අප්‍රමාණාලම්බනහ'යි ද නො කියැයුතු ද වන්නාහ.

කුශලවිපාකක්‍රියා විසින් රූපාවචර ත්‍රිකචතුෂ්කධ්‍යානයෝ ද චතුර්ථධ්‍යානයාගේ විපාකය ද ආකාසානඤ්චායතනය ද ආකිඤ්චඤ්ඤායතනය ද යන මේ ධර්මයෝ 'පරිත්තාලම්බනහ' යි ද 'මහද්ගතාලම්බනහ' යි ද 'අප්‍රමාණාලම්බන' යි ද නො කියැයුත්තාහ.

රූපය ද නිර්වාණය ද අනාලම්බනයෝ ය.

**1422.** හීන ධර්මයෝ කවරහ යත්:

දෙලොස් අකුශල චිත්තොත්පාදයෝ යැ. මොහු හීන ධර්මයෝ යි.

**1423.** මධ්‍යම ධර්මයෝ කවරහ යත්:

තුන්බිමැ කුශල යැ තුන්බිමැ විපාක යැ තුන්බිමැ ක්‍රියාව්‍යාකෘත යැ හැම රූපය ද යන මොහු මධ්‍යම ධර්මයෝ යි.

**1424.** ප්‍රණීත ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න සතර මාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මොහු ප්‍රණීත ධර්මයෝ යි.

**1425.** මිථ්‍යාත්වනියත ධර්මයෝ කවරහ යත්:

දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෝ සතරදෙන යැ දෙමනස්සහගත චිත්තොත්පාදයෝ දෙදෙන යැ යන මේ ධර්මයෝ මිථ්‍යාත්වනියත වන්නාහ, අනියත ද වන්නාහු ය.

**1426.** සම්‍යක්ත්වනියත ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ යැ. මොහු සම්‍යක්ත්වනියත ධර්මයෝ යි.

**1427.** අනියත ධර්මයෝ කවරහ යත්:

දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත චිත්තොත්පාදයෝ සතරදෙන යැ, විචිකිත්සාසහගත චිත්තොත්පාද යැ, ඖද්ධත්‍යසහගත චිත්තොත්පාද යැ, ත්‍රෛභූමක කුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය ද යන මේ ධර්මයෝ අනියතයෝ යි.

1428. කතමෙ ධම්මා මග්ගාරම්මණා:

කාමාවචරකුසලතො චත්තාරො ඤාණසම්පයුත්තචිත්තුප්පාදා, කිරියතො චත්තාරො ඤාණසම්පයුත්තචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා මග්ගාරම්මණා, න මග්ගහෙතුකා, සියා මග්ගාධිපතිනො, සියා න වත්තබ්බා මග්ගාරම්මණාතිපි මග්ගාධිපතිනොතිපි.

චත්තාරො අරියමග්ගා න මග්ගාරම්මණා, මග්ගහෙතුකා, සියා මග්ගාධිපතිනො, සියා න වත්තබ්බා මග්ගාධිපතිනොති.

රූපාවචරචතුත්ථජ්ඣානං කුසලතො ච කිරියතො ච, කිරියාහෙතුකමනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතා, ඉමෙ ධම්මා සියා මග්ගාරම්මණා, න මග්ගහෙතුකා න මග්ගාධිපතිනො, සියා න වත්තබ්බා මග්ගාරම්මණාති.

කාමාවචරකුසලතො චත්තාරො ඤාණවිප්පයුත්තචිත්තුප්පාදා, සබ්බං අකුසලං, සබ්බො කාමාවචරස්ස විපාකො, කිරියතො ඡ චිත්තුප්පාදා, රූපාවචරතිකචතුක්කජ්ඣානා කුසලතො ච විපාකතො ච කිරියතො ච, චතුත්ථස්ස ඣානස්ස විපාකො, චත්තාරො ආරුප්පා කුසලතො ච විපාකතො ච කිරියතො ච, චත්තාරි ච සාමඤ්ඤඵලානි, ඉමෙ ධම්මා න වත්තබ්බා මග්ගාරම්මණාතිපි, මග්ගහෙතුකාතිපි, මග්ගාධිපතිනොතිපි, රූපං ච නිබ්බානං ච අනාරම්මණා.

1429. කතමෙ ධම්මා උප්පන්නා:

චතූසු භූමීසු විපාකො, යං ච රූපං කම්මස්සකතත්තා, ඉමෙ ධම්මා සියා උප්පන්නා, සියා උප්පාදිනො, න වත්තබ්බා අනුප්පන්නාති.

චතූසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු කිරියාව්‍යාකතං, යං ච රූපං න කම්මස්සකතත්තා, ඉමෙ ධම්මා සියා උප්පන්නා, සියා අනුප්පන්නා, න වත්තබ්බා උප්පාදිනොති.

නිබ්බානං න වත්තබ්බං උප්පන්නන්තිපි අනුප්පන්නන්තිපි උප්පාදිනොතිපි.

1430. කතමෙ ධම්මා අතීතා:[1] නිබ්බානං ඨපෙත්වා සබ්බෙ ධම්මා සියා අතීතා, සියා අනාගතා, සියා පච්චුප්පන්නා, නිබ්බානං න වත්තබ්බං අතීතන්තිපි අනාගතන්තිපි පච්චුප්පන්නන්තිපි.

1431. කතමෙ ධම්මා අතීතාරම්මණා:

විඤ්ඤාණඤ්චායතනං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, ඉමෙ ධම්මා අතීතාරම්මණා:

1432. නියතඅනාගතාරම්මණා නත්ථි.

1433. කතමෙ ධම්මා පච්චුප්පන්නාරම්මණා:

ද්වෙපඤ්චවිඤ්ඤාණානි, තිස්සො ච මනොධාතුයො, ඉමෙ ධම්මා පච්චුප්පන්නාරම්මණා.

කාමාවචරකුසලස්ස විපාකතො දස චිත්තුප්පාදා, අකුසලස්ස විපාකතො මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතා, කිරියාහෙතුකමනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතා, ඉමෙ ධම්මා සියා අතීතාරම්මණා සියා අනාගතාරම්මණා සියා පච්චුප්පන්නාරම්මණා.

1. පාඨො යං කත්ථචි න දිස්සතෙ.

1428. මග්ගාරම්මණධම්මයෝ කවරහ යත්:

කාමාවචර කුශලයන් කෙරෙහි ඥානසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෝ සතරදෙන යෑ, ක්‍රියායෙහි ඥානසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෝ සතරදෙන යෑ, යන මේ ධම්මයෝ මග්ගාරම්මණ වන්නාහු යෑ, මග්ගහේතුක නො වෙති. මග්ගාධිපති වන්නාහු යෑ, මග්ගාරම්මණයහ යි ද, මග්ගාධිපතීහ යි ද නො කියැයුතු ද වන්නාහු යෑ.

සතර ආර්‍ය්‍යමාර්ගයෝ මග්ගාරම්මණ මග්ගහේතුක නො වෙති, මග්ගාධිපති ද වන්නාහ, 'මග්ගාධිපතීහ'යි නො කියැයුතු ද වන්නාහ.

කුශල හෙයින් ද ක්‍රියා හෙයින් ද රූපාවචර චතුර්ථධ්‍යාන යෑ, උපෙක්ෂා සහගත ක්‍රියාහෙතුක මනොවිඥන ධාතු යෑ, යන මේ ධම්මයෝ මග්ගාරම්මණ වන්නාහ, මග්ගහේතුක නො වෙති, මග්ගාධිපති නො වෙති, 'මග්ගාරම්මණයහ'යි නො කියැයුතු ද වන්නාහ.

කාමාවචර කුශලයන් කෙරෙහි සතර ඥානවිප්‍රයුක්ත චිත්තොත්පාදයෝ යෑ, සියලු කාමාවචර විපාක යෑ, ක්‍රියා විසින් චිත්තොත්පාදයෝ සදෙනෙක්, කුශලවිපාකක්‍රියා විසින් රූපාවචර ත්‍රිකචතුෂ්කධ්‍යානයෝ යෑ, චතුර්ථධ්‍යාන විපාක යෑ, කුශලවිපාකක්‍රියා විසින් සතර ආරූප්‍යයෝ යෑ, සතර ශ්‍රාමණ්‍ය-ඵලයෝ ද යන මේ දහම්හු මග්ගාරම්මණයහ යි ද, මග්ගහේතුකහ යි ද, මග්ගාධිපතීහ යි ද නො කියැයුත්තාහ. රූපය ද නිර්වාණය ද අනාලම්බන-යෝ යි.

1429. උත්පන්නධම්මයෝ කවරහ යත්:

චාතුර්භූමක විපාක යෑ, කම්සමුත්ථාන වූ යම් රූපයෙකුත් ඇද්ද, මේ ධම්මයෝ උත්පන්න වෙති, උත්පාදී ද වෙත්, අනුත්පන්නයහ'යි නො කියැයුත්තාහ.

චාතුර්භූමක කුශල යෑ, අකුශල යෑ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යෑ, කම්සමුත්ථාන නො වූ යම් රූපයෙකුත් ඇද්ද, මේ ධම්මයෝ උත්පන්න ද වෙති. අනුත්පන්න ද වෙති. 'උත්පාදීහ'යි නො කියැයුත්තාහ.

නිර්වාණය උත්පන්න යයි ද, අනුත්පන්න යයි ද, උත්පාදී යයි ද නො කියැයුතු ය.

1430. අතීතධම්මයෝ කවරහ යත්:

නිවන තබා හැම දහම්හු අතීත වෙති, අනාගත වෙති, ප්‍රත්‍යුත්පන්න වෙති. නිවන අතීත යයි ද, අනාගත යයි ද, ප්‍රත්‍යුත්පන්න යයි ද නො කියැයුතු යෑ.

1431. අතීතාලම්බන ධම්මයෝ කවරහ යත්:

විඥානඤ්චායතන යෑ, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යෑ, මේ ධම්මයෝ අතීතාලම්බන වන්නාහ.

1432. නියත අනාගතාලම්බනයෝ නැත්තාහ.

1433. ප්‍රත්‍යුත්පන්නාලම්බන ධම්මයෝ කවරහ යත්:

ද්විපඤ්චවිඥානයෝ යෑ, තුන් මනොධාතුහු ද යි මේ ධම්මයෝ ප්‍රත්‍යුත්පන්නාලම්බන වෙති.

කාමාවචර කුශලවිපාකයෙන් චිත්තොත්පාදයෝ දසදෙනෙක්, අකුශල විපාකයෙන් උපෙක්ෂාසහගත මනොවිඥනධාතු යෑ, සොමනස්සසහගත ක්‍රියාහෙතුක මනොවිඥනධාතු යැයි මේ ධම්මයෝ අතීතාලම්බන වෙති, අනාගතාලම්බන ද වෙති, ප්‍රත්‍යුත්පන්නාලම්බන ද වෙත්.

කාමාවචරකුසලං, අකුසලං, කිරියතො නව චිත්තුප්පාදා, රූපාවචරං චතුත්ථං ඣානං කුසලතො ච කිරියතො ච, ඉමෙ ධම්මා සියා අතීතාරම්මණා සියා අනාගතාරම්මණා සියා පච්චුප්පන්නාරම්මණා; සියා න වත්තබ්බා අතීතාරම්මණාතිපි අනාගතාරම්මණාතිපි පච්චුප්පන්නාරම්මණාතිපි.

රූපාවචරතිකචතුක්කජ්ඣානා කුසලතො ච විපාකතො ච කිරියතො ච, චතුත්ථස්ස ඣානස්ස විපාකො, ආකාසානඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනං, චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, ඉමෙ ධම්මා න වත්තබ්බා අතීතාරම්මණාතිපි අනාගතාරම්මණාතිපි පච්චුප්පන්නාරම්මණාතිපි. රූපං ච නිබ්බානං ච අනාරම්මණා.

1434. කතමෙ ධම්මා අජ්ඣත්තා:

අනින්ද්‍රියබද්ධරූපං ච නිබ්බානං ච ඨපෙත්වා සබ්බෙ ධම්මා සියා අජ්ඣත්තා, සියා බහිද්ධා, සියා අජ්ඣත්තබහිද්ධා, අනින්ද්‍රියබද්ධරූපං ච නිබ්බානං ච බහිද්ධා.

1435. කතමෙ ධම්මා අජ්ඣත්තාරම්මණා:

විඤ්ඤාණඤ්චායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, ඉමෙ ධම්මා අජ්ඣත්තාරම්මණා:

1436. කතමෙ ධම්මා බහිද්ධාරම්මණා.

රූපාවචර තිකචතුක්කජ්ඣානා කුසලතො ච විපාකතො ච කිරියතො ච, චතුත්ථස්ස ඣානස්ස විපාකො, ආකාසානඤ්චායතනං, චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි. ඉමෙ ධම්මා බහිද්ධාරම්මණා.

රූපං ඨපෙත්වා සබ්බෙව කාමාවචරා කුසලාකුසලාබ්‍යාකතා ධම්මා, රූපාවචරං චතුත්ථං ඣානං කුසලතො ච කිරියතො ච, ඉමෙ ධම්මා සියා අජ්ඣත්තාරම්මණා සියා බහිද්ධාරම්මණා සියා අජ්ඣත්තබහිද්ධාරම්මණා.

ආකිඤ්චඤ්ඤායතනං න වත්තබ්බං අජ්ඣත්තාරම්මණන්තිපි බහිද්ධාරම්මණන්තිපි අජ්ඣත්තබහිද්ධාරම්මණන්තිපි.

රූපං ච නිබ්බානං ච අනාරම්මණා.

1437. කතමෙ ධම්මා සනිදස්සනසප්පටිඝා:

රූපායතනං, ඉමෙ ධම්මා සනිදස්සනසප්පටිඝා.

1438. කතමෙ ධම්මා අනිදස්සනසප්පටිඝා:

චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං. ඉමෙ ධම්මා අනිදස්සනසප්පටිඝා.

කාමාවචර කුශල යැ, අකුශල යැ, ක්‍රියා හෙයින් සචිත්තොත්පාදයෝ යැ, කුශල හෙයින් ද ක්‍රියා හෙයින් ද රූපාවචර චතුර්ථධ්‍යානය දැයි මේ ධර්මයෝ අතීතාලම්බන වෙති. අනාගතාලම්බන ද වෙති, ප්‍රත්‍යුත්පන්නාලම්බනද වෙති. අතීතාලම්බන යයි ද අනාගතාලම්බන යයි ද ප්‍රත්‍යුත්පන්නාලම්බන යයි ද නො කියැයුත්තාහු ද වෙත්.

කුශල හෙයින් ද විපාක හෙයින් ද ක්‍රියා හෙයින් ද රූපාවචර ත්‍රිකචතුෂ්කධ්‍යානයෝ යැ, චතුර්ථධ්‍යානවිපාක යැ, ආකාසානඤ්චායතන යැ, ආකිඤ්චඤ්ඤායතනයැ, අපර්‍යාපන්න සතර මාර්ගයෝ යැ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ යැ, මේ ධර්මයෝ අතීතාලම්බන වෙති' යි ද අනාගතාලම්බන වෙති'යි ද ප්‍රත්‍යුත්පන්නාලම්බන වෙති' යි ද නො කියැයුත්තාහ.

රූපය හා නිර්වාණය හා අනාලම්බන යි.

1434. අධ්‍යාත්මධර්මයෝ කවරහ යත්:

අනින්ද්‍රියබද්ධ රූපය හා නිර්වාණය හා තබා සියලු ධර්මයෝ අධ්‍යාත්ම වෙති, බාහිර ද වෙති, අධ්‍යාත්ම බාහිර ද වෙත්. අනින්ද්‍රියබද්ධ රූපය හා නිර්වාණය හා බාහිර යි.

1435. අධ්‍යාත්මාලම්බන ධර්මයෝ කවරහ යත්:

විඤ්ඤාණඤ්චායතන යැ, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යැයි මේ ධර්මයෝ අධ්‍යාත්මාලම්බන වෙත්.

1436. බාහ්‍යාලම්බනධර්මයෝ කවරහ යත්:

කුශල හෙයින් ද විපාක හෙයින් ද ක්‍රියා හෙයින් ද රූපාවචර ත්‍රිකචතුෂ්කධ්‍යානයෝ යැ, චතුර්ථධ්‍යාන විපාක යැ, ආකාසානඤ්චායතන යැ, අපර්‍යාපන්න සතර මාර්ගයෝ යැ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ යැයි මේ ධර්මයෝ බාහ්‍යාලම්බන වෙත්.

රූපය තබා සියලු මැ කාමාවචර කුශලාකුශලඅව්‍යාකෘත ධර්මයෝ යැ, කුශල හෙයින් ද අකුශල හෙයින් ද රූපාවචර චතුර්ථධ්‍යානය දැයි මේ ධර්මයෝ අධ්‍යාත්මාලම්බන වෙති, බාහ්‍යාලම්බන ද වෙති, ආධ්‍යාත්මබාහ්‍යාලම්බන ද වෙත්.

ආකිඤ්චඤ්ඤායතනය අධ්‍යාත්මාලම්බන යයි ද බාහ්‍යාලම්බන යයි ද අධ්‍යාත්මබාහ්‍යාලම්බන යයි ද නො කියැයුතු යැ.

රූපය හා නිර්වාණය හා අනාලම්බන යි.

1437. සනිදර්ශනසප්‍රතිඝධර්මයෝ කවරහ යත්:

රූපායතන යි, මේ ධර්මයෝ සනිදර්ශනසප්‍රතිඝ වෙත්.

1438. අනිදර්ශනසප්‍රතිඝධර්මයෝ කවරහ යත්:

චක්ෂුරායතන යැ ... ස්ප්‍රෂ්ටව්‍යායතන යි, මේ ධර්මයෝ අනිදර්ශනසප්‍රතිඝ වෙත්.

1439. කතමෙ ධම්මා අනිදස්සනඅප්පටිඝා:

චතූසු භූමීසු කුසලං, අකුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාබ්‍යාකතං, යං ච රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං, නිබ්බානං ච, ඉමෙ ධම්මා අනිදස්සනඅප්පටිඝා.

තිකං

1440. කතමෙ ධම්මා හෙතූ:

තයො කුසලහෙතූ, තයො අකුසලහෙතූ, තයො අබ්‍යාකතහෙතූ.

අලොභො කුසලහෙතු අදොසො කුසලහෙතු චතූසු භූමීසු කුසලෙසු උප්පජ්ජන්ති, අමොහො කුසලහෙතු කාමාවචරකුසලතො චත්තාරො ඤාණවිප්පයුත්තෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා චතූසු භූමීසු කුසලෙසු උප්පජ්ජති.

ලොභො අට්ඨසු ලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, දොසො ද්වීසු දොමනස්සසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, මොහො සබ්බාකුසලෙසු උප්පජ්ජති.

අලොභො විපාකහෙතු, අදොසො විපාකහෙතු, කාමාවචරස්ස විපාකතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා චතූසු භූමීසු විපාකෙසු උප්පජ්ජන්ති.

අමොහො විපාකහෙතු කාමාවචරස්ස විපාකතො අහෙතුකෙ චිතුප්පාදෙ ඨපෙත්වා, චත්තාරො ඤාණවිප්පයුත්තෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා, චතූසු භූමීසු විපාකෙසු උප්පජ්ජති.

අලොභො කිරියහෙතු අදොසො කිරියහෙතු, කාමාවචරකිරියතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා තීසු භූමීසු කිරියෙසු උප්පජ්ජන්ති,

අමොහො කිරියහෙතු කාමාවචරකිරියතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා, චත්තාරො ඤාණවිප්පයුත්තෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා, තීසු භූමීසු කිරියෙසු උප්පජ්ජති, ඉමෙ ධම්මා හෙතූ.

1441. කතමෙ ධම්මා න හෙතූ:

ඨපෙත්වා හෙතූ, චතූසු භූමීසු කුසලං අකුසලං චතූසු භූමීසු විපාකො තීසු භූමීසු කිරියාබ්‍යාකතං, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා න හෙතූ.

1442 කතමෙ ධම්මා සහෙතුකා:

විචිකිච්ඡාසහගතං උද්ධච්චසහගතං මොහං ඨපෙත්වා, අවසෙසං අකුසලං, චතූසු භූමීසු කුසලං, කාමාවචරස්ස විපාකතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා චතූසු භූමීසු විපාකො, කාමාවචරකිරියතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා තීසු භූමීසු කිරියාබ්‍යාකතං, ඉමෙ ධම්මා සහෙතුකා.

1443 කතමෙ ධම්මා අහෙතුකා:

විචිකිච්ඡාසහගතො මොහො, උද්ධච්චසහගතො මොහො, ද්වෙ පඤ්ච විඤ්ඤාණානි, තිස්සො ච මනොධාතුයො, පඤ්ච ච අහෙතුකමනොවිඤ්ඤාණධාතුයො, රූපඤ්ච නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා අහෙතුකා.

1439. අනිදර්ශනඅප්‍රතිඝධර්මයෝ කවරහ යත්:

චාතුර්භූමක කුශල යැ, අකුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, ධර්මායතනපර්‍යාපන්න වූ අනිදර්ශන අප්‍රතිඝ යම් රූපයෙකුත් ඇද්ද, නිර්වාණය දැයි මේ ධර්මයෝ අනිදර්ශන අප්‍රතිඝයෝ යි.

## ත්‍රිකධර්ම යි

1440 හේතුධර්මයෝ කවරහ යත්:

තුන් කුශලහේතූහු යැ, තුන් අකුශලහේතූහු යැ, තුන් අව්‍යාකෘතහේතූහු යි.

අලෝභ කුශලහේතු හා අදෝෂ කුශලහේතු හා චාතුර්භූමක කුශලයෙහි උපදිති. අමෝහ කුශලහේතුව කාමාවචර කුශලයෙන් සතර ඥානවිප්‍රයුක්ත චිත්තොත්පාදයන් තබා චාතුර්භූමක කුශලයෙහි උපදී.

ලෝභය ලෝභසහගත චිත්තොත්පාද අටෙහි උපදී, ද්වේෂය දෙමනස් සහගිය චිත්තොත්පාද දෙකෙහි උපදී, මෝහය සියලු අකුශලයන්හි උපදී.

අලෝභවිපාකහේතුව හා අදෝෂවිපාකහේතුව හා දෙක කාමාවචර විපාකයෙහි අහේතුක චිත්තොත්පාදයන් තබා චාතුර්භූමක විපාකයෙහි උපදිත්.

අමෝහවිපාකහේතුව කාමාවචරවිපාකයෙන් අහේතුක චිත්තොත්පාද තබා සතර ඥානවිප්‍රයුක්ත චිත්තොත්පාද තබා චාතුර්භූමක විපාකයෙහි උපදී.

අලෝභක්‍රියාහේතු හා අදෝෂක්‍රියාහේතු හා මොහු කාමාවචරක්‍රියායෙන් අහේතුකචිත්තොත්පාද තබා ත්‍රෛභූමකක්‍රියායෙහි උපදිත්.

අමෝහක්‍රියාහේතුව කාමාවචරක්‍රියායෙන් අහේතුක චිත්තොත්පාද තබා සතර ඥානවිප්‍රයුක්ත චිත්තොත්පාද තබා ත්‍රෛභූමකක්‍රියායෙහි උපදී. මේ ධර්මයෝ හෙතූහු වෙත්.

1441 හෙතු නොවන ධර්මයෝ කවරහ යත්:

හේතුධර්ම තබා චාතුර්භූමක කුශල යැ, අකුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය දැයි මේ ධර්මයෝ හේතු නොවන ධර්මයෝ යි.

1442. සහේතුක ධර්මයෝ කවරහ යත්:

විචිකිච්ඡාසහගත උද්ධච්චසහගත මෝහය තබා අවශේෂ අකුශල යැ, චාතුර්භූමක කුශල යැ, කාමාවචර විපාකයෙන් අහේතුක චිත්තොත්පාද තබා චාතුර්භූමක විපාක යැ, කාමාවචර ක්‍රියායෙන් අහේතුක චිත්තොත්පාද තබා ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, මේ ධර්මයෝ සහෙතුකයෝ යි.

1443. අහේතුක ධර්මයෝ කවරහ යත්:

විචිකිච්ඡාසහගත මෝහ යැ, උද්ධච්චසහගත මෝහ යැ, දෙපස් විඥානයෝ යැ, තුන් මනෝධාතූහු ද පස් අහේතුක මනෝවිඥානධාතූහු ද රූපය නිර්වාණය දැයි මේ ධර්මයෝ අහේතුකයෝ යි.

1444. කතමෙ ධම්මා හෙතුසම්පයුත්තා:

විචිකිච්ඡාසහගතං උද්ධච්චසහගතං මොහං ඨපෙත්වා අවසෙසං අකුසලං, චතුසු භූමිසු කුසලං, කාමාවචරස්ස විපාකතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා චතුසු භූමිසු විපාකො, කාමාවචරකිරියතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා තීසු භූමිසු කිරියාබ්‍යාකතං, ඉමෙ ධම්මා හෙතුසම්පයුත්තා.

1445. කතමෙ ධම්මා හෙතුවිප්පයුත්තා:

විචිකිච්ඡාසහගතො මොහො, උද්ධච්චසහගතො මොහො, ද්වෙ පඤ්චවිඤ්ඤාණානි, තිස්සො ච මනොධාතුයො, පඤ්ච ච අහෙතුකමනොවිඤ්ඤාණධාතුයො, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා හෙතුවිප්පයුත්තා.

1446. කතමෙ ධම්මා හෙතූ චෙව සහෙතුකා ච:

යත්ථ ද්වෙ තයො හෙතූ එකතො උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා හෙතූ චෙව සහෙතුකා ච.

1447. කතමෙ ධම්මා සහෙතුකා චෙව න ච හෙතූ:

චතුසු භූමිසු කුසලං, අකුසලං, කාමාවචරස්ස විපාකතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා චතුසු භූමිසු විපාකො, කාමාවචරකිරියතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා තීසු භූමිසු කිරියාබ්‍යාකතං, එත්ථුප්පන්නෙ හෙතූ ඨපෙත්වා, ඉමෙ ධම්මා සහෙතුකා චෙව න ච හෙතූ

අහෙතුකා ධම්මා න වත්තබ්බා හෙතූ චෙව සහෙතුකා තිපි, සහෙතුකා චෙව න ච හෙතූතිපි.

1448. කතමෙ ධම්මා හෙතූ චෙව හෙතුසම්පයුත්තා ච:

යත්ථ ද්වෙ තයො හෙතූ එකතො උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා හෙතූ චෙව හෙතු සම්පයුත්තා ච.

1449. කතමෙ ධම්මා හෙතුසම්පයුත්තා චෙව න ච හෙතූ:

චතුසු භූමිසු කුසලං, අකුසලං, කාමාවචරස්ස විපාකතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා චතුසු භූමිසු විපාකො, කාමාවචරකිරියතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා තීසු භූමිසු කිරියාබ්‍යාකතං, එත්ථුප්පන්නෙ හෙතූ ඨපෙත්වා, ඉමෙ ධම්මා හෙතුසම්පයුත්තා චෙ ව න ච හෙතූ.

හෙතුවිප්පයුත්තා ධම්මා න වත්තබ්බා හෙතූ චෙව හෙතු සම්පයුත්තා තිපි, හෙතුසම්පයුත්තා චෙව න ච හෙතූතිපි.

1450. කතමෙ ධම්මා න හෙතූ සහෙතුකා:

චතුසු භූමිසු කුසලං, අකුසලං, කාමාවචරස්ස විපාකතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා චතුසු භූමිසු විපාකො, කාමාවචරකිරියතො අහෙතුකෙ චිත්තුප්පාදෙ ඨපෙත්වා තීසු භූමිසු කිරියාබ්‍යාකතං, එත්ථුප්පන්නෙ හෙතූ ඨපෙත්වා, ඉමෙ ධම්මා න හෙතූ සහෙතුකා.

1444. හේතුසම්ප්‍රයුක්තධර්මයෝ කවරහ යත්:

විචිකිච්ඡාසහගත උද්ධච්චසහගත මෝහය තබා අවශේෂ අකුශල යැ, චාතුර්භූමක කුශල යැ, කාමාවචර විපාකයෙන් අහේතුක චිත්තෝත්පාදයන් තබා චාතුර්භූමක විපාක යැ, කාමාවචරක්‍රියා හෙයින් අහේතුක චිත්තෝත්පාදයන් තබා ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ යන මේ ධර්මයෝ ක්‍රියාව්‍යාකෘතයෝ යි.

1445. හේතුවිප්‍රයුක්තධර්මයෝ කවරහ යත්:

විචිකිච්ඡාසහගත මෝහ යැ, උද්ධච්චසහගත මෝහ යැ, දෙපස් විඥානයෝ යැ, තුන් මනෝධාතුහු ද, අහේතුක මනෝවිඥානධාතු පස ද, රූපය ද, නිර්වාණය දැයි මේ ධර්මයෝ හෙතුවිප්‍රයුක්තයෝ යි.

1446. හේතු ද වූ සම්ප්‍රයුක්තහේතු සහිත ද වූ ධර්මයෝ කවරහ යත්:

යම් තැනෙක දෙතුන් හේතු කෙනෙක් එක්වට උපදනාහු වෙත් ද, මේ ධර්මයෝ හෙතු ද සම්ප්‍රයුක්ත හේතුයෙන් සහේතුක ද වෙත්.

1447. සහේතුක ද වූ නො ද හේතු වූ ධර්මයෝ කවරහ යත්:

චාතුර්භූමක කුශල යැ, අකුශල යැ, කාමාවචරවිපාකයෙන් අහේතුක චිත්තෝත්පාදයන් තබා චාතුර්භූමක විපාක යැ, කාමාවචර ක්‍රියායෙන් අහේතුක චිත්තෝත්පාදයන් තබා ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, මෙහි උපන් හේතූන් තබා, මේ දහම්හු සහේතුක ද නො ද හේතු වූවාහු ද වෙත්.

අහේතුක ධර්මයෝ හේතු ද සහේතුක ද වෙති'යි ද, සහේතුක ද නො ද හෙතු වෙති'යි ද නො කියැයුත්තාහ.

1448. හේතු වූ ද හේතුසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ කවරහ යත්:

යම් තැනෙක දෙතුන් හේතු කෙනෙක් (අන්‍ය හෙතූන් සමග) එක්වට උපදිත් ද, මොහු හේතු වූ ද හේතුසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ යි.

1449. හේතුසම්ප්‍රයුක්ත වූ ද නො ද හේතු වූ ධර්මයෝ කවරහ යත්:

චාතුර්භූමක කුශල යැ, අකුශල යැ, කාමාවචරවිපාකයෙන් අහේතුක චිත්තෝත්පාදයන් තබා චාතුර්භූමක විපාක යැ, කාමාවචර ක්‍රියායෙන් අහේතුක චිත්තෝත්පාදයන් තබා ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ යන මෙහි උපන් හේතූන් තබා, මොහු හේතුසම්ප්‍රයුක්ත ද වූ නො ද හේතු වූ ධර්මයෝ යි.

හේතුවිප්‍රයුක්ත ධර්මයෝ හේතු ද වූ හේතුසම්ප්‍රයුක්ත වූවෝ යයි ද, හේතුසම්ප්‍රයුක්ත ද වූ නො ද හේතු වූහ'යි ද නො කියැයුත්තාහ.

1450. හේතු නො වූ සහේතුක ධර්මයෝ කවරහ යත්:

චාතුර්භූමක කුශල යැ, අකුශල යැ, කාමාවචර විපාකයෙන් අහෙතුක චිත්තෝත්පාදයන් තබා චාතුර්භූමක විපාක යැ, කාමාවචරක්‍රියායෙන් අහේතුක චිත්තෝත්පාදයන් තබා ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ යන මෙහි උපන් හේතූන් තබා, මොහු හේතු නො වූ සහේතුක ධර්මයෝ යි.

1451. කතමෙ ධම්මා න හෙතූ අහෙතුකා:

ද්වෙ පඤ්ච විඤ්ඤාණානි, තිස්සො ච මනොධාතුයො, පඤ්ච ච අහෙතුකමනොවිඤ්ඤාණධාතුයො, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා න හෙතූ අහෙතුකා.

හෙතූ ධම්මා න වත්තබ්බා න හෙතූ සහෙතුකාතිපි, න හෙතූ අහෙතුකාතිපි.

### හෙතු ගොච්ඡකං

1452. කතමෙ ධම්මා සප්පච්චයා:

චතුසු භූමීසු කුසලං, අකුසලං, චතුසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා සප්පච්චයා.

1453. කතමෙ ධම්මා අප්පච්චයා:

නිබ්බානං, ඉමෙ ධම්මා අප්පච්චයා.

1454. කතමෙ ධම්මා සඞ්ඛතා:

චතුසු භූමීසු කුසලං, අකුසලං, චතුසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා සඞ්ඛතා.

1455. කතමෙ ධම්මා අසඞ්ඛතා:

නිබ්බානං, ඉමෙ ධම්මා අසඞ්ඛතා.

1456. කතමෙ ධම්මා සනිදස්සනා:

රූපායතනං, ඉමෙ ධම්මා සනිදස්සනා.

1457. කතමෙ ධම්මා අනිදස්සනා:

චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, චතුසු භූමීසු කුසලං, අකුසලං, චතුසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, යං ච රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං, නිබ්බානං ච, ඉමෙ ධම්මා අනිදස්සනා.

1458. කතමෙ ධම්මා සප්පටිඝා:

චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, ඉමෙ ධම්මා සප්පටිඝා.

1459 කතමෙ ධම්මා අප්පටිඝා:

චතුසු භූමීසු කුසලං, අකුසලං, චතුසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, යං ච රූපං අනිදස්සනං අප්පටිඝං ධම්මායතනපරියාපන්නං, නිබ්බානං ච, ඉමෙ ධම්මා අප්පටිඝා.

1460. කතමෙ ධම්මා රූපිනො:

චත්තාරො ච මහාභූතා, චතුන්නං ච මහාභූතානං උපාදාය රූපං, ඉමෙ ධම්මා රූපිනො.

1451. හේතු නො වූ අහේතුක ධර්මයෝ කවරහ යත්:

දෙපස් විඥානයෝ ය, මනෝධාතු ත්‍රිකය ද, අහේතුක මනෝවිඥානධාතු පඤ්චකය ද රූපය ද, නිර්වාණය ද, යන මේ ධර්මයෝ හේතු නො වූ අහෙතුකයෝ යි.

හේතු ධර්මයෝ හේතු නො වූ සහේතුකයෝ යයි ද, හේතු නො වූ අහේතුකයෝ යයි ද නො කියැයුත්තාහ.

හේතුගොච්ඡක යි.

1452. සප්‍රත්‍යයධර්මයෝ කවරහ යත්:

සියුබිම්හි කුශල ය, අකුශල ය, සියුබිම්හි විපාක ය, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත ය, හැම රූපය ද, යන මේ ධර්මයෝ සප්‍රත්‍යයයෝ යි.

1453. අප්‍රත්‍යයධර්මයෝ කවරහ යත්:

නිර්වාණය යි. මේ ධර්මයෝ අප්‍රත්‍යයයෝ යි.

1454. සංඛතධර්මයෝ කවරහ යත්:

සියුබිම්හි කුශල ය, අකුශල ය, සියුබිම්හි විපාක ය, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත ය, හැම රූපය ද, යන මේ ධර්මයෝ සංඛතයෝ යි.

1455. අසංඛතධර්මයෝ කවරහ යත්:

නිර්වාණය යි. මේ ධර්මයෝ අසංඛතයෝ යි.

1456. සනිදර්ශනධර්මයෝ කවරහ යත්:

රූපායතන යි. මොහු සනිදර්ශන ධර්මයෝ යි.

1457. අනිදර්ශනධර්මයෝ කවරහ යත්:

චක්ෂුරායතන ය ... ස්‍ප්‍රෂ්ටව්‍යායතන ය, චාතුර්භූමක කුශල ය, අකුශල ය, චාතුර්භූමක විපාක ය, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත ය, අනිදර්ශන අප්‍රතිඝ වූ ධර්මායතනපර්‍යාපන්න වූ යම් රූපයෙකුත් ඇද්ද, නිර්වාණය දැයි මොහු අනිදර්ශන ධර්මයෝ යි.

1458. සප්‍රතිඝධර්මයෝ කවරහ යත්:

චක්ෂුරායතන ය ... ස්‍ප්‍රෂ්ටව්‍යායතන ය යන මොහු සප්‍රතිඝධර්මයෝ යි.

1459. අප්‍රතිඝධර්මයෝ කවරහ යත්:

සියුබිම්හි කුශල ය, අකුශල ය, සියුබිම්හි විපාක ය, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත ය, අනිදර්ශන අප්‍රතිඝ වූ ධර්මායතනපර්‍යාපන්න වූ යම් රූපයෙකුත් ඇද්ද, නිර්වාණය දැයි මේ ධර්මයෝ අප්‍රතිඝයෝ යි.

1460. රූපිධර්මයෝ කවරහ යත්:

සතර මහාභූතයෝ ද, සතර මහාභූතයන් නිසා පවත්නා රූපය දැයි මොහු රූපි ධර්මයෝ යි.

1461. කතමෙ ධම්මා අරූපිනො:

චතූසු භූමීසු කුසලං, අකුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, නිබ්බානං ච, ඉමෙ ධම්මා අරූපිනො.

1462. කතමෙ ධම්මා ලොකියා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා ලොකියා.

1463. කතමෙ ධම්මා ලොකුත්තරා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා ලොකුත්තරා.

සබ්බෙ ධම්මා කෙනචි විඤ්ඤෙය්‍යා, කෙනචි න විඤ්ඤෙය්‍යා.

## චූලන්තරදුකං

1464. කතමෙ ධම්මා ආසවා:

චත්තාරො ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො. කාමාසවො අට්ඨසු ලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, භවාසවො චතූසු දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, දිට්ඨාසවො චතූසු දිට්ඨිගතසම්පයුත්තෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, අවිජ්ජාසවො සබ්බාකුසලෙසු උප්පජ්ජති, ඉමෙ ධම්මා ආසවා.

1465. කතමෙ ධම්මා නො ආසවා:

ඨපෙත්වා ආසවෙ අවසෙසං අකුසලං, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො ආසවා.

1466. කතමෙ ධම්මා සාසවා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා සාසවා.

1467. කතමෙ ධම්මා අනාසවා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අනාසවා.

1468. කතමෙ ධම්මා ආසවසම්පයුත්තා:

ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදෙ, එත්ථුප්පන්නං මොහං ඨපෙත්වා, විචිකිච්ඡාසහගතෙ උද්ධච්චසහගතෙ මොහෙ ඨපෙත්වා අවසෙසං අකුසලං, ඉමෙ ධම්මා ආසවසම්පයුත්තා.

1461 අරූපී ධර්මයෝ කවරහ යත්:

සිවුබිම්හි කුශල යෑ, අකුශල යෑ, සිවුබිම්හි විපාක යෑ, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යෑ, නිර්වාණය දැයි මොහු අරූපී ධර්මයෝ යි.

1462. ලෞකික ධර්මයෝ කවරහ යත්:

ත්‍රෛභූමක කුශල යෑ, අකුශල යෑ, ත්‍රෛභූමක විපාක යෑ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යෑ, හැම රූපය ද යන මොහු ලෞකික ධර්මයෝ යි.

1463. ලෝකෝත්තර ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ යෑ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මොහු ලෝකෝත්තර ධර්මයෝ යි.

හැම ධර්මයෝ කිසි විඥානයෙකින් දතයුත්තාහු යෑ, කිසි විඥානයෙකින් නො දතයුත්තාහු වෙත්.

චූලන්තර දුක යි.

1464. ආස්‍රවධර්මයෝ කවරහ යත්:

ආස්‍රවයෝ සතරදෙනෙක් වෙති: කාමාස්‍රව යෑ, භවාස්‍රව යෑ, දෘෂ්ට්‍යාස්‍රව යෑ, අවිද්‍යාස්‍රව යි. කාමාස්‍රවය අෂ්ටලෝභසහගත චිත්තෝත්පාදයන්හි උපදී, භවාස්‍රවය සතර දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත චිත්තෝත්පාදයන්හි උපදී, දෘෂ්ට්‍යාස්‍රවය සතර දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත චිත්තෝත්පාදයන්හි උපදී, අවිද්‍යාස්‍රවය සර්වාකුශලයෙහි උපදී. මේ ධර්මයෝ ආස්‍රවයෝ යි.

1465. ආස්‍රව නොවූ ධර්මයෝ කවරහ යත්:

ආස්‍රවයන් තබා අවශේෂ අකුශල යෑ, චාතුර්භූමක කුශල යෑ, චාතුර්භූමක විපාක යෑ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යෑ, රූපය ද නිර්වාණය දැයි මොහු ආස්‍රව නො වූ ධර්මයෝ යි.

1466. සාස්‍රව (ආස්‍රව සහිත) ධර්මයෝ කවරහ යත්:

තුන් බිමැ කුශල යෑ, අකුශල යෑ, තුන් බිමැ විපාක යෑ, තුන් බිමැ ක්‍රියාව්‍යාකෘත යෑ, හැම රූප දැයි මොහු සාස්‍රව ධර්මයෝ යි.

1467. අනාස්‍රව ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ යෑ, සතර ශ්‍රාමණ්‍යඵලය ද, නිර්වාණය දැයි මොහු අනාස්‍රව ධර්මයෝ යි.

1468 ආස්‍රවසම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

දෙම්නස් සහගිය චිත්තෝත්පාදයෝ දෙදෙන යෑ, මෙහි උපන් මෝහය තබා, විචිකිච්ඡාසහගත වූ උද්ධච්චසහගත වූ මෝහයන් තබා, අවශේෂ අකුශලය දැයි මොහු ආස්‍රවසම්ප්‍රයුක්ත ධර්මයෝ යි.

1469. කතමෙ ධම්මා ආසවවිප්පයුත්තා:

ද්වීසු දෝමනස්සසහගතේසු චිත්තුප්පාදෙසු උප්පන්නො මොහො, විචිකිච්ඡාසහගතො මොහො, උද්ධච්චසහගතො මොහො, චතූසු භූමිසු කුසලං, චතූසු භූමිසු විපාකො, තීසු භූමිසු කිරියාව්‍යාකතං, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා ආසවවිප්පයුත්තා.

1470. කතමෙ ධම්මා ආසවා චෙව සාසවා ච:

තෙව ආසවා ආසවා චෙව සාසවා ච.

1471. කතමෙ ධම්මා සාසවා චෙව නො ච ආසවා:

ඨපෙත්වා ආසවෙ අවසෙසං අකුසලං, තීසු භූමිසු කුසලං, තීසු භූමිසු විපාකො, තීසු භූමිසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා සාසවා චෙව නො ච ආසවා.

අනාසවා ධම්මා න වත්තබ්බා ආසවා චෙව සාසවාතිපි සාසවා චෙව නො ච ආසවාතිපි.

1472. කතමෙ ධම්මා ආසවා චෙව ආසවසම්පයුත්තා ච:

යත්ථ ද්වෙ තයො ආසවා එකතො උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා ආසවා චෙව ආසවසම්පයුත්තා ච.

1473. කතමෙ ධම්මා ආසවසම්පයුත්තා චෙව නො ච ආසවා:

ඨපෙත්වා ආසවෙ අවසෙසා අකුසලා, ඉමෙ ධම්මා ආසවසම්පයුත්තා චෙව නො ච ආසවා.

ආසවවිප්පයුත්තා ධම්මා න වත්තබ්බා ආසවා චෙව ආසවසම්පයුත්තාතිපි ආසවසම්පයුත්තා චෙව නො ච ආසවාතිපි.

1474. කතමෙ ධම්මා ආසවවිප්පයුත්තා සාසවා:

ද්වීසු දෝමනස්සසහගතේසු චිත්තුප්පාදෙසු උප්පන්නො මොහො, විචිකිච්ඡාසහගතො මොහො, උද්ධච්චසහගතො මොහො, තීසු භූමිසු කුසලං, තීසු භූමිසු විපාකො, තීසු භූමිසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා ආසවවිප්පයුත්තා සාසවා

1475. කතමෙ ධම්මා ආසවවිප්පයුත්තා අනාසවා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා ආසවවිප්පයුත්තා අනාසවා.

ආසවසම්පයුත්තා ධම්මා න වත්තබ්බා ආසවවිප්පයුත්තා සාසවාතිපි ආසවවිප්පයුත්තා අනාසවාතිපි.

ආසවගොච්ඡකං.

1469. ආස්‍රවවිප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

දෙමනස් සහගිය චිත්තෝත්පාද දෙක්හි උපන් මෝහ යැ, විචිකිච්ඡා සහගත මෝහ යැ, උද්ධච්චසහගත මෝහ යැ, සියුබිම්හි කුශල යැ, සියුබිම්හි විපාක යැ, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය දැයි මොහු ආස්‍රවවිප්‍රයුක්ත ධර්මයෝ යි.

1470. ආස්‍රව වූ ද ආස්‍රව සහිත වූ ද ධර්මයෝ කවරහ යත්:

ඒ ආස්‍රවයෝ මැ ආස්‍රව වූවාහු ද ආස්‍රව සහිත වූවාහු ද වෙත්:

1471. සාස්‍රව වූ ද නො ද ආස්‍රව වූ ද ධර්මයෝ කවරහ යත්:

ආස්‍රවයන් තබා අවශේෂ අකුශල යැ, ත්‍රෛභූමක කුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූපය දැයි මේ ධර්මයෝ ආස්‍රව සහිත වූවාහු ද නො ද ආස්‍රව වූවාහු ද වෙති.

අනාස්‍රව ධර්මයෝ ආස්‍රවයෝත් ආස්‍රව සහිතයෝත් වෙති යි ද, සාස්‍රව වූවෝත් නො ද ආස්‍රව වූවෝත් වෙති යි ද නො කියැයුත්තාහු වෙත්

1472. ආස්‍රව වූ ද ආස්‍රවසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ කවරහ යත්:

යම් චිත්තෝත්පාදයෙක්හි දෙතුන් ආස්‍රව කෙනෙක් එක්වට උපදිත් ද, මොහු ආස්‍රව වූ ද ආස්‍රවසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ යි.

1473. ආස්‍රවසම්ප්‍රයුක්ත වූ ද නො ද ආස්‍රව වූ ද ධර්මයෝ කවරහ යත්:

ආස්‍රවයන් තබා අවශෙෂ අකුශලයෝ යැ. මොහු ආස්‍රවසම්ප්‍රයුක්ත වූ ද නො ද ආස්‍රව වූ ද ධර්මයෝ යි.

ආස්‍රවවිප්‍රයුක්ත වූ ධර්මයෝ ආස්‍රව ද වූ ආස්‍රවසම්ප්‍රයුක්තයෝ යයි ද ආස්‍රවසම්ප්‍රයුක්ත ද වූ නො ද ආස්‍රව වූවෝ යයි ද නො කියැයුත්තාහ.

1474. ආස්‍රවවිප්‍රයුක්ත වූ සාස්‍රව ධර්මයෝ කවරහ යත්:

දෙමනස්සහගිය දෙ සිත්හි උපන් මොහ යැ, විචිකිච්ඡාසහගත මොහ යැ, උද්ධච්චසහගත මොහ යැ, තුන්බිම්හි කුශල යැ, තුන්බිම්හි විපාක යැ, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූපය දැයි මොහු ආස්‍රවවිප්‍රයුක්ත වූ සාස්‍රව ධර්මයෝ යි.

1475. ආස්‍රවවිප්‍රයුක්ත වූ අනාස්‍රව ධර්මයෝ කවරහ යත්:

අපර්යාපන්න වූ සතර මාර්ගයෝ යැ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු ආස්‍රවවිප්‍රයුක්ත වූ අනාස්‍රවධර්මයෝ යි.

ආස්‍රවසම්ප්‍රයුක්ත ධර්මයෝ ආස්‍රවවිප්‍රයුක්ත වූ සාස්‍රව (ආස්‍රව සහිත) යෝ යයි ද, ආස්‍රවවිප්‍රයුක්ත වූ අනාස්‍රවයෝ යයි ද නො කියැයුත්තාහ.

ආස්‍රවගොච්ඡක යි.

1476. කතමෙ ධම්මා සඤ්ඤොජනා:

දස සඤ්ඤොජනානි: කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං මානසඤ්ඤොජනං දිට්ඨිසඤ්ඤොජනං විචිකිච්ඡාසඤ්ඤොජනං සීලබ්බතපරාමාසසඤ්ඤොජනං භවරාගසඤ්ඤොජනං ඉස්සාසඤ්ඤොජනං මච්ඡරියසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනං.

කාමරාගසඤ්ඤොජනං අට්ඨසු ලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, පටිඝසඤ්ඤොජනං ද්වීසු දොමනස්සසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, මානසඤ්ඤොජනං චතුසු දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, දිට්ඨිසඤ්ඤොජනං චතුසු දිට්ඨිගතසම්පයුත්තෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, විචිකිච්ඡාසඤ්ඤොජනං විචිකිච්ඡාසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, සීලබ්බතපරාමාසසඤ්ඤොජනං චතුසු දිට්ඨිගතසම්පයුත්තෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, භවරාගසඤ්ඤොජනං චතුසු දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, ඉස්සා සඤ්ඤොජනං මච්ඡරිය සඤ්ඤොජනං ච ද්වීසු දොමනස්සසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජන්ති, අවිජ්ජාසඤ්ඤොජනං සබ්බාකුසලෙසු උප්පජ්ජති, ඉමෙ ධම්මා සඤ්ඤොජනා.

1477. කතමෙ ධම්මා නො සඤ්ඤොජනා:

ඨපෙත්වා සඤ්ඤොජනෙ අවසෙසං අකුසලං, චතුසු භූමීසු කුසලං, චතුසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො සඤ්ඤොජනා.

1478. කතමෙ ධම්මා සඤ්ඤොජනියා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා සඤ්ඤොජනියා.

1479. කතමෙ ධම්මා අසඤ්ඤොජනියා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි නිබ්බානං ච, ඉමෙ ධම්මා අසඤ්ඤොජනියා.

1480. කතමෙ ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා:

උද්ධච්චසහගතං මොහං ඨපෙත්වා අවසෙසං අකුසලං, ඉමෙ ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා.

1481. කතමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා:

උද්ධච්චසහගතො මොහො, චතුසු භූමීසු කුසලං, චතුසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා.

1482. කතමෙ ධම්මා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනියා ච:

තානෙව සඤ්ඤොජනානි සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනියා ච.

1476. සංයෝජනධම්මයෝ කවරහු යත්:

සංයෝජන දසයෙකි: කාමරාගසංයෝජන යැ ප්‍රතිඝසංයෝජන යැ මානසංයෝජන යැ දෘෂ්ටිසංයෝජන යැ විචිකිත්සාසංයෝජන යැ ශීලව්‍රත-පරාමර්ශසංයෝජන යැ භවරාගසංයෝජන යැ ඊර්ෂ්‍යාසංයෝජන යැ මාත්සර්‍ය්‍යසංයෝජන යැ අවිද්‍යාසංයෝජන යි.

කාමරාගසංයෝජනය අෂ්ට ලෝභසහගත චිත්තෝත්පාදයන්හි උපදී. ප්‍රතිඝසංයෝජනය දෞර්මනස් සහගිය දෙ සිත්හි උපදී. මානසංයෝජනය දෘෂ්ටිගතවිප්‍රයුක්ත වූ ලෝභ සහගත සතර සිත්හි උපදී. දෘෂ්ටිසංයෝජනය දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වූ සතර සිත්හි උපදී. විචිකිත්සාසංයෝජනය විචිකිත්සාසහගත චිත්තෝත්පාදයන්හි උපදී. ශීලව්‍රතපරාමර්ශසංයෝජනය දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත සතර සිත්හි උපදී. භවරාගසංයෝජනය දෘෂ්ටිගත-විප්‍රයුක්ත වූ ලෝභසහගත සතර සිත්හි උපදී. ඊර්ෂ්‍යාසංයෝජනයත් මාත්සර්‍ය්‍යසංයෝජනයත් දෞර්මනස්සහගිය දෙසිත්හි උපදිති. අවිද්‍යාසං-යෝජනය සියලු අකුශල සිත්හි උපදී. මොහු සංයෝජන ධම්මයෝ යි.

1477. සංයෝජන නො වූ ධම්මයෝ කවරහු යත්:

සංයෝජනයන් තබා අවශේෂ අකුශල යැ, සිවුබිම්හි කුශල යැ, සිවුබිම්හි විපාක යැ, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය දැයි මොහු සංයෝජන නො වූ ධම්මයෝ යි.

1478. සංයෝජනීය (සංයොජනයන්ට හිත වූ) ධම්මයෝ කවරහු යත්:

ත්‍රෛභූමක කුශල යැ, අකුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූපය දැයි මොහු සංයෝජනයනට හිත වූ ධම්මයෝ යි.

1479. අසංයෝජනීය ධම්මයෝ කවරහු යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ ද, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු සංයෝජනීය නො වූ ධම්මයෝ යි.

1480. සංයෝජනසම්ප්‍රයුක්ත වූ ධම්මයෝ කවරහු යත්:

ඖද්ධත්‍යසහගත මෝහය තබා අවශේෂ අකුශලය යි. මොහු සංයෝ-ජනසම්ප්‍රයුක්ත වූ ධම්මයෝ යි.

1481. සංයෝජනවිප්‍රයුක්ත වූ ධම්මයෝ කවරහු යත්:

ඖද්ධත්‍යසහගත මෝහ යැ, චාතුර්භූමක කුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය දැයි මොහු සංයොජනවිප්‍රයුක්ත වූ ධම්මයෝ යි.

1482. සංයෝජන වූ ද සංයෝජනීය වූ ද ධම්මයෝ කවරහු යත්:

ඒ සංයෝජනයෝ මැ සංයෝජනයෝ ද සංයෝජනයනට හිත වූවාහු ද වෙත්.

1483. කතමෙ ධම්මා සඤ්ඤොජනියා චෙව නො ච සඤ්ඤොජනා:

ඨපෙත්වා සඤ්ඤොජනෙ අවසෙසං අකුසලං, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා සඤ්ඤොජනියා චෙව නො ච සඤ්ඤොජනා.

අසඤ්ඤොජනියා ධම්මා න වත්තබ්බා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනියාතිපි, සඤ්ඤොජනියා චෙව නො ච සඤ්ඤොජනාතිපි.

1484. කතමෙ ධම්මා සංයොජනා චෙව සඤ්ඤොජනසම්පයුත්තා ච.

යත්ථ ද්වෙ තීණි සඤ්ඤොජනානි එකතො උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනසම්පයුත්තා ච.

1485. කතමෙ ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා චෙව නො ච සඤ්ඤොජනා:

ඨපෙත්වා සඤ්ඤොජනෙ අවසෙසං අකුසලං, ඉමෙ ධම්මා සඤ්ඤොජනසම්පයුත්තා චෙව නො ච සඤ්ඤොජනා.

සඤ්ඤොජනවිප්පයුත්තා ධම්මා න වත්තබ්බා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනසම්පයුත්තාතිපි, සඤ්ඤොජනසම්පයුත්තා චෙව නො ච සඤ්ඤොජනාතිපි.

1486. කතමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා සඤ්ඤොජනියා:

උද්ධච්චසහගතො මොහො, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා සඤ්ඤොජනියා.

1487. කතමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා අසඤ්ඤොජනියා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා සඤ්ඤොජනවිප්පයුත්තා අසඤ්ඤොජනියා.

සඤ්ඤොජනසම්පයුත්තා ධම්මා න වත්තබ්බා සඤ්ඤොජනවිප්පයුත්තා සඤ්ඤොජනියාතිපි සඤ්ඤොජනවිප්පයුත්තා අසඤ්ඤොජනියාතිපි.

## සංයොජනගොච්ඡකං

1488. කතමෙ ධම්මා ගන්ථා:

චත්තාරො ගන්ථා: අභිජ්ඣා කායගන්ථො, ව්‍යාපාදො කායගන්ථො, සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො.

අභිජ්ඣා කායගන්ථො අට්ඨසු ලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, ව්‍යාපාදො කායගන්ථො ද්වීසු දොමනස්ස සහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති සීලබ්බතපරාමාසො කායගන්ථො ච ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො ච චතූසු දිට්ඨිගතසම්පයුත්තෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා ගන්ථා.

1483. සංයෝජනිය වූ ද නො ද සංයෝජන වූ ද ධර්මයෝ කවරහ යත්:

සංයෝජනයන් තබා අවශේෂ අකුශල ය, තුන්බිම් කුශල ය, තුන්බිම් විපාක ය, තුන්බිම් ක්‍රියාව්‍යාකෘත ය, හැම රූපය දැයි මොහු සංයෝජනයනට හිත වූ ද, නො ද සංයෝජන වූ ද ධර්මයෝ යි.

අසංයෝජනිය ධර්මයෝ සංයෝජනත් සංයෝජනියත් වෙති' යි ද, සංයෝජනියත් නො ද සංයෝජනත් වෙති'යි ද නො කියයුත්තාහ.

1484. සංයෝජන වූ ද සංයෝජනසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ කවරහ යත්:

යම් සිතෙක දෙතුන් සංයෝජන කෙනෙක් එක්වට උපදිත් ද, මොහු සංයෝජන වූත් සංයෝජනසම්ප්‍රයුක්ත වූ ත් ධර්මයෝ යි.

1485. සංයෝජනසම්ප්‍රයුක්ත වූ ද, නො ද සංයෝජන වූ ද ධර්මයෝ කවරහ යත්:

සංයෝජනයන් තබා අවශේෂ අකුශල ය, මොහු සංයෝජනසම්ප්‍රයුක්ත වූත් නො ද සංයෝජන වූත් ධර්මයෝ යි.

සංයෝජනවිප්‍රයුක්ත වූ ධර්මයෝ සංයෝජනයෝත් සංයෝජනසම්ප්‍රයුක්තයෝත් වෙති'යි ද, සංයෝජනසම්ප්‍රයුක්ත වූවෝත් නො ද සංයෝජනයෝත් වෙති'යි ද නො කියයුත්තාහ.

1486. සංයෝජනවිප්‍රයුක්ත වූ සංයෝජනිය ධර්මයෝ කවරහ යත්:

ඖද්ධත්‍යසහගත මෝහ ය, ත්‍රෛභූමක කුශල ය, ත්‍රෛභූමක විපාක ය, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත ය, හැම රූපය දැයි මොහු සංයොජනවිප්‍රයුක්ත වූ සංයොජනිය ධර්මයෝ යි.

1487. සංයෝජනවිප්‍රයුක්ත වූ අසංයෝජනිය ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ ය, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු සංයෝජනවිප්‍රයුක්ත වූ අසංයෝජනිය ධර්මයෝ යි.

සංයෝජනසම්ප්‍රයුක්ත වූ ධර්මයෝ සංයෝජනවිප්‍රයුක්ත වූ සංයෝජනියවූහ යි ද, සංයෝජන විප්‍රයුක්ත වූ අසංයෝජනියහ'යි ද නො කියයුත්තාහ.

සංයොජනගොච්ඡක යි.

1488 ග්‍රන්ථධර්මයෝ කවරහ යත්:

ග්‍රන්ථයෝ සතරදෙනෙකි: අභිධ්‍යාකායග්‍රන්ථ ය, ව්‍යාපාදකායග්‍රන්ථ ය, ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ ය, ඉදංසත්‍යාභිනිවේශකායග්‍රන්ථ යි.

අභිධ්‍යාකායග්‍රන්ථය අෂ්ට ලෝභසහගත චිත්තොත්පාදයන්හි උපදී, ව්‍යාපාදකායග්‍රන්ථය දෞර්මනස්සහගත දෙ සිත්හි උපදී, ශීලව්‍රතපරාමර්ශකාය ග්‍රන්ථය ද ඉදංසත්‍යාභිනිවේශකායග්‍රන්ථය ද දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත සතර සිත්හි උපදිත්. මොහු ග්‍රන්ථධර්මයෝ යි.

1489. කතමෙ ධම්මා නො ගන්ථා:

ඨපෙත්වා ගන්ථෙ අවසෙසං අකුසලං, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො ගන්ථා.

1490. කතමෙ ධම්මා ගන්ථනියා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා ගන්ථනියා.

1491. කතමෙ ධම්මා අගන්ථනියා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අගන්ථනියා.

1492. කතමෙ ධම්මා ගන්ථසම්පයුත්තා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තචිත්තුප්පාදා, චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතචිත්තුප්පාදා, එත්ථුප්පන්නං ලොභං ඨපෙත්වා, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, එත්ථුප්පන්නං පටිඝං ඨපෙත්වා, ඉමෙ ධම්මා ගන්ථසම්පයුත්තා.

1493. කතමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා:

චතූසු දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පන්නො ලොභො, ද්වීසු දොමනස්ස සහගතෙසු චිත්තුප්පාදෙසු උප්පන්නං පටිඝං, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, උද්ධච්චසහගතො චිත්තුප්පාදො, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා.

1494. කතමෙ ධම්මා ගන්ථා චෙව ගන්ථනියා ච:

තෙව ගන්ථා ගන්ථා චෙව ගන්ථනියා ච.

1495. කතමෙ ධම්මා ගන්ථනියා චෙව නො ච ගන්ථා:

ඨපෙත්වා ගන්ථෙ අවසෙසං අකුසලං, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා ගන්ථනියා චෙව නො ච ගන්ථා.

අගන්ථනියා ධම්මා න වත්තබ්බා ගන්ථා චෙව ගන්ථනියාතිපි ගන්ථනියා චෙව නො ච ගන්ථාතිපි.

1496. කතමෙ ධම්මා ගන්ථා චෙව ගන්ථසම්පයුත්තා ච:

යත්ථ දිට්ඨි ච ලොභො ච එකතො උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා ගන්ථා චෙව ගන්ථසම්පයුත්තා ච.

1497 කතමෙ ධම්මා ගන්ථසම්පයුත්තා චෙව නො ච ගන්ථා:

අට්ඨ ලොභසහගතචිත්තුප්පාදා, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, එත්ථුප්පන්නෙ ගන්ථෙ ඨපෙත්වා, ඉමෙ ධම්මා ගන්ථසම්පයුත්තා චෙව නො ච ගන්ථා.

ගන්ථවිප්පයුත්තා ධම්මා න වත්තබ්බා ගන්ථා චෙව ගන්ථසම්පයුත්තාතිපි, ගන්ථසම්පයුත්තා චෙව නො ච ගන්ථාතිපි.

1489. ග්‍රන්ථ නො වූ ධර්මයෝ කවරහ යත්:

ග්‍රන්ථයන් තබා සෙසු අකුශල යැ, සියුබිම්හි කුශල යැ, සියුබිම්හි විපාක යැ, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද නිර්වාණය දැයි මොහු ග්‍රන්ථ නො වූ ධර්මයෝ යි.

1490. ග්‍රන්ථනීය ධර්මයෝ කවරහ යත්:

ත්‍රෛභූමක කුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූපය දැයි මොහු ග්‍රන්ථනීය ධර්මයෝ යි.

1491. ග්‍රන්ථනීය නො වූ ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ යැ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු ග්‍රන්ථනීය නො වූ ධර්මයෝ යි.

1492. ග්‍රන්ථසම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත චිත්තෝත්පාදයෝ සතරදෙන යැ, දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත චිත්තෝත්පාදයෝ සතරදෙන යැ, මෙහි උපන් ලෝභය තබා යි. දෞර්මනස්‍යසහගත චිත්තෝත්පාදයෝ දෙදෙන යැ, මෙහි උපන් ප්‍රතිඝය හැර යි. මොහු ග්‍රන්ථසම්ප්‍රයුක්ත ධර්මයෝ යි.

1493. ග්‍රන්ථවිප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත වූ සතර සිත්හි උපන් ප්‍රතිඝ යැ, විචිකිච්ඡාසහගත චිත්ත යැ, ඖද්ධත්‍යසහගත චිත්ත යැ, චාතුර්භූමක කුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය දැයි මොහු ග්‍රන්ථවිප්‍රයුක්ත ධර්මයෝ යි.

1494. ග්‍රන්ථ ද ග්‍රන්ථනීය ද වූ ධර්මයෝ කවරහ යත්:

ඒ ග්‍රන්ථයෝ මැ ග්‍රන්ථ ද ග්‍රන්ථනීය ද වූ ධර්මයෝ යි.

1495. ග්‍රන්ථනීය වූ ද නො ද ග්‍රන්ථ වූ ධර්මයෝ කවරහ යත්:

ග්‍රන්ථයන් තබා අවශේෂ අකුශල යැ, ත්‍රෛභූමක කුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූප දැයි මොහු ග්‍රන්ථනීය ද වූ නො ද ග්‍රන්ථ වූ ධර්මයෝ යි.

ග්‍රන්ථනීය නො වූ ධර්මයෝ ග්‍රන්ථ ද වූ ග්‍රන්ථනීය වූහ'යි ද ග්‍රන්ථනීය ද වූ නො ද ග්‍රන්ථ වූහ'යි ද නො කියැයුත්තාහ.

1496. ග්‍රන්ථ ද වූ ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ කවරහ යත්:

යම් සිතෙක දෘෂ්ටියත් ලෝභයත් එක්වට උපදිත් ද, මොහු ග්‍රන්ථ ද වූ ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ යි.

1497. ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වූ නො ද ග්‍රන්ථ වූ ධර්මයෝ කවරහ යත්:

එහි උපන් ග්‍රන්ථයන් තබා, ලෝභසහගත චිත්තෝත්පාදයෝ අටදෙන යැ, දෞර්මනස්සහගිය චිත්තෝත්පාදයෝ දෙදෙනා යැයි මොහු ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වූ නො ද ග්‍රන්ථ වූ ධර්මයෝ යි.

ග්‍රන්ථවිප්‍රයුක්ත ධර්මයෝ ග්‍රන්ථ ද වූ ග්‍රන්ථසම්ප්‍රයුක්තයෝ යයි ද, ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වූ නො ද ග්‍රන්ථයෝ යයි ද නො කියැයුත්තාහ.

1498. කතමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා ගන්ථනීයා:

චතූසු දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පන්නො, ලොභො, ද්වීසු දොමනස්සසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පන්නං පටිඝං, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, උද්ධච්චසහගතො චිත්තුප්පාදො, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බංච රූපං, ඉමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා ගන්ථනීයා.

1499. කතමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා අගන්ථනීයා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා ගන්ථවිප්පයුත්තා අගන්ථනීයා.

ගන්ථසම්පයුත්තා ධම්මා න වත්තබ්බා ගන්ථවිප්පයුත්තා ගන්ථනීයා තිපි ගන්ථවිප්පයුත්තා අගන්ථනීයාතිපි.

ගන්ථ ගොච්ඡකං

1500 කතමෙ ධම්මා ඕඝා: -පෙ-

ඕඝගොච්ඡකං

1501. කතමෙ ධම්මා යොගා: -පෙ-

යොගගොච්ඡකං

1502 කතමෙ ධම්මා නීවරණා:

ඡ නීවරණානි: කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථිනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං අවිජ්ජානීවරණං.

කාමච්ඡන්දනීවරණං අට්ඨසු ලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, ව්‍යාපාදනීවරණං ද්වීසු දොමනස්ස සහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, ථිනමිද්ධනීවරණං සසඞ්ඛාරිකෙසු අකුසලෙසු උප්පජ්ජති, උද්ධච්චනීවරණං උද්ධච්චසහගතෙසු චිත්තුප්පදෙසු උප්පජ්ජති, කුක්කුච්චනීවරණං ද්වීසු දොමනස්සසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, විචිකිච්ඡානීවරණං විචිකිච්ඡාසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, අවිජ්ජා නීවරණං සබ්බාකුසලෙසු උප්පජ්ජති, ඉමෙ ධම්මා නීවරණා.

1503. කතමෙ ධම්මා නො නීවරණා:

ඨපෙත්වා නීවරණෙ අවසෙසං අකුසලං, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො නීවරණා.

1504. කතමෙ ධම්මා නීවරණියා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා නීවරණියා.

1505. කතමෙ ධම්මා අනීවරණියා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අනීවරණියා.

1498. ග්‍රන්‍ථවිප්‍රයුක්ත ග්‍රන්‍ථනීය ධර්මයෝ කවරහ යත්:

දෘෂ්ටිගතවිප්‍රයුක්ත වූ ලෝභසහගත සතර සිත්හි උපන් ලෝභ යෑ, දෞර්මනස්‍ය සහගත දෙ සිත්හි උපන් ප්‍රතිඝ යෑ, විචිකිත්සා සහගත චිත්තෝත්පාද යෑ, ඖද්ධත්‍යසහගත චිත්තෝත්පාද යෑ, තුන්බිමැ කුශල යෑ, තුන්බිමැ විපාක යෑ, තුන්බිමැ ක්‍රියාව්‍යාකෘත යෑ, හැම රූපය දැයි මොහු ග්‍රන්‍ථවිප්‍රයුක්ත ග්‍රන්‍ථනීය ධර්මයෝ යි.

1499 ග්‍රන්‍ථවිප්‍රයුක්ත ග්‍රන්‍ථනීය නො වූ ධර්මයෝ කවරහ යත්:

අපර්‍ය්‍යාපන්න වූ සතර මාර්ගයෝ යෑ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්‍වාණය දැයි මොහු ග්‍රන්‍ථවිප්‍රයුක්ත ග්‍රන්‍ථනීය නො වූ ධර්මයෝ යි.

ග්‍රන්‍ථසම්ප්‍රයුක්ත ධර්මයෝ ග්‍රන්‍ථවිප්‍රයුක්ත ග්‍රන්‍ථනීය වූහ යි ද, ග්‍රන්‍ථවිප්‍රයුක්ත අග්‍රන්‍ථනීය වූහ' යි ද නො කියැයුත්තාහ.

ග්‍රන්‍ථගෝච්ඡක යි.

1500. ඕඝධර්මයෝ කවරහ යත්: ...

ඕඝගෝච්ඡක යි.

1501. යෝගධර්මයෝ කවරහ යත්: ...

යෝගගෝච්ඡක යි.

1502. නීවරණධර්මයෝ කවරහ යත්:

නීවරණයෝ සදෙනෙකි: කාමච්ඡන්දනීවරණ යෑ, ව්‍යාපාදනීවරණ යෑ, ථිනමිද්ධනීවරණ යෑ, උද්ධච්චකුක්කුච්චනීවරණ යෑ, විචිකිච්ඡානීවරණ යෑ, අවිජ්ජානීවරණ යි.

කාමච්ඡන්දනීවරණය ලෝභසහගත සිත් අටෙහි උපදී. ව්‍යාපාදනීවරණය දෞර්මනස්‍ය සහගත දෙ සිත්හි උපදී. ථිනමිද්ධනීවරණය සසංස්කාරික අකුසල් සිත්හි උපදී. උද්ධච්චනීවරණය ඖද්ධත්‍යසහගත චිත්තෝත්පාදයන්හි උපදී. කුක්කුච්චනීවරණය දෞර්මනස්‍ය සහගත දෙ සිත්හි උපදී. අවිජ්ජානීවරණය සියලු අකුසල්සිත්හි උපදී. මොහු නීවරණ ධර්මයෝ යි.

1503. නීවරණ නො වූ ධර්මයෝ කවරහ යත්:

නීවරණයන් තබා අවශේෂ අකුශල යෑ, සිවුබිම්හි කුශල යෑ, සිවුබිම්හි විපාක යෑ, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යෑ, රූපය ද නිර්‍වාණය දැයි මොහු නීවරණ නො වූ ධර්මයෝ යි.

1504 නීවරණීය (නීවරණයන්ට හිත) වූ ධර්මයෝ කවරහ යත්:

ත්‍රෛභූමක කුශල යෑ, අකුශල යෑ, ත්‍රෛභූමක විපාක යෑ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යෑ, හැම රූපය දැයි මොහු නීවරණීය ධර්මයෝ යි.

1505. අනීවරණීය ධර්මයෝ කවරහ යත්:

අපර්‍ය්‍යාපන්න වූ සතර මාර්ගයෝ යෑ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්‍වාණය දැයි මොහු අනීවරණීය ධර්මයෝ යි.

1506. කතමෙ ධම්මා නීවරණසම්පයුත්තා:

ද්වාදස අකුසලචිත්තුප්පාදා, ඉමෙ ධම්මා නීවරණසම්පයුත්තා.

1507 කතමෙ ධම්මා නීවරණවිප්පයුත්තා:

චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාබ්‍යාකතං, රූපං ච, නිබ්බානං, ඉමෙ ධම්මා නීවරණවිප්පයුත්තා.

1508. කතමෙ ධම්මා නීවරණා චෙව නීවරණියා ච:

තානෙව නීවරණානි නීවරණා චෙව නීවරණියා ච.

1509. කතමෙ ධම්මා නීවරණියා චෙව නො ච නීවරණා:

ඨපෙත්වා නීවරණෙ අවසෙසං අකුසලං, තීසු භූමීසු කුසලං තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාබ්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා නීවරණියා චෙව නො ච නීවරණා.

අනීවරණියා ධම්මා න වත්තබ්බා නීවරණා චෙව නීවරණියාතිපි, නීවරණියා චෙව නො ච නීවරණාතිපි.

1510. කතමෙ ධම්මා නීවරණා චෙව නීවරණ සම්පයුත්තා ච:

යත්ථ ද්වෙ තීණි නීවරණානි එකතො උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා නීවරණා චෙව නීවරණසම්පයුත්තා ච.

1511. කතමෙ ධම්මා නීවරණසම්පයුත්තා චෙව නො ච නීවරණා:

ඨපෙත්වා නීවරණෙ අවසෙසං අකුසලං, ඉමෙ ධම්මා නීවරණසම්පයුත්තා චෙව නො ච නීවරණා.

නීවරණවිප්පයුත්තා ධම්මා න වත්තබ්බා නීවරණා චෙව නීවරණසම්පයුත්තාතිපි, නීවරණසම්පයුත්තා චෙව නො ච නීවරණාතිපි.

1512. කතමෙ ධම්මා නීවරණවිප්පයුත්තා නීවරණියා:

තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාබ්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා නීවරණවිප්පයුත්තා නීවරණියා.

1513. කතමෙ ධම්මා නීවරණවිප්පයුත්තා අනීවරණියා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා නීවරණවිප්පයුත්තා අනීවරණියා.

නීවරණසම්පයුත්තා ධම්මා න වත්තබ්බා නීවරණවිප්පයුත්තා නීවරණියාතිපි, නීවරණවිප්පයුත්තා අනීවරණියාතිපි.

නීවරණගොච්ඡකං

1506. නීවරණසම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

දෙලොස් අකුසල් සිත්හු යැ. මොහු නීවරණසම්ප්‍රයුක්ත ධර්මයෝ යි.

1507. නීවරණවිප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

චාතුර්භූමක කුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය දැයි මොහු නීවරණවිප්‍රයුක්ත ධර්මයෝ යි.

1508. නීවරණ වූ ද නීවරණීය වූ ද ධර්මයෝ කවරහ යත්:

එ මැ නීවරණයෝ නීවරණ ද නීවරණීය ද වෙති.

1509. නීවරණීය ද නො ද නීවරණ වූ ධර්මයෝ කවරහ යත්:

නීවරණයන් තබා අවශේෂ අකුශල යැ, ත්‍රෛභූමක කුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූපය දැයි මොහු නීවරණීය වූ ද නො ද නීවරණ වූ ධර්මයෝ යි

අනීවරණීය ධර්මයෝ නීවරණ වූ නො ද නීවරණීයහ'යි ද, නීවරණීය ද වූ නො ද නීවරණ වූ හ'යි ද නො කියැයුත්තාහ.

1510. නීවරණ ද වූ නීවරණසම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ කවරහ යත්:

යම් සිතෙක දෙ තුන් නීවරණ කෙනෙක් එක්වට උපදිත් ද, මොහු නීවරණ වූ ද නීවරණසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ යි.

1511. නීවරණසම්ප්‍රයුක්ත ද වූ නො ද නීවරණ වූ ධර්මයෝ කවරහ: යත්:

නීවරණයන් තබා අවශේෂ අකුශල යැ. මොහු නීවරණසම්ප්‍රයුක්ත ද වූ නො ද නීවරණ වූ ධර්මයෝ යි.

නීවරණවිප්‍රයුක්ත ධර්මයෝ නීවරණ ද වූ නීවරණසම්ප්‍රයුක්ත වූහ'යි ද, නීවරණසම්ප්‍රයුක්ත ද වූ නො ද නීවරණ වූහ'යි නො කියැයුත්තාහ.

1512. නීවරණවිප්‍රයුක්ත වූ නීවරණීය ධර්මයෝ කවරහ යත්:

ත්‍රෛභූමක කුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූපය දැයි මොහු නීවරණ විප්‍රයුක්ත වූ නීවරණීය ධර්මයෝ යි.

1513. නීවරණවිප්‍රයුක්ත වූ අනීවරණීය ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ යැ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු නීවරණවිප්‍රයුක්ත වූ අනීවරණීය ධර්මයෝ යි.

නීවරණසම්ප්‍රයුක්ත ධර්මයෝ නීවරණවිප්‍රයුක්ත නීවරණීය වූහ' යි ද, නීවරණවිප්‍රයුක්ත අනීවරණීය වූහ'යි ද නො කියැයුත්තාහ.

නීවරණගොච්ඡක යි.

1514. කතමෙ ධම්මා පරාමාසා:

දිට්ඨිපරාමාසො චතූසු දිට්ඨිගතසම්පයුත්තෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, ඉමෙ ධම්මා පරාමාසා.

1515. කතමෙ ධම්මා නො පරාමාසා:

ඨපෙත්වා පරාමාසං අවසෙසං අකුසලං, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා නො පරාමාසා.

1516. කතමෙ ධම්මා පරාමට්ඨා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා පරාමට්ඨා.

1517. කතමෙ ධම්මා අපරාමට්ඨා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අපරාමට්ඨා.

1518. කතමෙ ධම්මා පරාමාසසම්පයුත්තා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තචිත්තුප්පාදා, එත්ථුප්පන්නං පරාමාසං ඨපෙත්වා, ඉමෙ ධම්මා පරාමාසසම්පයුත්තා.

1519. කතමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා:

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතචිත්තුප්පාදා, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, උද්ධච්චසහගතො චිත්තුප්පාදො, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා.

පරාමාසො න වත්තබ්බො පරාමාසසම්පයුත්තොතිපි පරාමාසවිප්පයුත්තොතිපි.

1520. කතමෙ ධම්මා පරාමාසා චෙව පරාමට්ඨා ච:

සො එව පරාමාසො පරාමාසො චෙව පරාමට්ඨො ච.

1521. කතමෙ ධම්මා පරාමට්ඨා චෙව නො ච පරාමාසා:

ඨපෙත්වා පරාමාසං අවසෙසං අකුසලං, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා පරාමට්ඨා චෙව නොච පරාමාසා.

අපරාමට්ඨා ධම්මා න වත්තබ්බා පරාමාසා චෙව පරාමට්ඨාතිපි, පරාමට්ඨා චෙව නො ච පරාමාසාතිපි.

1514. පරාමර්ශී ධර්මයෝ කවරහු යත්:

දෘෂ්ටිපරාමර්ශය දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වූ සතර සිත්හි උපදී. මොහු පරාමර්ශී ධර්මයෝ යි.

1515. පරාමර්ශී නො වූ ධර්මයෝ කවරහු යත්:

පරාමර්ශය හැර අවශේෂ අකුශල යැ, සිවුබිම්හි කුසල් යැ, සිවුබිම්හි විපාක යැ, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය ද යි මොහු පරාමර්ශී නො වූ ධර්මයෝ යි.

1516. පරාමෘෂ්ට (පරාමර්ශයන් විසින් අරමුණු කළ) ධර්මයෝ කවරහු යත්:

ත්‍රෛභූමක කුශල යැ, අකුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූපය ද යි මොහු පරාමෘෂ්ට ධර්මයෝ යි.

1517. අපරාමෘෂ්ට ධර්මයෝ කවරහු යත්:

අපර්‍යාපන්න සතර මාර්ගයෝ යැ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය ද යි මොහු අපරාමෘෂ්ට ධර්මයෝ යි.

1518. පරාමර්ශසම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහු යත්:

සතර දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෝ යැ, මෙහි උපන් පරාමර්ශය හැර යි. මොහු පරාමර්ශසම්ප්‍රයුක්ත ධර්මයෝ යි.

1519. පරාමර්ශවිප්‍රයුක්ත ධර්මයෝ කවරහු යත්:

සතර දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත චිත්තොත්පාදයෝ යැ, දෞර්මනස්‍යසහගත චිත්තොත්පාදයෝ දෙදෙන යැ, විචිකිච්ඡාසහගත චිත්තොත්පාද යැ, උද්ධච්චසහගත චිත්තොත්පාද යැ, චාතුර්භූමක කුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද නිර්වාණය ද යි මොහු පරාමර්ශවිප්‍රයුක්ත ධර්මයෝ යැ.

පරාමර්ශය තෙමේ පරාමර්ශසම්ප්‍රයුක්ත යයි ද, පරාමර්ශවිප්‍රයුක්ත යයි ද නො කියැයුත්තේ යි

1520. පරාමර්ශී ද වූ පරාමෘෂ්ට ද වූ ධර්මයෝ කවරහු යත්:

එ මැ පරාමර්ශය පරාමර්ශී ද පරාමෘෂ්ට ද වේ.

1521. පරාමෘෂ්ට ද වූ නො ද පරාමර්ශී වූ ධර්මයෝ කවරහු යත්:

පරාමර්ශය හැර අවශේෂ අකුශල යැ, ත්‍රෛභූමක කුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූප ද යි මොහු පරාමෘෂ්ට ද වූ නො ද පරාමර්ශී වූ ධර්මයෝ යි.

අපරාමෘෂ්ට ධර්මයෝ පරාමර්ශී ද වූ පරාමෘෂ්ටයහ'යි ද, පරාමෘෂ්ට ද වූ නො ද පරාමර්ශීහ'යි ද නො කියැයුත්තාහ.

1522. කතමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා පරාමට්ඨා:

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතචිත්තුප්පාදා, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, උද්ධච්චසහගතො චිත්තුප්පාදො, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා පරාමට්ඨා.

1523. කතමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨා.

පරාමාසා ච පරාමාසසම්පයුත්තා ච ධම්මා න වත්තබ්බා පරාමාසවිප්පයුත්තා පරාමට්ඨාතිපි, පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨාතිපි.

## පරාමාසගොච්ඡකං

1524. කතමෙ ධම්මා සාරම්මණා.

චතූසු භූමීසු කුසලං, අකුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, ඉමෙ ධම්මා සාරම්මණා.

1525. කතමෙ ධම්මා අනාරම්මණා:

රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා අනාරම්මණා.

1526. කතමෙ ධම්මා චිත්තා:

චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝානවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං කායවිඤ්ඤාණං මනොධාතු මනොවිඤ්ඤාණධාතු, ඉමෙ ධම්මා චිත්තා.

1527. කතමෙ ධම්මා නො චිත්තා:

වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො චිත්තා.

1528. කතමෙ ධම්මා චෙතසිකා:

වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චෙතසිකා.

1529. කතමෙ ධම්මා අචෙතසිකා:

චිත්තං ච රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා අචෙතසිකා.

1530 කතමෙ ධම්මා චිත්තසම්පයුත්තා:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චිත්තසම්පයුත්තා.

1531. කතමෙ ධම්මා චිත්තවිප්පයුත්තා:

රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා චිත්තවිප්පයුත්තා.

චිත්තං න වත්තබ්බං චිත්තෙන සම්පයුත්තන්තිපි, චිත්තෙන විප්පයුත්තන්තිපි.

1522. පරාමර්ශවිප්‍රයුක්ත වූ පරාමෘෂ්ට ධර්මයෝ කවරහ යත්:

සතර දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත සිත්හු ය, දෞර්මනස්සසහගත දෙ සිත්හු ය, විචිකිත්සාසහගත සිත ය, උද්ධච්චසහගත සිත ය, තුන්බිමැ කුසල් ය, තුන්බිමැ විපාක ය, තුන්බිමැ ක්‍රියාව්‍යාකෘත ය, හැම රූප දැයි මොහු පරාමර්ශවිප්‍රයුක්ත පරාමෘෂ්ට ධර්මයෝ යි.

1523. පරාමර්ශවිප්‍රයුක්ත වූ අපරාමෘෂ්ට ධර්මයෝ කවරහ යත්:,

අපර්යාපන්න වූ සතර මාර්ගයෝ ය, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු පරාමර්ශවිප්‍රයුක්ත වූ අපරාමෘෂ්ට ධර්මයෝ යි.

පරාමර්ශ වූ ද පරාමර්ශසම්ප්‍රයුක්ත වූ ද ධර්මයෝ පරාමර්ශවිප්‍රයුක්ත වූ පරාමෘෂ්ටයහ'යි ද, පරාමර්ශවිප්‍රයුක්ත වූ අපරාමෘෂ්ටයහ'යි ද නො කියැ-යුත්තාහ.

පරාමාසගොච්ඡක යි.

1524. සාලම්බන ධර්මයෝ කවරහ යත්:

සියුබිම්හි කුශල ය, අකුශල ය, සියුබිම්හි විපාක ය, තුන්බිම්හි ක්‍රියාව්‍යාකෘතයෝ දැයි මොහු සාලම්බන ධර්මයෝ යි.

1525. අනාලම්බන ධර්මයෝ කවරහ යත්:

රූපය ද, නිර්වාණය දැයි මොහු අනාලම්බන ධර්මයෝ යි.

1526. චිත්ත ධර්මයෝ කවරහ යත්:

චක්ෂුර්විඥාන ය, ශ්‍රොත්‍රවිඥාන ය, ඝ්‍රාණවිඥාන ය, ජිහ්වාවිඥාන ය, කායවිඥාන ය, මනොධාතු ය, මනොවිඥානධාතු යි. මොහු චිත්ත ධර්මයෝ යි.

1527. චිත්ත නො වූ ධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, රූපය ද නිර්වාණය දැයි මොහු චිත්ත නො වූ ධර්මයෝ යි.

1528. චෛතසික ධර්මයෝ කවරහ යත්.

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, මොහු චෛතසිකධර්මයෝ යි.

1529. අචෛතසික ධර්මයෝ කවරහ යත්:

චිත්තය ද, රූපය ද, නිර්වාණය දැයි මොහු චෛතසික නො වූ ධර්මයෝ යි.

1530. චිත්තසම්ප්‍රයුක්තධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, යන මොහු චිත්තසම්ප්‍රයුක්ත ධර්මයෝ යි.

1531. චිත්තවිප්‍රයුක්ත ධර්මයෝ කවරහ යත්:

රූපය ද නිර්වාණය දැයි මොහු චිත්තවිප්‍රයුක්ත ධර්මයෝ යි.

චිත්තය චිත්තය හා සම්ප්‍රයුක්ත යයි ද, චිත්තය හා විප්‍රයුක්ත යයි ද නො කියැයුත්තේ යි.

1532. කතමෙ ධම්මා චිත්තසංසට්ඨා:

වේදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චිත්ත-සංසට්ඨා.

1533. කතමෙ ධම්මා චිත්තවිසංසට්ඨා:

රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා චිත්තවිසංසට්ඨා.

චිත්තං න වත්තබ්බං චිත්තෙන සංසට්ඨන්තිපි, චිත්තෙන විසංසට්ඨන්තිපි.

1534. කතමෙ ධම්මා චිත්තසමුට්ඨානා:

වේදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං චිත්තජං චිත්තහෙතුකං චිත්තසමුට්ඨානං, රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ආකාසධාතු ආපොධාතු රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස උපචයො රූපස්ස සන්තති කබළීකාරො ආහාරො, ඉමෙ ධම්මා චිත්තසමුට්ඨානා.

1535. කතමෙ ධම්මා නො චිත්තසමුට්ඨානා:

චිත්තං ච අවසෙසං ච රූපං, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො චිත්ත-සමුට්ඨානා.

1536. කතමෙ ධම්මා චිත්තසහභුනො:

වේදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති, ඉමෙ ධම්මා චිත්තසහභුනො.

1537. කතමෙ ධම්මා නො චිත්තසහභුනො:

චිත්තං ච අවසෙසං ච රූපං නිබ්බානං ච, ඉමෙ ධම්මා නො චිත්ත-සහභුනො:

1538. කතමෙ ධම්මා චිත්තානුපරිවත්තිනො:

වේදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති, ඉමෙ ධම්මා චිත්තානුපරිවත්තිනො.

1539. කතමෙ ධම්මා නො චිත්තානුපරිවත්තිනො:

චිත්තං ච අවසෙසං ච රූපං නිබ්බානං ච, ඉමෙ ධම්මා නො චිත්තානු-පරිවත්තිනො.

1540. කතමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානා:

වේදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චිත්ත-සංසට්ඨසමුට්ඨානා.

1532. චිත්තය හා සංසෘෂ්ටධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යි. මොහු චිත්ත-සංසෘෂ්ට ධර්මයෝ යි.

1533. චිත්තය හා විසංසෘෂ්ටධර්මයෝ කවරහ යත්:

රූපය ද නිර්වාණය දැයි මොහු චිත්තවිසංසෘෂ්ට ධර්මයෝ යි.

චිත්තය චිත්තය හා සංසෘෂ්ට යයි ද, චිත්තය හා විසංසෘෂ්ට යයි ද නො කියයුත්තේ යි.

1534. චිත්තසමුත්ථානධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ, කායවිඥප්ති යැ, වාග්විඥප්ති යැ, යළි චිත්තජ චිත්තහෙතුක චිත්තසමුත්ථාන වූ යම් රූපයෙකුත් ඇද්ද එ යැ, රූපායතන යැ, ශබ්දායතන යැ, ගන්ධායතන යැ, රසායතන යැ, ස්ප්‍රෂ්ටව්‍යායතන යැ, ආකාශධාතු යැ, අබ්ධාතු යැ, රූපලඝුතා යැ, රූප-මෘදුතා යැ, රූපකර්මණ්‍යතා යැ, රූපොපචය යැ, රූපසන්තති යැ, කබලී-කාරාහාර යැ, යන මොහු චිත්තසමුත්ථාන ධර්මයෝ යි.

1535. චිත්තසමුත්ථාන නො වූ ධර්මයෝ කවරහ යත්:

චිත්තය ද අවශේෂරූපය ද නිර්වාණය දැයි මොහු චිත්තසමුත්ථාන නො වූ ධර්මයෝ යි.

1536. චිත්තසහභූ ධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ, කායවිඥප්ති යැ, වාග්විඥප්ති යැ, යන මොහු සිත හා එක් ව උපදනා (-චිත්තසහභූ) ධර්මයෝ යි.

1537. චිත්තසහභූ නො වූ ධර්මයෝ කවරහ යත්:

සිත ද අවශේෂ රූපය ද නිවන දැයි මොහු චිත්තසහභූ නො වූ ධර්මයෝ යි.

1538. චිත්තානුපරිවර්ති ධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ, කායවිඥප්ති යැ, වාග්විඥප්ති යැ යන මොහු චිත්තානුපරිවර්ති ධර්මයෝ යි.

1539. චිත්තානුපරිවර්ති නො වූ ධර්මයෝ කවරහ යත්:

චිත්තය ද අවශේෂ රූපය ද නිර්වාණය දැයි මොහු චිත්තානුපරිවර්ති නො වූ ධර්මයෝ යි.

1540. චිත්තසංසෘෂ්ට සමුත්ථාන ධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ යන මොහු චිත්තසංසෘෂ්ට සමුත්ථාන ධර්මයෝ යි.

1541. කතමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානා:

චිත්තං ච, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානා.

1542. කතමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චිත්තසංසට්ඨ සමුට්ඨානසහභුනො.

1543. කතමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො:

චිත්තං ච රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨාන සහභුනො.

1544. කතමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො:

වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො, ඉමෙ ධම්මා චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො.

1545. කතමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො:

චිත්තං ච රූපං ච නිබ්බානං ච, ඉමෙ ධම්මා නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො.

1546. කතමෙ ධම්මා අජ්ඣත්තිකා.

චක්ඛායතනං -පෙ- මනායතනං, ඉමෙ ධම්මා අජ්ඣත්තිකා.

1547. කතමෙ ධම්මා බාහිරා:

රූපායතනං -පෙ- ධම්මායතනං, ඉමෙ ධම්මා බාහිරා.

1548. කතමෙ ධම්මා උපාදා:

චක්ඛායතනං -පෙ- කබළීකාරො ආහාරො, ඉමෙ ධම්මා උපාදා.

1549. කතමෙ ධම්මා නො උපාදා:

චතුසු භූමිසු කුසලං, අකුසලං, චතුසු භූමිසු විපාකො, තීසු භූමිසු කිරියා ව්‍යාකතං, චත්තාරො ච මහාභූතා, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො උපාදා.

1550. කතමෙ ධම්මා උපාදින්නා:

තීසු භූමිසු විපාකො, යං ච රූපං කම්මස්ස කතත්තා, ඉමෙ ධම්මා උපාදින්නා.

1551. කතමෙ ධම්මා අනුපාදින්නා:

තීසු භූමිසු කුසලං, අකුසලං, තීසු භූමිසු කිරියාව්‍යාකතං, යං ච රූපං න කම්මස්ස කතත්තා, චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අනුපාදින්නා.

මහන්තර දුකං

1541. චිත්තසංසෘෂ්ට සමුට්ඨාන නො වූ ධර්මයෝ කවරහ යත්:

චිත්තය ද රූපය ද නිර්වාණය දැයි මොහු චිත්තසංසෘෂ්ට සමුට්ඨාන නො වූ ධර්මයෝ යි.

1542. චිත්තසංසෘෂ්ට සමුට්ඨාන සහභූ ධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ, යන මොහු චිත්තසංසෘෂ්ට සමුට්ඨාන සහභූ ධර්මයෝ යි.

1543. චිත්තසංසෘෂ්ට සමුට්ඨාන සහභූ නො වූ ධර්මයෝ කවරහ යත්:

චිත්තය ද රූපය ද නිර්වාණය දැයි මොහු චිත්තසංසෘෂ්ටසමුට්ඨාන සහභූ නො වූ ධර්මයෝ යි.

1544. චිත්තසංසෘෂ්ට සමුට්ඨානානුපරිවර්ති ධර්මයෝ කවරහ යත්:

වේදනාස්කන්ධ යැ, සංඥාස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ යන මොහු චිත්තසංසෘෂ්ට සමුට්ඨානානුපරිවර්ති ධර්මයෝ යි.

1545. චිත්තසංසෘෂ්ට සමුට්ඨානානුපරිවර්ති නො වූ ධර්මයෝ කවරහ යත්:

චිත්තය ද රූපය ද නිර්වාණය දැයි මොහු චිත්තසංසෘෂ්ට සමුට්ඨානානු-පරිවර්ති නො වූ ධර්මයෝ යි.

1546. ආධ්‍යාත්මික ධර්මයෝ කවරහ යත්:

චක්ෂුරායතනය යැ ... මනායතනය යි. මොහු ආධ්‍යාත්මික ධර්මයෝ යි.

1547. බාහ්‍යධර්මයෝ කවරහ යත්:

රූපායතනය යැ ... ධර්මායතනය යි. මොහු බාහ්‍යධර්මයෝ යි.

1548. උපාද (-භූතයන් නිසා පවත්නා) ධර්මයෝ කවරහ යත්:

චක්ෂුරායතනය යැ ... කවලීකාරාහාර යි. මොහු උපාද ධර්මයෝ යි.

1549. උපාද නො වූ ධර්මයෝ කවරහ යත්:

චාතුර්භූමක කුශල යැ, අකුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, සතර මහාභූතයෝ යැ, නිර්වාණය දැයි මොහු උපාද නො වූ ධර්මයෝ යි.

1550. උපාදින්න ධර්මයෝ කවරහ යත්:

ත්‍රෛභූමක විපාක යැ, කර්මය පිළිබඳ යම් කෘතත්වාත් රූපයෙක් ඇද්ද, මොහු උපාදින්න ධර්මයෝ යි.

1551. අනුපාදින්න ධර්මයෝ කවරහ යත්:

ත්‍රෛභූමක කුශල යැ, අකුශල යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, කර්මය පිළිබඳ කෘතත්වාත් නො වූ යම් රූපයෙකුත් ඇද්ද, අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ ද, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු අනුපාදින්න ධර්මයෝ යි.

මහන්තර දුක යි.

1552. කතමෙ ධම්මා උපාදනා:

චත්තාරි උපාදනානි: කාමුපාදනං දිට්ඨුපාදනං සීලබ්බතුපාදනං අත්තවාදුපාදනං,

කාමුපාදනං අට්ඨසු ලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, දිට්ඨු-පාදනඤ්ච සීලබ්බතුපාදනඤ්ච අත්තවාදුපාදනඤ්ච චතූසු දිට්ඨිගතසම්ප-යුත්තෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජන්ති ඉමෙ ධම්මා උපාදනා.

1553. කතමෙ ධම්මා නො උපාදනා:

ඨපෙත්වා උපාදනෙ අවසෙසං අකුසලං, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා නො උපාදනා.

1554. කතමෙ ධම්මා උපාදනීයා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා අනුපාදනීයා.

1555. කතමෙ ධම්මා අනුපාදනීයා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා අනුපාදනීයා.

1556. කතමෙ ධම්මා උපාදනසම්පයුත්තා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තා ලොභසහගතචිත්තුප්පාද, චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තා ලොභසහගතචිත්තුප්පාද, එත්ථුප්පන්නං ලොභං ඨපෙත්වා, ඉමෙ ධම්මා උපාදනසම්පයුත්තා.

1557. කතමෙ ධම්මා උපාදනවිප්පයුත්තා:

චතූසු දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පන්නො ලොභො, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාද, විචිකිච්ඡාසහගතො චිත්තු-ප්පාදො, උද්ධච්චසහගතො චිත්තුප්පාදො, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපං ච, නිබ්බානං ච, ඉමෙ ධම්මා උපාදනවිප්පයුත්තා.

1558. කතමෙ ධම්මා උපාදනා චෙව උපාදනීයා ච:

තානෙව උපාදනානි උපාදනා චෙව උපාදනීයා ච.

1559. කතමෙ ධම්මා උපාදනීයා චෙව නො ච උපාදනා ච:

ඨපෙත්වා උපාදනෙ අවසෙසං අකුසලං, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං ච, ඉමෙ ධම්මා උපාදනීයා චෙව නො ච උපාදනා.

අනුපාදනීයා ධම්මා න වත්තබ්බා උපාදනා චෙව උපාදනීයාතිපි උපාදනීයා චෙව නො ච උපාදනාතිපි.

1552. උපාදානධම්මයෝ කවරහ යත්:

උපාදාන සතරෙකි: කාමුපාදාන ය, දිට්ඨුපාදාන ය, සීලබ්බතුපාදාන ය, අත්තවාදුපාදාන යි.

කාමුපාදානය ලොභසහගත සිත් අටෙහි උපදී. දිට්ඨුපාදානය ද සීලබ්බතුපාදානය ද අත්තවාදුපාදානය ද දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත සිත් සතරෙහි උපදිත්. මේ ධම්මයෝ උපාදානයෝ යි.

1553. උපාදාන නො වූ ධම්මයෝ කවරහ යත්:

උපාදානයන් තබා අවශේෂ අකුශල ය, සියුබිම්හි කුශල ය, සියුබිම්හි විපාක ය, තුන්බිම් ක්‍රියාව්‍යාකෘත ය, රූපය ද නිර්වාණය දැයි මොහු උපාදාන නො වූ ධම්මයෝ යි.

1554. උපාදානිය (උපාදානයන්ට හිත) ධම්මයෝ කවරහ යත්:

ත්‍රෛභූමක කුශල ය, අකුශල ය, ත්‍රෛභූමක විපාක ය, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත ය, හැම රූපය දැයි මොහු උපාදානිය ධම්මයෝ යි.

1555. අනුපාදානිය ධම්මයෝ කවරහ යත්.

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ ය, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු අනුපාදානිය ධම්මයෝ යි.

1556. උපාදානසම්ප්‍රයුක්තධම්මයෝ කවරහ යත්:

දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වූ ලොභසහගත සිත් සතර ය, දෘෂ්ටිගතවිප්‍රයුක්ත වූ ලොභසහගත සිත් සතර ය, මෙහි උපන් ලොභය තබා යි. මේ ධම්මයෝ උපාදානසම්ප්‍රයුක්තයෝ යි.

1557. උපාදානවිප්‍රයුක්ත ධම්මයෝ කවරහ යත්:

දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලොභසහගත සිත් සතරෙහි උපන් ලොභ ය, දෙමනස්සහගිය සිත් දෙක ය, විචිකිත්සාසහගත සිත ය, ඖද්ධත්‍යසහගත සිත ය, සියුබිම් කුසල ය, සියුබිම් විපාක ය, තුන්බිම් ක්‍රියාව්‍යාකෘත ය, රූපය ද නිර්වාණය දැයි මොහු උපාදානවිප්‍රයුක්ත ධම්මයෝ යි.

1558. උපාදාන ද උපාදානිය ද වූ ධම්මයෝ කවරහ යත්:

ඒ උපාදානයෝ ම උපාදාන ද උපාදානිය ද වෙත්.

1559. උපාදානිය ද නො ද උපාදාන වූ ධම්මයෝ කවරහ යත්:

උපාදානයන් තබා අවශේෂ අකුශල ය, ත්‍රෛභූමක කුශල ය, ත්‍රෛභූමක විපාක ය, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත ය, හැම රූපය දැයි මොහු උපාදානිය ද නො ද උපාදාන වූ ධම්මයෝ යි.

අනුපාදානිය ධම්මයෝ උපාදාන ද වූ උපාදානිය යි ද උපාදානිය ද නො ද උපාදාන වූහ යි ද නො කියැයුත්තාහ.

1560. කතමෙ ධම්මා උපාදානා චෙව උපාදානසම්පයුත්තා ච:

යත්ථ දිට්ඨි ච ලොභො ච එකතො උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා උපාදානා චෙව උපාදානසම්පයුත්තා ච.

1561. කතමෙ ධම්මා උපාදානසම්පයුත්තා චෙව නො ච උපාදානා:

අට්ඨලොභසහගතචිත්තුප්පාද, එත්ථුප්පන්නෙන උපාදානෙ ඨපෙත්වා, ඉමෙ ධම්මා උපාදානසම්පයුත්තා චෙව නො ච උපාදානා.

උපාදානවිප්පයුත්තා ධම්මා න වත්තබ්බා උපාදානා චෙව උපාදානසම්පයුත්තාතිපි, උපාදානසම්පයුත්තා චෙව නො ච උපාදානාතිපි.

1562. කතමෙ ධම්මා උපාදානවිප්පයුත්තා උපාදානියා:

චතූසු දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පන්නො ලොභො, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාද, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, උද්ධච්චසහගතො චිත්තුප්පාදො, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බං ච රූපං, ඉමෙ ධම්මා උපාදානවිප්පයුත්තා උපාදානියා.

1563. කතමෙ ධම්මා උපාදානවිප්පයුත්තා අනුපාදානියා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානං ච, ඉමෙ ධම්මා උපාදානවිප්පයුත්තා අනුපාදානියා

උපාදානසම්පයුත්තා ධම්මා න වත්තබ්බා උපාදානවිප්පයුත්තා උපාදානියාතිපි, උපාදානවිප්පයුත්තා අනුපාදානියාතිපි.

### උපාදාන ගොච්ඡකං

1564. කතමෙ ධම්මා කිලෙසා:

දස කිලෙසවත්ථූනි: ලොභො දොසො මොහො මානො දිට්ඨි විචිකිච්ඡා ථීනං උද්ධච්චං අහිරිකං අනොත්තප්පං.

ලොභො අට්ඨසු ලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, දොසො ද්වීසු දොමනස්සසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, මොහො සබ්බාකුසලෙසු උප්පජ්ජති, මානො චතූසු දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, දිට්ඨි චතූසු දිට්ඨිගතසම්පයුත්තෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, විචිකිච්ඡා විචිකිච්ඡාසහගතෙසු චිත්තුප්පාදෙසු උප්පජ්ජති, ථීනං සසඞ්ඛාරිකෙසු අකුසලෙසු උප්පජ්ජති, උද්ධච්චඤ්ච අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච සබ්බාකුසලෙසු උප්පජ්ජන්ති; ඉමෙ ධම්මා කිලෙසා.

1565. කතමෙ ධම්මා නො කිලෙසා:

ඨපෙත්වා කිලෙසෙ අවසෙසං අකුසලං, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො තීසු කිරියාව්‍යාකතං, රූපඤ්ච, නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා නො කිලෙසා.

1560. උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ කවරහ යත්:

යම් සිතෙක දෘෂ්ටියත් ලෝභයත් එක්වට උපදිත් ද, මොහු උපාදාන ද උපාදානසම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ යි.

1561. උපාදානසම්ප්‍රයුක්ත වූ ද නො ද උපාදාන වූ ධර්මයෝ කවරහ යත්:

අෂ්ටලෝභසහගත චිත්තොත්පාදයෝ යැ, මෙහි උපන් උපාදානයන් තබා, මොහු උපාදානසම්ප්‍රයුක්ත ද වූ නො ද උපාදාන වූ ධර්මයෝ යි.

උපාදානවිප්‍රයුක්ත ධර්මයෝ උපාදාන ද වූ උපාදානසම්ප්‍රයුක්තයෝ යයි ද, උපාදානසම්ප්‍රයුක්ත ද වූ නො ද උපාදාන වූහ යි ද නො කියයුත්තාහ.

1562. උපාදානවිප්‍රයුක්ත වූ උපාදානීය ධර්මයෝ කවරහ යත්:

දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත සතර සිත්හි උපන් ලෝභ යැ, දෞර්මනස්සසහගිය දෙසිත්හු යැ, විචිකිත්සාසහගත සිත යැ, ඖද්ධත්‍යසහගත සිත යැ, ත්‍රෛභූමක කුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, හැම රූපය දැයි මොහු උපාදානවිප්‍රයුක්ත උපාදානීය ධර්මයෝ යි.

1563. උපාදානවිප්‍රයුක්ත අනුපාදානීය ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න සතරමාර්ගයෝ යැ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු උපාදානවිප්‍රයුක්ත අනුපාදානීය ධර්මයෝ යි.

උපාදානසම්ප්‍රයුක්ත ධර්මයෝ උපාදානවිප්‍රයුක්ත උපාදානීයහ යි ද උපාදානවිප්‍රයුක්ත අනුපාදානීයහ යි ද නො කියයුත්තාහ.

උපාදානගොච්ඡක යි.

1564. ක්ලේශධර්මයෝ කවරහ යත්:

ක්ලේශවස්තු දසයෙකි: ලෝභ යැ ද්වේෂ යැ මෝහ යැ මාන යැ දෘෂ්ටි යැ විචිකිත්සා යැ ස්ත්‍යාන යැ ඖද්ධත්‍ය යැ අහ්‍රීක යැ අනපත්‍රපා යි.

ලෝභය අෂ්ට ලෝභසහගත චිත්තොත්පාදයන්හි උපදී. ද්වේෂය දෞර්මනස්සසහගිය දෙසිත්හි උපදී. මෝහය සියලු අකුශලයෙහි උපදී. මානය දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත සතර සිත්හි උපදී. දෘෂ්ටිය දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත සතර සිත්හි උපදී. විචිකිත්සාව විචිකිත්සාසහගත සිත්හි උපදී. ස්ත්‍යානය සසංස්කාරිකඅකුශලයන්හි උපදී. ඖද්ධත්‍යය ද අහ්‍රීකය ද අනොත්තප්පය ද සියලු අකුසල්සිත්හි උපදිත්. මොහු ක්ලේශ ධර්මයෝ යි.

1565. ක්ලේශ නො වූ ධර්මයෝ කවරහ යත්:

ක්ලේශයන් තබා අවශේෂ අකුශල යැ, චාතුර්භූමික කුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද නිර්වාණය දැයි මොහු ක්ලේශ නො වූ ධර්මයෝ යි.

1566. කතමෙ ධම්මා සඞ්කිලෙසිකා:

තීසු භූමීසු කුසලං, අකුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බඤ්ච රූපං, ඉමෙ ධම්මා සඞ්කිලෙසිකා.

1567. කතමෙ ධම්මා අසඞ්කිලෙසිකා:

චත්තාරො මග්ගා අපරියාපන්නා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා අසඞ්කිලෙසිකා.

1568 කතමෙ ධම්මා සඞ්කිලිට්ඨා:

ද්වාදස අකුසලචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සඞ්කිලිට්ඨා.

1569. කතමෙ ධම්මා අසඞ්කිලිට්ඨා:

චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපඤ්ච, නිබ්බානඤ්ච ඉමෙ, ධම්මා අසඞ්කිලිට්ඨා.

1570. කතමෙ ධම්මා කිලෙසසම්පයුත්තා:

ද්වාදස අකුසලචිත්තුප්පාදා, ඉමෙ ධම්මා කිලෙසසම්පයුත්තා.

1571. කතමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා:

චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපඤ්ච, නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා.

1572. කතමෙ ධම්මා කිලෙසා චෙව සඞ්කිලෙසිකා ච:

තෙව කිලෙසා කිලෙසා චෙව සඞ්කිලෙසිකා ච.

1573. කතමෙ ධම්මා සඞ්කිලෙසිකා චෙව නො ච කිලෙසා:

ඨපෙත්වා කිලෙසෙ අවසෙසං අකුසලං, තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බඤ්ච රූපං, ඉමෙ ධම්මා සඞ්කිලෙසිකා චෙ ච නො ච කිලෙසා.

අසඞ්කිලෙසිකා ධම්මා න වත්තබ්බා කිලෙසා චෙව සඞ්කිලෙසිකාතිපි සඞ්කිලෙසිකා චෙව නො ච කිලෙසාතිපි.

1574. කතමෙ ධම්මා කිලෙසා චෙව සඞ්කිලිට්ඨා ච:

තෙව කිලෙසා කිලෙසා චෙව සඞ්කිලිට්ඨා ච.

1575. කතමෙ ධම්මා සඞ්කිලිට්ඨා චෙව නො ච කිලෙසා:

ඨපෙත්වා කිලෙසෙ අවසෙසං අකුසලං, ඉමෙ ධම්මා සඞ්කිලිට්ඨා චෙව නො ච කිලෙසා.

අසඞ්කිලිට්ඨා ධම්මා න වත්තබ්බා කිලෙසා චෙව සඞ්කිලිට්ඨාතිපි, සඞ්කිලිට්ඨා චෙව නො ච කිලෙසාතිපි.

1566. සාංක්ලේශික ධර්මයෝ කවරහු යත්:

ත්‍රෛභූමක කුශල යෑ, අකුශල යෑ, ත්‍රෛභූමක විපාක යෑ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යෑ, හැම රූපය දැයි මොහු සාංක්ලේශික ධර්මයෝ යි.

1567. අසාංක්ලේශික ධර්මයෝ කවරහු යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ යෑ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැයි මොහු අසාංක්ලේශික ධර්මයෝ යි.

1568. සංක්ලිෂ්ට ධර්මයෝ කවරහු යත්:

ද්වාදශ අකුශලචිත්තෝත්පාදයෝ යි. මොහු සංක්ලිෂ්ට ධර්මයෝ යි.

1569. අසංක්ලිෂ්ට ධර්මයෝ කවරහු යත්:

සිවුබිම්හි කුසල් යෑ, සිවුබිම්හි විපාක යෑ, තුන්බිමැ ක්‍රියාව්‍යාකෘත යෑ, රූපය ද නිර්වාණය දැයි මොහු අසංක්ලිෂ්ට ධර්මයෝ යි.

1570. ක්ලේශසම්ප්‍රයුක්ත ධර්මයෝ කවරහු යත්:

දොළොස් අකුශලචිත්තෝත්පාදයෝ යි. මොහු ක්ලේශසම්ප්‍රයුක්ත ධර්මයෝ යි.

1571. ක්ලේශවිප්‍රයුක්ත ධර්මයෝ කවරහු යත්:

චාතුර්භූමක කුශල යෑ, චාතුර්භූමක විපාක යෑ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යෑ, රූපය ද නිර්වාණය දැයි මොහු ක්ලේශවිප්‍රයුක්ත ධර්මයෝ යි.

1572. ක්ලේශ ද වූ සාංක්ලේශික ද වූ ධර්මයෝ කවරහු යත්:

එ මැ ක්ලේශයෝ ක්ලේශ ද සාංක්ලේශික ද වෙත්.

1573. සාංක්ලේශික ද වූ නො ද ක්ලේශ වූ ධර්මයෝ කවරහු යත්:

ක්ලේශයන් තබා අවශේෂ අකුශල යෑ, ත්‍රෛභූමක කුශල යෑ, ත්‍රෛභූමක විපාක යෑ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යෑ, හැම රූපය දැයි මොහු සාංක්ලේශික ද වූ නො ද ක්ලේශ වූ ධර්මයෝ යි.

අසාංක්ලේශික ධර්මයෝ ක්ලේශ ද වූ සාංක්ලේශික වූහ යි ද, සාංක්ලේශික ද වූ ක්ලේශ වූහ'යි ද නො කියැයුත්තාහ.

1574. ක්ලේශ ද වූ සංක්ලිෂ්ට ද වූ ධර්මයෝ කවරහු යත්:

එ මැ ක්ලේශයෝ ක්ලේශ ද සංක්ලිෂ්ට ද වෙත්.

1575. සංක්ලිෂ්ට ද වූ නො ද ක්ලේශ වූ ධර්මයෝ කවරහු යත්:

ක්ලේශයන් තබා අවශේෂ අකුශල යි. මොහු සංක්ලිෂ්ට ද වූ නො ද ක්ලේශ වූ ධර්මයෝ යි.

අසංක්ලිෂ්ට ධර්මයෝ ක්ලේශ ද වූ සංක්ලිෂ්ට වූහ'යි ද, සංක්ලිෂ්ට ද වූ නො ද ක්ලේශ වූහ'යි ද නො කියැයුත්තාහ.

1576 කතමෙ ධම්මා කිලෙසා චෙව කිලෙසසම්පයුත්තා ච:

යත්ථ ද්වෙ තයො කිලෙසා එකතො උප්පජ්ජන්ති, ඉමෙ ධම්මා කිලෙසා චෙව කිලෙසසම්පයුත්තා ච.

1577. කතමෙ ධම්මා කිලෙසසම්පයුත්තා චෙව නො ච කිලෙසා:

ඨපෙත්වා කිලෙසෙ අවසෙසං අකුසලං, ඉමෙ ධම්මා කිලෙසසම්පයුත්තා චෙව නො ච කිලෙසා.

කිලෙසවිප්පයුත්තා ධම්මා න වත්තබ්බා කිලෙසා චෙව කිලෙසසම්පයුත්තාතිපි, කිලෙසසම්පයුත්තා චෙව නො ච කිලෙසාතිපි.

1578. කතමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා සඞ්කිලෙසිකා:

තීසු භූමීසු කුසලං, තීසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, සබ්බඤ්ච රූපං, ඉමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා සඞ්කිලෙසිකා.

1579. කතමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා අසඞ්කිලෙසිකා:

චත්තාරො මග්ගා අපරියාපන්නා චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා කිලෙසවිප්පයුත්තා අසඞ්කිලෙසිකා.

කිලෙසසම්පයුත්තා ධම්මා න වත්තබ්බා කිලෙසවිප්පයුත්තා සඞ්කිලෙසිකාතිපි, කිලෙසවිප්පයුත්තා අසඞ්කිලෙසිකාතිපි.

### කිලෙස ගොච්ඡකං

1580. කතමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තචිත්තුප්පාදා, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා.

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතචිත්තුප්පාදා, ද්වෙ දොමනස්ස සහගත චිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා දස්සනෙන පහාතබ්බා සියා න දස්සනෙන පහාතබ්බා.

1581 කතමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බා:

උද්ධච්චසහගතො චිත්තුප්පාදො, චතූසු භූමීසු කුසලං, චතූසු භූමීසු විපාකො, තීසු භූමීසු කිරියාව්‍යාකතං, රූපඤ්ච, නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බා.

1582. කතමෙ ධම්මා භාවනාය පහාතබ්බා:

උද්ධච්චසහගතො චිත්තුප්පාදො, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බා.

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතචිත්තුප්පාදා, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා භාවනාය පහාතබ්බා සියා න භාවනාය පහාතබ්බා

1576. ක්ලේශ ද වූ ක්ලේශසම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ කවරහ යත්:

යම් තැනෙක දෙතුන් ක්ලේශ කෙනෙක් එක්වට උපදිත් ද, මොහු ක්ලේශ ද වූ ක්ලේශසම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ යි.

1577. ක්ලේශසම්ප්‍රයුක්ත ද වූ නො ද ක්ලේශ වූ ධර්මයෝ කවරහ යත්:

ක්ලේශයන් තබා අවශේෂ අකුශල යි. මොහු ක්ලේශසම්ප්‍රයුක්ත ද වූ නො ද ක්ලේශ වූ ධර්මයෝ යි.

ක්ලේශවිප්‍රයුක්ත ධර්මයෝ ක්ලේශ ද වූ ක්ලේශසම්ප්‍රයුක්ත වූහ'යි ද, ක්ලේශ සම්ප්‍රයුක්ත ද වූ නො ද ක්ලේශ වූහයි නො කියැයුත්තාහ.

1578. ක්ලේශවිප්‍රයුක්ත වූ සාංක්ලේශික ධර්මයෝ කවරහ යත්:

ත්‍රෛභූමක කුශල යැ, ත්‍රෛභූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යා-කෘත යැ, හැම රූපය දැ' යි මොහු ක්ලේශවිප්‍රයුක්ත වූ සාංක්ලේශික ධර්මයෝ යි.

1579. ක්ලේශවිප්‍රයුක්ත වූ අසාංක්ලේශික ධර්මයෝ කවරහ යත්:

අපර්‍යාපන්න වූ සතර මාර්ගයෝ යැ, සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද, නිර්වාණය දැ'යි මොහු ක්ලේශවිප්‍රයුක්ත අසාංක්ලේශික ධර්මයෝ යි.

ක්ලේශසම්ප්‍රයුක්ත ධර්මයෝ ක්ලේශවිප්‍රයුක්ත සාංක්ලේශික වූහ'යි ද, ක්ලේශවිප්‍රයුක්ත අසාංක්ලේශික වූහ'යි ද නො කියැයුත්තාහ.

කෙලෙසගොච්ඡක යි.

1580. දර්ශනයෙන් (සෝවාන් මඟින්) ප්‍රහාතව්‍යධර්මයෝ කවරහ යත්:

සතර දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෝ යැ, විචිකිත්සාසහගත චිත්තොත්පාදය දැ'යි මොහු දර්ශනයෙන් ප්‍රහාතව්‍යධර්මයෝ යි

දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත චිත්තොත්පාදයෝ සතරදෙන යැ, දෞර්මනස්‍ය සහගිය චිත්තොත්පාදයෝ දෙදෙන යැ යන මේ ධර්මයෝ දර්ශන-යෙන් ප්‍රහාතව්‍ය ද වන්නාහ, දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො ද වන්නාහ.

1581. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ කවරහ යත්:

උද්ධච්චසහගත චිත්තොත්පාදයැ, චාතුර්භූමක කුශල යැ, චාතුර්භූමක විපාක යැ, ත්‍රෛභූමක ක්‍රියාව්‍යාකෘත යැ, රූපය ද, නිර්වාණය දැයි මොහු දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ යි.

1582. භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ කවරහ යත්:

ඖද්ධත්‍යසහගත චිත්තොත්පාද යැ, මොහු භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ යි.

සතර දෘෂ්ටිගතවිප්‍රයුක්ත ලෝභසහගත චිත්තොත්පාදයෝ යැ, දෞර්මනස්‍ය සහගිය චිත්තොත්පාදයෝ දෙදෙන යැ යන මේ ධර්මයෝ භාවනායෙන් ප්‍රහාතව්‍ය ද වන්නාහ, භාවනායෙන් ප්‍රහාතව්‍ය නො ද වන්නාහ.

1583. කතමෙ ධම්මා න භාවනාය පහාතබ්බා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තචිත්තුප්පාදා, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, චතුසු භූමිසු කුසලං, චතුසු භූමිසු විපාකො, තීසු භූමිසු කිරියාව්‍යාකතං, රූපඤ්ච නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා න භාවනාය පහාතබ්බා.

1584. කතමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා:

චත්තාරො දිට්ඨිගතසම්පයුත්තචිත්තුප්පාදා, විචිකිච්ඡාසහගතො චිත්තුප්පාදො, එත්ථුප්පන්නං මොහං ඨපෙත්වා, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා.

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තලොභසහගතචිත්තුප්පාදා, ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා දස්සනෙන පහාතබ්බහෙතුකා, සියා න දස්සනෙන පහාතබ්බහෙතුකා.

1585. කතමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බහෙතුකා:

විචිකිච්ඡාසහගතො මොහො, උද්ධච්චසහගතො චිත්තුප්පාදො, චතුසු භූමිසු කුසලං, චතුසු භූමිසු විපාකො, තීසු භූමිසු කිරියාව්‍යාකතං, රූපඤ්ච, නිබ්බානඤ්ච, ඉමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බහෙතුකා.

1586. කතමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා:

උද්ධච්චසහගතො චිත්තුප්පාදො, එත්ථුප්පන්නං මොහං ඨපෙත්වා, ඉමෙ ධම්මා භාවනාය පහාතබ්බහෙතුකා:

චත්තාරො දිට්ඨිගතවිප්පයුත්තා ලොභසහගතචිත්තුප්පාදා. ද්වෙ දොමනස්සසහගතචිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා භාවනාය පහාතබ්බහෙතුකා, සියා න භාවනාය පහාතබ්බහෙතුකා.

1587. කතමෙ ධම්මා න භාවනාය පහාතබ්බහෙතුකා:

